

විනය කොෂය.

(ප්‍රථම - ද්විතීය භාගය)

විනය කොෂය

පාලි-සිංහලාර්ථ

ප්‍රථම භාගය

(අ)

පානදුරේ රන්කොත් විහාරාධිපති

''සිරිඤාණ සාසනධජ''

කරගම්පිටියේ ඥානිරතනාභිධාන

අමරපුර නිකායේ අධිකරණ නායක, මහාසංඝරත්න

සඞ්ඝාමිපාදයන් වහන්සේගේ

ශිෂ්‍යවූ

පණ්ඩිත මොරටුවේ සාසනරතන

(අභිධර්ම භාෂා ව්‍යාඛ්‍යා, ලක්දිව ඉතිහාසය අදහස්, සිංහල ශබ්දකෝෂය යන ග්‍රන්ථයන්හි කර්තෘ වූ)

සද්ධිවිහාරික වහන්සේ විසින්

සම්පාදිතයි.

පානදුරේ වදුරාමුල්ලේ ''සිසිර'' නිවෙස වැසි

ඇම්. ඇෆ්ප්. සී. පෙරේරා මහතාගේ

විසින්

පානදුරේ නන්දන යන්ත්‍රාලයේ

මුද්‍රණය කරවන ලදී.

ශ්‍රී: බු: ව: 2499

VINAYA KŌSHAYA

PĀLI – SINHALESE

PART I

A

Edited by

REV. PANDIT MORATUWE SASANARATANA THERA

("Viddya Visarada" Diploma of the University of Ceylon and "Grantha Visarada" Diploma of the Oriental Studious Society)

Pupil of

Ven'ble Karagampitiye Jotiratana Adhikarana Nayaka Maha Thera.

Rankot Viharaya, PANADURA.

Published by

M. F. C. PERERA

" SISIRA "

Wanduramulla, Panadura.

Printed at

The Nandana Press

PANADURA.

1955

සංඥාපනය.

විනය පිටකයට ඇතුළත් පෙළ, අටුවා, ටීකා සහ ප්‍රකරණ පොත්වල ද දක්නා විනය පිළිබඳ වචන අකාරාදි ක්‍රමයෙන් විසතර කළ බැවින් මේ පොත **"විනය කොෂය"** නම් විය. ආචාර්ය **විසුද්ධානන්ද්‍රයන්** අභිධර්ම කොෂයට ම විසින් ලියූ විසතර වර්ණනාව මුද්‍රණය කරවද්දී විනය පිටකය පිළිබඳව මෙබඳු පොතක් ලියැවිණි නම් මැනැවැයි මට හැඟී ගියේය. එබැවින් විනය පිටකය පිළිබඳව දැනට මුද්‍රණය වූ ද, නොවූ ද, පොත් රාශියක් සපයා ගෙණ එම පොත්වල එන විනය පාරිභාෂික වචන එකතු කර, එය අකාරාදි ක්‍රමයෙන් සකස් කොට සවර කාණ්ඩය අවසානය දක්වා විස්තර ද ලියූවෙමි. මෙහි ප්‍රථම භාගය වශයෙන් එම සවරාදි කාණ්ඩය මුද්‍රණයට සූදානම් කළ නමුදු එයට දිගුකලක් ගතවන අතර විශාල විෂයමක් ද දරන්නට සිදුවන බැවින් පිටු 200 කින් පරිමිතවූ අකාරාංශය පමණක් ප්‍රථම භාගය වශයෙන් මෙසේ මුද්‍රණය කරවීමි. මෙබඳු පිටු 500 කින් පමණ පරිමිත වන දෙවන කාණ්ඩය **"ආ"** පටන් **"ඔ"** අන්ත සවරාදි කාණ්ඩය වේ. **ඒ අනුව කාණ්ඩ සතරකින් හෝ පහකින් විනය කොෂය සම්පූර්ණ වනු ඇත.**

පොළොන්නරු යුගයේදී ලියූ **අභිධානප්පදීපිකාව** දැනට පාළිභාෂාවට ඇති ඉතා පැරණි ශබ්දකොෂය වේ. එහෙත් එය ලියන ලද්දේ අකාරාදි ක්‍රමයෙන් නොවේ. එහි දක්නා වචන අකාරාදි ක්‍රමයෙන් සකස්කොට පදසිද්ධි ආදිය දක්වමින් වස්කඩුවේ **ශ්‍රී සුභූති නායක සංඝරාජ මහාස්වාමීන්ද්‍රයන් වහන්සේ** ලියූ **අභිධානප්පදීපිකා සූචිය** ශ්‍රේෂ්ඨ ග්‍රන්ථයකි. **"අභිධාන කොෂ"** නමින් කොෂ ග්‍රන්ථයක් පිළිබඳව විමති විනොදනී ටීකාවේ මෙන් ම සාරත්ථදීපනී ටීකාවේ ද, සඳහන් වන නමුත් එය අද නාම මාත්‍ර ශෙෂය. සමහරවිට මේ **"අභිධාන කොෂය"** **"අභිධානප්පදීපිකාවට** වඩා පැරණි විය හැකිය. ඉංග්‍රීසියෙන් මුද්‍රිත, අකාරාදි ක්‍රමයෙන් ලියූ පාළි ශබ්දකොෂ කිපයක් ම ඇත. මේ අතර මීෑත කාලයේ විසූ ශ්‍රේෂ්ඨ පඬිවරුන් කීප පළක් විසින් ලියූ පාළි—සිංහල; සිංහල—පාළි; ඉංග්‍රීසි—පාළි ශබ්දකොෂ කිපයක් ද වේ. මේ **"විනය කොෂයේ"** වචනයන්ගේ නිෂ්පත්තිය, ප්‍රභවය ආදිය ශබ්දකොෂ ප්‍රතිපත්ති අනුගමනය කරමින් දැක්වීමි. මෙහි බොහෝ කරුණු විනය පිටකයට පමණක් සීමා වුව ද පාළි භාෂාව පිළිබඳ සංක්ෂිප්ත ශබ්දකොෂයක් හැටියට ද මෙය ප්‍රයෝජන ගත හැකිය. විනය පිටකය පිළිබඳව මෙබඳු පොතක් මුද්‍රණය වී ඇති බවක් මම නොදනිමි. එසේ නම් මෙය ලියන්නට ලැබීම පිළිබඳව මම වඩා ලා සතුටු වෙමි. අකාරාදි ක්‍රමයෙන් ශබ්දකොෂයක් පිළියෙළ කිරීමේදී මුහුණ පෑ සුපු දුෂ්කරතා රාශියකි. ඒ සියල්ලට මම ද මුහුණ පෑ වෙමි.

මෙහි උද්ධරණය කළ හැම වචනයක්ම, ඒ වචනය පිළිබඳව ලියූ විසතරය ද, ඇතුළත් පොත්වල පිටු—පෙළ ආදිය ඒ ඒ වචනයන්ගේ විසතරාවසානයෙහි ශබ්දකොෂ ප්‍රතිපත්ති අනුව දක්වා ඇත. එබැවින් යම් වචනයක් පිළිබඳ වඩා විසතර දත යුතු නම් ඒ ඒ පොත්වලින් දැනගත හැකිය. පදසිද්ධි දැක්වීමේදී ව්‍යාකරණ සූත්‍ර දැක්වීමක් නොකොට සූත්‍රයන්ගේ සාරය පමණක් ගරු කෙළෙමි. සමහර වචනවලදී විග්‍රහවාක්‍යාත්මක සාධක මෙහි ඉදිරිපත් කර ඇත. එය තවදුරටත් විමසා බැලීම ධර්ම—විනයධර උගත් ලොකයාට භාරය. එබැවින් **අනමතග්ග, අඩ්ඩුඩ්ඩ, අඩ්ඩකතිය, අජ්ජයධනු, අතුසඤ්ඤතවාසි, අධිකරණ වගග, අවිනිපාත ධම්ම, අණ, අසඛ්ඛකවිඤ්ඤ** ආදී තත්ත්වී දැක්වූ හෙතු සාධක විමසිය යුතුය. **අඩ්ඩුඩ්ඩ** ආදී ශබ්ද කිපයකම නියම අර්ථය කිසිදු ආඥාසයක් නැතිව මින් උගත හැකියැයි සිතමි. **අජ්ජතර, දුද්දුල්ල, අණත්ත** ආදී සතහි දැක්වූ ශබ්දයන්ගේ ඉතිහාසය නිසා සිංහල භාෂාවට ද ප්‍රයෝජනයක් වන්නට පිළිවන.

මෙහි සමහරවිට මගේ නොදැනීම නිසා අනවශ්‍ය වචන ඇතුළත්ව හෝ අවශ්‍ය වචන ඇතුළත් නොව හෝ ඇත. එසේ නම් එය දන්වා එවූ විට දෙවන මුද්‍රණයකදී සකස් කරන්

නෙමි. මේ ප්‍රථම භාගයේ පවා අවශ්‍යයෙන් ඇතැළත් විය යුතු වචන කිපයක් ම උණන පූරණ වශ යෙන් අවසානයෙහි යෙදිමි. මෙබඳු වචන තව ඇතිවිය හැකිය. ඒ සඳහා මෙහි අසුවල් වචනය නැතැයි කියන්නට පෙර ඒ වචනය යෙදිය හැකි හැම් තැනක් ම සොයා බැලිය යුතුය. සම්හරවිට ඔබ සිතන වචනය වෙන විසියකින් මෙහි යෙදෙන්නට පිළිවන.

මෙබඳු වැඩකදී ලොකු ඉඩකඩක් ද, විවේකයක් ද, අවශ්‍යය. එහෙත් ඒ සියල්ලම මට ලැබුණේ නැත. පොත් පත් 10, 15 එක පිට එක තැබූ කුඩා මේසයක ඒ සියල්ල සසඳා බලන්නට ද, විමසන්නට ද, කරුණු උපුටා විසතර ලියන්නට ද සිදු විය. මෙබඳු අනවකාශතා මධ්‍යයේ මෙය සම්පාදනය කළ බැවින් මෙහි ප්‍රමාද දෙෂ ඇතිවනු නිසැකය.

මෙය ලිවීමේදී සම්හර ගැඹුරු, ගැටලු කරුණු පිළිබඳව මිගේ ගුරු කොමුදුරුවන්ගේ පිහට ලබා ගතිමි. එසේම ශාස්ත්‍රාචාර්‍ය පණ්ඩිත **කහඳුගෝදර සියඋතන** සථවිරයන් වහන්සේ සහ පණ්ඩිත **අම්බලම්ගොඩ ධම්මකුසල** සථවිරයන් වහන්සෙද බොහෝ කරුණුවලදී මට උපදෙස් දුන්හ. මෙබඳු යටපුත්තකදී අවශ්‍ය පොත්පත් සොයා ගැණීම ද දුෂ්කර කරුණකි. එහෙත් **පොත්පත් වැඩි හරියක් සපයා දුන් ගරු මිහිරිපැන්නේ ජෝතිපාල, ගරු හොරේතුඩුවේ ධම්ම ඛජ, ගරු හම්බල ධම්මවංස** යන සථවිරයන් වහන්සේලා කෙරෙහි මම කෘතඥ වෙමි. එසේම කළුතර පුලිනතාරාරාම පුස්තකාලයේ තුබූ විනය විනිවිජය ටීකාවේ අඳුරින පිටපත දිමෙන් **බේරුවල සිරිසුමඟල සිරිනිවාස** මහානායක මාහිමියන් වහන්සේ ද, වජිරබුද්ධි ටීකාවේ සිංහල අකුරෙන් ලියූ පිටපත සපයා දිමෙන් **ගරු අඹලියද්දේ සරණතිස්ස** සථවිරයන් වහන්සේද, සමන්තපාසාදිකා අට්ඨවාවට ලියූ ව්‍යාඛ්‍යාවක් වන විනයාර්ථ සමුච්චය නම් පොතේ පුස්තෙළ පිට පත සපයා දිමෙන් පණ්ඩිත **මැදගෙදර ධම්මලංකාර** සථවිරයන් වහන්සේද මට ආධාර වූහ. එසේම මෙහි සම්හර ලිපි ඉංග්‍රීසියට පරිවර්තනය කිරිමේදී **පානදුරේ ශ්‍රී සුමඟල බාලිකා විද්‍යාලයේ** ආචාර්‍ය මණ්ඩලයේ නියුක්ත **මාලිනී ධම්මජ්ජිකර** මහත්මිය සහ **ටර්ලි කුරේ** මහත්මියද, එසේම එම විද්‍යාලයේ **සුජාතා රුද්‍රිගෝ** ශිෂ්‍යාවද උපකාර වූ බැව් දන්වනු කැමැත්තෙමි.

පොත කියවන්නට පෙර මෙහි ඇති උපදෙස් පිළිපැදිය යුතුය. ශුද්ධපත්‍ර බැලීමේදී සිදුවූ වැරැදි කිපයක්ම දක්නා නමුදු එයින් එතරම් අප්‍රිය විපරීතයක් සිදු නොවන බැවින් ශුද්ධපත්‍රයක් නොයෙදිමි. මෙහිදී මා ඇත් උත්සාහය කොතරම් දුරට සඵල වූයේ දැයි මම නොදනිමි. එය ධම්ම විනයධර පඬිවරුන් විසින් විමසිය යුතුය.

අවසාන වශයෙන් **''ලක්දිව මහායාන අදහස්''** නම් ග්‍රන්ථයට මුවුසින් ලියූ සාඥපනයේ අවසාන නගය මෙහි ද ඇතුළත් කරමින් මේ සංඥපනය අවසන් කරමි. එය මෙසේය.

''මෙහි යම් දෙෂයක් වෙයි නම් එය මට ද, සතුති ප්‍රශංසාවත් වෙයි නම් මගේ ගුරු—දෙගුරුන්ට ද ප්‍රයෝජනයක් වෙයි නම් එය ලොකඝාට ද හිමි ය.''

මේබවට, වැඩ කැමැති

මොරටුවේ සාසනරතන සථවිර.

2498
1955 1. 30 වැනි දින
පානදුරේ රත්නොත් විහාරයේදිය.

PREFACE

This book has been entitled the **'Vinaya Kosaya'** as it treats Vinaya terms found in Pali texts, commentaries, glossaries and treatises on the Vinaya Pitaka. When my commentary to **Vasubandhu's** Abhidharma Kosaya was in the press I falt that it would be useful if a work of a similar nature on the Vinaya Pitaka could be produced. Accordingly I collected the technical terms occuring in books and manuscripts on the Vinaya Pitaka & arranged them in alphabetical order & prepared a camprehensive glossary up to the end of the vowels. Although the first part containing all the vowels was ready for the press, yet, as it involves time and expense I have brought out as the first part 200 pages only covering the vowel "ඇ". The second part comprising 500 pages will deal with the remaining vowels ඈ to ඔ. Thus 'Vinaya Kosaya' will be completed in 4 or 5 parts.

Abhidhanappadipika belonging to the Polonnaruwa Period is the oldest available dictionary of the Pali Language. But it is not written in alphabetical order. On this work, Waskaduwe **Siri Subhuti Nayaka** thero produced the valuable work **Abhidhanappadhipika Suci** where the words are arranged in alphabetical order and etymologies given. Though the **Vimati Vinodani Tika** and **Saratthadipani Tika** make mention of a glossary "Abhidhana Kosaya" it remains only in name. Perhaps Abhidhana Kosa may be older than Abhidhanappadipika. Besides the Pali dictionaries written in English, there are several Pali–Sinhalese, Sinhalese–Pali, English–Pali dictionaries compiled by scholars in recent times. In this book I have followed lexicographical methods in giving the etymology etc. of words. Although much of the information is limited to the Vinaya Pitaka this can be used as a Pali dictionary as well, I am all the more happy about this effort as I am not aware of any other work of a similar nature on the Vinaya Pitaka. I must Admit that I too faced the difficulties met with in the compillation of a dictionary.

In keeping with the lexicographical methods, after the explanation of words I have cited the page and line etc. of the authorities from which words and information regarding any words is required it can be easily obtained by reference to these books, In explaining the derivation, I have, at times, prefered giving the gist rather than quoting the rule. In certain instances proofs have been adduced. Further research, I leave to those proficient in the Dhamma and Vinaya. The arguments given for **anamatagga, addhuddha, addhatiya, ajiyadhanu, annunnatavasi atthaka-wagga, avinipatadhamma ana, asankhaccika** etc. should be examined. I feel that, in this way, the exact meanings of words like **addhuddha** can be readly understood. And the historical data given to words like **ajagara, dutthulla, anana** will be useful to the Sinhalese Language as well.

If any mistakes found in this part are brought to my notice necessary corrections can be made in a future edition. I have included at the end a supplementary list of words that should have occured in the first part itself and so feel that there may be more. Before the ommission of a word is pointed out all the instances where this word occurs should be examained as the word may have been introduced in some other form here.

A work of this sort requires means and leisure. The task of comparing, examining and writing had to be done on a small table with a pile of 10 to 15 books. Under these adverse circumstances one cannot but expect shortcomings in a work like this.

I received the assistance of my Preceptor in elucidating certain dificulties. Pandit Kahandamodara Piyaratana thero and Pandit Ambalangoda Dhamma Kusala thero offered me guidance. I am grateful to Rev: Mihiripenne Jotipala, Rev: Horetuduwe Dhammadhaja, Rev: Gampola Dhammawansa for providing me with most of the books. Beruwala Siri Sumangala Siriniwasa Mahanayaka thero supplied me with a manuscript copy of Vinaya Vinichchaya Tika from the Kalutara Pulinatalarama library, Ambaliyadde Saranatissa thero with the copy (written in Sinhalese characters) of the Vajirabuddhi Tika and Pandit Madauyangoda Wimalakitti thero with an ola manuscript of Vinayartha Samuchchaya on the commentary Samantapasadika. I should also mention the names of Miss Malini Wijes"kara and Miss Turley Cooray of the Staff of Sri Sumangala Girl's School Panadura, and Miss Sujata Rodrigo of the same school who were of very great assistance to me in the English translation.

Before perusing this book, this instructions given should be followed. Although several mistakes were detected in the course of proof-reading, I did not include a corrigenda as they were not of a serious nature. I do not know how far my attempt. has been successful. I leave it to scholars well,versed in Vinaya to decide.

I conclude with the last part of my preface to "LAKDIVA MAHAYANA ADAHAS."
"Herein if there be any mistakes, they are mine, any praise should go to my teachers and parents and any benefit to the world."

MORATUWE SASANARATANA THERO.

Rankot Viharaya,
Panadura.
30. 1. 1955.

ප්‍ර ස්තා ව නා ව

ධම්මවිනය, සඩම්ම, පාවචන, බ්‍රහ්මචරිය, අරියවිනය යන නම්වලින් බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ශාසනය හැඳින් වූ සේක. බුඩ දෙශනාව ධම්--විනය දෙකින් ම යුක්ත වූ නිසා බොහෝ තැන දක්නේ **"ධම්ම විනය"** කියා ම ය. ප්‍රථම ධම්ම සඞ්ගායනාවට පෙරාතුව සංගීති කාරක මහ රහතන් වහන්සේ ද, **"ධම්ම-විනය දෙක සඞ්ගායනා කරමු"**යි කතිකා කළහ. මෙහි **ධම්ම** ශබ්දයෙන් පස්මහ සඟිය ද, **විනය** ශබ්දයෙන් උභතෝ විභඞ්ග, ඛන්ධක, පරිවාර ඇතුළත් විනය පිටකය ද ගැණේ. අභිධම්ම නමින් හඳුන්වන දෙශනාව ද, ධම්ම ශබ්දයෙන්ම ගත්හ. ශාසනයාගේ චිරස්ථිතිය විනය උඩ ම රඳා පවත්නා හෙයින් ප්‍රථම ධම්ම සඞ්ගායනාවේදී පළමුව විනය ම සඞ්ගායනා කළහ. සත්මසක් තුළ පැවැත්වූ සඞ්ගායනාව අවසානයෙහි බුඩවචනය **රස, ධම්ම විනය, වචන, පිටක, අඞ්ග, ඛන්ධ** වශයෙන් බෙදා වෙන් කළහ. සකල බුද්ධවචනය ම රස වශයෙන් එකකි. ධම්ම-විනය වශයෙන් දෙකකි. වචන සහ පිටක හෙදයෙන් තෙවැදෑරුම් වේ. අඞ්ග වශයෙන් නවයක් සහ සඞ්ඛ හෙදයෙන් අසූඅාර දහසක් ද වේ.

බුඩ දෙශනාවෙහි එක එක වචනයක් පාසා විමුක්තිය ම නිර්‍වාණය ම දෙන බැවින් එසෙම රසය නම් විමුක්තිරසය ම වේ. දෙවැදෑරුම් හෙදයෙහි විනය පිටකය විනය ශබ්දයෙන් ද, සෙසු බුඩවචනය ධම්ම ශබ්දයෙන් ද ගත්හ. වචන වශයෙන් ලැබෙන හෙදයෙහි බුදු වූ කෙණෙහි වදාළ **"අනෙක ජාති සංසාරං"** ආදී දෙශනාව ප්‍රථම බුඩ වචනය වේ. පිරිනිවන් ඇදේ සැතපුණු බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා වදාළ **"හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වෝ වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ"** යන දෙශනාව පශ්චිම බුඩවචනය වේ. මෙ දෙතුරෙහි වදාළ තාක් ධර්‍මය මධ්‍යම බුඩ වචනය වේ. **"යදු හ වෙ පාතු භවතෙ ධම්මං"** ආදි දෙශනාව ප්‍රථම බුඩ වචනය මෙන් සම්භරු සැලකුහයි අටුවාවෙහි පෙනේ. පිටක ප්‍රභෙදයෙහි ලා සූත්‍ර, අභිධම්ම, විනය සි තෙවැදෑරුම් බුඩවචනයෙහි භික්ෂු-භික්ෂුණී ප්‍රාතිමොක්ෂ, උභය විභඞ්ග, දෙවිසි කඳවත්, සොළස පරිවාර යන මෙතෙක් විනය පිටකය මෙන් ද, 1 දීඝ නිකාය, 2 මජ්ඣිම නිකාය, 3 සංයුත්ත නිකාය, 4 අඞ්ගුත්තර නිකාය, 5 ඛුද්දක නිකාය යනු සූත්‍රපිටකය මෙන්ද, 1 ධම්ම සඞ්ගණි 2 විභඞ්ග, 3 ධාතු කථා, 4 පුග්ගල පඤ්ඤත්ති, 5 යමක, 6 පට්ඨාන 7 කථාවත්ථු යන මෙතෙක් අභිධම්ම පිටකය මෙන් ද නියම කර ගත්හ. සූත්‍රපිටකයෙහි ඛුද්දක නිකායට ඛුද්දකපාඨ—ධම්මපද ආදී පොත් පසළොසක් ඇතුළත් වේ. නෙත්තිපකරණ, චතුභාණවාර පාළි පොත් දෙක පෙළ පොත් නමුදු සූත්‍ර පිටකයට අයත් ග්‍රන්ථයන්ගෙන් උඩාන දෙශනාවන්ගෙන් යුක්ත බැවින් ඛුද්දක නිකායට ඇතුළත් නො කළහ. අඞ්ග වශයෙන් ලැබෙනුයේ 1 සුත්ත, 2 නෙය්‍ය, 3 වෙය්‍යාකරණ, 4 ගාථා, 5 උදාන, 6 ඉති වුත්තක, 7 ජාතක, 8 අබ්භූත ධම්ම, 9 වෙදල්ල යන නවයයි. සඞ්ඛහෙදයෙහි විනය පිටකයෙහි සහ සූත්‍රපිටකයෙහි සඞ්ඛ විසිඑක් දහස බැගින්ද, අභිධම් පිටකයෙහි සතළිස් දෙදහසක් දැයි සුවාසූ දහසකි.

ප්‍රථම ධම්මසඞ්ගායනාව අවසානයෙහි විනය පිටකය උපාලි මහරහතන් වහන්සේට භාර කළහ එසේම දීඝනිකාය අනඳ හිමියන්ම ද, මජ්ඣිම නිකාය දම්සෙනෙවි සැරියුත් හිමියන්ගේ ශිෂ්‍යයනට ද, සංයුක්ත නිකාය මහකසුප් හිමියනට ද, අඞ්ගුත්තර නිකාය අනුරුඬ හිමියනට ද, භාර කොට සිය අනවැස්සනට උගන්වන මෙන්ද නියම කළහ. අභිධම් පිටකය කිසිවකුට භාර නො කොට සියලුදෙනා වහන්සේ ම ධාරණය කළ සේක. ඛුද්දක නිකාය ද කිසිවකුට භාර කළ බවක් සඳහන් නොවේ. ක්ෂුද්‍රක වස්තූන් පන්තිකොට හැමදෙනා වහන්සේ සඟඟ සජ්ඣායනා කළ බව ද, විනය පිටකය සහ අභිධම්පිටකය ද ඇතුළත්කොට ඛුද්දක නිකාය සතළොස් ප්‍රකාරයකින් යුක්ත වූ බව ද, සමන්තර පොතක දක්නේය. පිටකත්‍රයට ඇතුළත් පෙළ පොත්වල අනුක්‍රමාන (=අප්‍රකට) පද වර්ණනය පිණිස බුදුරජාණන් වහන්සේ විසින් ම දෙශනා කරන ලද ප්‍රකීර්ණක

(=විස්තර) දෙශනාව අට්ඨකථා **කම්** වූවා **සවිසතර** දෙශනාවෙහි බැස සිටුනා හෙයින් **ඔකඛනතික විනිවජය** නම් ද වන්නීය. පරපුර නො සිඳ ගෙණෙනලද ඒ අටුවා කථා ආචාර්යවරු පොත්වලට නැඟූහ. පිටකත්‍රය වෙන වෙන නම්වලින් ද ඇඳින් වූහ. ඒ අනුව **ආණා දෙසනා, ඝථාපරාධ සාසන, සංවරාසංවර කථා** යනුවෙන් විනය පිටකය ද; **පරමත්ථ දෙසනා, යථාධම්ම සාසන, නාම රූප පරිවෙජ්ද කථා** යනුවෙන් අභිධම්ම පිටකය ද; **වොහාර දෙසනා, යථානු ලොම සාසන, දිසි විනිවෙඨන කථා** යනුවෙන් සූත්‍රපිටකය ද ඇඳින්වූහ.

විනය පිටක

විනය විනය ශබ්දයාගේ අරුත් දක්වන ආචාර්යවරු (අ) විවිධ වූ විශෙෂ ක්‍රම ඇති හෙයින් ද; (ආ) කය වචනයන් හික්මවන හෙයින් ද, **විනය** නමැයි කිහ. මෙහි පූර්ව අර්ථය ගැණීමට නම් විවිධ විශෙෂාර්ථවාචී **වි** උපසර්ගයත්, ක්‍රම වාචී **නය** (වි + නය) ශබ්දයත් සමාසව **විනය** ශබ්දය සිඳියයි ගත යුතුය. විනයයෙහි වනාහි පස්වැදෑරුම් පාමොක් දෙසුම්ය, පරිජි ඇ සත් වැදෑරුම් ඇවැත් ය, ශික්ෂාපද නම් වූ මාතෘකා ය, වස්තු හා පුද්ගලාදිය ද, ඇත නත් වැදෑරුම් ක්‍රම යෝ වෙති. එසේම විනයයෙහි ලොකවජ්ජ ශික්ෂාපදයන්හි මූල **ප්‍රඥප්තිය** දැඩි කරනු පිණිස ද, **ප්‍රඥප්ති**වජ්ජ ශික්ෂාපදයන්හි මූල **ප්‍රඥප්තිය** ලිහිල් කරනු පිණිස ද, යොදන ලද අනු ප්‍රඥප්තීහු ද වෙති. විනය ශබ්දය වි පූර්ව නී ධාතුවෙන් (වි + √නී) සිඳියැති ගත් කල එයින් කය වචන දෙක හික්මවන හෙයින් හෙවත් කයින් හා වචනයෙන් සිදුවන සියලුම අකුසල් වළකා විශිෂ්ට අවස්ථාවකට පමුණුවන හෙයින් විනය නමැයි ගත යුතුය.

පිටක පිටක ශබ්දයාගේ නිරුක්තානුකූල අර්ථය පැහැදිලි නැත. පර්‍යාපත්තියට භාජන වූ බැවින් පිටක නමැයි අටුවාවෙහි දක්නේය. **"මා පිටක සම්පදානෙන"** **"ත්‍රීණිමානි පිටකානි උභතොමාතිකං"** ආදී තන්හි පිටක ශබ්දයෙන් පර්‍යාපත්තිය කියයි වේ. **"අථ පුරිසො ආගචෙජය්‍ය කුදාලපිටකං ආදාය"** **"පිටකෙ නිකඛිත්ත ලොණ මචජ සදිසං එව"** ආදී තන්හි භාජනයක් ද කියයි වේ. පැරණි වෙද මන්ත්‍රයන් නො නැසියදී පරම්පරාවෙන් පරම්පරාවට රැක නැණීමේ ක්‍රමය **පිටක සම්පදා** (පිටක සම්පදා) නමින් පැවැති බව මජ්ඣිම නිකායයෙන් පෙනේ. පර්‍යාපත්ති භාජනාර්ථයෙහි පවත්නා පිටක ශබ්දය විනය ශබ්දය හා සමානාර්ථ (=විනයො ච සො පිටකං චාති) =විනය පිටක නම් වේ. එම විනය පිටකය සම්මා සම්බුද්ධ බැවින් ආඥාවන් පණවන්නට සුදුසුවූ බුදුරජාණන් වහන්සේ විසින් ආඥාවන් බහුල කිරීම් වශයෙන් දෙශනා කළ බැවින් **ආණා දෙසනා** යි ද, බොහෝ වරද ඇති සෙය්‍යසක තෙරුන් ආදී දෙස් බහුල සත්ත්වයන් වරදට සුදුසු පරිදි මෙහි (=විනයයෙහි) හික්ම වූ බැවින් **ඝථාපරාධ සාසන** යි ද, කාය වාග්ද්වාර ඇත්හි හික්මීම් සීමාව ඉක්ම පැවැති අධ්‍යාචාර නම් වූ අපරාධයනට විරුද්ධ වූ කුදු මහත් **සංවර**ය් සංවරයන් කියනලද හෙයින් **සංවරා'සංවර කථා** යි ද කියනු ලැබේ. මෙසේ විනයයෙන් අධිශීල ශික්ෂාව හෙවත් කයින් හා වචසින් කෙරෙන තාක් අකුසලයන්ගේ හික්මවීම් ලබන්වසි. සංකෙලෙශ ධර්මයන්ගේ හෝ තම් කෙලෙසුන්ගේ කායවාග්ද්වාරයන්ගෙන් ප්‍රහාණය වන්නේ යයි විනය පිටකය **ව්‍යතික්‍රමණ ප්‍රහාණ** ද වේ. එසේම ධර්ම—අර්ථ—දෙශනා—ප්‍රතිවෙධ යන චතුර්ප්‍රකාර ගම්භීරත්වයෙන් ද යුක්තය. මේ ප්‍රභෙදය මෙසේම සූත්‍ර-අභිධර්ම පිටකයන්හිද ලැබේ. ඒ මෙසේයි

පිටක	දෙසනා	සාසන	සික්ඛා	පහාණ	ගම්භීර			
					1 ධම්ම	2 අත්ථ	3 දෙසනා	4 පටිවෙධ
1 විනයපිටක	ආණාදෙසනා	ඝථාපරාධ සාසන	අධිසීල සික්ඛා	වීතික්කමප්පහාණ	,,	,,	,,	,,
2 සුත්තපිටක	වොහාරදෙසනා	ඝථානුලොමසාසන	අධිචිත්ත සික්ඛා	පරියුට්ඨානප්පහාණ	,,	,,	,,	,,
3 අභිධම්මපිටක	පරමත්ථදෙසනා	යථාධම්ම සාසන	අධිපඤ්ඤා සික්ඛා	අනුසයප්පහාණ	,,	,,	,,	,,

විනය භෙද

මෙසේ ආණා දෙසනා, ඨපාපරාධ සාසන, අධිසීල සික්ඛා යන නාමාඛ්‍යාතරයන් ගෙන් ප්‍රකට වූ විනය, "විශිෂ්ඨ වූ විශෙෂ ක්‍රම" ඇති යන අර්ථයෙන් හෝ "කය වචන දෙක හික්ම වීම්" අර්ථයෙන් හෝ එකක් වුව ද, සංවර විනය, පහාණ විනය යි දෙවැදෑරුම් ද, 1 සංවර විනය, 2 පහාණ විනය, 3 සමථ විනය, 4 පඤ්ඤත්ති විනය යි සිවු වැදෑරුම්ද වේ. එහි **සංවර විනය** නම්: චක්ඛුරාදි ඉන්ද්‍රිය සංවරයයි, **පහාණ විනය** නම්; **තදඞ්ග** වික්ඛම්භන සමුච්ඡේද පටිපස්සඬ්ධි නිස්සරණ යන කෙලෙශ ප්‍රහාණය පිළිබඳ අවස්ථා පසයි. විනය යෙහි ප්‍රකට සමථ විනය, පඤ්ඤත්ති විනය යන දෙක මෙයට තුඩු දී පවත්නේය.

භික්ෂූන් අතර හටගන්නා විවාදාධිකරණ, අනුවාදාධිකරණ, **ආපත්තාධිකරණ**, කිච්චාධිකරණ යන සිව්වැදෑරුම් අධිකරණයන් සමත් කරනු පිණිස පැණවූ 1 සම්මුඛාවිනය, 2 **සතිවිනය** 3 අමූළ්හ විනය, 4 පටිඤ්ඤාතකරණ, 5 යෙභුය්‍යසිකා, 6 තස්ස පාපිය්‍යසිකා, 7 **තිණවත්ථාරක** යන සත ආකාරයක් සමථාධිකරණය **සමථ විනය** නම් වෙයි. (විස්තර අධිකරණ සමථ යනු බලන්නේය.)

පඤ්ඤත්ති විනය; 1 සුත්ත, 2 සුත්තානුලෝම 3 ආචරියවාද 4 අත්තනොමතියයි සිවුවැදෑරුම් වේ. මිළිඳප්‍රශ්නයෙහි **ආහචවපද, රස, ආචරියවංස, අධිප්පාය** යි පිළිවෙළින් මේ සතර හඳුන්වන ලදී. **සුත්ත** නම් විභඞ්ග, ඛන්ධක, පරිවාර යන භෙද ඇති විනය පාළියයි. මාතිකා යනුදු මෙයට ම ඇතුළත් වේ. **විභඞ්ග** නම් භික්ෂු—භික්ෂුණී වශයෙන් දෙවැදෑරුම් වූ ශික්ෂාපද සමූහය යි. එය පාරාජික පාළි—පාචිත්තිය පාළි දෙ පොත්හි ඇතුළත් වේ. චුල්ලවග්ග පාළි—මහාවග්ග පාළි පොත්හි ආ දෙවිසි කදුවත් **ඛන්ධක** නම්. සොළොස් පරිවාරය **පරිවාර** නම්. එය පරිවාර පාළියෙහි දක්නේය. විභඞ්ග—ඛන්ධකයන්හි නිර්දෙශයන්හට උද්දෙශ වූ ප්‍රාතිමොක්ෂය **මාතිකා** නමු. ඒ වනාහි ඒ ඒ ශික්ෂාපදයන්හි **නිදාන**, පුග්ගල, වත්ථු, අඞ්ග, පදභාජනීය, තිකදුක පරිවෙජ්ද, ආපත්ති, අනාපත්ති, අන්තරාපත්ති යන නිර්දෙශපදයන්ගේ උත්පත්ති ස්ථානයෙහි හෙවත් **මාතෘ** ස්ථානයෙහි සිටි හෙයින් **"මාතිකානි උද්දෙසෙ සොහි නිද්දෙසපදානං ජනනිඨානෙ ඨිතත්තා මාතා විය මාතිකා"** යන විග්‍රහය අනුව මාතෘවක් බඳුනුයි මාතිකා නම් වන්නිය. එය භික්ෂු—භික්ෂුණී යනුවෙන් දෙවැදෑරුම් වේ. **පාතිමොක්ඛ** යනුදු මෙහි මැයි.

ප්‍රාතිමොක්ෂය සහ එහි ප්‍රභෙද

"පාතිමොක්ඛන්ති යන්තං අතිමොක්ඛං අතිපමොක්ඛං උත්තමං සීලං, පාති වා සුග්ගතිං හයෙහි මොක්ඛන්ති දුග්ගතිං හයෙහි යො වා නං පාති තං මොක්ඛෙතීති පාතිමොක්ඛන්ති වුච්චති" යන ආචාර්ය මතය අනුව උත්තම ශීලය ප්‍රාතිමොක්ෂය යි. යමෙක් මෙය රක්නේද ඔහු අත්තානුවාද පරානුවාදදීන් හා සියලු සංසාර දුකින්හි මුදනුයි ප්‍රාතිමොක්ෂ නම් වේ. එය ද අවවාද ප්‍රාතිමොක්ෂය—ආඥා ප්‍රාතිමොක්ෂයයි දෙවැදෑරුම් වේ. අවවාද ප්‍රාතිමොක්ෂය උදෙසන්නාහු ලොවු තුරා බුදුවරයෝම වෙති. දීර්ඝායුෂ්ක බුදුවරු ශාසන පර්‍යන්තය දක්වා අවවාද ප්‍රාතිමොක්ෂය ම උදෙසති. ආඥා ප්‍රාතිමොක්ෂය භික්ෂූන් විනා බුදුවරයෝ නො ම උදෙසති. අල්පායුෂ්ක බුදුවරුන් ප්‍රථම බොධියෙහිම අවවාද ප්‍රාතිමොක්ෂය උදෙසන බැවින් ගෞතම බුදුරජාණන් වහන්සේද විසි අවුරුද්දක් පමණ කාලය තුළ අවවාද ප්‍රාතිමොක්ෂය උදෙසූහ. අවවාද ප්‍රාතිමොක්ෂය නම් පහත සඳහන් ගාථාත්‍රය පමණකි.

ඛන්තී පරමං තපො තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා
න හි පබ්බජිතො පරූපඝාති
සමණෙ හොති පරං විහෙඨයන්තො

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං
එතං බුද්ධාන සාසනං

අනුපවාදෝ අනුපඝාතෝ—පාතිමොක්ඛෙ ච සංවරෝ
මත්තඤ්ඤුතා ච භත්තස්මිං—පන්තඤ්ච සයනාසනං
අධිචිත්තෙ ච ආයොගෝ—එතං බුද්ධාන සාසනං

ආඥා ප්‍රාතිමොක්ෂය නම්; භික්ෂු භික්ෂුණීන්ගේ සදෙස වූ කායවාක් සමාචාරයෙහි දශවිධ **අකුසස්** සලකා "මෙනම් වරදෙහි මෙනම් ඇවැතයයි" පැණ වූ ආපත්ති විධි ඇති භික්ෂු භික්ෂුණීන් විසින් අඩ මසක් පාසා උදෙසිය යුතු ප්‍රාතිමොක්ෂයයි. ශික්ෂාපද පැණවීමෙන් පසු ආඥා ප්‍රාතිමොක්ෂය ම උදෙසනු ලැබේ. අපිරිසුදු පිරිස්හි බුදුරජාණන් වහන්සේ අවවාද ප්‍රාතිමොක්ෂය නො දෙසත බැවින් පාමොක් උදෙසීම භික්ෂූන්ට ම **නියම කරති.** එවක් පටන් භික්ෂුහු ආඥා ප්‍රාතිමොක්ෂය ම **උදෙසති.**

ප්‍රාතිමොක්ෂය; ශීල ප්‍රාතිමොක්ෂය, ග්‍රන්ථ ප්‍රාතිමොක්ෂය කියා ද දෙවැදෑරුම් වේ. **"පාතිමොක්ඛ සංවර සංවුතෝ විහරති"—"ආදිමෙතං මුඛමෙතං පමුඛමෙතං කුසලානං ධම්මානං තෙන වුච්චති පාතිමොක්ඛං"** ආදී තන්හි ශීල ප්‍රාතිමොක්ෂය හෙවත් ප්‍රාතිමොක්ෂ සංවරශීලය සඳහන් වේ. **"උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන සඞ්ගහිතානි හොන්ති"** යනාදී තන්හි ග්‍රන්ථ ප්‍රාතිමොක්ෂය ම ගැණේ. ඒ ග්‍රන්ථ ප්‍රාතිමොක්ෂය; භික්ෂු—භික්ෂුණීන්ගේ වශයෙන් දෙවැදෑරුම් වේ. එහි 1 නිදානුද්දෙස, 2 පාරාජිකුද්දෙස, 3 සඞ්ඝාදිසෙසුද්දෙස, 4 අනියතුද්දෙස, 5 විත්ථාරුද්දෙස යන උද්දෙස පසකින් යුක්ත වූයේ භික්ෂු ප්‍රාතිමොක්ෂය යි. අනියතුද්දෙසය හැර සෙසු උද්දෙස සතරින් යුක්ත වූයේ භික්ෂුණී ප්‍රාතිමොක්ෂයයි. භික්ෂුණීන් කෙරෙහි අනියත ශික්ෂාවන් නො ලැබෙන බැවින් අනියතුද්දෙසය ද නො ලැබේ. **නිදානුද්දෙසය** නම්; **"සුණාතු මෙ භන්තෙ සඞ්ඝෝ"** යනාදීන් ප්‍රකාශිත ප්‍රබඛකරණ, ඤත්තිකම්මවාචා, පත්තකාලයන් ඇතුළත් නිර්දෙශයයි. මෙසේ ම සතර පාරාජිකාවන් ඇතුළත් වූයේ පාරාජිකුද්දෙස ද, තෙළෙස් සඞ්ඝාදිසෙසයන්ගෙන් යුක්ත වූයේ සඞ්ඝාදිසෙසුද්දෙස ද, දෙවැදෑරුම් අනියතයන්ගෙන් අවසන් වූයේ අනියතුද්දෙස ද වේ. **"අවසෙසං සුත්තෙන සාවෙතබ්බං"** යි ප්‍රකාශිත නිස්සග්ගිය, පාචිත්තිය, සුඛපාචිත්තිය, සෙඛියා, පාටිදෙසනීය, අධිකරණ සමථ යන මෙතෙක් සඞ්ග්‍රහ කරණ ලද උද්දෙසය **විත්ථාරුද්දෙස** නම් ද වේ. මෙසේ අඩ මසක් පාසා උදෙසිය යුතු දෙසිය විස්සක් ශික්ෂාපදයන් ඇතුළත් වූයේ භික්ෂු **ග්‍රන්ථ ප්‍රාතිමොක්ෂ** ද, තුන්සිය සතරක් ශික්ෂාවන්ගෙන් යුක්ත වූයේ **භික්ෂුණී ග්‍රන්ථ ප්‍රාතිමොක්ෂ** ද වන්නේය. ග්‍රන්ථ පාතිමොක්ඛ නමින් හඳුන් වන්නේ මේ ශික්ෂාපද සමූහය යි.

විභඞ්ග ප්‍රාතිමොක්ෂ නමින් හඳුන්වන ඒ ශික්ෂාපද සමූහය විස්තර වශයෙන් බෙදා දක්වන හෙයින් පාරාජික—පාචිත්ති පොත් දෙක **උභය විභඞ්ග** නමින් හඳුන්වනු ලැබේ. මෙහි විභඞ්ග ශබ්දයෙන් කියවෙනුයේ විස්තරයයි. උභය විභඞ්ගයෙහි ඒ ඒ ශික්ෂාපදයන්ගේ වත්ථු-නිදාන-පුග්ගල-පඤ්ඤත්ති-අනුපඤ්ඤත්ති-ආපත්ති-අනාපත්ති යන වාරයන් විස්තර කරන ලදී. භික්ෂූන් උදෙසා පැණ වූ ශික්ෂාපද සමූහය **"මහා විභඞ්ග"**—**"භික්ඛු විභඞ්ග"** යි ද, භික්ෂුණීන් උදෙසා පැණ වූ ශික්ෂාපද සමූහය "භික්ඛුණී විභඞ්ග" යි ද, නම් වේ. **පාරාජික පාළිය**; පාරාජික, තෙරසක, අනියත, තිංසක යන මේ භෙදයන්ගෙන් යුක්තය. **පාචිත්තිය පාළිය** භික්ෂු—භික්ෂුණී යන විභඞ්ග දෙකකින් සහ 1 බුද්ධක, 2 පාටිදෙසනීය, 3 සෙඛියා, 4 අධිකරණ සමථ, 5 පාරාජික, 6 සත්තරසක, 7 නිස්සග්ගිය, 8 බුද්ධක, 9 පාටිදෙසනීය, 10 සෙඛියා, 11 අධිකරණ සමථ යන ඛණ්ඩ එකොළසකින් ද යුක්තය.

ඛන්ධක නමින් ගැණෙනුයේ මහාවග්ග – චුල්ලවග්ග නම් පොත් දෙකයි. එයින් මහාවග්ග පාළිය; 1 මහාඛන්ධක (=පබ්බජ්ජා ඛන්ධක) 2 උපොසථක්ඛන්ධක, 3 වස්සූපනායිකක්ඛන්ධක, 4 පවාරණාක්ඛන්ධක, 5 චම්මක්ඛන්ධක, 6 භෙසජ්ජක්ඛන්ධක, 7 කඨිනක්ඛන්ධක, 8 චීවරක්ඛන්ධක, 9 චම්පෙය්‍යක්ඛන්ධක, 10 කොසම්බක්ඛන්ධක යනුවෙන් ඛන්ධක දශයකින් යුක්තය. ඛන්ධකයන්ට ඇතුළත් දෙවෙනි ග්‍රන්ථය වූ චුල්ලවග්ග පාළිය; 1 කම්මක්ඛන්ධක, 2 පාරිවාසික

කඛ්ඛික 3 සමූච්චයකඛ්ඛික, 4 සමථකඛ්ඛික, 5 බුද්ධ වත්තුකඛ්ඛික, 6 මෙතාසනකඛ්ඛික, 7 සඞ්ඝ භෙදකඛ්ඛික, 8 වත්තකඛ්ඛික, 9 පාතිමොක්ඛඛ්ඛික, 10 භික්ඛුණී ඛන්ධක, 11 පඤ්චසතිකකඛ්ඛික 12 සත්තසතිකකඛ්ඛික යන මෙයින් යුක්තය.

පරිවාර

විභඞ්ග, ඛන්ධකයන්හි දක්නා ශික්ෂාවන් සොළොස් වැදෑරුම් පරිවාරයකින් යුක්තවූ බැවින් **පරිවාර** නම් වූ, විනය පිටකයෙහි අවසාන ග්‍රන්ථය වන පරිවාර පාළිය; 1 පඤ්ඤත්තිවාර, 2 කතාපත්තිවාර, 3 විපත්තිවාර, 4 සඞ්ගහවාර, 5 සමුට්ඨානවාර, 7 සමථවාර, 8 සමූච්චයවාර යන මහාවාර අටකින්ද, මේ අවම ප්‍රත්‍යය වශයෙන් ගෙන නැවත අවම වාරයකින්ද දක්වන ලදී. මෙසේ පරිවාර පාළිය ප්‍රධාන වාර සොළසකින් යුක්තය. එහි අනිකුදු අතුරු භෙද රාශියකි. ඛන්ධක-විභඞ්ග-පරිවාර යන භෙදත්‍රයක් ඇති විනය පිටකයට අයත් ග්‍රන්ථ **සුත්ත** නාමයෙන් ව්‍යවහාර කරති. එය මෙහි දක්වූ පරිදි පොත් පසකින් යුක්තය.

සත්තර මහා ප්‍රදේශ

පඤ්ඤත්ති විනයට අයත් ඉතිරි භෙදත්‍රයයෙහි (1 **සුත්තානුලොම**, 2 ආචරියවාද, 3 අත්තනොමති) **සුත්තානුලොම** නම්; සත්තර මහා ප්‍රදේශ සි. එසද ඛන්ධකය-සුත්තනාමය සි දෙවැදෑරුම් වේ. විනය පිළිබඳ විනිශ්චයකදී ඛන්ධකයන්හි එන මහා ප්‍රදේශ සත්තර ද, ඛණ්ඩ පිළිබඳ විනිශ්චයකදී සුත්‍රාත්තයෙහි එන මහා ප්‍රදේශ සත්තර ද ප්‍රමාණකොට ගත යුත්තේය. **ආචරිය වාද** නම්; පන්සියයක් මහරහතන් වහන්සේ විසින් තබනලද අර්ථ කථාවයි. **පාළිමුත්තක විනය, ඔකාසනතික විනිච්ඡය** යනුද එයට ම කියති. **අත්තනොමති** නම්; තුන් පිටකයට අයත් අටුවාවන්හි **ආ චෙරවාදය** වේ. මෙතෙක් මුද්‍රණය නොවූ "**විනයාළඳ සමුච්චය**" නම් ග්‍රන්ථයේ අත්තනොමතිය මෙසේ හඳුන් වන්නේය. "සූත්‍ර අටුවා අභිධම් අටුවා විනය අටුවායෙහි ආවාවූ ත්‍රිපිටක චූළාභයාදී සියලු තෙරුන්වහන්සේගේ වාදය අත්තනොමති නම් වෙයි දතයුතු." මෙයින් අත්තනොමතියට වඩා ආචරිය වාදය ද; එයට වඩා සූත්‍රානුලොමය ද; එයට ද වඩා සූත්‍රය ද බලවත් වේ. සූත්‍රය ධරමාන බුදුන් වැනීය. එබැවින් සූත්‍රය හා සමවේ නම් සූත්‍රානුලොමය ගතයුතුය. නැත නොගත යුතුය. **කප්පිය-අකප්පිය; ආපත්ති-අනාපත්ති;** ගරුක-ලහුකාදී සියලු විනිශ්චයයෙහි ද, **ශික්ෂාපද** සහ ශික්ෂාපද විභඞ්ගයෙහි ද දක්ෂභාවය උදෙසා මේ සත්තරාකාර විනය දත යුත්තේය. මේ සත්තරින් සමවන්නාවූ **කරුණ කරණුත්තරියතා** නම් වන්නීය.

විනයධර භික්ෂුව

මෙසේ විනය දත් ආචාර්‍යවරයා සෙසු කරුණු තුනකින්ද යුක්ත විය යුතුය. එනම්; **1 සියලු විනය පිටකය මනාව දැන සැක රහිතව උගත යුතුය. 2 විනයයෙහි ප්‍රතිමා සිවිය යුතුය. 3 ආචාර්‍ය පරම්පරාව මනාව දැන ගත යුතුය.** මේ කරුණුවලින් යුක්තවූයේ **නියම** විනයධරයා වේ. මෙහි **1 සියලු විනය පිටකය උගැන්ම නම්**; එහිය විනඞ්ග, ඛන්ධක, පරිවාරයන් මනාව ප්‍රගුණ කොට, ධාරණය කොට, ගුරු පා සෙවණෙහි පෙළ අටුවා දෙක අස්වා කිසිතැනෙක සැකයක් නැති අයුරු විනිශ්චය කොට උගැන්මයි. **2 විනයයෙහි සිවිය යුතුය** යන දෙවෙනි ලක්ෂණය නම්; විනයයෙහි ලජ්ජී භාවයෙන් පැවැත්මයි. අලජ්ජී පුද්ගල තෙමේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති බහුශ්‍රුත ලාභ ගරුකව පෙළ වෙනස් කොට ධර්මය අධර්මය කොට විනය අවිනය කොට **සඞ්ඝයා** අතර කලහ ඇති කෙරෙයි. ලජ්ජී පුද්ගල තෙමේ ශික්ෂාකාමී වූයේ සිය දිවි නැසුණු නමුදු පෙළ නො නසයි. ධර්මය ම, විනය ම පවසයි. බුඩවචනය ම ගරු කරයි. තමන් වෙත පැමිණෙන සියලු ප්‍රශ්නයන්හි නො සැලෙයි. තැති නො ගණියි. රන් බඳුනෙහි සිහ තෙල් මෙන් පුරුදු පුහුණු කළ විනය නො නැසිය දී රැක ගණියි. මේ පුද්ගල තෙම විනයයෙහි සිවියේ නම් වෙයි. තුන්වැනි ලක්ෂණය වූ ආචාර්‍ය පරම්පරාව මනාව දැනීම නම්; 3 "**මාගේ ගුරුවරයා අසුවල් ගුරුවරයාගෙන් උගත්තේය. ඒ ගුරුවරයා අසුවල් ගුරුවරයාගෙන් උගත්තේය යි**" තමන්ගේ ආචාර්‍ය පරම්පරාව උපාලි මහරහතන් වහන්සේ දක්වා ගළපා, උන්වහන්සේ ලොවුතුරා බුදුන් වෙත උගත්හයි කිය හැකි පරිදි **ථෙර නරඞ්ගම**, ආචාර්‍ය පරම්පරාව දැනගැණීමයි. මේ විනයධරයාගේ ලක්ෂණත්‍රයයි.

ඒ අනුව ලක්දිව ධම්—විනය පරම්පරාව මෙසේය.



ක්‍රි: පූ: 88 වළගම් අබා රජු දවස මාතලේ අලු ලෙණදී ධම්—විනය දෙක ග්‍රන්ථාරූඪ කරනලදී.

* * *

මෙසේ බුබ වර්ෂයෙන් 236 වැන්නෙහිදී ලක්දිව රජය කර වූ දෙවන පැතිස් රජු දවස මිහිඳු මහරහතන් වහන්සේ විසින් ධම්—විනය දෙක ලක්දිවට ගෙන එන ලදී. සඞ්ගායනා තුනකින් පරිශුද්ධ, සම්පූර්ණ පැවැති නමුදු මහා අරිට්ඨ තෙරුන්ගේ ප්‍රධානත්වයෙන් සහ දෙවන පැතිස් රජුගේ සහායයෙන් ථූපාරාම චෛත්‍යාසන්නයෙහිදී නැවැත වරක් ධම්—විනය දෙක සඞ්ගායනා කළහ. මේ ධම් සඞ්ගායනාව ලක්දිව බුද්ධාගම ස්ථිරව පිහිටීමේ ලකුණක් විය.

අට්ඨකථා

ධම්—විනය දෙක පිළිබඳව බුදුරදුන් වදාළ විස්තර දේශනාව **"අට්ඨකථා පාළිය"** යි ධම් සඞ්ග්‍රාහක මහරහතන් වහන්සේ විසින් සම්මත කරන ලදී. සමන්තපාසාදි කාවෙහි[1] එය මෙසේ දක්වේය.

"ආචරියවාදෙ නාම ධම්ම සඞ්ගාහකෙහි පඤ්චහි අරහන්ත සන්තෙහි ඨපිතා පාළි විනිමුත්තා ඔක්කන්තනිත්‍ය විනිච්ඡයප්පවත්තා අට්ඨකථා නාම"

මෙසේ **ආචරියවාද** යනුවෙන්වූ හඳුන්වන විස්තර දේශනාව ඇතුළත් අර්ථකථා පාළිය **මහා අට්ඨකථා** නම් වූවාය. සමන්තපාසාදිකාවෙහි[2] **"කතමා මහා අට්ඨකථා සරීරං"** යනුවෙන්වූ ධම්පියා අටුවා ගැටපදයෙහි[3] **"එයට බුදුකැලි මහඵුවා ඇත් නොවැ?"** යනුවෙන්වූ විස්තර වනුයේ ඒ **මහා අට්ඨකථාව** ය. මෙසේ සඞ්ගායනා තුනට ම නැඟුණු මේ **මහා අට්ඨකථාව** මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලක්දිවට ගෙන එනු ලැබ පරපුර තොසිඳ රැකෙන්නා ලද්දේ පසුකලෙක රැක ගැනීමේ හෝ පතුරුවා හැරීමේ හෝ පහසුව සලකා ඒ (මහා අට්ඨකථාව) සිංහලයට ද නඟනු ලැබුවාය.

"පරම්පරා භතා තස්ස—නිඤ්ඤා අට්ඨවණ්ණනා
යා තම්බපණ්ණි දීපම්හි—දීපභාසාය සඞ්ගතා"

යි කියන ලද්දේ මේ නිසාය. මෙය ඉතා පැහැදිලිව විනයාලංකාර කතිෘ[4] මෙසේ කියයි.

---

1. ස: පා: 162 2. ස: පා: 1 3. ධ: අ: ගැ: 5 4. වි: ලං: 14

"මහා අට්ඨකථා නාම සඞ්ගීතිත්තයං මාරුළහා තෙපිටකඤ්ච බුඛවචනඤ්ච අට්ඨකථා, සා මහා මහින්දත්ථෙරෙන තම්බපණ්ණිං දීපං ආහතා තම්බපණ්ණියෙහි ථෙරෙහි පඨමා සිහළභාසාය අභිසඞ්ඛතා ච හොති"

සිංහලයට නැගූ මහා අට්ඨකථාව හෙළවුවා නම්නුදු අදුන්වන ලද්දී ක්‍රි: ව: 10 වන ශත වර්ෂය තෙක් පැවැති නමුදු ඉන් පසුව අභාවයට ගියා සේය. බුඛඝොෂාචාර්‍යපාදයන් විසින් ශාස්ත්‍රීය කරගන් මේ මහා අට්ඨකථාව සෙසු ආචාර්‍යවරයන් ද විසින් ප්‍රමාණ කරනු ලැබුවාය. මෙයින් උපුටා ගත් පාඨ ක්‍රි: ව: 909—919 අතර රජය කරවූ පස්වන කසුප් රජුගේ ධම්පියා අටුවා ගැටපදයේ* තන්හි තන්හි දක්නේය. මේ මහා අට්ඨකථාව සිංහලයට නැගූ කාලය අවිනිශ්චිත නමුදු එය වළගම් අභා රජුගෙන් පසුව වූ බවට සාක්ෂ්‍ය සමන්තපාසාදිකාවේ[1] (හේ: වි: 338) ඇත.

අටුවාවක් වනාහි 1 බ්‍යඤ්ජනාසීසය, 2 පදානුගතාසීසය, 3 නිදානය, 4 වසතුය, 5 සම්බන්ධය යන පඤ්චප්‍රකාර වර්ණනාවන්ගෙන් යුක්ත ය. ඒ අනුව පසු කල ලක්දිව විසූ ආචාර්‍යවරයෝ ද අටුවා ලියූහ. එයින් **1 මහා පච්චරියට්ඨ කථා, 2 කුරුන්දට්ඨ කථා, 3 අන්ධකට්ඨ කථා, 4 සඞ්ඛෙපට්ඨ කථා** යන සතර ප්‍රධාන ය. මේ අටුවාවන්ගේ කර්තෘ කාලාදිය පිළිබඳ තොරතුරු ප්‍රකට නැත. මහා අට්ඨකථා, මහාපච්චරියට්ඨකථා සහ කුරුන්දට්ඨකථා යන තුනම සිංහල අටුවා නමැයි බුඛඝොෂාචාර්‍යපාදයෝ සමන්ත පාසාදිකා[2] අවසානයේ කියති. මහාපච්චරී—කුරුන්දී අට්ඨ කථාවන් ගෙන් උඛෘත පාඨයන් ධම්පියා අටුවා ගැටපදයෙහි හෝ නො දක්නා බැවින් ඒ වන විට මේ පොත් භාවිත නො වූ සේය. සිඛවළඳ විනිසෙහි එක් තැනෙක කුරුන්දී අටුවාව සඳහන් වුවද එය සමන්ත පාසාදිකාවේ කුරුන්දට්ඨකථාවේ දක්නා මතයක් සිඛවළඳ විනිසෙහි දැක්වීමකි. මේ අටුවාවන් ගෙන් බුඛඝොෂාචාර්‍යයන් විසින් පිළිනන්නා ලද්දේ මහා අට්ඨකථා, මහාපච්චරියට්ඨකථා සහ කුරුන්දට්ඨ කථාවය. සඞ්ඛෙපට්ඨකථා මතය ද සමහර තැන දැක්වූ නමුදු අන්ධකට්ඨ කථාව පිළි ගත්තේ නැත. එය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කළහ. අන්ධකට්ඨ කථාව කවරකු විසින් රචිතදැයි අවිනිශ්චිත ය. එහෙත් දක්ෂිණ භාරතීය ආන්ධ්‍ර දෙශීයයකු විසින් රචිත බවට ප්‍රබල සාක්ෂ්‍යයක් සමන්තපාසාදිකාවේ "යම්පන අන්ධකට්ඨකථාසු අපරිකප්පිතෙන පමුඛෙ අනාපත්තීති තුම්යං විනා ජනපියං පමුඛං සද්ධාය කථිතන්ති වුත්තං, තං අන්ධකරට්ඨෙ පාථෙක්කං සන්නිවෙසා එකච්ඡදනා ගබ්භ පාලියෝ සද්ධාය වුත්තං, තං නෙව අට්ඨකථාසු අත්ථි, පාළියං න සමෙති"[3] යනු වෙන් දක්නේය. මෙය තෙළිඟු බසින් ලියන ලදැයි සමහර පඬිවරුන්ගේ[4] මතයයි. එසේ අදහස් කරන්නේ දැන් ආන්ධ්‍රයේ භාෂාව තෙළිඟු නිසා විය හැකිය. ආන්ධ්‍රදෙශයේ බුඛ ධර්මය ව්‍යාප්ත වූ බව සත්‍ය නමුදු, එසේ ම දකුණු ඉන්දියානු පඬිවරයන් බෞද්ධ පත පොත ලියූ නමුදු අන්ධකට්ඨ කථාව ආන්ධ්‍ර භාෂාවෙන් රචිතය යනු පිළිනැණීම දුෂ්කරය. මෙහි දැක්වූ බොහෝ මත නො පිළිගත යුතුයයි බුඛඝොෂාචාර්‍යපාදයෝ අවවාද කළහ. ඒ නිසා මෙය ථෙරවාදයෙන් බාහිර වූ අන්‍ය නිකායිකයන්ගේ අර්ථකථාවක් බව පිළිගත යුතුය.

අශොක රජුගේ අභාවයෙන් පසු මෞර්‍ය අධිරාජ්‍යය ක්‍රමයෙන් පිරිහිණි. එබැවින් ගොදාවරි කෘෂ්ණ නදී අසල ප්‍රදෙශයට පමණක් සීමා වී පැවැති ආන්ධ්‍රරාජ බලය වහා වහා පැතිරෙන්නට විය. මෙහි ප්‍රතිඵලය වූයේ ඩෙක්කානය, අමරාවතිය, ගන්ටාර් දිස්ත්‍රික්කය, හයිද්‍රාබාද්, නාසික් ආදී පළාත් ද ආන්ධ්‍ර බලයට යටත්වීමය. අඛණ්ඩ සම්පූර්ණ රාජබලයක් ලද ආන්ධ්‍රරාජ්‍යය ක්‍රි: පූ: 235 සිට ක්‍රි: ව: 225 අතර කාලය හෙවත් අවුරුදු 450 ක් පමණවූ කාලය තුළ පැවැත්තේය. ආන්ධ්‍ර රාජබලය පැතිරී යෑමෙන් පසු ඒ ඒ පළාත්වල හටගත් බෞද්ධ නිකායයන් අන්ධක නමින් හැඳින් විණි. අන්ධකයෝ නම්; පුබ්බසෙලීය, අපරසෙලීය, රාජගිරික, සිද්ධත්ථික යන මේ නිකායිකයෝ ය.

---

* ධ අ: ගැ: 5, 7, 51, 79, 80, 103, 105, 111, 115, 121, 122, 132, 136, 149, 149 පිටු.

1. ස: ප්‍රා: 338 2 ස: ප්‍රා: 1056 3. ස: ප්‍රා: 545, 546 4. Early History of Buddhism in Ceylon P. 12

කියනලදී කථාවත්ථු[1] අටුවායෙහි; "අභිධම්මාගතා පුබ්බසෙලියා අපරසෙලියා රාජගිරියා සිද්ධත්ථිකා පධානා උපපන්නා නිකායා" යි. මේසේ නිසා අන්ධකට්ඨ කථාව අන්ධකයන්ගේ හෙවත් පුබ්බසෙලීයාදි නිකායිකයන්ගේ විනයාර්ථ කථාවය යි සලකනු සුදුසු ය. ථෙරවාදීන්ට මෙන්ම අනිකුත් නිකායිකයන්ට ද පිටකත්‍රයට මෙන් ම අට්ඨකථාවන් තුබුණු බව මෙහිදී අමතක නොකළ යුතුය. බුදු කාලයේදී ධර්මය පැහැදිලි කරනු පිණිස අටුවාවන් උවමනා නොකළද, උන්වහන්සේ පිරිනිවීමෙන් පැ පසු ධර්මය ප්‍රචාරය කිරීමේ පහසුව උදෙසා එක් එක් ආචාර්‍ය පරම්පරාව මඟින් බොහෝ අටුවා ග්‍රන්ථ නිපදවන ලදී. මෙසේ පළමුවන ධර්මසඞ්ගායනාවෙන් පසු ධර්ම-විනය උදෙසා නිපද වූ අටුවා පොත් ආචාර්‍ය පරම්පරාවල මතානන්තර අනුව බොහෝ වෙනස් විය.

මහාපව්වරිය ආදී සිංහල අටුවාවෝ විනය පිටකය කෙරෙහි බල පෑහ. මිහිඳු හිමියන් ලක්දිව වැඩමවා මෙහි බුද්ධශාසනය පිහිට වූ තැන් සිට අවුරුදු සත්සියයකට ආසන්න කාලයක් (ක්‍රි: පූ: 259 සිට ක්‍රි: ව: 412) මහා අට්ඨකථාව ඇතුළු අටුවාවන්ගෙන් මෙරට ජනතාව ධර්ම-විනය අවබෝධ කර ගත්තාය. මෙසේ තිබියදී ක්‍රි: ව: 412-434 අතර රජය කරවූ මහානාම රජු දවස මෙහි පැමිණි අරිට්ඨ ආචාර්‍යයන් බුද්ධඝෝෂ හිමියන් නිසා අමුතුම කාලපරිවේදයක් මෙ රටට උදාවිය. උන්වහන්සේ අනුරාධපුරයට එළඹ මහා විහාරයෙහි සඞ්ඝපාල සවාමීන් වෙතින් පෙළ-අටුවා දෙක විශේෂයෙන් උගෙන මහා සඞ්ඝයා වහන්සේගේ අනුදැනීම ඇතිව අටුවා පොත් කිපයක් ම පාළි භාෂාවෙන් ලියූහ. එවක මෙරට පැවැති සිංහල අටුවාවන්ගේ ආශ්‍රයෙන් ද, සවයං ලිඛිත වශයෙන් ද පාළි අටුවා ලියමින් ලක්දිව පාළි සාහිත්‍යයේ උද්දීපනය ආරම්භ කළහ. මේ පිළිබඳව මහාචාර්‍ය මල්ලසේකර මහතාණන්[2] මෙසේ කියයි.

> "ලංකාවෙහි පාළි සාහිත්‍යය පිළිබඳ සවර්ණමය යුගය ආරම්භ වූයේ බුඩඝෝෂාචාර්‍යයන්ගේ මේ ශාසන සංග්‍රහයන්ගෙන් බව කිය යුතුයි. උන්වහන්සේගේ කෘතීන් නිසා පාළිභාෂාව අති ව්‍යාප්තියට පැමිණියාය. බුඩඝෝෂාචාර්‍යයන් අනුගමනය කිරීමෙහි ලොල් වූ බොහෝදෙන පාළිභාෂාවෙහි ප්‍රවීණත්වයක් ලැබ ආගමික වූ ද, ශාස්ත්‍රීය වූ ද නොයෙක් ග්‍රන්ථයන් අපළබසින් නිපද වූහ. පාළි ඉගෙනීමේ ආශාව හා ඊට දක්වනලද ගෞරවය කෙතරම් දියුණුවිද යත්? ලෙළදිවි බස යටපත් කොට පාළිභාෂාවෙන් ම සිතිය අදහස් ප්‍රකාශ කිරීම තමන්ගේ පරමාර්ථය බැව් සිංහල ග්‍රන්ථ කර්තෘවරයෝ නිතියව මී කීහ. මෙතැන් සිට අවුරුදු 200 ක් පමණ ඉකුත්වන තුරු ලක්දිව කිසිද ග්‍රන්ථයක් සිය බසින් නොගොතන ලද බව පෙනේ."

විනය පිටකයට සමන්තපාසාදිකා නම් අටුවාව ද අභිධම්ම පිටකයට අත්ථසාලිනී, සම්මොහ විනෝදනී අටුවා දෙක සහ පඤ්චප්පකරණට්ඨ කථාව ද, කළු බුඩඝෝෂාචාර්‍යපාදයෝ සූත්‍රපිටකයේ ප්‍රධාන පෙළ පොත් සතරට ද, අටුවා ලියූහ. උන්වහන්සේ පළමුව ම මෙහිදී ලියූ විශුද්ධිමාර්ගය පිටකත්‍රයට ම සාධාරණ වූ අතර සූත්‍රපිටකය පිළිබඳව ගුරු පොතක් ද වැනි විය. පසුකාලයෙහි විසූ ධම්මපාල ආදී ආචාර්‍යවරයෝ සූත්‍රපිටකයේ ඉතිරි පොත්වලම අටුවා කළහ. ඒ සියල්ල පිළිබඳ කතා කාලාදිය පහත සඳහන් පට්ටිකාවෙන් දන්නේය.

---

1. කථාව: අ: 116 2. The Pali Literature in Ceylon. P. 94

1 විනය පිටකය.

පෙළ		අටුවාව	කර්තෘ		කාලය	
උභය විභඞ්ග	1 පාරාජික පාලි 2 පාචිත්තිය පාලි	1 සමන්තපාසාදිකා (විනය අට්ඨකථා)	බුද්ධඝොෂ ආචාර්ය		5 වන ශතය	
ඛන්ධක	3 චුල්ලවග්ග පාලි 4 මහාවග්ග පාලි					
පරිවාර	5 පරිවාර පාලි					
භික්ඛු පාතිමොක්ඛ භික්ඛුණී පාතිමොක්ඛ		කඞ්ඛාවිතරණී (මාතිකාඨකථා)	”	”	”	”

2 අභිධම්ම පිටකය.

1 ධම්මසඞ්ගණිප්පකරණ	1 පරමත්ථදීපනී සංඛ්‍යාත මූලටීකා	අත්ථසාලිනී	”	”	”	”
2 විභඞ්ගප්පකරණ		සම්මොහ විනොදනී	”	”	”	”
3 කථාවත්ථුප්පකරණ						
4 පුග්ගල පඤ්ඤත්තිප්පකරණ						
5 ධාතුකථාප්පකරණ		පරමත්ථ දීපනී (පඤ්චප්පකරණට්ඨ කථා)	”	”	”	”
6 යමකප්පකරණ						
7 පට්ඨානප්පකරණ						

3 සූත්‍ර පිටකය

1 දීඝ නිකාය	1 මූලටීකා සංඛ්‍යාත මූලටීකා	සුමඞ්ගල විලාසිනී	”	”	”	”
2 මජ්ඣිම නිකාය		පපඤ්ච සූදනී	”	”	”	”
3 සංයුත්ත නිකාය		සාරත්ථප්පකාසිනී	”	”	”	”
4 අඞ්ගුත්තර නිකාය		මනෝරථපූරණී	”	”	”	”
5 ඛුද්දක නිකාය						
1 ඛුද්දක පාඨ		පරමත්ථ ජෝතිකා	”	”	”	”
2 ධම්මපද		”	”	”	”	”
3 උදාන		පරමත්ථ දීපනී	ධම්මපාල	”	”	”
4 ඉතිවුත්තක		”	”	”	”	”
5 සුත්තනිපාත		පරමත්ථ ජෝතිකා	බුද්ධඝොෂ	”	”	”
6 විමානවත්ථු		පරමත්ථ දීපනී	ධම්මපාල	”	”	”
7 පෙත වත්ථු		”	”	”	”	”

පෙළ	අටුවාව	කර්තෘ		කාලය
8 ථෙර ගාථා	පරමත්ථ දීපනී	ධම්මපාල	,,	,, ,,
9 ථෙරී ගාථා	,,	,,	,,	,, ,,
10 ජාතක	පරමත්ථජෝතිකා	බුද්ධඝෝෂ	,,	,, ,,
11 නිද්දෙස (චූල—මහා)	සද්ධම්මපජ්ජෝතිකා	උපසේන	,,	6 වන ශ: ව:
12 අපදාන (ථෙර—ථෙරී)	විසුද්ධ ජන විලාසිනී	මහානාම	,,	7 වන ශ: ව:
13 පටිසම්භිදා	සද්ධම්මපකාසිනී	ධම්මපාල	,,	5 වන ශ: ව:
14 බුද්ධවංස	මධුරත්ථප්පකාසිනී	බුද්ධදත්ත	,,	,, ,,
15 චරියාපිටක	පරමත්ථදීපනී	ධම්මපාල	,,	,, ,,
——	විසුද්ධිමග්ග	බුද්ධඝෝෂ	,,	,, ,,
නෙත්තිප්පකරණ	නෙත්ති අට්ඨකථා	ධම්මපාල	,,	,, ,,
චතුභාණවාර පාළි	චතුභාණවාර අට්ඨකථා	ආනන්ද වනරතන	,,	8 වන ශ: ව:

මෙසේ උභය විභඞ්ග—ඛන්ධක—පරිවාර නම් වූ විනය පිටකයට ම බුද්ධඝෝෂාචාර්‍ය පාදයෝ සමන්තපාසාදිකා නම් වූ අට්ඨකථාව ද, භික්ඛු භික්ඛුණී පාතිමොක්ඛයට මාතිකට්ඨකථාව ද, සැපයී මෙන් විනය පිටකය අටුවාවන්ගෙන් සම්පූර්ණ කළහ. ත්‍රිපිටක උන්වහන්සේ විනය අටුවාව ලියද්දී පුරාණ සිංහල අටුවාවන්ගේ ආශ්‍රයෙන් සව මතාභාතරද දක්වමින්, පර මතයන් ඛණ්ඩනය කරමින් ඉතර මතයන් විවෙචනයට භාජනය කරවූහ. ප්‍රධාන වශයෙන් එබඳු කරුණු ආශ්‍රය කර ගත්තේත් (1) මහා අට්ඨකථා, (2) මහා පච්චරියට්ඨකථා, (3) කුරුන්දට්ඨකථා, (4) සංඛෙපට්ඨකථා, (5) අන්ධකට්ඨකථා යන මේ අටුවා ය. මේ සියල්ලෙහිම ප්‍රමාණවත්ම යන් සලකා ලද්දේ මහා අට්ඨකථාව ය. ඒ ඒ තැන අටුවාවන්හි ආ මතානන්තර සමඟ සසඳමින්, සමන්තපාසාදිකාව ලියද්දී ඒ පැරණි අටුවාවන් පිළිබඳව මැදහත් විවෙචනයක් කළහ.

සියලුම අටුවාවලට සාධාරණ මතයක් මී නම් එබඳු තැන "අට්ඨකථාසු වුත්තං" යි[1] කිහ. බොහෝ තැන කුරුන්දි-මහාපච්චරී මත පිළිනත් නමුදු සමහර තැන ඒ දෙමතයම ප්‍රතික්ෂේප කොට මහා අට්ඨකථා මතය මි[2] පිළිගත්හ. මහා අට්ඨකථා මතය පිළිනත්තේ ද පෙළ හා සම්කර[3] බැලීමෙනි. සම්කර නැතොත් දී මහා අට්ඨකථා මතය වුවද නො පිළිගෙන අනෙක් අටුවාවක[4] ආ

(1) සා: පා: 190, 203, 215, 224, 229, 230, 238, 249, 252, 261, 273, 325, 338, 353, 332, 383, 508 509, 520, 522, 528, 535, 542, 546, 567, 600, 639, 680, 688, 068, 069, 886, 865, 896, 918 994 පිටු.

(2) සා: පා: 203, 215, 224, 229, 230. 237, 272, 273, 276, 279, 281, 306, 335, 358, 375, 382, 387 388, 389, 395, 407, 452, 453, 858, 464, 479, 503, 520, 532, 526, 527, 528, 541, 542, 546 549 550, 558, 557, 565, 566, 567, 508, 578, 589, 597, 600, 601, 602, 606, 607, 608, 609 628, 637; 638, 636, 654, 660, 661, 663, 668, 680, 667, 688, 747, 769, 779, 788, 814, 815 821, 823, 824, 842, 861, 878, 905, 906, 911, 916, 936 පිටු.

(3) සා: පා: 202, 203; 215, 226; 230; 349; 252; 260; 261; 280; 353, 363; 378; 382; 383; 388, 389 406; 411; 412; 419; 430; 452; 479; 498; 515; 525; 535; 543; 553; 566; 578; 597; 600; 602 607; 609; 624; 637; 654; 664; 686; 748; 755; 756; 758; 762; 765; 778; 788; 814; 815; 823 824; 833; 864; 865; 871, 878; 879; 890; 892; 900; 906; 907; 918; 920; 930; 931; 994 1028 පිටු.

(4) සා: පා: 224; 229; 260; 276; 325; 341; 358; 353 පිටු.

(5) සා: පා: 486; 505, 509; 516; 545; 557; 724; 725; 761; 773; 776; 787; 794; 797; 814; 815; 835 පිටු

1 සා: පා: 831. 2 සා: පා: 249; 383; 758. 3 සා: පා: 271; 680. 4 සා: පා: 383.

මතය පිළිගත්ත. එහෙත් මහා අට්ඨකථාවෙහි නොවී නම් සෙසු අටුවාවන්හි දක්නේ නමුදු[1] නොපිළිගත්ත. ඒ අතර ප්‍රමාද ලිඛිත පාඨ මහා අට්ඨකථාවෙහි පවා දක්නා[2] බව ද එසේ ම මහා අට්ඨකථාවෙහි නොපිළිගත යුතු[3] නැන් ඇති බව ද කීහ. සමහර තැන මහාපච්චරී—කුරුන්දී අටුවා ද, සමහර තැන මහාපච්චරී—සඞ්ඛෙපට්ඨ කථා ද[4] සම්මත කළහ. එසේ ම මහාඅට්ඨකථාවෙහි ද මහාපච්චරියෙහි ද, කුරුන්දියෙහි ද නොපිළිගත හැකි[5] නැන් ඇතැයි පෙන්වූහ. ඒ අතර කුරුන්දට්ඨ කථාවේ සමහර මත වෙනම වෙසෙසා දක්වා ඒ පිළිබඳව[6] කිසිවක් නොකීහ. අඞ්ක කථාව සෙසු අටුවාහා නොගැලපෙන[7] බව ද, එසේ ම එහි දක්නේ[8] දුර්ගෝමිත බව ද එබැවින් නොපිළිගත යුතුයයි[9] අවවාද කළහ. එහෙත් එහි සමහර මත විවෙචනයට භාජන කළ නමුදු ප්‍රතික්ෂෙප[10] නොකළහ.

මේ පැරැණි අටුවා ග්‍රන්ථ පමණක් නොව පැරැණි ආවාසී මතද සමන්තපාසාදිකාවෙහි දක්නේය. යම් යම් කරුණු පිළිබඳව දැක්වූ ආවාසී මත අතර (1) මහා පදුම (2) මහා සුමම (3) චූළසුමම (4) උපතිස්ස (5) ආභිධම්මික ගොදත්ත (6) කරවික්කතිස්ස (7) මහාසීව (8) චූළසුමම (9) තිපිටක චූළනාග (10) සඞ්ඝ රක්ඛිත (11) චූළ සුමන (12) අභය (13) මහාතිස්ස යන ආවාසීවරයන්ගේ නම් දක්නේය. ඉතුදු මහාපදුම-මහාසුමම ආවාසීවරයන්ගේ අදහස් වැඩියක් දක්වා ඇත්තේ ය. මේ ආවාසීවරයෝ ද උපතිස්ස තෙරුන්ගේ සහ චූළසුමම තෙරුන්ගේ ශිෂ්‍යයෝ වූහ. මහා පදුම තෙරුන්ගේ මතය දක්වන තැන මහාසුමම තෙරුන්ගේ මතය ද, උපතිස්ස තෙරුන්ගේ මතය දක්වන තැන චූළසුමම තෙරුන්ගේ මතය ද සමහර තැන මේ ආවාසී මත සතර ම ද එක තැන[14] දක්වූහ. මේ පමණක් නොව දීඝභාණක—සංයුත්ත භාණක—මජ්ඣිම භාණකයන්ගේ[15] මතද දක්වා ලූහ. "බාහිර නිදාන වණ්ණනා" නමින් ලියූ දීඝ ප්‍රඥාවභාසිනී ලංකා ශාසනවංශයද, ආවාසීපරම්පරාදීඝ ද විස්තර කළ සමන්තපාසාදිකා ඒකාය අටුවාව මහානාම සිරිනිවාස නම් රජුගේ රාජ්‍යයෙන් විසිවන අවුරුද්දෙහි පමන්ගෙන එක් අවුරුද්දක්හි නිම කළහ.

බුඩඝොෂාචාර්‍යපාදයන් හා සමකාලීනයයි සලකනා බුඩදත්ත ආචාර්‍යපාදයන් විසින් "විනය විනිච්ඡය" සහ "උත්තර විනිච්ඡය" ලියන ලදී. බුඩඝොෂ—බුඩදත්ත ආචාර්‍යවරයන් ගෙන් කවරෙක් පැරැණි දැයි මතභේදාත්මක ප්‍රශ්නයකි. "සමන්තපාසාදිකාව" සහ "විනය විනිච්ඡය" සසඳා බලනවිට පෙණෙනුයේ "සමන්තපාසාදිකාමේ" ගද්‍යයෙන් කියන විනිශ්චය "විනය විනිච්ඡය"යේ පද්‍යයෙන් කියන බවයි. "විනය විනිච්ඡය" සොළීරට භූත මඞ්ගල නම් විහාරයේදී ලියන ලදී. "උත්තර විනිච්ඡය" බොහෝදී රචිත දැයි සඳහන් නොවතුදු සඞ්ඝපාල තෙරුන්ගේ ආරාධනයෙන් රචිත බැවින් එය ලක්දිව දී ලියූවා විය හැකිය. සමන්තපාසාදිකා—විනය විනිච්ඡය දෙපොත මහා විනාරිය භික්ෂූන්ගේ විනය නීති රීතින් ගද්‍යයෙන් සහ පද්‍යයෙන් විස්තර කළ පොත්ද? නැතහොත් විනය විනිච්ඡය; සමන්තපාසාදිකාවේ නිදාන කථාදී විස්තර

---

1 ස: පා: 542. 2 ස: පා: 224; 231; 440. 3 ස: පා: 280. 4 ස: පා: 215; 462; 453; 476; 815; 824; 878. 5 ස: පා: 520; 557; 249. 6 ස: පා: 748; 755; 756; 762; 765; 834. 7 ස: පා: 465; 516; 545; 557; 725. 8 ස: පා: 505; 776. 9 ස: පා: 734; 761; 787; 797. 10 ස: පා: 773; 794; 814; 815; 834.

(1) ස: පා: 188; 189; 203; 266; 280; 337; 340; 381; 383; 388; 398; 422; 439; 464; 469; 493; 519 532; 602; 608; 641; 777; 781; 785; 864; 873; 876; 908; 926 පිටු.

(2) ස: පා: 188; 189; 266; 280; 340; 381; 383; 384; 398; 422; 439; 466; 469; 493; 500; 519; 528 602; 638; 609; 641; 777; 781; 785; 868; 873; 876; 908; 926 පිටු.

(3) ස: පා: 188; 326; 353; 470; 471; 899; 986 පිටු. (4) ස: පා: 188; 326; 470; 471; 519; 899 පිටු.
(5) ස: පා: 221; 341; 422 පිටු (6 ස: පා: 781; 816; 864; 466 පිටු. (7) ස: පා: 516; 816; 843 පිටු.
(8) ස: පා: 663. (9) ස: පා: 663. (10) ස: පා: 466; 781; 816; 864. (11) ස: පා: 220.
(12) ස: පා: 609; 663; 988. (13) ස: පා: 464. 14 ස: පා: 469; 470. 15 ස: පා: 297.

හැර අවශ්‍ය විනිශ්චය පමණක් පද්‍යයට නැඟුවක් දැයි විමසිය යුතුය. කෙසේ වතුදු සමහර තැන දක්නා සුළු සුළු වෙනස්කම් හැර මේ පොත් දෙකම එකම ගුරු පරපුරක සමකාලීන උනැන්වීම් ය.

අනුරාධපුර රාජධානි යුගය අවසන් වන තුරු භික්ෂූහු බාහිර ශබ්ද ශාස්ත්‍රාදියෙන් ඇත්වී පෙළ—අටුවා දෙක හදාළහ. පැරණි රජවරුන්ගෙන් ද මේ පිණිස ලැබිය යුතු අනුබල නොඅඩුව ලැබුණේය. පොළොන්නරු යුගයේ අවසාන භාගයේ විසූ සාගරමති දිඹුලාගල, කාශ්‍යප, ගාථාදූත ආදී මහා පඬිවරුන්ගේ ජීවිතවලින් කැපී පෙණෙන ලකුණු අනුරාධපුර යුගයේ විසූ භික්ෂූන් වහන්සේගෙන් දක්නේය. කතිකාවතක සවරූපය ගන්නා මිඹින්තලා සන්නස පොළොන්නරු දඹදෙණි කතිකාවත් සමඟ සසඳනවිට එය මැනැවින් පැහැදිලි වේ. බුද්ධඝොෂාචාර්‍යයන්ගෙන් පසු ශත වකි කීපයක් තුළ ධර්ම—විනය ග්‍රන්ථ නිෂ්පාදනයෙහි භික්ෂූහු උත්සාහවත් වූහ. බුදුගොස් තෙරුන්ට නුදුරු ශතවර්ෂයෙහි ජීවත් වූ සේ සලකන ධම්මසිරි නම් ආචාර්‍යවරයකු විසින් පාරාජික පාළි-පාචිත්තිය පාළි-චුල්ලවග්ග පාළි-මහාවග්ග පාළි යන විනය ග්‍රන්ථයන්ගේ සාරය කැපිකොට බුද්ධ සික්ඛා (=කුදුසික) නම් පද්‍ය ග්‍රන්ථය ලියන ලදී. මෙය ඉතා සම්භාවිත වූ ග්‍රන්ථයක් විය. පොළොන්නරු කතිකාවතෙහි සහ දඹදෙණි කතිකාවතෙහි ද, කල්‍යාණි ශිලා ලිපියෙහි ද භික්ෂූන් විසින් හදාළ යුතු ග්‍රන්ථයක් මෙන් මෙය දක්වා ඇත. කුදු සික පිළිබඳව **පැළැණ්ණේ සිරි සද්ධිරඤ්ඤ මහා නායක මාහිමියෝ** මෙසේ[1] කියති.

> "අභිධම්ම පිටකයට අභිධම්මාවතාර සංග්‍රහය මෙන් විනය පිටකයට මේ කුදු සික ද අති සංක්ෂිප්ත වූ ද, සර්වඥ සම්පූර්ණ වූ ද, භික්ෂූන් විසින් වාචොද්ගත කොට දරා ගත යුතු වූ ද, ග්‍රන්ථ රත්නයෙකි. අභිධම්මාවතාර සංග්‍රහයෙන් මුළු චිත්ත චෛතසික පරමාර්ථ ප්‍රකරණයෙහි ඇතිතාක් අභිධම්මාවතාරයන් ඉගැන්විය හැක්කා සේ මේ කුදුසිකෙනුත් පඤ්ච විනය පාළීන්හි ම ඇතිතාක් විනයාවතාරයන් සම්පූර්ණ සෙන් උගන්වාදිය හැකි බව කල්‍යාණි ශිලා ලිපියෙන් හෙළි වේ. ලක්දිවින් බුරුම රට බලා ගිය රාහුල නම් විනය විශාරද වූ එක් තෙර නමක් එසේ කළ බව සඳහන් වේ."

"බුද්ධසික්ඛා" අනුගමනයෙන් එම ගුරු පරපුරේ ම භික්ෂුවක විසින් "මූල සික්ඛා" නම් ග්‍රන්ථය ලියැවිණි. ප්‍රමාණවත්වයෙන් කුදුසික පමණ විශාල හෝ එතරම් සම්භාවිත නොවූ මේ ග්‍රන්ථය "මහාසාමි" යන විරුද නාමධාරී භික්ෂුවකගේ කෘතියක් බැව් සමහර පඬිවරුන්ගේ මතයයි. එහෙත් සිඛවළඳ විනිස අවසානයෙහි දක්නා "අටුවා පාඨ උදෙස් බලා සැකෙවින් මුල්ගිඛ සිඛ වළඳ හා සිඛවළඳ විනිස මා විසින් කරන ලද්දෙයි" යන පාඨය ප්‍රමාණවත්වයෙන් ගන්නා සමහරු "මූලසික්ඛාව" සිඛවළඳ විනිස කතෘගේ ම කෘතියක්යයි තර්ක කරති. එසේ නම් මෙහි කාලය ශතවර්ෂ දෙකකින් පමණ තව මැනට එන්නේ ය. නොඑසේ නම් බුදුසික්ඛා-මූලසික්ඛා රචනා කාලය 7-8 ශතවර්ෂ අතරට වැටේ. මේසින් මොබ ශතවර්ෂ දෙක තුළ විනය ශික්ෂාවන් සිංහල යෙන් ලියනතට පෙළඹුණාහ. පොළොන්නරු යුගයේ අවසාන භාගයේදී සංස්කෘත ශබ්දවලින් ගවසා සිංහල පොත් ලියූ නමුදු මේ වකවානුවේහි ලියූ පොත්වල දක්නේ වැඩියක් පාළියෙන් බිඳ ගත් සිංහල ශබ්දයෝ ය. මෙය; සියල්ලම පාළියට නැමීමෙන් සිංහල භාෂාවට වන විපත දැක සිදු වූවක් සේය. ධම්පියා ගැටපදයට (ක්‍රි: ව: 909-919) වඩා යටත්පිරිසෙයින් අඩි ශතවර්ෂයක්වත් පැරණි භාෂා ලක්ෂණ පවසන කඩාවිතරණි ගැටපදය සහ විනය සන්නය ඒ පිණිස ප්‍රබල සාධක යකි. දැනට නාම මාත්‍ර ශෙෂ වූවද උද්ධෘත පාඨවලින් පෙණෙනුයේ මේ පොත් දෙක 8—9 ශතවර්ෂ අතරභාෂා ලක්ෂණ පවසන බවයි. මේ දෙ පොතින් උපුටාගත් පාඨ කුදුසික සන්නයේ තැනින් තැන දක්නේය.

---

1 කුදුසික විවරණය.

(1) i "මේ මැසි පුටු ඇ සහනට දෙමි සි කල ගුරු බඩි වෙසි. නො බෙජිය යුතු සඟිනි පිරිබැජිනි බැවිනි. මෙ ඔඟි හිමියනට වසෙගිනි ගණිනට දෙමි සි කල ගුරු බඩි ඔහොතුපු කෙපෙවෙන බෙජෙසි. වසෙඹිනි ගනිති වටියි දවා කිසෙසිනි කරති දෙස නැති. අයපවත බෙජෙසි හන නො ලැබෙසි. මෙ මැසි පුටු වසෙගිනි ගණිනට සහහව දෙමිසි කී දෙස නැති. පළමි සඟිනි පෙරෙබිජිනි සි කල ගුරු බඩි වෙසි" යනු කංඛා විතරණි ගැටපදසි.

ii "සාමිකෙ අපලොකෙතවා සි බැවින් හිමියන කියෙහි ලති දෙස නැති. එකරුණෙහි බිකිසඟිනි අයති වතුයෙහි ලති දෙස නැති" යනු කංඛා විතරණි ගැටපදසි

(2) i "රජන දෙණි පකිරති, එව නබති සේසි යනුදු අස්වදු කාබාන් ගඟටත් වතාහි වටි යනුදු විනය සන්‍යසි."

ii "වජ පිරිබුලු හෙලි වෙජෙ, සෙති මේ යනුදු විනය සන්‍යසි."

iii "මානම් රුවි ඇති පිළිජි බිතිජි ඇතිරිළිජි මාහම් රුවිති නො ගෙන නනුත් වටි. මාගම් කෙලෙබිරෙති සෙතින් පැහැර පසුල් ගෙන බැවින් බඩුගතිසෙ ජිණිය් කිසි මකින් ඕවය් විකිජිවිය යුතුය යනු විනය සන්‍යසි."

iv "මැජ බිඳැ විළි තුලු කොට බඳුත් නො ම වටි. එක් විළි තුලු බාණින් මැඟිනා පුන පුනා සිසාරා බඳුත් වනාහි වටි යනු විනය සන්‍යසි."

පැරැණි කංඛාවිතරණි ගැටපදයේ ඉහ විනය සන්‍යයෙන් උපුටා කුදුසික සන්නයෙහි දැක්වූ මේ පාඨ භාෂා විලාසය අනුව ක්‍රි: ව: 8—9 ශතවර්ෂ අතර භාෂා තත්ත්වය කියන්නේය. එසේම කුදුසික සන්නයේ දක්නා "පැරැණි කුදුසික සන්‍ය" පාඨ ද, "අටුවා සන්‍ය" පාඨ ද සසඳ බලන විට ඒ පොත් දෙක ද මීට ම නුදුරු කාලයට ගැනේ

(1) i "එසි බව දියවිව දෙවිඟවිව බලතු යුහට සිරවති. එකතියෙනි හරහන වෙළෙ වැනි මිසිනි, බොජුම්නි හුනු යුපයු බැලිය නො ලැබෙයි යනු මෙහි සන්‍යසි."

ii "හොවකැසි මතියෙ එකි පකි වසා මැඬිලි ඇති හොති හිකි පරාළි ඇති හොති පරාළි මතියෙහි එකි දෙනි ඇම් හොති නම් නම් නො වෙයි යනු මෙහි සන්‍යසි."

iii "හිසිහි ඔනට අනුජති පවිවණ කී එව පමණ ඉකුත හොති කොවිව කන්වයි නිකට නො ලැබෙයි සම් කුවරි එව පමණිහි ම කරණි යනු මෙහි සන්‍යසයි."

(2) i "අගඤහඤපි" යනුයෙහිදු ඇවැන් ම කියමින් එවිහු කිඹු හසුන් ම කියනොම් යණ බැවින් කිඹු වෙත්. එවිහු කියන හසුන් පිළිබෙව් කොට කුලුණෙහි සිට නිහි විහින් නමා ම කියම් කියත් හොත් නිරුවැති යනු අටුවා සන්‍යසි."

ii "බැස හෝනා කල්හි දෙර පියස් දෙර ඛිසස් ම හෙවැ දෙර නමා ම වරිති වටි යනු අටුවා සන්‍යසි."

මෙතෙක් පාළියෙන් ම අරුත් කියමින් විස්තර කළ විනය ග්‍රන්ථවලට සිංහලයෙන් අරුත් කිඹන්නට පෙළඹීම නිසා පොළොන්නරු යුගයේ මධ්‍යම භාගයේ දී භාෂා විපර්‍යාසය පිළිබඳ අවු තුම මනකම් වැටුණේය. පළමුව ගැටපද හෝ සන්‍ය පමණක් සිංහලයෙන් ලියූ නමුදු එහි අවසාන ප්‍රතිඵලය වූයේ "සිඛවලඳ හා සිඛවලඳ විනිස" වැනි සම්පූර්ණ පොත් පවා සිංහලයෙන් ලිවීම ය. පොළොන්නරු යුගයේ අවසාන භාගයේ සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථ ආශ්‍රයෙන් සිංහල සාහිත්‍යය ද; සංස්කෘත වචන සෙදීමෙන් සිංහල භාෂාව ද, පොෂණය කළ නමුදු මේ යුගයේ

මධ්‍යම භාගය ගත්තේ ඊට ඉදුරාම වෙනස් මහතිි. ක්‍රී: ව: 9 වන ශතවර්ෂයේ අවසානයේ ලියැවුණ පස්වන මිහිඳු රජුගේ මිහින්තලා ශිලා ලිපියේ විනය පිටකය හදාරන භික්ෂු සඞ්ඝයා වහන්සේට විශෙෂයෙන් සංග්‍රහ කළ බව දක්නේය. එම සන්නසෙහි ම "සිඛාකරණියි කියූ සෙයින්" යන පාඨයෙන් එවක පැවැති එනම් විනය ග්‍රන්ථයක ශික්ෂාවන් භික්ෂූන් වහන්සේට සිහිපත් කරවති. මිහින්තලා සන්නසෙහි කියන "සිඛාකරණියෙහි" එන සිවුරු හඳින මෙරවන පිළිවෙළ සිකවලඳ විනිසෙහි ද මෙසේ උපුටා දක්වා ඇත.

> "මෙහි සිඛාකරණි නම් කවරහ යත්? සැකෙවින් කියනෙමි. මඩු අතු ලෙන් අටඟුලක් දණ මඬලෙන් බහා එමෙන් සෙ හසුන් කන් තබා එක් කෙළ වරෙකින් නො එල්වා අවට ඇත්තා කොට හැන්ද යුත්තේයි. අවට ඇති කොටැ හඳහා සැඳෑ වැරැදූ අවට නැති වුව වරද නැති. අවට නැත්තා කොට සිවුරු පොරොවී නම් දුකුලා වේ. හැත් පිටැ ළිඳ කොටු සෙයින් දෙකෙළවරින් සමකොටැ වම් දණින් පත් පිටු බහාලා එක් කෙළවරකින් නොඑල්වා අවට ඇති කොටැ පෙරැවියැ යුත්තේයි."

මේ පාඨය සිඛවළඳ විනිසෙහි ඇතුළත් වූයේ කවත්පිරිසෙසින් මිහින්තලා සන්නසින් අවූ රැු පණසකින්වත් පුරාණයෙහි "සිඛාකරණිය" නාවිතවූ බැවිනි. මේ "සිඛාකරණිය" නම් අඹුතු පොතක් නොව ප්‍රාතිමොක්ෂයේ සෙඛියා කාණ්ඩයේ සිංහල විවරණය බව සමහර පඬිවරුන් ගේ මතයයි. මෑතකට කථාවේ "සීඛාකාණ්ඩණියි" නමින් විසතර වන්නේ මේ "සිඛාකරණිය" බැව් ඒ පඬිවරුන්ගේ අදහසය. කෙසේ වුවද ප්‍රාතිමොක්ෂය සහ එහි විවරණයක් සිංහලයෙන් ලියූ විනය ග්‍රන්ථයක් එවක පැවැති බැව් මෙයින් පැහැදිලි වේ.

ක්‍රී: ව: 10 වන ශතවර්ෂයේදී ලියූ සේ සලකන "සිඛවළඳ හා සිඛවළඳ විනිස" එක ම කතෘ වරයකුගේ කෘතියක්යයි සිඛවළඳ විනිස අවසානයෙහි දක්නේය. "අඹුවා හාඪ උදෙස් බලා සැකෙවින් මුල් සිඛ සිඛවළඳ හා සිඛවළඳ විනිස ම විසින් කරන ලද්දේයි" යන මේ පාඨයෙන් මූල්සිඛ (=මූලසික්ඛා) ද එම කතෘගේ ම යයි සමහර පඬිවරු කියති. එසේ නම් මූල්සික (=මූල සික්ඛා) සිංහල පරිවර්තනය සිඛවළඳ විය හැකිය. මූල්සික හා සිඛවළඳෙහි එතරම් ළඟ සම්බන්ධ යක් ද ඇත්තේ ය. එහෙත් පොළොන්නරු කතිකාවතෙහි "මූල්සික සෙඛියා" කියා ද, ක්‍රී: ව: 16 වන ශතවර්ෂයෙහි ලියූ හංස සන්දෙශයේ "මූණ්සික සිකවිළඳ" කියා ද යෙදී ඇති බැවින් සිඛ වළඳ විනිස අවසානයෙහි සහ මේ හංස සන්දෙශ පාඨයෙහි දක්නා "මුල්සික" යනු එනමින් යුත් පොත (=මූලසික්ඛා) නොව "සිඛවළඳ" යනුයෙහි විශෙෂණයක් විය හැකිය. එසේ ගනුන් වඩා සුදුසු සේය. නො එසේ නම් අතිශයින් සම්භාවිත වූ ද, රාජ නීයමයෙන් පවා භික්ෂූන් වීසින් උගත යුතුයයි නියම් කළා වූ ද, කුදුසික ජයවර්ධනපුර අවධියෙහි අභාවිත වූ සේ සිතන්නට සිදු වේ. එහෙත් එය එසේ නොවූ බවට කල්‍යාණී ශිලා ලිපිය සාක්ෂ්‍ය දරයි. මූලුසිකට වඩා කුදුසික හැම අතින්ම සම්භාවිතයැ. එබැවින් හංස සන්දෙශ පාඨයෙන් හා සිඛවළඳ විනිස අවසාන පාඨ යෙන් කියන මූල්සික (=මූන්සික) ප්‍රාළි මූලසික්ඛා නම් ග්‍රන්ථය නොව "සිඛවළඳ" යනුයෙහි මේ විශෙෂණයකි මෙහි පළමුව සඳහන් මතය හවගත්තේ නොබෝදා මුද්‍රණය වූ පොතක පැරණි සිඛවළඳ විනිස අවසාන පාඨය වෙනස් කිරීම නිසාය. සිඛවළඳ විනිස පොළොන්නරු කතිකා වතෙහි ද සඳහන් වේ. 12 වන ශතවර්ෂයේ භාෂාවෙන් ලියන්නද මෙරණ සිඛ ද පොළොන්නරු කතිකාවතෙහි සඳහන් වන බැවින් එය මහ පැරකුම්බා රජුගේ භාසන ශුද්ධියෙන් අවුරුදු පණස කටවත් පැරණි විය යුතුය.

පොළොන්නරු යුගය අවසාන භාගයේදී රටේ පැන නැඟුණු අන්‍යතර කොලාහල සහ පරසතුරු උවදුරු හිසා බුඩශාසනයත් සිංහල ජාතියත් ධර්ම—විනය ශබ්ද ශාස්ත්‍රාදියත් පිරිහීමේ පත්විය. 11 වන ශතවර්ෂයේ හරි අඩක් මෙසේ උවදුරු අතරින් ගෙවී ගියේ ය. ක්‍රී: ව: 1058 දී

රජ පැමිණි මහළු විජයබාහු රජුගේ අප්‍රතිහත ශාසනය නිසා රාමඤ්ඤ රට අනුරුබ රජු වෙත දූත යන් යවා උපසපන් භික්ෂූන් මෙහි වැඩමවා පිරිනි තුබු සසුන සඟහා තැබීය. මේ රජුගේ අභාවයෙන් පසු නැවැත්ත ද පිරිහෙන්නට වන්නේ ය. ක්‍රි: ව: 1153 රජ පැමිණි මහා පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍යොදය වනතුරු අඩි ශතවර්ෂයක් පමණ කාලය තුළ ආභ්‍යන්තරික කලබල නොඅඩුව පැවැත්තේය. එතුමා රජ පැමිණි විගස දිඹුලාගල මහකසුප් හිමියන්ගේ සහාය ලැබ සඩ්ඝාසනය වක් පවත්වා නිකායත්‍රය සමඟි කරවා, දහස් ගණන් වෙහෙර විහාර තනවා, රටද සශ්‍රීකකොට බුදුසස්න ද තන්පත් කරවීය. එසේ ම නොඅඩුකුත් ධර්මශාස්ත්‍රීය ග්‍රන්ථකරණයෙහි පසුවන් යෙදවිය. බුදුසස්න තහා තබා භික්ෂු ශ්‍රාමණේරයන්ගේ ධර්ම—විනය ශුනය දියුණු කරනු පිණිස මහා පරාක්‍රමබාහු රජතුමා දූරු එත්සාඟය එතුමාගේ මේ පොළොන්නරු කතිකාවතින්* පැවසෙන් සේය

> .....ශ්‍රමණදෙවු තෙරවරුන් විසින් තම තමා නිසා වත අනෙතාවාසික සඞ්විහාරිකයන් අතුරෙහි නිහ දෙන්නට තිබයෙන් මිදෙන්නව යොග්‍යවැ වසන්න වුන් පමා නොවියැදි ග්‍රන්ථධුරයෙහි යොදා සැවැත්පිරිසෙසින් විනයෙහි කුදුගිඩ හා පාමොක්ද සුතඞ්ග දසධර්ම සූත්‍රය අනුමාන සූත්‍රය ද මහපොත් පිටි හෙළිහැ නොදී ගණසංගණිකාදීන් දුරුකොටැ ග්‍රන්ථධුරයෙහි යෙදෙන්නවුන් විසිනුදු සතතයෙන් විවෙකවත් පිරුව මැනැවැයි වදාළ බැවින් තුන් වෙලෙහි ඉරියව් (සුමනා) සිල් පිරිසුදු කොටැ කංඛියාසි ආදි වූ කම්පිහනෙක්හි යෙදි දෙතුන් ලඟක් හුණු ගන්වා දවස තඹ නොකෙරුම විවෙකවත් පුරවා "අතනාන මෙව පඨමං පතිරූපෙ නිවෙහයෙ"යි වදාළ බැවින් තම තමා ද මෙහි ගුණාඞ්ගයෙහි වෙහෙසින් යෙදි අත්වැඩ පරවැඩ සාධමින් කී (වදාළෙන්) ග්‍රන්ථ ධුරයෙන් වැඩි ශක් කොටැ ගත නොහෙන අනෙතාවාසික සඞ්විහාරිකයන් ලවා මුල්යඩ හෙඞ්ගා වනපොත් කරවා ඔඩවළඳ විනිස අල්මා සමසින් සමස ආදායන කොටැ සුමහා විහාර තැනැක කියන්නට පොහොසත් කරවා දසධර්ම සඟහනයෙන් මෙනෙහි කරවා යැව කී විවෙක වතුදු පුරවා ශකතී පමණින් හදරා නිමිකලැ චරිකානුකූල කම්මඨානක් උගන්වා විදර්ශනා ධුරයෙහි මැ යොදා චතුඅවපජඤ්ඤ කථායෙහි වදාළ පරිද්දෙන් දවස් හවනු කොටැ පැවැත්විසැ යුතු හෙරණුදු හෙරණහිම සෙඞ්ගා දසධර්ම සූත්‍රත් වන පොත් කොටැ අහා නොපිරිහෙළා පරිහරණ කරනු කොටැ යොදා විවෙකවතුදු පුරවා හික්මැ විසැ යුතු"..... ..

මේ රජ කුමාගේ සියලුම ශාසනොපකාරී කටයුතුමල ප්‍රමුඛස්ථානය දූරු දිඹුලාගල මහා කාශ්‍යප හිමියෝ ද, උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව ද නොයෙකුත් ධර්මශාස්ත්‍රීය ග්‍රන්ථ නිෂ්පාදනය කළහ. මහාකාශ්‍යප හිමියෝ සමන්තපාසාදිකා විනයටඨ කථාවට සන්නයක් ලියූහ. මේ අටුවා සන්නය දැන් දක්නට නැත. කුදුසික සන්නයේ සහ කංඛාවිතරණී පිට පොතෙහි අටුවා සන්නයකින් උඩරණය කළ පාඨ කිහිප තැනක ම දක්නේය.

i 'බහුම්හනිහ පංසුම්හා යතුවාහි බහූ ශබ්දය යෙහුයාය පරියා යයි උදකෙන යනු ඉදිව ආසින් ම දසිනා දියෙන් අතක් නොතක පැහැර හී තෙමේ හොතුදු වටි සෙයි යනු අටුවා සන්නයි."

ii අගතඞ්ගාදි යනුයෙහිදු ඇවැත් ම කියමින් එවිහු කියූ හසුන් ම කියනෙමි යන බැවින් කියූ වෙත්. එවිහු කියන හසුන් හිළිඹව් කොටැ කුලුණෙහි සිවැ නිසි විසින් තමා ම කියම් කියත් හොත් නිරවැති යනු අටුවා සන්නයි."

---

* Epigraphia Zeyalanica Vol. III P- 18

මේ පාඨවලින් කියවෙන අටුවා සත්‍යය මහාසුප් භික්ෂූන්ගේ අටුවා සත්‍යය නොවිය හැකිය. උන්වහන්සේගේ කාලයට වඩා පැරණි භාෂාවක ලක්ෂණ මෙහි දක්නා ඛැවිනි. සමන්ත පාසාදිකාවට ලියූ "අටුවා ගැටපදඤ්ච" ද වූ බව කඞ්ඛාවිතරණී පිට පොතෙහි සඳහන් වේ. එමතු නොව විනයටඨ කථාවට මූල ගණ්ඨි පද, මජ්ඣිම ගණ්ඨිපද, මහාගණ්ඨි පද යනුවෙන් සිංහලයෙන් ලියූ ගැටපද තුණක් ම වියහැ[1] සාරත්ථදීපනී විනය ටීකාවේ කියවී. මෙහි පළමුව කී අටුවා ගැටපදය පාලියෙන් ලියූවකි. එහෙත් කඞ්ඛාවිතරණී පිටපොතේ එක් තැනක සිංහලයෙන් ලියූ අටුවා ගැටපදයකින් උඩරණය කළ පාඨ ඇත. සමන්තපාසාදිකාව මෙසේ සත්‍ය හා ගැටපද කිපයකින් ම පොෂණය වූ අතර ටීකා ග්‍රන්ථයන්ගෙන් ද පොෂිත වූවාය. වජිරබුද්ධි තෙරුන් විසින් ලියූ වජිරබුද්ධි ටීකාව ඉන් පළමුවැන්නය. මෙහි කාල නියමය අවිනිශ්චිත නමුදු සාරත්ථදීපනී විනය ටීකාවට වඩා මෙය පැරණි බැවින් මහා පරාක්‍රමබාහු රජුගේ රාජ්‍යොදයට ඉතුරු කාලයෙහි ලියූ සේ සලකනු ඉඳුරුසු ය. කඞ්ඛාවිතරණී පිටපොතෙහි ද සඳහන් වන මේ ග්‍රන්ථය වජිරබුද්ධි (=වජ්‍රබුද්ධි) ටීකාව ලක්දිව පඬුවන් විසින් අතිසම්භාවිත ය. සමන්තපාසාදිකාවට ලියූ දෙවන ටීකාව සාරත්ථදීපනියයි. දිඹුලාගල මහාකාශ්‍යප හිමියන්ගේ ශිෂ්‍ය, සාගරමතී යන අපර නාමයකින් ද හෙබි එක ශ්‍රැතීන් තෙක ග්‍රන්ථ ධාරණයෙහි සමර්ථ වූ ශාරීපුත්‍ර සඞ්ඝ රාජයන් වහන්සේ විසින් මෙය ලියන ලදී. මහා පරාක්‍රමබාහු රජු විසින් පොළොන්නරුවෙහි තනවන ලද ජේතවන විහාරයෙහි වැඩ වෙසෙමින් බොහෝ ශිෂ්‍යයනට ධර්මශාස්ත්‍රාදිග්‍රහණය කරවන අතර භාෂාන්තරය පිළිබඳ පොත් රාශියක් ලියූ මේ මහා පඬිවරයාණෝ අභිධර්මාර්ථ සංග්‍රහ සන්නයෙහි දී තමන් වහන්සේගේ තත්ත්වය මෙසේ පවසති.

"යං වත්ථෙ වඤ්ඤතං නිසිතතරමතීං පාණිතිං පාණිනීයෙ
සබ්බසම්ං තක්කසත්ථෙ පටුතර මතයො කත්තුභූතං'ව තන්තං
මඤ්ඤුනෙත කාලිදාසං කව්‍යජනඤදයා නන්දහෙතූ කවිනෙත
සාසං ලොකසස සිඞ්ං විතරතු රවනා තසස සාරී සුතසස.

ලක්දිව සඞ්ඝරාජ පදවිය ද දරූ මෙතුමන් ලියූ විනය ග්‍රන්ථ අතර "සාරත්ථදීපනී විනය ටීකාව" "පාළි මුත්තක විනය විනිච්ඡය" එම ටීකාව සහ "විනය සඞ්ගහ" ආදී ග්‍රන්ථයෝ වෙති. "විමති විනොදනී" නමින් සමන්තපාසාදිකාවට තුන්වන ටීකාවකුදු ලියන ලදී. එය දෙවන පැරකුම්බා රජු දවස වැඩ විසූ චොළිය කාශ්‍යප සඞ්ඝරාජ ස්වාමීන්ගේ කෘතියක් සේ සලකති. "විනය විනිච්ඡය ටීකාව" ලියනු පිණිස අයැදුම් කළ පිරිස අතර මේ චොළිය කාශ්‍යප තෙරුන්ගේ නම ද දක්නේය. විමති විනොදනී ටීකා කතෘහු ශාරීපුත්‍ර සඞ්ඝරාජ ස්වාමීන්ගේ මත නිදිය ලෙස විවෙචනය කර නුසුදුසු තැන් කිපයක් පෙන්වති. අභය ගිරිකයන්ගේ මත ද, විනය ගණ්ඨි පදවල ආ මත ද එසේම විවෙචනය කරන්නේ ය ඉසු කාලයෙහී විසූ සමඟර ආචාර්යවරයන් විසිනුදු සාරත්ථදීපනියට වඩා "වජිරබුද්ධි ටීකාව" සම්භාවිත විය. කඞ්ඛාවිතරණී පිටපොත" ලියූ ආචාර්යවරයන් විසින් එසින් කරුණු උපුටා ගැන්ම එයට හොඳ සාධකයකි. ශාරීපුත්‍ර ස්වාමීන්ගේ ම ශිෂ්‍යයකු වූ පොළොන්නරු පශ්චිමාරාම චොළකුලාභත්‍ථ පරිවෙණවාසී බුද්ධනාග තෙරුන් විසින් "විනයත්ථ මංජූසා" නම් කාඞ්ඛාවිතරණී ටීකාව ද, දිඹුලාගල මෙධඞ්කර තෙරුන් විසින් "විනයාර්ථ සමුච්චය" ද ලියන ලද්දේ මීට ඉතුරු කාලයේ ම ය. විනය පිළිබඳ පෙළ—අටුවා දෙකට ම ලියූ සත්‍යයක් වන "විනයාර්ථ සමුච්චය" පෙසලතිපපහම් යන අපර නාමයකිනුදු හඳුන්වති.

මහ පැරකුම්බා රජුගේ රාජ්‍යොදය බුඩඝාෂාචාර්යයන් මෙන් ම ධර්ම—විනය ශබ්ද ශාස්ත්‍රයන්හී උද්දීපනිය පිණිස ද, ජාතියේ ගෞරවය සහ උරුමයේ සංවර්ධනය පිණිස ද ඉවහල් විය. එතුමාගෙන් පසු හටගත් ආභ්‍යන්තරික කලබල අතරින් අර්ධ ශතවර්ෂයක් පෙර හිය පසු පොළොන්නරුවෙන්

1 සාර: දී: 12

දඹදෙණියට රාජධානිය වෙනස් විය. දඹදෙණි රාජධානිය ඇරඹීමින් සමග ම එහි රජ පැමිණි දෙවන පැරකුම්බා රජතුමා ද, මහ පැරකුම්බා රජු මෙන් ශාසනය නහා තබා ධර්ම—ශාස්ත්‍රීය දියුණුව පිණිස උත්සාහ දැරීය. විදෙශවලින් ධර්ම-විනයධර පඬිවරයන් ගෙන්වා නානා ග්‍රන්ථකරණයෙහි යෙදවීය. එමතු නොව එවක සුප්‍රසිද්ධව සිටි සඞ්ඝරක්ඛිත සවාමීන්ගේ පා සෙවේණෙහි හිඳ තමන්දුටු ධර්ම—විනය ශබ්ද ශාස්ත්‍රාදිය හදාරන්නේය. ශාසනයේ විරසථිතිය පිණිස ද, භික්ෂු ජීවිතයේ ප්‍රතිපත්ති ගරුත්වය පිණිස ද, රජතුමා කෙබඳු ක්‍රියා මාර්ගයක් අනුගමනය කෙළේ ද යනු ආරණ්‍යක මෙඩඹකර මහා සවාමි ප්‍රමුඛ ග්‍රාමාරණ්‍යවාසී සාරක මහා සඞ්ඝයා වහන්සේගේ සහායයෙන් ලියා වූ දඹදෙණි කතිකාවතෙන් පැහැදිලි වේ. එහි කියන පරිදි පැවිද්ද ලබනු කැමැති කුලපුත්‍රයකු විසින් ඇණවුම් සඞ්ඝස්ඝඩ, සතර ඛණවර, ඛවිසියා ප්‍රභුන්නැකොට ලියන කියන සේද උගත යුතු ය. හෙරණහු විසින් හෙරණසිඹ වනපොත් කොට කා ගියා සී සතර කම්වහන් සෙඛියා වතුපාරිශුද්ධි ශීලය ද සකස් කොට වන පොත් කළ යුතුය. මහලු පැවිද්ද ලබනුවන් විසින් මුල්සිඹ කතිකා බණ සකස් කොට වතපොත් තබා සිඹවළඳ විනිස අසා නිම කළ යුතුය. නිග්‍රන්ථ මුකතකයන් විසින් "උභය ප්‍රාතිමොක්ෂ කුදුසිඹ අළුත් සඞ්ග්‍රහ පරිහරණ කරන ව්‍යාකරණ සුතුරු ධාතු පාඨාදීයෙහි අසම්මුසාවැ ඝණ්ඨාවිතරණීය ද වන පොත් කළ යුතුය." දඹදෙණි කතිකාවත කියවනාවිට දෙවන පැරකුම්බා රජු විසින් ශාසන ගෞරවය ආරක්ෂා කරනු පිණිස කෙබඳු උත්සාහයක් ගන්නා ලද්දේ ද යනු සිතාගත හැක. ශාසනා ශුද්ධිය පිණිස ද, පාරිවෙණික අධ්‍යාපනය පිණිස ද, පදනම් කර ගත යුතු නීති පද්ධතියකි දඹදෙණි කතිකාවත. මේ රජතුමා විසින් බුද්ධඝෝෂ තෙරුන්ගේ "විනය විනිච්ඡයට" නිස්සඤ්ඤ නමින් සන්නයක් ලියන ලදී. "වන පිනිස සන්නස" යනුවෙනුදු හඳුන්වන මෙසින් උපුටා ගත් පාඨ කුදුසිඹ සන්නයේ සඟ කඞ්ඛාවිතරණී පිළිපොතෙහි දක්නේ ය. විශුද්ධිමාර්ග සන්නය ලියන ලද්දේ ද මේ රජු විසිනී. විශුද්ධිමාර්ග සන්නයෙන් ලක්දිව විසූ ශ්‍රේෂ්ඨ පඬිවරයකුගේ බුද්ධ වාතුර්ය කියන අතර බොහෝ දර්ශනය අන්‍ය දර්ශනයන් සමග සසඳමින් උගෙනීමට ද මාර්ගය පහදා දෙන්නේය. රජතුමා මේ සන්නය ලියද්දී ග්‍රන්ථ රාශියකින් කරුණු උපුටා ගත්තේය. පෙළ—අටුවා—ටීකාවන් අතර ම බොහෝ සංස්කෘත ග්‍රන්ථ රාශියක් ම එතුමා ඉදිරියෙහි වූයේය. මේ සන්නයට පෙරද විශුද්ධිමාර්ග සන්නයක් විය. එය ද අත්‍යුත්කෘෂ්ට මේ සන්නය ලියන බව රජතුමා ම කියයි. "මේවිත් මතු සන්න පිනා තුබූ සේ ප්‍රසන්න වචනයෙන් ඇතිප්‍රාය පදපිඬි වණ්ණනා කරනු ලැබේ." මේ සන්නයෙහි දී රජතුමා ගුරුකොට ගත්තේ බදරතිත්ථ ධර්මපාල ස්ථවිරයන්ගේ විශුද්ධිමාර්ග ටීකාව ය. පරවාදීන් මිඤ්ඡත්තා නම් වූ මේ විශුද්ධිමාර්ග ටීකාව මෙම බොහෝ න්‍යාය උගෙනීමට ඉවහල් වන අත්කිසි ටීකාවක් නැත. පරවාදීන් බොහෝ න්‍යායයෙන් බැණිනය කරන මේ ටීකාව අති ප්‍රශස්තය. මේ හැර දීඝ නිකාය—වසුබන්ධු—නාගර්ජුන ආදී මහාදාර්ශනිකයන්ගේ කෘතීන් ඇතුන් ද විශුද්ධිමාර්ග සන්නය සැරසී ඇත. දැනට අප අතර අවිද්‍යමාන පොත් රාශියක් ම විශුද්ධිමාර්ග සන්නයේ සඳහන් වේ. මේ සන්නය දෙවෙනි පැරකුම්බා රජු විසින් නොලියන ලදුයි ද, සඞ්ඝරක්ඛිත ස්ථවිරයන්ගේ කෘතියක්හි ද සම්හරු කියති. මේ මතයට තුඩු දෙන සාධක විශුද්ධිමාර්ග සන්නයෙන් මෙන් ම ඓතිහාසික ප්‍රවෘත්තිවලින් ද සොයා ගත්තට පිළිවන. විශුද්ධිමාර්ග සන්නයේ වන විනිස සන්නය සඳහන්වනාබැවින් විශුද්ධිමාර්ග සන්නය පසුව ලියූ බව පිළිගත යුතුය. මේ පොත් දෙක එකම කතුවරයකුගේ නමුදු දැනට අප ඉදිරියේ ඇති වනවිනිස සන්න පාඨ කිපය; විශුද්ධිමාර්ග සන්නය සමඟ සසඳනවිට පෙණෙනුයේ දෙවිධියක භාෂා සම්ප්‍රදායකි. ග්‍රන්ථ කර්තෘවරයකුගේ කෘතියක හෝ කෘතිවල සාධාරණ භාෂා සම්ප්‍රදායයක් විය යුතුයයි නීතියක් පැණවිය නොහැකි වුව ද, අදුනා ගත නොහැකි තරම් සම්ප්‍රදාය පිළිබඳ අනතරයක් ද නොවිය යුතුය. විශුද්ධිමාර්ග සන්නයේ දීඝනිකාය ඒ බව දෙක ග්‍රන්ථ කොට හැම තැන ම ගෙදු කඹුදු වන වනවිනිස සන්නයේ එසේ නොදැනේ. එපමණක් නොවේ. විශුද්ධිමාර්ග සන්නය සංස්කෘත මිශ්‍ර සිංහලයෙන් ලියූ අතර වන විනිස සන්නය සද්ධර්ම සිංහල ශබ්දයන්ගෙන් ලියා ඇත. දැනට අස්සන් වන වනවිනිස සන්න පාඨ කිපය විශුද්ධිමාර්ග සන්නය සමඟ සසඳා බැලීමෙන් රජතුමාගේ භාෂා සම්ප්‍රදාය පිළිබඳ අනතරය මැවෙන්නේ ය.

වන විනිස සන්‍ය පාඨ	විශුද්ධිමාර්ග සන්‍ය පාඨ
1 ''කණ්ඩු පටිවජ්ජාදි යනු කණ්ඩුයාදි රොග ඇති සතුන් සඳහා අනුදත් සිවුරකට නම් යනු වන විනිස සන්‍යයි''	4 ''මේ අනභිධ්‍යාදීහු අභිධ්‍යාදීනට ප්‍රතිශෙධක බැවීන් හෝ අභිධ්‍යාදීන් වන මිථ්‍යාචාරාදීනට ප්‍රතිශෙධක බැවින් හෝ ශීල නම් වෙත්. කිසෙය යත්? -පෙ- මෙසෙ ම සෙසු කම් පථ යෙහි යෙදෙන යෙදෙන සෙ යොදනු.
2 ''පමුදම් සේ සිව්රස් සටහන් ඇති සේ යනු නිස්සන්දෙහයි''	5 ''බුදධ නීන්දිත මිථ්‍යා ජීවයෙන් ප්‍රත්‍යය පරියේෂණ ප්‍රතිග්‍රහණ පරිභොග යන්හ මොවුන් දුරු කිරීමෙන් ධර්මයෙන් පරියේෂණය කොට ධර්මයෙන් පිළිගෙණ ප්‍රත්‍යවෙක්ෂා කොට වැළඳීම නිරවද්‍ය බව නම්''
3 ''සකණ්ණ ජප්පක නම් මෙසේ මැ බුමුනා කියා නැන්විම් යනු නිස්සන්දෙහයි''	6 ''ඉහි ප්‍රියශීල ප්‍රතිපත්ති වත්සල සුශික්ෂිත මුමුක්ෂු යොගිජනයහට ප්‍රත්‍යුත්පාදනය මුඛ්‍ය ප්‍රයෝජනය චතුෂ්පාරිශුද්ධි ශීලයෙහි සුප්‍රතිෂ්ඨිතවැ අධිශීල ශික්ෂා සිඛකොට සව චරිතානුකූල කර්මස්ථාන පරිග්‍රහාදි ක්‍රමයෙන් ලැබෙන භාවනා ප්‍රකර්ෂ පර්‍යන්ත ප්‍රාප්ත ලෝකොත්තර ඥාන විසින් .....

භාෂා සම්ප්‍රදාය අතින් මෙතරම් විපර්‍යාසයක් දක්නේ රජුගේ ම සෛවරී භාෂා ප්‍රතිපත්තිය නිසා ද? නැතහොත් අන් කිසිවක් නිසාදැයි සසඳ බැලීමට තරම් ප්‍රමාණ වන සාධක දැක්වීමට **''වන විනිස සන්‍යය''** අප අතර නැත. එබඳු **කරුණක්** පිළිබඳව අවසාන නිගමනයකට පැමිණීමට පෙන් වලින් උඩරණය කළ මේ වනවිනිස සන්‍ය පාඨ කීපය ප්‍රමාණවියෙන් හැණීම ද සුදුසු නැත. **''කච් සිඵමිණ''** නම් පද්‍ය ග්‍රන්ථය ද මේ රජතුමාගේ ම කෘතියකැයි පිළිගතහොත් මෙහි ඉදිරිපත් වන ගැටළුව තවත්වැඩි වන්නේය.

මෙයට තුදුරු කාලයෙහි ශාරිපුත්‍ර සඞ්ඝරාජයන් වහන්සේගේ ශිෂ්‍යයකු විසින් සුමංගල, බුඛ මිත්‍ර, වොළිය කස්සප යන තෙරුන්ගේ සහ ධම්මකිත්ති, වාණිජභාතු යන උපාසකවරුන්ගේද ආරාධනයෙන් **''ලිඛාපථප්පකාසිනී නම් විනය විනිච්ඡය ටීකාව''** ලියන ලදී. **මේ** ග්‍රන්ථයෙහි කර්තෘ අප්‍රකටය. බොහෝ විනය විනිච්ඡය ටීකා පිටපත්වල කර්තෘ හඳුන්වන ආකාරය දක්නට නැත. සමහර පැරණි පිටපත්වල අවසානයෙහි බුරුම රට අරිමද්දන පුරයෙහි රෙවත නම් තෙර කෙනෙක් ලියවන ලදැයි දක්නේය. එය සිංහල අකුරෙන් ලියූ පොත බුරුම අකුරින් ලිවීම පිළිබඳ සටහණ කි. **''විනය විනිච්ඡය ටීකාව''** ලියන්නට පෙර තුබූ **''විනය විනිච්ඡය විවරණය''**ක් පිළිබඳව මෙහි සඳහන්වන නමුදු එය පැරැකුම් රජුගේ **''වන විනිස සන්‍යය''** නොවේ. **මේ** ටීකාව වාචිස්සර තෙරුන්ගේ කෘතියකැයි බොහෝ පඬුවන්ගේ අදහසයි. පරාක්‍රමබාහු රජුගේ පුත්‍රකාලයෙහි අධිපතිවූ මේ වාචිස්සර නම් ශාරිපුත්‍ර සඞ්ඝරාජ ස්වාමීන්ගේ ශිෂ්‍යයෙකි. මෙතුමා එවක සොළී රටින් **මෙහි** වැඩමවා සිටි තෙරවරුන් තුළ උපන් සීමාවන් පිළිබඳ දුර්මත නිරාකරණය පිණිස **''සීමාලඞ්කාර සඞ්ගහ''** නම් ග්‍රන්ථය සහ එහි ටීකාව ද ලියන ලදී. **එසේම ''සඞ්ඛේප සන්නය'' ''පටිසම්භිදා මග්ග ටීකා'' ''සංඛිත්ත විශුද්ධිමාර්ග'' සහ පාළි ධූපවංසය''** ද මෙතුමාගේ කෘතිහු වෙත්. කංඛාවිතරණියට ලියූ සිංහල ගැටපදයක සවරූපය ගන්නා **''කඞ්ඛාවිතරණී පිටසොහ''** ද මීට තුදුරු කාලයේ ලියැවුණකි. මෙහි කතුතුමා කවරෙක්දැයි ප්‍රකට නැති නමුදු එවක පැවැති නොයෙකුත් පොත්වලින් ගෙන ඇරැ පැ සාධක නිසා මෙතුමාගේ විනය විභාරදර්ශය පැහැදිලිය **''මිජිරබුඩ් ටිකා''** (වජිරබුද්ධි සිද්ධ කියති) **''සිඛවලඳ''** වැනි දැනට අප අතර ප්‍රකට

1–2 කූ: සි: සං: 59, 123. 3 කං: වි: පි: 131. 4–5–6 වි: මා: සං: 25.

පොත්වලින් මෙන්ම **''විනය අවුවා ගැම්පදය''** **''කඩඛාවිතරණී ගැටපදය''** **''විනය සන්නය''** **''කඩඛාවිතරණී සන්නය''** **''හෙළුකඩඛාවිතරණිය''** **''අවුවා සන්නය''** යන අප්‍රකට පොත්වලින් සහ පෙළ—අටුවාවන්ගෙන් ද මෙහි **කරුණු** උපුටා ඇත්තේය. කතිං **කාලාදිය** අප්‍රකට වූවද **''කුදුසික සන්නය''** නමින් දැනට ප්‍රසිද්ධ ග්‍රන්ථය ද මේ කාලයට ම අයත් ය. මේහි කතුතුමා දෙවෙනි පැරකුම්බා රජතුමාගේ ශාසන ශුද්ධියෙහිදී ප්‍රමුඛ සථානයක් දරූ දඹදෙණි කතිකාවතෙහි ද සඳහන්වන **ආරණ්‍යක මෙඩඩකර හිමියෝ** යයි සමහරුන් සලකන නමුදු එය පිළිගැණීමට තරම් හේතු සාධක නැත. **''නිස්සයෙහෙ නම් වන විනිය සන්නයෙන්''** උපුටා ගත් පාඨ මෙහි දක්නා බැවින් **වන විනිය** සන්නය රචනා කාලයෙන් අවුරුදු කීපයකින් හෝ මොඩ විය යුතුය. **කුදු** සික සන්න කතුතුමා නොයෙකුත් ග්‍රන්ථයන්ගෙන් **කරුණු** උපුටා දැක්වීය. එහි ලා වැඩියක් ආශ්‍රය කළේ **''විනය අවුවාව''** **''විනය සන්නය''** සහ **''පුරාතන කුදුසික''** සන්නය යන ග්‍රන්ථය. **''කඩඛාවිතරණී ගැටපදය''** **''විනය සන්නය''** සහ **''පුරාණ කුදුසික සන්නය''** යන ග්‍රන්ථයන් නෙත් හෙන ඇරී දක්වූ පාඨ කීපය සිංහල භාෂාවේ ඉතිහාසය සොයතුවන්හට ඉතා ප්‍රයෝජනය. කාලාන්තරයක් තුළ දෙම් දූෂිතව පැවැති මේ පාඨ කීපය හැකිතාක් දුර සංශොධනයකොට මේ ප්‍රස්තාවනාවෙහි යොදා ඇත. ''බුද්ධසික්ඛා'' පාළි ග්‍රන්ථය විනය හදාරනුවන් හට යම්සේ ප්‍රයෝජන ද, සිංහල භාෂා ඉතිහාසය හදාරනුවන්හට කුදුසික සන්නය ද එසේ ම ප්‍රයොජනය. බ්‍රාහ්මණ වංශික පඤ්චමූල පරිවෙණාධිපතීන් වහන්සේ විසින් **''සිඛවලඳ විනිය''** පාළිගව පරිවර්තනය කර **''සික්ඛාපද වලඤ්ජන''** නම් ග්‍රන්ථය ලියන ලද්දේ ද මේ ශතවර්ෂයේ අවසාන භාගයේ දීය. හෙළටුවා පාළිගට නැගීමෙන් පසු සන්‍ය, ගැටපද ආදිය ලියා පාළිපොත් සිංහලයෙන් තේරුම් ගන්නට ශතවර්ෂ කීපයක් තුළ ම උත්සාහ කළ නමුදු සිංහල පොතක් පාළිගට පෙරලූ ඵලමුවන අවස්ථාව මෙය වේ. පඤ්චමූල පරිවෙණාධිපතීන් මේ උත්සාහය කරන ලද්දේ ශතවර්ෂ ගණනාක් තුළ **''සිඛවලඳ විනිසට''** ලැබී තුබුණු **ගෞරවය** නිසා බව සැක නැත. එසේ ම සිංහල අටුවා පොත් පාළිගට නැගීමේදී අටුවා ඇදුරන් කීවා **මෙන්** විපාතනාරවාසීන්ගේ ප්‍රයෝජනය ද පතා විය යුතුය. එහෙත් සිඛවලඳ විනිසට ලැබුණු **ගෞරවය** එහි පාළි පරිවර්තනයට **සික්ඛාපද වලඤ්ජන** යට ලැබුණේ නැත. **හෙළඤ්ජ මඤ්ජූසා** නම් වෛද්‍ය ග්‍රන්ථය ද මේ කර්තෘතුගේ ම කෘතියකි. පරිවෙණ්ද හැදෑරීන් යුත් මේ ග්‍රන්ථය **නිසා** සෘජුකෘත භාෂාවෙන් අමුතුම **ශබ්ද** රාශියක් පාළි භාෂාවට එකතු වූ අතර වෛද්‍ය ශාස්ත්‍රය හැදෑරීමට ද භික්ෂූන් **මෙහෙය** විය.

අනුරාධපුර යුගයෙහි විසූ භික්ෂූන් වහන්සේගේ තැන්පත් ජීවිතයෙහි අමුතුම විපර්‍යාසයක් පොළොන්නරු යුගයෙහි ආරම්භ විය. මහ පැරකුම්බා රජුගේ පොළොන්නරු කතිකාවත මේ විපර්‍යාසය පිළිබඳ වේගය නවත්වනුවට රාජබලය පෙරදැරිව ලූ පවුරක් වූ නමුදු රජතුමාගේ අභාවයත් සමග ම එය දෙදරා ගියා සේ ය. පැරකුම් රජුගේ මරණින් අවුරුදු කිහයකින් පසු රජ පැමිණි **නිශ්ශංක** මල්ල රජ තම කතිකාවතින් අපට එය සිතිපත් කරවයි. **පොළොන්නරු** සමයෙහි ඇරඹුණු මේ විපර්‍යාසය ගිළිබඳ සම්පූර්ණ ප්‍රතිඵල ලැබුණේ දඹදෙණි අවධියේ දීය. මේ යුගයෙහි වැඩ විසූ භික්ෂූහු ඡන්දස්—අලඞ්කාර—ව්‍යාකරණ—ජ්‍යොතිශ—නඝණ්ටු—නිඝණ්ටු—කාව්‍ය ආදී නානා භාෂා සාහිත්‍යඛණ්ඩයන් හදාරමින් පොත්පත් ද ලියූහ. මෙහි දී දඹදෙණි කතිකාවතෙහි එන වගන්ති දෙකක් විමසා බැලිය යුතුය. **''භාෂාසථානම සොලෝ ආදිය බැඳ නොකිය යුතු. කාව්‍ය—නාටකාදි ගර්හිත විද්‍ය නම ඉගත යුතු. අනුකූල් නූගැනවිය යුතු.''** මහ පැරකුම්බා රජු පටන් දෙවෙනි පැරකුම්බා රජු දක්වා අතර අවුරුදු සියයක් (1164—1236) නැත. එහෙත් මේ කාලය තුළ භික්ෂූන් වහන්සේගේ විපර්‍යාසය වේගයෙන් සිදු විය මෙයට ප්‍රධාන හේතුව වූයේ මේ අතර පැමිණි කාලිඞ්ග මාඝ ගේ ආක්‍රමණය සහ විනාශකාරී ක්‍රියා පිළිවෙළය. **''කාව්‍ය—නාමඛ්‍යාදි ගර්හිත විද්‍ය නම ඉගත යුතු අනුකූල් නූගැන්විය යුතු''** යන දඹදෙණි කතිකාවතෙහි එන මේ නීතිය ආරණ්‍යක වාසී භික්ෂූන් කෙරෙහි බල පැවැත් වූවද ග්‍රාම්‍යවාසී භික්ෂූන් කෙරෙහි ක්‍රියාත්මක නොවිය. දඹදෙණි පැරකුම් රජතුමාගේ ම ආඥාවී චරයා වූ සඞ්ඝරක්ඛිත සථවිරයන් නොයෙකුත් කාව්‍ය නාටකයන් හදාළ බව පැහැදිලි වනු පමණක් නොව **සුබොධාලඞ්කර, චූලනාරදය** නම් ග්‍රන්ථ රචනයෙන් කාව්‍ය කරණයට උපදෙස් ද දෙන බැවිනි. දඹදෙණි කතිකාවතට පැරණි වූ පොළොන්නරු කතිකාවතෙහි

හෝ ඉන් පසුව ලියූ කීර්ති ශ්‍රී රාජසිංහ—රාජාධිරාජසිංහ කතිකාවත්වල හෝ මේ පාඨය දක්නට නැත. එබැවින් මෙය දඹදෙණි කතිකාවත සැපයීමෙහි මූල් තැන ඇත් ආරණ්‍යක මෙධඞ්කර සංඝරාජ ස්වාමීන්ද්‍ර ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයා කෙරෙහි විනා ග්‍රාමවාසී භික්ෂූන් කෙරෙහි බල නො පෑ බව සිහිය යුතු ය. සඞ්ඝරක්ඛිත සංඝරාජ ස්වාමීන් ග්‍රාමවාසීන්ගෙ දඹදෙණි කතිකාවතේ ම කියයි. දඹදෙණි යුගයෙහි කාව්‍ය නාටකාදිය හදාරන්නට භික්ෂූන් පෙළඹුණේ එ සමයෙහි මෙහි වැඩම වූ සොළී භික්ෂූන් නිසා විය යුතුය. මේ භික්ෂූහු සංස්කෘත සාහිත්‍යයෙහි පතළ බුද්ධ පාවචයක් ඇති මහා පඬිවරුය. එමෙන් සමහරු බ්‍රාහ්මණ ආගමික යෝ ය. එබැවින් උත්වහන්සේගේ ආශ්‍රය ලද හැම කෘතියකට ම සංස්කෘත ආභාෂය වැටුණේය. බෝසත් සිරිසඟබෝ රජුන්ගේ චරිත කථාව "සඞ්ඝපාල චරිත විභාර වංශය" නමින් ලියද්දී පවා කරුණු උපුටා ගත්තේ සංස්කෘත සාහිත්‍යයේ ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ දෙකක් වූ කාදම්බරියෙන් සහ ජාතක මාලාවෙනි. දඹදෙණි යුගයෙහි සහරජ පදවියද දැරූ අනවමදර්ශි හිමියන් විසින් "දෛවඥ කාව්‍යබන්ධ" "පරෝපකාර" යන ජ්‍යොතිශ්ශාස්ත්‍රය පිළිබඳ ග්‍රන්ථ දෙකක් ම ලියන ලදී. සංස්කෘත පද්‍යකාව්‍යයේ අලඞ්කාර වාදය අරණ්‍යවාසී භික්ෂූන් කෙරෙහි ද තුඩුදුන් බැවින් ඒ අනුව යෙමින් ආරණ්‍යක වෙදෙහ හිමියෝ "සඞ්ඝනාකුට වණ්ණනාව" ලියූහ. සංස්කෘත සාහිත්‍යය ආශ්‍රයයෙන් දඹදෙණි යුගයෙහි විසූ භික්ෂූන් කාව්‍ය—නාටක නක්ෂත්‍ර —ජ්‍යොතිෂාදි ශාස්ත්‍රානන්තරයන් පමණක් නොව වෛද්‍ය ශාස්ත්‍රයද හදාළ බව්ද හදාළ ශ්‍රුත බව්ද පවසමින් පඤ්චමූල පරිවේණාධිපතීන් වහන්සේ හෙළජ්ජ මඤ්ජූසාව ලියූහ. දෙවන පැරකුම් රජු ගේ රාජ්‍යාදයයෙන් ආරම්භ වූ මේ ධර්ම—විනය ඇතුළු භාෂා සාහිත්‍ය දියුණුව වැඩි කලක් නො පැවැත්තේය. රජතුමාගේ අභාවයත් සමඟ හටගත් අභ්‍යන්තර කලබල නිසා මේ දියුණුව නැවතී ගියේ. විනය ග්‍රන්ථ නිෂ්පාදනයෙහි භික්ෂූන් තුළ පැවැති උනන්දුව ද ඒ සමඟ ම නැවතුණා සේ ය. මින් පසු ජීවත් වූ පඬිවරු සිංහල සාහිත්‍යය පොෂණයෙහි උත්සාහවත් වූහ. දඹදෙණියෙන් ඇතුගල් පුරයට ද, එයින් ගෙඟසිරි පුරයට ද රාජධානිය වෙනස් විය. ශතවර්ෂයක් පමණැති මේ කාලය තුළ ලියැවුණු විනය ග්‍රන්ථ අතර පංසු පබ්බත විහාරයෙහි වැඩ සිටි හුවනෙකබාහු සථවිර යන් විසින් ලියූ "අනාපත්ති දීපනිය" කුඩා වුව ද වැදගත් ග්‍රන්ථයකි. "පරිවාර ගණ්ඨිපදය" ද මේ කාලයටම අයත් සේ සලකනු සුදුසුය. සමිහර පඬිවරුන් මෙය දඹදෙණි යුගයෙහි ලා සලකා තුදු දඹදෙණි යුගයේ භාෂා ලක්ෂණ මෙහි දක්නට නැත. පුරාණ ප්‍රාතිමෝක්ෂ සන්නය ද මේ යුගයෙහිම රචිතය. ගම්පොළ රාජධානි සමයෙහි නෘත්‍යාදියක සලකුණු පතළ කරවමින් ශ්‍රේෂ්ඨ පඬිවරු කීපදෙනෙක් ම උදාවූහ. ශාසන ශුද්ධිය සහ ජාතියේ අභිවෘද්ධිය පිණිස මේ උතුමන් ඉදිරියේ කටයුතු රැසක් ම විය. රජවරුන් වශයෙන් පෙනී සිටි ප්‍රාදේශික බලයක් ඇති ප්‍රභූනට ආභ්‍යන්තරික කලබලවලින් නිදහසක් නො වූ කමුදු ශාසනය සහ ජාතිය ද, භාෂා සාහිත්‍යයන් ද දියුණු කරලනු පිණිස දිය යුතු ආධාරය ඉඩ ලද ලද අවසරයෙහි දෙන ලදී. මේ කාලය තුළ ශාසන ශුද්ධි කීපයක් ම කරන්නට සිදු විය. තුන්වන වික්‍රමබාහු රජු දවස රාජබලය ලැබ විසූ අල කෙශ්වර අමාත්‍යයා විසින් පළාබත්ගල වනවාසී පරම්පරාවට අයත් ගඩලාදෙනි විහාරාධිපති ධම්ම කිත්ති ස්වාමීන්ගේ සහාය ලැබ ක්‍රි: ව: 1370 දී පරාක්‍රම සාගර ශුද්ධියක් කෙළේය. පාරමී ශතකය ජනානුශාසන චරිතය යන පොත් ලියූ මුන්වහන්සේ එවක විසූ ශ්‍රේෂ්ඨ පඬිවරයෙකි. ආභ්‍යන්තරික කලබල්ලින් රට පිරී ඕය බැවින් ආගම ද ඉක්මිනින් පිරිහෙන්නට වන. එබැවින් ක්‍රි: ව: 1396 දී දෙවන විරබාහු රජතුමා දෙවරකඩින පඤ්චබාහු ධම්මකිත්ති මාඝීමියන්ගේ සහ ගලතුරුමුල මෛත්‍රෙය ස්වාමීන්ගේ ද සහාය ලැබ නැවත මහත් ශාසන ශුද්ධියක් කෙළේය. ජිනබෝධාවලිය, නිකාය සංග්‍රහය, සඞ්ඝාලඞ්කාරය, බාලාවතාර සන්නය ආදී පොත් කීපයක් ම ලියූ මෙතුමා එවක මාඝීම් පදවියද දැරීය. මේ උතුමන්ගේ අවසානය සමඟ ගම්පොළ රාජධානිය ද අවසන් විය.

පසළොස්වන ශතවර්ෂයේ ආරම්භය ජයවර්ධනපුර රාජධානියෙන් පටන් ගැනිණි. ලම්බකර්ණ වංශික සවන පරාක්‍රමබාහු මහරජතුමා ක්‍රි: ව: 1412 දී රයිගම පුරයෙහිද, 1415 දී ජයවර්ධන පුරයෙහි ද කිරුළු පැළඳ රජසිරි පෑමිණියේය. ඒ සමඟ ධර්මශාස්ත්‍රීය ආලෝකය ද හැම තැන විහිදිණ.

විදුරුම ඥානානන්ද පිරිවෙණ, කැරගල පද්මාවතී පිරිවෙණ, දෙවිනුවර ඉරුගල් කුලතිලක පිරිවෙණ, තොටගමුවේ විජයබා පිරිවෙණ, පැපිලියාගෙන් සුනෙත්‍රා දෙව් පිරිවෙණ යනාදි විදුෂථානාධිපතීන් මගින් ධම්—විනය ශබ්ද ශාස්ත්‍රාදිය පුරුදු පුහුණු කරවමින් බුඩශාසනය සහ රට ජාතිය දැනගැනීමට තැබූ මෙතුමා ලක්දිව එක ඝේසත් නොවේය. එවක පැවැති පාරිවෙණික අධ්‍යාපන තත්ත්වය කෙබඳු ද යනු කැරගල වනරතන, තොටගමුවේ සිරි රාහුල සඞ්ඝරාජයන් වහන්සේගේ ආඥා පත්‍රයෙන් පැවැති පද්මාවතී පිරිවෙණ—විජයබා පිරිවෙණ පිළිබඳ විස්තරවත ග්‍රන්ථයන්ගෙන් පැහැදිලි වේ. ඒ අනුව මේ පිරිවෙන්වල අටුවා ටීකා සහිත ත්‍රිපිටක බුඩවචනය සහ තර්ක—ව්‍යාකරණ—ඡන්දස්—අලඞ්කාර—කාව්‍ය—නාටක—ගණිතාදිය ද අධ්‍යයනය කරවූහ. විශෙෂයෙන් උගැන්වූ ග්‍රන්ථ අතර හෙරණ සිඛ සහ සීඛවළඳ විනිස මුල් තැන ගන්නේය. පැරණි කතිකාවත්හි දක්නා පරිදි නිස ඛණ්ඩ සහ තෙර ඛණ්ඩ ද භික්ෂූහු මෙහි හදාළහ. ජයවඩ්ඪනපුර අවධියෙහි දී භික්ෂූන් වහන්සේ ධම්—විනය ඥානයෙන් සම්පූර්ණව සිටි නමුදු සිංහල සාහිත්‍යය පොෂණය කිරීම පිළිබඳව මෙවැනි උනන්දුවක් දැක්වුන. තොටගමුවේ සිරි රාහුල් හිමියන්ගේ පඤ්චිකා ප්‍රදීපය ජයවඩ්ඪනපුර අවධියෙහි ශ්‍රෙෂ්ඨ පඬිවරයකුගේ අපූර්ව ප්‍රඥා පාටවය කියාපාන්නේය. එතරම් පොත් රැසකින් කරුණු උපුටා ලියූ ග්‍රන්ථයක් ලක්දිව තවත් නැත. ඒ පොත් අතර "විනය කැවඳය" ද* දක්නේය. බුරුම රට වැඩ විසූ තිපෙටකාචාර්ය මහතෙරුන් විසින් විනයාලඞ්කාරය නම් ප්‍රශස්ත ග්‍රන්ථය ලියන ලද්දේ මේ කාලයේය. විනයාලඞ්කාරය ලක්දිව බෙහෙවින් භාවිතය. හවෙහී පැරකුම්බා රජුගේ රාජ්‍යෝදයයෙහි දැල්වෙමින් තුබූ ධම්—ශාසනප්‍රදීපය රජුගේ අභාවයත් සමඟ මිනිවී ගියා සේය. සිංහාසනයට උරුමකම් කීමට ඉදිරිපත් වූ රජකුමාරුවන් නිසා සඟරජ පදවිය දුරු රහල් හිමියන් සමඟ පවා යම් යම් මතභෙද හටගන්නේය. මේ අතරින් පැන නැඟුණු ආභ්‍යන්තරික කලබල නිසා රට අඞ්කාරයට ද, ශාසනය පරිහානියට ද, වැටිණි. මෙසේ පහන් සංවෙග දනවමින් මේ ශතවර්ෂය ගෙවී යත්ම විදෙශීය ජාතියක් මේ රට ආක්‍රමණය කිරීම හෙවත් ක්‍රි: ව: 1505 පෘතුගීසීන්ගේ පැමිණීම සමග 16 වන ශතවර්ෂය ද ලැබුවේය. මෙයින් පසු සරණඞ්කර සඞ්ඝරාජ හිමියන්ගේ කාලය (1698—1778) වනතුරු මේ රට විදෙශීය පාලන බලයෙන් සහ ඔවුන්ගේ අනුග්‍රහය ලැබූ මිෂනාරීවරුන් නිසා අදුරෙන් අදුරට ම ගියේය. පෘතුගීසීන් මෙහි පැමිණ සහනරට පළාත්වල බලය ලැබ ඔවුන්ගේ ආගම් පතුරුවමින් වෙළෙඳාම ද කරන්නට විය. ජයවර්ධන පුරයට පහර දීමට වරින්වර පැමිණි ප්‍රතිකාල් හමුදාවනට මුහුණ දෙන්නට වන් කෝට්ටේ මෙවක විසූ රජවරුනට ශාසනික ක්‍රියා අමතක විය. භික්ෂූහු හුදෙකලා වූහ. ධම්—විනය ශබ්ද ශාස්ත්‍රයන් පිරිහිණි. ක්‍රි: ව: 1542 දී විරවික්‍රම රජතුමා ධම්කීර්ති නම් ස්තවරනමකගේ සහාය ලැබ උපසම්පදා කර්මයක් පවත්වා සසුන විනාශ විය නොදී රැක ගත්තේය. එහෙත් කෝට්ටේ ධම්පාල රජුගේ සහ සීතාවක රාජසිංහ රජුගේ විනාශකාරී ක්‍රියා නිසා මේ උපසම්පදා කර්මයෙන් අවුරුදු පණසක් ගතවන්නට පෙරලන්දිව උපාසම්පන්න භික්ෂූන් පස්නමකුදු සොයා ගත නොහැකි විය. බුඩ්ධ ශාසනය ද භික්ෂු සඞ්ඝයා ද අන්තිමට ම පිරිහුණේය. මේ අතර ගනදුරු රැයක උදාවුණු පුරසඳ මඩලක් බඳු පළමුවන විමලධම්සූරී රජතුමා (ක්‍රි: ව: 1952—1604) සිහසුන් ඇරීය. තමන් ඉදිරියෙහි පැන නැඟ තුබූ ආගමික – ජාතික ප්‍රශ්න විස විහා විසඳන්නට වන් මෙතුමා රකඛඞ්ග දෙශයෙන් භික්ෂූන් නෙන්වා උපසම්පදා කර්මයක් කරවා බුදුසස්න නගා සැබිය. එහෙත් දෙල්ගමුවෙහි රහසේ වඩා හිදුවන ලද දාන ධාතූන් වහන්සේ මහ නුවරට වැඩමවා දන්තධාතු මන්දිරයක් තනවා සෙංකඩගල ලංකාවේ රාජධානිය බවට පැමිණි විය. මින් පසුව රජපැමිණි සෙනරත්, රාජසිංහ ii රජවරු පෘතුගීසීන් සමඟ සටන් කිරීමට ම කාලය ගත කළහ. පෘතුගීසීන් පලවා හැර ලංකාව නිදහස් කර ගැනීමේ විර ක්‍රියාව රාජසිංහ ii රජු විසින් කළ නමුදු තම ආඛාරය පිණිස ගෙන්වා ගත් ඕලන්දයන් නිසා නැවැතත් අමුතු ගටන් ආරම්භ විය. ඉන්පසු රජ පැමිණි රාජසිංහ රජුගේ පුත් විමලධම්සූරී රජ ii ඕලන්දයන් සමඟ සමගියෙන් කලක් වසමින් ඉඩ ලද අවසරයෙහි අරකන්රවින් භික්ෂූන් නෙන්වා උපසම්පදාවක් කර විය. නරෙන්ද්‍රසිංහ රජතුමා රජ පැමිණියේ මෙයට අනා

---

* පඤ්චිකා ප්‍රදීපය 16

කුරුවය. පිණ්ඩපාතික සරණංකර සඟරජ හිමියන්ගේ පහළවීම ද මේ කාලයේදීම විය. තමන් විසින් නහා තැබිය යුතු වූ ශාසනයත් ජාතියත්, නහා ශාස්ත්‍රානතරත් ඉදිරියේ මහාපුරුෂ ලීලා යෙන් මුතුණ පෑ මෙතුමා රාජානුග්‍රහය ලැබ පිරිහී ගිය ශාසනයට පුනර්ජීවය දෙමින්, නොයෙ කුත් ශිෂ්‍යයනට ධර්ම—විනය ශබ්ද ශාස්ත්‍රයන් උගන්වමින් සාරාර්ථ සංග්‍රහය නම් ධර්ම ග්‍රන්ථය ද, හෙළජ්ජ මංජූසා සන්නය, පාළි මහාබොධිවංශ සන්නය, අභිසමෙබාධි අලංකාරය ආදී පොත් කීපයක් ම ලියූහ. අනතයම ම පිරිහී තුබූ බුඩසාසනය නහා තබා එය ක්‍රමයෙන් දියුණුවනු බල බලා ධර්ම—ශාස්ත්‍රාලොකය ලක්දිව විහිදී යනු දැක දැක ක්‍රි: ව: 1778 ඇසළ පුර පසළොස්වක් දින උන්වහන්සේ අපවත් වී වදාළහ. කෝට්ටේ රාජධානියෙන් පසු අවුරුදු සිය ගණනක් ධර්ම—විනය ශබ්ද ශාස්ත්‍රාදිය ද බුදුසස්න ද පිරිහුණු නමුදු සරණංකර සඟරජ හිමියන් නිසා එය යළිත් දියුණු වන්නට විය. මේ කාලය තුළ ලියැවුණු විනය ග්‍රන්ථයක් පිළිබඳව වාර්තාවක් නැතද උන්වහන්සේ ගෙන් ආරම්භ වූ ශාසනික අධ්‍යාපන ක්‍රමය පිළිබඳ වාර්තා දක්නේය

1 .... අකුරු නො කී ළදරු වයස් ඇති අයට හෝඩිය පවත් ද සමහර අයට ඔතක පොත් පවත් ද, කීම් ලිම් උගන්වමින් හෙරණ සික දින වදියාව සතරසංවර සිල් ..... සෙඛියාව ඇතුළු ධුතාඩ්ග පිළිවෙත් ද, සමහර අයට වාක්‍යරණ ධාතු පාඨ නිඝණ්ඩු සහ රාත්‍රී බණ ද පුරුදු කරවමින් .....

2 "ඇදවල්වලට වැලි අතුර රෑ දවල් උගන්නා අයට වැල්ලේ බොහෝ සේ ලියමන වාය. සතරසංවර සිල්,ය හෙරණ සිඔ, දින වදියාව, සෙඛියාව, සිල් වොලොහන්නා සූතිස් යොධයත් හා ශිලානිශංස, කාමයෙහි ආදීනව, ධම්පියා සන්නේ, තෙලඔවාද සන්නේ කියවනවාය. ඔතක පොත් කියා නිමවුණා ම උගන්වා උගන්ට පුළු පුළුවන් අයට නිඝණ්ඩුව, ධාතුපාඨය, බාලාවතාරය, පදසාධනය, කියවමින් වරනෑගිල්ල කියවමින් ව්‍යාකරණ වැල්ලේ ලියවමින්, නාමය හා ලිඛිතත්‍රය සපා විහකතීන්ගේ එකවචන බහුවචන තේරෙන ලෙසට රෑ දවල් බොහෝ සේ උදාහරණ යොදා අස්වනවාය. පාළි කථාවිසඳු අස්වනවාය. පාළි බොධිවංශෙ, අන්නනඟලු වංශෙ, ප්‍රදීපිකාව, අනාගත වංශෙ ඇතුළුවූ බොහෝ පොත් පත් කියවමින් ලිඛවමින් බණ දහම් පාඩම් කරවමින්" .....

3 "..... ..... බොහෝ දෙනා වහන්සේට ප්‍රාතිමොක්ෂය මුලුසිඔ කුදුසිඔ සතර බණවර පාඩම් කරවමින් පාමොක් විභාග ඉඟනා වශයෙන් ම කරවමින් පාළි මුඛතඔ විනයාදි බොහෝ විඔය පොත් අස්වමින් දවස තුන්විව කඩි නැතිව වග් පිරිත් පවත්වමින් ශබ්ද ශාස්ත්‍ර උගන්වා පාළි ජාතඔ කථා වස්තු ආදිය අස්වමින් ..... ඔගි බණ පාඩම් කරවමින් ..... අඩ්ඛානතර සතිය ..... මෑදුම් සතිය පාඩම් කරන ..... ශබ්ද ශාස්ත්‍ර ලිම් කිම් හොඳින් දුහුණු කරන ..... දික් සතිය පාඩම් කළ ..... ඡඳස් ව්‍යාකරණ සුඟ සුත්‍රාදිය දුහුණ ....."

4 "..... ප්‍රාතිමොක්ෂ ගණ ශික්ෂාපද විශෙෂයන් අස්වමින් කැප අකැප පිළිනන්නා වස්තු හදුන්වා පවිඔතඟණ ශික්ෂාපදදියෙහි හික්මවමින් පොහෝ පවුරුණු සඩ්ඝකම් කරවමින් වස් විසිවි සඔන ලැබීම් ඔාමණෙර උපසම්පද කිරීම් ආදියෙහි විභාග ද, කම් වාක්‍යය කියන ක්‍රම ඇතුළුවූ විනය විභාග සඩ්ඝ යාට අස්වමින් හොඳින් හික්මවීමට තටක් ගෙන ....."

1-2-3-4 සඩ්ඝරාජ සාහිත්‍යවිවරියාව 5, 10, 15, 31.

මෙසේ වැලිවිටි සරණංකර සහරජ හිමියන්ගෙන් ආරම්භ වූ ධර්ම ශාස්ත්‍රාලොකය ලක්දිව හැම තැන ව්‍යාප්ත වෙමින් පැවතුණි. කාලයේ දුෂ්කරතා, ආභ්‍යන්තරික කලබල, ශත්‍රූපද්‍රව, කොතරම් ප්‍රබලව ඉදිරිපත් වුවද ඒ පිළිබඳ කිසිදු තැකීමක් නොකොට බුද්ධශාසනයත්, ඒ අනුසාරයෙන් ධර්ම—විනය ශබ්ද ශාස්ත්‍රත් යලිදු නොවැටෙන සේ නඟා තබා අටළොස්වන ශතවර්ෂයේ අවසාන භාගයේ දී මෙතුමා අපවත් වූ තමුදු ඒ වනවිට උන්වහන්සේගේ ලොකශාසනික කටයුතු උර දී දරා සිටි ප්‍රබල ශිෂ්‍ය පිරිසක් ජීවත් වූහ. නිබ්බොටුවාවේ සිඛාලඞ්ඞ බුද්ධරක්ඛිත, වේහැල්ලේ ධම්ම දින්න, වොරතොට ධම්මක්ඛන්ධ, හිනට්ටිකුඹුරේ සුමඞ්ගල, අත්තරගම රාජගුරු හණ්ඩාර ආදී පඬිවරු සරණංකර සහරජ හිමියන්ගෙන් පසු නානා ග්‍රන්ථ රචනා කිරීමෙන් ධර්ම—ශාස්ත්‍රීය සේවයෙහි යෙදුණහ. එසේම රාජානුග්‍රහය ද මහජන ප්‍රසාදය ද ලබා සිටි සිරිනාමළුවේ ධම්මජෝති හිමියෝ පහතරට ධර්ම—ශාස්ත්‍රීය සේවයෙහි යෙදුණහ. මේ අතර වැලිතර ඤාණවිමලතිස්ස, බෝගහපිටියේ ධම්මජෝති, කප්පුගම ධම්මක්ඛන්ධ, කතලුවේ ගුණරතනතිස්ස, අත්තුඩාවේ ධම්මරක්ඛිත යන සවාමීවරු දෙශාන්තරයට නොව් සිරිසුදු උපසම්පදාව මෙහි ගෙනවුත් ඒ ඒ භික්ෂු වංශයන් පිහිටුවූහ. ලංකාගොඩ ධීරානන්ද, මාතර ධම්මාරාම, අඹගහවත්තේ සරණංකර (ඉන්ද්‍රසඟවරඤාණ) යන සවාමීවරු ද භික්ෂු නිකායයන් පිහිටුවීමේ ආදී කර්තෘවරු වූහ. දඹන්වවන ශතවර්ෂයේ ආරම්භයත් සමඟ ම ලංකාව ඉංග්‍රීසීන් අයත් විය. එයට කලින් අවුරුදු ගණනක් ම උඩරට රජවරුන් ආභ්‍යන්තරික දුෂ්කර ප්‍රශ්නවලට මුහුණ දුන් බැවින් ද, එහි ප්‍රතිඵල වැසිසකට විඳින්නට සිදුවූ බැවින් ද මේ කාලය තුළ මහනුවර රාජධානියෙන් ධර්ම—ශාස්ත්‍රීය සේවය අවතක වී ගියේය. ඉංග්‍රීසි ආණ්ඩුව යටතේ පහතරට පළාත්වල එක්තරම්ක නැන්පත් කමක් පැමිණි බැවින් ඒ අතින් පහතරට පෙදෙස් පියවර ගණනක් ම ඉදිරියට ගියේය. සරණංකර සහරජ හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාව මේ වනවිට ලක්දිව හැම තැනම පැතිරී පැවැත්තේය. සව ශක්තී පමණින් නානා ග්‍රන්ථ රචනයෙන් ධර්ම—ශාසෙත්‍රාද්දීපතීය ඇති කළ මේ උතුමන් නිසා දහනවවන ශතවර්ෂයේ මුල්භාගය පිරී ඇත. මෙහි මධ්‍යම භාගය නානා ශාසනික ක්‍රියාවලට මුල් තැන ලැබිණි. අවසාන භාගය අලංකාර වන්නේ විදර්ශනත—පිරිවෙන් පිහිටුවීම් පිළිබඳ උසස් වාතාවරණයෙනි. හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල, වැලිගම ශ්‍රී සුමඞ්ගල, රත්මලානේ ශ්‍රී ධර්මාලෝක, රත්මලානේ ශ්‍රී ධර්මාරාම, වස්කඩුවේ ශ්‍රී සුභූති, බුලත්ගම ධර්මාලංකාර, ලංකාගොඩ ධීරානන්ද, දෙඛන්දුවේ පියරතන ආදී මහ පඬිවරයන් ගේ උත්සාහයේ ප්‍රතිඵල නිසා වර්තමාන ලංකා සම්බුද්ධ ශාසනයේ ද, පෙරදිග භාෂාවන්ගේ ද, අපූර්ව උද්දීපනීයක් ඇත්වෙන්ය. වලාණේ ශ්‍රී සිද්ධාර්ථ හිමියන් විසින් රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙණ පිහිටුවන ලදී. හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල මාහිම්යෝ මාලිගාකන්දේ විදුදය පිරිවෙණ ද, රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මාහිම්යෝ කැලණියේ විදාලංකාර පිරිවෙණ පිහිටු වූහ. වැලිගම ශ්‍රී සුමඞ්ගල මාහිම්යන්ගේ ප්‍රධානත්වයෙන් පානදුරේ සෝභන විදාලය පිහිටුවන ලදී. මඩිගල්ලේ ශ්‍රී සිද්ධාර්ථ අනුනායක සවාමීන්ද්‍රයෝ සහරජ පිරිවෙණ පිහිට වූහ. මේ වර්තමාන ලංකාවේ ධර්ම—ශාසෙත්‍රාද්දීපතියේ මූලාරම්භනයෝය. මෙයට සමකාලයෙහි හා මින් පසුකාලයෙහි ද ඒ ඒ පළාත්හි විදාලයනයන් පිහිටුවා ධර්ම—විනය ශබ්ද ශාස්ත්‍රීය ග්‍රන්ථ නිෂ්පාදනය කළ පඬිවරු බොහෝ වූහ. මේ ශතවර්ෂයේ මධ්‍යම භාගයේ (ක්‍රි: ව: 1865) සිදුවූ පැල්මඩුල්ලේ පොත් සඞ්ගායනාව විශිෂ්ට ශාසනික ක්‍රියාවකි. බුලත්ගම ධම්මාලංකාර සුමනතිස්ස සවාමීන්ගේ අනුසාසනා පරිදි ඉද්දමල්ගොඩ දිසාපති තුමන් විසින් කරවූ මේ පොත් සඞ්ගායනාවේදී හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල, වැලිගම ශ්‍රී සුමඞ්ගල, වස්කඩුවේ ශ්‍රී සුභූති, රත්දෙඹේ ධම්මාලංකාර, දෙඛන්දුවේ සිරි පියරතන, එඩිගල්පිටියේ සිරි සුමඞ්ගතිස්ස, මිරිස්සේ ධම්මානන්ද ආදී මහා සථවිරයන් වහන්සේලාගේ නම් ඒ පිළිබඳ ලිඛිත වලිවල දක්නේය. විනය පිටකයට පමණක් සීමා වූ මේ පොත් සඞ්ගායනාව පුරා හඹසක් පැවැත්විණි. මේ කාලයේදීම නොයෙක් පඬිවරු භික්ෂු විනය පිළිබඳ සන්න—ගැටපද—විවරණ ආදී පොත් ලියූහ. අම්බරපුර සිරි සද්ධම්මවංස නිකායයේ මහානායක ධුරය දැරූ ලංකාගොඩ ධීරානන්ද මහා සවාමීන් විසින් "විනය විනිශ්චය සන්නය" ලියන ලදී. බොහෝ තැන පාළි වචන

වලට පිරිසුදු සිංහලයෙන් අරුත් කියන අතර ලලිත භාෂා විලාසයකින් විස්තාරය කරන මේ ග්‍රන්ථය නිසා සිංහල භාෂාවට අමුතු වචන රාශියක් ම ඇතුළත්ව ඇත.

> "මජ්ඣිමං අසීස සවවාය, මැදුම් පුහුල් හිස නොවදින පමණ උසයට තෙල ඇති (සීසං න භවෙවතීති=ඉසිස සවවා, මජ්ඣිමස්ස අසිස සවවා=මජ්ඣිමාසිස සවවා, භාය සී විඉහතී) වෙහාස කුටියා, (ලැහැළි නොම අතුළ තලාන් පමණකින් යුත් විහුමකාදි ප්‍රභෙද) අහස් කිළියකැ; උපරි, මතු තෙලෙහි; තස්මිං ආභවව්‍යාදකෙ මඤෙඣ වා, අවනි ශීෂී විද පා කුඩිවකි අවුණා කුඩිවකි මතු නොගයා තුබූ ඒ ඇදකැ හෝ; පිඨෙ වා පන, එසේ අණු නුදුන් පුටුවකැ හෝ; නිසිදනතස්ස වා, හිඳිනා වූ හෝ; නිපජ්ජනතස්ස වා පන, නෝනා වූ හෝ විනාහි; තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහට; පයොග ගණනාය එව, ප්‍රයොග ගණනින් ම; පාචිතතියො සියුං, පවිති වෙති."

මේ එසින් උපුටා ගත් කොටසකි. දැනට ප්‍රථම භාගය පමණක් මුද්‍රණය වී ඇති මෙහි ඉතිරි කොටස ද මුද්‍රණය කරවන්නේ නම් සිංහල භාෂාවට ද එසින් විශාල යහපතක් සිදුවනු ඇත. **"විනය මහා නිඝණ්ඨය"** නම් ග්‍රන්ථය ද, ඹුන්වහන්සේගේ ම කෘතියකි. මේ කාලයේ විසූ පඬිවරු යම් යම් විනය නීති රීති **ඝන විනය** කම් පිළිබඳව එක් එක් මත දැරූහ. ඒ නිසාම **"අධිමාස වාදය" "පාරුපන වාදය"** සීමා වාදය ආදී නොයෙක් වාදයෝ පැනනැංවූහ. ඒ පිළිබඳව එකල පුවත්පත්වලින් ප්‍රමාණවත් ආධාරයක් ලැබුණු අතර ඒ ඒ පඬිවරු තමන් ගත් පක්ෂය හෝ මතය උදෙසා, පොත් ලියූහ. **"අධිමාස භෙදන"** (මොරාන්ඩුල් බුද්ධසිරි) **"සීමා විභාගය"** (හික්කඩුවේ ශ්‍රී සුමඟල) **"සීමාඝය දපප කා"** (රත්දෙණියේ ධම්මානන්ද) **"සීමා විනිශ්චය"** (සිරි ධම්ම කඩුක්ක) **"සීමා විනිශ්චය"** (සිරි ධම්මකඩුක්ක) **"සමඝානනවාදිනා සන්නය"** (සිරි පඤ්ඤාසීහ) **"අඛඩසීමා විනිවජය"** (අම්බලම්ගොඩ දෙවානන්ද උප සඞ්ඝරාජ) **"බඩසීමා විනිවජය"** (කෝදාගොඩ උපසෙන) **"දළහිකරණ විනිවජය"** (අම්බලම්ගොඩ දෙවානන්ද උප සඞ්ඝරාජ) **"පඤඤ නිකකුජ්ජ නවාදය"** (වැලිහිටියේ වජිරඤාණාලංකාර) **"සඞ්ඝදාන විනිශ්චය"** (කෝදාගොඩ උපසෙන) **"විසසුකකඩඩනය"** (කෝදාගොඩ උපසෙන) **"සුගත විදසුවිබානය"** (දෙඩන්දූවේ ශ්‍රී ශීලඤාණ) **"සීමාසංකර විනොදනී"** (අස්ගිරි මල්වතු) **"සංකර විනිශ්චය"** (ගණේකොඩැල්ල විහාරය) යනාදී පොත් ඒ සීමා ප්‍රකාශයට පැමිණි වූහ. සීමාවන් පිළිබඳ මතානතර හටගත්තේ මේ යුගයේ දී පමණක් නොවේ. දඹදෙණි අවධියෙහි සොළී රජුන් වැඩම කළ නිකුන්ට උපන් සීමාවන් පිළිබඳ දුම්ත නිරාකරණය කරනු පිණිස ඝාරී පුත්‍ර සඞ්ඝරාජ ස්වාමීන්ගේ ශිෂ්‍ය වූ වාචිස්සර තෙරුන් විසින් **"සීමාලංකාර සඞ්ගහ"** නම් ග්‍රන්ථයක් ලියන ලද්දේ එබැවිනි.

විනය පිටකයෙහි යම් යම් කරුණු විස්තර කරනු පිණිස සිංහලයෙන් පොත් ලියූ පඬිවරුන්ගේ සඞ්ඛ්‍යාව ද වැඩි විය. මෙතෙක් පාලියෙන් විනය පොත් ලියූ නමුදු මේ ශතවර්ෂයේ විනය පොත් සිංහලයෙන් ලියන්නට පෙළඹුණේ ප්‍රථම පක්ෂය තරමට ම ශීඝ්‍ර පක්ෂයද භික්ෂු විනය පිළිබඳ සැලකිල්ලක් දැක්වූ බැවිනි. දෙඩන්දූවේ ශෛලබිම්බාරාමාධිපතිව වැඩ සිටි පියරතන තිස්සාභිධාන අමරපුර නිකායයේ මහානායක සඞ්ඝනායක් වහන්සේ විසින් චුල්ලවග්ග පාළියේ දක්නා හරු හණඩ පිළිබඳව විස්තර කරමින් **"විනය නීතිය"** නම් ග්‍රන්ථය ලියන ලදී. **"විනය සංග්‍රහය"** (කතිපා අජුකටයි) **"විනය කර්මාවතා"** (රත්මලානේ ශ්‍රී ධම්මලෝක) **'විනයාදර්ශය"** (කෝදාගොඩ උපසෙන) **"භික්ෂු ශීලය"** (උඩුගම්පොල සුවණ්ණජෝතිසාභිධාන) **"පරිකඛාර විභාවනිය"** (මාතර සුමඞ්ගලාභිධාන) **"විනය ශික්ෂාව"** (කෝදාගොඩ උපසෙන) **"විනය මුඛය"** (ධම්මරත්න පඬිතුමා) **'දළහිකරණ නිවජය"** (දෙඩන්දූවේ සරණජෝති තිස්ස) යනාදී පොත් ද ලියැවිණ. මේ කාලය තුළ ඒ ඒ නිකායවල භික්ෂු සඞ්ඝයාගේ දියුණුව උදෙසා පැරණි කතිකාවත් අනුසාරයෙන් නිකාය පාලක මහා සඞ්ඝරාජ ස්වාමීවරු කතිකාවත් ද කීපයක් සකස් කළහ. කතිකාවත් නම් වූ ව්‍යවස්ථා

පඬිකතී ඇතිකොට එ මඟින් භික්ෂු ශ්‍රාමණේරාදීන්ගේ පාලනය සඳහ පැවැත් ම මනාව පවත්වා ගැණීම ඇත කාලයේ පටන් ම පැවැත්තේය. දෙළ අටුවා පොත්වල ද කතිකාවන් පිළිබඳව සඳ හන් වේ. එහෙත් එය රාජකීය ව්‍යවස්ථාවන් හැටියට ආරම්භ වූයේ පොළොන්නරු අවධියේ දිය. සතරවෙනි මිහිඳු රජුගේ මිහින්තලා ශිලා ලිපිය සඳහ පස්වෙනි කසුප් රජුගේ අභයගිරි ලිපිය ද එබඳු කතිකාවත් ය. එසේ ම ඉන් මෙබ විසූ මහ පැරකුම්බා, දෙවෙනි පැරකුම්බා, නීශ්ශඞ්ක මල්ල සවෙනි පැරකුම්බා, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධි රාජසිංහ යන රජවරු ද කතිකාවත් ලියූහ. මහ පැරකුම්බා රජුගේ පොළොන්නරු කතිකාවත ඇතුළු සෙසු සියලු කතිකාවත් පොදුවේ සියලු භික්ෂු ග්‍රාමණේරයන් විෂයෙහි බල පැවැත් වූයේ එකල නිකාය භෙදයක් සහ පැවැති බැවිනි. දඹදෙණි කතිකාවත් කාලයෙහි භික්ෂු සඞ්ඝයා ශ්‍රාමවාසීය-අරණ්‍යවාසී යයි දෙ කොටසක් වූ නමුදු කතිකාවත එසේ ලා වෙනසක් නො දක්විය. කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත ද එසේම යැයි එහි දක්නා "තත්කාල ශාසනානුග්‍රහාසක සංඝරාජ ධුරන්ධර සරණංකරාභිධාන මහා සථවිර ප්‍රමුඛ ග්‍රාමාරණ්‍යවාසී කාරක මහා සංඝයා වහන්සේ විසින් පවත්නා ලෙස නියම වූ කතිකාවත මෙසේ දනයුතු" යන මේ පාඨයෙහි කියැවේ. එහෙත් රාජාධිරාජසිංහ කතිකාවත විශෙෂයෙන් උභය විහාරවාසී මහා සංඝයා වහන්සේ උදෙසා ලියන ලදි. එහි මේ පාඨය දක්නේය. " .... උභය විහාරවාසී මහා සංඝයා වහන්සේ මඞ්ගල මණ්ඩපයඩි රැස් කරවා එබඳු දුෂ්ප්‍රතිපත්ති හරවන පිණිස යෙදුණු ධම් විනයානුකූල මහ ආඥව මුල්කොට උභය විහාරවාසී මහා සංඝයා වහන්සේ විසින් ව්‍යවස්ථා කරන ලද කතිකාවත මෙසේ දනයුතු." මේ සියලුම කතිකාවත් අතර දඹදෙණි කතිකාවත ප්‍රශස්ත තරය. සත් තත්කාලීන ශාසන ප්‍රවෘත්තිය සහ ශාසන ඉතිහාසය දැන ගැණීමට මේ කතිකාවත් ඉතා උපකාර වේ. දහතවවන ශතවර්ෂයේ ලියූ කතිකාවත් අතර අමරපුර නිකායික දෙඛන්දූවේ සිරි පියරතන, වැලිඇම ශ්‍රී සුමඞ්ගල මාහිම්වරුන් විසින් සම්පාදනය කළ කතිකාවත ප්‍රමුඛස්ථානයක ගැණේ. එහි සංක්ෂිප්තයෙහි මෙසේ දක්නේය.

> "ශ්‍රී ශුද්ධ බුද්ධ ශාසනයෙහි මහා විහාර පරම්පරානුයාත අමරපුර නිකායික ගණයා කෙරෙහි ප්‍රධාන සථවිරයන් වූ දෙඩම්දූව ශෙෂලඞ්කාරාමාධිපතිව වැඩ විසූ අරියවංසාලංකාර සාසනධජ විනයාචරිය පියරතන නාමක සථවිරොදය න් වහන්සේ විසින ද, කළුතර පුලිනඛලාරාමාධිපතිව වැඩවිසූ සාසන ඇසාලංකාර කව්ධජ විද්‍යාචරිය වැලිඇම ශ්‍රී සුමඞ්ගලාභිධාන නායක සථවිර පාදයන් වහන්සේ විසින් ද සම නිකායිකයන් වහන්සේලා ප්‍රතිපත්තියෙහි පිහිටුවා ශාසනාභිවර්ධනය කරනු සඳහා ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2438 ට පැමිණි මෙම වර්ෂයෙහි සම්පාදනය කරනලද මෙම කතිකාවත ....."

මෙසේම රාමඤ්ඤ නිකාය ආදී අනිකුදු නිකායවල්ව ද මෙබඳු කතිකාවත් පණවා ඇත් හේය. සඟරජ කතිකාවත, ගල්ගිරියේ තෙරුන්ගේ කතිකාවත ඝනුවෙහුදු කතිකාවත් දෙකක් දක්නේය.

දහතවවන ශතවර්ෂයේ අවසාන භාගයේ දී බුඩ ධම්යේ ආභාසය පෙරදිග පමණක් නොව අපරදිග ද පැතිරී නොස් අපරදිග පඬුවෝ ද පාළි භාෂාව ආශ්‍රයයෙන් ධම්—විනය දෙක හදුළහ. ක්‍රි: ව: 1882 දී ආරම්භ කළ පාළි පොත් සමාගම (The Pali Text Society) නිසා පෙළ—අටුවා පොත් හැදෑරීමට යුරෝපීය පඬුවනට ද අවසථාව ලැබිණ. එහි ප්‍රතිඵලය වූයේ පාළි භාෂාව විශව භාෂාවක් බිවට පැමිණීම පමණක් නොවේ. බුඩ ධම්ය ද විශව ව්‍යාපි ධම්යක් බවට පැමිණීම ද විය. එ මතු නොවේ. සෙමින් සෙමින් නමුදු බටහිර දිනා ජීවිතයට බුඩ ධම්ය ද ඇතුළු විය. මේ අතර කාලයෙහි භේෂජ්‍ය විකාරණ ත්‍රිපිටක මුද්‍රණ සහාව පිහිටුවීම ද, එ මඟින් සියලුම අටුවා පොත් මුද්‍රණය කරවීම ද, ලක්දිව ධම්—විනය දියුණුවට ලැබුණු විශාල ආධාරයකි. මේ සහාව තුන්පිටකය ම අයත් අටුවා පොත් මුද්‍රණය නො කරන්නම් අදත් එසින් සමහරක් පුස්කොළ පොත්හි ලියූ වර්ණින් ම පවතිනු නිසැකය.

විසිවන ශතවර්ෂයේ මුල්භාගයේ පිරිවෙන් මගින් ප්‍රාචීන භාෂාවන් මෙරට ඉතා ඉක්මණින් දියුණු විය. ගණනින් පිරිවෙන් වැඩිත් ම දැතුමෙන් ද ඒවායින් ශ්‍රෙෂ්ඨ උගත්තු බිහි වූහ. විද්‍යෝදය, විද්‍යාලංකාර දෙ පිරුවෙන නිසා ශාඛා පිරිවෙන් කීපයක් ම ඇති විය. ඒ හැම ආයතනයක ම ධර්ම—විනය ඇතුළු භාෂා ශාස්ත්‍රාන්තරයන් උගැන්වූහ. **පරම ධම්ම චේතිය** (රත්මලානේ) **සංඝරාජ** (මහනුවර) **සෞගත** විද්‍යාලය (ජානදුරේ) **ප්‍රඥාලෝදය** (මොල්ලිඝාඛ) **සද්ධර්මාකර** (පින්වත්ත) **සෞගතෝදය** (කෝට්ටගොඩ) **මහාවෙතිය** (රන්දෙණේ) **සුධර්මාකර** (හෝනගල) **විද්‍යාලංකාර** විද්‍යාලය (අම්බලම්ගොඩ) **ආනන්ද** (ගාල්ල) **විද්‍යාලංකාර** (නාල්ල) **මහාමන්ත්‍රීන්ද** (මාතර) **ඥානෝදය** (කොස්ම්ලේ) **මහාවිහාර** (අනුරාධපුර) **ශාස්ත්‍රාලංකාර** (කඩුගන්නාව) **පරම ධම්ම නිවාස** (බෝරලැස්ගමුව) **ධර්මෝදය** (වැල්ලවත්ත) **සරස්වතී** (මීගහල්ල) **සුදර්ශන** (රන්දෙණේ) **සුගත ශාසනෝදය** (වැලිතොට) **ශ්‍රී නිවාස** (කඩුගන්නාව) **සිරිමංගල** (මාතර) **විද්‍යානන්ද** (නීට්ටමුව) **සෙලලාගන්නාරාමය** (බෙන්තොට) **විජයාභාණ්ඩ** (නාල්ල) **මංගල** (බේරුවල) **සරස්වතී මණ්ඩප** (දෙඛම්දූව) **ගුණරත්න** මුදලින්ද (හික්කැඩුව) **ශ්‍රී විජය සෞගත** (වලාන) **ඛද්‍රාරාජ** (ගොරක ඇපොල) **ප්‍රඥාරාජ** (අගලවත්ත) **සුභද්‍රාරාම** (ගංගොඩවිල) **ශික්ෂාලංකාර** (රන්දෙණේ) **ශාස්ත්‍රෝදය** (අම්බලම්ගොඩ) **වජිරසෙල** (පොතුහැර) **ගෞතම** (තංගල්ල) ආදී විද්‍යායතන රාශියක් ම මේ ශතවර්ෂයේ මුල් භාගයේ ඇති විය. පෙරදිග භාෂාවන් පිළිබඳව කවරදු හෝ නොපැවැති උද්‍යෝගයක් මේ විද්‍යායතනයන් නිසා ඇති කරවීමින් හෝ ඇති කරවන්නට හෝ ක්‍රි: ව: 1902 දී ප්‍රාචීන භාෂෝපකාර සමිතිය පිහිටුවන ලදී. සමිතියේ ආරම්භක උත්සාහයන් තුළ පැවැති දුර දක්නා නුවණ නිසා ධර්ම—විනය සහිත පෙරදිග භාෂාවන් හා ශාස්ත්‍රාන්තරයන්හි ගැඹුරු පඬිවරු සමූහයක් ම පහළ වූහ. නොයෙකුත් ග්‍රන්ථ නිෂ්පාදනයෙන් හා නව නවත් පිරිවෙන් පිහිටුවීමෙන් ධර්ම විනය දියුණු කළහ. ඒ අතර අතිශූරු පඬිවරු ද ධර්ම—විනය ග්‍රන්ථ සංශෝධනය කළහ. සන්න – ගැටපද ආදිය ලියූහ. විද්‍යෝදය පිරිවෙන්හි ආචාර්ය **හික්කඩුවේ සුමංගල** නායක සථවිරයන් වහන්සේ විසින් **"ශරු හණ්ඩ විනිච්ඡය"** නම් පොත ද; එහිම ආචාර්ය වූ **පණ්ඩිත මේවිතිගාඩ අමරමෝලි** සවාමීන් විසින් **"විනය ගැටපදය"** ද ලියන ලදී. විද්‍යාලංකාර පරිවේණාධිපති **කිරිබත්ගොඩ ඤාණානන්ද** නායක සවාමීන්ද්‍රයෝ **"සසුන වංසය"** ලියූහ. පානදුරේ රන්මොකත් විහාරාධිපති අසමදූවාසී **කරණවිට්ටියේ ජෝතිරත්නාභිධාන** නායක සවාමීන්ද්‍රයන් වහන්සේ විසින් **"පාළි මුත්තක විනය විනිශ්චය සන්නය"** සහ **"මහාවගග පාළි සන්නය"** ලියන ලදී. විනය පිටකානත ගාථාවන් සඞ්ග්‍රහ කර එයට **"සුජනප්පමොදනී"** නම් සන්නය ලියන ලද්දේ වවද්දර මෙධානන්ද සථවිරයන් වහන්සේ විසිනි. මේසේ ම **"විනය වත්ථු"** (පණ්ඩිත මාතර ධම්මවංස) **"විනය බිඳු"** (පණ්ඩිත මාතර ධම්මවංස) **"මූලසික්ඛා සන්නය"** (සිනාවත්තේ ගුණාලංකාර) **"කුදුසික්ඛා විවරණය"** (පණ්ඩිත වැලිගම සුමංගරතන) **"මහාවගග පාළි ගැටපදය"** (උහන්ඹේවිට සාසනතිලක) **"ප්‍රාතිමොක්ෂ වර්ණනාව"** (පණ්ඩිත පණ්ඩිතාලංකාර ජිනරතන—රත්ගම පසුකුසෙඛර) ආදී විනය ග්‍රන්ථ රාශියක් ම මේ කාලය තුළ ලියැවුණේ ය. මේ අතර ත්‍රිපිටකය සිංහලයට පරිවර්තනය කිරීමට අදහස් කළ සමන්ත ලංකා බෞද්ධ සම්මේලනය සූත්‍ර පිටකයේ පොත් කීපයක් සිංහලයට නඟන ලදී. එම සම්මේලනයේ ම ආරාධනයෙන් විනය පිටකයේ **චුල්ලවග්ග පාළිය** නිස්සැල්ලේ **සුමංගලාභිධාන** නායක සථවිරයන් වහන්සේ සිංහලයට පරිවර්තනය කළහ. එහි පෙළ මහාචාර්ය **ගුණපාල මලලසේකර** මහතුන් විසින් **සංශෝධිත** විය. පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණේ ත්‍රිපිටක ධර්ම සංගීතිය මේ වනවනුවෙහි සිදු වූ ශ්‍රෙෂ්ඨ ශාස්ත්‍රීක කෘත්‍යයකි. බුඞ්ධ පරිනිර්වාණයෙන් අවුරුදු 2500 ක් සම්පූර්ණ වීම නිමිත්තකොට රජයේ සහයොගයෙන් පවත්වන බුඞ්ධජයන්ති උත්සවයෙහි තුන්පිටකය සිංහලට පරිවර්තනය කිරීම ද එක් අංගයක් වෙයි. එබැවින් රජයේ ආරාධනයෙන් විනය පිටකයට අයත් **මහාවගග පාළිය** පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල සථවිරයන් වහන්සේ ද, **චුල්ලවගග පාළිය** හාල්දඬුවන ධම්මරක්ඛිත සථවිරයන් වහන්සේ ද සිංහලයට පරිවර්තනය කරති. **පාරාජිකා පාළිය** පණ්ඩිත **වේරගොඩ අමරමෝලි** සථවිරයන් වහන්සේ විසින් පරිවර්තනය කෙරේ. **පාචිත්තිය පාළිය** සිංහලයට නඟන්නේ පණ්ඩිත **ඉඳුරුවේ උත්තරානන්ද** සථවිරයන් වහන්සේ ය. **කෙසෙල්වතුගොඩ රතනජෝති** නායක සථවිරයන් වහන්සේ **පරිවාර පාළිය** පරිවර්තනය කරති.

* * *

ත්‍රිපිටකත්‍රයට අයත් ග්‍රන්ථසමූහයේ හෝ ග්‍රන්ථාගත ධර්මයන්ගේ සංවර්ධනය පිළිබඳ ඉතිහාසය සෙවීමෙහි දී එහි පූර්ව සීමාව හා අපර සීමාව වෙන් කරගත යුතුය. මෙහි පූර්ව සීමාව සිද්ධාර්ථ බෝධි සත්ත්වයන් වහන්සේ බුද්ධත්වයට පැමිණි කාලය (ක්‍රි: පූ: 543 හෝ ක්‍රි: පූ: 483) ද, අපර සීමාව බර්මි ත්‍රිපිටක ග්‍රන්ථාරූඪවූ වළගම් අභය රජුගේ රාජ්‍ය සමය (ක්‍රි: පූ: 29-17) ද වේ. අවුරුදු පන්සිඅසයක් පමණ වූ මේ කාලය තුළ සථවිරවාදීන් විසින් දඹදිව දී සඞ්ගායනා තුනක් පැවැත්විණි. මෙයින් ප්‍රථම සඞ්ගායනාව පිළිබඳ කිසි වාර්තාවක් සථවිරවාදීන්ගේ චුල්ලවග්ග පාළි ග්‍රන්ථයෙහි හැර අන් කිසි තත්කාලීන ශිලා ලිපියක හෝ ලේඛනයක දක්නට නැත. එහෙත් පසු කාලයේ ඇතැත් මහා සාංඝික—සර්වාස්තිවාදී—මහීශාසක—ධර්මගුප්ත නිකායිකයන්ගේ පොත්වල ප්‍රථම ධර්ම සඞ්ගායනාව පිළිබඳ යම් යම් විවෙචන දක්නේය. මේ සඞ්ගායනාවට රැස්වූ භික්ෂූන් වහන්සේ ධර්ම—විනය—අනිධර්ම පිළිබඳව සාකච්ඡා කළහයි සර්වාස්තිවාදීහු කියති. ප්‍රථම ධර්ම සඞ්ගායනාවේදීම ධර්ම—විනය නම් මෙය යි වෙන් කරගෙන එය පිටකවලට ද බෙදූ නම නියම කරගත් බැමින් ඔහැරින් ඇතුළු විය හැකි වාදාන්තර හෝ දෙශනා මාර්ග සියල්ල වළක්වන ලදී. එදා පැවැති එක්තරා සම්ප්‍රදායකට අනුව ධර්ම—විනය දෙක පිටකවලට බෙදූහ. වෛදිකයන්ගේ වෙද මන්ත්‍ර ආරක්ෂා කර ගැණීමේ එක් ක්‍රමයක් නම් පිටක සම්ප්‍රදාය යි. මේ ක්‍රමය බුබාඟමට ඇතුළු වූයේ පළමුවන සඞ්ගායනා වෙන් පසුව ය. දැන් පිටකත්‍රයට අයත් යයි සලකන සියලුම ග්‍රන්ථ මුල් සඞ්ගායනාවේදී කොවූ සේ සලකති. විනය පිටකයෙන් චුල්ලවග්ග පාළියේ පඤ්චසතිකක්ඛන්ධකය එම සඞ්ගායනාවෙන් පසුව ද, එහිම සත්තසතිකක්ඛන්ධකය දෙවන සඞ්ගායනාවෙන් පසුව ද එයට ඇතුළත් කරන ලදී. පරිවාර පාළිය; විනය පිටකය ඉතාම පිරිසුදුව ආරක්ෂා කරගනු පිණිස පසුකලෙක ලියූවක් සේ සලකති භික්ෂු—භික්ෂුණී විභංගයන්හි නොවිසඳූ කිසිවක් පරිවාර පාළියේ නැත. එක එක ශික්ෂාපදයක් ගෙන එය සොළොස් අයුරකින් ප්‍රස්තාර කොට විග්‍රහ කරන මේ ප්‍රශ්න විසඳීජන ක්‍රමය නිසා අභිධර්ම පිටකය සමග ද පරිවාර පාළියේ එක්තරා සම්බන්ධතාවයක් පවත්නේය. පරිවාර පාළියේ එන මේ ප්‍රශ්නොත්තර ක්‍රමය වෛදිකයන් වෙද මන්ත්‍රයන් ආරක්ෂා කර ගැණීමට යොදා ගත් අනුක්‍රමණිකා—පරිශිෂ්ට ක්‍රමයන් හා ඉතාම සමානය. විනිශ්චය සංකාශනාවෙහි ප්‍රධාන අදහස වූයේ විනය නීතීන් ක්‍රමානුකූල සංස්කරණයකට පත්කිරීම බැවින් ඉන් පසුව විනය පිටකයේ කිසියම් අඩුවැඩි වීමක් නොවිය අශෝක යුගයේදී අදට වඩා කුඩා වුවද පාළි ත්‍රිපිටකයක් තුබුණ බවට ශිලා ලේඛන හා ඓතිහාසික වාර්තාවෝ සාක්ෂ්‍ය දෙති. ක්‍රි පූ: 3 වන ශතවර්ෂයට අයත් ශිලා ලිපිවල ධම්මභාණක, පෙටකින් (පිටක දන්නා), සුත්තන්තික, පඤ්චනිකායික (නිකාය ග්‍රන්ථ පස දන්නා) යන වචන දක්නා අතර අශෝක රජතුමා ද භාබ්‍රා හෙවත් බෛරාට් ශිලා ලිපියෙන් සඞ්ඝයා වහන්සේට විනය පිටකය පිළිබඳ මතක් කිරීමක් ද කරන්නේය. මහ පැරකුම්බා දෙවන පැරකුම්බා ආදී රජවරුන් ලියවූ කතිකාවත්වල භික්ෂූන් වහන්සේ වීසින් අවශ්‍යයෙන් හදාරා යුතු ධර්ම—විනය ග්‍රන්ථ සමූහයක් දක්නා සේ ම මේ ශිලා ලිපියේ ද අශෝක යුගයේ විසූ භික්ෂූන් වහන්සේ විසින් දැනගත යුතු ධර්ම—විනය දෙශනා සඳහන් වන්නේය. ත්‍රිපිටකය ලංකාවට ගෙනෙන්නට පෙර එය පාළි භාෂාවෙන් ම පැවැති බවට මේ ශිලා ලිපිය සාධකයකි. එසේ නම් පාළි භාෂාව ලංකාවේ මහාවිහාරීය. භික්ෂූන්ගේ නිර්මාණයකැයි කියන පඬුවනට ද මේ ලිපිය පිළිතුරු දෙන්නේය.

ශිලා ලිපිය

1 ප්‍රියදසි ලාජා මාගධෙ සංඝං අභිවාදෙතුනං ආහ අපාබාධතං ච ඵාසු විහාලතං ච

2 විදිතෙ වෝ භංතෙ ආවතකෙ හමා බුධසි ධංමසි සංඝසීති හාලවෙ ච ප්‍රසාදෙ ච එකෙවි භංතෙ

3 භගවතා බුධෙන භාසිතෙ සවේ සෙ සුභාසිතෙ වා එ වූ බොභංතෙ හමියෘවයෙ දිසෙයා නෙවං සධඃ ෙච

අදහස

ප්‍රියදර්ශී මගධ රජ තෙමේ සංඝයා වහන්සේට නමස්කාර පූජාකර සුව පතා මෙසේ අනුශාසනා කරයි.

භෞරවාඥී ස්වාමීවරුනි, බුද්ධ ධර්ම සඞ්ඝ යන රත්නත්‍රය කෙරේ මා කොතරම් දුරට භෞරව හා ශ්‍රද්ධා සම්පන්නදැයි ඔබ වහන්සේ දන්නා සේක. භෞරවාඥී ස්වාමීවරුනි, භාග්‍ය වත් බුදුරජාණන් වහන්සේ විසින් භාෂිත

ශිලා ලිපිය	අදහස
4 විලසිතිකෙ හොසතීති අලහාමි හකං ත වාතවෙ ඉමානි හංතෙ ධංම පලියා යානි විනය සමුකසෙ	සියල්ල සුභාෂිතය. නමුත් ඒ දෙශනාවන්හෙන් ශ්‍රී සද්ධර්මය චිරස්ථායි වන කවරක් මා විසින් තෝරා ගන්නා ලද්දේදැයි මෙහි දැක්වීමට අවසර දුන මැනවි. පින්වත් සඞ්ඝරුනි, ධර්ම පාඨයෝ මොහු වෙත්. **විනය සමුව්වය, අරිය වංස දෙසනා, අනාගත භය, මුනිගාථා, මොනෙය සූත්‍ර, උපතිස්ස ප්‍රශ්නය** සහ මුසාවාදය පිළිබඳ දෙශනාවෙන් ආරම්භවන **රාහුල සූත්‍රය** යන මොවුහු වෙත්. පින්වත් සඞ්ඝරුනි, ගොරවාර්හ භික්ෂු භික්ෂුණීන් වහන්සේලා නිතර මේ ධර්මය ශ්‍රවණය කරනු දැක්ම මගේ සතුටයි. උපාසික උපාසිකාවෝද මෙය මනා සේ ඉගෙන ගත්තාහ පින්වත් සඞ්ඝරුනි, ජනයාට මාගේ අභිප්‍රාය දන්වනු පිණිස මෙය ලියවිණි.
5 අලිය වසා ණි අනාගත භයානි මුනිගාථා මොනෙය සුතෙ උපතිස මසිනෙ චා ලාහුලොවා	
6 චාදෙ මුසාවාදං අධිගිච්ච භගවතා බුධෙන භාසිතෙ එතානි හංතෙ ධංම පලියායානි ඉච්ඡාමි	
7 කිංති බහුකෙ භික්ඛු පාඛෙචා භික්ඛු නියෙචා අභික්ඛනං සුනෙයු චා උප ධාලයෙයු වා	
8 හෙවං මෙවා උපාසකාවා උපාසිකාවා එතානි හංතෙ ඉමං ලිඛාපයාමි අභිප්‍රෙතං මෙ ජනං තුසි	

අශොක රජ තමා සිත් ගත් සූත්‍ර දෙශනා සතක් මේ ලිපියෙන් දක්වමින් එය නිතර භාවිත කරන මෙන් භික්ෂු—භික්ෂුණීන්හෙන් ගරුබුහුමන් පෙරටුව ඉල්ලයි. මෙහි **1 විනය සමුව්වය** (විනය සමුකස) **නම්**; මහාවග්ග පාළියේ 1-6--7-8 ආදී වශී සහ උදාන පාළියේ 3-5 වශීයෝ වෙති. **2 අරියවංස සූත්‍රය** අඞ්ගුත්තර නිකායයේ චතුක්ක නිපාතයට ද **3 අනාගත භය සූත්‍රය** එහිම පඤ්චක නිපාතයට ද අයත්ය. **4 මුනිගාථා නම්** සුත්ත නිපාතයේ මුනි සූත්‍රයයි **5 මොනෙය්‍ය සූත්‍රය** ඉති වුත්තකයෙහි දක්නේය. **6 උපතිස්ස පඤ්හය නම්** සුත්ත නිපාතයේ සාරිපුත්ත සූත්‍රයයි. **7 රාහුලොවාද සූත්‍රය** සුත්තනිපාතයට සහ මජ්ඣිම නිකායට ඇතුළත්ය. සමහර පඬිවරු **විනය සමුකස** යනු තුවටක සූත්‍රයයි ද, **මොනෙය්‍ය සූත්‍රය** නම් නාලක සූත්‍රයයි ද, **උපතිස්ස පඤ්හය** නම් රථවිනීත සූත්‍රයයි ද කියති. එසේම **විනය සමුකස** යනු වෙන ම සූත්‍රයක් නොව සාමූකකං සික දෙශනාවයයි කියති. ඒ අතර සමහරු එය ප්‍රාතිමෝක්ෂයට නමකැයි පවසති. අශොක රජු විසින් භික්ෂු—භික්ෂුණීන්ගේ නිත්‍ය භාවිතය පිණිස මේ සූත්‍රයන් තෝරා ගන්නා ලද්දේ විනය පිටකයේ සාරය මේ සූත්‍රවල ඇතුළත් නිසාය. විශුද්ධිමාර්ගයෙහිදී බුද්ධඝොෂාචාර්‍යපාදයන් වහන්සේ විසින් බුද්ධදෙශනාව අනුව ජීවත්වන භික්ෂුවක විසින් පිළිපැදිය යුතු ප්‍රතිපත්ති සතරක් දක්වමින් **රථවිනීත ප්‍රතිපදාව** (=සූත්‍රය) **නාලක ප්‍රතිපදාව, තුවටක ප්‍රතිපදාව** සහ **මහා අරියවංස ප්‍රතිපදාව** ද දක්වන ලදී. **අශොක ශිලා ලිපියෙහි** දැක්වූ සූත්‍රයන්ගේ සහ බුද්ධඝොෂාචාර්‍යපාදයන් දැක්වූ ප්‍රතිපදාවන්ගේ (=සූත්‍රයන්ගේ) එක් සමානත්වයක් ඇත්තේය. අශොක රජ උපතිස්ස තෙරුන්හෙන් බුද්ධාගම් වැළඳගෙන සංඝසහිවාදී බෞද්ධයෙක් වියයි සමහර ඉතිහාසඥයන් කියතුදු මේ ශිලා ලිපියෙන් ප්‍රකාශ වනුයේ සථවිරවාදීන් කියන පරිදි එතුමා ථෙරවාදී බෞද්ධයකු වූ බවයි. අශොක රජුගේ සාංචි සතුප ලිපියක විනය පිටකය සම්පූර්ණයෙන් දන්නා උපාධ්‍යාය කාශ්‍යපගොත්‍ර නම් රහතන් වහන්සේ නමක් පිළිබඳ සටහනක් දක්නේය. **"සවිනා විනයකා ං අරං ඛාසඃ ගොතං උපාදිය අරං ච වාචිසු විජය තං විනාඃඛා"** යන මේ ශිලා ලිපියෙන් උන්වහන්සේ විනය පිටකය දැන සිටි බව ප්‍රකාශ වේ. ත්‍රිපිටක පාළිය ලංකාවට ගෙනෙන්නට පෙර—දඹදිව පැවතියදී—සංවර්ධනය වෙමින් පැවතිණ. එහෙත් සූත්‍ර පිටකය එවක පවා සම්පූර්ණව පැවැති බව ක්‍රි: පූ: 3 වන ශතවර්ෂයේදී ලියැවී පවත්නා **සුත්තනන්තික—පඤ්චනිකායිකා** යන යෙදුම්වලින් පැහැදිලි වේ. සූත්‍ර පිටකය ප්‍රධාන නිකාය ගුරු පසකින් යුක්තය. පිටකය දන්නා යන අදහස පවසනු පිණිස යෙදූ **පෙටකී** ශබ්දයෙන් තුන්පිටකය ම අදහස් කළාද? නැතහොත් එක් පිටකයක් හෝ දෙකක් අදහස් කළාදැයි පැහැදිලි නැත. පිටකත්‍රයේ සංවර්ධනය අඳුව පළමු සූත්‍රපිටකය ද, දෙවෙනුව විනය පිටකය ද, අන්තිමට අභිධර්ම පිටකය ද රචිතයයි සිතනු හැකිය. සූත්‍රපිටකයේ

බුදුන ත්‍රිකායම් අයත් ග්‍රන්ථ පිළිබඳව ථෙරවාදීන් අතර පවා නොයෙක් මත භෙද පවතී. දීඝ භාණකයෝ බුදුන ත්‍රිකායයේ ග්‍රන්ථ අභිධම් පිටකයම අයත් විය යුතුයයි කියති. එහෙත් මජ්ඣිම භාණකයෝ එය සූත්‍ර පිටකයට ඇතුළත් කරති. දීඝ භාණකයෝ චරියාපිටක—බුද්ධවංස ග්‍රන්ථ බුදුන ත්‍රිකායට අයත් නැතැයි කියති. බුද්ධවංස—චරියාපිටක පොත් දෙක ත්‍රිකායය ග්‍රන්ථයන්ගෙන් පසුකලෙක රචිතය. චරියාපිටකය ආර්‍යශූරපාදයන්ගේ ජාතක මාලාව අනුව පසුකලෙක ලියැවුණක් යයි සලකති. ජාතක මාලාවේ ජාතක කථා 34 ක් ද, චරියාපිටකයේ 35 ක් ද දක්නේය. "චරියා පිටක" යන නම මෙන්ම එහි උගන්වන ධර්ම මාර්ගය ද ස්ථවිරවාදයෙන් බැහැර අන්‍ය නිකායකට නැකම් කියන්නේය. මෙහි උගන්වන දශපාරමී පිළිබඳ කථා උත්තර භාරතීයයන්ගේ සිත්හි බල පැවැත්වූ බව පෙනේ. බොධිසත්ත්ව අදහස ආරම්භ වූයේ ඒ නිසාය.

අශෝක යුගයටත් පෙර පවත් ස්ථවිරවාදීන්ට මෙන් අන්‍ය නිකායිකයන්ට ද වෙන වෙන ම පිටක ද, පිටක ග්‍රන්ථ ද විය. ස්ථවිරවාදීන්ට සූත්‍ර—අභිධර්ම—විනය යනුවෙන් පිටක් තුනක් නමුදු මහාසංඝිකයන්ට සූත්‍ර—අභිධර්ම—විනය—ධාරණී—මිශ්‍ර යනුවෙන් පිටක පසකි. මහාසංඝික නිකාය ස්ථවිරවාදී නිකාය හා සමකාලීනය. සර්වාස්තිවාදීන්ට ද පිටක තුනකි. ස්ථවිරවාදීන්ගේ පිටකත්‍රය හැර දැනට ලැබී ඇත්තේ සර්වාස්තිවාදීන්ගේ පිටක ග්‍රන්ථ පමණකි. මාථුර—කාශ්මීරී යනුවෙන් සර්වාස්තිවාදීහු ද දෙකොටසකි. එයින් ස්ථවිරවාදය හා වඩා සමාන වන්නේ කාශ්මීරී (=මූල) සර්වාස්තිවාදය යි. පිටකත්‍රය පිළිබඳව මේ නිකායයන්ගේ ඇති වෙනස පහත සඳහන් පරිදි කොටෙන් දක්නේය.

1 විනය පිටකය

	ස්ථවිරවාද	සර්වාස්තිවාද (කාශ්මීර)	සර්වාස්තිවාද (මථුරා)
විභඞ්ග	පාරාජික පාළි	විනය විභඞ්ග	පාරාජිකා
	පාචිත්තිය පාළි		
ඛන්ධක	මහාවග්ග පාළි	විනය වස්තු	අවදානම්
	චුල්ලවග්ග පාළි	(විනය ක්ෂුද්‍රක වස්තු)	ජාතකම්
	පරිවාර පාළි	විනය උත්තර ග්‍රන්ථ	
	පාතිමොක්ඛ	ප්‍රාතිමෝක්ෂ සූත්‍ර	

2 සූත්‍ර පිටකය

දීඝනිකාය	දීර්ඝාගමඃ
මජ්ඣිම නිකාය	මධ්‍යමාගමඃ
සංයුත්ත නිකාය	සංයුක්තාගමඃ
අඞ්ගුත්තර නිකාය	අඞ්කෝත්තරාගමඃ
ඛුද්දක නිකාය	ක්ෂුද්‍රකාගමඃ

3 අභිධම් පටකය

ධම්මසඞ්ගණිප්පකරණ	ධර්මස්කන්ධපාදඃ (ආර්‍යශාරිපුත්‍ර)
විභඞ්ගපකරණ	විඥානකායපාදඃ (දෙවශර්මී ස්ථවිර)
කථාවත්ථුපකරණ	ප්‍රකරණ පාදඃ (වසුමිත්‍ර ස්ථවිර)
පුග්ගල පඤ්ඤත්තිපකරණ	ප්‍රඥප්තිපාදඃ (ආර්‍ය මෞද්ගල්‍යායන)
ධාතුකථාපකරණ	ධාතුකාය පාදඃ (පූර්ණ ස්ථවිර)
යමකපකරණ	සංගීති-පර්‍යායපාදඃ (මහා කෞෂ්ඨිල)
පට්ඨානපකරණ	ඥාන ප්‍රස්ථානම් (ආර්‍ය කාත්‍යායන)

කාශ්මීර් සර්වාස්තිවාදීන්ගේ **විනය විභඞ්ගය** සහ **විනය වස්තුව** ස්ථවිරවාදීන්ගේ **විභඞ්ග** (= පාරාජික පාළි—පාචිත්තිය පාළි) සහ ඛන්ධක (=මහාවග්ග පාළි—චුල්ලවග්ග පාළි) සමානය ස්ථවිරවාදීන්ගේ චුල්ලවග්ග පාළියේ එන **බුද්ධ වස්තු ඛන්ධකය** සර්වාස්තිවාදීහු **විනය ක්ෂුද්‍රක වස්තු** යන වෙනම පොතක් වෙන් සලකති. මහාවග්ග පාළි—චුල්ලවග්ග පාළි දෙ පොත්හි ඛන්ධක නමින් හැඳින්වෙන පරිවේදද දෙ විස්සක් නමුදු සර්වාස්තිවාදීන්ගේ පොත්හි වස්තු සතළොසකි. මහාවග්ග පාළියේ **චමෙපය්‍යකඛන්ධකය** සහ **කොසම්බකඛන්ධකයට** සමාන වස්තු (=පරිවේදද) දෙකක් ඔවුන්ට නැත. මේ ඛන්ධක දෙක ඔවුන් නො පිළිගත්තේ මෙහි කියවෙන කරුණු නො පිළිගත් නිසාය. ඔවුන්ගේ විනයයෙහි මේ කරුණු දක්නට නැත. චුල්ලවග්ග පාළියේ **භික්ඛුණීඛන්ධකය, පඤ්ච සතිකඛන්ධකය** සහ **සත්තසතිකඛන්ධකය** ද ඔවුනට නැත. **පඤ්චසතිකඛන්ධක සත්තසතිකඛන්ධක** දෙකෙහි දක්නේ ප්‍රථම-මිතීය සංගායනා පිළිබඳ විස්තර වෘත්තාය මේ සංගායනා ඔවුන් නො පිළිගත් බැවින් මේ ඛන්ධක දෙක ද පිළිගත්තේ නැත. මහාවග්ග පාළියේ **ඉතිරි** ඛන්ධක අට එසේම සර්වාස්තිවාදීහු පිළිගණිති. චුල්ලවග්ග පාළියේ ඔවුන් පිළිගන්නා ඛන්ධක සමවන්නේ කිහිපයකි. සෙස්ස සමාන නැත. ඒ මෙසේය.

ස්ථවිරවාද		සර්වාස්තිවාද	
මහාවග්ග පාළි		**විනය විභඞ්ග**	
1	මහා ඛන්ධක (=පබ්බජ්ජා ඛන්ධක)	1	ප්‍රව්‍රජ්‍යා වස්තු
2	උපොසථඛන්ධක	2	පොෂධ වස්තු
3	වස්සූපනායිකඛන්ධක	3	වර්ෂා වස්තු
4	පවාරණඛන්ධක	4	ප්‍රවාරණ වස්තු
5	චම්මඛන්ධක	5	චර්ම වස්තු
6	භෙසජ්ජඛන්ධක	6	භෛෂජ්‍ය වස්තු
7	කඨිනඛන්ධක	7	කඨින වස්තු
8	චීවරඛන්ධක	8	චීවර වස්තු
9	චමෙපය්‍යකඛන්ධක		
10	කොසම්බකඛන්ධක		
චුල්ලවග්ග පාළි		**විනය විභඞ්ග**	
11	කම්මඛන්ධක	9	කර්ම වස්තු
12	පාරිවාසිකඛන්ධක	10	ප්‍රතිඝාය වස්තු
13	සමුච්චයඛන්ධක	11	කාලාකාලසමුත්ථ වස්තු
14	සමථඛන්ධක	12	භූම්‍යනන්තරස්ථ චරණ වස්තු
15	බුද්ධ වත්ථුකඛන්ධ	13	පරිකර්මණ වස්තු
16	සෙනාසනඛන්ධක	14	ශයනාසන වස්තු
17	සඞ්ඝ භෙදඛන්ධක	15	කර්මභේද වස්තු
18	වත්තඛන්ධක	16	චක්‍රභේද වස්තු
19	පාතිමොක්ඛ ඨපනඛන්ධක	17	අධිකරණ වස්තු
20	භික්ඛුණීඛන්ධක		
21	පඤ්චසතිකඛන්ධක		
22	සත්තසතිකඛන්ධක		

ස්ථවිරවාදීන්ගේ **පාතිමොක්ඛය** සර්වාස්තිවාදීහු "**ප්‍රාතිමෝක්ෂ සූත්‍ර**" නමින් හඳුන්වති. ස්ථවිරවාදීහු සූත්‍ර පිටකය (දීඝනිකාය ආදීන්) **නිකාය** ශබ්දයෙන්ද, අභිධර්ම පිටකය (**ධම්ම**

සඛ ණිපපාතරණ ආදීන්) **පාතර ණ** ශබ්දනත ායෙන් ද ගණිති. සර්වාස්තිවාදිහු සූත්‍ර පිටකය (දීඝී ගමඃ ආදීන්) **ආගම** ශබ්දනයායෙන් ද අභිධර්ම පිටකය (ධර්මස්කන්ධ පාදඃ ආදීන්) **පාද** ශබ්දනත යෙන් ද ගණිති. සථවිරවාදීන් සූත්‍ර පිටක ායේ ග්‍රන්ථයන් හැඳින්වීමට **නිකාය** ශබ්දය ගත් නමුදු සර්වාස්තිවාදීන් මෙන් **ආගම** ශබ්දනත ය ද නත්හ. "මජ්ඣිම විසුඞ්ඛි මගෙඝා—එස වතුත්‍ථනම්පි ආග මානං නි" යනුවෙන් එය දක්නේය. **සථවිරවාදීන්ගේ** දීඝනිකායයෙහි සූත්‍ර 37 කි. එහෙත් සර්වාස්ති වාදීන්ගේ දීර්ඝාගම යෙහි සූත්‍ර 30 කි. මෙයින් සූත්‍ර 27 ක් ග්‍රන්ථවයෙහිම සමානය. දීඝනිකායයෙහි ඇතුළත් සූත්‍ර 3 ක් සර්වාස්තිවාදීන්ගේ මධ්‍යමාගමයෙහි දක්නේය. දීඝනිකායයේ **සංගීති සූත්‍රය** සර්වාස්තිවාදීන්ගේ **සංගීති පර්යාය** නම් අභිධර්ම ග්‍රන්ථයට අයත් ය. බුදුක නිකාය වෙනම කොට සක් මෙන් ඔවුහු දක්වති. එහෙත් බුදුන්ට **ක්ෂුද්‍රකාගමයක්** ද ඇත්තේය. බුදුක නිකායට පොත් 15 ක් සථවිරවාදීන්ට ඇතත් සර්වාස්තිවාදීන්ට ඇත්තේ ධර්මපදය, උදානය, සූත්‍ර නිපාතය, විමාන වසතු, බුබ්වංස යන ග්‍රන්ථ පමණකි. ලක්දිව සථවිරවාදීන් අතර ද, බුදුක නිකාය පිළිබඳ මත භෙද පැවැත්තේය. පාළි බුදුක නිකායට සම්වූ ක්ෂුද්‍රකාගමයට අයත් ධම්මපද, උදාන, **සථවිරගාථා**, විමාන වසතු සහ බුබ්වංසය සථවිරවාදයේ මෙන්ම සර්වාස්තිවාදයේ ද බොහෝ දුර සමානය. එහෙත් මේ පොත් අතර සූත්‍ර නිපාතයේ අට්ඨකවගග —පාරායණ වගග දෙකින් ගත් සූත්‍ර ද ඇත්තේ ය අට්ඨකවගග සහ පාරායණ වගග ය වෙනම පොත් මෙන් භාවිත වූ බැව් චීන තුර්කීස්ථානයෙන් ලැබුණු පොත්වලින් පෙනේ. විනය **කොෂයේ** "**අට්ඨක වගග**" යනු බලනු. සථවිරවාදීන්ගේ සහ සර්වාස්තිවාදීන්ගේ අභිධර්ම පිටකය; සඞ්ඛ්‍යා වගයෙන් ද නම් වගයෙන් ද සමාන නමුත් ඇතු ළත් කරුණු සමාන නැත. සර්වාස්තිවාදීන්ගේ අභිධර්ම පිටකයෙහි කතිවරු විද්‍යමාන වෙත්. සථවිරවාදීන්ගේ අභිධර්ම පිටකයට **අත්ත කථාවත්ථුප්පකරණය** ; පමණක් මොග්ගලි පුත්ත තිස්ස සථවිරයන් වහන්සේ විසින් ප්‍රණීතයයි දක්වති. සථවිරවාදීන්ගේ **ධාතුකථා පකරණය** සර්වාස්ති වාදීන්ගේ **සංගීති පර්යාය පාදයට** සමානය. මේ දෙක ම අඞ්ගුත්තර නිකාය හා අඞ්ගෝත්තරාගමය වැනි වේ. සථවිරවාදීන්ගේ **පට්ඨානප්පකරණය** සර්වාස්තිවාදීන්ගේ **ඥාන ප්‍රස්ථාන** ශාස්ත්‍රය හා සමය. එය ආර්යකාත්‍යායන තෙරුන්ගේ කෘතියකි. සථවිරවාදීන්ගේ **නෙත්තිප්පකරණය** ද, **කාත්‍යායන** තෙරුන් විසින් රචිතය.

සථවිරවාදීන්ගේ ප්‍රාතිමෝක්ෂයේ දක්නා ශික්ෂාපද සඞ්ඛ්‍යාව ද, සර්වාස්තිවාදී ආදී අනිකුත් නිකායිකයන් සමග සම නොවේ. ථෙරවාදීන්ගේ ප්‍රාතිමෝක්ෂයේ ශික්ෂාපද සඞ්ඛ්‍යාව දෙසිය සත් විස්සක් වේ. මේ ගණනට සෙඛියවුන් ද ඇතුළත් ය. ප්‍රාතිමෝක්ෂය උදෙසන්නට අනු දන වදාළ මුල් අවධියේ සෙඛියා හැර ශික්ෂාපද එක්සිය දෙ පණසක් විය. ව්‍යවහාර පහසුව උදෙසා මේ ගණන එක්සිය පණසක් සි ද කියති. ප්‍රාතිමෝක්ෂයෙහි සෙඛියා පන් සැත්තෑවක් දක්වා ඇත ද කඞ්ඛාවිතරණී අට්ඨාවෙහි ඒ පිළිබඳව කියනුයේ චතුනකඞ්කකයෙහි දැක්වෙන සියලුම වණ් ණික්ම විය යුතු හෙයින් ඒ සියල්ල සෙඛියාවලට ඇතුළත්වන බවයි. සර්වාස්තිවාදීන්ගේ විනය ග්‍රන්ථ යක් වූ මහා වස්තුප්‍රාප්ති සූත්‍රයෙහි "**සම්බහුලාඃ ශෛක්ෂධර්මාඃ**" යනු දක්නේය. සථවිරවාදීන් මෙන්ම සර්වාස්තිවාදීන් ද ශෛක්ෂධර්මයන්ගේ සංඛ්‍යාවක් නොකියනුදු සථවිරවාදීන්ගේ ප්‍රාතිමෝක්ෂ යෙහි සෙඛියා එක්සිය පණසක් ඇතුළත් වූවා මෙන් සර්වාස්තිවාදීන්ගේ ප්‍රාතිමෝක්ෂ සූත්‍රයෙහි ශෛක්ෂධර්මයන් එක්සිය තෙළෙහකි. මූල සර්වාස්තිවාදීනට එක්සිය සයක් ද, ධර්මගුප්තිකයන්ට එක් සිය්‍යක් ද ලැබේ. එසේම සථවිරවාදීනට පාචිත්තිය ධර්ම දෙසාතුවක් නමුදු සර්වාස්තිවාදීනට ප්‍රායශ්චිත්ත=පාචිත්තික ධර්ම අතුවකි මෙසේ ඒ ඒ නිකායිකයන් අතර ශික්ෂාපද පිළිබඳව අඩු වැඩිකම් දක්නේය. මූල් ප්‍රාතිමෝක්ෂයට සෙඛියාවන් ඇතුළත් වූයේ නැත. එහි සඞ්ඛ්‍යාවකුදු නැත. මේ සෙඛියාවනට "**දුක්කටය**" යනුවෙන් ආපත්ති නාමය නොකඩා "**සික්ඛා කරණීය**" නාමය කඩන ලදී. ඒ චාරිත්‍ර නය පිණිස යයි ද, එහෙත් පදඝටනයෙහි "**අ පත්ති දුක්කටස්ස**" කී බැවින් ශික්ෂා අනාදරයෙහි දුකුළා වෙන බව්ද අර්ථ කථාවාරී මතයි. මෙහි මුලින් දක්වූ අශෝක ශිලා ලිපි යෙහි "**විනය සමුකසෙ**" යනුවෙන් ප්‍රාතිමෝක්ෂය අදහස් කරන ලදැයි සමහර පඬිවරු කියති.

* * *

චිනය පිටකයට අයත් ග්‍රන්ථයන්ගේ විටනාකම් පවත්නේ බුදුන් දෙසනාවක් වීම, විනය ශික්ෂාවන්ගේ නිදාන, වස්තු, පුද්ගල, ප්‍රභේදනා පිළිබඳ විස්තර දක්නා ලැබීම නිසා ම නොවේ. බෞද්ධයනට මෙහි ලා යම්බඳු අගයක් ඇත්තේ ද, එබඳු වූ ම අගයක් පැරණි සමාජය පිළිබඳ තොරතුරු සොයනුවනට ද, ඇත්තේය. සාමාජික වාතා ග්‍රන්ථාරූඪ නොවූ යුගයක, සමරණ ශක්තියේ අතුල්‍ය බලමනිමියෙන් ඒ සියල්ල වූ පරිදි ම පරපුරෙන් පරපුරට රැක ගෙන ඒ මේ ප්‍රතිඵලය විනය පිටකය අප වෙතට ලැබීමය. මෙසින් ශතවර්ෂ විසිපහකට පෙර භාරතයේ පැවැති දෘෂ්ටික සංකල්පනා, ආචාර විචාර විධි, ප්‍රජාපාලන ශික්ෂා, ණ්‍යාය තන්ත්‍ර, අධ්‍යයන අධ්‍යාපන ක්‍රම, සමාජ චාරිත්‍ර, ආගමික සිද්ධාන්ත, විද්‍යා විධි, කලා ශිල්ප ආදිය පිළිබඳ විස්තර වාතා ඇතුළත් ග්‍රන්ථාවලීය විනය පිටකය වේ. එ මෙන්ම ඔවුන්ගේ සීමාසහිත සුඛෝපභොගී ජීවිතයෙහි බල පෑ විවිධ ජීවන වෙළඹාවන් ද, පාර ලෞකික ජීවිතයෙහි සුඛාස්වාදය පිණිස අනුගමනය කළ සදහන් ශික්ෂා මාර්ගයන් ද දත හැක්කේ විනය ග්‍රන්ථයන්හෙනි. එ මතු නොවේ. ලෞකික සංස්කෘතයට හෝ වෛදික සංස්කෘතයට කිසිදු සම්බන්ධයක් නැති (චුල්ලවග්ග පාළි බුදුක වත්ථුකඛ්ඩකය ආදී තන්හි දක්නා) දෙමිය ශබ්ද හා පාළි භාෂාවගේ සංවර්ධනය පිළිබඳ නිදසුන් කියන තත්සම—තද්භව ශබ්ද සමූහය නිසා ද, ඉන්දු—ආර්‍ය භාෂා ගණයේ ඉතා උසස් තැනක් විනය පිටකයට හිමිවන්නේය. සාහිත්‍ය කෘතීන් සැරියෙන් ගෙන විමසා බැලුව ද, ඒ ඒ ශික්ෂාපදයන්ගේ නිදානයන්හි දක්නා චරිත කථා ණාශ්‍රය මිථ්‍යා මිතාන්තර, පරිකල්පනා, අතිශයෝක්ති ආදියෙන් සහමුලින් තොර වූ සවාභාවික කථා වස්තුහුය. සවාභාවික, සත්‍ය සිඹින් හා චරිත කථාවන් කිසිදු අඩු-වැඩියක් නොකොට ඒ වූ පරිදි ම දක්නා ග්‍රන්ථාවලියක් මේ හැර තවත් නැත. මෙහි අගය තවත් වැඩි වන්නේ මේ සත්‍ය සිඹින් සහ චරිත කථාවන් ශ්‍රේෂ්ඨ සමාජයක ශික්ෂා පද්ධතියකට පදනම් වීමත්, ඒ ශික්ෂා මාර්ගය ලෞකොත්තර ජීවිතයට පමුණුවා එසින් සදකාලික සුඛාස්වාදයක් විඳුවීමත්ය. **සිද්ධිය** සමහරවිටක දුශ්ශ්‍රාව්‍ය වාතාවක් හෝ ඛෙදවාචකයක්, දුර්වල චරිතයක්, මිථ්‍යා මතයක්, ආචාර සම්ප්‍රදායක් විය හැකිය. එහෙත් ඒ නිසා පැනවුණු **නීති**ය ඒ සියල්ලට ම ලැබුණු එකම පිළිතුර විය. **ප්‍රතිඵලය** නිර්‍වාණයයි. කලින් කල භික්ෂු ජීවිතයේ උන්නති අවනති අවස්ථාවන් දක්නේ නම්වූ භික්ෂු සමාජය කෙබඳු නීති පද්ධතියක් උඩ ගමන් කළෝ ද යනුත් විනය පිටකය අපට කියන්නේය.

එදා භාරතයේ බොහෝ **බ්‍රාහ්මණයන්** බුදුරදුන් වෙත මහණ මහළු පැවිදිව විසුවද කුල මානයෙන් ඉදිමුණු ඇතැම් බමුණන් උන්වහන්සේට නිතැ කළ සැරි පාරාජික පාළි ආරම්භයේ ම දක්නා වෙරඤ්ජා කථාවෙන් කිය වේ. උන්වහන්සේ මෙන්ම උන්වහන්සේගේ ධර්ම මාර්ගයත් ඔවුනට පෙණුනේ **අරසරූපො-නිබ්බානගෝ-අකිරිය වාදෙ-උච්ඡේද වාදෙ-ජෙගුච්ඡී-වෙනයිකා-තපස්සි-අපගබ්භා** යන මේ වචන ඔවුන් දැනගත් අර්ථ අනුවය. එහෙත් බ්‍රාහ්මණයන් තමන් වහන්සේට නිතැ පිණිස කියූ මේ ශබ්දයන්ගේ ධ්වන්‍යාර්ථය ප්‍රතික්ෂේප කළ උන්වහන්සේ එහි ව්‍යඞ්ග්‍යාර්ථයෙන් තමන් වහන්සේ හඳුන්වනුයේ ශ්‍රේෂ්ඨ වාදියකුගේ මෙන්ම තාර්කිකයකුගේ ද විලාසයෙනි. **"සෙය්‍යථාපි බ්‍රාහ්මණ කුක්කුවිය අණ්ඩානි"** (පාරා: පා: 4[1]) යන ඡේදයෙන් තමනියම තතු පෙන්වා අනතුරුව එසින් ම තම ශාසනයේ මූලික ප්‍රතිපත්ති **මාර්ග** ද වදාරති. සුදින්න කථාවෙහි **"කිඤ්චාපි නාම තා අඤ්ඤපුත්තා අවජ්ජරූපයා? යාහං එවං හෙතු ඛ්‍රහ්මචරියං චරසීති"** (පාරා: පා:17[21](යන පාඨයෙන් අඛුදරුවන් හැර දමා දෙවඟනන් පිණිස බඹසර හැසිරෙනැයි භික්ෂුනට සමහර කෙනෙකු කළ දොරණු උපහාසයන් එදා ඔවුන් භික්ෂූන් මෙන්ම බුද්ධාගම ද ඇදිනගත් අයුරු කියන්නේය. බුදුන් වෙත බොහෝ කුලපුතුන් පැවිදිවන විට සමහරු උන්වහන්සේට ද චෝදනා කළේ මෙසේ ම ය. **"අප්පුත්තකතාය පබ්බජිතා සමණා ශාකපුත්තියා, වෙධබ්‍යාය පබ්බජිතා සමණා ශාකපුත්තියා කුලූපවේජදාය පබ්බජිතා සමණා ශාකපුත්තියා"** (මහා: පා: 40[3]) යනුවෙන් සමාජයේ සමහර කෙනෙකු උන්වහන්සේ වරදවා තේරුම් ගත් අයුරු පැහැදිලි කරයි. "අප්පුත්තකං සාපතෙය්‍යං ලිච්ඡවියෝ අතිහරාපෙස්සං" (පාරා: පා: 18[9]) ඝන-පාඨය එවකා පැවැති රාජ්‍ය පාලනය පිළිබඳ බලපෑ එක් නීතියක් පවසන්නේය.

"මිලක්ඛඤ්ඤඤ්ච අරියඤ්ඤඤ්ච සන්තිඤ්ඤෙ සික්ඛං පච්චක්ඛාමි" (පාරා: පෘ: 29[13]) යන තන්හි මිලක්ඛ නම්; අන්ධ දමිළාදි අනාර්‍ය භාෂා යි ද, අරියක්ඛ නම්; ආර්‍ය ව්‍යවහාරය වූ මාගධ භාෂාව යි ද, බුදුහොඟාවෙයි පාදයෝ කියති. මිලක්ඛ ශබ්දයාගේ නිරුක්තියය අප්‍රකටය. එය ම්ලේච්ඡ ශබ්දයෙන් ප්‍රභව වූ ප්‍රාකෘත රූපයක්යැයි සමහර පඬුවන්ගේ මතයයි. අටුවා ඇදුරන් නම් "අන්ධ දමිළාදිය නම් ආන්ද්‍ර දෙශයේ ව්‍යවහාර වූ දෙමළ ආදි භාෂා යි. ආන්ද්‍ර දෙශයේ මෙවන ව්‍යවහාර වන්නේ තෙලිඟු භාෂාව නම්වූ අටුවා ලියන කාලයෙහි ව්‍යවහාර වූයේ දෙමළ භාෂාව මිස මෙයින් පෙරාණි තෙලිඟු සාහිත්‍යයේ වයස අවුරුදු නවසියයකි. මිලක්ඛ ශබ්දයෙන් කියන ආදිම ද්‍රවිඩ භාෂාවේ කිසිවක් දැනට සොයා ගන්නට නොමැත. ආන්ද්‍ර දෙශය ඉතා පැරණි ශිෂ්ටාචාරයක් ඇති බුදුශාසනයේ ව්‍යාප්තියට අසහාය සේවයක් සිදුවූ නගරයකි. නාගාර්ජුනි කොණ්ඩය සහ ධන කටක ය පිහිටියේ ද මෙහි ය. මිලක්ඛ ශබ්දයෙන් ආන්ද්‍ර ද්‍රවිඩ භාෂා ගත යුතුයයි අටුවා ඇදුරන් කියන්නේ අටුවා කරන කාලයෙහි ද්‍රවිඩ භාෂාවන් අතර ඉතා ප්‍රකට වූයේ ආන්ද්‍ර ද්‍රවිඩ භාෂාව බැවිනි. එහෙත් පාරාජික පාළියේ එන මිලක්ඛ ශබ්දය අටුවා කාලයෙන් ගතවූ 10 කට වඩා පැරණි ය. එකල මේ ශබ්දය ව්‍යවහාර වූයේ කවර භාෂාවකට හෝ භාෂා ගණයකටදැයි දැනගනු පිණිස බුඬ කාලයේ පැවැති ආර්‍ය—අනාර්‍ය භාෂා පිළිබඳ පරීක්ෂණයක් කළ යුතුය. මිලක්ඛ නම් ද්‍රවිඩභාෂා ඒ ගතගොත් ඒ ආදි ද්‍රවිඩ භාෂාවන්හෙන් ආර්‍ය භාෂාවට ඇතුළුවූවන පෙළ පොත්හිල හමා දක්නේය. වෙදසට පවා ඒ ආදි ද්‍රවිඩ වචන ඇතුළත් විය.

"අථ ඛො වස්සකාරෝ බ්‍රාහ්මණො මගධ මහාමත්තො" (පාරා: පෘ: 46[17]) යන තන්හි මහාමත්ත ශබ්දයෙන් කියවෙනුයේ මහාමාත්‍යයන් නොව මහාමාත්‍යයෝ ය. මහාමාත්‍යයන්ගේ සහ මහාමාත්‍යයන්ගේ වෙනස ඉතා විශාලය. සංස්කෘත මහාමාත්‍ය·ශබ්දයෙන් ආර්‍යයට හා මහාමච්ච ශබ්දය ඒ අර්ථයට ම රුස් වී පවතී. සංස්කෘතයෙහි ත්‍ය අන්ත ශබ්ද පාළියෙහි එනුයේ ච්ච වීමෙනි. සං. නිත්‍ය > නිච්ච, සත්‍ය > සච්ච, කෘත්‍ය > කිච්ච, ආදිත්‍ය > ආදිච්ච[1] උදිත්‍ය > උදිච්ච ආදි වශයෙනි. සංස්කෘත ත්ව අන්ත ශබ්ද පාළියට එනුයේ තත්ත වීමෙනි. පුත්ත > පුත්තක, නෙත්ත > නෙත්තා, පාත්ත > පත්තා, සුත්ත > සුත්තා, ගොත්ත > ගොත්තා යනුවෙනි. එසේ ගත ද මේහි බුල් ශබ්දය මහාමාත්‍ය නොව මහාමත්ත බව පැහැදිලිය. අශොක ශිලා ලිපිවල දක්නා මහාමාත්‍ර ශබ්දය මෙයට හැඟවුම් කිරීහි. අශොක රජු දවස ධම්ම මහාමාත්‍ර, අධ්‍යක්ෂක මහාමාත්‍ර, ව්‍යොහාරික (නීතිය පිළිබඳ) මහාමාත්‍ර, නාගරික මහාමාත්‍රයන් සහ අන්‍ය (=දෙශීය) මහාමාත්‍රවරු ද සිටියහ. තමන්ගේ පෙර ධම්ම මහාමාත්‍රයන් නො සිටි බැවින් ඔවුනුදු පත් කරන බව අශොක රජ මහේශ්වරු ලිපියෙන් කියයි. අශොක රජුද කියන නොයෙකුත් මහාමාත්‍රයන් බුඬකාලයේ ද විසූ බව දෙශනා පාළියේ ම දක්නේය. "චුල්ලසුභද්දා භික්ඛුණී මහාමත්තානං එතමත්ථං ආරොචෙසි" (පාරා: පෘ: 248[14]) "අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරෝ සෙනානායකෙ මහාමත්තෙ ආණාපෙසි" (මහා: පෘ: 82[5]) "දීඝෙනා නදීතෙනා වොහාරිකෙ මහාමත්තෙ පුච්ඡිංසු" (පාචි: පෘ: 248[6]) "සෙය්‍යථාපි භණෙ මහාමත්තා" (චූ: පෘ: 243[12]) "එකච්චෙව මහාමත්තා එවං මතිං අකංසු" (චූ: පෘ: 317[8]) යන නිදසුන්වලින් රජුගේ නොයෙකුත් ධුර දරන මහාමාත්‍රයන් විසූ බව පැහැදිලි වේ. අශොක රජු කියන්නාක් මෙන් පාළි සාහිත්‍යයේ ද ධම්ම මහාමාත්‍රයන් කොට දක්නේය. චුල්ලවග්ග පාළි සඞ්ඝ භෙදකාරක භික්ෂූන් දෙව්දත් කුමරුන් පිළිබඳ කථාවෙහි එබඳු මහාමාත්‍රයන් සමූහයක් පිළිබඳ විස්තර ඇතුළත් වේ. එහි බිම්බිසර රජ සමහර මහාමාත්‍රයන් නිලයෙන් පහ කෙළේය. සමහරුන් පහත් නිලවල ද, අන් කෙනෙකු උසස් නිලවලට ද පත් කෙළේය. මේසේ බැවින් දෙශනා පාළියේ මහාමත්ත ශබ්දය මහාමාත්‍ය යනුවෙන් විස්තර කිරීම සුදුසු නැත. මේ මහාමාත්‍රයෝ රජුගේ උසස් නිලධාරීහුය. ඔවුන්ගේ යුතුකම නම් දෙශ සීමා තුළ සිදින ජනකාවගේ යහපත පිණිස කම්යුතු කිරීමයි. රජුගේ මෙබඳු උසස් නිලධාරීහට "යුත්ත පුරුත්ත" යි කෞටිල්‍ය නම් කරන්නේය.

බුඬ ධම්ම බුදුන්·දවස උත්තර භාරතයේ සීමා සහිත ප්‍රදෙශයක විහරා ඉන් බව සැතුරුණේ කැතැයි සමහර පඬිවරුන්ගේ මතයකි. "තෙන ඛො පන සමයෙන භාරුකච්ඡකො—පෙ—භාරුකච්ඡං ගච්ඡන්තො" (පාරා: පෘ: 42[23]) "එසා භික්ඛවේ ඉත්ථී කාලිඞ්ගස්ස රඤ්ඤො අග්ගමහෙසී

අහොසි" (පාරා: පා: 1[10][35]) ඝන පාඨවලින් භාරුකච්ඡය සහ කාලිඞ්ගය ද සඳහන් වේ. මේ දෙරට පිහිටියේ ඉන්දියාවේ බටහිරි—නැගෙනහිරි පෙදෙස්වල ය. භාරුකච්ඡය මුහුදු ගමන් මාර්ගයේ ද ප්‍රසිද්ධ තිබිණි. මේ කාලයේ බරෝච් හෙවත් බ්‍රෝච් යනුවෙන් හඳුන්වන බටහිරි ඉන්දියාවේ නර්මදා ගං මුවදොර පිහිටි ප්‍රදේශය මෙය වේ. මහානදී—ගොදාවරී අතර පිහිටි කාලිඞ්ගය දකුණු ඉන්දියාවම අයත්ය. මේ දෙරට පාරාජික පාළිය වැනි පුරාණතම ග්‍රන්ථයක සඳහන් වන්නේ බුදුහාමි හැන දැන සිටි නිසා විය යුතුය. බුදුකා කාලයෙහි භාරතයෙහි නොයෙකුත් ඇදහිලි ක්‍රම විය. ගස්—ගල් ඇදහිලි ද ඒ අතරවා ම පැවැණි. ඒ ආගමිකයන්ගේ පූජනීය වස්තුවලට කිසිදු හානියක් කිරීමට බුදුහු ඉඩ නොදුන්හ. පූදනලභාගේ අදහස් ක්‍රමය සකස් කිරීම විනා ඒ උඩ හොඬනැගුණු සුළු ඔදම් සකස් කිරීමට උන්වහන්සේ අදහස් නොකළහ. "විගරහි බුද්ධා භගවා කථං හි නාම මෝඝ පුරිස චෙතිය රුක්ඛං චේතයිස්සසි භාවපූජිතං-පෙ-රඤ්ඤපූජිතං" (පාරා: පා: 1[9][28]) යනුවෙන් ඡන්න නම් භික්ෂුව එනුදු වෘක්ෂයක් සපා දැම්ම නිසා භික්ෂූන්ට ශික්ෂාපදයක් පවා බුදුහු පැණවූහ. වෘක්ෂ ලතාවන් එකීන්ද්‍රිය ප්‍රාණීන් මෙන් එදා සැලකූහ. "එකින්ද්‍රියං සමණා සක්‍ය පුත්තියා ජීවං විහෙඨෙසසන්තී" යි (පාමි: පා: 4[7][39]) මේ එකීන්ද්‍රිය නම් ජීවිතෙන්ද්‍රියය වේ. ජීවං යනුවෙන් කියනු යේ ද එය මැයි. එහෙත් බුදුන් විඤ්ඤාණකාවන්ගේ ජීවිතෙන්ද්‍රියවය නොසා පිළිගත් බැව් "ජීවසඤ්ඤිනෝ හි මොඝපුරිස මනුස්සා රුක්ඛස්මිං" (පාරා: පා: 190[30] පාමි: පා: 48) යන පාඨවලින් ප්‍රකාශ වේ. විඤ්ඤාණකාවන් ජීවින් මෙන් උපන්වනුයේ ජෛන ධර්මයේය. දීඝනිකායයේ සාමඤ්ඤඵල සූත්‍රයේ ද එය දක්නේය. විඤ්ඤාණකාවන්ගේ විරූහන ස්වභාවය ජීවත්වෙන් ගන්නා ලදැයි සුමඞ්ගල විලාසිනියෙහි "සනිඤ්ඤ හි සෝ විරූහති භාවෙන ජීවසඤ්ඤාදී" යනුවෙන් පැවසේ

පාරාජික පාළි චතුපාප සඞ්ඝාදිසෙස නිදාන කථාවේ මෙන් ම එම ශික්ෂාපද පදභාජනියේ ද එවක පැවැති ආවාහ—විවාහ පිළිබඳ සමාජ චාරිත්‍ර රාශියක් විස්තර වේ. ඉන්දු—ආර්ය යුගයෙන් ආරම්භ වූ දෙවකාවන් ඇදහීමෙන් වැඩි හරියක් බුදුකා කාලය වන විට අභාවයට ගොස් අවශේෂ. එහෙත් අග්නි දෙවකාවා ඇදහීම බුඩ කාලයේ ද ඉන් පසුව ද පැවැත්තේය. මහාවග්ග පාළියේ උරුවේල කාශ්‍යපයන් පිළිබඳ පුවතෙහි අග්නි දෙවකාවා ඇදහීම සහ යාගය පිළිබඳ වැදගත් කරුණු රාශියක් ම ඇත්තේය. එහි දක්වෙන විස්තරය විනය පිටකයේ අන් පොතකින් නොලද හැකිය. උරුවේල් කස්සප් ආදී නවුසන්ට දෙසූ ආදිත්ත පරියාය සූත්‍රයේ "සබ්බං භික්ඛවෙ ආදිත්තං" යන ආරම්භ දේශනා පාඨය ඇසිනිසා පඤ්ඤෙයෙන් ඉතාම වටනේය. චුල්ලවග්ග පාළියේ "න භික්ඛවෙ සිඞ්ගිලෙන ජීවාතිං වත්තබ්බා. යෝ වදෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (චු: පා: 254[8], යන පාඨයෙන් එක් තරං ආගමික මතයක ඉතිහාසය කියන්නේය. ඉතා ඈත යුගයක සිට ලෝකයේ බොහෝ ප්‍රාථමික ආගම්වල ප්‍රාණය, ආත්මය මෙන් සලකන ලදී. උපනිෂද් ග්‍රන්ථවල ද මේ අදහස දක්නේය. ඒ ආත්මය ශරීරයෙන් යම් යම් අවස්ථාවලදී ඉවතට යෑමෙන් ආයුෂ අඩු වේ යයි ඔවුන්ගේ හැඟීම විය. හදිසියේ කිසිසුමක් ගිය විට ද, ශරීරයෙන් ආත්මය ඇත් වූ බැවින් ආයුෂ අඩුවේය යි සිතූහ. මෙබඳු ප්‍රාථමික ආගමික අදහස්වලින් එදා භික්ෂූනු ද නොතොර වූහ. බුදුහු ධර්මදේශනා කරමින් සිටි එක් අවස්ථාවක දී කිව්සිහ. මෙහිදී සෙසු භික්ෂූනු "ජීවතු භගවා භවා, ජීවතු සුගතෝ" යි (චු: පා: 254[4]) උස් හඬින් ශබ්ද කළහ. මෙයින් ඒ භික්ෂූන් ආත්මවාදය ගුරු කොට ගත් බවක් නොකියවෙතුදු එදා පැවැති ප්‍රාථමික Primitive ආගම්වල අදහස් උන්වහන්සේ කෙරෙහි ද බල පෑ බව පැහැදිලිය.

බුඩ කාලයෙහි ලෙඛන විද්‍යාවක් නොවිය යි සමහර පඬිවරුන්ගේ මතයයි. එහෙත් විනය පිටකයේ සම් යම් පාඨවලින් එවක ලිවීමේ ශිල්පය දියුණුව පැවැති බවට සාධක ලැබේ. "ලෙඛාය සංවණ්ණෙතබ්බ" (පාරා: පා: 81[14]) "ලෙඛං සික්ඛෙය්‍ය" (මහා: පා: 85[26] පාචි: පා: 146[8]) "ලිඛිතකා" මහා: පා: 83—101) ආදී පාඨවලින් පැවැසෙනුයේ එවක ලිවීමේ ශිල්පය පැවැති බවයි. එය පොදු සමාජයේ අදහස් ඵදහස් දැනගැනීමට චුල්ලවග්ග පාළි ඛුද්දක වත්ථුක්ඛන්ධකය ඉතා ප්‍රයෝජනය. භික්ෂූ ජීවිතයට හොඳ හැඟෙන යම් යම් දේ භික්ෂූන්ගෙන් කෙරෙනවිට පොදු මහාජනයා උද්ගෝෂණ

කළහ. **ඤාණා විලංඝිතාවන්හෙන් භික්ඛූන් සැරසෙනවිට සෙය්‍යථාපි**" ..... සි කීහ. මේබඳු තැන් චුල්ලවග්ග පාළියේ බොහෙයක් තැන දන්නේය. "සෙය්‍යථාපි 1 ගිහි කාමභොගී නො"-"සෙය්‍යථාපි 2 කීතපිණ්ඩා"-සෙය්‍යථාපි 3 "මිලලමුචලිකා ගාමපොදුවා"-"සෙය්‍යථාපි 4 පිසාචිල්ලිකා"-"සෙයථාපි 5 කංස පත්තපරිකා"-"සෙය්‍යථාපි 6 රජොහරණ මුණ්ඩවට්ටි"-"සෙය්‍යථාපි 7 දවඩාහකා"-"සෙය්‍යථාපි 8 මිකාහවා"-"සෙය්‍යථාපි 9 ගිහිසාමභොගිනී යන මේ පාඨයන් ගෙන් එවක කාමභොගී සත්ත්ව ප්‍රෑඪ ආදින්ගේ ජීවිතය කෙබඳු ගති පැවැතුම් වූයේ ද යනු දැනගනු හැකිය. චුල්ලවග්ග පාළි සඩ්ඝ භෙදක්‍යක්ඛන්ධකයෙහි අනුරුද්ධ කුමාර කථාවෙහි එවක ගොවිතැන් කළ අයුරු පැමැසෙන්නේය.

* "ඉළමුව් කෙත සි සැම් කරවීය යුතුයි. සි සැම් කරවා වැපිරවිය යුතුයි. වැපිරීම් කරවා ජලය ඇතුළුව ගත යුතුයි. ජලය ඇතුළට ගෙන ජලය සම් ලෙස පැතිර වීය යුතුයි. ජලය සම් ලෙස පතුරුවා නෙළීම් කරවිය යුතුයි. නෙළීම් කරවා කැප්පිය යුතුයි. කප්පා එකතුකොට ඇද්දිය යුතුයි. එකතුකොට අද්දා කෙලින්(?) ගොඩ ගැස්සිය යුතුයි. කෙලින් (?) ගොඩ ගස්සා පැශීම් කරවිය යුතුයි. පැශීම් කරවා පිදුරු බැහැර කරවිය යුතුයි. පිදුරු බැහැර කරවා කාටුව හැරීම් කරවිය යුතුයි. කාටුව හැරීම් කරවා හුළං ගැසීම් හෝ පෙළීම් කරවිය යුතුයි. හුළං ගැසීම් හෝ පෙළීම් කරවා ගෙන ගොස් තැම්බිය යුතුයි."

චුල්ලවග්ග පාළියේ මේ පුවතින් කියන්නේ ක්ෂත්‍රිය වංශිකයන් ද කාෂිකර්මයට පුරුදු පුහුණු වූ බවයි. මනු නීතියෙහි[10] වෛශ්‍ය වංශිකයනට නියම වූ කාෂිකර්මයට බුඩ කාලයෙහි දී ක්ෂත්‍රිය වංශිකයෝ ද ප්‍රිය කළහ. ලංකාවේ ගොවිතැන් කිරීමේ ක්‍රමය චුල්ලවග්ග පාළියේ දක්නා ක්‍රමය හා සම්පූර්ණයෙන් එකහය. චුල්ලවග්ග පාළිය හැර වීනය ශ්‍රුත්‍යංක කිසියේත් ඇතුලත් කළ නොහැකි තැන් ද එහි දක්නේය. බුදුකවපටු ඛන්ධකයේ එන අහිරාජ සූත්‍රය එබඳු එක් තැනකි. මේ සූත්‍රය පිළිබඳව **සම්භතාඝාසාදිකාවෙද** කියවක් නො කියයි. එහිනි ආත්මාරක්ෂාව පිණිස විරූපක්ඛ—එරාපථ—**ඡබ්‍යා පුත්ත**—කණ්හා ගොතමක යන සර්පරාජ කුලයන්ගේ මෛත්‍රිය පැතිර වීය යුතු බව පෙන්වා ඒ පිණිස භාවිත කිරීමට "**විරූපක්ඛෙහි මේ මෙත්තං**" ආදින් පිරිත් සූත්‍රයකුදු උගන්වති. චුල්ලවග්ග පාළියේ අනිකුත් ශික්ෂාපදයන් සමඟ සසඳා බලනවිට පෙණෙනුයේ ඒ ශික්ෂාපදයන් සමඟ මෙහි කියවිම සමානත්වයක් නැති බවයි. එම සූත්‍රයෙහි එන

"අපමාණෝ බුද්ධෝ අපමාණෝ ධම්මෝ අපමාණෝ සඞ්ඝෝ පමාණවන්තානි සිරිංසපානි අහි විච්ඡිකා සතපදි උණ්ණනාභි සරබූ මූසිකා කතා මේ රක්ඛා කතා මේ පරිත්තා පටික්කමන්තු භූතානි. සෝහං නමෝ භගවතෝ නමෝ සත්තන්නං සම්මා සම්බුද්ධානං"

යන මෙබඳු අදහස් පවසන සූත්‍ර පිරිසුදු බුඩ ධර්මයේ නැත. මේ අහිරාජ සූත්‍රය ද, මොරපරිත්ත නමින් හැඳින වන සූත්‍රය ද, මහායානිකයන්ගේ "**මහා මයුරී විද්‍යාරාජිනී**" ධාරණී මන්ත්‍රයට ඇතුළත් වේ. අහිරාජ සූත්‍රයෙහි සඳහන් දෙව කළ භික්ෂුව කාලක්‍රියා කළ බැවි කියවත් විද්‍යාරාජිනියෙහි දක්නේ කල්‍යාණත්ව ඔම වැටි සිටි බවයි මේ භික්ෂුවගේ නම් සවාතීය. අලුත පැවිදි වූ මෙ සෙම් සඞ්ඝයා උදෙසා ගිහිකල් ගෙයි දර පිණිස වනයට ගියේය. එහිදී විසලි දර ඩිඩිමින් සිටියදී ම ඇති යකු විසින් දතුණු පය මත ඇගිල්ල දමා කරණ ලදී. එයින් සවාති භික්ෂුව කල්‍යාණත්ව සෙම් දම්මින් ඇස් පෙරළී ඔම වැටී සිටියේය. අනද තෙරුන් මේ බව දැන බුදුනට දන්වූයෙන් බුදුහු සවාති

1. චූ: පෑ: 216, 217, 218, 219, 223, 224, 227, 228, 235, 236, 247, 248, 250, 251, 253, 266, 267, 268. 2. චූ: පෑ: 226 3. චූ: පෑ: 215 4. චූ: පෑ: 226, 248 5. චූ: පෑ: 249
6. චූ: පෑ: 251 7. චූ: පෑ: 252 8. චූ: පෑ: 252 9. චූ: පෑ: 409, 410, 414.

* චූ: පෑ: B 640 10. **මනුසංහිතා** 1-90.

භික්ෂුවගේ ආරක්ෂාව උදෙසා විදූරාජිනී ධාරණී මන්ත්‍රය උගැන්වූහ. චුල්ලවග්ග පාළියේ මේ විස්තරය නැත. එහෙත් සර්පයා දෂ්ට කළ භික්ෂුව කලුරිය කළ බැව් කියයි. අභිරාජ සූත්‍රයේ සහ විදූරාජිනී යෙහි නිදන කථාව දක්නේ මෙසේය.

අභිරාජ සූත්‍රය	විදූරාජිනී
තෙන බොපන සමයෙන අඤ්ඤතරෝ භික්ඛු අහිනා දට්ඨෝ කාලකතෝ හොති. භගවතෝ එතමත්ථං ආරොචෙසුං. නහඤ්ඤත්‍ර තෙ භික්ඛවෙ භික්ඛු.....	එවං මයා ශ්‍රැතම්. එකසමින් සමයෙ භගවා වජ්‍රාවත්‍යා විහරති ජේතවනෙ අනාථපිණ්ඩදස්‍යාරාමෙ. තසමිංශ් සමයෙ ශ්‍රාවස්‍යා ජෙතවනෙ අනාථපිණ්ඩදස්‍යාරාමෙ සර්වාකීර් භික්ෂු ප්‍රතිවසති සම නවෝ දහරෝ තරුණඃ අචිරප්‍රව්‍රජිතඃ අවිරාඝසඃ ඉමම් ධර්ම් විනයම්. සර්පදස්‍යාෂ්ටෝ කෙඛිනතකදරුනී පාතයම්නෝ'නාත්‍ය කරාත් පූතිදරු සුෂිරානනිෂ්ක්‍රම්‍ය මඛතා කාඛෙණ සඛෙණ දක්ෂිණ පාදඞ්ගුෂ්ඨෙ දෂ්ටඃ ස කලාඤෙන ඛායඃ භූමෝ පතිතඃ ඛෙඛණං ශ්‍රාවෙති අක්ෂිණී ච පරිවර්තයමානඃ අද්‍රාක්ෂීදථ භගවාන් අඟොපෑඃ සර්වාකීර් භික්ෂු මධික බාධානං ඛෙඛණං වාහඤ මන්තඤ..... .....

මේ නිදන කථා දෙකෙහි විශාල වෙනස නම් අභිරාජ සූත්‍රයෙහි කාලක්‍රියා කළ බව සහ විදූරාජිනියෙහි සුවපත්වූ බව සඳහන් වීමයි. මහාමයූරී විදූරාජිනිය අභිරාජ සූත්‍රයට මුල් වී නම් මෙතරම් සරතෙරයක් කෙසේ වීද? ඉදිරිපත් කළ හැකි සාධකවලින් පෙණෙන්නේ අභිරාජ සූත්‍රය සහ මොරපරිත්තයන් විදූරාජිනියෙන් පිඬුකරගත් බවයි. මහායානිකයන් ඔවුන්ගේ අදහස් අනුව බුද්ධදේශනාව වෙනස් කර ගත්තා මෙන් හීනයානිකයන් ද මහායානිකයන්ගේ සූත්‍ර දේශනාදිය පිටපත් කිරීමේදී තම ධර්ම—විනය අනුව පිටපත් කරගත් නිසා මෙබඳු විශෙෂතා ඇතිවිණ්ණට අවකාශ ඇත්තේය. එබඳු කැන් බෞද්ධ සංස්කෘත ග්‍රන්ථවල මෙන් ම පාළි පොත්වල ද එමට දක්නේය. අභිරාජ සූත්‍රයෙහි "සොහං භගවතෝ නමෝ සත්තන්නං සම්මා සම්බුද්ධානං" යන පාඨයෙහි සොහං යනු "ඒ මම්" යි පරිවර්තකයෝ අරුත් කියති. එම අර්ථය මෙහි ගන්නට හැකි නමුදු මේ පාඨයෙහි පාළි භාෂා රීතිය අමුතුම මගක් ගෙණ ඇති බැව් ද අමතක නොකළ යුතුය. මන්ත්‍ර පඨනයෙහිදී පළමුව "සඛාහා" යන බීජාක්ෂරය ද, ඉන්පසුව මන්ත්‍රය ද කියති. එයින් ඵල සිද්ධිය වන්නේය. කියන ලදී බුහම් වෛවර්ති සර්වාඛොපාඛ්‍යානයෙහි;

"සඛාහාං මන්ත්‍රාඞ්ග භූතාඤ්ච—මන්ත්‍ර සිද්ධි සඛ රූපිනීම්
සිද්ධාඤ්චෙව සිද්ධිදං නාඤ්ණාං—කම්මාඤ්ණං ඵලදං භවේ"

අභිරාජ සූත්‍රයෙහි "සොහං" යනු "සඛාහා" යන බීජාක්ෂරය සාළිඤව පෙරළා ගත් සැටි ය. විදූරාජිනියෙහි සඛාහා ශබ්දය එසේම දක්නේය. "සත්තන්නං සම්මා සම්බුද්ධානං" යනු යෙන් ගැණෙනුයේ විපස්සී ආදී සත්බුදුවරයන් වහන්සේයි. මේ බුදුවරයන් සත් නම නිමිත්ත කාරයෙන් යුත් බැවින් "සප්ත මානුෂී බුද්ධ" යි ලලිත විස්තරයේ හඳුන්වති. ආටානාටිය සූත්‍රයෙහි ද මේ සත්බුදුවරයන් වදිති. ස්ථවිරවාදයෙහි දීපඞ්කර බුදුන් පටන් සූවිසි බුදුවරයන් ගන්නා අතර විපස්සී ආදී සත්බුදුවරයන් ගන්නෝ මහායානිකයෝය. එමතු නොව මෙහි දක්නා "අප්ප මාණෙන බුද්ධ" යනු ද මහායානිකයන්ගේ ම අදහසකි. ආටානාටිය සූත්‍රය මෙන් ම අභිරාජ—මොරපරිත්ත සූත්‍රයන් ද ආරක්ෂක පිරිත් මෙන් භාවිත කරති. අභිරාජ—මොරපරිත්ත සූත්‍රයන් විදූරාජිනිය සමඟ සැසඳෙන කිප තැනක් පහත සඳහන් වේ.

අහිරාජ සූත්‍රය	විදූරාජනී
විරූපක්ඛේහි මේ මෙත්තං මෙත්තං එරාපථේහි මේ ඡබ්‍යා පුත්තේහි මේ මෙත්තං මෙත්තං කණ්හා ගෝතමකේහි ච	විරූපක්ෂේභ්‍ය මේ මෛත්‍රී කෘෂ්ණ ගෞතම කේභ්‍ය ච ඵලාල පත්‍රභ මේ මෛත්‍රී මෛත්‍රී චීර්ඛබසුතේන ච
+ + මා මං අපාදකෝ හිංසි මා මිං හිංසි ද්විපාදකෝ මා මං චතුප්පදෝ හිංසි මා මං හිංසි බහුප්පදෝ	මා මේ අපාදකා හිංසීත් මා මේ හිංස්‍යුර් ද්විපාදකා මා මේ චතුෂ්පදා හිංසීත් මා මේ හිංස්‍යුර්බහුපාදකා
+ + මොරපරිත්ත	
යේ බ්‍රාහ්මණා වේදගූ සබ්බ ධම්මේ තේ මේ නමෝ තේව ඉං පාළයන්තු නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා නමෝ විමුත්තානං නමෝ විමුත්තියා	යේ බ්‍රාහ්මණා විභත පාප ධම්මා – —සෝතඡං නම්සෝච මං පාලයන්තු නමෝඝතු බුද්ධාය නමෝඝතු බෝධයේ නමෝ විමුක්තානාය නමෝ විමුක්තායේ

ධම්මපදට්ඨ කථායෙහි **එරකපත්ත** නම් නාගරාජයකු පිළිබඳ පුවතක් විස්තර වේ. අහිරාජ සූත්‍රයෙහි **"එරාපථ"** නාගරාජ කුලය සමඟ ද එහි සම්බන්ධයක් පෙනේ. සම්භර බෞද්ධ සංස්කෘත ග්‍රන්ථවල මෙම එරාපථ ශබ්දය **"ඵේරාවණ"** කියා ද යෙදේ. ධම්මික සූත්‍රයෙහි ද එරාවණ නම් නාග රාජයකු පිළිබඳව පුවතක් සඳහන් වේ. මහාසාහීකයන්ට අපූමාණ බුදුවරු ඇත්තාහ. අහිරාජ සූත්‍රයෙහි ද **අපමාණා** බුද්ධා යනු දක්නේය. මෙසේ චුල්ලවග්ග පාළියට අහිරාජ සූත්‍රය ඇතුළු වූයේ පසු කාලයක විය යුතුය.

මහාවග්ග පාළියේ දක්නා යම් යම් ප්‍රවෘත්ති නිසා බුදුන් දවස භාරතීය සමාජතත්ත්වය පරීක්ෂා කරනුවනට ලැබෙන ප්‍රයෝජනය සීමා රහිතය. පැරණි භාරතීය මනුෂ්‍යයාගේ එදිනෙදා ජීවිතය පවත්වා ගත යුතු පිළිවෙළ උගන්වන කින්දුන්ගේ ගාහ්‍ය සූත්‍රවල දක්නා චාරිත්‍ර වාරිත්‍ර රාශියක් මහාවග්ග පාළියේ සඳහන් වේ. එසින් වසලූපනාසිඝකාණීඝයෙහි සඳහන් විදූම පිළිබඳ පැරණියන්ගේ මතය අපට සිතාගත හැකිය. **"හරිතානි තීණානි සම්මද්දමානා එකිඳ්‍රියං ජීවං විහෙඨෙන්තා"** යනාදීන් උද්ඝොෂණය කළෝ ජෛන භකතිකයෝය. ධනවත් කුලයක උපන් හරුණයකුගේ සුඛුමාර ජීවිතය චම්මකඛ්ඛකයෙහි සොණ කොළිවීස සිටු පුත්‍රයාගේ කථා වෙන් පැහැදිලිය. හෙසජ්ජකඛ්ඛකයෙහි එන සීහ සෙනාපතියාගේ සහ බුදුරදුන්ගේ සාකච්ඡා වෙන් එවන පැවැති දෘෂ්ටිනික මනානන්තර කිපයක් ම ප්‍රකට වේ. සීහ සෙනාපතියා **නිගණ්ඨනාථ** පුත්‍ර යන්ගේ ශ්‍රාවකයෙකි. පාරාජික පාළියෙහි වෙරඤ්ජා බ්‍රාහ්මණයා බුදුන් හා වාද කළේ ද, සීහ සෙනාපතියා ඉදිරිපත් කළ කරුණු උඩම ය. බුදුන් බ්‍රාහ්මණයනට ගරු බුහුමන් නො කරන්නාහු පම්ණක් නොව නාස්තික වාදියකු බව ඔප්පු කිරීමට ද සීහ සෙනාපතියා මෙහෙ ම වෙරඤ්ජා බ්‍රාහ්මණයා ද උත්සාහ ගත්හ. චිවරකඛ්ඛකයෙහි ජීවකයන්ගේ කථා පුවත ඉතා අගය ඔප්පෙන් කරුණු කිපයක් ම නිසාය. එද පැවැති අධ්‍යාපන තත්ත්වය, වෛද්‍ය ශාස්ත්‍රය, යුද්ධ ශිල්පය, කාශවෛද්‍ය ඕදූව ආදී සාමාජික වටිනාකම්ට සැලකිය යුතු නිදසුන්වලින් චිවරකඛ්ඛකය පිරී ඇත්තේය. එහි දක්නා අයුරු ජීවකයනට **"කෞමාරභෘත්‍ය"** නාමය ලැබුණේ අහය රාජකුමාරයන් විසින් පොෂණය කළ නිසාය. එහෙත් බෞද්ධ සංස්කෘත ග්‍රන්ථවල කියන්නේ කෞමාරභෘත්‍ය චිකිත්සායෙහි දක්ෂයකු වූ බැවින් එ නම් ලද බවයි.

විනය පිටකයට සහ සූත්‍ර පිටකයට අයත් ග්‍රන්ථවල දක්නා ''නිසණ්ඩ නාථ පුත්ත'' නාම ය පෙන ග්‍රන්ථවල දක්නේ ''ණිසණ්ඨ ඤාත පුත්ත'' යනුවෙනි. මහි ඤාත යනු ගොත්‍රයේ නාම යයි. එම ගොත්‍රයේ උපන් බැවින් ඤාතපුත්ත නම් විය. බුදුන් උදෙසා ද ගොත්‍ර නාමය යෙදූ තැන් එමට ඇත. ලක්දිව ලියූ සමහර පැරණි පුස්කොළ පොත්වල ''නාත පුත්ත'' යනුවෙනුදු දක්නේය. මහාවග්ග පාළි හෙසජ්ජක්ඛන්ධකයේ සීහ සෙනාපති කථාවෙහි ''අනුච්චකාරෝ තුම්හාදිසානං ඤාත මනුස්සානං'' යනු යෙදී ඇත. මෙහි ''ඤාත මනුස්සානං'' යන ප්‍රසිඩ මනුෂ්‍යයන්ට යන අර්ථය දෙයි. මේ ''ඤාත'' ශබ්දයේ ඊට වඩා පළල් තේරුමක් ඇතැයි සිහතොත් එය, ''ඤාත'' ගොත්‍රය සමග ද සම්බන්ධ වන්නේය. කෙසේ වතුදු ''ඤාතපුත්ත'' යනුවෙන් පෙන ප්‍රාකෘත ග්‍රන්ථවල දක්නා නාමය පාළියට ''ණාථ පුත්ත'' විය නො හැකිය. ''නාහිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තත පරිපුණ්ණං එකන්තත පරිසුද්ධං සඛලිඛිතං බ්‍රහ්මචරියං'' යනුවෙන් පාරාජික පාළි—මහාවග්ග පාළි ආදී නොයෙක් තැන දක්නා පාඨයෙහි ''සඛලිඛිතං'' යනු අටුවාවල විස්තර කරනුයේ ''ඛොත සඛ සපපමිහාහං'' යි සේදූ සක්ඛෙඩියක් වැනි යනුවෙනි. එහෙත් අටුවාවෙහි කියන විස්තරය එතැනට එතරම් නැළපෙන බවක් නො පෙනේ. එ පමණකුදු නොව බ්‍රහ්මචරියය පිළිබඳ විස්තර වන සමහර තැන මේ උපමාව නොයෙදී ''පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති'' යනු පමණක් ද යෙදී ඇත්තේය. මේ වචනය පිළිබඳව ඉතිහාසය සොයන්නකුට කරුණු කිපයක් හමුවේ. මනු ආදී සෘෂිවරුන් විසින් ප්‍රණීත ධර්ම—ශාස්ත්‍ර විශේෂය සමෘති-ධර්ම සංහිතා නම් වන්නිය. ඒ ධර්ම ශාස්ත්‍ර ප්‍රයෝජක මුනිවරයන් අතර ශඛ්‍ය—ලිඛිතය නමින් මුනීවරු දෙදෙනෙක් වූහ. යාඥවල්ක්‍යයෙහි ධර්ම ශාස්ත්‍ර ප්‍රයෝජක මුනිවරුන් මෙසේ දක්වති.

මන්ත්‍රි විෂ්ණු හාරීත—යාඥවල්ක්‍යා ශනොඞ්ගිරාඃ
යමාපස්තම්බ සම්බර්තාඃ—කාත්‍යායන වෘහස්පති

පරාශර ව්‍යාස ශඛ්‍ය—ලිඛිතා දක්ෂ ගෞතමෝ
ශාතාතපෝ වශිෂ්ඨශ්ච—ධර්ම ශාස්ත්‍ර ප්‍රවර්තකාඃ—යාඥවල්ක්‍ය 1-4-5

ධර්ම—ශාස්ත්‍ර ප්‍රයෝජක මනු ආදී සෘෂි ගණයා අතර ගැණෙන ශඛ—ලිඛිත සෘෂිවරයන් මෙන් ම ''බ්‍රහ්මචරිය'' ශබ්දය ද බුදුනට වඩා පැරණිය. එසේ වන විට ''සඛ්‍ය ලිඛිතං'' යි කියවෙන්නේ එම මුනිවරයන් දෙදෙනා විසින් ප්‍රණීත බ්‍රහ්මචරිය ගෞතම බුදුරජාණන් වහන්සේත් පිළිගෙන එසේ ම දෙශනා කළ බව ද? මේ පාඨයට අනතුරුව දක්වන ''කෙසඤ්චස්සු ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡා දෙත්වා අගාරසමා අනගාරියං පබ්බාජෙසුං'' යනුවෙන් දක්වෙන්නේ එම සංඛ ලිඛිත බ්‍රහ්මචරිය චරණය වේ. රඝුනන්දන භට්ටාචාර්යයන් දක්වන අෂ්ටවිංශති ධර්මශාස්ත්‍ර ලක්ෂණ යෙහිදී ප්‍රව්‍රජිත ජීවිතයේ මේ ලක්ෂණ කියවති. පාචිත්තිය පාළියේ ''සුදන්නං ඛොම්ම සික්ඛාපද නිදාන'' යෙන් ප්‍රකට වතුයේ එබඳ පැවැති එක් අධ්‍යාපන ක්‍රමයකි. මෙහි ඉතිහාසය සෙවිය යුතු වන්නේ එය අනුපසම්පන්නයන් කෙරෙහි බල පවත්වන බැවිනි. ''ගිරග්ගසමජ්ජ'' යනුවෙන් පාචිත්තිය පාළි ආදී පොත්හි එන පාඨය බෞද්ධ සංස්කෘත ග්‍රන්ථවල ''ගිරිවිහාර සමාජම්'' යි දක්නා ලැබේ. එහෙත් එයින් නියම අර්ථය ප්‍රකට නොවේ. මෙහි ගිරග්ගසමජ්ජ (ගිරි + අග්ග) නම් කඳු මුදුනකි. සමජ්ජ නම් කෘත්‍යයකි. ධම්පියා අටුවා ගැටපදයෙහි සහ සද්ධම් රත්නාවලියෙහි එය විස්තර කරන්නේය.

''රජ්ජනහනුවර හවුරුදු පතා ගල් සෙවණැල්ල හුනු තැන බොහෝ දෙන රැස්ව කන බොන දැ ඇතිව කරන උත්සවයක් හෙයින් හෝ නොහොත් සමීප මුදුනට රැස්ව කළමනා උත්සවයක් හෙයින් හෝ ගිරග්ගසමජ්ජ නම් කෙළිනුවෙක් ඇත.''

මේ සද්ධම් රත්නාවලියෙහි එන විස්තරයයි. මහාවග්ග පාළියේ අජ්ජාල කථාවෙහි ''වේදයන්තු'' යි ද, නැත් නොයෙක් තැන 'මේදතු'' යි ද බුදුන් රහතන් උදෙසා යොදූ ඇත. මෙහි ''වේද'' ශබ්දයෙන් චතුර්විධ මාර්ග ඥානය ද, ''මේදනතු'' ශබ්දයෙන් එම මාර්ග ඥානයාගේ

කෙළවර ද අටුවාවට අනුව විසඳා වේ. මේ වෙද—වෙදඤ්ඤ ශබ්ද බුදුනට වඩා පැරණිය. ඒ වෙද ශබ්දයෙන් සෘක් ආදී වෙදත්‍රය ද වෙදඤ්ඤ ශබ්දයෙන් උපනිෂද් ද ගැනිණ. වෙද යුගයාගේ අවසානයෙහි උපනිෂද් ධර්මයන් පහළවූ බැවින් "වෙදඤ්ඤ" නම් උපනිෂද් ධර්මයයි. මේ වෙද—වෙදඤ්ඤ (උපනිෂද්) යන්හේ කෙළවරට ගිය බැවින් බුදුහු වෙදගූ-වෙදඤ්ඤගූ නම්වලින් හැඳින් වූහ. දීඝනිකායයේ තෙවිජ්ජ සූත්‍රය, සූත්‍රනිපාතයේ අට්ඨකවග්ගය—පාරායණ වග්ග කියවනවිට උන්වහන්සේගේ උපනිෂද් ධර්මඥතාව පැහැදිලි වේ. මහාවග්ග පාළියේ මහාඛන්ධකයෙහි ද, චුල්ලවග්ග පාළියේ වත්ථුඛන්ධකය ඇතුළත් වේ. චුල්ලවග්ග පාළියේ පඤ්චසතික ඛන්ධකය සහ සත්තසතිකඛන්ධකය ශාසන ඉතිහාසය උදෙසා ඉතා වටනා පරිවේදද දෙකකි. මේ පරිවේදද දෙකින් කියැවෙන්නේ ප්‍රථම ධර්ම සඞ්ගායනාව සහ මිතීය ධර්ම සඞ්ගායනාව පිළිබඳ ඉතිහාසයයි. මේ සඞ්ගායනාවන්ගේ විස්තරය පළමුව ඇතුළත්වූ පෙළ පොත චුල්ලවග්ග පාළිය වේ. එහි එන විස්තරය අන් කිසි තැනකින් නොලද හැකිය. පඤ්චසතිකඛන්ධකයෙහි දක්ඛා පරිදී ක්ෂුද්‍රානුක්ෂුද්‍රක ශික්ෂාපද සමූහනය පිළිබඳ ප්‍රශ්නයේදී බොහෝ දෙනා එකන්සේ නොයෙකුත් අදහස් පහළ කළහ. අවසානයෙහි ඔහකසුප් ඕමියන්ගේ වචනයෙන් සියලු දෙනා වහන්සේ නිශ්ශබ්ද වූහ. බුදුන් විසින් නො පැණවූ ශික්ෂාපදයක් නො පැණවීමට ද, පැණවූ ශික්ෂාපදයන් නො ඉක්මවීමට සහ සමාදන්ව පැවැත්වීමට ද, මේ සංගීතිය්දී ම නියම කර ගත්හ. සඞ්ගායනාව අවසානයෙහි අනඳ හිමියනට කරුණු පසකින් චෝදනා නැඟූහ.

1 ක්ෂුද්‍රානුක්ෂුද්‍රක ශික්ෂාපද කවරේදැයි බුදුන්හෙන් නො ඇසීම
2 බුදුන්ගේ වැසි සළුව මැඬහෙන මැසීම
3 ස්ත්‍රීන්ගේ කඳුළු පිරිනිවන් පෑ බුදුසිරුරෙහි වැකෙන පරිදි ස්ත්‍රීන් ලවා පළමුව උන්වහන්සේ වැන්දවීම
4 කල්පයක් ජීවත් වන මෙන් බුදුන් නො යැදීම
5 ස්ත්‍රීන්ට බුද්ධ ශාසනයෙහි පැවිද්ද ලබා දීමට උත්සාහවත් වීම

මේ චෝදනා නමන් මිසින් කළ වැරදි වශයෙන් අනඳ හිමියන්, නො පිළිගත ද, සංගීති කාරක මහරහතන් වහන්සේගේ වචනය නිසා දුකුළා වශයෙන් පිළිගත්හ. "නාහනනං දුක්කටං පඤ්ඤාමි අසිවා යසම්හනනාතා සද්ධාය දෙසෙමි තං දුක්කටනති"යි එය දක්නේය. අනඳ තෙරුන් පිළිබඳ මේ පුවතට අනතුරුව දක්නේ පුරාණ නම් සථවිරයන් පිළිබඳ විස්තරයයි. පුරාණ නම් භික්ෂුව සඞ්ගායනාව කළ කාලය තුළ පන්සියයක් පමණ භික්ෂු පිරිසක් රුහෙණ දක්ෂිණ ගිරියෙහි සැරිසරා සඞ්ගායනාව අවසන් වූ පසු රජගහනුවරට වැඩියහ. එහිදී සංගීති කාරක සථවිරයන් වහන්සේ පුරාණ තෙරුන් වෙතට පැමිණ තමන් විසින් කළ ධර්ම—සඞ්ගායනාව එසේම පිළිගන්නා මෙන් දැන්වූහ. "සුසංගීතාවුසො ථෙරෙහි ධම්මෝ ච විනයෝ ච. අපි ච යථෙව මයා හග වතෝ සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහීතං තථෙවාහං ධාරෙස්සාමී"ති සංගීතිය මැනැවින් කරන්නට ඇති නමුදු මවිසින් බුදුහු හමුවෙහි අසා පිළිගත් ධර්මයම එසේ ම ධරන බව පුරාණ තෙරහු කීහ. අනඳ තෙරුන් සහ පුරාණ තෙරුන් පිළිබඳ මේ පුවත් මහා සංඝිකාදී අන්‍ය නිකායිකයන්ගේ පොත්වල ද විස්තර වේ. සත්තසතිකඛන්ධකයේ මිතීය සඞ්ගායනාව පිළිබඳ ඉතිහාසය අන් කිසිදු ග්‍රන්ථයක නො දක්නේය. එම සඞ්ගායනාවට හේතු වූ විශාලා වජ්ජීපුත්‍රක භික්ෂූන් ඉදිරිපත් කළ දශ වස්තුව පිළිබඳ කරුණුවලින් සම්භරක් අන්‍ය නිකායිකයන්ගේ පොත්වල ද ඇතුළත් වේ. සම්භර කරුණු ඔවුන් විස්තර කරන්නේ වෙන ක්‍රමයකටය. දශ වස්තුවට ඇතුළත් අටවන ජලෝගී කප්පය චුල්ලවග්ග පාළියේ මෙන් ම අනික්දු ථවිරවාදීන්ගේ පොත්වල "නො කැසුණු නො බුහුකළ රා බීම කැපය" යනුවෙන් විස්තර කරති. එහෙත් එයින් මෙයව ඉඩා පුළුල් අර්ථයක් අදහන් කරන්නේ කියයි.

සංස්කෘත ග්‍රන්ථවල සුරා කල්කෘව "ජගල" යනු නම්. එය පාළියට කිසිසේත් "ජලෝගී" යි නොවේ. පාළි පොත්වල "ජලෝගී යනුවෙන් හඳුන්වන්නේ මද්‍ය භාවයට නො පැමිණි තරුණ

සුරාව ය. එය පරෙවියන්ගේ පා වැනි පැහැ ඇත්තේ යයිද කියති. සංස්කෘත කොෂ ග්‍රන්ථවල **ජලූකා-ජලාලූකා-ජලිකා-ජලුකා-ජලූකා-ජලොකා-ජලොකිකා** යන නම්වලින් පූර්වාචාර්යවරු හඳුන්වති. පාලි කොෂ ග්‍රන්ථවල **ජලූකා** යනු දක්නේය. ශබ්ද ධර්මය අනුව **ජලොග** ශබ්දය පාලියට ලැබෙනුයේ මෙහි දැක්වූ **ජලොකා** ශබ්දය ඔස්සේය. එසේ නම් **ජලොග** (=ජලොගි) ශබ්දයෙන් කියවෙනුයේ පූර්වාචාර්යවරු **ජලූකා** යනුවෙන් පූර්වාචාර්ය මෙන් මේ ග්‍රන්ථවලින් ඒ බව කැපයයි ප්‍රකාශ කළ බැව් ධර්ම ගුප්තිකයෝ පවසති.

විනය පිටකයට අයත් පෙළ පොත්වල තත්කාලීන භාරතීය සමාජයේ හැම අංශයක් පිළිබඳ සත්‍යමය වාර්තා ද, එබඳු වාර්තාවකට තුඩු දෙන ශබ්ද ප්‍රයෝග ද, පිටුවක් පාසා සෙයදී ඇත. ඒ සියල්ල මෙහි විස්තර කිරීම නො කට හැකිය. මෙසින් ශතවර්ෂ විසිපහකට පෙර උත්තර භාරතයේ පැවැති සභ්‍ය සමාජය පිළිබඳව පරිශීලනයට ඉවහල් වන එම ශබ්දයන් අකාරාදී ක්‍රමයෙන් විනය කොෂයෙහි ඇතුළත්වනු ඇත. ඒ සියල්ල ඒ ඒ තන්හිම විස්තර වන්නේය.

* * *

ඉන්දු—ආර්ය භාෂා කණ්ඩයේ ප්‍රාකෘත භාෂාවන්ගෙන් අතර ඉතාම පැරණි ප්‍රාකෘතය පාලි භාෂාව වේ. ථේර මහාචාර්ය තුමා සවකීය ධර්මය දේශනා කළ අර්ධමාගධිය පාලි භාෂාවට වඩා අර්ධ ශතවර්ෂයක් පමණ පැරණි නමුදු එතුමාගේ ධර්මය ග්‍රන්ථාරූඪ වූයේ බුද්ධ ධර්මය ග්‍රන්ථාරූඪ වූවාට පසුව බැවින් එහි දක්නා භාෂා ලක්ෂණ පාලි භාෂාවට වඩා මැනය. වෛදික භාෂාවට (සහ ලෞකික සංස්කෘතයට) ප්‍රකෘති ස්ථානය හිමි වේ නම් එහි ආදිම ප්‍රාකෘතය පාලිය වේ. එයට වඩා පැරණි ප්‍රාකෘතයක් නැත. අනිකුදු සියලුම මධ්‍යතන ප්‍රාකෘත භාෂාවන්ගේ ලක්ෂණ සහ ඒවාහි නො දක්නා ප්‍රාථමික භාෂා ලක්ෂණ පාලියේ විද්‍යමානය. පාලියේ දක්නා සමහර ලක්ෂණ වෛදිකය සමඟ පමණක් සාධාරණ වේ. එ පමණකින් පාලිය වෛදික යුගය ඉක්ම ඉන් ඔබ්බට යන්නේ හෝ තත්කාලීනය යන නිගමනයකට බැස ගන්නට සුදුසු නැත. වෙද ශික්ෂාවන්ගේ හෝ උපනිෂදාදී දර්ශනික මතානතරයන්ගේ දක්නා පුරාණතම භාෂා ලක්ෂණ ඉතාම පැරණි පෙළ පොත්වල පවා මුළුමණින් නො දක්නේය. පාණිනි ආදීන් විසින් සකස් කළ සංස්කෘතයේ නැති බොහෝ යෙදුම් වෛදික භාෂාවේ සහ පාලි භාෂාවේ විද්‍යමානය. ශ්‍රී උදයරාම ශාස්ත්‍රී තුමා මෙසේ කියයි.

> "අපරෙතු වෙද මූලක මිදං තත්තත්ථනාදි ප්‍රත්‍යයානාං අමෙහ අහෙම ආදිපදනාම්
> ලිඞ්ග වචන විභක්තාහ්‍යාදිනාං ච වෛදිකෛඃ ප්‍රයෝගෛඃ සාම්‍ය දර්ශනාත්"

විනය පිටකයෙහි අයත් ග්‍රන්ථවල ද එබඳු තැන් එමට ඇත. **මොඝපුරිස** (පාරා: පා: 12), **මොඝඤ්ඤතක** (චූ: පා: 227) ආදී තන්හි දක්නා "මොඝ" ශබ්දය වෛදිකයේ ද එසේම ය. එහෙත් සංස්කෘතයේ ඒ වෙනුවට ඇත්තේ "මෝහ" ශබ්දය පමණි. පාලියෙහි එය ද ලැබේ. වේදයේ මෙන් ම පාලියේ "ඉධ—ඉහ" ශබ්ද දෙක ම ලැබෙතුදු සංස්කෘතයෙහි ඇත්තේ "ඉහ" රූපය පමණකි. ඝාතු (මහා: පා: 42) ලඝු (මහා: පා: 42) යන තන්හී දක්නා ඛ-ඝ වෙනුවට ඛ-ඝ කාරය ඇත්තේ වෙදයට සහ පාලියට පමණි. සංස්කෘතයෙහි සාධු—ලඝු යනු යෙදේ. **ලඝොණ** (මහා: පා: 11) **ආලම්බර** (මහා: පා: 13) යනාදීන් දක්නා මූර්ධන්‍ය ළ කාරය සංස්කෘතයෙහි නැත. වෛදිකයෙහි "දෙවෙභිඃ"—"කණ්ණිභිඃ"—"ගඞ්ගාභිඃ"—"යඤ්ඤියභිඃ" යන භාෂ්‍යය බහුවචන රූපයෝ වෙත්. පාලියෙහි ද "දෙවෙහි"—"දෙවේහි" යනාදීන් එයට සමාන විභක්ති රූපයන් ලැබෙතුදු සංස්කෘතයෙහි එසේ නොවේ. වෛදිකයෙහි පඤ්චමෝක්ත වචනයෙහි "උච්චා—නීචා—පශ්චා" යනු වේ. පාලියෙහි ද "උච්චා—නීචා—පච්ඡා" හි එම විභක්තිය හා විවිධය පවසන්නේය. "චතුර්ථ්‍යර්ථේ බහුලං ඡන්දසි" යන පාණිනිය සූත්‍රයෙන් චතුර්ථී විභක්ත්‍යර්ථයෙහි ෂෂ්ඨිය අනුශාසිතය. පාලියෙහි ද එසේම ය. මෙසේ ලෞකික සංස්කෘතයෙහි නැති ප්‍රයෝග වේදයේ මෙන් ම පාලියේ ද එකසේ දක්නේය. (ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ **පණ්ඩිත උපාධිය** උදෙසා ම එසින් ලියූ (ළඟදී මුද්‍රණය වන) "**සිංහල ප්‍රාකෘතය**" නම් ග්‍රන්ථයේ එය විස්තර

වන්නේය.) ගෞතම බුදුරදුන්ගේ සහ මහර්ෂි පාණිනීන්ගේ ජීවන සමය එකම ශතවර්ෂයේය. එසේ නම් සූත්‍ර පඨනයෙන් පාණිනීන් විසින් සංස්කෘතය සකස් වූයේ ද, පාලි භාෂාව නිර්මාණය වූයේ ද එක ම වකවානුවකය. පාණිනීය ශබ්දානුශාසනයෙහි පාලිය හෝ ප්‍රාකෘත භාෂාවන් පිළි බඳව කිසිවක් සඳහන් නොවේ. සමහරවිට එම නම් පසුකාලයක භාෂා විෂයයෙහි රූඪ වූ නිසා විය හැකිය. එහෙත් 'බහුලං" යන සූත්‍රයෙන් පාණිනී එය ද සම්පූර්ණ කෙල්ලේය. එසේ ම දෙශ භෙදයෙන් වූ රීති භෙදය ද සූත්‍රඝන්ථයෙන් ම දැක්විය. "ඉඤඃ ප්‍රාචාම්" 2-4-60 ශොණාත් ප්‍රාචාම් 4-1-13 උදීචාම්ඝ්ස් 4-1-150 උදීචාං වෘද්ධාදඥොත්‍රාත් 4-1-157 වෘද්ධාද් ප්‍රාචාම් 4-2-120 ප්‍රාචාම් කටාදෙඃ 4-2-139 ප්‍රාචාං ග්‍රාමනගරාණාම් 7-3-14 ප්‍රාචාං නගරාණෙන 7-3-21 ප්‍රාචාමූ ෂාදෙරඩම්බූ චෞව 5-3-80 එකාචව ප්‍රාචාම් 5-3-94 උදීචාමඩොව්‍යතීභාරෙ ඊ 4-4-19 යනාදී සූත්‍රයන්ගෙන් වෛදිකය පවා දෙශ භෙදයෙන් වෙනස් වන බව සහ ශෛදිකී ප්‍රක්‍රියාවෙන් වෙදයට පමිණක් සාධාරණ වූ තැන් ද, පෙන්වීය. මේසේ දෙශ භෙදයෙන් වන රීති භෙදය එක භාෂාවකට පමිණක් සීමා නොවීය. පාලි භාෂාව ගෞතම බුදුරදුන් විසින් එ දවසම සකස් කළ ද, එහිදු මේ දෙශ භෙදයෙන් වූ වෙනස දක්නේය. ගෞතම බුදුරදුන් වෛදික සංස්කෘතය භාවිත නො කළ බවට සැකයක් නැත. එන්වහන්සේ ධර්මදෙශනා කරමින් සැරි සැරූ පළාත්වල මෙන් උන්වහන්සේගේ ශ්‍රාවකයන් අතර ද එක ම භාෂාවක් ව්‍යවහාර වී යැයි කිසිසේත් සිතිය නොහැක. නානා ප්‍රාකෘත විශෙෂයන් එවක පවා පැවැති බව මජ්ඣිම නිකායයේ අරණවිභඞ්ග සූත්‍රයේ සඳහන් මේ පාඨයෙන් පෙනේ.

> "ඉධ භික්ඛවෙ තදෙවෙකච්චෙසු ජනපදෙසු පාතීනි සඤ්ඤානන්ති, විඤ්ඤානන්ති සඤ්ඤානන්ති සරාවන්ති සඤ්ඤානන්ති ඔදෘපනන්ති සඤ්ඤානන්ති පොක්ඛරණන්ති සඤ්ඤානන්ති පිසීලකන්ති සඤ්ඤානන්ති ඉති යථා යථා නං තෙසු තෙසු ජනපදෙසු සඤ්ඤානන්ති."

පාලි භාෂාව ආරම්භ වූයේ සැකෙත මිගධය විශාල ජනපදයකි. එය උතුරින් ගංගා නදිය ද, නැගෙනහිරින් චම්පා නදිය ද, නිරිත දිගින් විඤ්ඣ කඳු වැටිය ද, බටහිරින් සොණ නදිය ද සීමා අතර පිහිටියේය. මෙකල "ඕහාර්" නමින් හඳුන්වනුයේ පැරණි මිගධයයි. මාගධී නමින් නොයෙක් භාෂාවෝ මෙහි උපන්හ. ශාක්‍යතම බුදුරදුන්ගේ ශුද්ධ මාගධිය (පාලිය) ද, ජෛන මහාවීර තුමාගේ අර්ධ මාගධිය ද, ඕගධි නම් නාට්‍ය ප්‍රාකෘතය ද, එසින් කිහිපයකි, ක්‍රි: ව: 12 වන ශතවර්ෂයේ විසූ ආචාර්‍ය උද්ගොතනයෝ මාගධිකයන්ගේ ශරීර ලක්ෂණය සහ භාෂා තත්ත්වය පවසන්නේ මෙසේය.

> * "ණීහරිය පොව්ව දුව්වණණ—මඩහ එ සුරය කෙලි තවජිලෙල
> එඉග ලෙ ජංපුලෙල—අන පෙවජ්ඣ මාගහෙ කුමාරෙ"

ශුද්ධ මාගධී භාෂාවෙන් ගැළෙණන පාලි භාෂාව ද, ඒ ඒ දෙශීයයන්ගේ උච්චාරණ භෙදය නිසා වූ විපර්‍යාසයට එ දවසම මුහුණ පෑවාය.

සං. වෘක්ෂ > පා. වච්ඡ, රූක්ඛ (මාලාවච්ඡං රොපෙන්ති පාරා: පා: 222[1]) සං. ආර්ද්‍ර > පා. අද්ද, අල්ල. සං. ක්ෂුද්‍ර > පා. ඛුද්ද, චුල්ල (චුල්ලවග්ග පාලි—ඛුද්දක නිකාය) සං. සත්‍රි > පා. ඉත්ති; ඊ (පියෝ බහූ පුත්‍රා කා මෙ. සු: නි: 106[2]) සං. දුෂ්කෘත > පා. දුක්කත, දුක්කට. සං. වෘෂභ > පා. වසභ, උසභ; සං. මෘග > පා. මිග, මිගා; සං. සනාත > පා. නහාත, සිනාත; සං. තෘෂ්ණා > පා. තණ්හා, තසිණා; සං. ත්‍රයස්ත්‍රිංශත් > පා. තාවතිංස, තෙත්තිංස; සං. උක්තම් > පා වුත්තං, උත්තං. සං. අර්ධ > පා. අද්ධ, අඩ්ඪ; සං පරිඛ > පා. පරිඛ; සං. කුලූපග > පා. කුලූපක. සං. කුසීද > පා කුසීත; සං. ප්‍රාදුර්භවති > පා. පාතුභවති; සං. පිධීයති > පා. පිධීයති යනාදි විකල්ප ලක්ෂණ දක්නේ එබැවිනි. පාලි භාෂාව ව්‍යවහාර වූ පළාතෙහි හෝ එහි ජනතාවට හෝ මූර්ධන්‍යාක්ෂර උච්චාරණය කිරීම දුෂ්කර වූ බව පෙනේ. මූර්ධන්‍යාක්ෂරයක පිහිටි මූර්ධන්‍යත්වය දන්ත්‍යයක් කිරීමෙන් හෝ නො එසේ

---

* (ඡාඨා) (නීඃ සෘතොදර දුර්වර්ණ—වාමනාන් සුරත කෙලි තලලිපඝාන්
එඉග ලෙ ජල්පාකානාථ—ප්‍රෙක්ෂතෙ මාගධාන් කුමාරාන්.

නම් මූර්ධන්‍යත්වය දුර්වල කිරීමෙන් හෝ එබඳු බොහෝ ශබ්ද උච්චාරණය කළහ. සං. අන්තරීක්ෂ > පා. අන්තලික්ඛ (මහා: පා: 213) සං. භගන්දරා > පා. භගන්දලා (මහා:පා: 311) සං. රෙඛා > පා. ලෙඛා (ලෙඛං සික්ඛාපය පාරා: පා: 12) සං. රූක්ෂ චීවර > පා. ලූඛචීවර (මහා: පා: 118) සං. හරිද්‍රා > පා. හළිද්දි (මහා: පා: 235) සං. විරූඪ > පා. විරූළ්හ (මහා: පා: 42) සං. ෂඩායතන > පා. සළායතන (මහා: පා: 4) සං. ආඪක > පා. ආළ්හක (මහා: පා: 275) සං. අමූඪ > පා. අමූළ්හ (චූ: පා: 207) ආදී නිදසුන්වලින් එය පැහැදිලි වේ. මෙහි සං. විරූඪ, ආඪක ආදී ශබ්දයන් විරූළ්හ-ආළ්හක යි පාලි ඝට එන විට ඪ කාරයේ මූර්ධන්‍යත්වය හුගක් දුර පිරිහී ගියේය. සං. භගන්දරා, ආදී ශබ්ද භගන්දලා යි ර වෙනුවට ල උච්චාරණය කරනුයේ දෙශීය බල පැවැත්ම නිසාය. පාලි භාෂාව කථා කළ ජනතාවට බ්‍රාහ්මණ, නිග්‍රෝධ, සබ්බත්ථ, අත්ථ ආදී කිහිප තැනෙක හැර සෙසු කිසි තැනක සංයුක්ත රේඵය උච්චාරණය වී නැත. මේ තත්ත්වය නැගෙනහිරි පළාත්වල ආර්ය වර්ගීයා කෙරෙහි බල පැවැත් වූ බැව් අපදාන්වාම් චක්‍රවර්ති පඬිතුමා කියයි.

"The Aryans of the eastern countries could not pronounce the Sanskrit words correctly. They always spoke a corrupt form of Sanskrit, and the illustration given is that they were not able to pronounce "R" and that they always substituted "L" for "R". This gives a clue to the language that was prevalent in the eastern countries. It must have been some form of Prakrit out of which have evolved Pali and later Prakrit, the former being the language in which the sacred literature of the Buddhists was composed and the latter being the sacred language of the Jainas."

අශෝක යුගය වන විට මේ මූර්ධන්‍යයන් දැනත්‍ය වීම වඩාත් දියුණු වූ බැව් එතුමාගේ ශිලා ලිපිවලින් කියැසි. (සං. රාජා) ලාජා (සං. විහාර) විහාල (සං. පඨාය) ඵලයාය (පා. අරිඨවංස) අලියවස (පා. රාහුලොවාද) ලාඋලොවාද (පා. නගර) නගල (පා. පාර ලෞකික) පාලලෝකික ආදී ශෛලීම් එහි නොමඳව ඇත්තේය. අශෝක යුගයෙන් පසු අනිකුදු නාට්‍ය ප්‍රාකෘතවල ද මේ තත්ත්වය මෙසේම ය.

ඉන්දු ආර්යයන් සිඳුබඹබඹ නවාතැන් ගෙන ක්‍රමයෙන් ව්‍යාප්ත වීමේදී අනාර්ය යි සැලකූ සවදෙසින් සමඟ ද මිශ්‍ර වන්නට විය. මෙහි ප්‍රතිඵලය වූයේ ඒ අනාර්ය වර්ගයාගේ භාෂාව ද ආර්ය භාෂාව හෙවත් වෛදිකය සමඟ මිශ්‍ර වීමය. එවක අනාර්ය නමින් හදුන්වනුයේ ආර්යාවර්තයෙන් අවට විසූ ආද්‍ය ද්‍රවිඩයන් බැවින් ඒ ආදි ද්‍රවිඩයන්ගේ භාෂාවේ වචන වෛදික සාහිත්‍යයට ද ඇතුළු විය. අණු-අරණ්, කපි, කලා, ඛාල, කිතව. කූට, ගණ, නානා, නීල, පුෂ්ප, පුෂ්කර, පූජන, ඵල, බීජ, රාත්‍රි, අටවි, ආඛ්‍යාඛ්‍යර, ඛඩ්ග, තණ්ඩුල, මකීට යනු එන්න් කිහිපයකි. ඵරුණඩ, එඩ, (එඩක) කර්බාල, කර්ණාටක, කුණ්ඩ, කුර්කුර, කෙයූර, කොකිල, ඛොට, චමූපක, නාරඛ්‍ය, පිටක, පුන්නාග, මරුත්ත, මුක්තා, හිලල, විරල, හෙරම්බ, ශාඛ්‍යමිවෙර, වොර, ලොම්, පාප, අතර, මාලා වෛර යන ශබ්ද ද ද්‍රවිඩ භාෂාවෙන් සංස්කෘතයට ගන්නා ලදැයි මහාචාර්‍ය Robert Caldwell පූජකතුමා සහ H. Gundred පූජක තුමා පවසයි. මේ අතර ආචාර්‍ය කොලින්ස් තුමා ද එතුරු ඉන්දියානු භාෂාවන් කෙරෙහි ද්‍රවිඩ ලක්ෂණ දක්නා බැව් කියන්නේය. මහාචාර්‍ය කිටෙල් තුමාගේ ශබ්දකොෂයෙහි වෛදික භාෂාවේ බල පවත්වන දෙමළ වචන 450 ක් පෙන්වා දෙයි. මෙහි දක්වූ වචන සමූහයෙන් වුවද වැඩි හරියක් විනය පාළියේ පවා දක්නේය. ඒ ඒ ජාතීන් හා දෙශයන් සමඟ ගැටෙන භාෂාවක සම්මිශ්‍රණය වැළැක්විය නොහැකිය. එහින් භාෂාවේ හටගන්නා ජීව වෙනස නිසා අදහස් ප්‍රකාශ කිරීමේ පහසුව ද සැලසෙන්නේය.

බුදුරදුන් ජීවත් වූ සමාජයේ ජනතාවගේ ප්‍රයෝජනය පිණිස පැවැති ද්‍රව්‍යාපකරණ සමූහයක නාම මාලාවක් චුල්ලවග්ග පාළි ඛුද්දකවත්ථුක්ඛන්ධකයේ දක්නේය. මේවායේ නම්වලින් පෙණෙනුයේ ඒ සියල්ල දෙශීය ශබ්ද බවයි. ව්‍යවහාරයෙහි පවත්නා හැම භාෂාවකටම තද්භව විකෘතියෙන් හෝ තත්සම වශයෙන් යම් යම් ශබ්ද ඇතුළුවීමට ඉඩ ඇති නමුදු හැම ප්‍රාකෘත භාෂාවක ම දෙශී නාමයෙන් කොටසක් ද ලැබේ. දෙශී ශබ්ද නම් ඒ ඒ පළාත්වල ජාතීන්ගේ මූල ප්‍රකෘති ශබ්දයි. ආචාර්‍ය හෙම්චන්ද්‍රයෝ දෙශී නාම මාලාවෙහි දී මෙසේ කියත්

"ජේ ලකඛණේ ණ සිද්ධා—ණ සිද්ධා සකකයාභිභාණේසු
ණය හලණ ලකඛණා සත්ති—සම්භවං හෙ ඉහ ණිබ්දධං"

ජාත්‍යනන්තර වූ හෝ භාෂාන්තර වූ බලය යම්කිසි භාෂාවක් කෙරෙහි බලපවත්වන විට එම භාෂාවෙහි දෙශීය ශබ්ද අඩු වන්නේය. චුල්ලවග්ග පාළිය ඇතුළු විනය පොත්වලින් එකතුකර ගත හැකි දෙශීය ශබ්ද මාලාවෙන් පෙනෙනුයේ මගධ දෙශීයයන්ගේ සාමාජික ජීවිතය පිළිබඳ බාහිර බලය අඩු වූ බව සහ ඔවුන් මුල් බැස ගත් දෙශීය සංස්කෘතියකින් යුත් ජනතාවක් බවයි. "අබහුං, (චූ: පා: 226) අඩ්ඪුරක, (චූ: පා: 247) ඉකඛාස (චූ: පා: 268) ඉඩස (චූ: පා: 322) උකඛාභික, (චූ: පා: 217) ඔවට්ටික (චූ: පා: 217) කණෙඩාලික (චූ: පා: 225) කතක (චූ: පා: 242) කරකටක (චූ: පා 234) කලිම්බක (චූ: පා: 227) කුතතක (පාරා: පා: 75) ගඞ්ගබබහත්ථ (චූ: පා: 216) ඝටක (චූ: පා: 257, චන්දනික (චූ: පා: 234) චිකඛල්ල (චූ: පා: 278) විඩභුල (චූ: පා: 257) විම්බික (චූ: පා: 266) ජනාඝාතර (ඣානාඝාර?) චූ: පා: 277) ධම්මකරක (චූ: පා: 229) නාමතක (චූ: පා: 246) නිල්ලබ චූ: පා: 259) පකුඩ්ඩ (චූ:පා: 260) පඞ්ගචීර (චූ: පා: 257) පඤ්චපට්ටික චූ: පා: 231) පටිගණහ (චූ: පා: 228) පිසාචිල්ලිකා (චූ: පා: 226) පොදුවා (චූ: පා: 215) බුන්දිකාබබ (චූ: පා: 265) මනෝසිකා (චූ: පා: 257) මරුම්බ (චූ: පා: 233) මලෝරික (චූ: පා: 236) මොකඛචික (චූ: පා: 257) රඤ්ඤ (චූ: පා: 305) වට්ටංසක (චූ පා: 256) වඤ්ඤ (චූ: පා: 257) විධූනික (චූ: පා: 212) සිලික (චූ: පා: 218) යනාදී ශබ්ද විනය පිටකයට ඇතුළත් වූ දෙශීය ශබ්ද ගණයෙහි ලා සැලකේ. මේ ශබ්දයන්ගේ වටනාකම ඇත්තේ ව්‍යාකරණ සූත්‍රවලින් සිඳ කිරීමට හෝ නිරුකති දැක්වීමට නුපුළුවන් වීම නිසාය. දෙශනා පාළියේ බොහෝ ශබ්ද ශාබ්දික නීති අනුව විසාර ඍරීමෙන් එම ශබ්දයන්ගේ මූලික අර්ථයන් වෙනස් වූ තැන් එමට ඇත්තේය. මෙහි දැක්වූ දෙශීය වචන රාශිය ශාබ්දික නීතිවලට අසු නො වී මුල් සව රූපයෙන් ම තැන්පත් වී තිබීම භාෂාවන් පිළිබඳ පරීක්ෂණ පවත්වන විද්‍යාර්ථීනට විශාල ලාභයකි.

පෞරාණික වාසභූ විද්‍යාවට මෙන් ම සාමාජික ජීවිතයට අවශ්‍ය වූ ගෘහොපකරණාදිය පිළිබඳව ද ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගැනීමට ඉවහල්වන තැන් චුල්ලවග්ග පාළියේ ඛුද්දක වත්ථුකඛන්ධකයේ සහ සෙනාසනකඛන්ධකයේද ඇත. කපි—මකර—හත්ථි—ණාග ආදී සතුන්ගේ අඛේහපාඛයන්ගේ ලක්ෂණ අනුව තැනූ මේ වසතූන් නිසා පුරාවිද්‍යාව හදරනුවනට ද බොහෝ කරුණු උගත හැකිය. "එළක පාදක (චූ: පා: 266) කපිසීසක (චූ: පා: 233) කලාබුක (චූ: පා 250) කුක්කුට සම්පාද (පාචි: පා: 79) කුළීරපාදක (චූ: පා: 265) කුළංක පාදක (චූ: පා: 269) කොකනද පාසාද (චූ: පා: 211) ගඞ්ගබබහත්ථ (චූ: පා: 216) ගොඝංසික (චූ: පා: 229) ගොලොම්ක (චූ: පා: 247) චාමරිවිජනී (චූ: පා: 242) දෙඩ්ඩුභක (චූ: පා: 250) නාළිමුඩි (චූ: පා: 276) නාගදන්තක (චූ: පා: 269) පලාලපීඨ (චූ: පා: 266) මකරදන්තක (චූ: පා: 231) මකස කුටික (චූ: පා: 230) මකස විජනී (චූ: පා: 242) මච්ඡවාලක (චූ: පා: 251) මච්ඡකාසණ්ඩ (පාරා: පා: 39) මද්දවිණා (චූ: පා: 250) මිගලණ්ඩික (පාරා: පා: 73) මුණ්ඩවට්ටි (චූ: පා: 251) මුරජ (චූ: පා: 250) සපපසොණ්ඩික (චූ: පා: 173) හත්ථි සොණ්ඩික (චූ: පා: 251) යනාදී යෙදුම්වලින් ඒ ඒ වසතූන්ගේ හැඩහුරුකම ආදිය උගත හැකිය. පාචිත්තිය පාළියේ ඔමසවාද ශික්ෂාපද පදභාජනියේ ද එදා පොදු ජීවිතය පිළිබඳ ඉතා වටිනා තැන් ගෙදී ඇත්තේය. අවකණ්ණක—ජවකණ්ණක—ධනිට්ඨක—සව්ඨක ආදී යෙදුම් නිසා පෞරාණික සාමාජික තත්ත්වය විමසන්නකුට ලැබෙන ප්‍රයෝජනය මෙපමණකැයි කිව නොහේ.

අක්ෂර පරිපාටිය.

Alphabetical Order.

අ	ක	ට	ප	ස
ආ	ඛ	ඨ	ඵ	හ
ඉ	ග	ඩ	බ	ළ
ඊ	ඝ	ඪ	භ	(අ)ං
උ	ඩ	ණ	ම	
ඌ	ච	ත	ය	
එ	ඡ	ථ	ර	
ඔ	ජ	ද	ල	
	ඣ	ධ	ව	
	ඤ	න		

ආශ්‍රිත හා සාධක පොත්.

BIBLIOGRAPHY.

ග්‍රන්ථය	පරිශෝධක හෝ සම්පාදක	මුද්‍රිත වර්ෂය
අඞ්ගුත්තර නිකාය	සිරි දෙවමිත්ත, සිරි රෙවත, සිරි දෙවරක්ඛිත සංස්කරණය	1924
අධිමාස විනිශ්චය	කෝදාගොඩ උපසේන නායක ස්ථවිරයන් වහන්සේ	
අභිධර්මකෝෂය	පණ්ඩිත මොරටුවේ සාසනරතන ස්ථවිරයන් වහන්සේ	1948
අභිධර්ම චන්ද්‍රිකා	පණ්ඩිත මාතර ධම්මවංස ස්ථවිරයන් වහන්සේ	
අභිධර්ම ප්‍රදීපිකා	මොරටුවේ සිරි මේධානන්ද නායක ස්ථවිරයන් වහන්සේ	1950
අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය	තොටගමුවේ සිරි පඤ්ඤාමොලිතිස්ස නායක ස්ථවිරයන් ව:	1926
අභිධානප්පදීපිකා සන්නය	තොටගමුවේ සිරි පඤ්ඤාමොලිතිස්ස නායක ස්ථවිරයන් ව:	1895
උදානට්ඨකථා (භේ: වි:)	බිහල්පොල සිරි දෙවරක්ඛිත නායක ස්ථවිරයන් වහන්සේ	1920
උභය ප්‍රාතිමෝක්ෂ සන්නය	වැලිතර ධම්මකුසල ස්ථවිරයන් වහන්සේ	1927
කඞ්ඛාවිතරණී (භේ: වි:)	කරඳන සිරි ජිනරතන නායක ස්ථවිරයන් වහන්සේ	1930
කඞ්ඛාවිතරණී පිටපොත	කලුකොඩයාවේ සිරි පඤ්ඤාසෙඛර නායක ස්ථවිරයන් ව:	1926
කඨින වංසය	කිරිවත්තුඩුවේ සිරි පඤ්ඤාසාර නායක ස්ථවිරයන්වහන්සේ	1950
කල්‍යාණී ප්‍රකරණ	ගීන්තොට සිරි මේධඞ්කර මහා ස්ථවිරයන් වහන්සේ	1924
කුඩුසික පුරාණ සන්නය 1	හරුමල්ගොඩ සිරි සුමඞ්ගල නායක ස්ථවිරයන් වහන්සේ	1928
කුඩුසික පුරාණ සන්නය 2	බේරුවල සුමේධඞ්කර ස්ථවිරයන් වහන්සේ	1894
කුඩුසික පුරාණ සන්නය 3	මොරගල්ලේ [illegible] ඤාණෝභාස තිස්ස ස්ථවිරයන් වහන්සේ	1954
කුඩුසික විවරණය	පණ්ඩිත වැලිගම ඤාණරතන ස්ථවිරයන් වහන්සේ	1954
බුද්ධසිකඛා ටීකා	ගාල්ලේ සුමනජෝති ස්ථවිරයන් වහන්සේ	1898
ගරු භණ්ඩ විනිශ්චය	කලුකොඩයාවේ සිරි පඤ්ඤාසෙඛර නායක ස්ථවිරයන් ව:	1930
චූළවගග පාළි	ධම්මානන්ද අමරසිහ සුධීහු	1909
චුල්ලවගග පාළි B	ඕල්සැල්ලේ සිරි ඤාණෝදය නායක ස්ථවිරයන් වහන්සේ	1951
ජාතක අට්ඨවා ගැටපදය	ඩී බී. ජයතිලක ශ්‍රීමත්තු	1943
ජාතකට්ඨ කථා	විදුරුපොල පියතිස්ස මහා නායක සවාමීන්ද්‍රයන් වහන්සේ	1937
ධම්පියා අට්ඨවා ගැටපදය	ඩී. බී ජයතිලක ශ්‍රීමත්තු	1933
ධර්ම ප්‍රදීපිකාව	රත්මලානේ ශ්‍රී ධම්මාරාම නායක සවාමීන්ද්‍රයන් වහන්සේ	1906
පපඤ්ච සූදනී (භේ: වි:)	රත්මලානේ සිරි ධම්මානන්ද නායක සවාමීන්ද්‍රයන් වහන්සේ	
පරිවාර පාළි 1	පී. වී. ඇම්. වී. ප්‍රඥාලෝකාසභ ස්ථවිරයන් වහන්සේ	1905
පරිවාර පාළි 2	වැලිපටන්විල සිරි දීපඞ්කර නායක ස්ථවිරයන් වහන්සේ	1915
පරිවාර ගණ්ඨිපද	බැන්ඩිඇමුල්ලේ ධම්මරතන නායක ස්ථවිරයන් වහන්සේ	1914
පාචිත්තිය පාළි 1	බෙන්තර සඛානිස්ස සහ කාළඹිල ඉන්දරතන ස්ථවිරයන් ව:	1926
පාචිත්තිය පාළි 2	තෙල්වත්තේ සිරි අරියවංස නායක ස්ථවිරයන් වහන්සේ	
පාතිමොක්ඛ ගණ්ඨි	ඤාණරතන ස්ථවිරයන් වහන්සේ	1890
පාරාජික පාළි 1	තෙල්වත්තේ සිරි අරියවංස නායක ස්ථවිරයන් වහන්සේ	1913
පාරාජික පාළි 2 (භේ: වී:)	පලන්නොරුවේ විමල ධම්ම නායක ස්ථවිරයන් වහන්සේ	1950
පාළිමුත්තක විනය විනිශ්චය	පානදුරේ සිරි ඤාණවිමලතිස්ස නායක ස්ථවිරයන් වහන්සේ	1903
පාළිමුත්තක විනය විනිශ්චය සඞ්ඛෙප ටීකා.	කහදමෝදර සිරි පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ	1908

පාළිමුත්තක විනය විනිවිජය සන්නය.	කරගම්පිටියේ ජෝතිරතන නායක සථවිරයන් වහන්සේ	1918
ප්‍රාතිමෝක්ෂ පුරාණ සන්නය	කොළොන්නාවේ සුගුණසාර නායක සථවිරයන් වහන්සේ	1927
ප්‍රාතිමෝක්ෂ වර්ණනාව	පණ්ඩිත පණම්ඹල ජිනරතන, රත්ගම්පඤ්ඤසෙඛර නායක සථවිරයන් වහන්සේ	1948
භික්ෂු ශීලය	උඩුනම්පොලවිසුවණණජෝතිස්සභ මහා සාමි	1893
භෙසජ්ජ මංජූසා සන්නය	මතුගම විජයසිරි මුදුණය	1947
මනොරථ පූරණී 1	රත්මලානේ ශ්‍රී ධම්මාරාම නායක සවාමීන්ද්‍රයන් වහන්සේ	1907
මනොරථ පූරණී 2 (හේ: වි:)	රත්මලානේ සිරි ධම්මානන්ද නායක සවාමීන්ද්‍රයන් වහන්සේ	1928
මහා බොධිවංශ ගැටපදය	රත්මලානේ ශ්‍රී ධම්මාරාම නායක සවාමීන්ද්‍රයන් වහන්සේ	1910
මහාවග්ග පාළි	බෙන්තර සඤ්ඤාතිස්ස සථවිරයන් වහන්සේ	1911
මහාවග්ග පාළි සන්නය	කරගම්පිටියේ ජෝතිරතන නායක සථවිරයන් වහන්සේ	1928
මහාවග්ග පාළි ගැටපදය	උහන්ඹිවිට සාසනතිලක සථවිරයන් වහන්සේ	1945
මූලුසික සන්නය	මුල්ලපිටියේ ධම්මජෝති තිස්ස සථවිරයන් වහන්සේ	1912
මූලුසික වර්ණනාව	සීනාවත්තේ ගුණාලංකාරතිස්ස නායක සථවිරයන් වහන්සේ	
වජිරබුධි ටීකා 1	බුරුම පොත	
වජිරබුධි ටීකා 2	සිංහල ඡිවපත (අමුද්‍රිත)	
චතුතකඛ්ඩිකය	බලපිටියේ උපරතන සථවිරයන් වහන්සේ	1905
විනයපත මංජූසා	ශ්‍රූ. පි. ඒකනායක සුධීහු	1912
විනය නීතිය	දෙඩන්දූවේ සිරි පියරතනතිස්ස මහා නායක සවාමීන්ද්‍ර: ව:	1905
විනය විනිවිජය 1	අම්බලම්ගොඩ සුමංගලතිස්ස නායක සථවිරයන් වහන්සේ	1914
විනය විනිවිජය 2	පොල්වත්තේ බුද්ධදත්ත නායක සථවිරයන් වහන්සේ	1952
විනය විනිශ්චය සන්නය	තලල්ලේ ශ්‍රී ධම්මරක්ඛිත නායක සථවිරයන් වහන්සේ	1957
විනයාවී සඞ්ග්‍රහය	පුස්කොළ පිටපත (අමුද්‍රිතයි)	
විනයාලඞ්කාරය	පානදුරේ සිරි සුමංගලතිස්ස නායක සථවිරයන් වහන්සේ	
විමති විනොදනී ටීකා	බේරතුඩුවේ ධම්මාධාරතිස්ස සථවිරයන් වහන්සේ	1935
විසුඞ්මාගී සන්නය 1	වැබඩ සඞ්ඝරතන සථවිරයන් වහන්සේ	
විසුඞ්මාගී සන්නය 2	පරවාහැර වජිරඤාණ සථවිරයන් වහන්සේ	
විසුඞ්මාගී සන්නය 3	බෙන්තර සඤ්ඤාතිස්ස සථවිරයන් වහන්සේ	1949
ශ්‍රී සුමඞ්ගල ශබ්දකොෂය	පණ්ඩිත වැලිවිටියේ සොරත නායක සථවිරයන් වහන්සේ	1952
සද්ධම්ම සාගරය	පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල සථවිරයන් වහන්සේ	1954
සමන්තපාසාදිකා (හේ: වි:)	බද්දේගම සිරි පියරතන නායක සථ: ව: සහ පණ්ඩිත වැලිවිටියේ සොරත නායක සථවිරයන් වහන්සේ	1929
සමෙමාග විනොදනී (හේ: වි:)	යගිරල පඤ්ඤානන්ද නායක සවාමීන්ද්‍රයන් වහන්සේ	1932
සාරත්ථ දීපනී	බිහල්පොල සිරි දෙවරක්ඛිත නායක සවාමීන්ද්‍රයන් වහන්සේ	1915
සාරාර්ථ මඤ්ජරී	පණ්ඩිත වේරගොඩ අමරමොලි නායක සථවිරයන් ව:	1946
සික්ඛාපද වළඤ්ජනං	වැකඹ පඤ්ඤානන්ද සථවිරයන් වහන්සේ	1901
සුජනපමොදනී	පණ්ඩිත වවද්දර මේධානන්ද සථවිරයන් වහන්සේ	1929
සුමඞ්ගල විලාසිනී (හේ: වි:)	බිහල්පොල සිරි දෙවමිත්ත නායක සවාමීන්ද්‍රයන් වහන්සේ	1918

සඞ්කේත විඤ්ඤත්ති

A List of Abbreviations used in the Dictionary of Vinaya

අඞ්ගු: නි: = අඞ්ගුත්තර නිකාය
අතී: = අතීත
අතී: කෘ: = අතීත කෘදන්ත
අනා: = අනාගත
අ: ප: ස: = අභිධාන ප්‍රදීපිකා සන්නය
අභි: කෝ: = අභිධම්ම කෝෂය
අභි: ච: = අභිධම්ම චන්ද්‍රිකා
අභි: ධ: ප්‍ර: = අභිධම්ම ප්‍රදීපිකා
අභි: ස: ස: = අභිධම්මාර්ථ සංග්‍රහ සන්නය
උ: අ: = උදාන අට්ඨකථා
උප: ග්‍ර: = උප ග්‍රන්ථය
උ: වි: = උත්තර විනිච්ඡය
උ: ස: = උපසර්ගීය
කථා: අ: = කථාවත්ථු අට්ඨකථා
කම්: කෘ: = කම්මාරක කෘදන්ත
කං: වි: = කඞ්ඛා විතරණී
කං: වි: පි: = කඞ්ඛා විතරණී පිටපොත
කු: සි: ස: = කුද්දසික සන්නය
කෘ: = කෘදන්ත
ක්‍රි: වි: = ක්‍රියා විශේෂණ
ඛු: සි: ටී: = ඛුද්දසික්ඛා ටීකා
ග: හ: වි: = ගරු භණ්ඩ විනිච්ඡය
චු: පා: = චුල්ලවග්ග පාළි
චු: පා: B = චුල්ලවග්ග පාළි
(බෞද්ධ සමෙමලනයේ)
ජා: අ: ක: = ජාතක අට්ඨ කථා
ජා: අ: ගැ: = ජාතක අට්ඨවා ගැටපදය
තුං: = තුම්හත්ථය
දී: නි: B. = දීඝ නිකාය (බෞද්ධ සමෙමලනයේ)
ධ: අ: ගැ: = ධම්මපදා අට්ඨවා ගැටපදය
ධ: ප්‍ර: = ධම්ම ප්‍රදීපිකා
න: ලි: = නපුංසක ලිඞ්ග
නා: = නාම පදය
නි: = නිපාත පදය
ප: මී: = පඤ්ඤ මී වීහක්ඛිය
පරි: පා: = පරිවාර පාළි
පරි: පා: ගැ: = පරිවාර පාළි ගැටපදය
ප: සූ: = පපඤ්ච සූදනී
පා: = පාළි
පාචි: පා: = පාචිත්තිය පාළි
පා: මෙ: ඝ: = පාතිමොක්ඛ ඝණ්ඩි
පාරා: පා: = පාරාජික පාළි
පා: මූ: වි: වි: = පාළිමුත්තක විනය විනිච්ඡය
පු: ප්‍රා: ස: = පුරාණ ප්‍රාතිමොක්ෂ සන්නය
පු: ලි: = පුල්ලිඞ්ග
පූ: ක්‍රි: = පූර්ව ක්‍රියාව
ප්‍රා: = ප්‍රාකෘත
ප්‍රා: ච: = ප්‍රාතිමෝක්ෂ වර්ණනාව
භි: ශී: = භික්ෂු ශීලය
මනු: = මනුසම්‍රතිය
මනෝ: පූ: = මනෝරථ පූරණීය
මහා: පා: ගැ: = මහාවග්ග පාළි ගැටපදය
මහා: පා: = මහාවග්ග පාළි
මහා: පා: ස: = මහාවග්ග පාළි සන්නය
මහා: බෝ: ගැ: = මහා බෝධිවංශ ගැටපදය
මෝ: පා: = මොග්ගල්ලාන පඤ්චිකා
රූ: සි: ස: = රූපසිද්ධි සන්නය
ව: බු: ටී: = වජිරබුද්ධි ටීකා
වර්ත: = වර්තමාන
වර්ත: කෘ: = වර්තමාන කෘදන්ත
විනී: නි: = විනය නීතිය
වින: ම: = විනයත්ථ මංජූසා
වි: ම: ටී: = විසුද්ධි මග්ග ටීකා
වි: මා: ස: = විශුද්ධිමාර්ග සන්නය
වි: ල: = විනයාලඞ්කාරය
වි: වි: = විනය විනිච්ඡය
වි: වි: ටී: = විමති විනෝදනී ටීකා
වි: වි: ස: = විනය විච්ඡය සන්නය
සං: = සංස්කෘත
සං: වි: = සමෙමාහ විනෝදනී
සා: පා: = සමන්තපාසාදිකා
සැ: මී: = සත්ත මී
ස: සා: = සද්ධර්ම සාගරය
සාර: දී: = සාරත්ථ දීපනී
සාර: ම: = සාරාර්ථ මඤ්ජූරී
සි: ව: වි: = සිඛාවළඳ විනිස
සි: ව: වි: ප්‍ර: = සිඛාවළඳ විනිස ප්‍රදීපය
සූ: නි: අ: = සූත්තනිපාතට්ඨ කථා
සූ: ප: = සුජනපමෝදනී
සූ: වි: = සූළඞ්ගල විලාසිනී
සත්‍රී: ලි: = සත්‍රී ලිඞ්ග

< = පූර්ව පදයෙන් අපරපදය බිඳුණු බව
> = අපරපදයෙන් පූර්ව පදය බිඳුණු බව
√ = ධාතුව ඇදින්වීම
= = සමාන ලකුණ ආදේශය
? = විමසිය යුතු බව

උපදෙස්.

(මේ ග්‍රන්ථය කියවීමට පෙර පහත සඳහන් උපදෙස් දැන ගැනීම ප්‍රයෝජනවත් වේ)

Directions to be studied Before using this Dictionary of Vinaya.

1 මෙහි විසතර කළ (මාතෘකා) වචනයන් දැක් වූයේ අකාරාදි පිළිවෙළිනි. එබැවින් යම් වචනයක් පිළිබඳ අදහස හා විස්තර උව නොවූ විට එම වචනය අකාරාදි පිළිවෙළින් බැලිය යුතුය.

2 සම්කිසි නාමපදයක් සමඟ සමාස වූ පද කීපයක් වේ නම් එබඳු සමාස පද සියල්ල දැක්වූයේ පූර්වපදය හැර අකාරාදි ක්‍රමයෙනි. සමාස වූ පූර්ව පදය පමණක් එම ඡේදයේ මුලින් දක්වා අපර පදයන් අකාරාදි පිළිවෙළින් දක්වා ඇත. නිදසුනක් වශයෙන් මෙහි පළමුවන පිටුවේ "අංස කාසාව" යනු බැලිය යුතුය එහි "අංස" යනු එම ඡේදයේ මූල දක්වා අකාරාදි ක්‍රමයෙන් "කාසාව" යන පදය ළඟට එය සම්බන්ධ කර ඇත. ඒ පිණිස කාසාව යන වචනයට මුලින් — ඉරි කැල්ලක් දක්වන ලදී. එසින් අදහස් කරන්නේ එම ඡේදයේ මුලින් දක්නා අංස යනු එ තැනට ගත යුතු බවයි.

3 සමහර ඡේද ඇතුළත —ං මෙබඳු ලකුණක් ඇත. එයින් අදහස් කරන්නේ එම ඡේදයේ මුලින් ම සඳහන් වචනය ද, එම ලකුණට උඩින් ඇති වචනය ද එතැනට ගත යුතු බවයි. මෙහි 3 වැනි පිටුවේ "අකාල චීවර ගහණ" යනු බැලිය යුතුය. ගහණ යන්නට මුලින් —ං මේ ලකුණ යෙදූ වේ "—" ඉරි කැල්ලෙන් අකාල යනුද "ං" ලකුණෙන් චීවර යනු ද ගැනීම පිණිස ය. ඒ වචන දෙක එම ලකුණුවලින් සම්බන්ධ කළ විට අකාල චීවර ගහණ යනු සම්පූර්ණ වේ.

4 සමාන සවර දෙකක් අතර හෝ අසවර්ණ දෙශයක්ව හෝ සන්ධි වූ පදයන් " ' " ලකුණෙන් විසන්ධිකොට ඒ සමඟ ම වරහනින් විසන්ධි රූපය හෝ සන්ධි සවර හෝ දක්වා ඇත.

5 අනු ආදි උපසර්ගීයක් සමඟ සමාස වූ පදයක් නම් එම උපසර්ගීය මුලින් දක්වා සමාස පද අකාරාදි ක්‍රමයෙන් යොදා ඇත එහෙත් න නිපාතය හා සම්බන්ධ වූ උකාරාදි පද එම ගණයෙහි ලා නොසලකා අකාරාදි ක්‍රමයෙන් දක්වන ලදී. නිදසුනක් වශයෙන් මෙහි 124 වැනි පිටුවේ දෙවැනි ඡේදයේ (අනු) ඛණ්ඩන යනු බැලිය යුතුය, අනුබන්ධන යනු අනු උපසර්ගීය පූර්ව සිඛ්ධ පදයක් බැවින් එම ඡේදයට ම ඇතුළත් විය. එහෙත් අනුකම්පනඤ්ඤ යන පදය දක්නේ 131 වැනි පිටුවේ 1 වැනි ඡේදයේය, එම පදය සිද්ධ වූයේ අනු උපසර්ගීය පූර්වකව නොව "න + උකම්පනඤ්ඤ" යන පද දෙක සන්ධි වීමෙනි. මෙබඳු සෙසු තැන් ද මේ ක්‍රමයෙන් දත යුතුය.

6 ආඛ්‍යාත පදයක් මාතෘකාවට යෙදුණු විට එහි ධාතු ප්‍රත්‍යය ද, එයින් සිඛ් එම ක්‍රියා පදයේ අතීත — වර්තමාන — අනාගතාදි ආඛ්‍යාත රූපයන්ගේ එකවචන ද තද්ධිත ප්‍රත්‍යයානන්තරයන්ගේ ප්‍රකෘති ප්‍රත්‍යය ද දක්වා ඇත.

7 යම්කිසි වචනයක් හෝ විසතරයක් මෙහි දක්වූ නම් එම වචනය හෝ විසතරය උපුටාගත් පොත්වල පිටු හා පෙළ දක්වන ලද්දේ ලොකු කුඩා අංකවලිනි. "පාරා: පා: 621" යනුවෙන් අදහස් කරන්නේ පාරාජික පාළියේ 6 වන පිටුවේ 21 වන පෙළ බවයි ගාථා පමණක් ඇති පොත්වල ගාථා අංකය දක්වන ලදී. "චින: ව: 568" යනු චිනය චිනිශ්චයේ 568 වන ගාථාව පිණිස ය.

8 තද්ධිත කෘදන්ත පදයන් හුදෙකලාව යෙදුණු විට එහි ප්‍රකෘති ප්‍රත්‍යයාදිය ද, එයට වූ ආදෙශාදිය ද එතැනම දක්වන ලදී. "සං + √මස + යු=අන" යනු නිදසුනකි, එසින් අදහස් කරන්නේ 'සං" යන උපසර්ගීය පූර්ව වූ "මස" ධාතුවෙන් "යු" ප්‍රත්‍යය වූ බව සහ එම ප්‍රත්‍යයට "අන" ආදෙශ වූ බවත් ය.

9 සමහර ශබ්දයන්ගේ වෙනස් අර්ථ දැක්වීම පිණිස එම ශබ්දයන්ගේ අවසානයෙහි 1-2-3 ආදී පිළිවෙළින් අංක යොදන ලදී.

10 පදසිද්ධි දැක්වීමේදී ව්‍යාකරණ සූත්‍රයන් හෙන් සිද්ධ කෘතී ය එම ව්‍යාකරණ සූත්‍ර රහිතව දක්වා ඇත. සමාසානන්ත පදයන්ගේ ව්‍යාකරණ විභාග පෙන්වන විට පූර්වපදය හැර අපර පදයෙහි පමණක් ව්‍යාකරණ දක්වන ලදී. එසේ සිඛ්වූ පාඨ අකාරාදි ක්‍රමයෙන් මෙහි අඟ ඇත.

පිළිගැන්වීම.

විනය කොෂය

නම් වූ මේ ග්‍රන්ථය පානදුරේ රන්
කොත් විහාරාධිපති අස්මදුවායය්‍ය
"සිරිසඛන සාසනධජ" කරගම්පිටියේ
ජෝතිරතනාභිධාන අමරපුර නිකාය
යේ අධිකරණ නායක සඛාමීන්ද්‍රයන්
වහන්සේ වෙත ගුරු ගෞරවයෙන්
යුක්තව පිළිගන්වන ලදී.

(සම්පාදක)

විනය කොෂය

-ට්ඨපන (නා) (√ඨප + යු=අන)= අගුළු දැමීම. උඩඩලිපත සහිත දෙර පෝරුවෙන් දෙරබාව නිශ්චල වනු පිණිස වසා දැමීම. දෙර කවුළු නිශ්චල වනු පිණිස වැසීම. "අග්ගළට්ඨපනාය, සකවාට ඛාර බන්ධනාය නිශ්චල වනු පිණිස" පාචි: පා: 525 කැ: චි: 9538 කැ: චි: පි: 7211 සී: වි: 1105 **-ත්ථම්භ**(නා) [සං. සත්‍ථම්භ > ප්‍රා: ඨම්භ > සිං: ටැඹ]= අගුළු කනුව. අගුළු සවිකළ උළුවහු කනුව. සිදුරු තුනක් හෝ සතරක් ඇතිව හිදි යොදූ දෙර බා පමණට කළ කණුව. අගුළු වැට. දෙරපොල්ල සැ: පා: 8935 චූ: පා: B. 7427 (අග්ගළවට්ටි බලනු) **-දාන** (නා) √දා + යු=අන)= අණඩු දැමීම, දිරුණැක් ඉවත්කොට අලුත් කැබලි දැමීම. "අග්ගළදානං වා, කඩ ලීම් එව්" ජා: අ: ගැ: 132 මහා: පා: 32631 (අග්ගළ 2 බලනු) **-පාසක** (නා) (පාස + ක= පාස) [සං. පාශ]= අගුළු පාසකය. යතුරු ලිය. කපි සීසකය යතුරු තහඩුව. "කපි සීසකං නාම ද්වාරබාහං විජ්ඣිත්වා තත්ථ පවෙසි ත්වා අග්ගළ පාසකෝ වුච්චති" සැ: පා: 8938 චූ: පා: B 7428 ඉ: චි: ථි: 46032 අ: ප: ස. 3113 **-ඵලක** (නා) [සං. ඵලක]= කවුළුව. අගුළු පුවරුව. යතුරු වැටෙන කවුළුව. "අග්ගළ ඵලකන්ති කවාටං" ප: සු: (4) 10020 **-වට්ටි** (නා) [සං වර්ති]= අගුළුවැට. දෙර පොල්ල. දෙර බාවට සම පමණ වූ අගුළු කණුව "අග්ගළ වට්ටි නාම ද්වාර බාහාය සම්පජ්ජමාණෝයෙව අග්ගළත්ථම්භෝ වුච්චති" චූ: පා: B 7437 0 සැ: පා: 8935 (අග්ගළත්ථම්භ බලනු)

අජ්ඣායක (නා) [සං. අධ්‍යායක]= හදාරන්නා. වෙද හදාරන ආචාර්යා. ''අජ්ඣායකො, හදාරන්නාවූ, ශාස්ත්‍රු පිරිවන්නාවූය යූ කැන්'' ''න + ජ්ඣායකො=අජ්ඣායකො''යි නෙතඩ්‍යාත විරහිතවූ බ්‍රාහ්මණයන්ට පළමුව නිදු පිණිස මෙය ව්‍යවහාර කළ බවද පසුව ඔවුන් මන්ත්‍ර පිරිවහන්නට වූ පසු ප්‍රශංසා පිණිස ''අජ්ඣායකො'' යි ව්‍යවහාර කරන බවද මනොරථ පූරණියේ කියයි. ජා: අ: ගැ: 8[34], මනො: පූ: 393[14], –කුල (නා)= මන්ත්‍ර හදාරන කුලය. මන්ත්‍ර හදාරන බ්‍රාහ්මණ කුලය. සු: නි: අ 132[13].

අජ්ඣිට්ඨ (නා) (අධි + √ඉස + ත)= ආරාධනා කළ. වි: වි: ථි: 477[17]. (අජ්ඣෙසති බලනු)

අඤ්ජන (නා) [සං. අඤ්ජන]= අඳුන්. අඳුන්දැලි. කා:වි:පි: 111[16]. –කරණ්ඩ (නා) [සං.කරණ්ඩ]= අඳුන් කරඬුව. අඳුන් හෙප්පුව. දමන භාජනය. භාජනීය භාණ්ඩයක්. කා: වි:1පි: 113[30].

අඤ්ජනී (නා)= අඳුන් නල. අඳුන් දමන හෙප්පුව. එක් භාජනීය භාණ්ඩයක්. වටවූ හෝ අටැස් හෝ සොළසැස් වූ මාලාකම්මාදි ඒකාර රහිතවූ අඳුන්නල භික්ෂූන්ට වටනේය. එය සක්නැබ, අං, ඇට, රණහුණ, දළ, දඬු, හුණ, ලාකඩ, ලොහොමුවා වූයේ වටී ''උජුක මෙව පන චතුරස්සා වා අට්ඨංසා වා සොළසංසා වා අඤ්ජනී වට්ටති'' යි යනු අටුවා ඇත්ත් වා ශබ්දයෙන් සිව්රැස් අඤ්ජනියද ගතයුතු:' කි වි: පි: 113[32], කු: සි: සං: 641–[23], චූ: පා: B 722[22], වි: ලං: 32[25]. –කරණ්ඩ (නා)– අඳුන් කරඬුව. කා: වි: 140[22] කා:වි: පි: 113[30](අඤ්ජන කරණ්ඩ බලනු.) –කඤ්ඤන (නා)= උදුකඳල දණ්ඩය. මොහොල? වී: ලං: 342[9] –කුසඤ්චිකා (නා) [සං. කුසඤ්චිකා]= අඳුන් කෙස්ස. අඳුන් හෙප්පුවේ යතුර. විසිතුරු නොකළ යුත්තක්. කු: සි: සං: 65[10]. –ඝකාස (නා) [සං. කෝෂ]= අඳුන් හෙප්පුව දමන පසුම්බිය: අඳුන් පසිය කු: සි: සං: 65[10]. –ථවිකා (නා)= අඳුන් පසිය ''අඳුන් පසිය එක් පැහැ ඇති හුසින් විදිනට වටී.'' කු: සි: සං: 64[29]; පා: මු: වි: වි: 352[8].

-සලාක (නා) [සං. ශලාක]= අඳුන් ලහ. අඳුන් ගාන කූර. ක: වි: පි: 113[32], පා: මු: වි: ටී: 34[7] කු: සි: ස: 65[17]. **-සිපාටි**(නා)[සං. ස්‍රුපාටිකා?]= අඳුන් කරඬියලිය. වාසිය ආදි භාණ්ඩ බහා ලන රෙදි ආදියෙන්ම කළ පැස නොහොත් පසුම්බිය සිපාටිකා නමි. (සිපාතිකා සී ද දක්නේය.) කු:සි:ස: 65[10], පා:මු:වි:ටී: 35[23]

අඤ්ජනූප පිංසන (නා) (අඤ්ජන+උප පිංසන) (උප + √පිංස + යු + අන)=අඳුන් පිණිස සුණු කරන ද්‍රව්‍ය. අඳුන් පිණිස සුණු කරන බෙහෙත්. මහා: පා: 237[30] ස: පා: 81[219] වි: වි: ටී: 430[20]

අඤ්ජලි (නා) [සං. අඤ්ජලි]=ඇඳිලි. දෙහොත. මල් කැකුලක් මෙන්· මුදුනෙහි තැබූ දෙහොත. ටී: මා: ස: 542[13] අ: ප: ස: 37[21] **-කම්ම** (නා) [සං, කර්‍ම]= ඇඳිලි බැඳීම. අත් දෙක මල් කැකුලක් මෙන් කොට මුදුනෙහි තබා වැඳීම. නමස්කාර කිරීම. ක: වි: පි: 33[11] ජා: අ: ගැ: 3[24] **-කරණීය** (නා) (√කර + නීය; නී;=ණී)=ඇඳිලි බැඳීමට සුදුසු. සඞ්ඝානුස්මෘතියෙහි දක්නා ආර්‍ය නවගුණය අතුරෙන් එක් ගුණයක්· ටී: මා: ස: 542[17] **-පග්ගහණ** (නා) (ප + √ගහ + යු=අන; න=ණ)=ඇඳිලි බැඳීම, දෙහොත මුදුනත තබා වැඳීම. ස: පා: 1033[17] ජා: අ: ගැ: 3[24] **-සාමීචි** (නා) [සං. සාමීචි]= ඇඳිලි බැඳීම් හා පිළිසඳර කථා කිරීම්. සා: පා: 1033[17] පරි: පා: ගැ: 39[27]

අඤ්ජස (නා) [සං. අඤ්ජස]= මාර්‍ගය. කණු කටු නැති මාර්‍ගය. ජා: අ: ගැ: 15[16] අ: ප: ස: 27[30]

අඤ්ජිත (නා) (√අඤ්ජ + ඉ + ත)=හූ කවින ලද. තුල් කැටපු. "අඤ්ජිතං, යම් පමණ කැටැ කැටැ අතින් එවැ ගන්නා ලදද" ක: වි: 186[27] ක: වි: පි: 130[14]

අඤ්ඤ (ස: නා) [සං. අන්‍ය]=අන්. අනික්. අනිකක්. පු: ලි: **අඤ්ඤෝ**, ස්ත්‍රී: ලි: **අඤ්ඤා**, න: ලි: **අඤ්ඤං** **-තර** (ස: නා)[සං. අන්‍යතර]= එක්තරා. එක්. පු: ලි: **අඤ්ඤතරෝ**. ස්ත්‍රී: ලි: **අඤ්ඤතරා** න: ලි: **අඤ්ඤතරං** "අඤ්ඤතරං වා, අඤ්ඤතරං වා, එක්තරා එක්තරා" ප්‍රා: පු: ස: 1[29] **-භොජන** (නා) =එක්තරා භෝජනයක්. ඔදන, කුම්මාස, සත්තු, මච්ඡ, මංස යන පස් භොජනයන් අතුරෙන් එක් භෝජනයක්. ගණ භෝජන ශික්ෂාපදයෙහි භොජන නාම යෙන් ගැණෙන ආහාර. ක: වි: 103[7] ක: වි: පි: 7[31] **-තිත්ථිය** (නා) [සං. තීර්‍ථික] =අන්‍ය තීර්‍ථිකයෝ. ශාසනයෙන් බාහිර අන්‍ය ලබ්ධිකයෝ මෙහි "තිත්ථ" යනු ලබ්ධියයි දෙසැටක් දෘෂ්ටිහු ද "තිත්ථ"සි කියති. "අඤ්ඤ තිත්ථියාති එත්ථ තිත්ථං වුච්චති ලද්ධි. අඤ්ඤ **තිත්ථං** අඤ්ඤ තිත්ථං නං එතෙසං අත්ථීති අඤ්ඤ තිත්ථියා." ස: පා: 772[23] ම: පා: ස: 2[76] ජා: අ: ගැ: 12[411] **-පරිබ්බාජක** (නා) [සං. පරිව්‍රාජක]= අන්‍ය තීර්‍ථික පරිව්‍රාජකයෝ.අන් තොටු පිරිවැජියෝ. ශාසනයෙන් බාහිර තීර්‍ථික නිකායවල පැවිදි වූවෝ. ගිහි ජීවිතය හැර පැවිදිව තැනින් තැන ඇවිදින්නෝ පරිව්‍රාජකයෝ නම්වෙත්. ප: සු: 6[27](3) **-පුබ්බ** (නා,=පෙර අන්‍ය තීර්‍ථික වූ. පළමුව අන්‍ය තීර්‍ථික නිකායෙක්හි පැවිදි වූ. එබන්දන් මෙ සස්නෙහි පැවිදි උපසපන් කැමැති නම් සිව් මසක් පිරිවෙස් විසිය යුතුය. කර්‍මවාදී ක්‍රියාවාදී ගිනි දෙවිඟන් පුදන ජටිලයන් හා ශාක්‍යවංශික අන්‍ය තීර්‍ථික යන් ද, පිරිවෙස් නොදී උපසපන් කළ යුතුය. මහා: පා: 77[7]–80[11] ස: පා: 740[7] (විසාර ම: පා: ස: 256–459 පිටු බලන්නේය.) **-පුබ්බ කථා** (නා) පෙර අන්‍ය තීර්‍ථික වූවන්ගේ පැවිදි උපසපන් පිළිබඳ කථා. මහාවග්ගපාළියේ මහා ඛන්ධකයේ එක් කොටසක්. මහා: පා: 80[12]

අඤ්ඤතර (නි) [සං: අන්‍යතර]= 1 අන් නැනක, 2 හැර, විනා, තබා. **-අජ්ඣාරාම** (නා) =ආරාමය ඇතුළත හැර. භික්ෂු විහාරයෙහි මෙන්ම භික්ෂුණී විහාරයෙහි ඇතුළත් රතන සික්ඛා පදයෙහි එක් අනු ප්‍රඥප්තියක්. යම් භික්ෂුවක් ආරාමය හෝ ආවසථය ඇතුළත හැර සෙසු තැන තුබූ රතනයක් හෝ රතන සම්මතයක් නහා තබා, දෙනු පිණිස ගනී නම් පවිති වේ. මේ ශික්ෂාපදය භික්ෂුණීන්ට ද සාධාරණය. ප්‍රා: පු: ස: 89[26] ස: පා: 654[29] (අජ්ඣාරාම බලනු) **-අජ්ඣාවසථ** (නා) =ආවසථය ඇතුළත හැර. ඇතුළු ගෙය තබා. ප්‍රා: පු: ස: 90[13] ස: පා: 654[29] වි: වි: ටී: 336[24] (අඤ්ඤතර අජ්ඣාරාම සහ අජ්ඣාවසථ බලනු) **-අධිමාන** (නා) =අධිමානය (=තද මානය) නැතිව. අධිගත ධර්‍ම ඇත්තෙමි යන අභිමාන නැතිව. උත්තරි මනුස්‍යධර්‍මාරොචන පාරා

Paññāpārami - Na Uyana Free Distribution

ජීකා ශික්ෂාපදයෙහි අනු ප්‍රඥප්තිය. මා විසින් චතුරාර්ය සත්‍යාධිගමය කරන ලද්දේයයි උපන් මානයෙන් උත්තරි මනුෂ්‍ය ධර්ම රොචන යෙන් පරිජි නොවේ. "අධිමාන නම් සුපරිශුද්ධ ශීල සම්පන්නී විසිව පැවතුව හට හෝ විදර්ශිනාගි යුක්තව සොපක්කෙලශොදය ව්‍යය ඥාන ලදුවහට හෝ මේ ධර්ම මා විසින් අධිගත යයි දැඩිව උපදනා මනි"

මෙහි අධිමානය නම් ඵඩමානයයි හෙවත් අනිමානයයි. කලාප සම්මර්ශනය කිරීම්‌ වශයෙන් සංඝාරයන් ත්‍රි ලක්ෂණයට නඟා විදර්ශිනා වඩන ආරබ්ධ විදර්ශිකයාහට සවසන්නානයෙහි නො පැමිණි ධ්‍යාන මාර්ගාදියෙහි මානය උපදී. සමහර ශුෂ්ක සමථ ලාභී තැනැත්තේ හෝ ශුද්ධ විදර්ශනා ලාභී තැනැත්තේ දිගු කලක් තමන් තුළ ක්ලෙශ සමුදාවරණයක් (කෙලෙස් සිතිවිලි හට ගැන්මක්) නො දක්නේ මම සෝවාන් වෙමි, සකෘදාගාමී වෙමි, අනාගාමී වෙමි යි සිතයි. සමථ විදර්ශනාලාභීහුගේ සමාධි බලයෙන් ක්ලෙශයෝ දැඩි වූවාහු විදර්ශනා බලයෙන් සුපරිගෘහීත වූවාහු ද වෙත්. එබැවින් සියවසක් ගත වූයේ ආමුදු ක්ලෙශයෝ නො නැඟෙති. එහිදී හෙතෙම මම රහත් වීමියි සිතයි. මේ ය අධිමාන නම් සං: පා: 308[4] වි: ව්‍ය: වී: 100[27] ප්‍රා: ව: 51[17] කු: සි: ස: 7[14] ක: ව්‍ය: 32[31] **-අනන්තරවාසක** (නා) අනන්තරවාසකය හැර. හඳනා සිවුර හැර: කඨිනය අතුළ හැකි ත්‍රිවිධ වස්තූන්ගෙන් එකක්. කඨිනය අතුරන්නහු විසින් සඟළ සිවුරෙන් හෝ උතුරු සඟළින් හෝ අතුරු වසා සිවුරෙන් හෝ අතුළ යුත්තේය. මහා: පා: 288[31] ව්‍ය: 2705 ක: ව:7[43]**-අනන්තරා** (නා)= අනතුරක් නැතිව. දශවිධ අන්තරාවන්ගෙන් බාධාවක් නැතිව. 1 දශවිධ අන්තරාවන්ගෙන් අනතුරක් නැතිව සැකෙවින් පා මොක් උදෙසී නම් දුකුළා ය. 2 ආපත්ති පරිච්ඡේද වන එක් අඛණ්ඩක්. ගමන බාධක වූ රාජ චෝරාදීන් අන්තරාවක් නැතිව ආපත්ති ආරොචනය නො කෙළේ නම් ආපත්ති පරිච්ඡේද වේ. 3 මෙයින් අනතුරක් නැතිව පොහොය කරන දින භික්ෂූන් වසන ආරාමයක සිට භික්ෂූන් නැති ආරාමයකට යනු නොවටී. සෙසු තන්හි ද මෙසේ යෙදෙන පරිදි දැනගත්තේය. මෙහි අන්තරා නම් 1 රාජන්තරා 2 චෝර-3 අග්නි- 4 උදක- 5 මනුෂ්‍ය-5 අමනුෂ්‍ය-7වාළ 8 සිරිංසප- 9 ජීවිත- 10 බ්‍රහ්මචරිය අන්තරායන මේ දශයයි.

1 **රාජන්තරාය** නම්, භික්ෂූන් පොහෝ කරම් හයි රැස්ව හුන් කල්හි රජ ආයේ වී නම් මේ රාජන්තරාය නම්. 2 **චෝරන්තරාය** නම් පොහෝ කරම්හයි හුන් තැනට සොරහු අවු නම් මේ චෝරන්තරාය නම්. 3 **අග්නි අන්තරාය** නම් සෙනාසනය ගිනි ගත් නම් මේ අග්නි අන්තරාය නම්. 4 **උදක අන්තරාය** නම් පොහෝ කරම්හයි හුන් තැනට වතුරු ආයේ නම් හෝ වැසි නැඟි නම් හෝ මේ උදකන්තරාය නම්. 5 **මනුෂ්‍යන්තරාය** නම් බොහෝ මිනිස්සු අවු නම් මේ මනුෂ්‍යන්තරාය නම්. 6 **අමනුෂ්‍යන්තරාය** නම් භික්ෂූහු යකෙකු ගත මේ අමනුෂ්‍යන්තරාය නම්. 7 **වාළන්තරාය** නම් පොහෝ කරම්හයි හුන් තැනට ව්‍යාඝ්‍රාදී වූ වණ්ඩ මෘගයෝ අවු නම් මේ වාළන්තරාය නම්. 8 **සිරිංසපන්තරාය** නම් භික්ෂූන් සර්පාදීහු දෂ්ට කොළෝ නම් මේ සිරිංසපන්තරාය නම්. 9 **ජීවිතන්තරාය** නම් මහණ ගිලන් වී නම් හෝ මළේ නම් හෝ මරහු කැමැතිව ගනිත් නම් හෝ මේ ජීවිතන්තරාය නම්. 10 **බ්‍රහ්මචරියන්තරාය** නම් මිනිස්සු එක් භික්ෂුවක් හෝ බොහෝ භික්ෂූන් හෝ බ්‍රහ්මචරියාවෙන් චුත කරනු කැමැතිව ගනිත් නම් මේ බ්‍රහ්මචරියන්තරාය නම්: මේ සැකෙවින් පාමොක් දෙසීමට සමත් වන පරිදි දශවිධ අන්තරුන් අන්තරු වන අයුරු සි. මහා:පා: 121[25] -150[22] සං: පා:795[35] ක: ව්‍ය: 48[5] සි: ව:ව්‍ය:1091 කු: සි: ස: 13[24] ක: ව්‍ය: පි: 138[14] ස: ප: 698[5]. 699[20]. 795[35] **-අවුට්ඨිතපරිසා** (නා)= පිරිස නො නැඟිට සිටීම හැර=නැඟිට සිටියදී. පාරිවාසික පාරිශුද්ධිය දීමෙන් පොහෝ නොකළ යුතු අවස්ථාව. පිරිස නැඟිට සිටිය දී පාරිවාසික පාරිශුද්ධිය දීමෙන් පොහෝ නොකට යුතු. "ඉදං හි පාරිවාසිය පාරිසුද්ධි දුතියං නාම පරිසාය වුට්ඨිත කාලතොව පට්ඨාය න වට්ටති" සං: පා: 707[13]=795[11] මහා.පා: 152[23] ම: පා: සං: 418[15] 422[16] **-උත්තරාසඞ්ඝ** (නා) (උත්තර + ආ + √සඤ්ජ් + අ) =උතුරු සඟළ හැර. තනි පට සිවුර විනා. කඨිනය අතුළ හැකි තුන් සිවුරු වලින් එකක්. කඨිනය අතුරන්නහු විසින් සඟළ සිවුර, උතුරු සඟළ,

අතුරුවසා සිවුර යන මෙයින් එකකින් අතුළු යුතුය. මහා: පා: 288[30] චි: ච: 2705 කැ: ව: 74[3]

-උදක දන්තපොණා(නා) [සං. දන්ත පවන]= දිය සහ දෑහැටි දඬු හැර. භික්ෂු විභඞ්ගයේ මෙන් ම භික්ෂුණී විභඞ්ගයේ ද පණවා වදුළු දන්ත පොණ ශික්ෂාපදයේ අනුප්‍රඥප්තිය. අනුන් විසින් නොදී තමා කැමැති පරිදි නෙත දිය සහ දෑහැටි දඬු පරිභොග කරනු හැකිය. මේදෙක හැර අනුන් විසින් නොදුන් සෙසු දෑ පරිභොග කරන භික්ෂුවට ද, භික්ෂුණියට ද, පවිති ඇවැත් වේ. කැ:චි:115[9] සැ:පා:621[14],ප්‍රා: පු: ස: 56[1] චි:චි:ථි 241[6]. **-කපපා** (නා) [සං. කල්ප]= පැවිදිවූ තැනැත්තිය හැර. තීථීකයන් කෙරෙහි හෝ අන්‍ය භික්ෂුණීන් කෙරෙහි හෝ පළමුව පැවිදිව සිටි තැනැත්තිය හැර. භික්ෂුණී විභඞ්ගයෙහි චොදී ඵඨාපන දුතිය සඞ්ඝාදිසෙසයෙහි අනුප්‍රඥප්තිය. යම් භික්ෂුණී-යක් වධයට නිසි තැනැත්තිය දැන දැන රජහු හෝ භික්ෂුණී සඞ්ඝයා ආදීන් නො පිළිවිස උපසපන් කෙරේ නම් සඞ්ඝාදිශේෂ වේ. තීථීකයන් කෙරෙහි හෝ භික්ෂුණීන් කෙරෙහි පළමුව පැවිදිවූ තැනැත්තිය එසේ නො පිළිවිස උපසපන් කිරීමෙන් ඇවැත් නොවේ. ''අසඤ්ඤත්‍ර කපපා, සෙසු තැනම මනාවූ (මහණවූ?) කැප තැනැත්තිය තබා'' ප්‍රා:පු:ස: 12[12] කැ: චි: 164[5], පරි: පා: 223[1]|ස: පා: 678[1]

-චතුමපඤ්ඤාහා (නා)=සතර පස් දිනක් හැර. සතර පස් දිනක් ඉක්මවා. යම් මෙහෙණක් මෙහෙණකගේ නපුරු කොට ගෙත්තම් කළ සිවුරක් නොමෝ එහි මැහුම් මුදු හෝ මුදවා පසුව අනාතුරක් නැතිව එම සිවුර -ගෙත්තම් නොකරා නම් හෝ නො කරවා නම් පවිති වේ. ගෙත්තම් මිදූ දවස් පටන් සතර පස් දිනක් ඇතුළත ගෙත්තම් කිරීමෙන් ඇවැත් නො වේ. පාචි: පා: 269[29], ප්‍රා: පු: ස: 39[21] චි: චි: වී: 351[24], කැ: චි: 180[14]. **-තථාරූපප්ප චචයා** (නා)= සුදුසු කරුණක් නැතිව. යන්නට සුදුසු කරුණක් හැර. භික්ෂූන්ට හා භික්ෂුණීන්ට සාධාරණ උත්තරාධිකෘ ශික්ෂාපදයේ අනුප්‍රඥප්තිය. යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් ගම්න් යුදු පිණිස නික්මුණු සිවුරහ සෙනහ දක්නට යේ නම් පවිති වේ. ගිලනකුගේ ආරාධනයක් වැනි එබඳු සුදුසු කරුණක් ඇති කල ඇවැත් නැති. පාචි: පා: 105[36], කැ: චි: 118[36], ප්‍රා: පු: ස: 72[33]. **-නිරියංතරණා** (නා) =සරස යන නැව හැර. කාවාතිරුහන ශික්ෂා පදයෙහි අනුප්‍රඥප්තිය. යම් භික්ෂුවක් භික්ෂුණී යක හෝ බැණගෙන උඩු ගං හෝ යටි ගං යන නැවකට නැඟේ නම් පවිති වේ. යම් නැවක් සරස හෙවත් තොටට යේ නම් එහි ඇවැත් නැති. ''යා නිරියං තරණා, යම් නැවක් තොමෝ තොටට යේද'' ප්‍රා: පු: ස: 64[33], කැ: චි: 101[18], කැ: චි: පි: 78[10]. **-නිච්චපවාරණා** (නා)= නිත්‍යයෙන් පැවැරීම හැර, යාවජීව යෙන් පැවැරීම තබා. මහානාම ශික්ෂාපදයෙහි, 1 චාතුමාස පවචය පවාරණ, 2 අසඤ්ඤත්‍ර පුන පවාරණ. 3 අසඤ්ඤත්‍ර නිච්ච පවාරණ යනුවෙන් පවාරණ තුනක් දක්නේය. චාතුමාස පවචය පවාරණ නම්, සිව් මසක් සපපිනචනිතාදි හෙසජ්ජ පඤ්චකයෙන් පැවැරීමයි. අසඤ්ඤත්‍ර පුන පවාරණය නම්, නැවත සාරමසකට බෙහෙදින පැවැරීමයි. වදුළේ මැයි අට්ඨාතපත්තියෙහි ''තෙන හි ත්වං මහා නාම සඞ්ඝං අපරම්පි චාතුමාසං හෙසජ්ජේන පවාරෙහි'' යි. නිච්චපවාරණා නම් යාවජීව යෙන් සඞ්ඝයා බෙහෙදින් පැවැරීමයි. වදුළේ මැයි. ''තෙනහි ත්වං මහානාම සඞ්ඝං හෙස ජ්ජේන යාවජීවං පවාරෙහි'' යි. ප්‍රා:පු:ස:72[36] ප්‍ර: ච: 276[23], කැ: චි: 118[18], කැ: චි: පි: 91[32]. **-පඤ්චක** (නා)= පසකින් හෙවත් පස් මැඬිල්ලකින් තබා. සිවුරෙහි අඩුම මැඬිලි (=අතු) සඞ්ඛ්‍යාව. සිවුරෙහි අතු පසකට අඩු වූයේ නො වටී. ''එදින ම කඩකැපිම් සහිතව මහ මැඬිලි කුඩා මැඬිලි සහිතව අතු පසෙකින් යුක්තව හෝ පසෙකින් වැඩි කඩ අතු ඛෙදූ සිවුරෙකින්ද කඨිනය අතුරන ලද්දේ වේ.'' කැ: ව: 74[3], මහා: පා: 289[10], ස: පා: 824[15].

-පාරිවට්ටක(නා)(පරිවට්ට + ක)[සං.පරිවර්තික <පෘ: ප්‍රා: පරිවට්ටක< පිරිවට්ට< පිරුවට්ට<]= පෙරලි (මාරු) කර හැනීමක් නැතිව. අරළු කඩකුදු දී ගැන්මක් නැතිව. චීවර පරිභෝගාදී නිසගි පවිති ශික්ෂාපදයෙහි අනුප්‍රඥප්තිය. 1 යම් භික්ෂුවක් නො නෑ භික්ෂුණියක අතින් යටත් පිරිසෙයින් අරළු කඩකුදු දී ගැන්මක් නැතිව විකපුන් පොහොනා සිවුරක් පිළිනනී නම් නිසගි පවිති වේ. 2 යම් භික්ෂුවක් නො නෑ මෙහෙණකට පෙරලි කිරීමක් නැතිව සිවු

රක් දේ නම් පවිති වේ. "පරිවතෙතනතබබං පරිවටටං, පරිවටට මෙව පාරිවටටකං පරිවටෙවතබා දියමානං තං විනාති අතථො" ප්‍රා:පු: ස: 37[13], 63[31], ක: ච: 63[31–28], ච: ම: 157[30] ස: පං: 479[1]. **-පුගහලසස අසථාරා** (නා)= පුද්ගලයකුගේ ඇතිරීමක් විනා. කඨිනාසතරණ පුද්ගල නිදේශය. කඨිනය පුද්ගලයකුට විනා ගණයාට හෝ සඛසයාට ඇතිරිය නො හැක එය එක භික්ෂුවක් විසින්ම අතුළ යුතුය. මහා: පා:288[34], ස:පා: 824[19]. **-පුන පවාරණා** (නා) (ප + √වාර + යු=අණ + ආ)= නැවත පැවරීම හැර. "මෙහි පුන පවාරණ නම් නැවත සාර මසකට බෙහෙදින් පැවැරීමයි." ක: ච: 118[14] ක:ච:පි:91[32],(අසැසෙදුනු නිවව පවාරණා බලනු) **-පුබබ ගිහි සමාරමභා** (නා) (සං + ආ + √රභ + ණ + ආ)= භික්ෂුණීයකගේ පරිපාවනයට පෙර ගිහීන්ගේ පිළියෙල කිරීමක් නැති. පරිපාවන ශික්ෂාපදයෙහි අනුප්‍රඥප්තිය. යම් භික්ෂුවක් භික්ෂුණියක විසින් තමන්ගේ ශීලශ්‍රැතාදි ගුණ නො නෑ නොපැවැරූ කුල යනට කියා පිළියෙල කළ භොජනය දැන දැන වළඳ නම් පවිති වේ. ඉදින් භික්ෂුණියගේ පරිපාවනයට (=සැපසීමට) පළමුව ගිහින් විසින් සැපයූ භොජනය නම් ඇවැත් නැති. ප්‍රා: පු: ස: 65[16], ක: ච: 101[31]; ක: ච: පි: 78[25], ප්‍රා: ව: 239[20]. **-භික්ඛු සම්මුති** (නා) (සං + √මන + ති)= සඛස සම්මතයක් නැතිව. සඛසයාගේ නියමයක් නැතිව. 1 නිසසගිය පාචිතතිය උදෙදසයෙහි උදෙදාසිත ශික්ෂාපද යෙහි ද, 2 එනිම ඡබබසස ශික්ෂා පදයෙහි සහ 3 සාසඛස ශික්ෂාපදයෙහි ද, 4 දුබ්භුලලාරොචන ශික්ෂාපදයෙහි ද අනුප්‍රඥප්තිය. 1 කොට නිම වූ සිවුරු ඇති, කඨිනය උඛ්ධරණය කළ භික්ෂුව තුන් සිවුරෙන් වෙන්ව එක් රැයකුදු වෙසේ නම් උදෙදාසිත ශික්ෂාපදයන් නිසඟි පවිති වේ. 2 නව සන්තතයක් කරවා ගත් භික්ෂුව සවසක් එය වැළඳ ගත යුතුය. ඒ සන්තතය අනිකකුගට දී සවස ඇතුළත නව සන්ථතයක් කරවා නම් ඡබබසස ශික්ෂාපදයෙන් නිසඟි පවිති වේ. 3 පෙර වස්වැස පවාරණය කළ භික්ෂුවක් අරණ්‍යයෙහි සෙනසුන්හි බිය දක්නේ තම තුන් සිවුරු සොරුන්ගෙන් රැක ගනු කැමැත්තේ නම් ඒ තුන් සිවුරන් එක් සිවුරක් අනතරඝරයෙහි (හාත්පස ගොවර ග්‍රාමයෙහි)තබනු හැක්කේය. යම්කිසි කටයුත්තක් උදෙසා ග්‍රාමාන්තරයට යනු කැමැත්තේ සරුයක් පමණ කල් ඒ සිවුරෙන් වෙන ව වසනු හැක්කේය. එසින් ඔබ්බෙහි විසුව සාසඛක ශික්ෂාපදයෙන් නිසඟි පවිති වේ. 4 යම් භික්ෂුවක් පරිජි නො අවන් භික්ෂුවකගේ සඛසා දිශෙෂා පත්තියක් වසනු සහිතව අනු පසම්පන්නයකුගට කියා නම් දුට්ඨුල්ලාරොචන ශික්ෂා දයෙන් පවිති ඇවැත් වේ. මේ සියලු තන්හි සඛස සම්මුතියක් ලද්දේ නම් ඇවැත් නැති. ප්‍රා: පු: ස: 35[27] 46[18] 54[32] 57[29] ක: ච: 58[14] 70[2] 81[24] **=භික්ඛු භිසම්මුති** (නා)=භික්ෂුණී සඛසයාගේ සම්මුතියක් නැතිව-මාගම් සතුන්ගේ නියමයක් තබා. භික්ෂු විභඞග-යෙහි උදෙදාසිත ශික්ෂාපදය සහ දුබ්භුල්ලා රොචන ශික්ෂාපදය ද, භික්ෂුණී විභඞගයෙහි සාධාරණය. ප්‍රා: පු: ස: 28[12–54][2] (අසැසෙදුනු භික්ඛු සම්මුති බලනු) **-භිසැසෙදුනා ඉතථි විඝහ ගහණ** (නා) = යම් භික්ෂුණියක් නුවණැති සත්‍රියක නැතිව පුරුෂයකුට පස් පදයකින් හෝ සපදයකින් අධික ධර්මය දෙශනා කෙරේ නම් පවිති වේ. සියල්ල භික්ෂු විභඞගය හා සාධාරණ වේ. ප්‍රා: පු: ස: 53[12]-**භිසැසෙදුනා පුරිස විඝහ ගහණ** (නා)=නුවණැති පුරුෂයකු හැර. "කටයුතු නො කටයුතු දන්නා ශ්‍රවණොප චාරයෙහි සිටි මිනිස් පිරිමිනියකු නැතිව" භික්ෂු විභඞගයෙහි ධර්මදෙසනා ශික්ෂාපදයෙහි අනුප්‍රඥප්තිය. යම් භික්ෂුවක් මිනිස් මාගම කට පස්පදයකින් හෝ සපදයකින් අධික වූ ධර්මය දෙශනා කෙරේ නම් පවිති වේ. ඉදින් ශ්‍රවණොපචාරයෙහි කටයුතු නො කටයුතු දන්නා පුරුෂයකු ඇත්තේ නම් ඇවැත් නැති: ක: ච: 85[33–86][6] ක: ච: පි: 62[24] **-සඛස සාමගහි** (නා) =සඛසයාගේ සාමීචිය හැර. අනුපොසථයෙහි පොහොය කළහැකි පිළිවෙළ. කොසඹක භික්ෂූන් මෙන් බිඳුණු සඛසයා සමගිවීමෙන් පසු දින නියමයක් නොබලා "සුණාතු මෙ භනෙතා සඞඝා අජ්ජු පොසථො සාමගහි" යනු කියා අනුපොසථයෙහි වුව ද, පොහොය කටයුතු. සවලප මාතු දෙෂයකින් බිඳී සිටියවුන් සමගිවූ කල ඔවුන් සමගි පොහොය නො කොට උපොසථ දින ම පොහොය කළ යුත්තේය. සමගි පොහොයට දින නියමයක් නැති. එබඳු සඛස සාමීචියකදී

විනය කොෂය

නමො තසස භගවතො අරහතො සමම සම්බුද්ධසස.

අ

අංස (නා) [සං. අංස]= 1 දසරුව, උරස,උරහිස. "අංසෙ, දසුරුයෙනි" කැ: ව්: පි: 47[34] සැ: පා: 476 [20] "එකංසං චීවරං කත්වාන වාමංසං පාරුපිත්වා" ව්: ලැ: 264[30] සු: නි: අ: ට031 2. භාගය, කොටස. ව්: ව්: 3084. අ: ප: ස: 66 [5] **-භාගව** (නා)=අංසයෙහි පෙරවන සිවුර. ව්:ව් පි: 33[10] **-කූට** (නා) [සං. අංසකූට]=දසරුව උරහිස. "ඒසු අංසකූටෙසු, දෙ දසරුයෙහි හෙවත් දෙවුරයෙහි" කැ:ව්: පි: 124[26] ව්: ලැ: 76 [29] සැ: පා: 4739 **-බද්ධක** (නා) [සං. අංස බද්ධ + ක]= අංස බද්ධකය. අංසයෙහි බඳින පටිය සැ: පා: 939[20] (අංසවද්ධකසි ද දක්නේය) **-බන්ධක**(නා) අංස බද්ධක බලනු. ව්: ලැ: 28[23] **-භණ්ඩික**(නා)(අංස + භණ්ඩ + ඉක) [සං.අංස භාණ්ඩ] = අංසයෙහි ලූ පොදිය. උරෙහි (කදෙහි) තුබූ සහල සිවුර නෙත දෙකෙළවුර ගැට ගසා හසුන්වැක්මෙන් කොට එහි මල් දමත්ද, මේ අංස භණ්ඩික නමි. සැ: පා: 447' ව්: ලැ: 52[13] ව්: ව්: පි: 251[2] සාර: දි: 711[2] **-වට්ටක** (නා) (අංසවට්ට + ක) [සං. අංස වෘත්ත]= අස්වටු. අදුන්එවිකය එල්ලා ගන්නා පටිය. සැ: පා: 477[34] 479[12] 498[17] 810[23] "අංස වට්ට නමී පාතු පටිය යි" සි: ව: ව්: 113[21] **-වද්ධක** (නා)= > අස්වදු. සි: ව: ව්. 113[21] අංසයෙහි බඳින පටිය. අදුන් එවිකය හෝ පාතු පසුම්බිය හෝ බලගුව එල්ලා ගනු පිණිස අංසයෙහි බඳින පටිය. "අනුජානාමී භික්ඛවෙ අංසවද්ධකං බන්ධන සුත්තං" චූ: පා: B. 652[15] 662[5] සැ: පා: 939[20] (අංස බද්ධක බලනු)

අකට (නා) (න + √කර + ත) [සං. අකෘත]- නොකළ. අහිනව. "අකට විසමුට්ඨානං, අහිනව වූ සමුට්ඨාන දෙකක් ඇත්තේ" කැ: ව්: පි: 154[27] -'**අනුඛම්ම** (ව + ෘ=ව) (නා) (න + කට + අනු ධම්ම) = නොකළ අනු ධර්මය ඇති. අවසාරණ කර්මය නොකළ. ඔසාරණ කර්මය නොකරන ලද භික්ෂුව. මෙහි අනු ධර්මය නම්; ඔසාරණ කර්මයයි. එනම්; අවන් ඇවැත් නොදැක්මෙන් හෝ ඇවැතට සුදුසු පිළියම් නොකිරීමෙන් හෝ පාපීවූ දෘෂ්ටිය නොහැරීමෙන් හෝ උත්ක්ෂෙපනීය කර්මය කරනු ලැබේ. එබඳු උත්ක්ෂෙපනීය කර්මය කරනු ලැබුවකුට උපසම්පදා කිරීම් නිසදීම ආදී අවලොස් වතක් නුසුදුසු වේ. ඒ අවලොස් වතට අනුලොම්ව පවත්නා බැව් දුටුව හොත් උත්ක්ෂෙපනීය කර්මය ඔසාරණය (=ඉවත්) කරනු ලැබේ. එසේ ඔසාරණය නොකරන ලද්දේ අකටානු ධම්ම නම් වේ." "නැවත සංඝයා විසින් ඇතුළත්කර නොගත්" ප්‍රා: ව: 3086 සැ: පා: 644[34] කැ: ව්: 1292 චිත: ම: 244[21] පරි: පා: ගැ:5[29] අකතානු ධම්මසීද දක්නේය.) (අව්කාරසවත්ත බලනු.) සාර: දි: 714[19] **-පඩිභාර** (නා) සං, ප්‍රාච් + භාර=ප්‍රාග්භාර]= 1 ඉදිරියට කදු මුදුන නැමුණු සවාභාවික පළඟ 2 බෙහෙවින් තුඩස් හටගන්නා තැන් 3 සවාභාවික පළඟ සැ: පා: 551[35] ව්: ව්: පි: 301[16] ව්: ව්: 962 (අට්ටක පඩිභාරසි ද දක්නේය. ව්: ව්: සැ: 962) (අකත පඩිභාර බලනු) **-භණ්ඩ** (නා) [සං, භාණ්ඩ] = නොසළ බඩු. (එළක ලොම ශික්ෂාපදයෙහි දක්නා පරිදි) එළ ලොමින් නොකළ කම්බිලි කොදු පලස් ආදි බඩු. සාර: ම: 9717 (අකත භණ්ඩ බලනු.) **-භාග** (නා) = ආගන්තුක භාගය. මිහිරි හඬින් අනුමෝදනා කරන භික්ෂුවකගේ අනුමෝදනා බණ අසා පහන්වූ සැදැහැතියන් විසින් දෙන ලද ශ්‍රමණ පරිෂ්කාර. සියලු භික්ෂූන්ට සාධාරණ පිරිකර. නුදුන් පූජා භාගය. සැ: පා: 942[14] ව්: ව්: පි: 472[2] **-යුග** (නා) [සං. යුග] නොසැම්බු මුංයුගය. ව්: ව්: පි: 430[24] මහා: ගැ: 53[26] **-වත්ථු** (නා) [සං. වස්තු] නො කළ කරුණු

ළමුළුව නො කළ වැරැදි. ''තෙ අකට වත්ථුං උපපාදෙන්ති පඤ්ඤත්ත සික්ඛාපදං පන න මඤ්ඤන්ති'' සං: පා: 443[22] සං: දී: 707[17] **-විඤ්ඤත්ති** (නා) (වි + √ඤ්ඤ + ති) [සං. විඥප්ති]= නොනෑ නො පැවැරුවන් කෙරෙහි වින විම ඔවුන්ට දන්වා ඉල්ලා ගැනීම. **නොනෑයෝ** නම්; දෙටු සොහොයුරු සොහොයුරි, කනිටු සොහොයුරු සොහොයුරි, සුලු පියා මහපියා සුලුමව, මහම්ව, සහ නැදිමසිල් ඇත දසදෙනා ද, මේ දසදෙනාගේ සත් කුල පරම්පරාවත නැයන් හැර සෙසු ලොකයා සි. **නොපැවැරුවෝ** නම්; ''වද භන්තෙ පව්වයෙන'' ඇතැදින් ''සාමිනි සිව්පසයෙන් උවමනාවක් ඇතිකල මට දැන්වුව මැනැවැ සි සාමාන්‍ය ප්‍රත්‍යය නාමයෙන් හෝ සිවුරෙන් ප්‍රයෝජන ඇතිකල මට දැන්වුව මැනැවැයි යනාදින් විශෙෂ ප්‍රත්‍යය නාමයෙන් දිවිනිම් කොට හෝ දින-මාස-අවුරුදු වශයෙන් කාල පරිවෙශ්ද කොට හෝ කප්පිය[1]කාරක නො වූවෝ සි. ක: වි: පි: 55[28] නි: ශි: 65[16] සං: පා: 476[16] (අඤ්ඤතිකා බලනු.)

අකඨින (නා) (න + කඨින)= කඨිනය නොවූ. කඨින චිවරය නොවන ''දුයක දුනයට පෙර කත චිවරය සමප්පත්ත කඨිනඤ්ච නොව විපන්න කඨිනයක් හෙයින්ම අකඨින වේ.'' (?) කඨි: ව: 114[7]

අකත (නා) (න √කර + ත) [සං. අකෘත]= නො කළ, නොකරන ලද. අමිශ්‍රව, අනිත්‍යව. චූ: පා: B. 668[7] පරි: පා: ගැ: 914 වි: වි: ටී: 486[7] **-'නතිරිත්ත** (න + අ=භා) (නා) [සං. අනතිරික්ත]= ඉතිරි නොකළ. පවාරණය කෙට ඉතිරි නොකළ හොජනය (අනතිරිත්ත බුත්තු.) සං: පා: 986[18] **-'අනුඛම්ම** (න + අ=නා) (නා)= ඔසාරණ කම්ම නොකළ. උක්ඛිත්තක භික්ෂුව වෙත භික්ෂූන්ට් අනුකූල පැවැතුම් දැක සඞ්ඝයා විසින් කරනු ලබන කම්ම අනු ධම්ම නෙවත් ඔසාරණ නම්. එය නොකළ. චින: ම: 214[21] (අකටානු ධම්ම · බලනු) **-කල්‍යාණ** (නා)= යහපතක් නොකළ. නො කළ යහපත ඇති. චූ: පා: B 676[8] **-කිබ්බිස** (නා) [සං. කිල්බිෂ]= සාහසික කම් නො කළ. ලොභාදි කෙලෙස්වන්නෙන් උත්සන්නව සාහසික ක්‍රියා නොකළ සං: පා: 312[14] **-චීවර** (නා)= නො කළ යවුර. සිවුරු පිළි. කසිනු **කුඨාර මාසිකා නිදෙසවාරයෙහි කත** චීවරං-චීවරං-විප්පකත චීවරං යි සිවුරු තුනක් වදළහ. එහි කතචීවරය නම්; **කඩ** කැපීම් මැසීම් ආදී පරිකම් නිමකළ සිවුරයි. චීවරය නම්; අකත චීවරයයි, හෙවත් සිවුරු පිළියයි. විප්ප කත චීවරය නම්; පරිකම් කොට අඩාළවූ සිවුරයි'' කසි: ව: 108[20] **-ඤ්ඤු** (නා) න + කඨ + √ඤ්ඤා + රූ=ඵ්ඵ) =අකෘතඥ. කළ දෙය නොදන්. කළ ඵපකාර නොදන්නා. මනෝ: සූ: 312[2] – ං භූ=කළු ඵපකාර නොදත් බව **-පච්චුද්ධාර** (නා) පති + ඵ + √ධර...ණ) =ඉනා පසුදුළ. චීවර ප්‍රතිග්‍රාහකයා විසින් පච්චුද්ධරණය නොකළ. පෙරළා අසිනිය අත් නොහළ. 'අඤ්ඤත පච්චුද්ධාරං, චීවර ප්‍රතිග්‍රාහකයා විසින් නො පසුදුළ හොත්'' ''මඤ්ඤං සන්ඨකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙතිවාති ආදිනා නයෙන අකත පච්චුද්ධාරං'' සාර: දී: 861[13] කං: වි: ප: 96[21] චින: ම: 240[19] **-පටිඤ්ඤම්ම** (නා) (පටි + √කර + ම්ම)=පිළියම් නොකළ.ඇවැතට පැමිණ අවත් ඇවතින් නැගී සිටිනු සඳහා යථා ධම්මයෙන් පිළියම් නො කළ. අපිරිසුදු සිල් ඇත්තහුගේ ලක්ඛණයක්. වි: මා: සං: 435 **-පභාර** (නා) අකට පඵභාර බලනු. වි: වි: 162 **-පවාරිත** (නා) (ප + √වාර + ඉ + ත) = පවාරණය නොකරන ලද, පැවැරීමක් නොකළ, යාවදත් පවාරණයෙන් හෝ පවාය පවාරණයෙන් නොපවරණ ලද ''වස්සං වුත්ථ පවාරණ පවාය පවාරණ යාවදත් පවාරණ පටික්ඛිප පවාරණයි පවාරණාය සිවු වැදෑරුම් වේ ''අනු ජානාමි භික්ඛවෙ වස්සං වුත්ථානං භික්ඛූනං තීහි යානෙහි පවාරෙතුං'' යනු වස්සං වුත්ථ පවාරණයයි. ''ඉච්ඡාමහං භන්තෙ සඞ්ඝං චාතුමාසිනිං ඵෙහසඵේජනා පවාරෙතුං'' 'අත්ථඤ්ච පුනපවාරණාය අත්ථඤ්ච නිච්ච පවාරණාය'' යනු පවත්‍ය පවාරණයි. ''පව ටිඨො නාම අසනං පඤ්ඤපෙති. භොජනං පඤ්ඤපෙති හත්ථ පාසෙ ඨිතා අභිහරති පටික්ඛිපො පඤ්ඤපෙති'' යනු පටික්ඛිප පවාරණයි. 'පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්ත පෙසි ඵමපවාරෙසි'' යනු යාවදත් පවාරණයි වි: ලැ: 38[33] (අකට විඤ්ඤත්ති බලනු) **-ඵස** (නා) පව් නොකළ. නොකළ ලාමක ක්‍රියා ඇති. සං: පා: 312[12] **-භාණ** (නා)= කුදුන්

පූර්ව භාගය. වි: ල: 310[25] (අකට භාග බලනු) **-මල්ලක** (නා) [සං. මල්ලක?]= දැති නොසුන් මුල්ලකය? එනම් උපකරණය. "මල්ලක නම් මුවර දත් සිද කෙළමලාමුල සටහණින් වටව කළ මල්ලක යයි කියනු ලැබේ." කු: සි: ස: 59[24] "අකතමල්ලකං නාම් දනෙත අච්ඡින්දිත්වා කතං" ස: පා: 888[9] වි: වි: ටී: 456[19] **-ලුද්ද** (නා) [සං, රෞද්ර > පා. රුද්ද > ලුද්ද)= දරුණු ක්‍රියා නොකළ. දරුණු දුශ්ශීල ක්‍රියා නොකළ ස: පා: 312[13]. **-විඝාසූදනති** (නා)= නොනැ නොපැවැරූවන් **කරෙහි** විනවිම. වි:ල: 38[27] (අකටවිඝාසූදනති බලනු) **-විහාර** (නා)= බොසි චෛත්‍යාදිය නැති විහාරය. එබඳු විහාරයක සීමාවක් බඳින සඞ්ඝයා විසින් බොධි චෛත්‍යාදියටද, තැන් බලා විහාර කෙළවර විවෙක සථානයක බැන්දසුතු. ස: පා: 777[31] **-වෙදි**(න + කත + √විද + ඊ)= අකෘත වේදියා. කළ උපකාර ප්‍රකටව නොදන්නා- ං= නා කළ උපකාර ප්‍රකටව නොදත් බව. මනෝ: පූ: 123 **-සහාය** (නා)= සහාය නැති. සමාන සංවාසක නම් වූ සහාය නැති. මෙහි සංවාස නම්, 'එත්ථ න වත්ථං එකුදෙසෝ සමසිකඛතා" යනුවෙන් දක්නා ත්‍රිවිධ සංවාස යති. එනම්; එක කම් සංවාස, එකුදෙස සංවාස, සම සි ඛතා සංවාස යන තුනයි. එයින් අපලොකනාදි චතුර්විධ සඞ්ඝකර්ම සමානවඡ්ඡුයෙන් කළ යුතු බැවින් සඞ්ඝ කම් වශයෙන් එක්ව විසීම නම් වූ එක කම් සංවාස වේ. පස්වැදෑරුම් ප්‍රාතිමොක්ෂොද්දෙශයන් එක්ව උදෙසීය යුතු බැවින් උදෙස වශයෙන් එක්ව විසීම නම් වූ එකුදෙස සංවාසය වේ. සියලුම සිකපද ලජ්ජී භික්ෂූන් විසිවා සමව **ශික්ෂිය යුතු** බැවින් භික්ෂූ වශයෙන් **එක්ව විසීම** නම් වූ සමසිකඛතා සංවාසය වේ. මේ ත්‍රිවිධ සංවාසය ඇත්තෝ සහායයෝ නම් **වෙත්.** උත්ක්ෂෙපනීය කර්මයකළ භික්ෂුව සමග මේ සමාන සංවාස නම් වූ සහාය නැති බැවින් එබඳු භික්ෂුව අකත සහාය නම් වේ. "සමාන සංවාසකා වුච්චන්ති සහයා. සෙතෙහි සඳ්ධිං නත්ථි තෙන වුච්චති අකත සහායොති" ස: පා: 673[10] ම: පා: සු: 450[28]$_B$

අකතන (නා) (න + √කතූ + නන)= **කාතන නොවූ,** අප්‍රිය, අමනාප. පටි: පා: නැ: 32[25]

අකපකත (නා) (න + කපකත)= **කප් බිඳූ** නොනඹන ලද, කප් බිඳූ නොදෙන ලදසිවුර අනඤ්ඤ කඨිනයෙහි සූවීසි විපත්තීන්ගෙන් එකක් නව චීවර ලාභ පරිභොගයෙහි පවතී ඇවැත් සිදුවන අඛය. හඳනට පොරෝනට නිසි අළුත් සිවුරු ලත් භික්ෂුව විසින් සිවුර මනාව රඳා සිවු කොණෙහිම හෝ තුන් කොණක දෙකොණක එක් කොණක හෝ කංසනීල පාසනීල කඳිම යන මෙයින් එක කින් මොනර ඇසෙහි කෘෂ්ණ මණ්ඩලය පමණ හෝ මකුණු පිටක් පමණට මණ්ඩලාකාරයෙන් දුවිණි කවයුත්තේය. මේ කපප කත නම්. මෙසේ නොවූයේ අකපපකත නම්. මෙහි **කංසනීල** නම්; ලොහොමල සි **පාසන නීල** නම්; යම් කිසි පත්‍ර විශෙෂයක නිල වණ්ණ යසි. කඳිම නම් මැටිසි. ක: වි: පි: 96 6-[10] ක: වි: 123[17] ස: පා: 824[12] පරි: පා: ගැ: 46[22]

අකපපිය 1(නා) (න + කපප + ඉය)[සං. අකප්‍ය]= නොකැපවූ කැප නැති. භික්ෂූන්ට නොවටිනා, ශ්‍රමණ සාරුප්‍ය නොවූ. ස: පා: 152[32]

අකපපිය 2 (නා)=කැප නොකළ. භික්ෂූන්ට සුදුසු පරිදි පස්වැදෑරුම් කැපයෙන් කැප නොකළ. නඛය, අගහිය, සත්ථය, නීඛබවඛිජය, අඛිජය යන පස් සමණ කැපයෙන් කැප නොකළ දෙයද, අකැප මස් හා අකැප බොජුන් යන මේ සියල්ල අකප්පිය නම්. ක: වි: 108[9] ස: පා: 610[26] 986[16] (අකප්පියකත බලනු) **-අම්බ**(නා) (√අට + අ) [සං. අම්ල]= දැසි දස් වැව් ආදිය උදෙසා කරන කලහ ය. ස: පා: 677[6] වි: වි: ටී: 348[3] සාර: දී: 890[15] **-උදක** (නා)= කැපනැති දිය. නොකැප ජලය. අකප්පිය උදක නම් පණුවන් සහිත ජලය හි. "කතමං අකප්පිය උදකං කතමං පන කප්පිය උදකන්ති? සපාණකං අකප්පිය උදකං. අපාණකං කප්පිය උදකන්ති" වි: ල: 493[1] වි: වි: 458 **-භත** (නා)කැප නොකළ. අනතිරිත්ත භොජනයෙහි එක් අඛයක්. සප්ත විධ විනය කර්ම කර(=කම්) යන්ගෙන් එකක්. පස් සමණ කැපයෙන් කැප නොකළ දෙය ද, අකැප මස් හා අකැප බොජුන්ද යන මේ සියල්ල අකප්පිය නම්. ඒ අකැප දෑය "අලමෙතං සබ්බං"යි මෙසේ කැප නොකරන ලද්දේ අකප්පිය කත නම්.

සි: පා: 6¦10[24] චි: ල: 156[26] සාර: දී: 843[24] කැ: ච්: 1086 (අකප්පිය සහඅනතිරිත්තබලනු) **-කුටි** (නා) [සං. කුටි]= කැප නැති කිළිය සංඝයාට හෝ උපසපන් භික්ෂුවට හෝ සතුව වසනු පිණිස කළගෙය. "අකප්පිය කුටි නාම සඞ්ඝස්ස වා උපසම්පන්න පුග්ගලස්ස වා සන්තකං වසනත්ථාය කත ගෙහං" "සඟහුගෙ එවු පැවිදි කෙනෙකුන්ගෙ එවු අයත් ලන්නට කළ සහසෙය්‍ය පොහොනා සෙනසුන් අඝ පකිළි නම්" කැ: ච්: 111[29] සි: ව: චි: 52[35] ච්: ල: 143[30] **-චම්ම** (නා) [සං. චර්ම්]= කැප නැති සම්. මුව, එළු, හිරෙළු ගන මොවුන් ගේ සම් හැර සෙසු සම්. අකැප සම් ඇඳ පුටු ආදියෙහි අතුට හිඳීනට නො වටී. එබැවින් උපාහණ දෙක්හී මිනිස් සම් පමණක් අකැප වේ. "අට්ඨ කථාසු හි සෙනාසන පරිභොගෙ පටික්ඛිත්ත චම්මං නාම නදිස්සති" "මිනිස් සම් තබා සෙසු සම් සෙනසුන් අයත්වූව වටී. එහෙත් කසුවහන් ආදියට ප්‍රි වටී."කු: සි:ස; 61[11] සැ:පා: 1671[13] සි: ව: චි: 62[12] චි: චි: 2650 සාර: දී: 808[22] **-චීවර** (නා)=කැප නැති සිවුරු. හඳනට පොරෝනට නො කැප සිවුරු. කුස චීවර, වාක චීවර, ඵලක චීවර, ඒකසකම්බල, වාලකම්බල, උලූක පක්ඛ. අජිනක්ඛිප අක්කතාළ ගන අට වැදෑරුම් සිවුරු ද, කෙහෙල් වැහැරියෙන් සහ එරු පත් හුයින් කළ සිවුරු ද, හැම නිල්වන් හැම මදටවන්, හැම රන්වන්, හැම ලේවන්, හැම සළුවන්, පිළි ද, රත්වායන් පිට සේ, තුනු පියුම්පෙති පැහැසේ රදන් කළ පිළි ද, ටිවිසුඛුළු, දහ නොසිදු පිළි, මැදින් කැපූ දික් දහ ඇති පිළි, යන මේ සියල්ල අකප්පිය චීවර නම්. කු: සි: ස: 22[24] සි: ව: ච්: 59[23] ච්: චි: 596- 599. **-තණන වාය** (නා) [සං, තනතුවාය]= කැප නැති පෙහෙරා, තමා විනවීමෙන් ලද, නො නෑ, නො පැවැරූ පෙහෙරා. සි: පා: 527[14] **-මූල** (නා)= නො කැප වූ පුලුන්. රුක්ඛතුල, ලතාතුල පොක්ඛරතුල යන තුන් වැදෑරුම් පුලුන් කපපිය තුලයෝ නම් වෙත්. ඒ සු පුලුන් අකපපිය තුල නම්. මෙහි රුක්ඛතුල නම්, ඉඹුල් ආදී ගස්වලින් ලබා ගන්නා පුලුන්ය. ලතාතුල නම්, කිරි වැල් ආදී වැල් වලින් ලබාගන්නා පුලුන්ය. පොක්ඛරතුල නම්, උක් බට ආදියෙන් ලබාගන්නා පුලුන්ද ඇතුළුව යම්කිසි තෘණ විශේෂයක් පිළිබඳ පුලුන්ය. භූතගාම නම් වූ වෘක්ෂලතා තෘණ යන් අතුරෙන් කවරක් හෝ පිළිබඳ පුලුන් බිමබොහන සඳහා වටනේය. බිබි පිණිස ඒ සියල්ල නො වටී. බිමබොහනයෙහි මේ පුලුන් පමණක් නොව හංස මයූර ආදී සියලු පක්ෂීන් ගේ හා සිංහාදී සියලු සිවුපාවුන්ගේ ලොම්ද කැප වේ. කු: සි: ස: 571[31] චි: ල: 384[20] චි: චි: 2832 **-ථාල** (නා)= කැප නැති තලු "දඩුමුවා, රන්මුවා, රිදීමුවා, ඉඳුනිල්මිණිමුවා, වෙරළුමිණිමුවා තලුඅකැපයි." කු: සි: ස: 271[28] **-පච්චත්තරණ** (නා)= (පති + අත්ථරණ) [සං ප්‍රත්‍යාස්තරණ]=තනාකැප පසතුරුණු.කථිස්ස කොසෙය්‍ය, කාදලිමිග පවර පච්චත්ථරණ යනාදියයි. පසතුරුණු නම් ඇතිරි උඩ අතුරන ගෙත්තම් කළ ඇතිරිය. සි: ප: 808[10] චි: චි: 2662 සි: ව: චි: 62[12] **-පත්ත** (නා) [සං. පාත්‍ර]= කැප නැති පාත්‍ර. නිස්සීමාවට [නුසුදුසු පාත්‍ර. "දඩුමුවා රිදීමුවා රන්මුවා ඉඳුනිල් මිණිමුවා වෙරළු මිණිමුවා පාත්‍රයෝ ද, කස්ලෝ (=පිත්තල) කදු (=විදුරු) හෙළතුඹ (=සුදු ඊයම්) කළු තුඹ (=කළු ඊයම්) පිළිවහණ (=පළිඟු) සඳ සහ ලොහ පාත්‍රයෝ ද, මිනිහිස් කබල් මුවා පාත්‍රය ද, සළු තබලින් සහ ලබු කබලින් කළ පාත්‍ර ද යන මේ සියල්ල අකැප පාත්‍රයෝ වෙති "යවණීමයාදී අකැප පාත්‍ර එකොළොසක් තහනම් කරන ලදහ"නි: ශී: 313[33] "එකාදසවිධෝ පත්තො වුත්තපාඨා දූකකාට වත්තුකොං:: චි: චි: 751 සි: ව: ච්: 775 කු: සි: ස: 26[25] **-පත්ත චතුක්ක** (නා)= අකප්ප පාත්‍ර චතුෂ්කය රූපිය සංවොහාර ශික්ෂාපද වණ්ණනාවෙහිදී රූපිය සංවොහාරයාගේ (=රන්රිදී බඩු කහවණු ගනුදෙනුවෙහි) ගරුභාවය (-බැරෑරුම් බව) දැක්වීමට නිදර්ශන කළ කැප නැති පාත්‍ර සතර.

1. යො හි රූපියං උග්ගණ්හිත්වා තෙන අය බීජං සමුට්ඨාපෙති, තං කොට්ටාපෙත්වා තෙන ලොහෙන පත්තං කාරෙති අයං පත්තො මහා අකප්පියො නාම න සක්කා කෙනචි උපා යෙන කප්පියං කාතුං.

2. යො පන රූපියං උග්ගණ්හිත්වා තෙන පත්තං කිණාති අයම්පි පත්තො අකප්පියො,

3 යොපි රූපියං උග්ගණ්හාපෙත්වා කප්පිය කාරකෙන සද්ධිං කම්මාරකුලං ගන්ත්වා පත්තං දිසවා අයං මය්හං රූව්වතීති වදති, කප්පිය කාරකො ච තං රූපියං දත්වා කම්මාරං සඤ්ඤාපෙති අයං පත්තො කප්පිය වොහාරෙන ගහිතොපි දුතිය පත්ත සදිසො යෙව මූලස්ස සඤ්ඤාපිවිජිතත්තා අකප්පියො.

4 යො පන රූපියං අසම්පට්විජිත්වා ථෙරස්ස පත්තං කිණිත්වා දෙතිනි පහිත කප්පිය කාර කෙන සද්ධිං කම්මාර කුලං ගන්ත්වා පත්තං දිසවා ඉමෙ කහාපණ ගහෙත්වා ඉමං දෙතීති කහාපණෙ දත්වා ගහිතො අයං පත්තො එතසෙව නිකඛුනො නවවටති දුක්ඛිවාරිත ත්තා, අඤ්ඤසං පන වට්ටති, මූලස්ස අසම් පට්විජිතත්තා" -පෙ- ඉදං අකප්පිය පත්ත වත්තුකකං. ස: පා: 506[24] -පවාරණ (නා) [සං. ප්‍රවාරණ] කැපනැති පවාරණය. නුසුදුසු අයුරින් කළ ආරාධනය. භොජන වර්ගයෙහි විතීය ගණ භොජන ශික්ෂා පදයෙහි සඳහන් පවාරණය.

"භික්ෂූන් සතරනමක් වඤ්ඤ තැනට යම්කිසි දායකයකු එළඹ "භූතමෙතං භන්තෙ ඔදනෙන නිමන්තෙමි. ඔදනං මෙ ගණ්හථ ආකඞ්ඛථ ඔලොකෙථ අධිවාසෙථ පතිමානෙථ" යනු වෙන් ස්වාමීනි! ඔබවහන්සේලාට ඔදනයෙන් පවරමි මාගේ ඔදනය ගත්ත මැනව කැමැති වනු මැනව, බලාපොරොත්තුවූව මැනව, ඉව සුව මැනව, සැලකුව මැනවැයි මෙසේ යම්කිසි වචනයකින් පස් වැදෑරුම් භොජනයන් (=බත් අග්ගලා කොමුපිඩු ගොඩමස් දියමස්) අතු රෙන් යම්කිසි නමක් ගෙන පැවැරීම හෝ ආකූ ද්‍රව්‍යාදි කිසියම් භාෂාවකින් කරන නිම න්ත්‍රණය"

"ඔදනයට භත්තය අන්නය ආහාරය යනාදි පරියාය වචනයකින් හෝ මේ පඤ්චවිධ භොජ නයැ සඞ්කිය නාමය අකප්පිය ය"

"මගධ වචනයෙන් පිටත් සිහල දම්ළාදී වච නාන්තරයකින් වේවයි මෙසේ අකප්පිය පවා රණයෙන්" කැ: වි: 103[8] කැ: වී: පි: 79[34] 80[1-4] ස:පා:597[6] -භණ්ඩ (නා) [සං. භාණ්ඩ] =කැපනැති බඩු, සවණ්ණාදිය. ං -පරිවත්තන= (නා) කැප නැති බඩු පෙරළී කිරීම, නොකැප බඩු ගනුදෙනු කිරීම. ස: පා: 507[10] (අකප්පිය වත්ථු බලනු) ඒ: වි: 647. -භූමි (නා)= නොකැප බිම්. නුසුදුසු සථාන. ඔවාද දීඝීයෙහි සංවිධාන ගමන ශික්ෂාපදයෙහි භික්ෂුණී ආශ්‍රමය, අන්තරාරාමඤ්ච ආසන ශාලාවය (=භොජන ශාලාවය) නීඝීක ශෙය්‍යාවය යන මෙතෙක් තැන් හැර සෙසු තැන් අකප්පිය භූමි නම් වේ. ඉඅකැප බිම්හි සිට මෙහෙණක හා ගමන සංවිධාන කරන්නහුට දුකුලාදියෑමෙන් පවිත්දවේ කැ: වි: 100[21] ස:පා: 592[6] -භොජන (නා) (√භුජ් + යු = අන) කැපනැති භොජනය නොකැප ආහාරය. කුල දූෂණය, වෙදකම් කිරීම්, උතුරු මිනිස් ධම් හැඟවීම්, මිළ මුදල් ඉවසීම් ආදියෙන් හෝ එක්දිසි අන් වෙෂණ යන්නෙන් උපන් භොජනය. "කුලදූ සකවෙජ්ජකම්ම උත්තරිමනුස්ස ධම්මාරොචන සාදිත රූපියාදීහි නිබ්බත්තං බුද්ධ පතිකුට්ඨං අනෙසනාය උප්පන්නං අකප්පිය භොජනං පටික්ඛිපති" ස: පා: 607[6] -මංසවු (නා)= නොකැප මැසි. කැප නැති ඇඳන්. සවණ්ණිමය හා රජතමයාදි ඇඳන්. ඒ: ලැ: 387[6]-මංස (නා) [සං. මාංස]= කැප නැති මස්. භික්ෂූන් විසින් නොවැළඳිය යුතු මස් වර්ග

I මිනිස් ඇත් අස් සුනඛ නා සිහ වඝ දිවි වලස් තරස් යන මේ දස දෙනාගේ මස් අකැපය. එසේම මේ දසදෙනාගේ ඇට, ලේ, සම් හා ලොම් ද, අකැපය.

II භික්ෂු භික්ෂුණී ශ්‍රාමණේර ශ්‍රාමණේරී ශික්ෂමානා යන පඤ්චවි සහ ධාර්මිකයන් උදෙසා මැරූ මස්ද, හෙවත් උද්දිස්සකට මාංසය ද, කවර මස්දුයි නොවිචාළ මස්ද එසේම අකප්පිය ය. ස: පා: 519[1] කු: සි: ස: 41[8] සි: ව: වි: 60[10] ඒ: වි: 430-431 -වත්ථු (නා) [සං වස්තු] = කැප නැති වස්තු. තමා උදෙසා හෝ සඞ්ඝ ගණ පුද්ගල චෙතනායෙන් උදෙසා හෝ නො පිළිගත යුතු වස්තු. නිස්සග්ගියවස්තු සහ දුක්කට වස්තු. හිරණ්‍ය සුවණ්ණ කෙත්වත් ආදිය. ස: පා: 490[2] 499[15] ඒ: වි: 699-725 වි: ල: 84[20] -වාක්‍ය (නා) (√වච + ණ්‍ය)= නුසුදුසු වාක්‍යය. ඒ: වි: 452 අකප්පිය වොහාර බලනු) -වොහාර [සං. ව්‍යවහාර]= කැප නැති ව්‍යවහාරය, භික්ෂූන්ට නුසුදුසු කථාව. ගස් කොටීම් කෙටවීම් වලවල් කැණීම් කැණවීම් මල් ගස් රොපණය කිරීම් කරවීම් ඇල බැඳීම් බැඳවීම් දිය ඉසීම් ඉස්වීම් ආදිය.

...උදකඨ ථලට්ඨ වශයෙන් දක්වන ලද චැඩුණාවූ ද, වැඩිනන යන්නාවූ ද, භූතගාම සංඛ්‍යාත සියලු වෘක්ෂ තෘණ ලතාදීන්ගේ ද, පැලවෙන ගති ඇති සියලු මුල් පුරුක් අතු ගෙඩි බීජ යන පස් වැදෑරුම් බීජ ග්‍රාමයාගේ ද, මුල් ඇ නිල්පාට කොළ ද, ඇතිවූ කල කැපීම් කැඩීම පැලීම් ඉහිලීම් ආදිය කිරීමෙන් සහ මෙය කපව, කඩව, පලව, බිඳුව, උගුල්වව, යනාදී අකැප ව්‍යවහාරයෙන්" "අකප්පිය වොහාරෙනාති ඉදං ඛණ ඉදං රොපෙතීති අකප්පිය වොහාරෙන" සැ: පා: 44[34] භි: ශි: 1[35] මි: ල: 506-[22] වි: මි: 452 සාර: දී: 709[22]

-සප්පි (නා) [සං, සර්පිස්] = කැපනැති ගිතෙල්. ඇත් අස් ආදීන්ගේ ගිතෙල්. මස් නොවටනා සතුන්ගේ ගිතෙල්. සාර: දී: 764[17]

කැ: මි: 112[36] **මි: මි: වී:** 288[18] **සි: ව: මි:** 54[29]

-සමොහාර (නා)= (සං + √හර් + ණ) = කැප නැති සම්හොරය. අනුපසම්පන්නයන් සමග නොකළ යුතුය යි පැණවූ පොහෝ පවුරුණු කිරීම් ආදී සංවාසය. "අකප්පිය සමොහාරොති අනුපසම්පන්නෙහි සඞ්ඝං කාතුං පටිකඛිත්තෙනා ඵපොසථාදි සංඨාසො එව වුත්තෙනා" මි: මි: ටී: 508[16] පරි: පා: ගැ: 40[29]

-සමාදාන (නා) (සං + ආ + √දා + යු=අන) = නොකැපයෙහි සමාදන් කරවීම. "අකප්පිය සමාදාන නම් පස් සහ දැමියන්ට නොවටනා බැව් දැන දැන මේ කර මේ බඳු යනාදීන් අකැපයෙහි සමාදන් කරවීමයි" කු: සි: ස: 115[11] මි: මි: 3082

-සයන (නා) (√සි + ඉ=ඒ=අය + යු= අන) = කැප නැති හෝනා හිඳිනා දෑ. නො කැපවූ ඇඳ පුටු. උසසුන් සහ මහ අසුන්. "අකප්පිය සයනානි" යන්නෙහි උසසුන් සහ මහ අසුන් විසින් අකැප හෝනා හිඳිනා දැනම් කු: සි: ස: 65[23] "මෙහි උසසුන් නම්; වඩු රියනින් ඉකුත් වලින් ඔට පා ඇති ඇඳ. පුටුයි මෙහි පුටු නම් දික් හඟලා පුටුයි." සි: ව: මි: 62[24] "මහ අසුන් නම් 1 පල්ලඞ්ක 2 තූලික 3 පටික 4 පටලික 5 හොණක 6 චිත්තක 7 විකතික 8 උද්දලොමික 9 එකන්ත ලොමික 10 කුත්තක 11 කොසෙය්‍ය 12 කට්ඨිස්ස 13 හත්ථත්ථරණ 14 අස්සත්ථරණ 15 රථත්ථරණ 16 අජිනප්පවෙණික 17 කාදලි මිගපවර පච්චත්ථරණ 18 සලොහිත විතාන 19 උභතො ලොහිත කූපධාන යනුයි"

මෙහි 1 **පල්ලඞ්ක** නම් ඇරැහිඳවූ (කපා ඔබ බාපු) ව්‍යාල රූ ඇති පලහයි. 2 **තූලික** නම් හිඹුල්පුප් සමන් පුප් ආදිය හා පුලුන්න් මැසූ තිළිසි හෙවත් මේට්ටයයි. 3 **පටික** නම් ලොම් මුවා හෙළ ඇතිරිසි. 4 **පටලික** නම් සන පුප් ඇතිරිසි. 5 **හොණක** නම් සතරහුලෙන් දික් ලොම් ඇති ඇතිරිසි. 6 **චිත්තක** නම් පීමෙන් විසිතුරු ඇතිරිසි. 7 **විකතික** නම් සිංහ රූපාදීන් විසිතුරු ඇතිරිසි 8 **උද්දලොමික** නම් එක පිටෙක ලොම් ඇති ඇතිරිසි. 9 **එකන්ත ලොමික** නම් දෙපිට ලොම් ඇති ඇතිරිසි. 10 **කුත්තක** නම් මානමුත් සොළසක් සිට නැටිය හැකි මහ ඇතිරිසි. 11 **කොසෙය්‍ය** නම් රන් කසුකම් කළ තිහිරි හුයින් කළ පස තුරුණුසි. 12 **කට්ඨිස්ස** නම් රන් කසුකම් කොට කැටපු තිහිරි හුයින්කළ පසතුරුණුසි. 13 **හත්ථත්ථරණ** නම් ඇතුන් පිට අතුරන ඇතිරිසි. 14 **අස්සත්ථරණ** නම් අසුන් පිට අතුරන ඇතිරිසි. 15 **රථත්ථරණ** නම් රියෙහි අතුරන ඇතිරිසි. 16 **අජිනප්පවෙණි** නම් අදුන් දිවි සමින් ඇඳ පමණ මසා කළ ඇතිරිසි. 17 **කාදලිමිග පවර පච්චත්ථරණ** නම් උතුම් කෙසෙල් මුවසම් පස තුරුණින් කළ ඇතිරිසි. 18 **සලොහිත විතාන** නම් රත් වියන් ඇති ඇඳුන් වේ. 19 **උභතො ලොහිත කූපධාන** නම් හිස් දෙර හා පාමුල රත් කොච්චි ඇති ඇඳුන් ය. කු: සි: ස: 65[23] සි: ව: මි:62[24] ස: පා: 807[24] වි: මි: 266

-සුත්ත (නා) [සං. සූත්‍ර]= කැප නැති හූ. (=නුල්) නමා විසින් විනවා (=දන්වා) ලබා ගත් හූ අකැප හූ නම් "සුත්තං තාව සාමං විඤ්ඤාපිතං අකප්පියං" සැ: පා: 527[13] වි: මි:848-ං **මය** (නා)(සුත්ත + මය)[සං. සූත්‍රමය]= නො කැප හුයින් ම කළ සැ: පා: 527[20]

අකප්පිය කප්පිය සඤ්ඤි (නා) (සඤ්ඤා + ඊ)= නො කැපයෙහි කැපය යන සංඥාව ඇති. එබන්දෙහි කැපය යන හැඟීම ඇති. ඇවැතට පැමිණෙන කරුණු සයෙන් එකක්. 1 අලජ්ජිතා 2 අඤ්ඤාණතා 3 කුකතකුච්චපකතතා 4 අකප්පියෙ කප්පිය සඤ්ඤිතා 5 කප්පියෙ අකප්පිය සඤ්ඤිතා 6 සති සම්මොසා යන කරුණු සයෙන් ඇවැතට පැමිණේ. නො කැපයෙහි කැපය යන හැඟීම් ඇති

තැනැත්තේ වලස් මස් උරුමස්සයි සිතා වළඳයි. විකාලයෙහි කාලයයි හැඟවළඳයි. මෙසේ අකැපයෙහි කැපය යන සංඥාවෙන් ඇවැතට පැමිණේ කැ: වි: 14[14] (ආපත්ති ආපජ්ජන බලනු.)

අකම්ම (නා) (න + √කර + රම්ම)= කොපය වූ කර්මය. කර්මයක් නොවන, කර්ම විපත්තිය. ඒ ඒ කර්මයන් කොපයවන අයුරින් කළ විපත්ති **කර්මය** දී: වි: ටී: 406[19] වි: ල: 185[4]

අකම්මනිය (නා) (න + කම්ම + නිය) [සං. අකර්මණ්‍ය]= කර්මණ්‍ය නොවූ. කර්මයට සුදුසු නොවූ (කම්මනිය බලනු) පාරා: පා: 38[16]

අකම්මාස (නා) (න + කම්මාස) [සං. අකල්මාෂ] කැනින් තැන කැලැල් නැති. අතරතුර සිල් පද නොබිඳුණු, පිරිසුදු ශීලයේ ලක්ෂණයක්. මෙහි කම්මාසනම් කැලැල්ය 'අතරතුරබොහෝ සිකපද නොබිඳුණු හෙයින් **නිත්** නොවේද්ද" වි: මා: ස: 135[36] 544[35] පරි: පා: ගැ: 10[7]

අකම්මන ආපජ්ජන අකම්මන වුට්ඨානි= අකර්මයෙන් ඇවැතට පැමිණේයි. අකර්මයෙන් ඇවැතින් නැඟිටියි. කර්මචතුෂ්කයෙන් එකක් (**කම්ම** චතුක්ක බලනු පරි: පා: 172[32] වි: ව්: R. 537 ස: පා: 98[133]

අකම්මන ආපජ්ජති කම්මන වුට්ඨාති=අකර්මයෙන් ඇවැතට පැමිණේයි. **කර්මයෙන්** ඇවැතින් නැඟිටියි. (**කම්ම** චතුක්ක බලනු) පරි: පා: 172[31] ස: පා: 98[134]

අකරණ (නා) න + √කර + යු=අන=ණ) =නොකිරීම. ස: පා: 83[28]

අකරණීය 1(නා)(න + √කර + අනීය=ණ)=නොකට යුතු. භික්ෂුවක් විසින් දිට්ඨිම්මයෙන් නොකටයුතු කරුණු "චත්තාරි අකරණීයානි, නොකටයුතු සතර" 1මෛථුන සෙවනය 2 අදින්නාදානය 3 **මනුෂ්‍ය** විග්‍රහය 4 උත්තරි මනුෂ්‍ය ධර්මාරොචනය ඉතු සතර අකරණීය යෝ වෙත්: ස: පා: 152[33] ම: පා: ස: 488[29]

අකරණීය 2 (නා)=නොකටයුතු. සිල විපත්ති දිට්ඨි විපත්ති ආචාර විපත්ති ආජීව විපත්ති ආදිය නොකට යුතු කරුණුය. සු: නි: අ:136[3]

අකරණීය 3 (නා)=ශ්‍රමණයන්ට නොකැපවූ දේ නොකැපවූ බැවින්ම නොකටයුතු කරුණු. 'යං හි සමණකම්මං න හොති තං තෙසං න කප්පති අකප්පියත්තා අකරණීයං" ස: පා: 152[33]

අකරොනෙතා ආපජ්ජති=(අ + √පද + ය + ති)= නොකරමින් ඇවැතට පැමිණේයි. උපාධ්‍යායාදීන්ට කළයුතු වතාවත් ආදිය නොකරනුයේ ඒ නොකිරීම නිසා ඇවැතට පැමිණේයි. පරි: පා: 163 ස: පා: 975[10]

අකලලක 1 (නා) (න + කලල + ක) [සං. අකල්ය] =නිලනා. ගිලන් නිෂ්ඵල. සාර: දී: 850[9] වි: ව්489 වි: ල: 145[17] කු: සි: ස: 61 [27]

අකලලක 2 (නා)= නො ගිලන්, ගිලන් නොවූ නිෂ්ඵල, "අකලලකො, නොගිලන් මහණ, ලසුණං, අමූ මගධ ලූණු. න බාදයෙ, **කෙවල** කොට නො කන්නේය" කු: සි: ස: 111[26]

අකසිර (නා) [සං. කෘච්ඡ්‍ර > කසිර?] =අනායාසයෙන්, නිදුකින්. මනෝ:පූ: 344[36]

අකසිර ලාභි(නා) (න + කසිර + ලාභ + ඊ)=අනායාසයෙන් ලැබීම් ඇති. විශාල ලැබීම් ඇති. මහත්සේ ලැබීම් ඇති. "අකසිර ලාභී, අකසිරවූ මහත්වූ ඒ ධ්‍යානයන්ගේ ලාභය ඇත්තේද" පරි: පා: ගැ: 15[17] උ: අ: 164[11]

අකාම (නා) (න + කාම)= නො කැමැත්ත "අකාමා, නො කැමැත්තහු විසිනුදු; පරිවත්තබ්බං, පිරිවස් විසිය යුතුය" ප්‍රතිකර්ම නොකරන ලද ඇවැතින් සඝාදිසේසාපත්තිය කරන හෙයින් නොකැමැත්තෙන්ම පිරිවස් සමාදන්ව විසිය යුතුයි. "අකාමා පරිවත්ථ බබන්ති න කාමෙන න වසෙන අථඛො අකාමෙන අවසෙන" කැ: වි: 48[16]

අකාමක (නා) (න + √කමු + ණ්වු=අක)= නොකැමැති කැමැත්තක් නැති. පාරා: ප: 12[8] ස: පා: 140[23]

අකාමා භාගෙ (නා)= නො කැමැති කොටස. "අනාගමෙන්නානං න අකාමා භාගො දාතබ්බා, එනතෙක් නොසිට යන්නවුන්ට නො කැමැති නම් කොටස නොදිය යුතු'. ඉදින් බොහෝ භික්ෂූන් දීඝී මාගීයට පැමිණි කල්හි ඇතැම් භික්ෂූහු පාංසුකූලපිණ්ඩිය සුසාන යන් කරා පැමිණෙත්ද, ඇතැම් කෙනෙක් එනතෙක් නොසිට නික්ම යත් ද එනතෙක් නො සිට යන්නවුන්ට නො කැමැති **නම්** කොටස නොදිය යුතු. විනි: නී: 491[1]

අකාය බන්ධන (නා) =කාය බන්ධනය නැතිව. පටිය නොබැඳ. කාබාන් නැතිව හෙවත් කාබාන් නොබැඳ. "න හි තතෝ අකාය බන්ධනෙන ගාමා පවිසිතබ්බා යෝ පවිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස" වි: ල: 295' සි: ව: වි:77[32] කු: සි: ස: 80[32]

අකාරක (නා) (න > √කර + ණ්වු=අක)= නොකළ තැනැත්තා, නොකරන්නා. (සන්‍ස්: ලි: අකාරිකා=නොකළ තැනැත්තී=නොකරන්නී) වි: වි: ටී: 235[4]

අකාරණ (නා) (න + ∨ කර + යු= අණ)= හෙතු රහිත, හෙතුවක් නැති වි: වි: ටී• 443[22]

අකාල 1 (නා) (න + කාල)= නො කාලය. නුසුදුසු කාලය.අත්තාදන අධිකරණය. ගැනීමේදී නම් රජ බිය සොරබිය දුබික්ෂ බිය සහ වැසි කාලය ද අකාලයයි.

අකාල 2 (නා)=නුසුදුසු කාලය. වොදනා කිරීමට සුදුසු නැති කාලය. සඞ්ඝ මධ්‍යය, ගණ මධ්‍යය, හඹු බෙදන තැන, ලහ බෙදන තැන, විතකී මාලය, භික්ෂාචාර මාර්ගය සහ ආසන ශාලාදියෙහි උපස්ථායකයන් පිරිවරා සිටින අවස්ථාව ද වොදනා කිරීමට නුසුදුසු කාලයයි. ස:පා: 950[22](අකාලතනවදති බලතු)

අකාල 3 (නා)= අනවකාශ සථානය, ආරාධනා නො කළ කාලය. ස: පා: 989[29]

අකාල 4 (නා)= අනවකාශය, අනුශ්‍රාවණයෙන් කර්‍ම විපත්තිය සිදුවන කරුණු පසින් එකක්. සාවණාවගේ අවකාශයෙහි හෙවත් අනුශ්‍රාවණයට පෙර ඤත්තිය නොතබා අනුශ්‍රාවණ කර්‍මය කොට පසුව ඤත්තිය තැබීම. ස: පා: 1044[3] කැ: වි: පි: 16[22] (අකාලෙ සාවණ බලතු) **–විවර** (නා)=අකාල විවරය. නොකල්හි උපන් සිවුර. කාලයෙහි හෝ අකාල නමින් දුන් සිවුර. "කඨිනය නො අතුළ ඉල් මස හැර අනික් එකොළොස් මස උපන්නාවූ ද, කඨිනය අතුළ කල්හි ඉල්මස හා හෙමන්ත සෘතුව හැර සෙසු සත්මස උපන්නා වූ ද, කාලයෙහි උදෙසනා ලද්දාවූ ද, සිවුර. වි: වි: ටී: 265[24] කු: සි: ස: 132[35] සාර: දී: 734[9]-777[33] සි: ව: වි: 89[21] **–ංගහණ** (නා)=එනම් නීසඝිපවිති ශික්ෂා පදය. කඨිනය නො අතුළ කල ඉල් මාසයේන් සෙසු මාසයන්හි ද, අතුළ කල ඉල් උදුවප් පුරාතු නවම් මැදින්දින යන පස් මාසයෙහි ද, උපන් බොමාදි සිවුරු වස්තුයක් පිළිගෙන ප්‍රත්‍යාශාව ඇතිව ද, මසකට වඩා කල් තබා ගැනීමෙන් පැමිණෙන නීසඝි පවිත්තිය. **ට්ඨි:** ශී: 7[8] **–ඤඤු** (නා) (අකාල + √ඤු + රූ=ඌ)= 1 කාලය නොදන්නා 2 ආරාධනයක් නැතිව කථා කරන්නා 3 ඤත්තිකාල ඤත්තිඛණ්ඩ ඤත්ති ඔකාසයන් නො දන්නා) ස: පා: 989[29] **–මේඝ** (නා)=අකාල මෙඝය, නොකල් වැස්ස. "වස්සාන සෘතුව නො පැමිණි කල හටගත් මෙඝය අකාල මෙඝ නමි" ස: පා: 292[1]–718[20] **ම:** පා: ස: 10[6] **–සාවණ** (නා) (√සු + ඵ=ඕ=අව=ආව + යු=අණ) [සං, ශ්‍රාවණ]= නොකල්හි ඇස්වීම. පස් වැදෑරුම් අනුශ්‍රාවණ දෙඅයන්ගෙන් එකක්. වත්‍රු අපරාමසන, සංඝ අපරාමසන, පුග්ගල අපරාමසන, සාවණාය හාපන, අකාලෙ සාවණ ඇතුවෙන් අනුශ්‍රාවණ දෙඅයෝ පසක් වෙත්. එයින් අකාලෙ සාවණ නම්; සාවණාවගේ අනවකාශයෙහි හෙවත් අනුශ්‍රාවණයට පෙර ඤත්තිය නොතබා අනුශ්‍රාවණ කර්‍මය කොට පසුව ඤත්තිය තැබීමයි. එයින් අනුශ්‍රාවණ විපත්ති වශයෙන් කර්‍මය කොප්‍ය වේ: කැ: වි: 18[25] ස: පා: 1144[3] කැ: වි: පි: 16[22] (අනුසාවණ දෙස බලතු.)

අකාලික (නා) අකාල + ණික=ඉක)= කල් නොයවා විපාකදෙන, පැවැත්මට ඉක්බිතිවම ඵලය දෙන, මාර්ගයට අනතුරුවම ඵලය උපදවන. වි: මා: ස: 530[36] සු: නි: අ: 375[13]

අකිඤ්ඤ (නා) [සං, අකිඤ්චන්‍ > පා: අකිඤ්ඤ] නිදුකින්, අනායාසයෙන්.**–ලාභි** (නා) ලාභ + ඊ)= නිදුකින් ලැබීම් ඇති: "අකිඤ්ඤලාභී, සුව සේ නිදුකින් සමවැදීමට නිසිව ලැබීම් ඇත්තේ" පරි: පා: ගැ: 15[15] උ: අ: 164[10]

අකිත්තනි (නා) (න+√කිත + ති) අපකීර්තිය නිඳුව.

අකිරිය (නා) (න + √ කර + රිය) [සං, අක්‍රිය] නොකිරීම. නොකිරීමෙන් ඇවැතට පැමිණීම. "අකිරියතෝ ආපජ්ජති, නොකිරීමෙන් ඇවැතට පැමිණෙයි. සිවුරු නො ඉටීමෙන් එය නො ඉටීමේ ඇවැතට පැමිණේ." සැ: පා: 973[7] "කයින් වචනයෙන් හා සිතින් නො ඉටීමෙන් ද, විකප්පනය නොකිරීමෙන් ද, පැමිණෙන බැවින් අකිරිය නමි" කැ: වි: පි: 46[2] ස: පා: 1036[11] ප්‍රාතිමොක්ෂ නිදු නොදෙසයෙහි "යාව සතියං අනුසාසිතං

හොති"යි තුන් යලක් අනුසාවණය කරනු ලැබේ. ඒ යාව තනියානුසාවණය කරන කල යමෙක් සිතිකොට ඇති ඇවැත් පහළ නො කෙරේද, ඔහට යාව තනියානු සාවණ යාගේ අවසානයෙහිදී සම්පජාන මුසාවාදය වේ: දැමේ මුසාවාද ලක්ෂණයෙක් නොර වුව ද, වාග් ද්වාරයෙහි අක්‍රිය සමුත්ථාන ආපත්තියි. කැ: වි: 1535 සැ: පා: 49710

අකිරිය දිට්ඨි (නා) [සං දෘෂ්ටි]= අක්‍රිය දෘෂ්ටිය. කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාක නැතැයි යන දර්ශනය මනෝ: ප්‍ර: 49710

අකිරියවාද 1. (නා) [සං. අක්‍රිය වාද]= එනම් වාදය. එක්තරා දර්ශන වාදයක්. කුශල අකුශල කර්ම හෝ එහි විපාක නැතැයි යන වාදය සැ: පා: 8328

අකිරියවාද 2. (නා) වැඩිමහල්ලන්ට අභිවාදනාදිය නොකිරීම වැරැදිය යන වාදය වේරඤ්ජා බ්‍රාහ්මණයා බුදුන්ට චෝදනා කළ එක්වාදයක් සැ: ප : 8328

අකිරියවාද 3. (නා) කාය දුශ්චරිතාදිය නො කිරීම ශ්‍රේෂ්ඨය යන වාදය සැ: පා: 8328

අකිරියවාදී (නා) [අකිරියවාද + ඊ]= කුශලා කුශල කර්මයන් හෝ එහි විපාක නැතැයි යන වාද ඇති තැනැත්තා

අකිරිය සමුට්ඨාන(නා)(සං + උ + √ස්ථා + යු-අන) = අකිරිය සමුට්ඨානය. සියලුම ආපත්තිහු ක්‍රියා ක්‍රිය වශයෙන් පස් වැදෑරුම් වෙත්. 1 අපි කිරියතො 2 අපි අකිරියතො 3 අපි කිරියා කිරියතො 4 අපි සියා කිරියතො සියා අකිරිය තො 5 අපි සියා කිරියතො සියා කිරියාකිරිය තො යනු ද් පසසි. මෙයින් කයින් හා වචසින් කටයුතු ඉරිමි ආදිය නොකරන්නහුට වන ආපත්තිය අකිරිය සමුට්ඨාන නම්. අසි ට්ඨාන දසාභබහනතරයෙහි අතිරෙක චීවර නො ඉටිමෙන් නිසඟි පචිත්ති වන පඨම කඨිනා පත්තියෙහි මෙන් නොකිරීමෙන් හටගන්නා ඇවැත. වි: වි: ටී: 1212 කැ: වි: 2236 කැ: වි: පි: 2012

අකිලාසු (නා) (න + කිලාසු)=උත්සාහ සහිතවූ උත්සාහවත් වූ. සැ: පා: 12728

අකිලිත්ත (නා) [සං න + කලිත්ත]=ඉනා නෙත් නො පැසුණු "අකිලිත්ත, නො විලිකුස්සුණු" කැ: වි: පි: 5410

අකුක්කුච්චන (නා) (න + කුක්කුච්ච + කම) =තාවකාලික නොවූ, එබඳු වස්තුය. කඨිනාස්තරණයෙහි ලැබෙන සතළොස් සමඳත්තීන් ගෙන් එකක්. කුක්කුච්චන නම් තාවකාලිකව ලබාගත් වස්තුයයි. එබඳු වස්තුයකින් කඨිනය අතුළ නො හැක. අකුක්කුච්චන නම් තාවකාලිකව ලබා නොගත් වස්තුයයි. පරි: පා:ගැ:2309 සැ: පා: 8247

අකුටි (නා) (න + කුටි) [සං.කුටි]= කුටියක් නොවන. වස් විසීමට සුදුසු නොවන කුටි. වංකිත මණ්ඩ ජිවකුටි ආදිය, "වංකිත මණ්ඩාදි හෙදො අකුටි" වි: ල: 2745 වි: වි: ටී: 23026 කැ: සි: ඨ: 10614

අකුප්ප 1 (නා) (න + කුප්ප + අ)= අකොප්‍ය, කොප්‍ය නොවන, නො කිපෙන රාගාදී ප්‍රතිපක්ෂයන් විසින් කොපනය නොකට හැකි. ප: සු: 1452

අකුප්ප 2 (නා)= කොප්‍ය නොවන, ආක්‍රොශ කටයුතු බවට නොපැමිණි 1 වස්තු 2 ඤාතී 3 අනුසාවණ 4 සීමා 5 පරිස යන පංච සම්පත්තීන්ගෙන් යුක්තවූ බැවින් ආක්‍රොශ නො කටයුතු බවට පැමිණි. සැ: පා: 17225 (අකොප්‍යකම්ම බලනු.) -භාවම්ම (නා) අකොප්‍ය කර්ම බලනු, -ධම්ම (නා)=නො කිපෙන සභාව ඇති, රහතන් වහන්සේ, සැ: පා: 9853 වි: වි: ටී: 5930 පරි: පා: ගැ.1412

අකුසල (නා) (න + කුසල)= 1 අකුශලය. පාපය. 2 ආපත්තිය, ඇවැත. 3 අදක්ෂ. "පඤ්චවෙර දස අකුසල කම්මපථපප භෙදනං අකුසලානං" සැ: පා: 10549 මනෝ: ප්‍ර: 5559 සැ: පා: 10331 -භාවම්ම (නා)=අකුශලකර්මය, අකුසලය, පාපය. -චින්තන (නා)= අකුසල් සිත. අකුසල් සිත ඇතිව -චිත්තනා ආපජ්ජති= අකුසල් සිත ඇතිව ඇවැතට පැමිණෙයි. පාරාජිකා සුක්කවිසට්ඨි කාය සංසගග දුට්ඨුල්ල ආදී ආපත්තීන් ට අකුසල් සිත් ඇත්තේ ම පැමිණෙයි. පරි: පා: 1677 සැ:පා: 977331-ං චුට්ඨානි=අකුසල් සිත් ඇතිව ඇවැතින් නැගිටිසි. ඇවැත් දෙසයි. දොම්නස්ව ඇවැත් දෙසන්නේ අකුසල් සිත් ඇතිව ඇවැතින් නැඟී සිටින්නේ වේ. සැ: පා: 1025 -ධම්ම (නා)= අකුශල ධර්ම. අවිද්‍යාව නිසා හටගන්නා කරුණු. "අකොසල්ල සම්භූතටෙඨන අකුසලානං ධම්මානං" ඨ: පා: 84 74-29.33 වි: වි: ටී: 5921 17616

2018 02 17 Paññāpārami - Na Uyana Free Distribution

-මූල (නා)= අකුසල් මුල්. ලොභය, දෝෂය සහ මොහය යනු අකුසල් මුල්. පරි: පා: 17[115] සං: පා: 980[31]

අකොප්‍ය කම්ම (නා) (න + √ කුප + ණ්‍ය= අකොප්‍ය) =කොප්‍ය නොවූ කර්මය. ආක්‍රොශ කවයුතු බවට නො පැමිණි කර්මය. වත්‍ථු සම්පත්ති සහ නිසම්පත්ති අනුස්සාවණ සම්පත්ති සීමා සම්පත්ති පරිස සම්පත්ති යන පඤ්චප්‍රකාර සම්පත්තීන්ගෙන් පිරිපුන් කල්හි සඞ්ඝ කර්මය කොප්‍ය නොවේ. මෙහි **වත්‍ථු** නම්; උපසම්පදා පෙක්ඛක පුද්ගලයායි, උනු විසිවස් පුද්ගලයා ද, අනන්තර වස්තු සංඛ්‍යාත පරිදි අවන්, පුද්ගලයා ද, පණ්ඩකාදි එකොළොස් අනවය පුද්ගලයන් ද, හැර උපසම්පදා කර්මාර්හී පුද්ගලයා ඇති කල්හි උපසම්පදා කර්මය වස්තු වශයෙන් අකොප්‍ය වේ. **ඤත්ති සම්පත්ති** නම්; වත්‍ථු අපරාමසන සඞ්ඝ අපරාමසන පුග්ගල අපරාමසන ඤත්ති අපරාමසන පවත්‍ත්‍ථු ඤත්ති ඨපන යන පඤ්චවිධ ඤත්ති දෝෂයන්ගෙන් විනිර්මුක්තවූ සුපරිශුද්ධ ඤත්තිය කීර්තනය කිරීමයි. උපසම්පදා පෙක්ඛකයාගේ නම නොකියා හැරීම වත්‍ථු අපරාමසනයයි. ''සුණාතු මෙ භන්තෙ සඞ්ඝෝ''යි යන තන්හි ''සුණාතු මෙ භන්තෙ'' යි කියා ''සඞ්ඝෝ'' යනු නොකියා හැරීම සඞ්ඝ අපරාමසන නම්. උපාධ්‍යාය යන් කීර්තනය නොකිරීම පුග්ගල අපරාමසන නමී. ඤත්තිවාක්‍යය සම්පූර්ණ කොට නොකියා හැරීම ඤත්ති අපරාමසන නම්. කර්ම වාක්‍යය පළමුකොට දෙසනා කොට පසුව ඤත්තිය දෙසනා කිරීම පවත්‍ත්‍ථු ඤත්ති ඨපන නම්.

අනුසාවණ සම්පත්ති නම්; වත්‍ථු අපරාමසන සංඝ අපරාමසන පුග්ගල අපරාමසන සාවණ හාපන අකාල සාවණ යන පඤ්ච ප්‍රකාර අනුශ්‍රාවණ දෝෂයන්ගෙන් විනිර්මුක්ත වූවායි. (අනුසාවණ සම්පත්ති බලනු.)

සීමා සම්පත්ති නම්; එකොළොස් විපත්ති සීමාවන්ගෙන් අමිශ්‍රවූ ත්‍රිවිධ සම්පත්තීන් ගෙන් යුක්ත කොට නිමිත්තෙන් නිමිත්ත ඝටා සම්මත කළ බඳ්ධ-අබඳ්ධ වශයෙන් දෙ වැදෑරුම් වූ සීමාවයි.

පරිස සම්පත්ති නම්, කර්මාර්හ භික්ෂූන් අත් පසට නො පැමිණීම, ඡන්දාර්හයන්ගේ ඡන්දය නො නෙනීම, ප්‍රතික්‍රොශනය යන ත්‍රිවිධ දෝෂයන්ගෙන් විනිර්මුක්ත වූ කර්මාර්හ භික්ෂු සඞ්ඝයායි. මේ පඤ්චප්‍රකාර සම්පත්තීන් ගෙන් පිරිපුන් කර්මය අකොප්‍ය වේ. සං: පා: 172[25] ක: ව: 16[34] ප්‍ර: ව: 21[30]

අකොවිද (නා) [සං. න + කොවිද]= අදක්ෂ. අසමර්ථ පරි: පා: ගැ: 27[32]

අකොසල්ල (නා) (න + කුසල + ණ්‍ය) [සං. අකෞශල්‍ය]= 1 අදක්ෂ. 2 නොදන්ම 3 අවිද්‍යාව වි: වි: ටී: 3[130]

අක්ක (නා) [සං. අක්‍ත]= වරා, වරාහූ ''අක්ක වරාහුසින් කළ. කු: සි: සං: 22[21] **-දූසක** (නා) [සං. දූෂී]=වරා වැහැරියෙන් කළ වස්ත්‍රය. නො දැරිය යුතු, දුර්මෙන් දුකුළා ඇවැත් අවදින වැහැරි සිවුරු විශෙෂයක්. සං: පා: 841[29] වි: වි: ටී:439 [29] කු: සි: සං: 22[21] **-නාළ** (නා) [සං. නාල]= වරා නළ, වරා දඹු, වරා දඬු ගොතා කළ වස්ත්‍රය. දුර්මෙන් තුලැසි ඇවැත් අවදින වස්තු විශෙෂයක්, ''මෙහි නොකී වැහැරි ආදීන් ගොතා කළ අක්ක නාළයෙහිදු තුලැසි වෙයි. දතයුත්තු'' කු: සි: සං: 22[27] සං: පා: 84.[27] වි: වි: ටී: 439[29] **-ං මය** (නා) (නාළ + මය) =වරා දඹුවලින් කළ වස්ත්‍රය වි: වි: ටී: 439[29] **-ණ** (නා) (අ — √ නමු + ත්ත)= ආක්‍රමණය කරමින් සිටි. මැඩගෙන සිටි. ''අක්කන්තස්ස, මැඩගෙන සිටියහුට'' සං: පා: 666[11] සං: ම: 177[25] (අතී: අක්කමි: වත්: අක්කමති, අනා: අක්කමිස්සති, ප්‍රෙ: ක්‍රි: අක්කමිත්‍ථා, අක්කමම) **-ණ්ණ** (නා) [ස. පර්ණ්]= වරා පත්, වරාකොළ, ජා: අ: ගැ: 100[9]

අක්‍රිය (නා) (න + ක්‍රියා)= නොකිරීම. අක්‍රිය සමුට්ඨාන ආපත්ති. අධිට්ඨාන දසාහබ්භන්තර යෙනි අතිරෙක චීවර නො ඉවීමෙන් නිසඟි පචිත්ති වන ප්‍රථම කඨිනාපත්තියෙහි මෙන් අන ධිෂ්ඨාන අධිකප්පනයෙන් සිදුවන අක්‍රියා පත්තිය. වි: වි: 631 කං:ටී:2[236] (අකිරිය බලනු.)

අක්කොසාපේති (ක්‍රි) (අ + √ කුස + ණි=ණේ)= ආක්‍රොශ කෙළේය. රළු පරුෂ බසින් බැණ වැදුණේය. සං: පා: 854[18] (අතී: අක්කොසි= අක්කොච්ඡි, වත්: අක්කොසති, අනා: කා: අක්කොසිස්සති ප්‍රෙ: ක්‍රි: අක්කොසිත්‍ථා, එය්‍ය + අක්කොසෙය්‍ය) ආක්‍රොශ කරන්නේය (ද?)

අක්කොස (නා) (අ + √ කුස + ණ) [සං. ආක්‍රොශ]= ආක්‍රොශය. ආක්‍රොශ කිරීම.

1. චොරොසි 2. බාලොසි 3. මූළෙහොසි 4. ඔට්ඨොසි 5. ගොණොසි 6. ගද්‍රභොසි 7. නෙරයිකොසි 8, තිරච්ඡානගතොසි 9. තත්‍රපි තුයහං සුගති 10 දුග්ගතියෙව තුයහං පාටි කඞ්ඛා යන්‍ය දශ ආක්‍රොශ වස්තුවෙන් ආක්‍රොශ කිරීම. පි: මා: ස: 791

(2) ඔමසවාද ශික්ෂාපද පදභාජනියෙහි සඳහන් දශ ආක්‍රොශ:ස්තුන්ගෙන් ඔවා බිණීම. 1. ජාති 2. නාම 3. ගොත්‍ර 4. කම්ම 5 සිප්ප 6, ආබාධ 7. ලිඞ්ග 8. කිලෙස 9. ආපත්ති 10 අක්කොස යන වස්තූන්ගෙන් ඔවා බිණීම පාචි: පා: 638 සි: ව: චි: 421 සා: දී: 7116 (අක්කොච්ඡි බලනු) -'අධිප්පාය (ස + අ=සා) (නා)= ආක්‍රොශ කරන අදහස. පඨම දුට්ඨදොස සික්ඛාපදයෙහි ඉදහන් නා නා අධිප්‍රාය ගන්ගෙන් එකක්. ආක්‍රොශ කරණ අදහසින් අමූලක සඞ්ඝාදිශෙෂාපත්තියෙන් අභිමුඛයෙහි වොදනා කරන්නහුට පවිති ඇවැත් වේ. ස: පා: 42928 චි: ටි: 411. -ඣ (නා)= ආක්‍රොශ කරන. ස: පා: 99511 -ංපරිභාසඣ (නා) (පරි + √භාස + ණවු=අක) ආක්‍රොශකරන සහ භය කිරීමෙන් තර්ජනය කරන. ස: පා: 75622 99,11 -ච ණ්ඩ මච්ඡරී (නා) 1 'නිකුබුං අක්කොසෙය්‍ය වා පරිභාසෙය්‍ය වා" 2 'චණ්ඩිකතා ගණං පරිභාසෙය්‍ය" 3 "කුලමච්ඡරිනි අස්ස" යනුවෙන් භික්ෂුණී විභඞ්ගයෙහි සඳහන් ශික්ෂාපද තුන. පරි: පා: 12527 ස: පා: 96331 -වචන (නා) (√වච + යු=අන)= ආක්‍රොශ වචන. දුට්ඨුල්ල වාචා සඞ්ඝාදිශෙෂ ශික්ෂාපද පදභාජනියෙහි ආක්‍රොශ නිර්දෙශයෙහි සඳහන් වන 1 අනිමිත්තාසි 2 නිමිත්ත මත්තාසි 3 අලොහිතාසි 4 ඛුවලොහිතාසි 5 ඛුවචොලාසි 6 දඝරත්තිසි 7 සිඛරිණියි 8 ඉත්ථිපණ්ඩකාසි 9 වෙපුරිසිකාසි 10 සම්භින්නාසි 11 උභතොබ්‍යඤ්ජනකාසි යනුවෙන් සඳහන් පද එකොළොස. මෙයින් සිඛරිණියි, සම්භින්නාසි, උභතො බ්‍යඤ්ජනකාසි යන පද තුන සඞ්ඝාදිශෙෂය සම්පූර්ණ කරයි. සෙසු පද අට 'අනිමිත්තෙන මෙථුනං ධම්මං මෙ දෙහි" යනාදීන් "මෙථුන ධර්ම" ශබ්දය සමඟ ගළපාකීමෙන් ම ආපත්ති කර වේ. පාරා: පා: 1455 ස: පා: 39,9 චි: ච: 355 -වත්ථු (නා) [සං. වස්තු]= ආක්‍රොශ වස්තු. ආක්‍රොශ කිරීමට හෙතු වන, ආධාර වන කරුණු දශය. 1 ජාති 2 නාම 3 ගොත්‍ර 3 කුල 5 කම්ම 6 ශිල්ප 7 ආබාධ 8 ලිඞ්ග 9 කිලෙස 10 ආපත්ති යන මේ දශය. ජා: ආ: ගැ: 6623 සි: ව: චි: 421 සා: දී: 7116 (අක්කොස 2 බලනු)

අක්ක (නා) [සං. අක්ෂ]- 1 ඇස 2 ඉන්ද්‍රිය 3 පස ඇට, වට, ගුළ, දුඳුකැටය. 4 විනිශ්චය ශාලාව. 5 අලවංගුව. 6 දූ කෙළිය. 7 අක (කල දෙන් අවෙන් කොටස =වී ඇට විස්සක බර) 8 පන්දු කෙළිය? 9 බුළුනස. ස: පා: 44814 ජා: අ: ගැ: 9015 අ: ප: ස: 6535 සු: චි: 6310 දී; නි: B. 1415 -ඝ (නා)= අකු ඇටය, ගලඟ ඇටය, නලසර ඇටය. "අධක්කකං, අකු ඇටින් යට" "අධක්කකන්ති අක්කකතො පට්ඨාය අධො" අ: ප:ස: 398 ක:ච:පි: 2724 චින: ම: 9821 -ණවෙධි (නා)=න + ඛණ √විධ + ණි)= අක්ෂණ වෙධියා. මෙහි අක්ඛණ නම් විදුලියයි. ක්ෂණ මාත්‍රයකුදු තහවුරුව නො පවත්නා බැවින් විදුලිය අක්ඛණ නම්, එබඳු විදුලිය එලියෙන් නො වැරැද ලක් විදුනේ අක්ඛණ වෙධී නම්. "අකුණු සතින් ලක් විදුනා" ජා: අ: ගැ: 5623 මනෝ: පූ: 46119 -න (නා) න + √ඛර + න)= [සං. අක්ෂත]= නො නැසුණු. නො නටු වාවූ. ගුණ ක්ෂය නොවූ. මනෝ: පූ: 67917 දස්ස (නා) (අක්ක + √දිස + ණ) [සං. අක්ෂ දර්ශක]= විනිශ්චය කරන්නා, ධර්මාධ්‍යක්ෂකයා මෙහි 'අක්ක"යනු විනිශ්චය ශාලාවයි. එහි සිට වරද නිවරද පසිඳුනාහු අක්කදස්සයෝ නම් වෙත්. ඔවුහු ධර්ම සභාවෙහි හිඳ අපරාධ කරුවන්ගේ අපරාධයට සුදුසු පරිදි දඬුවම් නියම කරන්නෝ වෙත්. පාරා: පා: 462 ස: පා: 22229 චි: ච: ටී: 1481 -ඛුත්ත (නා) [සං. අක්ෂ ඛුන්න]= අක්ෂඛුන්නයෝ. දූ කෙළියෙහි, ලොල්ව ඛුත්තීවූවෝ. දුවරුවෝ. " අක්ක ඛුත්තා දරු ගුළං ඛිපන්ති එවං උදකං වා වාලුකං වා ගහෙත්වා ඨාම මජ්ඣිමෙන පුරිසෙන සබ්බත්ථාමෙන ඛිපිතබ්බං, යත්ථ එවං ඛිත්තං උදකං වා වාලුකං වා පතති අයමෙකො උදකුක්කෙපො" ස: පා: 78527 ජා: අ: ගැ: 9010 ක: ච: පි: 63 -ඤාති (නා) (න + √ඛඤ්ඤ + නි) [සං. න + ක්ෂාන්ති]= නො ඉවසන, උපන් ක්‍රොධය සහනය නො කරන. ච:ච: ටී: 24113 -ඛයඤාණ (නා) (අනි + √අඤ්ජ + යු=අන)= රියෙහි අකුර (අලවංගුව) ගැටෙන තැන සෙල් දැමීම. ශරීරයේ යැපීම පිණිස පිණ්ඩපාතය පරිභෝජනය කළයුතු පමණ දැක්වීමට යෙදූ උපමාව. "අක්ක ඛයඤාණ

මිව, සකට යහපත් වන පිණිස අකුරක දෙන වදනක් මෙන්" "අකුර ගහනා වදනක් මේන්, වදඟ නම් නෙලි" ජා. අ: ගැ: 150^{2} වි: මා: ස: 86^{26} **-ම** (නා) (න+ඛමා) [සං. අක්ෂමා]= නො ඉවසිම. අවවාදඅ නො ඉවසිම. මනෝ: දු: 541^{20} පට්: පා ගැ: 35^{36} ස: පා $44.^{9}$ **-ය** (නා) (න+ඛය) [සං. අක්ෂය]= ක්ෂය නොවූ විනාශ නොවූ. **-සික** (නා) (න+√ඛි+ණ+ඉ+ඩ)=ක්ෂය නොවූ, නො කැ. ප්‍රථම පාරාජිකා ශික්ෂාපද ක්ෂේත්‍ර නියමයෙහි දී සොණ සිගාලාදීන් විසින් කෑමෙන් ක්ෂය නොවූ සත්‍රී නිමිත්ත පාරා: පා 29^{12} කැ: වි: පි: 18^{29} ම: පා: ස: 485^{15} R **-සුත** (නා) =අකුර හා විය දණ්ඩ ජා; අ: ගැ: 54^{38}

ඉසෙනසුන් පහසුකම් හා සහාය සම්පත් ඇති අනෙක් වෙහෙරකට පැමිණ එහිදී සිවුර කොට නිමි කල්හි සිදු වන කඨිනුද්ධාරයයි. 3 **සනනිට්ඨානනනිකා** නම්; මේ වස්තුයෙන් සිවුරද නො කරමි. මේ වෙහෙරට ද නැවැත නො පැමිණෙන්නෙමියි මෙසේ ධුර නිස්සේ පස කොට යැමෙන් සිදුවන කඨිනුද්ධාරයයි. 4 **නාසනනනිකා** නම්; වස්තුවක් ලැබ මේ වෙහෙරට නැවත නො පැමිණෙන්නෙමියි නොස් අන් වෙහෙරක දී ඒ සිවුරහි පරිකර්ම කරමින් සිටියදී ඒ විවරය නැසුණේ නම් හෝ දැවේ නම් හෝ එකල සිදු වන කඨිනුද්ධාරයයි. 5 **සව සංනනිකා** නම්; කඨින වස්තුයක් ලැබ වුසු වෙහෙරට නැවැත පැමිණෙන්නෙමි යි අපෙක්ෂා ඇතිව අන් වෙහෙරකට පැමිණ සිවුර කෙරේ ද එකල්හි කඨිනය ලත් ආවාසයෙහි අන්තරුබ්භාර සංඛ්‍යාත කඨිනුද්ධාරය කරන ලදුයි ඇසීමෙන් සිදුවන කඨිනුද්ධාරයයි. 6 **ආසාව චෙජදිකා** නම්; කඨින වස්තුය ලත් මහණ සිවුරක් ලබනු කැමැත්තෙන් අන් වෙහෙරකට පැමිණි කල්හි යම් කිසිවෙක් සිවුරක් දෙමියි කී කල්හි වස් සීමාව කෙරේ ආලය හැර පසුව සිවුරක් දෙන්නට නො හැක්කෙමියි කීමෙන් ඒ සිවුර පිළිබඳව පැවැති ආශාව ද, සුන් වූ පමණකින් සිදුවන කඨිනුද්ධාරයයි. 7 **සීමාතික්කන්තිකා** නම්; වස් වුසූ වෙහෙරට නැවැත පැමිණෙන්නෙමියි අපෙක්ෂා ඇතිව එයින් අන් වෙහෙරකට පැමිණ එහිදී සිවුර නිම කොට පෙරළා එන කල අරුණු නැංගේ නම් විවර කාල සඞ්ඛ්‍යාත දිනය ඉක්මුණු හෙයින් සිදු වන කඨිනුද්ධාරයයි. 8 **සහුබ්භාර** නම්; වුසූ වෙහෙරට නැවැත පැමිණෙන්නෙමි යන අපෙක්ෂා ඇතිව අන් වෙහෙරකට ගොස් එහිදී සිවුර නිමකොට පෙරළා වස් සීමාවට පැමිණ කඨිනය අනුදා අනුමොදනා කොට පසුව එහි වැසි භික්ෂූන් සමග එකතුව උද්ධරණය කිරීමෙන් සිදුවන කඨිනුද්ධාරයයි. ක: වි: පි: 43[27], ක: ව: 78[2], වි: වි: 270, සා: පා:824[35] මහා: පා: 289[15]. **-කථා** (නා) (√කථ + අ + ආ)= අර්ථකථා. අටුවා. දෙශනා පාළිය විසතර කළ පොත්. 2 ධර්ම සංග්‍රාහක ආචාර්ය වංශය. වි: වි: ටී: 102[27]–300[8] **-කථාවාද** (නා)= 1 අර්ථ කථා වාදය. අටුවාවල දක්නා විසතර කථා මාර්ගය. **අත්ථ කථා පාළිය.** සා:පා:466[35], **-කථික** (නා) (කථා + ණික)= අර්ථකථාචාර්යයෝ. අටුවා ඇදුරෝ. සු: නි: අ: 266[19]. **-කදලන** (නා)= දැනි පෝරුව වැනි දත් ඇති පුද්ගලයා. පැවිදි නො කළ යුතු පරිස දූෂකයෙක්. සා: පා:768[38] **-කනන** (නා) [සං. කර්තන]= එනම් බත. තුදුස් බතට ඇතුළත් නැති, බත් සතරින් එකක්. 1 විහාර කර්තන 2 අර්ථකකර්තන 3 වතු කකර කර්තන 4 ගුලක කර්තන යන සතර අටුවා යෙහි දක්නේය. භික්ෂූන් අට නමකට දෙමුයි කියා දුන් බත අර්ථක කර්තන නම් වේ. මෙය සලාක කර්තනය වැනි වේ. සා: පා: 937[38] 938[3]. **-වගග** (නා)= අෂ්ටක වර්ගය. සූත්‍ර නිපාතයේ සූත්‍ර සොළසකින් යුක්ත වූ එක් වර්ගයක්. මහාවග්ගපාළියේ චම්මක්ඛන්ධකයේ දක්නා පටිදි සොණ තෙරුන් නිතර මෙනෙහි කළ බුදුන් ඉදිරියෙහි පැවසූ සූත්‍ර සමූහය. සූත්‍ර නිපාතයේ මේ ''අට්ඨක වග්ගය'' සඞ්ගායනා වන්ට පෙර පටන් හෙවත් බුදුන් දවස පවා වෙන ම කොටසක් මෙන් සකස් වූ සේ සල කති. සොණ තෙරුන් පවා මෙසේ භාවිත කරන ලද්දේ එබැවිනි. දිව්‍යාවදාන නම් බෞද්ධ සංස්කෘත ග්‍රන්ථයේ මෙය හඳුන් වන්නේ ''අර්ථක වර්ග'' යනුවෙනි. ''එකනාසඤ්ච භගවතා අර්ථක වර්ගියෙභූ''– ''දීර්ඝතම උදාන සථවිරගාථා මුනිනාථා අර්ථකවර්ගියානි'' යනු දිව්‍යාවදානයේ පාඨ දෙකකි. අර්ථක වග්ගයේ සූත්‍රවල දක්නා අදහස් ද, ඒවාහි භාෂා විලාශය ද, ඉතා ම පැරණිය. පිටකත්‍රයට අයත් කිසිග්‍රන්ථයක නො දක්නා පුරාණතම පාළිගබද දක්නේ මෙහිය. **ඉමයා** සු: නි: 106[2] (=ඉත්‍රියෝ) **අවිදූනියා** සු: නි: 106[17], (=අවදූනා ?) **චුතාසෙ** සු: නි: 106[19], (=චුතා) **තණහාසෙ** සු: නි: 106[37], (=තණහා) **පාවා** සු: නි: 107[23] (=පවදති) **ආතුමානං** සු: නි: 107[25], (=අත්තානං) **අච්ච දූතා** සු: නි: 108[2] (=අවොදූනා) **පාව** සු: නි: 108[25], (=පවදති) **වදූනං** සු: නි: 108[25]. (=වොදූනං) **සිතාසෙ** සු: නි: 109[1] (=නිසසිතා) **සිකඛිසසාමසෙ.** සු: නි: 111[25] (=සිකඛිසසාම) **මොසවජජං** සු: නි: 112[10], (=මුසාවාදං) **වදූනා** සු: නි: 121[24] (= වාදූ) **සීනං** සු: නි: 128[12] (=ඉත්‍රීනං) **පණ්ඩිතාසෙ** සු: නි:119[12] (= පණ්ඩිතා) **නිථ්‍යා** සු: නි:121[19] (=නිත්‍රියා) **කමයා** සු; නි: 116[28] (=කාමෙන) **කුවං** සු:නි: 131[5] (=කව) **කුවජජ** සු: නි: 131[6]. (=කවජජ)

මෙබඳු ඉතා පැරණි පාළි ශබ්ද රාශියක් ම එහි දක්නේය. මෙසේම අර්ථ පක්ෂයෙන් ද ඉතා සාරවත් වූ බැවින් මේ වගීය භාරතීය පඬිවරු "අර්ථික වර්ග" යි සලකන ලදැයි සිතිය යුතුය. සංසකෘත "අර්ථික-අෂ්ටක" ශබ්ද දෙකම පාළි යට බිඳී එනුයේ "අටඨක" යනුවෙනි. මහා: පා: 2311, චි: ච: ටී: 42988, සු: නි: 10516. -වගසිඛ (නා) (වගග + ණික)= අෂ්ටක වර්ගීයට ඇතුළත්. සූත්‍ර නිපාතයේ අටඨක වග්ගයට ඇතුළත් සූත්‍ර දහසය. මහා: පා: 2311. චි: ච: ටී: 429312 -කුඛ්ඛ (නා)= අට උළක්කුවක්. අට පතක්. ඔමික පාත්‍රයෙහි මාන ප්‍රමාණය. අට උළක්කුවකට අඩු ඔදනය ගන්නා පාත්‍රයෙන් පිඬු සිඟා යැපෙන්නට නො හැකිය. කුඛ්ඛ නම් පසතය හෙවත් පතයි. එනම් උළක්කුවයි. "නහි සක්කා අට්ඨ කුඛ්ඛතෝ ඌනොදන ගාහිනා පත්තෙන අද්ධිකතං පිණ්ඩපාතං පරියෙසිත්වා යාපෙතුං." චි: ල: 7214, අ:ප:ස: 669 -කුලදූසණ (නා) [සං. දූෂණ]= අෂ්ට කුල දූෂණය. කුලයන්ගේ ශ්‍රද්ධාව දූෂණය කරන අට වැදෑරුම් ක්‍රියා. චීවරාදී ප්‍රත්‍යය ලාභය උදෙසා කුල සංග්‍රහය පිණිස. 1 මල් 2 ගෙඩි 3 සුණු 4 මැටි 5 දූතැටි සහ හුණපත් දීමද 7 වෛදකම් කිරීම ද, 8 ගිහියන්ගේ හසුන් ගෙන ගොස් දීම්, පිළිතුරු හසුන් ගෙන ඒම් ආදිය ද, යන අට. මෙහි මල් නම් සදුමල් ඉද්දමල් ආදි මල්ය. ගෙඩි නම් අඹ, දඹ කැඹිලි, ආදී ඵලයි. සුණු නම් මහරි සුණු පලා සුණු ආදිය සි. සෙස්ස සුගමය. පාරා:පා: 219111, සං:පා: 45283-45383-45548, ඛ:අ:ගැ:143111 චි: මා: ස: 505, චි: ච: 439, සි: ව: චි: 6414, කු: සි: ස: 97386. (කුල දූෂනයි ද දක්නේය) -කුසින වත්ථු (නා) [සං. කුසීද + වස්තු]= අට වැදෑරුම් කුසීද වස්තු. අලස බව උපදවන කරුණු අට. 1 කම්මං කාතබ්බං 2 කතං අකාසිං 3 මඤ්ඤා ගන්තබ්බා 4 මඤ්ඤා ගන්තබ්බා අනමාසිං 5 නාලත්ථං හොජනස්ස පාරිපූරිං 6 හොජනස්ස පාරිපූරිං අලත්ථං 7 උපපන්නෝ මේ ආබාධෝ 8 අවිර වුට්ඨිනෝ ගිලානසුඛං යන වස්තු අට. චි:ච:ටී: 88110. සං: දි: 412335. -ඛණ්ඩාණ (නා)= අට කොණ. එබඳු සටහණ. ගණ්ඨික පටට පාසක පටවලයන්හි නො මැසිය යුතු එක් ආකාරයක්. චි: ච: 3035 චි: ල: 2717. -ගරුධම්ම (නා)= අෂ්ට ගරු ධර්ම. ගරුධර්ම අට. භික්ෂුණීන් විසින් දිවිහිමියෙන් ගරුකොට විසිය යුතු ධර්ම අට. 1 උපස පන් වීමෙන් සියක් වස් ඇති භික්ෂුණියක වුවත් එදවස් උපසපන් භික්ෂුවට ගරුබුහුමන් කළ යුතුය. 2 අඩ යොදුනක් තුළ භික්ෂූන් නැති ආවාසයක භික්ෂුණියක් වස් නොඑළඹිය යුතුය. 3 භික්ෂුණීන් විසින් අඩමාසක් පාසා භික්ෂූන් වෙත එළඹ පොහෝ විචාරා අවවාද ලැබිය යුතුය. 4 වස් දිවූ භික්ෂුණිය උභතෝ සඞ්ඝයා කෙරෙහි පවාරණය කළ යුතුය. 5 ගරුකාපත්තියට පැමිණි භික්ෂුණිය උභතෝ සඞ්ඝයා කෙරෙහි මානත හැසිරිය යුතුය. 6 දෙවසක් කරුණු සයෙක්හි භික්ෂුණී ශික්ෂා මානාව උභතෝ සඞ්ඝයා කෙරෙහි උපසම්පදා විය යුතුය. 7 භික්ෂුණියක විසින් කිසිම ක්‍රමයකින් භික්ෂුවට නින්ද පරිභව නො කළ යුතුය. 8 භික්ෂුණියක විසින් භික්ෂූන්ට අවවාද නොකළ යුතුය යනු අෂ්ට ගරු ධර්මයි චූ: පා: 3987 පාචි: පා: 5625, මහා: පා: 2015 සා: පා: 58029 -ගුණසමුපෙතං අසඤ්ඤං (නා) ගුණ අටකින් යුක්ත වූ ආශ්‍රමය= අසඤ්ඤ. ජා:අ:කැ: 73, ජා: අ: ගැ: 1121 (අට්ඨසමණසුඛ බලනු) -ගුණ සමුපෙතං විඤ්ඤාණං (නා) ගුණ අටකින් යුක්ත වූ විඤ්ඤාණය. පඤ්චාභිඥාවන් ලැබීමට හෙතු වූ විඤ්ඤාණය. 1 සමාහිතෙ චිත්තෙ 2 පරිසුද්ධෙ 3 පරියොදාතෙ 4 අනඞ්ගණෙ 5 විගතෙ උපක්කිලෙසෙ 6 මුදුභූතෙ 7 කම්මණියෙ 8 ආනෙඤ්ජප්පත්තෙ යන ගුණ අට. ජා: අ:ගැ: 10335, ජා: අ: ක: 644. -චරියා (නා) [සං. චර්යා]= අට වැදෑරුම් චර්යාවන්. 1 ඉරියාපථ චරියා 2 ආයතන චරියා. 3 සතිචරියා 4 සම්මාධිචරියා 5 ඤාණචරියා 6 මග්ගචරියා 7 පත්තිචරියා 8 ලොකත්ථචරියා යන අට. සු: නි: අ: 43383 -චීවර මාණිකා (නා) (මාතු + ණික + ආ) [සං. මාතෘකා]= අෂ්ට චීවර මාතෘකා. චීවර ක්ෂේත්‍ර අට. චීවරොත්පත්තියට මුල් වූ කරුණු අට. 1 සීමාය දෙති 2 කතිකාය දෙති 3 භික්ඛා පඤ්ඤත්තියා දෙති 4 සඞ්ඝස්ස දෙති 5 උභතෝ සඞ්ඝස්ස දෙති 6 වස්සං වුත්ථ සඞ්ඝස්ස දෙති 7 ආදිස්ස දෙති 8 පුග්ගලස්ස දෙති යනුවෙන් දක්වන ලද අෂ්ට මාතෘකා. මහා: පා: 34615, චි: ච: 2726, ක: චි: 583561-61382, සා: පා: 842216, (අට්ඨමාතිකා 1 බලනු). -ඨානඛායපාගඛහිය (නා) (පගඛහ + ණික= ඉය) [සං. ප්‍රගලභ]= අට තැනෙක්හි කයින් නුසුදුසු දේ කිරීම. අඤ්ඤ ඨානයෙක්හි පවත්නා කායික අසංවරය, අවිනීත ක්‍රියා. 1 සඞ්ඝ

2 ගණ 3 පුණ්ණ 4 හොජනසාලා 5 ජනතා ඝර 9 නහාන තිත්ථ 7 භික්ඛාචාර මග්ග 8 අනනර ඝරපවෙසන ඇත මේ අට තන්හි කසින් අසංවර වීම. යම්කිසි භික්ෂුවක් 1 සඞ්ඝයා මැද හෝ 2 ගණයා මැද හෙවත් සිව් පිරිස මැද හෝ 3 වැඩි මහළු භික්ෂූන් මැද නෝ හිදී ද, 4 හොජන ශාලාවෙහි වැඩි මහළු භික්ෂූන්ට අසුන් නොදේ ද, නවක භික්ෂූන්ට අසුන් වළක්වා ද, 5 ජනතා ඝරයෙහි තෙර මහණුන් නො පිළිවිස හිනි දල්වා ද, 6 නහන තොට පැමිණි පිළිවෙළින් නැම නොකොට පසුව පැමිණ සග මහළු මහණුන් වළඳා ද, 7 පිඬු පිණිස හැසිරෙන මනෙහි, අග්‍රාසන අග්‍රොදක, අග්‍ර පිණ්ඩ පිණිස මහළු භික්ෂූන්ට පෙරටුව හෝ අතින් අත ඔවමින් හෝ යේ ද 8 අනනරඝරයෙහි මහළු භික්ෂූන්ට පළමුව පිවිසේ ද, දහර මහණුන් සමග කෙළි සෙල්ලම් කෙරේ ද, මේ අටඨ ඨාන කායපාගබ්භිය නම් වේ. සු: නි: අ: 139[27] **-තිංසාරම්මණ** (නා) (ආ + √රභ + ණ) [සං. ආලම්බන]= අවතිස් අරමුණු. කම්මස්ථානයන්හි සඳහන් අරමුණු තිස් අට. පඨවි, ආපෝ, තෙජෝ, වායු, නීල පීත, ලෝහිත ඔදාත, යන අට කසිණය ද, උඹුමාතක. විනීලක, විපුබ්බක, විච්ඡිද්දක වික්ඛායිතක, හත වික්ඛිත්තක, ලොහිතක, පුළුවක, වික්ඛිත්තක, අට්ඨික, යන දශවිධ අශුභය ද; බුද්ධ, ධම්ම, සඞ්ඝ, සිල, චාග, දෙවතා උපසම, යන සත අනු ස්සති ද; කායගතාසති මරණ සති, ආනා පාන සති, යන ත්‍රිවිධ අනුස්සතියද: මෙත්තා, කරුණා; මුදිතා, උපෙක්ඛා යන චතු බ්‍රහ්ම විහරණ ද; ආකාසා නඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන ආකිඤ්ඤඤ්ඤායතන, නෙව සඤ්ඤා නාසඤ්ඤායතන යන සතර අරූපාවචරයන් ද; චතුධාතු වවත්ථාන, ආහාරෙ පටිකූල සඤ්ඤා යන දෙක දැයි මේ සියල්ල අටතිස් අරමුණු නම් 8 + 10 + 7 + 3 + ෟ + 2 = 38 කැ: ව: 307 **-තිංසිය වත්ත** (නා) [සං. වෘත]= අවට තීර්ථක වත. තීර්ථකයන් විසින් පිළි පැදිය යුතු අවට වතය. තීර්ථක පරිවාසය සම්පූර්ණ කිරීමට නො පිරිහෙලා පිරිය යුතු වත් අට. 1 වැඩිකල් ඇතිව පිඬු පිණිස ගම් නො පිවිසීම සහ කල් ගත නො කොට පෙරළා වෙහෙරට පැමිණීම 2 වෙසිය ගොචර නො වීම 3 සබ්‍රහ්මචාරීන්ගේ කුදු මහත් කටයුත්තෙහි නියැලිව විසීම 4 උදෙසීම් ආදියෙහි වැඩි ආශාවක් දැක්වීම 5 තීර්ථකයන්ගේ අගුණ කිමට සතුටු වීම 6 බුද්ධාදි රත්නත්‍රයේ අගුණ කියන කල සතුටු නොවීම 7 තීර්ථකයන්ගේ ගුණ කීමට සතුටු නො වීම 8 බුද්ධාදි රත්නත්‍රයෙහි ගුණ කියන කල සතුටු වීම යන වත අට. මහා: පා; 78[88] ම: පා: ස: 257[81] සැ: පා: 740[85] (අපටිවජ්ඣනා පරිවාස ඛලත්තු) **-දිසා** (නා) [සං. දිශා]= අට දිශාව 1 නැගෙනහිර 2 ගිනි කොණ 3 දකුණු 4 නිරිත 5 බටහිර 6 වයඹ 7 උතුරු 8 ඊශාන යන අට දිශාව 2 අඤ්ඤ සමාපත්ති ව; වි: වී: 4811 **-දුක්කට** (නා) (දු + √කර + ත) [සං. දුෂ්කෘත]= දුෂ්කෘතාපත්ති අඟකය අට වැදෑරුම් දුකුළා ඇවැත්. 1 පුබ්බ්‍යොග දුක්කට 2 සහපයොග දුක්කට 3 අනාමාස දුක්කට 4 දුරූප විඤ්ඤ දුක්කට 5 විනය දුක්කට 6 සූත දුක්කට 7 ඝනති දුක්කට 8 පටිසාර දුක්කට යන අට. එහි 1 සොරසින් ඇතිව මේරමා නුදුන් බිම් කැණ සඟවා තුබූ දෙය ගනු පිණිස දෙවැන්නකු හෝ උදලු පැස් ආදිය හෝ සොයා ද, එහි දී **පුබ්බප්‍යොග දුක්කටය** වේ, 2 ඒ වස්තුව තුබූ තැන හටගත් ගසක් හෝ වැලක් සිඳිද එහි **සහ පයොග දුක්කටය** වේ. 3 දශවිධ රත්නයන් හෝ සප්තවිධ ධාන්‍යය හෝ **සපශී** කරන්නහුට **අනාමාස දුක්කටය** වේ. 5 කෙසෙල් පොල් ගස් ආදියේ හටගත් ගෙඩි ආමිශීනය කරන්නහුට **දුරූපඛිණ්ණ දුක්කටය** වේ. 5 පිඬු පිණිස හැසිරෙන්නහුගේ පාත්‍රයෙහි රජස් හෝ වැටිණි නම් පාත්‍රය නො පිළිගෙන හෝ නො සෝදා හෝ එහිදීම භික්ෂාව ගන්නහුට **විනය දුක්කටය** වේ. විනයෙහි පැණවූ දුක්කටය බැවින් එනම් විය. 6 සඞ්ඝයා බිඳුවීම පිණිස එත්සාහ කෙරේයයි අසා එය වැළක්ම පිණිස දැනගත් කරුණු නොකියන්නහුට **සූත දුක්කටය** වේ. 7 එකෙළොස් ඇමතුහාඝණ කර්මයන්හි ඝනතිය නැබීමෙන් වන දුකුළාව ඝනති දුක්කට නම් වේ. එකොළොස් ඇමතුහාඝණ නම්; භික්ෂු ප්‍රාතිමොක්ෂයෙහි යාව තතියක සඞ්ඝාදි සෙස සතර සහ අටඨ ශික්ෂාපදය ද යන පසද; භික්ෂුණී ප්‍රාතිමොක්ෂයෙහි එක් යාවතතියක පාරාජිකාව ද, සඞ්ඝාදිශෙෂ සතර ද, චණ්ඩ

Free Distribution

කාලි ශික්ෂාපදය දූසි යන එකලොස වේ. 8 **පවිසාවෙ දූකකටය නම්**; වස්සාවාසාදිය පිළි බඳව ප්‍රතිඥ කොට එය ඉටු නො කරන්නහුට සිදුවන දුකුළාවයි. ස: පා: 224[36] සා:දී:501[35] වි: වි: ටී: 148[19] **–දූතෙය්‍යඛන්ධ** (නා)=අෂ්ට දූතා ඛන්ධ. දූත භික්ෂුව කෙරෙහි පිහිටිය යුතු අඩංග අට 1 සොතා (=මනාව අසන්නෙක්; වෙයිද,) 2 සාවෙතා (=මනාව අස්වන්නෙක් වෙයි ද) 3 උභතොඅතා (=ඉතෙන ගන්නෙක් වෙයි ද) 4 ධාරෙතා (=උගත් දේ දරන්නෙක් වෙයි ද) 5 විඤ්ඤුතා (=කරුණු දැනන්නෙක් වෙයි ද) 6 විඤ්ඤුපෙතා (=දන්වන්නෙක් වෙයි ද) 7 කුසලො සහිතා සහිතස්ස (=තෙවළාවූ හා තෙවළාවට විරුද්ධ ධර්මය පිළිබඳ දක්ෂයෙක් වෙයි ද) 8 නො ච කලහකාරකො (=කලහ කරුවෙක් නොවෙයි ද) යන කරුණු අටෙන් යුක්තවූ භික්ෂුව දූත ක්‍රියාවෙහි යන්නට සුදුසු සුදු. චූ: පා: 330[8] චූ: පා: B 219[80] **–දූසය** (නා) (√දූස + ණ) [සං, දොෂ]= දූස් අට. සුවිමල තවුස් බෝසතුන් දුටු පන්සල් පරිහෝගයෙහි දූස් අට. ජා: අ:කා: 9[5] (අටඨ ආදීනව බලනු) **–ධම්ම** 1 (නා)=අෂ්ට ධර්මය. ගරුධම්ම පටිග්ගහණ උපසම්පදාවෙහි සඳහන් කරුණු අට. මහා ප්‍රජාපතී ගෞතමියට අනුදත් උපසම්පදාවෙහි සඳහන් අෂ්ට ධර්මය. කං: වි: පි: 15[2] චූ: පා: 398[7] (අඤ්ඤ ගරුධම්ම බලනු) **–ධම්ම** 2 (නා =අෂ්ට ධර්මය. බුදු බව පතන බොධි සත්ත්වයන්ගේ වෙත පිහිටිය යුතු ධර්ම අට ජා: අ: කා: 38[21] (අටඨ අභිනීහාර බලනු) **–ධම්ම** 3 (නා)=අෂ්ට ධර්මය. පඨවි, ආපො, තෙජො වායු, වණ්ණ, ගන්ධ. රස, ඔජා යන ශුද්ධාෂ්ටක රූපය. වි: මා: ස; 879[9] **–ංවිදූ**(නා)– අෂ්ටධර්මය දන්නා. කරුණු අටක් දත්. කඨිනත්ථාරක භික්ෂුව විසින් දත යුතු කරුණු අට දන්නා 1 පුබ්බ කරණ 2 පච්චුද්ධාර 3 අධිට්ඨාන 4 අත්ථාර 5 මාතිකා 6 පළිබොධ 7 උද්ධාර 8 ආනිසංස යන කරුණු අට දන්නා. මෙහි **පුබ්බකරණ** නම් කඨින වස්ත්‍රය ලැබ පළමුව කටයුතුවූ 1 ධොවන (=සේදීම) 2 විචාරණ (=පස්කඩ සත්කඩ යනාදීන් කඩ අතු බෙදූ තුල් ගැසීම) 3 ඡේදන (=කඩ අත් බෙදූ පරිදි කැපීම) 4 බන්ධන (=හිස් නූල් නැගීම හෙවත් කටු ගැසීම) 5 සිබ්බන (=හිස් නූල් නැතු පරිදි මැසීම) 6 රජන (=රඳන් දීම හෙවත් පඬු පෙ වීම) 7 කප්පකරණ (=කප් බිඳූ තැබීම) යන කරුණු සතයි. 2 **පච්චුද්ධාර නම්**; තුන් සිවුරු පිළිබඳ අධිෂ්ඨානය අත් හැරීමයි. සඟළ සිවුරෙන් කඨිනය අතුරනු කැමැති නම් "ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි"යි පොරණ සඟළ සිවුර **පච්චුද්ධරණය** කරන්නේය. ඉදින් උතුරු සඟළ හෝ අන්තරවාසකයෙන් කඨිනය අතුරනු කැමැත්තේ නම් "ඉමං උත්තරාසඞ්ගං පච්චුද්ධරාමි"යි උතුරු සඟළ හෝ "ඉමං අන්තර වාසකං පච්චුද්ධරාමි" යි අන්තරවාසකය හෝ පච්චුද්ධරණය කරන්නේය. මෙසේ පච්චුද්ධාරය මේ සිවුරු තුනෙන් යුක්තය. 3 **අධිට්ඨාන නම්**; තුන් සිවුරු ඉටීමයි. "ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි" යි සඟළ සිවුර හෝ "ඉමං උත්තරා සඞ්ගං අධිට්ඨාමි" යි උතුරු සඟළ හෝ "ඉමං අන්තරා වාසකං අධිට්ඨාමි" යි අන්තරවාසකය හෝ ඉටීමයි. කායාධිට්ඨාන – වාචාධිට්ඨාන; සම්මුඛාධිට්ඨාන – පරම්මුඛාධිට්ඨාන යනුවෙන් ද අධිෂ්ඨානයාගේ ප්‍රභේදයෝ වෙත්. 4 **අත්ථාර නම්**; වාග් භෙදයෙන් කරන ඇතිරීමයි. "ඉමාය සඞ්ඝාටියා කඨිනං අත්ථරාමි"යි සඟළ සිවුරෙන් හෝ "ඉමිනා උත්තරා සඞ්ඝෙන කඨිනං අත්ථරාමි" යි උතුරු සඟළ සිවුරෙන් හෝ හෝ "ඉමිනා අන්තරාවාසකෙන කඨිනං අත්ථරාමි"යි අන්තර වාසකයෙන් හෝ වාග් භෙදයෙන් කඨිනය ඇතිරීමයි. 5 **මාතිකා නම්**; 1 පක්කමනාතිකා 2 නිට්ඨානාතිකා 3 සන්නිට්ඨානාතිකා 4 නාසනාතිකා 5 සවණාතිකා 6 ආසාවච්ඡෙදිකා 7 සීමාතික්කමනාතිකා 8 සහුබභාර යන අෂ්ට මාතෘකාවයි. (අටඨකඨිනුබභාර බලනු) 6 **පළිබොධ නම්**; ආවාස පළිබොධය සහ චීවර පළිබොධය යන දෙකයි. 7 **උද්ධාර නම්**; පක්කමනාතිකා ආදීවූ සහුබභාරාවසානවූ අෂ්ට මාතෘකාවයි. හෙවත් අෂ්ට කඨිනුබභාරයයි. මෙයින් එකම අන්තරුබභාර කඨිනුද්ධාරය පමණක් උබභාර මූලක ආනිසංස හෝ හෝ ශ්‍රද්ධා පරිපාලනය හෝ සලකා සඞ්ඝ තෙමේ ඤත්ති දුතිය කම්ම වාක්‍යයෙන් උද්ධරණය කරන බැවින් සඞ්ඝයා අයත් වේ. පක්ක මනාතිකා. නිට්ඨානාතිකා. සන්නිට්ඨාන නාතිකා. සීමාතික්කමනාතිකා යන සතර අත්ථාරක භික්ෂුව කෙරෙන් පමණක් සිදු වන බැවින් පුද්ගලයාට අයත් වේ. නාසනාතිකා– සවණාතිකා–ආසාවච්ඡෙදිකා–සහුබභාර යන සතර

අප්පාරක භික්ෂුව කෙරෙන් හෝ **සඞ්ඝයා** කෙරෙන් සිදු නො වී තෙමේ ම **සිදු වන** බැවින් නො ද සහසතු නො ද පුහුල් සතු වේ. 8 **ආනිසංස** නම්; 1 අනාමන්තචාර 2 අසමාදාන චාර 3 ගණභොජන 4 යාවදත්ථචීවර 5 යො ච තත්‍ථ චීවරුප්පාද යන පඤ්ච ආනිසංසයයි. මේ අෂ්ට ධර්‍මය දන්නා භික්ෂුව කඨිනත්‍ථාරයට සුදුසුය. ච: ච: 2704, ච: ලං: 346[26]-355[30]-358[14], මහා:පා: 289[15], සා:පා: 821[29], පරි:පා: 233[5]. **-ධම්මික පාතිමොක්ඛඨපන** (නා)= ධාර්මිකවූ පාමොක් බහා තැබීම් අට. පාමොක් බහා තැබීම **නම්**; පාමොක් **නො** උදෙසීමයි. හෙවත් තහනම් කිරීමයි. 1 මුල් කරුණක් සහිත වූ නො කරන ලද ශීල විපත්තියෙන් පාමොක් බහා තැබීම 2 මුල් කරුණක් සහිත වූ කරන ලද ශීල විපත්තියෙන් පාමොක් බහා තැබීම යනුවෙන් සමූලික **කත** අකත භෙදයෙන් පාමොක් බහා තැබීම් දෙකකි. මෙසේ ම ආචාර විපත්ති දිට්ඨ විපත්ති ආජීව විපත් තීන්ගේ වශයෙන් ද දෙක බැගින් ලැබ ධාර්මික පාමොක් බහා තැබීම් අටක් වන්නේය. අධාර්මික ප්‍රාතිමොක්ෂ ඨපනයෝ ද අටක් වෙති. එය අමූලික කතා **කත** විපත්තීන්ගේ වශයෙන් දත්තේය. චූ: පා: B 375[11]. **-නනං ආසනං දාතබ්බං** = අට දෙනෙකුන්ගට අසුන් දිය යුතුය. භක්ෂාග්‍රයෙහිදී වැඩිමහළු පිළිවෙළින් භික්ෂුණීන් අට දෙනෙකුන්ගට සෙසු භික්ෂුණීන් විසින් අසුන් දිය යුතුය. වෘද්ධ පරිපාටියෙන් **භික්ෂුණීන්** අට දෙනකු වැඩ හුන් පසු සෙසු භික්ෂුණීන්ට පැමිණි පැමිණි පිළිවෙළින් අසුන් ගැනීම වරදී. මේ වැනි මහළු පිළිවෙල සලකන්නට නියම කරන ලද්දේ භක්ෂාග්‍රයෙහිදී පමණෙකි. පරි: පා: 188[31] සු: ප: 146[8]. **-නනං පවාවුට්ඨාතබ්බං** = අට දෙනකුන් දැක හුනස්නෙන් නැගිටිය යුතුයි. භක්ෂාග්‍රයෙහිදී වැඩි මහළු පිළිවෙළින් අට දෙනකු දැක හුනස්නෙන් නැගිටිය යුතුයි. මේ දෙ නැනදීම භික්ෂුණීන් අට දෙනකුන් කෙරෙහි පමණක් වැඩිමහළු පිළිවෙළ සලකන්නට නියම **කරන** ලද්දේ භක්ෂාග්‍රයෙහිදී පමණකි. පරි: පා: 188[36], සු:ප: 146[8], සා: පා: 992[27]. **-නිමිත්ත** (නා)= **අෂ්ට** නිමිති. සීමා බන්ධනයෙහි සුදුසු සේ සැලකෙන නිමිති අට. බද්ධ සීමාවේ අවසානය (=මායිම) **ඇඳුන්වන** ලකුණු. 1 පබ්බත නිමිත්ත 2 පාසාණ නිමිත්ත 3 වන නිමිත්ත 4 රුක්ඛ නිමිත්ත 5 මග්ග නිමිත්ත 6 වම්මික නිමිත්ත 7 නදී නිමිත්ත 8 උදක නිමිත්ත යන අට. මෙහි **1 පබ්බත නිමිත්ත** හෙවත් නිමිත්ත කීනයට සුදුසු පර්‍වතය නම්; 1 සුද්ධපංසු (හුදු පස් පර්‍වතය) 2 **සුද්ධ** පාසාණ (හුදු ගල් පර්‍වතය) 3 උභය මිස්සක (පස් හා ගල් මිශ්‍ර පර්‍වතය) වශයෙන් තෙවැදෑරුම් වූ, සත්‍රියන් පමණ ඇතෙකු සා පර්‍වතයෙහි පටන් ඉන් වැඩි පර්‍වතයයි. ඉන් අඩු පර්‍වතය නිමිත්තුපග නොවේ. 2 **පාසාණ නිමිත්ත** නම්; දෙතිස් පලමක උක්කංසකූරු පිඬක් පමණ සිට සත්‍රියන් ඇතෙකු පමණ වූ පාෂාණයයි. මින් අඩු වූයේ හෝ වැඩි වූ යේ නිමිත්තුපග නොවේ. 3 **වන නිමිත්ත** නම්; ඇතුළත අරටුව ඇති හෝ අරටුව මුසු වූ, යටත් පිරිසෙයින් ගස් සතරකින් හෝ පස කින් හෝ යුක්ත වූ වනයයි. එසින් අඩු වූයේ නිමිත්තුපග නොවේ. 4 **රුක්ඛ නිමිත්ත** නම්; නො මළ, අරටුව ඇති, බිම පිහිටි යටත් පිරිසෙයින් උසින් අටඹුලකට නො අඩු, මහතින් ලක් දිව පන්නිද් දණ්ඩක් සාමහැකි වූයේ නිමිත්තුපග රුකයි. එසින් අඩු වූයේ නො වටී. 5 **මග්ග නිමිත්ත** නම්; දෙතුන් ගම් කෙතක විනිවිද යන, මිනිසුන් පරිභොග කරන අඩි පාර හෝ රිය මගයි. පරිභොග නො කරන මග නිමිත්තුපග නොවේ. 6 **වම්මික නිමිත්ත** නම්; එ දවස් හටගත් අටඹුල් පමණ ගෙරි අහක් පමණ වූ තුඹස පටන් ඉන් වැඩි තුඹස සුදුසු වේ. ඉන් අඩු වූයේ නිමිත්ත කීනයට සුදුසු නොවේ 7 **නදී නිමිත්ත** නම්; අඛද්ධ සීමා ලක්ෂණයෙහි එන නදියයි. එනම්; නෙ මඩුලු වසා හැඳගත් හඳනා සිවුර නො ඔසවා නොටින් හෝ නො තොටින් එතරවන මෙහෙණකගේ එම අඳනා සිවුර අඟලක් හෝ දෙකක් තෙමේ නම් එය හටගත් තැන් පටන් නදිය නම් වේ. එබඳු නදිය නිමිත්තුපග වේ. 8 **උදක නිමිත්ත** නම්; ගලා නො බස්නා ජලය ඇති වළ, පොකුණු, විල්, කලපු, ආදිය පටන් එකෙණෙහි කැණූ වළකු වත්කළ වතුර කම්මාෂ්‍යය අවසන් වනතුරු නො සිඳේ නම් එය ද සුදුසුය. ගලා බස්නා ජලය හෝ **කම්** මාෂ්‍යය අවසන් වනතුරු නො පවත්නා දිය ඇති වළ හෝ නො වටී. සා: පා: 773[33], කැ:වි

5^{23}–7^{5}, **කැ**: වි: පි: 5^{8}–11–^{28}, **මැ**: පා:ස: 500^{12} වි: වි: 2563, වි: ල: 205^{30}, වි: වි: ටී: 397^{6}. **-පවවයා භූමිචාලස්ස පාතුභාවාය**= 1 පෘථිවි කම්පාවට හේතු වූ කරුණු අට. 1 ධාතුක්ෂෝභය 2 සෘද්ධිමත්කමේ අනුභාවය 3 බෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීම 4 මව්කුසින් නික්මීම 5 බුදුබවට පැමිණීම 6 ධර්මචක්‍ර ප්‍රවර්ත්තන 7 ආයුසංස්කාරය අත් හැරීම 8 පරිනිර්වාණ ලාභ යන කරුණු අට. (2) මහබිනිෂ්ක්‍රමණ කිරීම 2 බෝමැඩට එළඹීම 3 පංසුකූල චීවරය පිළිගැන්වීම 4 එය සේදීම සහ 5 කාලකාරාම 6 ගොතමක 7 වෙස්සන්තර ජාතක 8 බ්‍රහ්ම ජාල සූත්‍රය යන දෙශනාවන් පැවැත්වීම ද, පෘථිවිකම්පාවට හේතු වූ කරුණු අටකි. අඞ්ගු: නි: 805[33] දී: නි: 141^{4} **-පද** (නා) දූ කෙළින පුවරුකඩ. දුදුපෙත. දූ කෙළින පිණිස හිරි සිඳ කළ පුවරුව. අට මඩුලු පෝරු කෙළිය අවැස් ඇති දුදු පෙතයයි ද කියත්. සාරී ඵල කය. පාරා: පා: 214^{12}, සා: පා: 448^{2}, වි:වි:ටී: 438^{12}–456^{18}, අ: ප: ස: 72^{34}, දී: නි: B 15^{18} (අට්ඨාපදයි ද දක්නේයෙ.) **-පදඛ** (නා) (පද + ක)= දූ කෙළින පුවරුකඩ දූ කෙළින පුවරු යෙහි හිරි සිඳීම මෙන්. සිවුරෙහි පත් (=අතු) මැසුමට නියම කළ ආකාරය. "අනුජානාමි භික්ඛවෙ අට්ඨපදකං කාතුනති" මහා: පා: 333[39], සා: පා: 837^{12}, වි: වි: ටී: 438^{12}. **-පදඛලෙඛා** (නා) [සං. රෙඛා]= දූ පෝරුවක හිරි සිඳීම මෙන්. සමූහනය කටයුතු සීමා භූමියෙහි ඉරි අඳින ආකාරය සමූහනය කටයුතු සීමා භූමිය කැටපතක් මෙන් සමව පිරිසුදු කොට නියමිත මඤ්ච ප්‍රමාණසථානයෙහි දූ පුවරුවක මෙන් රූහැණින් හෝ දණෙඩන් හෝ හිරි සිඳ ඒ රෙඛානුසාරයෙන් තබවන් මැටිසුණින් හෝ සටහන් කර.... වි: ලං: $2^{4}3^{35}$ (සීමා සමූඛන බලනු) **-පන** (නා) (ආ + ඨපන) (ආ + √ඨප + යු= අන)=ආදී කොට තිබීම හෝ ආදර යෙන් තිබීම. සිව් ඉරියව්වෙහි කරන කුහක පැවැත්ම. "ආකාරස්ස රස්සං කත්වා අට්ඨපනානි වුත්තං" වි: ම: ටී: 46^{18}, වි: ම: ස: 74^{21} **-පරම** (නා)= පරම ශබ්දයෙන් දෙසූ ශික්ෂාපද අට. තුදුස් පරම ශික්ෂාපදයන්ගෙන් පළමුවන අට. 1 දසාහ පරමං අතිරෙක චීවරං ධාරෙතබ්බං 2 මාසපරමං තෙන භික්ඛුනා තං චීවරං නික්ඛිපිතබ්බං 3 ඡත්තරුත්තර පරමං තෙන භික්ඛුනා තතො චීවරං සාදිසිතබ්බං 4 ඡක්ඛත්තු පරමං තුණ්හීභූතෙන උද්දිස්ස ඨාතබ්බං 5 නවං පන භික්ඛුනා සන්තං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරෙතබ්බානි ඡබ්බස්ස පරමං තං ධාරෙතබ්බං 6 තියොජන පරමං සහත්ථා හාරෙතබ්බානි 7 දසාහපරමං අතිරෙක පත්තො ධාරෙතබ්බො 8 සත්තාහ පරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි"යන ශික්ෂා පද අට. ධර්: පා: 188^{33}, ස: පා: 993^{33}. **-පරිකඛාර** (නා) [සං. පරිෂ්කාර]= අට පිරිකර. භික්ෂුවකට උවමනා පිරිකර අට. 1 සඟළසිවුර හෙවත් දෙපට සිවුර 2 උත්තරාසඞ්ගය හෙවත් තනිපට සිවුර 3 අන්තරවාසකය හෙවත් අදනා සිවුර 4 පාත්‍රය 5 වාසිය හෙවත් කර කැන්ත 6 හිඳිකටුව 7 කාබහන හෙවත් පටිය 8 පෙරහන යන අට. අ:ප:ස: 60^{1}. **-පරිස** (නා) [සං පර්ෂ]= අෂ්ට පර්ෂද. අට පිරිස. 1 ක්ෂත්‍රිය 2 බ්‍රාහ්මණ 3 ගෘහපති 4 ශ්‍රමණ 5 චාතුර් මහාරාජික 6 ත්‍රයස්ත්‍රිංශත් (=තාවතිංස) 7 මාර 8 බ්‍රහ්ම යන පිරිස් අට. අ: ප: ස: 57^{9}. **-පාටිදෙසනීය** (නා) (පටි + √දිස + අනීය)= භික්ෂූණීන්ට ප්‍රතිදේශනා වදාළ පාටිදෙසනීය ශික්ෂා පද අට. භික්ෂුණියක් නොගිලන්ව සිට 1 ගිතෙල් 2 තෙල් 3 දී 4 මී 5 උක්සකුරු 6 මවඡ (දියමස්) 7 මංස 8 කිරි යන මේ අට වර්ගය විනවා වැළඳීමෙන් සිදුවන පාටිදෙසනීය ඇවැත් අට. "පටිදෙසෙ තබ්බං = පාටිදෙසනීයං" යනු බැව්න් නැවැත දෙසිය යුතු ඇවැත පාටිදෙසනීය නම් වේ. ප්‍රා:පු:ස: 63^{24} කැ: වි: පි: 153^{29}. **-පාන** (නා)= අෂ්ටපානය. අට වැදෑරුම් පාන වර්ග. යාම කාලිකයට අයත් ගින්නෙන් හුණු නො කළ පාන වර්ග අට. 1 මධු 2 මුදුදික 3 සාඵක 4 ඛොව 5 මොව 4 අම්බ 7 ජම්බුජ 8 එාරුස යන අට වැදෑරුම් පාන වර්ග. මෙහි 1 මධු නම් මීය. (මීදෙහි සවරසය) 2 මුදුදික නම් ඇල් පැන මැඩි මිදිය. 3 සාඵක නම් ඕරය. 4 ඛොව යනු ඇට සොහෙල්ය. 5 මොව යනු සෙසු කෙහෙල්ය. 6 අම්බ යනු අඹය. 7ජම්බුජ යනු දඹය. 8 එාරුස නම් බොරළු දමනය. මේ සියල්ල ඇල් පැන මැඩ හෝ සවරසයට ඇල් පැන් වත්කොට පහරණ ලද්දේ හෝ යම් කැලි වේ. කු: සි: ස: 31^{33}, සි: ව: වි: 54^{19}, වි: වි: 2684, ධ: අ: ගැ: 10^{3}, ජා: අ: ගැ: 148^{31} (අට්ඨ පානක

ඇතු ද දක්නේය:) -**පාන ගතික** (නා)= අෂ්ට පානයන් වැනි. අෂ්ට පානයන්ගේ සවභාවය ඇති. අෂ්ට පානයන් මෙන් වැළඳිය හැකි සියඹලා ගිවුළු ලප්තාරන් ආදී ඵලයන්ගේ පාන වර්ග. "වෙත්ත තිනත්තීනික-පෙ-බුද්ධක ඵල පානානං අට්ඨ ඵල ගතිකානෙව" සා: පා: 818[19]. -**පාරාජිකා** (නා)= අෂ්ට පාරාජික, පරිජි අට. භික්ෂූන්ට පණවා වදාළ මෙථුන ධර්ම ආදී පාරාජිකා සතර සහ භික්ෂුණීන්ට පමණක් විශෙෂ වූ උභතොසංඝ මණ්ඩලික ආදී අසාධාරණ පාරාජිකා සතර ද ඇත අට. 1 මෙථුන ධම්ම 2 අදින්නාදාන 3 මනුස්ස විග්ගහ 4 උත්තරි මනුස්ස ධම්ම 5 උභතොසංඝ මණ්ඩලික 6 චජ්ජ පටිච්ඡාදක 7 උක්ඛිත්තානුවත්තක 8 අට්ඨ වත්තුක ඇත පාරාජිකා අට. මෙහි **උභතොසංඝ මණ්ඩලික** නම්; භික්ෂුණියක් කාය සංසර්ගයෙන් තෙත්ව එබඳු පුරුෂයකුගේ කයින් කය පැහැරීම ඉවසීමෙන් හෝ තම සිරුරින් ඔහු කය පැහැරීමෙන් හෝ වන පරිජිය යි. **චජ්ජ පටිච්ඡාදක** නම්; පරිජි වූ මෙහෙණ කගේ එම පරිජි ඇවැත දැන දැන වසා නම් නෝ අනික්කඩව නො කියමින් ධුර නික්ඛේපය කිරීමෙන් හෝ වන පරිජි ඇවැත යි. **උක්ඛිත්තානුවත්තක** නම්; යම් මෙහෙණක් උත් ක්ඛේපනීය කර්මය කළ භික්ෂුවගේ ලබධිය ගෙන ඔහු අනුව සිට ඇපත්ති චතුර්ථ කර්මවාක්‍යය කියවන තෙක් එය අත් නො හැරීමෙන් වන පරිජි ඇවැත යි චූ: පා: B 474[2], ප්‍රා: පු: ස: 10[4], සි: ව: ටී: 28[35]. (අට්ඨ වත්තුක බලනු.) -**පුඤ්ඤ** (නා) [සං. පුණ්‍ය]= අට මහා පින්කම් 1 කයින දීමය 2 අට පිරිකර දීමය 3 ආවාස කරවා දීමය 4 බුදු පාමොක් සඟනට දන් දීමය 5 බණ පොත් ලියවීමය 6 කෙත් වතු පූජා කිරීමය 7 බුදු පිළිම කරවීමය 8 වැසිකිළි කරවීමය යනු අට මහ පින්කම් නම් වේ. කා:ව: 99[35]. -**පුඵ්ඵ විකති** (නා) (වි + √කර + ති) [සං. විකෘති]= බුදුන් පුදනු පිණිස වත් භික්ෂූන් විසින් මෙන් ම භික්ෂුණීන් විසිනුදු නො කළ යුතු අට වැදෑරුම් පූජ විකෘතීහු (=මල් ගෙතීම්.) 1 ගතපිම 2 නොපපිම 3 වෙධිම 4 වෙසිම 5 පූරිම 6 වාසිම 7 කලම්බක 8 අඩ්ඪ වන්දක යන අට. මෙහි 1 **ගතපිම** නම්; මල් දඹුහෝ නැවි එකට බැඳ කරණ ලද්දේසි. 2 **නොපපිම** නම්; නියඳ කෙඳිවලින් හෝ නූ ආදියෙන් හෝ දූසමන් ආදි මල් නැවි එක් පසකට හෝ දෙපසකට සිවින සේ ගෙතූ මල් දම්ය. නියඳ කෙඳි හෝ නූ විගුණ කොට බක් මී මල් ආදිය එහි ප්‍රවෙශ කොට කරණ ලද්දේ ද නොපපිම නම්. 3 **වෙධිම** නම්; නැවි සහිත සමන් මල් ආදිය නැවිවලද, නැවි රහිත මූණමල් ආදිය සිදුරෙහි ඉරටු ආදියකින් අවුණා කරණ ලද්දේය. 4 **වෙසිම** නම්; යට බලා සිවි කලස් වැනි මල් පොකුරු සිවින සේ කරණ ලද්දේය. අට හෝ සොළස බැගින් මහනෙල් මිටි හුසින් හෝ නියඳ කෙඳිවලින් බැඳ කරණ ලද පුප්ඵහත්ථක ද, වෙසිම නම්. 5 **පූරිම** නම්; මල්දම්වල හෝ මල් වත්වල පමණට වැඩි කොටස් විසුරුවා හැර පිළියෙළ කර ගැණීමයි. මෙය ලැබෙනුයේ බොධි චෛත්‍ය චෙදිකාදිය මල්දම්න් වට කිරීමෙහිය. ගෙතූ මල්දම්න් බොධි චෛත්‍යාදිය වට කර මින් අවුත් පටන් ගත් තැන ඉක්ම වී නම් මෙ පමණකින් පූරිමය වේ. 6 **වාසිම** නම්; සරසට මල්දම් ගෙණ යෑමයි. 7 **කලම්බක** නම්; අඩසඳ වන් මල්දම් අතර සටිකාකාරව එල්බෙන මල්දමයි. 8 **අඩ්ඪ චන්ද** නම්; අඩ සඳ අයුරින් මල්දම්න් වට කිරීමයි. මේ කලම්බක අඩ්ඪවන්ද දෙක ද පළමු සවැදෑරුම් පූජා විකෘතීන්ට ම ඇතුළත්ය කියති. සා: පා: 447[25], වි:ව: 463-471, සි:ව:ටී: 64[23], සා:ම: 76[17]. -**පුබ්බකිච්ච** (නා)= පූර්ව කෘත්‍යය අට. උපසම්පදා කර්මයෙහි උපසම්පදාපෙක්ෂකයා පිළිබඳ කට යුතු පූර්ව කෘත්‍ය අට. උපසම්පදා කර්මය පත්ත කල්ල වන අයුරු. 1 උපජ්ඣං ගාහාපනං 2 පත්තචීවරා චික්ඛණං 3 අනුසාසක සම්මුති කරණං 4 අනුසාසනං 5 හත්ථපාසෙ අවත්ථානං 6 උපසම්පදා යාචාපනං 7 අනන්තරායික ධම්ම පුච්ඡක සම්මුති කරණං 8 අනන්තරායික ධම්ම පුච්ඡනං ඇත අට. මේ පූර්ව කෘත්‍යයන් නිම වූ කල්හි ම සඞ්ඝයාගේ උපසම්පදා කර්මය පත්ත කල්ල නම් වේ. "එතසම්භව පුබ්බකම්ම නිට්ඨා පනෙ සති ඒව ඉදං සඞ්ඝස්ස උපසම්පදා කම්මං පත්තකල්ලං නාම හොති නාඝති" යනු විමති විනොදනී ටීකායි. මෙහි 1 **උපජ්ඣං ගාහාපනං** යනු උපාධ්‍යායයන් ගැන්වීමයි. "**න හිකඛවෙ අනුපජ්ඣායකො උපසම්පාදෙතබ්බො**" යනුවෙන් උපාධ්‍යායයන් නැතිව උපසම්පදා

නො කට යුතුය. එබැවින් "**පඨමං උපජ්ඣං ගාහාපෙතබ්බා**" යි උපසම්පදා කර්මයෙහි පළමුව උපාධ්‍යායයන් ගැන්විය යුතුය. උපසම්පදාපේක්ෂකයා ලවා "**උපජ්ඣායො මෙ භන්තෙ හොහි**" යි කියවා උපාධ්‍යාය ග්‍රහණය කරවන්නේය. 2 **පත්ත චීවරාචික්ඛණය** නම්; "**අයං තෙ පත්තෝ අයං සඞ්ඝාටි අයං උත්තරාසඞ්ගෝ අයං අන්තරවාසකෝ**" යනුවෙන් උපසම්පන්න කැමතියහු සතු පා සිවුරු කීමයි. 3 **අනුසාසක සම්මුතිකරණය** නම්; "**සුණාතු මෙ භන්තෙ සඞ්ඝෝ ඉත්ථන්නාමෝ ඉත්ථන්නාමස්ස ආයස්මතෝ උපසම්පදාපෙක්ඛෝ. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ඉත්ථන්නාමං අනුසාසෙය්‍යං**" යි තමා තමන් සම්මත කිරීම හෝ "**සුණාතු=පෙ- ඉත්ථන්නාමෝ ඉත්ථන්නාමං අනුසාසෙය්‍ය**" යි මෙරමා විසින් මෙරමා සම්මත කිරීමයි. 4 **අනුසාසනය** නම්; "**සුණාසි ඉත්ථන්නාම අයං තෙ සච්චකාලෝ භූතකාලෝ-පෙ-කිං නානමෝ තෙ උපජ්ඣායෝ**" යනුවෙන් පණවා වදාළ අනුශාසනය යි. 5 **හත්ථපාසෙ අඛ්‍යානං** (අවහානං?) යනු අනුශාසනය කළ භික්ෂුව පළමුව අවුත් සංඝයාට ඤත්තියෙන් දන්වා උපසම්පදාපේක්ෂකයාට "**ආගච්ඡාහි**" යි අත්පසට කැඳවීමයි. 6 **උපසම්පදා යාචාපන** නම්; එසේ අත් පසට පැමිණියහු ලවා "**සඞ්ඝං භන්තෙ උපසම්පදං යාචාමි උල්ලුම්පතු මං භන්තෙ සඞ්ඝෝ අනුකම්පං උපාදාය දුතියම්පි -පෙ- උපාදාය. තතියම්පි භන්තෙ -පෙ- අනුකම්පං උපාදාය**" යනුවෙන් කරවන යාචඤ්ඤාවයි. 7 **අනනුරාසික ධම්ම පුච්ඡක සම්මුති කරණය** නම්; "**සුණාතු මෙ භන්තෙ සඞ්ඝෝ අයං ඉත්ථන්නාමෝ ඉත්ථන්නාමස්ස ආයස්මතෝ උපසම්පදාපෙක්ඛෝ යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ඉත්ථන්නාමං අනනුරාසිකෙ ධම්මෙ පුච්ඡෙය්‍යං**" යන සම්මුතිකරණයයි. 8 **අනනුරාසික ධම්ම පුච්ඡනය** නම්; "**සුණාසි ඉත්ථන්නාම අයං තෙ සච්චකාලෝ භූතකාලෝ -පෙ- කිං නානමෝ තෙ උපජ්ඣායෝ**" යනුවෙන් කරණ විචාරණයයි. එහි **අනනුරාසික ධම්ම** නම්; අභව්‍ය පුද්ගලාදීන් සහ උපසම්පදාවට අවසානකර පණ්ඩකාදි ඛලිත්වාදි ආදි ධර්මයි. "**අභබ්බතාදිකෙහි උපසම්පදාය අවත්ථානරෙහිභාවෙ පණ්ඩකාදි ඛලිත්වාදීහිච ආපත්තිකරෙහි අනනුරාසිකෙහි සභාවෙනි පරිමුත්තෙනා එව වුත්තෙනා.**" වි: ලං: 1951[10] වි: වි: ටී: 393[1] ම:පා: ස:319[26]

-පුග්ගල දෙස (නා) අඟට පුරුෂ දෙශ. ඇවැතින් වොදනාකළ භික්ෂුවගේ වොදනාව නො පිළිගැනීමෙන් කරන වැරදි. 1 එබඳු ඇවැතක් සිහි නො කරමියි කීම 2 වොදකයා පහත් කොට සැලකීම 3 වොදකයාටම ඇවැතින් පෙරළා වොදනා කිරීම 4 **අන්‍ත කරුණකින්** වොදනාව වසාදැමීම 5 සඞ්ඝයා මැද දෙ අත් සලමින් කිණීම 6 ඇවැත් සහිතව කැමැති නැන යැම 7 තුෂ්ණීම්භාව සඞ්ඝයා වෙහෙසීම 8 ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි වීම යන අට. විසාර අඞ්ගුත්තර නිකාය අට්ඨක නිපාතයෙන් දන්නේය. අඞ්ගු: නි: 731[31]. **-පුග්ගල පුග්ගල** (නා) පුරුෂ පුද්ගලයන් අට දෙන. අෂ්ටාර්‍ය පුද්ගලයෝ. ශ්‍රෝතාපත්ති සකෘදාගාමී අනාගාමී අර්හත් යන මාර්ග සතරට සහ ඵල සතරට පැමිණි ආර්‍ය පුද්ගලයෝ. මෙහි පුරිස යනු ද පුග්ගල යනු ද එකාර්‍ථය. **වෙනෙක ජනයන්** ගේ වශයෙන් මෙසේ කියන ලදී. ඒ: මා: ස:538[38] සු: නි: අ:210[10] සං: දී: 5464 (අඤ්ඤත පුග්ගලබලනු) **-භන්ත** (නා) 1 අට නමකට දුන් බත. භික්ෂූන් අට නමකට දුන් දානය. තුදුස් බතට ඇතුළත් නැති බතක්. 2 අට බතින් එක් බතක්. ස: පා: 937[38] ධ: අ: ගැ: 187[27]. **-මඞ්ගල** (නා) අෂ්ට මඞ්ගල වස්තු. 1 සඞ්ඛය 2 චක්‍රය 3 පූර්ණ කුම්භය 4 ගදුවය 5 ශ්‍රී වත්සය 6 අඞ්කුසය 7 ධ්වජය 8 සුවස්තිකය යන වස්තු අට. කායබන්ධන ඒකයෙහි නො කළ යුතු විහිතුරු රූපයන්. ඒකය නම් කාය බන්ධනයෙහි දහ මුල තර බව පිණිස ලීයෙන් හෝ ඇත් දළ ආදියෙන් කළ විටුවයි. විටුව නම් පටි ඇටයයි. "කාය බන්ධන ඒකේ අට්ඨමඞ්ගලාදිකං යං කිඤ්චි විකාර රූපං න වට්ටති". පා: ඒ: වි: 6[30], වි: ලං: 3011-3218, සි: ව: ඒ: 7318-11285 චූ: පා: B 7265, ඒ:වි:ටී: 1424, ස: පා: 2089, කු: සි: ස: 828 (කුද්‍රසික සන්නයෙහි දක්නා "ඒකේ" යනු "ඒකේ" සි ශුද්ධ්‍යිය යුතුය.) **-මණ්ඩබ්බ** (නා)= අඟට මණ්ඩබ්බයය. මණ්ඩබ්බ අට. මණ්ඩබ්බය නම් දිගින් පස් රියන් පුළුලින් දෙ රියන් සමාරක් හෙවත් පස් රියත් ප්‍රමාණයයි. එබැවින් අඟට මණ්ඩබ්බය නම් දිගින් සත්‍රිස් රියන් පුළුලින් විසි රියන් ප්‍රදේශයයි. වි: ලං: 24317 ම: පා: ස: 5069B. **-මහා නිරය** (නා)= මහා නරක අට. 1 සඤ්ජීවය 2 කාලසූත්‍රය 3 මහාරෞරවය 4 රෞරවය 5 තාපය 6 ප්‍රතාපය 7 අවීචිය 8 සඞ්ඝාතය යන අට. අ: ප: ස:89[10]

-මහා පුරිස විතක්ක (නා)= අෂ්ට මහා පුරුෂ චිත්තකී. මහා පුරුෂයන්ට උපදිනා අට වැදෑරුම් සඞ්කල්පනා. 1 අප්පිච්ඡස්සායං ධම්මෝ නායං ධම්මෝ මහිච්ඡස්ස (=මේ නව ලොකොත්තර ධර්ම අල්පේච්ඡයාට විනා මහේච්ඡයාට අවබෝධ නොවේ. සෙසු තැන් ද මේ ක්‍රමයෙන් දන්නේය.) 2 සන්තුට්ඨස්සායං ධම්මෝ නායං ධම්මෝ අසන්තුට්ඨස්ස 3 පවිවිත්තස්සායං ධම්මෝ නායං ධම්මෝ සඞ්ගණිකාරාමස්ස 4 ආරද්ධවීරියස්සායං ධම්මෝ නායං ධම්මෝ කුසීතස්ස 5 උපට්ඨිත සතිස්සායං ධම්මෝ නායං ධම්මෝ මුට්ඨස්සතිස්ස 6 සමාහිත ස්සායං ධම්මෝ නායං ධම්මෝ අසමාහිතස්ස 7 පඤ්ඤවතෝ අයං ධම්මෝ නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස 8 නිප්පපඤ්චාරාමස්සායං ධම්මෝ නිප්පපඤ්චරතිනෝ නායං ධම්මෝ පපඤ්චාරාමස්ස පපඤ්චරතිනෝ" යන අටයි. අඞ්ගු: නි: 753[2], මනෝ: පූ: 767[1]. **-මහාවාර** (නා)= පරිවාර පාළියෙහි ශික්ෂාපදයන්ගේ පරිවිතිය පිණිස දැක්වූ සොළස පරිවාරයන්ගෙන් පළමු වන අට. 1 පඤ්ඤත්තිවාර 2 ඛත්තාපත්තිවාර 3 විපත්තිවාර 4 සඞ්ඝභේදවාර 5 සමුට්ඨානවාර 6 අධිකරණවාර 7 සමථවාර 8 සමුච්චයවාර යන මහාවාර අට. මේ අෂ්ට මහාවාරය ලැබෙන අයුරු ප්‍රථම පාරාජිකා ශික්ෂාපදය පිළිබඳ පහත සඳහන් ප්‍රභාවයෙන් දතු හැකිය. **1 පඤ්ඤත්තිවාර**- පඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තං? 2 **ඛත්තාපත්තිවාර**- මෙථුනං ධම්මං පතිසෙවන්තෝ කති ආපත්තියෝ ආපජ්ජති? 3 **විපත්තිවාර**- මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියෝ චතුන්නං විපත්තීනං කති විපත්තියෝ භජන්ති. 4 **සඞ්ඝභේදවාර**- මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියෝ **සත්තන්නං ආපත්තික්ඛන්ධානං** කතිහි ඛන්ධෙහි සඞ්ගහිතා 5 **සමුට්ඨානවාර**- මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියෝ ඡ ඨානං ආපත්තිසමුට්ඨානානං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති 6 **අධිකරණවාර**- මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියෝ චතුන්නං අධිකරණානං කතමං අධිකරණං? 7 **සමථවාර**- මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියෝ **සත්තන්නං** සමථානං කතිහි සමථෙහි **සම්මන්ති** 8 **සමුච්චයවාර**- 1 මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස කති ආපත්තියෝ ආපජ්ජති. 2 තා ආපත්තියෝ චතුන්නං විපත්තීනං කති විපත්තියෝ භජන්ති 3 **සත්තන්නං** ආපත්තික්ඛන්ධානං කතිහි ආපත්තික්ඛන්ධෙහි **සඞ්ගහිතා** 4 ඡන්නං ආපත්ති සමුට්ඨානානං **කතිහි** සමුට්ඨානෙහි සමුට්ඨහන්ති 5 චතුන්නං අධිකරණානං කතමං **අධිකරණං** 6 **සත්තන්නං** සමථානං කතිහි **සමථෙහි** සම්මන්ති. සාර: දී: 57[37]

-මහා සංවේගවත්ථු (නා)= අෂ්ට මහා සංවේග වස්තු. 1 ජාති දුක 2 ජරා දුක 3 ව්‍යාධි දුක 4 මරණ දුක 5 අපාය දුක 6 අතීත සංසාර දුක 7 අනාගත සංසාර දුක 8 වර්තමානයෙහි ආහාර සෙවීම් මුල්කොට ඇති දුක යන මේ අට. සු: නි: අ: 135[81], චි: මා: ස: 324[25]. **-මාතිකා** 1 (නා) [සං. මාතෘකා]= මාතෘකා අට. අෂ්ට මාතෘකා. අකාල චීවරුප්පාදය පිණිස පැණවූ මාතෘකා අට. 1 සීමාය දෙති 2 කතිකාය දෙති 3 භික්ඛාපඤ්ඤත්තියා දෙති 4 සඞ්ඝස්ස දෙති 5 ඨපනෙ සඞ්ඝස්ස දෙති 6 වස්සංවුත්ථසඞ්ඝස්ස දෙති 7 ආදිස්ස දෙති 8 පුග්ගලස්ස දෙති යන අට. කං: වි: 58[35]-61[22], චි: වි: 2726, මහා:පා: 346[5], ස:පා: 842[16] (අට්ඨ චීවර මාතිකා බලනු) **-මාතිකා** 2 (නා) අෂ්ට මාතෘකා. කඨිනුද්ධාරය පිණිස නියම කළ මාතෘකා අට. කං: ව: 7[30]. **වි: ලං:** 378[18], මහා: පා: 289[15]. (අට්ඨ කඨිනුද්ධාර බලනු.) **-මාස** (නා)= අට මස. වර්ෂා මූල සෙනාසනයට අනුදත් කාලය. "අට්ඨ මාසෙ ඛො මයා දෙවදත්ත රුක්ඛමූල සෙනාසනං අනුඤ්ඤාතං" පාරා: පා: 206[14], චූ: පා: 325[32], චූ: පා: B 204[19]. **-මිච්ඡත්ත** (නා) 1 මිච්ඡාදිට්ඨි 2 මිච්ඡාසඞ්කප්ප 3 මිච්ඡාවාචා 4 මිච්ඡාකම්මන්ත 5 මිච්ඡා ආජීව 6 මිච්ඡාවායාම 7 මිච්ඡාසති 8 මිච්ඡාසමාධි යන අට. වි: මා:සි: 507[36], ජා: අ: ගැ: 207[28]. **-මු** (නා)= අටවක. අටවක් පොහෝ දවස. එක් පක්ෂයක්. කුසල් කිරීමට සුදුසුයයි සම්මත පක්ෂ සතරින් එකක්. අ: පා: 935[8] මි: පා:සි: 484[77B]. **-මුත්ත** (නා)= අට වැදෑරුම් මුතු. අනාමාස වස්තුවක්. 1 හත්ථි කුම්භ 2 වරාහදාඨ 3 භුජඞ්ගසීස 4 වලාහක 5 වේළු 6 මච්ඡසිර 7 සඞ්ඛ 8 සිප්පි යන අට වැදෑරුම් මුතු. (2) 1 හය 2 ගජ 3 රථ 4 ආමලක 5 වලය 6 අඞ්ගුලි වේඨක 7 කකුධඵල 8 පාකතික යනුවෙන් ද මුතු අට වැදෑරුම් වේ. වි:ලං: 58[18], ස: පා: 43[29]. **-සාවත්ථිගමක** (නා)= එනම් ශික්ෂාපද අට. තුන්වන වර දක්වා **සම්නුභාසණය** කරන ශික්ෂාපද අට. එයින් භික්ෂූන්ට සතරක් සහ භික්ෂුණීන්ට සතරක් ද

Free Distribution

වේ. භික්ෂූන්ට සාධාරණ ශික්ෂාපද සතර නම්; සඞ්ඝාදිශේෂ කාණ්ඩයෙහි දක්නා 1 සඞ්ඝභෙද සඞ්ඝාදිසෙසය 2 අනුවත්තක සඞ්ඝාදිසෙසය 3 දුබ්බච සඞ්ඝාදිසෙසය 4 කුලදූසක සඞ්ඝාදි සෙසය යන සතර වේ. භික්ෂුණීන්ට සාධාරණ ශික්ෂාපද සතර සත්තරසකයෙහි සත්තම, අට්ඨම නවම, දසම ශික්ෂාපද සතර වේ. ක: වි: 136[3] පරි: පා: 188[20], සා: පා: 992[8], ක: වි: පි: 105[24]. -**ලොකධම්ම** (නා)= **ලොක** ධර්‍ම අට. අෂ්ට ලොක ධර්‍මය. ලොක සභාවය වූ කරුණු අට. 1 ලාභ 2 අලාභ 3 යස 4 අයස 5 නින්දා 6 ප්‍රශංසා 7 සැප 8 දුක යන කරුණු අට. පරි: පා: 188[24] සා: පා: 992[17]. -**විකුප්ප** (නා) (වපු + ක)= අෂ්ට වස්තුක නම් පාරාජිකාව. භික්ෂුණීන්ට පමණක් සාධාරණවූ පාරාජිකාවක්. කරුණු අටක් සම්පූර්ණ වීමෙන් සිදු වන පාරාජිකාව. රාගයෙන් මඩනා ලද භික්ෂුණියක් එබඳු පුරුෂයකු විසින් තමාගේ 1 අත ගැනීම ඉවසා ද, 2 සඟල සිවුරු කොණ ගැනීම ඉවසා ද, 3 එබඳු පුරුෂයකු වෙත එළඹ සිටිනී ද, 4 ඔහු හා කථා කරා ද, 5 සඞ්කේතස්ථානයට යන්නී ද, 6 පුරුෂයකුගේ පැමිණීම ඉවසා ද, 7 රහස් පෙදෙසකට පිවිසේ ද, 8 සිය සිරුර ඔහු වෙත එළවා ද, යන මේ කරුණු අට සම්පූර්ණ වීමෙන් සිදු වන පාරාජිකාව. සි: ව: වි: 299, සා: පා: 674[8]; වි: ම: 274[6], පාචි: පා: 219[18], චූ: වි: පි: 49[9]. -**ඤාණවිප්පයුත්ත** (නා)= අෂ්ට වස්තුක අවිද්‍යාව. 1 දුක්ඛ 2 දුක්ඛ සමුදය 3 දුක්ඛනිරෝධ 4 දුක්ඛ නිරොධගාමිනී පටිපදා 5 දුබ්බත්ත 6 අපරන්ත 7 පුබ්බන්තාපරන්ත 8 ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්න ධම්ම යන මේ අෂ්ට වස්තුවෙහි උපදනා අවිද්‍යාව. ධ: අ: ගැ: 187[13]. -**ංකඛ්ඛා** (නා)= වස්තු අටක් පිළිබඳව උපදනා සැකය. 1 බුද්ධ 2 ධම්ම 3 සඞ්ඝ 4 සික්ඛාපද 5 පුබ්බන්ත 6 අපරන්ත 7 පුබ්බන්තාපරන්ත 8 ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්න ධම්ම යන අෂ්ට වස්තුව පිළිබඳ උපදින සැකය. ධ: අ: ගැ: 182[22] -**වර** 1 (නා)= අෂ්ට වරය. පොරොන්දු අට. මහාප්‍රජාපතී ගෝතමිය පැවිදි වීමේදී ලබාගත් පොරොන්දු අට. චූ: පා: 398[7] (අට්ඨගරු ධම්ම බලනු) -**වර** 2 (නා) අනද තෙරුන් ලබා ගත් වර අට. 1 බුදුන් පිළිගත් සිවුරු තමන්ගට නො දිය යුතුය. 2 බුදුන් ලද පිණ්ඩපාතාහාරය නො දිය යුතුය. 3 එක ගඳකිළියෙහි විසීමට අවසර නො දිය යුතුය. 4 බුදුන් පිළිගත් නිමන්ත්‍රණයට අනද තෙරුන් නො වැඩිය යුතුය යන ප්‍රතික්ෂේප වර සතර සහ 5 අනද තෙරුන් පිළිනත් නිමන්ත්‍රණයට බුදුන් වැඩිය යුතුය. 6 බුදුන් දක්නට බැහැර ජනපදයෙන් පැමිණියවුනට ඔවුන් පැමිණි කෙණෙහි බුදුන් දක්වාලීමට අවසර දිය යුතුය. 7 තමන් හට යම් සැකයක් උපන් කෙණෙහි එය පිළිසිඳීමට අවසර දිය යුතුය. 8 තමන් නො හමුයෙහි දෙසූ සියලුම ධර්‍මය පෙරළා තමන්හට දෙසිය යුතුය යන මේ ආයාචනාවර සතර අනද තෙරුන් ලද වර අට නම් වේ. මනෝ: පූ: 164[7] -**වර** 3 (නා) ගිලානොපස්ථානය උදෙසා විශාඛා උපාසිකාව බුදුන්ගෙන් ලද වර අට 1 සිඟලුම ආගන්තුක භික්ෂූන් තම ගෙදරට ම පිඬු පිණිස වැඩම විය යුතුය. 2 පාංසුකූලයක් භික්ෂූන් නිති තම නිවෙසෙහි දන් වැළඳිය යුතුය. 3 ගිලන් භික්ෂූන් ගිලන්පස පිණිස තම ගෙදරට ම වැඩම විය යුතුය. 4 ගිලානොපස්ථායක භික්ෂූන්ට තමන්ම දන් දිය යුතුය. 5 පාංසුකූලයක් භික්ෂූන් සමග බුදුන් තම ගෙදර කැඳ අදුළුන් වැළදිය යුතුය. 6 වස් අන්තයෙහි වස්සාවාසික සිවුරු දිය යුතුය. 7 බෙහෙත් බඩු හැමදා දෙන දිය යුතුය. 8 හවුරුදු පතා කණ්ඩුප්පටිච්ඡාදන සිවුරු දන් දිය යුතුය. යන අට. (2) 1 දිට්ඨධම්මයෙන් සඞ්ඝයාට වැසි සළු දීම 2 ආගන්තුක භක්තය දීම 3 ගමික භක්තය දීම 4 ගිලාන භක්තය දීම 5 ගිලානොපස්ථායක භක්තය දීම 6 ගිලාන භෛෂජ්‍යය දීම. 7 ධුව යාගු දානය 8 භික්ෂුණී සඞ්ඝයාට උදක සාටිකා දානය යන මේ අට ද දක්නේය. මහා: පා: 328[30] පූජා: ව: 846[4], ධ: අ: ගැ: 121[4], ජා: අ: ගැ: 163[18]. -**වාභිසා උපසම්පදා** (නා)= එනම් උපසම්පදාව. අට වැදෑරුම් උපසම්පදාවන්ගෙන් එකක්. භික්ෂුණීන්ගේ උපසම්පදාව. භික්ෂුණීයක් විසින් භික්ෂුණී සඞ්ඝයා ගෙන් ලැබූ ඉක්බිති භික්ෂු සඞ්ඝයා ගෙන් ද ලැබිය යුතු භික්ෂුණී උපසම්පදාව උභය සඞ්ඝයා විසින් ඤත්තිය දෙවරක් සහ අනුශ්‍රාවණය ඇවරක් අස්වන බැවින් "අට්ඨසු වාරෙසු වාචං අස්ස අත්ථි" යන නිරුක්තිය අනුව අට්ඨවාචිකා නම් වේ. භික්ෂුණී සඞ්ඝයාගෙන් ඤත්ති චතුර්‍ථ කම්ම වාක්‍යයෙන් සහ භික්ෂු සඞ්ඝයා ගෙන් ද ඤත්ති චතුර්‍ථ කම්ම වාක්‍යයෙන් ලබන උපසම්පදාව. සා: පා: 172[3] ක: වි: පි: 15[8] ක: වි: 163[11]. -**වාර** (නා) (අට් මහාවාර බලනු.)

-ඤ්ඤා (නා) අභි විද්‍යා. **ඉඞ්** අභිඤ්ඤවන් ඇතුළු මනොමය සෘද්ධිය සහ විදර්ශනා ඥානය ඝන අට. වි: ම: සු: 482[2] ධ: ඇ: ගැ: 18[3]

-ඤ්ඤාපස (නා) අට වැදූරුම් උපසම්පදා. උපසම්පදා කම් අට. 1 එහි භික්ඛු උපසම්පදා. 3 සරණ ගමන උපසම්පදා 3 ඔවාද පටිග්ගහණ උපසම්පදා 4 පඤ්හබ්‍යාකරණ උපසම්පදා 5 ගරු ධම්ම පටිග්ගහණ උපසම්පදා 6 දූතේන උපසම්පදා 7 අට්ඨවාචිකා උපසම්පදා 8 ඤත්ති චතුත්ථ කම්ම උපසම්පදා යන අට.

1 **එහි භික්ඛු උපසම්පදා නම්**; අනන්තිම භවික වූ පූර්ව හෙතු සම්පන්න පුද්ගලයාට "එහි භික්ඛු චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛක්ඛය අන්ත කිරියාය"යි දෙන උපසම්පදාවයි.

2 **සරණ ගමන උපසම්පදා නම්**; බුද්ධං සරණං ගච්ඡාමි ඝනාදී නයින් තුන් වරක් වාග් භෙද කොට ප්‍රථම බෝධියෙහි දුන් උපසම්පත්තියි. බුදුදු එක් විසි හවුරුද්දෙක් ප්‍රථම බෝධි නම් වෙයි.

3 **ඔවාද පටිග්ගහණ උපසම්පදා නම්**; "තස්මාතිහ තෙ කස්සප එවං සික්ඛිතබ්බං" යනාදීන් ස්ථවිර නව මධ්‍යමයන් කෙරෙහි හිරි ඔතප්ප ද, ධර්මදේශනා අර්ථිව මෙනෙහි කොට ඇසීම ද, කායගතාසති මනසිකාර ද යන තුන් අවවාදයන් පිළිගැන්මෙන් වූ උපසම්පදාවයි.

4 **පඤ්හබ්‍යාකරණ උපසම්පදා නම්**; දශ අශුභ විෂයෙහි බුදුන් පුළුවුන් ප්‍රශ්න විස්සජ්ජනය කළ සොපාක සාමණේරයන්ටය අනුදත් උපසම්පදාවයි.

5 **ගරුධම්ම පටිග්ගහණ උපසම්පදා නම්**; 1 වස්සසතූප සම්පන්නාය භික්ඛුණියා තදහුප සම්පන්නස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කාතබ්බං අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයෝ 2 න භික්ඛුණියා අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිතබ්බං අයම්පි ධම්මෝ-පෙ-අනතික්කමනීයෝ 3 අඩ්ඪමාසං භික්ඛුණියා භික්ඛු සඞ්ඝතො දේඩම්මා පවාරෙතබ්බා උපොසථ පුච්ඡනංච ඔවාදූපසඞ්කමනංච අයම්පි ධම්මෝ-පෙ-අනතික්කමනීයෝ 4 වස්සං වුට්ඨාය භික්ඛුනියා උභතෝ සඞ්ඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බං දිට්ඨෙන සුතෙන පරිසඞ්කාය අයම්පි-පෙ- අනතික්කමනීයෝ. 5 ගරු ධම්මං අජ්ඣාපන්නාය භික්ඛුණියා උභතෝ සඞ්ඝෙ පක්ඛමානත්තං චරිතබ්බං අයම්පි ධම්මෝ-පෙ-6 දෙවා වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිත සික්ඛාය සික්ඛමානාය උභතෝ සඞ්ඝෙ උපසම්පදා පරියෙසිතබ්බා අයම්පි ධම්මෝ-පෙ- 7 න භික්ඛුණියා කෙනචි පරියායෙන භික්ඛු අක්කොසිතබ්බා. පරිභාසිතබ්බා අයම්පි ධම්මෝ-පෙ 8අජ්ජතග්ගෙ ඔවාදෝ භික්ඛූනං භික්ඛුණීසු වචනපථෝ. අයම්පි ධම්මෝ සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයොයි වදළ මේ අට්ඨගරු ධම්ම පිළිගත්කල මහාපජාපති ගොතමීන්දට අනුදත් උපසම්පදාවයි.

6 **දූතෙන උපසම්පදා නම්**; අඞ්කාසි නම් ගණිකාවට අනික් තැනෙක්හිදී ව්‍යකත ප්‍රතිබල මෙහෙණක දූත වැ අවුත් භික්ෂු සඞ්ඝයා කරා එළඹ උපසම්පත්තියට ආරාධනා කළ කල පරමමූඛයෙහිම ඤත්තිකම්වදන් කියවා උපසම්පත්ති කරන පරිද්දෙන් අනුදත් උපසම්පදාවයි.

7 **අට්ඨවාචිකා උපසම්පදා නම්**; භික්ෂුණී සඞ්ඝයා කෙරෙන් ඤත්ති චතුත්ථ කම්මයෙන්ද භික්ඛු සඞ්ඝයා කෙරෙන් ඤත්ති චතුත්ථ කම්ම යෙන්දයි යන මේ කම්දවාචයෙන් මෙහෙණන්ට අනුදත් උපසම්පදාවයි.

8 **ඤත්ති චතුත්ථ උපසම්පදා නම්**; භික්ෂූන්ට මෙසමයෙහි දෙන උපසම්පදාවයි. කා: වි: 1[32] කා: වි: පි: 1[410]-**ඉඛනාපස** (නා)= අටවැදූරුම් තාපසයෝ. 1 සප්පත්තභරියා 2 උඤ්ඤාචරිකා 3 සම්පත්තකාලිකා 6 අනාගහිපකතිකා 5 අස්සමිටඨිකා 6 දන්තාලුය්හකා 7 පවත්තඵලිකා 8 වණ්ඨ මුනිනිකා යන අට වැදූරුම් තවුසෝ. එහි 1 **සප්පත්තභරියා නම්**; අඹුදරුවන් සමග පැවිදිව කෘෂිවණිජ් ආදීන් ජීවිකාව කරන තෙණ්ඩ ජටිලාදීහුයි. 2 **උඤ්ඤාචරිකා නම්**; නුවර දොර අසපුවක් කරවා ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී කුමරුන් ශාස්තෘ විෂයෙහි හික්මවමින් රන් රිදී ප්‍රතිරූප කොට තල සහල් ආදී කැප බඩු පමණක් පිළිගන්නෝයි. 3 **සම්පත්තකාලිකා නම්**; ආහාර වෙලාවෙහි ලැබුණ දෙය කින් යැපෙන්නෝයි. 4 **අනාගහිපකතිකා** යනු

Digitized by Dhamma Digital - Nalanda Digital Project Free Distribution

හින්නෙන් පිසූ දෑය ප්‍රතික්ෂේප කොට කොළ හෙඩි ආදියෙන් යැපෙන්නෝසි. 5 **අසඝමුට්ඨි** නම්; ගලක් හෝ යම් කිසි ආයුධයක් රැගෙන හැසිර කුස හිනි වූ විට හමු වූ ගසක පොතු සිඳ එය අනුභව කරන පොහෝ සිල් ඉටා සිවි බඹ විහරණ වඩන්නෝසි. 6 **දණ්ඩ ලුයෂණ** නම්; කුස හිනි වූ විට දනින් ගස්පොතු සිඳ එය අනුභව කර සිල් ඉටා බඹ විහරණ වඩන්නෝසි. 7 **සමණ එලික** යනු ආහාර පිණිස අන් තැනක නොනොස් වැටුණු ගෙඩි මල් පමණක් කා යැපී බඹ විහරණ වඩන්නෝසි 8 **වාතභුතික** නම්; හුවටුවෙන් ගිලිහුණු ගෙඩි පමණක් කා යැපී සිල් ඉටා බඹ විහරණ වඩන්නෝසි. මේ අට වැදෑරුම් තවුසෝ ක්‍රම අයෙන් ශ්‍රේෂ්ඨයෝ වෙත් වණවමුතනික තාපස යෝ සවී ශ්‍රේෂ්ඨයහ. සු: නි: අ: 2391 **-ද්විධ මානිකා** (නා)= අට වැදෑරුම් මානකා. ඒ: ලං: 37236 (අ ඨමානිකා බලනු) **-විධ විනය** (නා) අට වැදෑරුම් විනය. 1 සංවර විනය, 2 පහාණ විනය යි විනය දෙවැදෑරුම් වේ. එයින් සංවර විනය; 1 සීල සංවර 2 සති සංවර 3 ඤාණ සංවර 4 ඛන්ති සංවර 5 විරිය සංවර යි පස් වැදෑරුම් වේ. පහාණ විනය ද, 1 තදඞ්ග පහාණ 2 විකඛම්භනපපහාණ 3 සමුච්ඡේදපපහාණ 4 පටිපස්සද්ධිපහාණ 5 නිස්සරණපපහාණ යි පස් වැදෑරුම් වේ. සංවර විනය; කාය වාක් දුශ්චරිතයන් සංවර කරන බැවින් සංවර ද; විනය කරන බැවින් විනය ද වේ. පහාණ විනය ද; ත්‍යාගාර්ථයෙන් පහාණ ද, විනය නයාර්ථයෙන් විනය ද වේ. මෙසේ එකක් පස් අයුරකින් බෙදෙන බැවින් විනය දශ වැදෑරුම් වේ. එයින් පටිපස්සද්ධි විනය සහ නිස්සරණ විනය හැර සෙසු අට අට වැදෑරුම් විනය නම් වේ. පටිපස්සද්ධි පහාණ කාලයෙහි භික්ෂුව යුතු කිසිවක් නැති බැවින් ද, නිස්සරණපපහාණය නුපදවන බැවින් ද, මේ දෙකින් කිසිවක් විනය නොකෙරේ. "පටිපස්සද්ධිපහාණ කාලෙ පන විනෙතබ්බාභාවතො නිස්සරණපහාණස්ස ච අනුප්පාදෙතබ්බතො න තෙහි කිඤ්චි විනෙතීති වුච්චති" සු: නි: අ: 76-88 **-විනය තණ්හා** (නා)=අට වැදෑරුම් අසමානතා. බුදුවරයන්ගේ පවත්නා අසමාන ධර්ම අට. 1 අද්ධාන වෙමත්තතා 2 ආයු වෙමත්තතා 3 කුල වෙමත්තතා 4 පමාණ වෙමත්තතා 5 නෙකඛම්මවෙමත්තතා 6 පධාන වෙමත්තතා 7 බොධි වෙමත්තතා 8 රංසි වෙමත්තතා යන අට. 1 **අද්ධාන වෙමත්තතා** නම්; බුදුවරුන් පාරමී පුරන කාලයේ අසමාන තාවයයි. සමහර බුදුවරු ලඟත් පිරිසෙසින් සාරසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරත්. සමහර බුදුවරු ඉඛඝා සංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරත්. 2 අවුරුදු සියයකට ආයුෂ ඇති කාලයෙහි හෝ ලක්ෂයක් අවුරුද්දට ආයුෂ ඇති කාලයෙහි හෝ බුදුවරු උපදින් මේ **ආයුවෙමත්තතා**වය යි. 3 **කුල වෙමත්තතා** නම්; කුලයන්ගේ අසමානතාවයයි. බුදුවරු ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි හෝ උපදිත්. මේ කුල වෙමත්තතාවයයි 4 **පමාණ වෙමත්තතා** නම්; ශරීරප්‍රමාණය පිළිබඳ වෙනසයි බුදුවරු ශරීරප්‍රමාණයෙන් පසළොස්-අටළොස් රියන් හෝ අටාසූරියන් හෝ වෙත්. 5 **නෙකඛම්ම වෙමත්තතා** නම්; බොධිසත්ත්වවරයන්ගේ අභිණිෂ්ක්‍රමණයේ වෙනසයි. හත්ති-අශ්ව-රථසිවිකාවන්ගෙන් හෝ අහසින් හෝ බොධිසත්ත්වවරයෝ අභිණිෂ්ක්‍රමණය කරති. 6 **පධාන වෙමත්තතා** නම්; ප්‍රධන් වීරිය කාලය පිළිබඳ අසමානත්වයයි. සමහර බුදුවරුන්ගේ ප්‍රධන් වීරිය කාලය සතියකි. එසේම අඩමස-මස-දෙමස-තෙමස-සමස හෝ සමහර බුදුවරුන්ගේ ප්‍රධන් වීරිය කාලය වේ. එක් හවුරුදු දෙතුන් හවුරුදු සැවුරුදු හෝ ප්‍රධන් වීරිය කරති. 7 **බොධි වෙමත්තතා** නම්; බොධි වෘක්ෂය පිළිබඳ වෙනසයි. ඇසතුරුක හෝ නුග ආදී අන් කිසි රුකක් හෝ බොධිය වේ. 8 **රංසි වෙමත්තතා** යනු බුඩරශ්මිය පැතිරෙන ප්‍රමාණයේ වෙනසයි. මේ අට වැදෑරුම් අසමානකම් හැර ප්‍රතිවෙධයෙන් අවබොධ කරන ගුණයන්හි හෝ දුරුකටයුතු දෙෂයන්හි කිසි වෙනසක් නැති. "ඉමා අට්ඨ වෙමත්තතා ඨපෙත්වා අවසෙසෙසු පටිවෙධෙනාධිගන්තබ්බසු ගුණෙසු පහාතබ්බසු වා දොසෙසු නත්ථි තෙසං විසෙසො" සු:නි:අ: 34319. **-සත තණ්හා** (නා)= එක්සිය අට වැදෑරුම් තෘෂ්ණාව. **තෘෂ්ණා** තොමෝ රූප තෘෂ්ණා, ශබ්ද තෘෂ්ණා, ගන්ධ තෘෂ්ණා, රස තෘෂ්ණා, සප්‍රෂ්ටව්‍ය තෘෂ්ණා ධර්ම තෘෂ්ණා වශයෙන් සයෙකි. එකෙකක් කාම, භව, විභව වශයෙන් තෙවැදෑරුම් වී අටළොසක් වේ. ඒ අටළොස ආධ්‍යාත්මික බාහිර භෙදයෙන් සතිසක් වේ. ඒ සතිස

අතීත – අනාගත – වර්තමාන වශයෙන් එක් සිය අට වැදූරුම් වේ. වි: මා: ස: 5[31]. **-සත පුග්ගල** (නා)= ආර්ය පුද්ගලයන් එක්සිය අට. එකබිජී, කොලඞ්කොල, සත්තක්ඛත්තු පරම යනුවෙන් ශෝවාන් පුද්ගලයෝ තිදෙනෙක් වෙත්. කාම, රූප, අරූප භවයන්හි ඵලාව බොඹය කළ සකෘදාගාමී පුද්ගලයෝද, එසේම තෙ වැදූරුම් වෙත්. මේ සවැදූරුම් ආර්ය පුද්ගලයෝ සිව්පිළිසිඹියාවන්ගේ වශයෙන් සූචිසි වැදූරුම් වෙත්. අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී යන බ්‍රහ්මලෝකයන්හි එක් බ්‍රහ්ම ලෝකයක පස්දෙන බැහින් අනන්තරා පරිනිබ්බායි, උපහච්ච පරිනිබ්බායි, සසඞ්ඛාර පරිනිබ්බායි, අසංඛාර පරිනිබ්බායි, උද්ධංසෝත අකනිට්ඨගාමියයි අනාගාමී පුද්ගලයෝ විසි දෙනෙකි. අකනිට්ඨ බ්‍රහ්මලෝකයෙහි උඩිං සොත අකනිට්ඨගාමී පුද්ගලයා හැර පුද්ගලයෝ සිව් දෙනෙක් වෙත්. මෙසේ අනාගාමී පුද්ගලයන්ගේ සඞ්ඛ්‍යාව සූචිස්සකි. සුතව විපස්සක, සමථයානිකයයි අර්හත් ආර්ය පුද්ගලයෝ දෙදෙනෙක් සහ සතර මාර්ගස්ථයෝදැයි මේ සියලුම ආර්ය පුද්ගල සඞ්ඛ්‍යාව සිව් පණසකි. එය ශුද්ධාධුර ප්‍රඥාධුර භෙදයෙන් එක සිය අවකි. සූ: නි: 216[17]. **-සංවෙග වත්ථු** (නා)= අෂ්ට සංවේගවස්තු. වි: ව්: ථී: 184[36], වි: මා: ස: 324[25], සූ: නි: අ: 135[21], (අට්ඨ මහා සංවේග වත්ථු බලනු.) **-සමණ පරික්ඛාර** (නා) අට වැදූරුම් මහණ පිරිකර. පාත්‍ර සිවුරු ආදිය. සූ: නි: අ: 1391[8]. (අට්ඨ පරික්ඛාර බලනු) **-සමණසුඛ** (නා)= අෂ්ට ශ්‍රමණ සැප. භික්ෂූන්ට ඇති සැප අට. 1 ඛත්තඛණූපපරිඝහාභාවෝ (=ධන ධාන්‍යයන්ගේ අසිතියක් නැති බව. 2 අනවජ්ජපිණ්ඩපාත පරියේසනභාවෝ (=නිරවද්‍ය පිණ්ඩපාතය සොයන බව) 3 නිබ්බුත පිණ්ඩපාත භුඤ්ජනභාවෝ (=ප්‍රත්‍යවේක්ෂා කොට පිණ්ඩපාතය වළඳන බව) 4 රට්ඨපීළන කිලෙසාභාවෝ) (=අය බදු දීම් ආදියෙන් රට වැස්සන් විඳුනා දුක් නමන්ට නැති බව) 5 උපකරණෙසු නිච්ඡන්දරාගභාවෝ (=නාහොපකරණයෙහි ඇලුම් නැති බව) 6 වොරව්හාරූපෙ නිබ්භයභාවෝ (= සොරුන්ගේ මං පැහැරීම් ආදියෙහිදී බිය නැති බව) 7 රාජ රාජ මහා මත්තෙහි අසංසට්ඨභාවෝ(=රාජ රාජ මහාමාත්‍යයන් සමඟ නො ඇතුණු බව) 8 චතූසු දිසාසු අපපටිහතභාවෝ (=බාධාවක් නැතිව සිව් දිගටම යා හැකි බව) යනු අට වැදූරුම් ශ්‍රමණ සැපයෝ වෙත්. ජා: අ: කා: 7[4] ජා:අ:ගැ: 12[26], (අෂ්ට ගුණ බලනු) **-සමාපත්ති** (නා)= අෂ්ට සමාපත්ති. රූපාවචර ධ්‍යානසතර සහ අරූපාවචර ධ්‍යාන සතර. ජා: අ: ගැ: 116.

අට්ඨාන 1 (නා) (න+ඨාන) (න + √ඨා + යු= අන)= අස්ථානය. හෙතු රහිතය. ඵලයක් නිපදවීමට හෙතුවක් නැත. ස: පා: 160[34]. වි: ව්: ථී: 79[16], චූ: පා: B 366[8], මනෝ: පූ: 247[21] (අට්ඨාන යි ද දක්නේය.)

අට්ඨාන 2(නා)(ආ+ඨාන)=පුවරුකඩ.ලී පුවරුව. ශරීරය උලා නහනු පිණිස නහනතොට හිඳුවන ලී පුවරුව. "ගසක් ලෑල්ලක් ලෙස සැස එහි අට පදයක් සේ රෙදවල් කපා නහන තොටුපළෙහි සිටුවත්. එහි සුණුවහී විසුරුවා මනුෂ්‍යයෝ ශරීරය උලත්. මෙය **අට්ඨාන** නම්" භික්ෂූන් විසින් ශරීරය උලා නොනෑ යුතුයයි පණවන ලද්දක්. චූ: පා: 216[17] සා: පා: 88[34] (අට්ඨාන ඵලක බල යු)(අට්ඨාන යි ද දක්නේය) වි: ව්: B 2783, **-ඵලක** (නා) [සං. ඵලක]= පුවරුකඩ. "අට්ඨාන ඵලක නම් පොහොරුවක් මෙන් දැවයක් සැස සුණු පුරා එහි පිට ගහා නහනු සඳහා දූ පෝරු ආකාරයෙන් හිරිසිඳ නහන තොට හිඳුවන පොහොරුවයි" කු: සි: ස: 59[27] සි: ව: ව්: 92[6] ඒ: ව්: ථී: 456[18] චූ: පා: B I උප: ග්‍ර: ස; පා: 88[34] (අට්ඨාන බලනු)

අට්ඨානාරහ (නා) =1ඨානාරහ නොවූ; ස්ථානාර්හ නොවූ. ශාසනය ශාසනයට නුසුදුසු. නිවණට පැමිණීම හෙතු කොට ත්‍රිවිධ ශික්ෂාවන්හෙන් යුත් ශාසනය ඨාන නම්. ඒ ශාසනයට සුදුසු වූයේ ඨානාරහ නම්. එසේ නොවූයේ අට්ඨානාරහ නම් වේ. 2 **ඇපත්** චතුර්විධ කම්වාක්‍යය උපසම්පදා කර්මයට කාරණ බැවින් ඨාන නම්. ඒ උපසම්පදා කර්මයට සුදුසු වූ වස්තුදෙශාදියෙන් විනිර්මුක්ත වූ කර්මය ඨානාරහ නම් වේ. එබැවින් පිරිසිදු කර්මවාක්‍යය කෙළවර කොට ඇති සියලු සඞ්ඝකෘත්‍යය ඨානාරහ නම් වේ. **එසේ නොවූයේ අට්ඨානාරහ** නම් වේ. ස: පා: 172[27] ඒ: වි ථී: 110[6] සා: දී; 439[19] (ඨානාරහ බලනු)

අට්ඨානිසංස (නා)= අනුසස් අට. විනයධරයා කෙරෙහි විද්‍යමාන වූ අනුසස් අට. 1 අත්ත නො සීලකඛන්ධො සුගුත්තො හොති සුරක්ඛිතො (=තමාගේ ශීලය මනාව රක්නා ලද්දේ වෙයි) 2 කුක්කුච්චපකතානං පටිසරණං හොති (=කුකුස් කරන්නවුනට පිළිසරණ වෙයි) 3විසාරදො සඞ්ඝ මජ්ඣෙ වොහරති (=නොබියව සඞ්ඝයා මැද කථා කරයි) 4 පච්චත්ථිකෙ සහ ධම්මෙන සුනිග්ගහීතං නිග්ගණ්හාති (=පස මිතුරන් කරුණු දැක්වීමෙන් නිග්‍රහ කරයි) 5 සඞ්ඝමජ්ඣිනියා පටිපත්තො හොති (=සඞ්ඝ යාගේ විරසථිතිය පිණිස පිළිපන්නේ වෙයි. නස්සාධෙය්‍යා 6 උපොසථො 7 පවාරණා 8 සඞ්ඝකම්මං (=පොහොකිරීම පවාරණය සහ සඞ්ඝ කර්මය ද ඔහු අයත් වෙයි.) යන අට. පරි: පා: 18:30 18833 සා: පා: 99239 (අට්ඨ ආනි සංස බලනු)

අට්ඨාපදක? (නා) =අෂ්ට පදකය, .දූ පෝරුව දැම් පෙත. සාරී ඵලකය. සා: පා: 83712 අ: පා: සා: 7234 (අට්ඨ පදක බලනු)

අට්ඨාරස (නා) -අටළොස. දහ අට. එනම් සඞ්ඛ්‍යාව, -**අභබ්බට්ඨාන** (නා)- අටළොස් අභව්‍යස්ථාන. මූල ප්‍රණිධානයෙන් පසු බොධි සත්ත්වවරයන්හට නොසුදුසු ස්ථාන අටළොස. මූලප්‍රණිධානයෙන් පසු බොධිසත්ත්වවරයෙක් 1 ජාත්‍යන්ධ; 2 ජාතිබධිර; 3 උම්මත්තක 4 කෙළනොළු; 5 පිළු නොවෙයි. 6 මෙලච්ඡ ජනපදයක; 6 දුස්සකගේ කුසක; 8 නියත මිථ්‍යා දෘෂ්ටි කුලයක නූපදියි. 9 ලිඛත පරිවර්තන වූවෙක්; 10 පඤ්චානන්තරීය කර්ම කරන්නෙක්; 11 කුෂ්ඨරොගියෙක් නොවෙයි. 12 වටුවකුට වඩා කුඩාව හෝ ඇතකුට වඩා විශාලව හෝ නූපදියි. 13 ප්‍රෙත අසුර නිකාය වල හෝ අවීචි ලොකාන්තරික නරකයක; 14 මාරයෙක්ව; 15 අසංඥභවයක; 16 ශුද්ධාවාස බ්‍රහ්ම ලොකයක; 17 අරූප භවයක 18 පිට සක්වලක නූපදියි. සු: නි: අ: 3331 -**ආචරියවාද** (නා)-අටළොස් ආචාරී වාදය විතීය සඞ්ගායනාවෙන් පසු හින්න වූ භික්ෂුනිකාය සඞ්ඛ්‍යාව: කාලාශොක ධර්මාශොක දෙරජුන් (ක්‍රි: පූ: 365–274) අතර වූ ශත වර්ෂය තුළ දඹදිව හටගත් බොඳ භික්ෂු නිකායයෝ 1 මහා සඞ්ඝික 2 ගොකුලික 3 එකබෙබාහාරික 4 පණ්ණත්තිවාදී 5 බාහුලික 6 චෙතියවාදී 7 මහිංසාසක 8 වජ්ජීපුත්තක 9 ධම්මුත්තරීය 10 භද්‍රයානික 11 ඡන්නාගාරිකා 12 සම්මිතිය 13 සබ්බත්ථිවාදී 14 ධම්මගුත්තික 15 කස්සපික 16 සඞ්කන්තික 17 සුත්තවාදී 18 ථෙරවාදී යන අටළොස් ආචාරී වාදයෝ, 1 **මහාසඞ්ඝික වාදය**; – සථවිරවාදයෙන් භින්නවූ ප්‍රථම භික්ෂුනිකාය මෙය වේ. විතීය සඞ්ගීතියෙන් බැහැර කළ දස දහසක් පමණ වජ්ජීපුත්‍රක භික්ෂූහු තුමූ වෙනම නිකායක්ව මහාසඞ්ඝික නමින් පෙනී සිටියහ. මහාදෙව නම් ආචාර්යයන්ගේ පඤ්චවස්තුවාදය මහා සඞ්ඝිකයන්ගේ මූල සිද්ධාන්තය විය යෙති. ආචරිය වාද, ධර්ම ගුරු නමින් ද හඳුන්වන මේ භික්ෂුවංශයට සූත්‍ර පිටකය, විනය පිටකය, අභිධර්ම පිටකය මිශ්‍ර පිටකය, ධාරණී පිටකය යි පිටක පසකි. මහා සඞ්ඝිකයන්ගේ පොත්වලින් දැනට ශෙෂව පවත්නේ **මහාවස්තු** නම් ඔවුන්ගේ විනය ග්‍රන්ථය පමණකි. එය ථෙරවාදීන්ගේ මහාවග්ග පාළිය වැනි වේ. සංඝභේදය මෙන්ම ප්‍රාක්භේදය භාවිත කළ මහාසඞ්ඝිකයෝ ශ්‍රී පර්වතය මෙන්ම ආන්ධ්‍ර දෙශය ද, ධාන්‍යකටකය මෙන්ම පාටලී පුත්‍ර නගරය ද මූල ස්ථාන කර ගත්හ. 2 **ගොකුලික**;- මහාසඞ්ඝික යන්ගේ ශාඛාවක් වූ මේ නිකාය කුක්කුලික කුක්කුටික, භූරිකුල්ලක යනුවෙන් ද හඳුන් වති. කථා වත්ථු අට්ඨකථාවේ බුබ ඝොෂාචාර්ය පාදයෝ ද කුක්කුල යනුම යොදති. ගොකුලිකයන් සියලුම සංස්කාරයන් හිනිදැල් රහිත උණු අඵමෙන් සලකන බැව් කථා වත්ථු අට්ඨකථාවේ දක්නේය.3 **එකබෙබාහාරික**;- මහා සඞ්ඝික නිකායයෙන් බිඳුණු මේ ආචාර්ය වාදයේ සිද්ධාන්ත මහා සඞ්ඝික- කුක්කුටික- ලොකොත්තරවාදීන්ගේ සිද්ධාන්ත හා සමානය. බුබ ධර්මීය සෙසු නිකායිකයන්ට වඩා අන්තර් බුද්ධියෙන් දත් බැවින් එකබෙබාහාරික (=එකව්‍යවහාරික) නම් විය කියති. 4 **පණ්ණත්තිවාද**;- පසු කාලයෙහි ගොකුලිකයන් නෙන් හින්නවූ මේ නිකායිකයෝ සියලුම ප්‍රඥප්ති ධර්මයන් දුකඛ සම්මිශ්‍රයයි කීහ. මහාවංස ටීකාවෙහි "පුග්ගල පඤ්ඤත්තිවාද" යනුවෙන් මේ නිකාය ඇදින් විය.5 **බාහුලික**;- ගොකුලිකයන්ගෙන් ප්‍රභවවූ දෙවෙනි ශාඛාව මෙය වේ. සථවිරවාදීන් ලියූ ග්‍රන්ථාන්තරයෙහි

භාග ගහණ යනුද දක්නේය.) -**මාස** (නා)= මසකට වැඩි. ග්‍රීෂ්ම ඍතුවෙහි ඉදිරියට ශෙෂවූ මසකට වැඩි කාලය. ග්‍රීෂ්ම ඍතුවෙහි මසකට වැඩි කලක් ශෙෂව තිබියදී වැසි සළු සිවුර සොයා ලද නම් නිසගි වේ: වැසි සළු සිවුර සෙවිය යුත්තේ ග්‍රීෂ්ම ඍතුවෙහි මසක් ශෙෂව තිබියදීය. පාරා: පා:2121[19] ස: පා: 523[11] (අඩ්ඪමාස සහ අතිරෙකඩඪමාස බලනු) -**මාසක** (නා) මස්සකට වැඩි. මස්සකින් වැඩි. පස් මස්සකින් හෙවත් පාදයකින් අඩු අගනා තුදුන් දේ ගැනීමෙහි ථුලැසි වේ. කැ: වි: 29[5] -**ලාභ** (නා)= වැඩි ලැබීම. අතිරෙක ලාභය. සතර නිශ්‍රයයන් පිළිබඳව ලැබෙන අතිරෙක ලාභය. නිශ්‍රය සතර නම්; 1 පිණ්ඩියාලෝප භොජනය. 2 පංසුකූල චීවරය. 3 රුක්ඛමූල සෙනාසනය. 4 පූති මුත්ත භෙසජ්ජය යනුයි. මෙයින් 1 **පිණ්ඩියාලෝපභොජනයට**; අතිරෙක ලාභ වශයෙන් මහාවග්ග පාළි මහා ඛන්ධකයෙහි සඞ්ඝභත්තාදි බත් සතක් ද, විශාඛා මහා උපාසිකාවගේ අයැදුමෙන් ආගන්තුකාදි බත් සතරක් ද, ධුරභත්තාදි බත් තුණක්දෑසි මෙසේ තුදුස් බතක් දක්වන ලදී. එනම්; 1 සඞ්ඝභත්ත 2 උද්දෙසභත්ත 3 නිමන්තණ භත්ත 4 සලාක භත්ත 5 පක්ඛික භත්ත 9 උපොසථික භත්ත 7 පාටිපදික භත්ත 8 ආගන්තුක භත්ත 9 ගමික භත්ත 10 ගිලාන භත්ත 11 ගිලානුපට්ඨාක භත්ත 12 ධුර භත්ත 13 කුටි භත්ත 14 වාරක භත්ත යන මේ තුදුසයි මේ බත් තුදුස පිණ්ඩියාලෝප භොජනයට අතිරෙක ලාභය වේ, "අතිරෙක ලාභෝ නි භික්ඛා හාරතෝ අධිකලාභෝ" යනු විමති විනෝදනී ටීකායි **2 පංසුකූල චීවරයට**, 1 ඛෝම 2 කපාසික 3 කොසෙය්‍ය 4 කම්බල 5 සාණ 6 භඞ්ග යන ෂට් චීවරය සහ එයට අනුලෝම් වූ 1 දුකූල 2 පත්තුණ්ණ 3 චීන 4 සොමාර පට්ට 5 ඉඞ්ජ 6 දෙව දින්නා යන අනුලෝම චීවර ද අතිරෙක ලාභය වේ· 3 **රුක්ඛමූල සෙනාසනයට**; 1 විහාර 2 අඩ්ඪයොග 3 පාසාද 4 හම්මිය 5 ගුහා යන පස අතිරෙක ලාභය වේ. 4 **පූතිමුත්ත භෙසජ්ජයට**; 1 සපපි 2 නවනීත 3 තෙල 4 මධු 5 ඵාණිත යන පඤ්ච භෙෂජ්‍යය අතිරෙක ලාභය වේ· මහා: පා: 55[26] – 106[30] ම: පා: ස: 321[38]–438[16]A ස: පා: 922[38]–938[10] වි: වි: ටී: 370[8] -**චීවර සඞ්ඝ** (නා)= චීවර නමකට වැඩි සඞ්ඝයා. අතිරෙක චීවරත් වර්ගික සඞ්ඝයා. 1 චතුවග්ග 2 පඤ්චවග්ග 3 දසවග්ග 4 වීසතීවග්ග 5 අතිරෙක වීසතීවග්ගය යි කම්මයන්ගේ වශයෙන් සඞ්ඝයා පස් වැදෑරුම් වෙති. එයින් 1 **චතුවග්ගී සඞ්ඝයා**; අබ්භාන කම්මය, උපසම්පදා කම්මය සහ පවාරණය ද; තබා සෙසු කම් කිරීමට සුදුසුය. 2 **පඤ්චවග්ගී සඞ්ඝයා**; අබ්භාන කම්මය සහ මධ්‍ය දෙශයෙහි උපසම්පදා තබා සෙසු කම් කිරීමට සුදුසුය. 3 **දසවග්ගී සඞ්ඝයා**; අබ්භාන කම්මය හැර සෙසු සඞ්ඝ කම්මයෙහි කම්මීය. 4: 5. වීසත් වග්ගී සහ අතිරෙක වීසත් වග්ගී සඞ්ඝයා සියලු කම්කිරීමට සුදුසු වෙති. "වීසිවග සඟුන් විසින් සියලු කම් සිද්ධ වතුදු අසිරා වීසිවග සඟුන් ගැන්ම වතුවග්ගාදි සඟුන් විසින් කටයුතු කම් අතිරෙකයන් විසින් කට හැකි සේ ඤත්තියන් විසින් නො කටහැකි සේ දක්වන පිණිසය යි දතයුතු" කු: සි: ස: 71[14–39] ඛු: සි: ටී: 97[21] මහා පා: 356[38]-357[6] ස: පා: 350[26] වි: වි: 2601-2604 -**සඞ්කුසිදි** (නා) (සඞ්කුසු+ඒ)= අධිකයි යන හැඟීම ඇති. පාරා: පා: 263[17] -**සෙනාසන** (නා) [සං. සයනාසන]= රුකඵමූල සෙනාසනයට අතිරෙක ලාභ වූ 1 විහාර 2 අඩ්ඪයොග 3 පාසාද 4 හම්මිය 5 ගුහා යන පස් වැදෑරුම් සෙනසුන්. මහා: පා: 55[31] ම: පා: ස: 487[24]A (අතිරෙක ලාභ බලනු) -**ලඝු** (නා) [සං. ලඝු]= ඉතා යුහුසුළුව ම. ඉතා ඉක්මනින් ම. මහා: පා: 57[1] ම: පා: ස: 215[26] -**ලීන** (නා) (√ලී+යු=අන)= ඉතා හැකුළුණු ඉතා ලිහිල්. "අතිලීන විරියතා, ඉතා හැකුළුණු වීරී ඇති බැවින්" වි: මා: ස: 329[25] මනෝ: පූ: 680[30–31] -**විරිය** (නා) [සං. වීරී]= ඉතා හැකුළුණු වීරී "අතිලීන විරියං කොසජ්ජාය සංවත්තති" මහා. පා: 216[5] -**ලූඛ** (නා) [සං. රූක්ෂ]= ඉතා රූක්ෂ වූ. ඉතා කටුක. කිසි මොළොක් බවක් නැති. -**ලොණ** (නා)[සං. ලවණ]= ලුණු බහුල. ලුණු වැඩි. -**වණ්ණ** (නා)= ඉතා වක් වූ. ඉතා නැමුණු. -**වත්තති** (ක්‍රි) (අති+√වතු+අ+ති)= ඉක්ම පවතියි. මැඩ ලයි. අතී: -වත්තී වති -**වත්තති** අනා. -වත්තතියති ස: මී; -**වත්තයිත්‍ය** ප්‍ර: ක්‍රි: -**වත්තිත්වා**,තුං -**වත්තිතු**ං

ව: කෘ -වතෙනෙනෙනා= ඉක්ම පවතිමින්, මැඩ ලමින්. පරි: පා: 223[33] පරි: පා: ගැ: 28[33] -වත්තා (නා)= බොහෝ කථාකරන. ඉක්මී බෙණෙන. බ:ව්: -වත්තාරෝ, බොහෝ කථා කරන්නෝ: ඉක්ම බෙණෙන්නෝ, නිඳා කරන්නෝ. -වස්සති (ක්‍රි) (අති + √වස්ස + ති)= 1 තෙමෙයි. වැසි දිය පිවිසෙයි. 2 නැවත නැවත ඇවැතට පැමිණෙයි. ඇවැතට පැමිණ එය සඟවමින් නැවත අනෙක් ඇවැත කට පැමිණෙයි චූ: පෘ: 38[14] ස. පා: 948[37] 949₂ වි:වි:ටී: 498[15] වූ: පා: B 366[8] -වාක්‍ය (නා) (√වච + ණ්‍ය; ච=ක)= ඉක්ම පැවැති තෙපුල් නිඳා වචන. අඟට අනාසී ව්‍යවහාර. ධ: අ: ගැ: 74[18] අ. ප: ඨ: 18[23] (අටඨ අනරිය වොහාර බලනු) -වාත (නා)= ඉක්ම හමන සුළඟ. සැඩ සුළඟ. -වායති (ක්‍රි) (√වා + ය + ති)= ඉක්ම හමයි. තදින් හමයි -විකාල (නා)= ඉතා නො කාලයෙහි. ඉතා නුසුදුසු කාලය. -විය (නි) [සං. අතීව]= ඉතා ම වැඩියක් ම. (අතීව, අතිරිව යනු ද දක්නේය.) -විස (නා)= එනම් බෙහෙත් වර්ගය. එක් මුල් බෙහෙත් වර්ගයක්. ඉවද අතිවිඛයන්. මහා පා: 235[22] කු: සි: ස: 34[13] අ: ප: ස: 80[10] -විසාල (නා)= [සං. විශාල]= ඉතා විශාල වූ 1. දිගින් දුළුලින් මහත් බැව් නොහොත් ඉතා පළල් බැව්. 2. සක්මන් මළුවක නො විය යුතු දෙස් පසින් එකක්. දුළුලින් යෙළ රියන සඟ දිගින් සැට රියන ඉක්ම වූ සක්මන. ජා: අ: ගැ: 11[34] ජා: අ: ක: 6[39] -විසුද්ධ (නා)= ඉතා පිරිසුදු. සුපිරිසුදු. වී: වි: ටී: 184[4] -විස්සාසික (නා) (විස්සාස + ණික)= ඉතා විශ්වාස වූ -විඤ්ඤුත (නා) [සං. විඥැත]= ඉතා ප්‍රසිද්ධ වූ, ප්‍රකට වූ: -වේවචනි (ක්‍රි)= අතිශයින්ම පට ලවයි. තදින් වෙළයි. චූ: පා: 208[16] චූ: පා: B 108[13] -වේල (නා)= කල් යවා, වෙලාව ඉක්මවා, ප: සූ: 78₂[7] සා: පා: 990[7] ජා: අ: ගැ: 69[39] -සඤ්චාර (නා) (අති + සං + √චර + ණ)= නිතර ඇවිදින. -සණ්හ (නා)= ඉතා මිහිරි. ඉතා ප්‍රිය මනාප. -සන්න (නා)= ඉතා ශාන්ත වූ. -සම්බාධ (නා)= 1. ඉතා හිරිහැර ඇති. 2. ඉතා ලුහුඬු. දිගින් පුළුලින් හකවූ සක් මනක නො විය යුතු එක් දෙසයක් ජා: අ: ගැ: 11[33] -සය (නි)= අධික, බහුල, වැඩි. -සයති (ක්‍රි)= බොහෝ කොට නිදයි. පම්ණ ඉක්මවා නිදයි. -සාය (නා)=ඉතා සවස. -සාර (නා)= දෙමය වරද. ස: ප: 976[16] (සාතිසාර බලනු) -සිඛිල (නා) [සං. ශිථිල]= ඉතා ලිහිල්. මහා: පා: 216₂ මනෝ: පූ:680[30-31] (අතිලීන බලනු) -හරති (ක්‍රි) (අති + √හර + ති) 1. ගෙන්වා ගනියි. 2. ඉවත් කරයි. 3. ඇතුළට ගෙනයයි. 4. කැඳවයි. අති: -හරි වති: -හරන්ති අනා: -හරිස්සති සම්: -හරෙය්‍ය පූ: ක්‍රි: -හරිත්වා තුං -හරිතුං ව: කෘ: -හරණෙනා ප්‍රඅති: -හරාපෙයි -හරාපෙසුං ප්‍රවති: -හරාපෙති ප්‍රඅනා -හරාපෙස්සති ප්‍රසමී: -හරාපෙය්‍ය ප්‍රපුක්‍රි: -හරාපෙත්වා "අත්තනෝ අත්තනෝ සාධු සම්මතෙ සමණ බ්‍රාහ්මණෙ අනෙකාපූරං අතිහරථ දුනං දස්සාමාති" පෘවි: පා: 44[19] මහා: පා: 44[33] ම: පා: ස: 159[17] පාරා:පා: 116₂ ස:පා: 25[3₂-146[3₂ -හීන (නා)= ඉතා පහත්. -හීළෙති (ක්‍රි)= ඉතා අවමන් කරයි. ඉතා නින්දාකරයි.

අතීත (නා) (අති + √ඉ + ත)=ඉක්මුණු ගෙවුණු. පසු වූ -'අද්ධාන (නා)=පසු ගිය කාලය අතීත කාලය. යටගිය දවස. -'අනාගත (නා)= අතීත කාලය සහ අනාගත කාලය. ගිය දවස සහ මතුදවස. -කරණ (නා)= අතිත කරණය. තෙ වැදූරුම් කම් සංග්‍රහයන්ගෙන් එකක්. 1. ඤත්තිකපනාය. 2. විපඤත පච්චත්තය 8. අතීත කරණය යනුවෙන් කම් සංග්‍රහය තෙ වැදූරුම් වේ. "දදෙය්‍ය, කරෙය්‍ය" යනා දිය ඤත්තිඛපනා නම් වේ. "දෙති, කරොති" යනාදිය විපඤත පච්චත්ත නම් වේ. 'දින්නං, කතං" යනාදිය අතීත කරණ නම් වේ. "කඨින දුස්සං ඉත්ථන්නාමස්ස දදෙය්‍ය, සංඝො උපොසථං කරෙය්‍ය" යනාදිවූ ඤත්තිය නිබ්මෙන් ද, "ඉත්ථන්නාමස්ස දෙති කඨිනං අත්ථරිතුං අසමොහාගං කරොති" යනාදිවූ විපඤත පච්චයෙන් ද, "දින්නං සඞ්ඝෙන-කතං සඞ්ඝෙන" යනාදිවූ අතීත කරණයෙන් යයි ඤත්ති අනුසාවණ කම්යන්ගේ සඞ්ග්‍රහයෝ තුන් දෙනෙකි" පරි: පා: ගැ: 38[24] ස: පා: 1028[36] පරි: පා: 279[1] -දිවසභාගං (නා)= ඉක් මුණු දවහල් කාලය. ඊයේ දවස, ස: පා, 417[8] වි: වි: ටී: 235[4] -පච්චවෙක්ඛණ (නා) (පති + අවෙක්ඛණ) (පති + ආ + වි + √ඉක්ඛ + ණ)[සං. ප්‍රත්‍යවෙක්ෂණ]= අතීත ප්‍රත්‍යවෙක්ෂාව. අතීත සිව්පසය පිළිබඳ නුවණින් සලකා බැලීම. "අජ්ජමයා යං චිවරං පරිභුත්තං" යනාදීන් අද උදය පරිභොග කළ සිව්පසය පිළිබඳව සවස

කරන ප්‍රත්‍යවේක්ෂාව වි: ලං: 98[30]–99[8]–100[4] වි: මා: ස: 82[14] පා: මූ: වි: වි: 65[17] (පච්ච වෙක්ඛණ සුඛි බලනු) **-පරිභොග** (නා) (පරි + √භුජ + ණ;ජ=භ)= එදවසම උදය කාලයෙහි කළ සිව්පස පරිභොගය. මෙහි අතීත යනුවෙන් හඳුන්වනුයේ සවස හෝ රාත්‍රි කාලයෙහි ප්‍රත්‍යවේක්ෂා කරන්නහුගේ උදය කාලයයි. ''අතීත පරිභොගොතිච ඉමස්මිං යෙව දිවසෙ පච්ඡා භත්තාදි කාලං උපාදාය පුරෙභත්තාදිසු පරිභොගෙ ඉච්ඡිතබ්බෙ'' වි: ලං: 99₂ **-සඤ්ඤා** (නා)= ඉක්මුණු බුදුන් ඇති. බුදුන් පිරිනිවන් පෑ. ස: පා: 3[31] ථි. වි: ටි: 10[13]

අතීසාර (නා)= එනම් රොගය. මහා විරෙකය. අ: ප: ස: 4[525]

අතුරිත (නා) (න + තුරිත) අසීඝ්‍ර, ඉක්මන් නැති, සෙමින්. **-චාරිකා** (නා) (√චර + ඉ + ණ්වු= අක + ආ)= අතුරිත චාරිකාව. බුදුන්ගේ එක් චාරිකාවක්· ගම් නියම්ගම් පිළිවෙළින් දින පතා යොදුන අඩයොදුන වශයෙන් පිඬු සැරීම් ආදීන් ලොකයාට අනුග්‍රහ කරමින් වැඩමවීම. සං: දී: 38[419]

අතුල්‍ය (නා)= අසමාන, සමාන නැති. **-ඤාණ-කථා** (නා)= අතුල්‍ය ඤාණකථා. අසමාන ඤාණකථා. කසිනදාන ඤාණ දුතිය කම්මවාක්‍යය සහ කසිනාරම්භ පිළිබඳව ලැබෙන ඤාණයන්ගේ අසමානතාවය. කසින දීක්ඛාවයෙහි දී කසින දාන කම්මවාක්‍යය දෙසන සඞ්ඝයා සහ කසිනය ඇතිරීම කරන භික්ෂුවද අතුල්‍ය ඤාණ වෙත් මෙහි කම්මවාක්‍යය දෙසන ඤාණ සඞ්ඝයාගේ. කසිනය අතුරන ඤාණ පුද්ගලයාගේ. එබැවින් අතුල්‍ය ඤාණ වශයි. ''ඤාණං අතුල්‍ය ඤාණාරොති කම්ම වාචාය ඤාණාරොති කම්ම වාචාය ඤාණා සඞ්ඝා හොති අත්තාරස්ස ඤාණා පුග්ගලො හොති එවං අතුල්‍ය ඤාණාරො හොතී'' වි: ලං: 367[11] **-ඤාණ** (නා)= අතුල්‍ය කම්මය කසීන වීවර විනිශ්චයයෙහිදී කම්මවාක්‍යයට කම්මය වන කසීන වස්තුය සහ ඇතිරීමට කම්මය වන කසීන සංඛ්‍යාත වූ සමුදාය ප්‍රඥප්තිය දැන දෙක. වි:ලං: 367[14] **-කාල** (නා)= අතුල්‍ය කාලය. අසමාන කාලය. කසීන දාන කම්මවාක්‍යය; කසීන වීවරය පිළිබඳ පුබ්බකරණ, පච්චුද්ධාර, අධිට්ඨානයන්ගේ පූර්වයෙහි ද, කසිනය ඇතිරීම ප්‍රබල කරණාදීන්ගෙන් පසුවද වේ. මෙසේ කාලය වශයෙන් අසමාන වේ. වි:ලං: 367[16] **-කිරියා** (නා)= අසමාන ක්‍රියාව. කම්මවාක්‍යයෙන් කසිනය දීම ක්‍රියාව ද, ඇතිරීම අධිට්ඨාර ක්‍රියාවෙන්ද වන බැවින් අතුල්‍ය ක්‍රියා නම් වේ. ''කථං අතුල්‍ය කිරියා හොතී කම්මවාචා දාන කිරියාහොති. අධිට්ඨාරෙ පණ්ණරස ධම්මානං කාරණභූතා අධිට්ඨාර කි යාති එවං අතුල්‍ය කිරියා. වි: ලං: 367[9] (අතුල්‍ය කත්තාරෙ බලනු)

අතෙකිච්ඡ (නා) (න + තිකිච්ඡා) (√කිත + ඡ; කි + √කිත + ඡ; ති + √කිත + ඡ; ති√කිච + ඡ තිකිච්ඡ) [සං. චිකිත්සා]= පිළියම් නොකට හැකි. 1 පාරාජිකා පත්තිය 2 පඤ්චානන්තරීය කම්මය චූ: පා: 331[29] ස: පා: 941[10]

අත්ත (නා) [සං.ආත්ම]= 1 චිත්තය, විඤ්ඤාණය; 2 ශරීරය 3 සභාවය 4 ආත්මය, පරමාත්මය 5 සත්තෝපාදය. අ: ප: ස: 114[19] සු: නි: අ: 2[5319] **-'අත්ථ** (නා)= ආත්මාර්ථය, සත්වාර්ථය. තම කටයුතු. තම දියුණුව. තමන් පිණිස. වි: වි: ටී: 16[84] (අත්ත දත්ථ යනුද මෙසේ මැයි) **-'අනුවාද** (නා)= අනු + √වද + ණ)= තමන්ම තමාට අවවාද කිරීම. **-'ඕභය** (න)- එනම් බිය, ''ඉදින් නෝ පවු කෙළෙඹි විනම් මා කළ සේ නප්‍රරූපි කියා තෝම තට අවවාද කරන්නෙහියයි කියා එසේ තමන්ම තමාට කරන්නාවූ අවවාදයෙහි භයය.'' ජා: අ: ගැ: 59[33] ම: පූ: 530[18] වි: මා: ස: 38[1] (2) **-'අදාන** (නා)= තමා තෙපුල්දීම. අධිකරණය ගැන්ම. තමා විසින් ගන්නා අධිකරණය. ශාසනය පිරිසුදු කරනු කැමැති භික්ෂුනමක් යම් අධිකරණයක් තමා විසින් ඉදිරිපත් කර ගනියි ද, ඒ අධිකරණය අත්තාදානය නම් වෙයි. ඒ ගන්නා භික්ෂුව කරුණු පසක් සලකා බැලිය යුතුයි. ''එත්ථ සාසනං සොධෙතු කාමෝ භික්ඛු යං අධිකරණං අත්තානං ආදියති තං අත්තා දානන්ති වුච්චති'' චූ: පා: B. 390[6–583]10 (ලී: ඉ:) ස: පා: 949[84] චූ: පා:390[86] පරි: පා: ගැ: 34[89] පරි: පා:[526] (අත්තාදාන ලක්ඛණ බලනු) **-'ලක්ඛණ** (නා)= අත්තාදානය ගන්නා භික්ෂුව විසින් සලකා බැලිය යුතු කරුණු පස. 1 සුදුසු කාලය 2 සත්‍යවොදනාව 3 වැඩ සහිත වීම

4 සඳහාම සම්භවන භික්ෂූන් ලැබීම 5 සඞ්ඝයා අතරකලහයක් නොයිපදීම යන කරුණුපසින් අත්තාදානය යුකත වීය යුතුය. චූ: පා 390[88] චූ: පා: B.391[10] පරි: පා: 252[11] සා: පා: 949[24] -'ආධිපතෙය්‍ය (නා) (අධිපති + ණෙය්‍ය) [සං. ආධිපත්‍ය]= ආත්මාධිපත්‍යය, තමා අධිපති කොට ඇති බව. තමන් කෙරෙහි නොරව යෙන් පවත්වන ලද්ද, ලජ්ජාධික බව. නෙවැ දූරුම් ශීලයන්ගෙන් එනක්. ආත්මාධිපති ශීලය 'අත්තා එව ගරු අධිපති එතස්සාති අත්තගරු- ලජ්ජාධිකො; අත්තාධිපතිනො භාවතං අත්තාධිපතෙය්‍යං" වි: මා: සා: 35[88]-42[27] වි: ම: ටී: 27[13] -'ආධීන (නා)= සවාධිපත්‍යය, තම අධිපති භාවය. නිදහස. දී: නි: B 180[23] -'ඉස්සර (නා) [සං: ඊශ්වර]= සව ප්‍රධාන සවාධිපති. සා: පා: 833[23] -'උකකංසන (නා) (උ + √කංස + යු=අන) [සං. උත්කර්ෂණ]= ආත්මොත්කර්ෂය. තමා උසස් කොට සැලකීම. ශීලය කිලුටු වන කරුණු දෙකින් එකක්. හීන ශීලය. 'අහමස්මි සීල සම්පන්නෝ ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ දුස්සීලා පාප ධම්මාති. එවං අත්තුකකංසන පරවම්භනානි උපකකිලිඨං වා හීනං" වි: මා: සා: 415—4212 ජා: අ: නි: 1348 -'උද්දෙස (නා) [සං. ඵුද්දිශ්‍ය]= තමන් උදෙසා. තමනි වසන පිණිස කරවන බැවින් තමා උදෙස කොට ඇති. "අත්තනා උද්දිස්සො අස්ස, නි=අත්තු දෙස්සො" කං: වි: 39[24] ප්‍රා: පු: සා: 18[17] සා: පා: 402[8]-406[37] -'උද්දෙසික (නා) (උද්දෙස + ණික)= තමන් උදෙසා පවත්ගත්. තමන් උදෙසා ඇරඹූ. පාරා: පා 1702[1] සා: පා: 432[6] -'උපකකම (නා) (උප + √කමු + ණ)= තමාගේ උපක්‍රමය, ඵිතස්සාහය, වැහැම. තමාගේ උපක්‍රමයකින් හෝ මෙරමාවගේ උපක්‍රමයකින් හෝ ශුක්‍ර මුදන්නනුට සඞ්ඝාදිශෙෂ වේ. වි: වි: 326 -'උපනායික (නා) (උප + √නී + ණ; ඊ=එ=අය= උපනය + ණික)= තමා කෙරෙහි ඇතිවත් ඉක්මට. ධ්‍යාන විමොක්ෂාදී උත්තරි මනුෂ්‍ය ධර්මය කෙරෙහි තමා එළවා නෝ තමන් කෙරෙහි උත්තරි මනුෂ්‍ය ධර්මය එළවා. උත්තරි මනුෂ්‍ය ධර්ම පාරාජිකා ශික්ෂාපදයෙහි එක් අඞ්ගයක්. කං: වි. 31[31] සා: පා: 348[28] ප්‍රා: පු: සා: 10[30] කු: සි: සා: 6[28]-8[23] කං: වි: පි: 24[16] පාරා: පා: 92[5] -ඤාන (නා) (√කර+ත) [සං කෘත]= තමන් විසින් කළ. -කාම (සා)= තමන් විසින් කැමැති වන ලද. මෛථුන රාග වශයෙන් පතන ලද කා: වි: 36[35] -කාම පාරිචරියා 1 (නා) (පරි + √චර + ණිය) [සං. පරිචර්යා]= තමහට කාමයෙන් මෙහෙකිරීම. මෛථුන ධර්ම නම් වූ කාමයෙන් මෙහෙ කිරීම. සුභාෂිත-දුර්භාෂිත දන්නා මිනිස් මාගමකට මෙවුන්දමින් තමහට මෙහෙකිරීමෙහි අනුසස් කීම. මෙහි කාමය නම් මෛථුන ධර්මය යි. පාරිචරියා නම් පූජාව, උපස්ථානය හෝ මෙහෙ කිරීමයි. "මෛථුන ධම්මසඞ්ඛාතෙන කාමෙන පාරිචරියා = කාමපාරිචරියා, අත්තනො අත්ථාය කාම පාරිචරියා අත්තකාම පාරිචරියා". කං: වි: 36[32] කං: වි: පි: 28[6] සා: පා: 393[27] පාරා. පා: 149[35] -කාම පාරිචරිය 2 (නා)= එනම් සඞ්ඝාදිශෙෂා පත්ති ශික්ෂාපදය. යම්කිසි භික්ෂුවක් සුභාෂිත දුර්භාෂිත දන්නා මිනිස් මාගමකට "එතදග්ගං භගිනි පාරිචරියානං යා මාදිසං සීලවන්තං කල්‍යාණ ධම්මං බ්‍රහ්මචාරිං එතෙන ධම්මෙන පරිචරෙය්‍ය" යනුවෙන් තමහට මෛථුන ධර්මයෙන් මෙහෙ කිරීමෙහි අනුසස් කියා "අරහසි ත්වං මයහං මෛථුන ධම්මං දාතුං" යනාදී මෛථුන ධර්මප්‍රතිසංයුක්ත වචනයෙන් මෙවුන්දම් අයැදීමෙන් සිදුවන අත්තකාම පාරිචරියා නම් සඞ්ඝාදිශෙෂාපත්තිය. නි: ශී: 48 කු: සි: සා: 11[16] ප්‍රා: පු: සා: 16[14] කං: වි: 377 සා: පා: 394[28] -කාම රූප (නා)= තමන්ගේ හින වැඩ කැමැති සභාවය ඇති. තම දියුණුව කැමැති. මනා: පා: 40[30] වි: වි: ටී. 444[26] -කාර (නා) (√කර + ණ)= තමන් විසින් කළ කර්මය. "නත්ථි අත්තකාරා, තමා කළ කර්මයෙහි විපාක නැත" මක්ඛලි ගොසාල යන්ගේ එක් වාදයක්. දී: නි: B. 1225-1238 සු: වි: 113[10] -කිලමථ (නා) [සං, කුලමථ]= ආත්ම කුලමථය. ශරීරයට දුක් දීම පිඩා කිරීම. -කිලමථානුයොග (නා) (අනු + √යුජ් + ණ)= ආත්මකුලමථානුයෝගය, ශරීරයට පිඩා කිරීමෙහි නිතරයෙදීම. ඉනා යෙදියයුතුයයි වදාළ යොග ක්‍රමයක්. "ආත්ම නම් ශරීර යැ කිලමථ නම් පිඩා යැ. අනුයොග නම් එහි යුත්ති යැ" 'කිලමොව කිලමථො අත්ත නො අත්තභාවස්ස කිලමථෝ=අත්තකිලමථෝ තස්ස අනු අනු යොගො පුනප්පුනං පවත්ත නං අත්තකිලමථානුයොගො" ම: බෙ: ගැ:

576 වි: වි: ටී: 364–3599 සා: දී: 1711 **-ගරහි** (නා) (√ගරහ + ඉ) [සං. ගර්හී]= තමාටම තමන් ගර්හා කරන 'අත්ත ගරහිනෝ මයං භගෙන ආනන්ද අනඤ්ඤ ගරහිනෝ" පාරා: පා: 2188 **-ගුත්ත** (නා) (√ගුප+ත) [සං ගුප්ත]= තමන් විසින් රක්ෂා කරන ලද. **-ගුත්ති** (නා) (√ගුප + ති) [සං. ගුප්ති]= ආත්ම ගුප්තිය සඛකිය ආරක්ෂාව. ම: පූ: 6188 **-ඤාත්ත** (නා) (√ ඤා + යු = අන; √ඤා =ඤාත)=ආත්ම ඥානය තමන් තැසීම. ආහාර අනුභව නො කිරීම් ආදියෙන් තම ජීවිතය විනාශ කර ගැනීම. "අඤ්ඤාත නෙ. ආහාරොපචෙජ්දීන්. තමා මැරීමෙහි ද; දුක්ඛවං, දුක්ඛළා වේ" කු: සි: ස: 1169 පා: මූ: වි: වි: 3839 සම් ඎසි ගිලන් භික්ෂුවක් බෙහෙත් ද, උපස්ථායකයන් ද ඇතිකල්හි මැරෙනු කැමැත්තෙන් ආහාර නො ගනී ද, දුක්ඛළා වේ. යමෙක් දරුණු රොගින් දිගු කලක සිට පෙළෙන්නේ ද, ඔහුට උපස්ථාන කරන භික්ෂූන් කවරදා මොහුගෙන් මිදෙමු දැ යි පිළිකුල් කෙරෙත්ද,එබඳු ගිලන් භික්ෂුව ආහාර අනුභව නො කෙරේ ද, බොහෙන් නො බෝ ද එහි ඇවැත් නැති. යම් කිසි ගිලන් භික්ෂුවක් "මගේ මේ රොගය ඉතා දරුණුය. ආයු සංඝකාරයෝ ද නො පවතිත්. අධිගමය ද මා අතට පැමිණියා වැනිය සි" සිතා ආහාර ගැනීම වළක්වා ද; එසේම නො ගිලන් වුව ද උපන් සංවෙග ඇතිව කමටහන් වැඩීමෙහි ම යෙදෙමි. ආහාර සෙවීම පමා විමකැසි සිතා ආහාර නො ගනී ද, එහි දු ඇවැත් නැති කු: සි: ස: 1169 පා: මූ: වි: වි: 3839 ස: පා: 3339-3348 **-චතුක්ක** (නා)= තමන් සතර වැනි කොට. සෙසු තිදෙනකු සමග. "පොහොා කරන දීන සමාන සංවාසක පැවිද්දන් වසන ආවාසාදියක සිට නානා සංවාසක මහණුන් වසන ආවාසාදියකට නො වැඩිය යුතු. එසේ වඩනා සේක් නම් තමන් හා සිව් නමකට අඩු නො වන සේ වැඩම විම ද, රාජාදි දඟවිඩ අනතරාය අතු රෙන් එකක් පැමිණි කල හුදෙකලාව වැඩම විම ද වැරැදි නො වේ. "යඛනන්තිමෙන පරිවෙජ්දෙන අත්තචතුත්ථෙන වා අත්තරායෙ සති ගන්තුං වට්ටති" ම: පා: අ: 4163 ස: පා: 7193 කු: සි: ස: 1522 (අඤ්ඤත්‍ර අන්තරා බලනු) **-ත්ත** (නා)= තමන් පිණිස: තමන් උදෙසා. වි: වි: ටී: 1624 **-දණ්ඩ** (නා)= 1 අතින් ගත් දඬු ඇති. 2 තමන් විසින් කළ දුශ්චරිත. සු: නි: අ: 4533 **-දමන** (නා)= (√ දම + න; ම=න)= ආත්ම දමනය. තම හිත කය වචනය යන තිදෙර දමනය කරගැණීම. **-දීප** (නා) [සං. දීප]= තමාට තමන් පහනක් ව. තම ගුණය ම පහනක් කොට හැසිරෙන. සු: නි: අ. 3483 **-දුහර** (නා) (දු + √හර + අ)= තමන් විසින් ද, උපස්ථායකයන් (අනුන්) විසින් ද පොෂණය කිරීමට දුෂ්කර. එබඳු පුදගලයා. අසංවර පුදගලයා තමාට ම තමා පොෂණය කිරීම දුෂ්කර වන්නේය. අත්ත දුහර- උපට්ඨාක දුහර යයි පුදගලයෝ දෙදෙනෙක් වෙත්. යමෙක් ඇඹුල් ආදිය ලැබ නැවත නැවතත් ඇඹුල් ආදියම සොයන්නේ ද, අනෙකකුගේ නෙයින් ලද දෙය අනෙකකුගේ ගෙනි විසුරුවා හෙළ හැම තැන ම ඇවිදන් හිස් පාත්‍රයෙන් යුක්තව ම විහාරයට පිවිසෙන්නේ ද, මේ අත්තදුහර නම්. යමෙක් ඇල් සාලේ බත් මසුන්-සමග පාත්‍රය පුරා ලැබත් නො සතුටු ගතිය ම පෙන්වන්නේ නම් හෝ දුන් දෙය දුන්නවුන් හමුවෙහි ම පහත් කොට බැණ අනුනට දෙන්නේ නම් හෝ මේ උපට්ඨාක දුහර නම්. සා: දී: 4126 ස: පා: 1547 වි: වි: ටී: 888 උ: අ: 14115 **-නො මති** (අත්තනෝ මති) (√මන + ති)= සිව් වැදෑරුම් විනිශ්චයන් එකක්. සථවිර වාදය. අධිප්පාය. අනුඥාත ඥානයෙක් ගත් සථවිර වාදය. විකා පාළිය? 1 සමථ විනය 2 පඤ්ඤත්ති විනය සි විනය දෙ වැදෑරුම් වේ. එයින් 1 **සමථ විනය** නම්; භික්ෂූන් අතර හට ගන්නා 1 විවාදාධිකරණ 2 අනුවාදාධිකරණ 3 ආපත්තාධිකරණ 4 කිච්චාධිකරණ යන චතුර්විධ අධිකරණයන් සන්සිඳුවනු පිණිස පණවා වදළ 1 **සම්මුඛා විනය** 2 **සති විනය** 3 **අමූළ්හ විනය** 4 **පටිඤ්ඤාත කරණය** 5 **යෙභුය්‍යසිකා** 6 **තස්ස පාපියසිකා** 7 **තිණවත්ථාරක** යන සප්ත සමථයෝ සි. 2 **පඤ්ඤත්ති විනය**; 1 **සුත්ත** 2 **සුත්තානුලොම** 3 **ආචරියවාද** 4 **අත්තනොමති** යනුවෙන් සිව් වැදෑරුම් වේ. එහි 1 **සුත්ත** නම්; සියලු විනය පිටකයට ඇතුළත් 1 මා තිකා 2 විභඞ්ග 3 ඛන්ධක 4 පරිවාර යන භෙද ඇති පාළි ධර්මයයි. 2 **සුත්තානුලොම**

නම්; සතර මහා ප්‍රදෙශනය යි. සූත්‍ර නම් වූ පාළි ධර්මයට අනුලොම් ව, සුදුසු සේ සලකා ගනයුතු බැවින් සුත්තානුලොම නම් වී ය. 3 **ආචරිය වාද** නම්; ධර්ම සඞ්ග්‍රාහක පන්සිය යක් මහරහතන් වහන්සේ විසින් කරන ලද පාළි විනිර්මුක්ත වූ ඔක්කන්තික. විනිවිජය නම් වූ අට්ඨකථා පාළිය යි. පාළි මුත්තක විනය යනු ද මේයට ම නම්. 4 **අත්තනොමතී** නම්; **සුත්ත**, සුත්තානුලොම, **ආචරිය** වාදයන්හි පිහිටි විනයධරයා ගේ සිතෙහි අනුමාන බුද්ධියෙන් **ඤාත** වන නයග්‍රාහ කථාව හෝ සූත්‍රානිධර්ම විනයාට්ඨකථා ගත සියලු ථෙරවාදය හෝ වේ. විනයාට්ඨ **සමුච්චය** සන්නයෙහි මෙසේ දක්නේය. "සූත්‍රඅටුවා අභිධර්ම අටුවා විනය අටුවායෙහි ආවා වූ ත්‍රිපිටක චූළාභයාදි සියලු තෙරවරුන්වහන්සේ ගේ වාදය **අත්තනොමතී** නම්වෙයි දනයුතු" (අමූ:බු:) ශ්‍රී මුඛ පාළිය සූත්‍රය යි ද, ශ්‍රාවක භාෂිතය සුත්තානුලොම යයි ද, අට්ඨකථා පාළිය ආචරිය්‍ය වාද ය යි ද, ටීකා පාළිය අත්තනොමති යයි ද නය ග්‍රාහ වශයෙන් ගත හැකි ය "ආහචව පදෙන බො මහා රාජ රසෙන ආචරියවංසතා අධිප්පායො" යනුවෙන් 1 ආහ චව පද 2 රස 3 ආචරියවංස 4 අධිප්පාය යන නම්වලින් ද මේ සතර ම අදුන්වන ලදී. මේ සතරින් අත්තනොමතිය සළු දුර්ලභ ය. එයට වඩා ආචරිය වාදය ද; ආචරිය වාදයට වඩා සූත්‍රානුලොමය ද බලවත් ය. සියල්ලට වඩා සූත්‍රය ම බලවත් වේ අත්තනොමතිය ආචරිය වාදය හා සම වේ නම් ගත යුතු ය. නැතහොත් නො ගත යුතුය. ආචරියවාදය සූත්‍රානුලොමය සමග සැසඳේ නම් ගත යුතුය. එසේ නො වේ නම් නො ගත යුතුය. සූත්‍රානුලොමය ද, සූත්‍රය සමග සම නම්. එහි බැස සිටී නම් ගත යුත්තේය. නැත නො ගත යුත්තේ ය (විසාර සමන්තපාසාදිකා විනයට්ඨකථාවෙන් දන්නේ ය.) ස: පා: 161[26]-162[12] සා: දී: 430[12]-431[4] වි: වි: වී: 102[18] සු: ප: XVI **-නතප** (නා) (√තප + අ)=ආත්මතාපය. ආ ම තාපනය කරන්නෝ. තමහට දුක් දෙන්නෝ· "විද්‍යාචරණ විපත්තියන්ගෙ සවු වෝ අත්තනත්තපාදීන් මෙනි, ආදිග්‍රහණින් පරන්නප උභයන්නපයන් ගත්හු" ඒ: මා: ස: 484[17] ස: පා: 70[17] වි: වී: වී: 4[319] වි: ම: ටී: 192[27] **-පච්චක්ඛ වචන** (නා) (පති + අක්ඛ) [සං. ප්‍රත්‍යක්ෂ]= තමා ප්‍රත්‍යක්ෂ කොට කියන ලද වචන. තමන් ජීවත්ව සිටියදී පැවසූ. ධර්මාන බුදුන් සමයෙහි දෙසන ලද වචන. ආගවචභාසිතය. "තෙන සමයෙන බුද්ධෝ භගවා වෙරඤ්ජායං විහරතීති එවමාදි වචනං සඞ්ගාය වුත්තං. ඉදං හි බුද්ධස්ස භගවතෝ අත්ත පච්චක්ඛ වචනං න හොති" ස: පා. 3[14] වි: වි: වී: 8[19] සා: දී: 2[211] **-පච්චක්ඛික** (නා) (පච්චක්ඛ + ණික = තමහට ප්‍රත්‍යක්ෂ වූ. සඛකීය ඉන්ද්‍රිය ගොචර වූ. **-පච්චත්තික** (නා) (පති + අත්ත + ණික) [සං. ප්‍රත්‍යාත්මික]= තමහට තමන් සතුරු වුවෝ, දුශශීලයෝ, ලජ්ජී ප්‍රිය ශීලි භික්ෂූන්ට චොදනා කරන, එබඳු භික්ෂූන් ගේ අවැඩ කැමැති වෛරී දුඃඛාලයෝ. මෙත්තිය භුම්මජක, වඩ්ඪ ලිච්ඡවි වැනියෝ. ස: පා: 64[82] වි; වි: වී: 500[17] සා: දී: 868[17] **-පටිලාභ** (නා) (පටි + √ලභ + ණ) [සං. ප්‍රතිලාභ]= (අත්තභාව පටිලාභ බලනු) **-පරිතාපන** (නා) (පරි + √තප + යු=අන)= ශරීරය තැවීම .ශරීරයට වධ දීම. ආත්ම කිලමථ. මනෝ: පූ: 563[26] **-පරිත්තන** (නා) (පරි + √තා + අ) [සං. පරිත්‍රාණ]= ආත්මාරක්ෂාව. චූ: පා 220[33] වි: වි: ටි: 335[24]-457[10] මනෝ: පූ:518[28] **-පරිභව** (නා) පරි + √භූ + ණ; ඌ= ඔ= අව [සං. පරිභව]= තමහට තමන් අවමන් කිරීම. ආත්ම පරිභවය. අ: ප: ස: 2[59] **-භාර** (නා (√හර + ණ)=තමා පමණක් පොෂණය කරන. ආත්මභාවය ආරක්ෂා කරන. උ: අ: 141[15] **-භාව** (නා)= අත්මභාවය. ශරීරය. ජීවිතය. අ: ප: ස: 2[219] **-ංපටිලාභ** (නා) (පටි + √ලභ + ණ) [සං. ප්‍රතිලාභ]= අත්මභාව ප්‍රතිලාභය ජීවිතයක් ලැබීම. චූ: පා: 310[3] මනෝ: පූ: 544[20]-616[5] **-මනෝ** (නා)=සතුටු සිත. එකඟ වූ සිත. නො පෙරෙළෙන සිත. ප්‍රීතියෙන් හා සොම්නසින් යුත් සිත. එබඳු සිත්. ඇති තැනැත්තා. ධ: අ: ගැ: 206[3] පාරා: පා: 279[40] අ: ප: ස: 146 මනෝ: පූ: 533[31] 668[4] උ: අ: 148[7-9] **-රූප** (නා)= ආත්ම සවරූප. එක පුඟලයකු මෙන් **-වධ** (නා) (√වධ + අ) [සං. වධ]= ආත්මවධය. තමාගේම විපත්තිය, චූ: පා: 314[3] චූ: පා B. 169[1] මනෝ: පූ: 519[18] **-වාද** (නා)= ආත්මවාදය. සඛකීය වාද මාර්ගය.

-විපත්ති (නා) (වි + √පද + ති)= ආත්ම විපත්තිය. තමාගේ විනාශය. **-චෙතන** (නා) [සං. චෙතන]= තමාගේම වැඩ කිරීමෙන් තමනට ලැබෙන වැටුප. සචකීය චෙතනය. සු: නි: 2533 **-ව්‍යාබාධ** (නා) (වි + ආබාධ) (වි + ආ + √වධ + ණ)= තමනට හිංසා පිණිස. තමාගේ විපත්තිය පිණිස **-සඤ්චේතනා** (නා) (සං. + √චිති + යු=අන + ආ; ඉ=ඒ)= තමන් සිතූ සිත. තම චෙතනාව මනෝ: පූ: 54421 **-සම්භව** (නා) සං + √භූ + ණ)= තමන් කෙරෙහි හටගත්. තමන්ගෙන් උපන්. උ: අ: 23181 **-සම්භූත** (නා) (සං + √භූ + ත)= තමන් කෙරෙහි හෝ තමන්ගෙන් හෝ හටගත් **-සම්මාපණිධි** (නා) [සං. ප්‍රණිධි]= ආත්මය මනාව පැවැත්ම. යහපත් දිවි පැවැත්ම. සිල් නොරක්නා තැනැත්තේ සිල් රැකුමෙහි යෙදේද, සැදැහැ නැත්තේ සැදැහැයෙහි පිහිටාද, මසුරු නැනැත්තේ දීමෙහි යෙදේද මේ අත්ත සම්මා පණිධි නම් වේ. සු: නි: අ: 25526 **-සරණ** (නා) (√සර + යු=අන; න=ණ) [සං. ශරණ]= තමහට තමන් පිළිසරණ වීම. **-සුඛ** (නා)= ආත්ම සුඛය. තම සැපය. **-හෙතු** (නා)= තමා හෙතුකොට, තමන් නිසා. ධ: අ: ගැ: 153[20]

අත්ථ (අ) [සං. අත්‍ර]= මෙහි. මේ කරුණෙහි,

අත්‍රජ? (නා) [සං. ආත්මජ > පා: අත්තජ]= දරුවා. පුතා. "අත්‍රජ" යනු පාළි අත්තජ ශබ්දය වෙනුවට යදෘනත් රූපයකි. එහි නියම රූපය අත්තජ විය යුතුය. අ: ප: ස: 3385

අත්‍රිච්ඡා (නා) (අත්‍ර + ඉච්ඡා) (අති + ඉච්ඡා?)= වැඩියක් කැමැති වීම. තමන් ලද කොටසෙහි නොසෑහී මෙරමා ලද කොටසත් පැතීම සං: වි: 33288 **-තා** (නා) =වැඩියක් කැමැති වන බව. තමන් ලද ප්‍රණීතාහාරය ද ලාමක සේ ද, මෙරමා ලද් ලාමකාහාරය ප්‍රණීත සේ ද, දැක එය පතන බව ස: වි: 33283

අත්ථ (නා) [සං. අර්ථ]= 1 ප්‍රයෝජනය 2 ශබ්ද ව්‍යාව්‍යය 3 අභිවෘද්ධිය 4 ධනය 5 ද්‍රව්‍ය ගුණ කර්මාදි පදාර්ථය 6 කාරණය 7 විනාශය 8 හිතය 9 අත්ත පළිතය 10 අර්ථකථාව 11 විනිශ්චය 12 බුද්ධිය 13 ශක්තිය 14 රුචිය 15 නිවෘත්තිය 16 ද්‍රව්‍ය ශරීරය 17 සමාන ඝන අර්ථයන්හි වැටෙන කාම පදයක්. අ: ප: ස: 1044 ධ: ප්‍ර: 5515 **-'අනත්ථ** (නා)=වැඩ අවැඩ. දියුණුව සහ පිරිහීම. 'අත්ථානත්ථ කුසලෝ, හිතාහිතයෙහි සෙවූයේසි'' ධ: අ: ගැ: 116[29] **-'අනුරූප** (නා) 1 අර්ථයට අනුරූප වූ. අර්ථයට ඇදුසුසු. 2 හෙතුවට සමාන ඵලය ලැබෙන. කාර්‍යයට අනුරූප. ස: පා: 1318 සා: දී: 6817 **-උදඛාර** (නා) (උ + √ධර + ණ)= අර්ථෝදඛාරය. අර්ථය උපදවා කීම: අර්ථය කීම. අටුවා කථාව. "න අත්ථකුසලොති න අට්ඨකථා කුසලෝ. අත්‍රුදඛාරෙ ඡේකෝ න හොති" ස: පා: 1022[32] විමා:ස: 918 උ: අ: 830 **-'උපසංහිත** (නා) (උප + සං + √හි + ත)= වැඩෙන් යුක්තවූ. ප්‍රයෝජනවත්. පරි: පා: ගැ: 4122 පරි: පා: 28422 **-කාම** (නා) (√කම + ණ)= වැඩ කැමැති. දියුණුව කැමැති. වි: වි: වී. 21318 ධ: අ: ගැ: 241 **-කුසල** 1 (නා) [සං. කුශල]= අර්ථ කුශල වූ. අටුවායෙහි දක්ෂ වූ. "න අත්ථකුසලොති න අට්ඨකථා කුසලෝ. අත්‍රුදඛාරෙ ඡේකෝ න හොති" පරි: පා: ගැ: 3521 ස: පා: 102231 පරි: පා: 2617 **-කුසල** 2(නා)= හිත වැඩෙහි දක්ෂවූ. තම දියුණුවට හිතවූ ප්‍රතිපදාවෙහි දක්ෂවූ. සු: නි: අ: 13522 **-ගම්භීර** (නා) [සං. ගම්භීර] අර්ථ ගම්භීර වූ අර්ථයෙන් ගැඹුරුවූ. ධර්මය සාර්ථක වන එක් ආකාරයක්. "මොවුන් කෙරෙහි ප්‍රතිවෙධය ද අර්ථසන්නිශ්‍රය හෙයින් අර්ථ සම්පත්තිය හා වන බැවින් "අත්ථගම්භීරතා පටිවෙධ ගම්භීරතා නි සාත්ථා" යි කීහු" වි: මා: ස: 5256[22]. වි: වි: ටී: 569 ස: පා: 7829 (සාත්ථං බලනු) **-ගමන** (නා) (√ගමු + ත)= අසනයට ගිය. අවරට ගිය. ස: පා: 63422 ක: වි: 9833 **-චරියා** (නා) [සං. චර්‍යා]= දියුණුව පිළිබඳ පැවැත්ම. අභිවෘද්ධියට හිතවත් වූ කටයුතු කිරීම. තම කටයුතු කර ගැණීමට සැහෙන වසතුව දීම. සිව් සඟරා වන්නෙන් එකක්. මනෝ: පූ: 4981[9]-7632[1] **-ජාත** (නා)= 1 අර්ථ සමූහය. 2 කාර්‍යය. කාර්‍ය ප්‍රභෙදය වි:වි:ටී:199 සා: දී: 6829 ස:පා: 1329 **-ත** ‡(නා)= අතුරන ලද. කඨිනය අතුළ. ක: වි: 9618 මහා: පා: 2965 (අපරාති බලනු) **-කඨින** (නා) (√කථ + ඉත) (√කථ + ඉන)= අතුරන ලද කඨිනය. කෙළින් සිවුර අතුළ. සඝයාගේ සම්පත්තියකින් යුක්තව අතුරන ලද කඨින විවරය. "මඟණෙනි, කෙසේ නම් කඨිනය අතුරන ලද්දේ වේද? 1 පරිභොග

නො කළ අලුත් වස්ත්‍රයකින් කසිනය අතුරන ලද්දේ වේ. 2 එක් වරක් දෙවරක් සේදූ පරිභොග නොකළාක් වැනි වස්ත්‍රයකින් ද, 3 ඝන වූ වස්ත්‍රයකින් ද, 4 පංසුකූලාදී නෙවිසි පරිද්දෙන් උපන් වස්ත්‍රයකින් ද, (විශුද්ධිමාර්ගයෙහි පංසුකූලිකඛඟය බලනු) නොහොත් පංසුකූලික භික්ෂුවක් විසින් සොඹෝන් ආදි නෙවිසි කෙත ඇවිද ලබන ලද වස්ත්‍රවලින් කළ සිවුරුවලින් ද, 5 යම් කිසිවෙක් ආපණවාරයෙහි පතිත වස්ත්‍රයක් හෙන කසිනය දෙත් නම් එයින් ද. 6 නිමිත්ත කර්මයෙන් නොලැබූ වස්ත්‍රයකින්ද, 7 කසින වස්ත්‍රයක් ලබාගන්නා අවියෙන් ඒ වූ පරිදි සම්පූ කපා නොකොට දුහැමෙන් සෙමෙන් උපන් වස්ත්‍රයකින් ද, 8 තාවකාලික නොවන වස්ත්‍රයකින් ද, 9 කරණ-නිවය සන්නිධි වශයෙන් තොරව ලත් සිවුරෙන් ද, 10 රාත්‍රිය ඉක්මීමට පළමු සියලු පරිකර්ම නිමවා ලීමෙන් ද, 11 කප් බින්දු නැබීමෙන් ද, 12 සඞ්ඝාටියෙන් ද, 13 උත්තරාසඞ්ගයෙන් ද, 14 අන්තරවාසකයෙන් ද, 15 එදිනම කඩ කැපීම් සහිතව මහමැඬිලි කුඩා මැඬිලි සහිතව අතු පසකින් යුක්තව හෝ පසකින් වැඩි කඩ අතු බෙදූ සිවුරකින් ද, 16 පුද්ගලයකුගේ ඇතිරීමෙන් ද, 17 මතාකොට කසිනය අතුරන ලද්දේ නමුදු ඉදින් ඒ කසිනාස්තරණානිශංසය උපචාර සීමාව තුළ සිටියෙක් අනුමෝදන් වේද; මෙසේත් කසිනය අතුරන ලද්දේ වේ. මහණෙනි; මෙසේ සත ළොස් සම්පත්තියෙන් යුක්තව කසිනය තෙම අතුරන ලද්දේ වේ'' ක:ව: 75[25] වි: ලං, 345[14-27] මහා: පා: 289[1] පරි: පා: 230[4] **-පච්චත්ථික** (නා)= අර්ථයෙහි විරුද්ධවූ. කාරණයෙහි සතුරුවූ. ''ඵලං අත්ථපච්චත්ථිකා, ප්‍රතිපක්ෂවූ අර්ථ ඇති දෙන්නම'' පරි: පා: ගැ 47[32] පරි: පා: 294[22] වි: වි: ටී: 240[6] **-පටිසම්භිදා** (නා) (පටි + සං + √භිද + අ + ආ) [සං. ප්‍රතිසංවිත්]= අර්ථ ප්‍රතිසම්භිදාව. සිව් පිළිසිඹියාවන්හෙන් එකක්. අර්ථකථායෙහි ප්‍රභෙදගත ඥානය. ''ඉමහි අර්ථ යෙහි ප්‍රභෙදගත ඥානය අර්ථ පටිසම්භිදා නම්'' වි: මා: ස: 525[30] පරි: පා: ගැ: 35[15] ස: වි; 271[17] මනෝ: පූ: 545[26] **-පටිසරණ** (නා) පටි+√සර + +යු=අන; න=ණ; = අර්ථය පිහිටකොට ඇති. අර්ථය ප්‍රධාන සේ සැලකීම. අර්ථ ප්‍රධාන වාදය. වි: මා: ස: 522[21] **-පද** (නා)= අර්ථපද. 1 **සඞ්කාසන** 2 **පකාසන** 3 **විවරණ** 4 **විභජන** 5 **උත්තානීකම්ම** 6 **පඤ්ඤත්ති** යන අර්ථ පද සය. පඨාපත්තියෙහි අර්ථ විභාග කරන පද ෂට්කය. එහි ''සඞ්ඛ පත්තෝ කාසනං දීපනං= සඞ්කාසනං'' යි සංක්ෂේපයෙන් අර්ථය හැඟවීම **සංකාසන** නම්. ''පඨමං කාසනං= පකාසනං'' යි ප්‍රථම කොට දීපනය **පකාසන** නම්. සංක්ෂේපයෙන් කියන ලද්දහුගේ විස්තාර වචනය ද, එක්වටෙක කීවහුගේ පුනර්වචනය ද, **විවරණ විභජන** යෝ නම් වෙත්. විවෘතය විස්තර කොට කීම **උත්තාන් කරණ** නම්. විභක්තයාගේ ප්‍රකාරයෙන් ඥපනය විනෙය ජනයන්ගෙ චිත්තපරිතෝෂණය **ප්‍රඥප්ති** නම්. වි: මා: ස; 522[33] ද්: වි: ටී: 489-556[33] සා:දී: 276[33] උ:අ:7[4] 2 අර්ථය හා පදය. **-පුරෙක්ඛාර** (නා) [සං පුරස්කාර]= අර්ථය පෙරදැරිකොට. පෙළෙහි ආ පදයන්ගේ අර්ථය පෙරදැරිකොට කීම. දුට්ඨුල්ලවාචා සඞ්ඝාදිශෙෂ ශික්ෂාපදයෙහි සහ ඔමසවාද පාචිත්ති ශික්ෂාපදයෙහි අනාපත්ති වාරයක්. 1 යම් භික්ෂුවක් විඥප්ති පථයෙහි සිට අසන සහ්‍යාසහ්‍ය තෙපුල් දන්නා මිනිස් මාගමකට වසමග පස මග හෝ මෙවුන්දම් අරහයා හෝ දුරුකත වචනයෙහි ආස්වාදයෙන් ''නව වච්චමග්ගෙහා ච පස්සාව මග්ගෙහා ච සුභො සුසණ්ඨානෝ'' යනාදි අනෙකප්‍රකාර අසඞ්ගී තෙපුල් බෙණේ නම් සහ වෙස්සෙස් ඇවැත් වේ. එහෙත් පෙළෙහි අර්ථ කීම පෙරදැරිව කියන්නහුට ඇවැත් නැති. ''මාගම්නට ''අනිමිත්තාසි'' ත්‍යාදි පදයෙහි අර්ථ කියනු පෙරදැරි කොට අනිමිත්තා සිත්‍යාදි පද බණන්නාහට ද, මාගමුන් එක් නැන්ව අටුවා හදුරන්නාහට හෝ අනාපත්තිය'' 2 යම්කිසි භික්ෂුවක් භික්ෂුවකට ජාත්‍යාදීන් ඔටා බෙණේ නම් පවිත්‍රි ඇවැත් වේ. එහෙත් පෙළෙහි අර්ථ කීම පෙරදැරිකොට කියන්නහුට ඇවැත් නැති. ''චණ්ඩාලොසි ත්‍යාදී පාඨයෙහි අර්ථ කියන්නාහට ද,'' (ඇවැත් නැති) ''පාළියා අත්ථං වණ්ණෙන්තා අත්ථ පූරෙක්ඛාරෝ'' ක; වි: පි: 279-601[5] ස: පා: 392[5]-538[33] වි:ම: 98[27]-192[27] වි: වි: 361-896. **-බ්‍යඤ්ජන** (නා) (වි + √අඤ්ජ + යු=අන) [සං. ව්‍යඤ්ජන]= අර්ථය හා ව්‍යඤ්ජනය. ශබ්දය හා අර්ථය. අර්ථ පද ෂට්කය සහ ව්‍යඤ්ජන පද ෂට්කය. **-සම්පන්න** (නා) (සං + √පද +

යු-න)= අර්ථයෙන් හා ව්‍යඤ්ජනයෙන් යුක්තවූ. ශබ්දාර්ථ සම්පූර්ණ. 1 සඞ්කාසන 2 පකාසන 3 විවරණ 4 විභජන 5 උත්තානීකම්ම 6 පඤ්ඤත්ති යන අර්ථපද ෂට්කයෙන් සහ 1 අක්ඛර 2 පද 3 ව්‍යඤ්ජන 4 ආකාර 5 නිරුත්ති 6 නිද්දෙස යන ව්‍යඤ්ජන පද ෂට්කයෙන් ද යුක්තවූ. බුඩවචනයේ එක් ලක්ෂණයක්. ඵ: අ: 7[6] -**හඤ්ජක** (නා) (√හඤ්ජ් + ණ්වු=අක)= අර්ථය නසන. වැඩ නසන. **නිෂ්ප්‍රයෝජන**. මුසාවාදය. ජා: අ: ගැ: 167[25] -**රක්ඛ** (න) (අත්ථර + ක)= ඇතිරිලි. "අත්ථරක අස්සත්ථරක රථත්ථරකාදි ඇතිරි" කැ: වි: පි: 135[74] -**රති** (ස්ත්‍රී) (ආ + √ථර + ති)= අතුරයි. කයින සිවුර අතුරයි. අති:-**ති** වති:-**රති** අනා: -**රියති** සම්:-**ත්‍රරයා** පම්:-**රතු** තුං:-**රිතුං** පූ: ක්‍රි:-**රිත්වා** අකා:-**න**=අතුරන ලද, අතුළ. ඒ:කා: -**රණෙනා**= අතුරමින්. -**වස** (නා)= ඡිත කරුණු. නිත විශෙෂයන්. දියුණුවට ඉවහල් වන කරුණු. අර්ථ කොළාස "තෙන හි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච" පාරා: පා: 19[27] සං: පා: 155[31] වි: වි: වි: 80[1] සා: ඩී: 4.0[9] ඵ:අ: 113[2] පරි: පා: ගැ: 16[89] -**වසික** (නා)='අර්ථ වශයට පැමිණි. පරි: පා: ගැ: 26[2] -**වාද** (නා) (√වද + ණ)= අර්ථවාදය, අටුවා කථා මාර්ගය. -**වාදී** (නා) (වාද + ඊ)= අර්ථවාදි. අර්ථවත් කරුණු කියන. -**විඤ්ඤත්ති** (නා) වි + √ඤ්ඤා + ණ්‍යාප + යු=අන) [සං විඥප්ති] =අර්ථය දැන්වීම. අදහස දැන්වීම. වචනයෙන් ඇස්වීම හෝ කයින් ඇඟවීම. සං: ප: 729[39] -**විපල්ලාස** (නා) (වි + පරි + √අස + ණ) [සං විපර්‍යාස]= අර්ථ විපර්‍යාසය. අර්ථයන්ගේ විරුද්ධත්වය. "අත්ථ විපල්ලාසාභාවතො වා සුට්ඨු අක්ඛාතොති සවාක්ඛාතො" වි: මා: ස: 526[41]-527[10] -**සංහිත** (නා) (සං + √ හි + ත) [සං. සංහිත]= 1 කාරණය ඇසුරු කළ. 2 ජීවිතයට සහ බ්‍රහ්මචර්‍යාවට වැඩ පිණිස පවත්නා. අර්ථවත්. "අත්ථ සංහිතං තථාගතා භාසන්තීති නො අනත්ථ සංහිතං"- "යං ජීවිතන්තරායායවා බ්‍රහ්මචරියන්තරායාය වා සංවත්තති ඉදං අනත්ථසංහිතං. විපරීතං අත්ථ සංහිතං" පාරා: පා: 6[21] සං: පා: 120[26]-949[22] 950[28] මනෝ: පූ: 566[25]-629[15]-838[7] සා: ඩී: 365[25] -**සතංධම්මසතං** (නා) අර්ථපද සියය සහ ධම්මපද සියය. බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට සිකපද පණවන සේක් හිත කරුණු දශයක් නිසාය. "තෙනහි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච" යනු වෙන් එය දක්නේය. ඒ කරුණු දශය නම්: 1 සඞ්ඝ සුට්ඨුතාය 2 සඞ්ඝ ඵාසු තාය 3 දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය 4 පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය 5 දිට්ඨ ධම්මිකානං ආසවානං සංවරාය 6 සම්පරායිකානං ආසවානං පටිඝාතාය 7 අප්පසන්නානං පසාදාය 8 පසන්නානං භීයෝභාවාය 9 සද්ධම්මට්ඨිතියාය 10 විනයානුග්ගහාය ඇතුයි. මේ එක එක පදයක් "සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි" යනු හා යොදා "සඞ්ඝසුට්ඨුතාය සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි" යනාදීන් යොදා ගත යුතුය. මේ දශය "යං සඞ්ඝසුට්ඨුතං සඞ්ඝ ඵාසු"- "යං සඞ්ඝ ඵාසු තං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය"-පෙ-" යං සද්ධම්මට්ඨිතියා තං විනයානුග්ගහාය" යනුවෙන් ඛණ්ඩචක්‍ර වශයෙන් සහ සංඛලික නය අනුව ගෙණ "යං විනයානුග්ගහාය තං සඞ්ඝසුට්ඨු" සි ඛද්ධ චක්‍රනය අනුව ගත් කල ධම්මපද දශයක් සහ අර්ථපද දශයක්දැයි පද විස්සක් ලැබේ. එහි පළමු පළමු පදයෝ ධම්මපදයෝ ද, පසු පසු පදයෝ අර්ථ පදයෝ ද වෙත්. ඉක්බිති මේ එක් එක් පදය එක මූලක නය අනුව ගෙණ සෙසු පද සමඟ යෙදීමෙන් එකවර ධම්මපද අනුවක් සහ අර්ථපද අනුවක් ලැබේ. ඒ මෙසේයි. "යං සඞ්ඝසුට්ඨු තං සංඝඵාසු, යං සංඝ සුට්ඨු තං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, යං සංඝසුට්ඨු තං පෙසලානං භික්ඛූනං ඵාසු විහාරාය"-පෙ-යං සංඝසුට්ඨු තං විනයානුග්ගහාය" යනුවෙන් සංඝ සුට්ඨු පදය මුල් කොට ගැණීමෙන්ද; මෙසේම "යං සංඝ ඵාසු තං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, යං සංඝ ඵාසු තං පෙසලානං භික්ඛූනං ඵාසු විහාරාය යනාදීන් සෙසු පදයන් ද මෙසේ එක එක මූලකව ගැණීමෙන් ධම්මපද අනුවක් සහ අර්ථපද අනුවක් ලැබේ. එය සංඛලික නය අනුව ගත් අර්ථපද දශය සහ ධම්මපද දශය සමඟ යෙදීමෙන් පද සියය බැගින් ලැබෙන් නේය. සමන්ත පාසාදිකාවෙහි ද, සාරත්ථ දීපනී විනය ටීකාවෙහි සහ වජිරබුද්ධි ටීකා වෙහි ද දක්වන ලද්දේ එකමූලික ක්‍රමයෙන් ම අර්ථපද සියය සහ ධම්මපද සියය ගැණීමයි.

වජිරබුද්ධි ටීකාවෙහි මෙසේ දක්නේය. ''දසසු පදෙසු එකෙකං මූලං කත්වා දසකඛත්තුං යොජනාය පදසතං වුත්තං. තත්ථ පඨමස්ස පදස්ස වසෙන අත්ථසතං. පුරිමස්ස වසෙන ධම්මසතං. අත්ථ ජොතකානං නිරුත්තීනං වසෙන නිරුත්ති සතන්ති දෙව නිරුත්ති සතං. ධම්මභූතානං නිරුත්තීනං වසෙන නිරුත්ති සතන්ති දෙව නිරුත්ති සතානි. අත්ථසතෙ ඤාණ සතං. ධම්මසතෙ ඤාණ සතං. ඉසු නිරුත්ති සතෙසු දෙ ඤාණසතානීති චත්තාරි ඤාණසතානි වෙදිතබ්බානි'' මෙහි දක්වන ලද්දේ විමති විනොදනී ටීකාවෙහි දැක්වූ ක්‍රමයයි. මෙහි අත්ථපද නම් අටුවාසි. ධම්මපද නම් පෙළසි. සං: පා: 155[37]–996[18] සං: දී: 42[218] පරි: පා: 194[18] පරි: පා: ගැ: 153[30] ව: ව: ටී: 90[22] **-සම්පත්ති** (නා) (සං + √පද + ති) [සං. සම්පත්ති]= 1 අර්ථසම්පත්තිය. අර්ථයෙන් සම්පූර්ණ වීම 2 වස්තු සම්පත්තිය, ධන රාශිය. **-සාධක** (නා) (√සාධ + ණ්වු=අක)= අර්ථය සිදු කරන. අදිත්තානුදාන පාරාජික ශික්ෂාපදයේ සාහත්ථික පඤ්චකයේ සතරවන අඞ්ගය ක්‍රියා සිද්ධියට පෙරම පාරාජික වීම නම්වූ අර්ථය අවශ්‍යයෙන්ම සිදු කරන බැවින් මෙය අත්ථ සාධක නම් වේ. අර්ථසාධක චෙතනාව මාගී යට අනතුරු ඵලය වැනි වේ. ''අත්ථසාධකො යනු අසවලාගේ බඩු හැකි වෙලාවක නොස් සොරා ගෙණ එවසි. අණ කෙළේ නම් අණ කළහුට එකෙණෙහිම පරිජී වේ. අනුන්ගේ තෙල් සැළ ආදියක පාදයක් අහතා තෙල් බොන වහන් ආදියක් බහාලසි නම් අතින් මුත් කෙණෙහි පරිජී වේ.''– ''එකෙණෙහි ගැණීම පිණිස නියොගය ආණත්තික නම්. කාලාන්තරයෙහි ගැණීම පිණිස නියොගය අත්ථසාධක නම් '' සං: පා: 268[10] ව: ව: ටී: 147[14] සි: ව: ව: 20[12] ප්‍රා: ව: 397 ව: ලං: 397[17] වි: ව: 41

අත්ථාර (නා) (ආ + √ථර + ණ) [සං. ආස්තරණ]= ඇතිරීම. කඨිනය ඇතිරීම. සඟළ සිවුරෙන් හෝ එතුරු සඟළ සිවුරෙන් හෝ අතුරු වසා සිවුරෙන් හෝ කඨිනය ඇතිරීම. සඟළ සිවුරෙන් කඨිනය අතුරනු කැමැත්තේ නම් පුරාණ සංඝාටිය ''ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරණං'' යි පච්චුද්ධරණය කොට නව සංඝාටිය ''ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි'' යි ඉටා ''ඉමාය සඞ්ඝාටියා කඨිනං අත්ථාරාමි'' යි වාග් හෙද කොට ම අතුරන්නේය. උත්තරාසඞ්ග අන්තරවාසක සිවුරින් කඨිනය ඇතිරීම ද මෙසේමය. නම් පමණක් වෙනස් වන්නේය. ''අත්ථාරස්සාති කඨිනත්ථාරස්ස''– ''වච්ඡෙදං කරණෙනෙවහි අත්ථාරො සම්පජ්ජති''– ''කඨිනත්ථරණං නාම වච්ඡෙදං කරණං මෙව හොති න කිඤ්චිකාය විකාර කරණන්ති අත්ථො'' සං: පා: 1016[16] ව: ලං: 355[37]–358[33] පරි: පා: 234[19] කං: ව: 63[9] (කඨිනත්ථාර බලනු) **-ක** (නා)= අතුරන්නා. කඨිනය අතුරන භික්ෂුව. පරි: පා: 234[13] පරි: පා: ගැ: 30[18] ව: ලං: 367[33] **-කිරියා** (නා) (√කර + රිරිය) [සං. ක්‍රියා]= ඇතිරීම් ක්‍රියාව. කඨිනය ඇතිරීම. ව: ලං: 366[4] (කඨිනත්ථාර බලනු) **-කුසල** (නා)= කඨිනය ඇතිරීමෙහි, එම කර්මවාක්‍යයෙහි දක්ෂ. කඨිනත්ථාරය පිළිබඳ කාරියෙහි සමර්ථ ''සචෙ පුරිමිකාය උපනන්ත කඨිනත්ථාර කුසලා න හොන්ති අත්ථාරකුසලා බහිඛාණකපෙරා පරියෙසිත්වා ආනෙතබ්බා. කම්මවාචං සාවෙත්වා කඨිනං අත්ථරාපෙත්වා දුනඤ්ච භුඤ්ජිත්වා ගමිස්සන්ති. සං: පා: 821[12] **-ජාතිකා** (නා)= අත්ථාර ජාතිය. කඨිනත්ථාරයා ගේ ජාතිය අෂ්ටමාතෘකාව සහ දෙවැදෑරුම් පළිබොධය. (අට්ඨමාතිකා බලනු) දෙවැදෑරුම් පළිබොධ නම් චීවර පළිබොධ සහ ආවාස පළිබොධ යන දෙකයි. කඨිනත්ථාරයා ගේ නිදාන-පභව-සමුභාර-සමුට්ඨාන සමුදය යනුද මෙය මැයි. ''මාතිකාව පළිබොධා ව අත්ථාර නිදානා – පෙ – අත්ථාර සමුට්ඨානා'' ඇතු පරිවාර පාළියි. පරි: පා: 232[5] **-නිදාන** (නා) [සං. නිදාන]= කඨිනත්ථාරයා ගේ නිදානයෝ අෂ්ටමාතෘකා යන දෙවැදෑරුම් පළිබොධයෝ. පරි: පා: 232[4] **-පභව** (නා) [සං. ප්‍රභව]= කඨිනත්ථාරයා ගේ ප්‍රභවය, (අත්ථාරජාතික බලනු) **-මාස** (නා)= අත්ථාර මාසය. කඨිනය අතුරන මාසය. වස්සාන සාතුවේ අවසාන මාසය කඨිනය අතුරන මාසයයි. ''කඨිනස්ස අත්ථාර මාසෙ ජානිතබ්බානි වස්සානස්ස පච්ඡිමෙ මාසෙ ජානිතබ්බා'' පරි: පා: 384[1] ව: ව: ටී: 739[22] කං: ව: 62[21] **-මූලක** (නා)= කඨිනය ඇතිරීම මුල් කොට ඇති. කඨිනය ඇතිරීම නිසා. 'අත්ථාර මූලකොති කඨිනත්ථාර මූලකෙ. සම අධිකය දීම කඨිනත්ථාරයට මැයි''— ''අන්තරුභාර

සහබ්භාර දෙක අට්ඨාර මූලක අනුසසින් එකකුත් නො තබා හැම ම අනුසස් නසි සි" ක: වි: පි: 139[9] පරි: පා; ඟැ: 31[31] සා: පා 69[4][8] ක: වි: 183[7] (අට්ඨාර මූලික යනු ද දක්නේ ය.)

-විපත්ති (නා) (වි+√පද+ති)= කසිනට්ඨාර විපත්තිය. කසිනය ඇතිරිය නො හැකි කරුණු. සුවිසි පරිද්දකින් වන කසිනට්ඨාර විපත්තීහු 1 **න උග්ගහනිමිත්ත මනසිකාර** අට්ඨනං හොති කසිනං (=සන්ගත් පමණකින් හෙවත් දිහින් පුළුලින් **පමණ** ගැන්මට ඒ ඒ නැන සලකුණු පිණිස නිය ආදියෙන් ගැටූ රෙඛා මාත්‍රයකින් හෝ නූල් ගැසූ පමණකින් කසිනය තෙම නො අතුරා ලද්දේ වේ) 2 **න ඩොවන මනසිකාර** (=කඩ දෙවි පමණකින් හෙවත් කසින වස්තුය සේදූ පමණකින් ද) 3 **න චීවර චිවාරණ මනසිකාර** (=පස්කඩ, සත් කඩ, නව කඩ, එකොළොස් කඩ චීවරයි බෙදූ නූල් ගැසූ පමණකින් ද) 4 **න ඡේදන මනසිකාර** (කඩ කැපූ ප්‍රමාණකින් ද) 5 **න බන්ධන මනසිකාර** (=හිස් නූල් නැඟීම් = කවු ගැසීම් පමණින් ද) 6 **න ඔවට්ටිකරණ මනසිකාර** (හිස් නූල් නැඟීම අනුව දික් මැහිම් කළ පමණින් ද) 7 **න කණ්ඩුසකරණ මනසිකාර** (= මුද්දිය පත් බැඳි පමණකින් ද, හෙවත් ඔබා පැදිම් පමණින් ද,) 8 **න දළහීකරණ මනසිකාර** (=දෙපට කිරීම් හෙවත් අන්තනිපට සිවුරක් දෙපට සිවුරක් කරනු පිණිස කසින වස්තුය එහි එළවා මැසීම් පමණකින් ද,) 9 **න අනුවාත කරණ මනසිකාර** (=දිග පටු නුවා කිරීම් පමණකින් ද,) 10 **න පරිභණ්ඩ කරණ මනසිකාර** (=ඇතුළත පුළුල් නුවාව නැගූ පමණකින් ද) 11 **න ඔවට්ටෙවය්‍ය කරණ මනසිකාර** (=අන්වා පත් ලීම හෙවත් කඩ කපා මැසීමට නො පොහොනා කසින චීවරයට අනෙක් වස්තු කඩක් හෝ අනෙක් සිවුරක් එසේ මැසීමට නො පොහොනා කල කසින චීවරයෙන් කඩක් හෝ එළවීම් පමණකින් ද) 12 **න කම්බල මද්දන මනසිකාර** (=දළුවන් කළ හෙවත් එක් වරක් රදනෙකි බහා පඩු පලාවන් පැහැ කළ පමණකින් ද) 13 **න නිමිත්තන මනසිකාර** (=සලකුණු කළ පමණකින් ද, හෙවත් මේ වස්තුයෙන් කසිනය අතුරමියි මෙසේ සනිටු හන් කළ පමණකින් ද) 14 **න පරිකථා කථනෙන** (=පරිකථා කොට හෙවත් කසිනය නම් දෙන්නට වටනේය, කසිනය දෙන දායක තෙමේ බොහෝ පින් රැස් කර ගන්නේ යයි මෙසේ පරිකථා කොට ලත් වස්තුයෙන් අතුළ පමණින් ද) 15 **න ඛුද්දකඛු කථනෙන** (=තාවකාලික වස්තුයකින් ද) 16 **න සන්නිධි කථනෙන** (=එදින ම පරිකර්ම නිම නො කොට තබා නැවත නැවත කිරීමයයි කියන ලද කරණ සන්නිධිය; කසින වස්තුය ලැබූ දින හැර පසු දින අට්ඨාරස භික්ෂුවට පමුණුවාලීම යයි කියන ලද නිවය සන්නිධි යන යන දෙප්‍රකාර **සන්නිධියෙන්** ද) 17 **න නිස්සඟිඝියන** (=නිසඟි වුයෙන් ද, හෙවත් කසින යෙහි පරිකර්ම කරමින් සිටියදීම රාත්‍රිය ඉක්ම යාමෙන් ද) 18 **න අඤ්ඤපය කථනෙන** (=කප් බින්දු නො නැබීමෙන් ද) 19 **න අඤ්ඤත්‍ර සඛ්‍යාවියා** 20 **න අඤ්ඤත්‍ර උත්තරා සඛ්‍යාන** 21 **න අඤ්ඤත්‍ර අනන්තරවාස සඛ්‍යාන** (සඛ්‍යාව, උත්තරාසඛ්‍ය, අනන්තරවාසක හැර යම් අනෙක් පිරිකරකින් ද) 22 **න අඤ්ඤත්‍ර පඤ්චඛ්‍යන වා අතිරේක පඤ්චඛ්‍යන වා තදහෙව සඤ්ඤ්‍යාපනෙන සමණ්ඩලි කථනෙන** (=එදින ම කපන ලදුව මහ මඩුලු කුඩා මඩුලු සහිතව කළාවූ කඩ අතු පසකින් හෝ පසකින් වැඩි සතය නවය එකොළොසය යන කඩඅතු ගණනකින් මිස කැපුම් නැතිව කඩ අතු තුණකින් සතරකින් යුත් සිවුරකින් ද) 23 **න අඤ්ඤත්‍ර පුග්ගලස්ස අට්ඨාරා** (පුද්ගල යකුගේ ඇතිරීමෙන් විනා සඞ්ඝයා ගේ හෝ ගණයාගේ ඇතිරීමෙන් ද,) 24 **සම්මාචෙව අට්ඨානං හොති කසිණං තං වෙ නිස්සිමටෙඨා අනුමොදති** (=මෙකියන ලද තෙවිසි විපත්තින් තොරව කසිනය අතුරන ලද නමුත් ඒ කසිනට්ඨාරානිසංසය උපචාර භූමියෙන් පිටත සිටියෙක් අනුමෝදන් වේද, මෙසේ කසිනය නො අතුරන ලද්දේ යයි දක්වන ලද මේ කරුණු සුවිස්ස අට්ඨාර විපත්තීහු නම් වෙත්. පරි: පා: 229[12]—234[16] මහා: පා: 288[16] සා: පා: 823[31] පරි: පා ඟැ: 29[15] ක: ව: 71[20]-92[23] වි:ලි:354[21] (අනපෙත කසින බලනු)

-සමාපත්ති (නා) (සං+√පද+ති)= කසිනය ඇතිරීමෙහි සමපත්. කසිනය අතුළ හැකි කරුණු. සතළොස් පරිද්දකින් ලැබෙන කසිනයා ගේ අට්ඨාර සමාපත්තිය. 1 **අභිනන්ත**

අට්ඨනා හොති කඨිනං (=පරිභොග නොකළ අලුත් වස්ත්‍රයකින් කඨිනය අතුරන ලද්දේ වේ) 2 **අහතකප්පන** (=එක්වරක් දෙවරක් සේදූ පරිභොග නොකළාක් වැනි වස්ත්‍රයකින් ද) 3 **පිලොතිකා ය** (=සත වූ වස්ත්‍රයකින් ද) 4 **පංසුකූලෙන** (පංසුකූලාදි තෙවිසි පරිද්දකින් උපන් වස්ත්‍රයකින් ද නොහොත් පංසුකූලික භික්ෂුවක් විසින් සොහොන් ආදී තෙවිසි කෙන ඇවිද ලබන ලද වස්ත්‍රවලින් කළ සිවුරකින් ද) 5 **පාපණිකෙන**(යම්කිසිවෙක් ආපණදවාරයෙහි සිටින වස්ත්‍රයක් ගෙණ කඨිනය පිණිස දෙයිනම් එයින් ද.) 6 **අනිමිත්ත කතෙන** (=නිමිත්ත කම්යෙන් නොලැබූ වස්ත්‍රයකින් ද) 7 **අපරිකථා කතෙන**(=කඨින වස්ත්‍රයක් ලබා ගන්නා අවියෙන් ඒ වූ පරිදි සම්පකථා නොකොට දැහැමෙන් සෙමෙන් උපන් වස්ත්‍රයකින් ද) 8 **අතුකතු කතෙන** (=නාඩිකාලික නොවන වස්ත්‍රයකින් ද) 9 **අනනිධි කතෙන**(=කඨින-නිවය සනනිධි වශයෙන් නොරව ලත් සිවුරෙන් ද) 10 **අනිසඝගියෙන** (=රාත්‍රිය ඉක්මී මට පලමු සිසලු පරිකම් නිමවා ලීමෙන් ද) 11 **කපපකතෙන** (=කප් බින්දු තැබීමෙන් ද) 12**සඛසාවියා** 13**උතතරා සඛඛන** 14**අනතරවාසකතෙන** (=12 සඛසාවියෙන් 13 උතතරා සඛඛයෙන් සහ 14 අනතරවාසකයෙන් ද) 15 **පසුවතෙන වා අතිරෙක පසුවතෙන වා තදහෙව සඤජිනෙනන සමණඩලිකතෙන** (=එදින ම කඩකැපීම් සහිතව මහ මැඩිලි කුඩා මැඩිලි සහිතව අතුපසකින් යුක්තව හෝ පසකින් වැඩි කඩඅතු බෙදූ සිවුරකින් ද.) 16 **පුනගලසස අට්ඨාරා** (=පුද්ගලයකුගේ ඇතිරීමකින් ද) 17**සමමාවෙව අතථතං හොති කඨිනං, තං චෙ සීමටඨා අනුමොදති එවමපි අට්ඨතං හොති කඨිනං.** (=මනා කොට කඨිනය අතුරන ලද්දේ නමුදු ඉදින් ඒ කඨිනානිසංසය උපචාර සීමාව තුල සිටියෙක් අනුමෝදන් වේද මෙසේත් කඨිනය අතුරන ලද්දේ වේ) යනුවෙන් කඨිනය ඇතිරිය හැකි මේ සතලොස් ආකාරය අට්ඨාර සමපත්තීහු නම් වෙත්. පරි: පා. 230⁴-234⁴ මහා: පා: 289¹ කං: ව: 73¹⁴-92²⁴ (අට්ඨත කඨින බලනු) -**සම්භාර** (නා)= අට්ඨාර ජාතික බලනු, -**සමුඛාන** (නා=අට්ඨාර ජාතික බලනු. -**සමුදය** (නා)= අට්ඨාර ජාතික බලනු.

අට්ඨි (ක්‍රි; නා) [සං. අස්ති]= ඇති. අට්ඨි යනු ආඛ්‍යාත පදයක් මෙන් ම නාමපදයක් මෙන් ද යෙදේ. රූ: සි: ස: 460¹³ -**ක** (නා) (අට්ඨි +ක) [සං. අර්ථි]= කැමැති. "**අට්ඨිකෙහි උපසඞකමිතං මහඝං**, අර්ථීන් විසින් (නිවන් සොයනුවන් විසින් මාගීය දන්නා ලද්දේය" මහා: පා: ස: 134²³ මහා: පා: 37² වි: මා: ස: 70.⁴ ස: පා. 826 ²¹ -**ංවාද** (නා) දුන් දෙයෙහි ඵලය ඇත යන මේ වාදය. ප: සූ. 157³ (3) -**දිනන** (නා) (√දා + න=ඉහන) දුන් දෙයෙහි විපාක ඇත දශවැදෑරුම් සම්‍යක් දෘෂ්ටියෙහි එක් අඞගයක්. කම්මසසකතා ඤාණය. ස: වි 292⁶ ස: පා: 174¹⁰ වි: වි: ටී: 112²² ධ. අ: ගැ: 114²² -**සිටඨ**(නා)(√ඨජ + ත; (ත=ඨ; ජ=ඨ=ට; ය=සි) [සං. ඉෂ්ට]= යාගයෙහි විපාක ඇත. සවී සාධාරණ මහාදානයම මෙහි යාග නම්. දශ වැදෑරුම් සම්‍යක් දෘෂ්ටියේ එක් අඞගයක්. කම්මසසකතා ඤාණය, සා: දී: 444⁷-¹⁹ වි:වි: ටී: 112²⁴. ධ: අ: ගැ: 114²³ ස: පා: 174¹⁰ -**භුත** (නා) (√භු + ත) [සං. භූත]= පිටත් කොට යවන සත්කාරය. වි: වි: ටී: 112²⁴ සා: දී:: 444²⁹

අථ (නි)= [සං. අථ]= අනනතර, ප්‍රාරමභ, ප්‍රශන, පදපූරණ යන අර්ථ ප්‍රකාශ කරණ නිපාත පදයක්. අ: ප: ස: 159¹⁹ රූ: සි: ස: 455¹⁷ (අථෝ යනු ද මේසේ මැසි.) -**ඛෝ** (නි) අනනතර, ප්‍රශන. අධිකාර, පදපූරණ යන අර්ථයන් පවසන නිපාත පදයක්. ස: පා: 196¹⁷ වි: වි: ටී: 108⁷-354²²-²⁴ -**බබණ** (නා) [සං අථර්වණ]-එනම්වෙදය. චතුර්වෙදයෙන්එකක්. නො උගතයනුගයි පණවා වදුල තිරශ්චීන විද්‍යා සඞඛ්‍යාවට ඇතුළත් එක් මන්ත්‍ර විශෙෂයක් "අථබබණ නම් එකහනී? අශවාදීන් මරා යාග කරණ සැටි කියන වේදයෙකි" "**ආථබබණ** මනෙතා නාම **ආථබබණක** වෙද විහිතො පරූපඝාත භරෝ මනෙතා" කං: වි: පි: 141³ වි: වි: ටී: 352¹⁷ ස: පා: 700¹⁹ සා: දී 901⁷ සු: නි: අ: 45²²¹ ජා: අ: ගැ: 835 ක වි: 1882⁷. ස: පා. 314³⁶

අථුල්ල වජ්ජ(නා) (න + ථුල්ලවජ්ජ)(√වද + ණ්‍ය; ද + ණ්‍ය=ජ්ජ) [සං. වද්‍ය]= ලහුකා පත්ති, ලඝු ඇවැත්, ලඝු වූ වරදෙහි පැණ වූ ඇවැත්. ථුල්ලවය, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කට දුබ්භාසිත යන පඤ්චාපත්තීහු. "අථුල්ල වජ්ජාති ලහුකා ආපත්තී'' ස: පා: 973[28] පරි: පා: 162[1]

අදඩ්ඪ (නා) (න + දඩ්ඪ) (√දහ + ත; ත=ඪ; හ=ඩ) [සං. දග්ධ]= **දැහැ** ලද. පිළිසුණු. දැ. දි: මා: ස: 154[34].

අදත්ත (නා) (න + දත්ත)= **නොදෙන** ලද. නුදුන්, වසතු හිමියා විසින් නොදෙන ලද. (අදින්න බලනු) ='**ආදාන** (නා) (ආ + √දා+යු =ආන)= නුදුන් දේ ගැන්ම. සොරකම් කිරීම. 2 එනම් ශික්ෂාපදය. 3 එනම් පාරාජිකා පත්තිය කු:සි: ස: 5[9] භි: ශී: 2[22] (අදින්නාදාන බලනු)

අදදමපටිය (නා) (න + දදං + අපටිය)= නොදෙන්නේ ප්‍රිය නොවේ. පාරා: පා: 174[11] ස: පා: 406[17]

අදස (නා) (න+දස) [සං. දශා]= දහ නැති. දහවලූ නොවටනා සිවුරු. සඞ්ඝාටිය, උත්තරාසඞ්ගය, අන්තරවාසකය, වස්සික සාටකය, කණ්ඩු පටිච්ඡාදනය යන සිවුරු පස. කු: සි: ස: 2[11] පා: මූ: වි: වි: 379[25]

අදසක නිසීදන කප්ප (නා)= දහවලූ නැති නිසීදනය කැපය යන මතය. වෛශාලියෙහි වජ්ජීපුත්‍රක භික්ෂූන් ඉපදවූ දශවස්තුවෙන් එකක්. දුවලූ නම් විසන ලද වස්තුයෙහි එල්බෙන හූ කොන් වේ. "දසාය පන විදත්ථි දුවඝපමාණං කතං අදසකම්පි නිසීදනං වට්ටති'' වි: වි: ටි: 483[5] චූ, පා: B 566[10] චූ: පා: 437[17] (අවශ්‍යන්න දසා බලනු)

අදස්සන (නා) (න + දස්සන) (√දිස + සු=අන; √දිස=දස්ස) [සං. අදර්‍ශන]= 1 **නොදැක්ම**. අදර්‍ශනය. 2 විනයධර භික්ෂුවකගේ අදර්‍ශනය. ඇවැතට පැමිණෙන කරුණු පසින් එකක්. කැප-අකැප දෙයෙහි කුකුසක් උපන් කල ඉදින් විනයධර භික්ෂුවක් දක්නේ නම් කැප-අකැප විමසා දැන කැප දැ කරන්නේය. අකැප දැ නොකරන්නේය. එබඳු භික්ෂුවක් නොදක්නේ කැපය, අකැපය සි ද; අකැපය, කැපයය සි ද සිතා කරමින් ඇවැතට පැමිණෙන්නේය. මෙසේ විනයධර භික්ෂුවකගේ නොදැක්ම ද ඇවැතට පැමිණීමේ එක් කරුණක් වන්නේය. පරි: පා: 257[19] ස: පා: 1021[38] වි: වි: ටි: 505[19].

අදස්සිත වත්තු (නා) [සං. වස්තු]= නොදැක්වුණු වස්තුව. වස්තුව නොදක්වන ලද ශික්ෂාපද. සඞ්ඝභෙදානුවත්තනක ශික්ෂාපද. (අනුදෙස (පඤ්ඤත්ති බලනු)

අදස්සිතාපත්ති (නා)= ඇවැත නොදැක්වූ ශික්ෂාපද. ප්‍රතික්ෂේප ශික්ෂාපද සහ සමහර විනීත වස්තු ශික්ෂාපද. ප්‍රතික්ෂේප ශික්ෂාපද නම්; "ලොහිතුපපාදකො භික්ඛවෙ අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො'' ඝනාදිය යි. විනීත වස්තු ශික්ෂාපද නම්:"අනුජානාමි භික්ඛවෙ දිවා පතිසල්ලියන්තෙන දවාරං සංවරිතුං පතිසල්ලියිතුං'' යනාදි ශික්ෂාපදයි.

අදස්සිතාපත්ති වත්තුක (නා)= ආපත්තිය සහ වස්තුව නොදැක්වූ ශික්ෂාපද.

අදාපෙත්වා (පූ: ක්‍රි:) (න + √දා + ණාප + ත්වා)= නොදෙවා. ප්‍රා: පු: ස: 70[38]

අදූස (නා) (න + දූස)= දූසයෙක් නොවූ. සත්‍රී: ලි: අදූසී- ස: පා: 748[5]_[6].

අදිට්ඨං දිට්ඨං මෙ (නා)= නොදුටු දෙයක් මවිසින් දක්නා ලද්දෙමි සි කීම. අට වැදෑරුම් අනාසී ව්‍යවහාරයේ එක් අඞ්ගයක්. මෙසේ කියන්නහුගේ වචනය හෝ ඒ නිසා හටගන්නා වූ චෙතනාව හෝ එක් අනාසී ව්‍යවහාරයකි. සම්පජාන මුසාවාදයේ එක් ලක්ෂණයක්. පාචි; පා: 2[28] ස: පා: 536[10]

අදිට්ඨ (නා) + දිට්ඨ) (√දිස + ත: ත=ට්ඨ) [සං. අදෘෂ්ට] =නොදක්නා ලද. චක්ෂුර්ව්‍යවහාරයෙන් අරමුණු නොගත්. පාචි: පා: 2[36] ස: පා: 536[18] -**ජොතනා පුච්ඡා** (නා) [සං. පෘච්ඡා]= ප්‍රකෘතියෙන් ලක්ෂණය අප්‍රකට වූ කරුණු දැන ගැණීම් පිණිස කරන විමසීම්. පස් වැදෑරුම් පෘච්ඡාවන්ගෙන් එකක්. සු: වි: 514[4] -**පුබ්බ සහායක** (නා)= නොදුටු විරූ යහළුවා. නොදුක මිත්‍ර වුවහු. ධ: අ: ගැ: 67[38]

අදිට්ඨ දිට්ඨ සඤ්ඤී (නා) (සඤ්ඤී + ඊ)= නොදුටු දෙයෙහි දක්නා ලද්දෙමි යන සංඥාව ඇති. චතුර්‍ථ පාරාජික ශික්ෂා පදයෙහිදී නුවණැසින් හෙවත් ප්‍රත්‍යවෙක්ෂාඥාන නමැති

ඇසින් නොදුටු අහීඤ්ඤය දුටුවෙමි (=රහත්වීමි) යන හැඟීම ඇති. අධිමානයෙන් එබඳු හැඟීම ඇතිව රහත් වීමිසි ප්‍රකාශ කිරීම ආපත්තියට අඞ්ගයක් නො වේ. පාරා; පා: 91[31] සා: පා: 347 [25] වි: වි: ටි. 203[28]

අදිනන 1 (නා) (න + දිනන) (√දා + න; **න**= ඉත්ත)= නොදුන්. මෙරමා විසින් කසින් හෝ වචනයෙන් නො දුන්. නිමිත්තක් නො දුන් වස්තුව. අනුන් අයත්. පාරා: පා: 45[33] සා: පා: 216[32] ප්‍රා: පු; සා: 9[11]

අදිනන 2 (නා)= නො පිළිනන්වන ලද. කසින් හෝ කය පිළිබඳ වූවකින් නො දුන් දෙය. පාචි: පා:9.[12] සා: පා: 216[32]-621[17] –**'ආදාන 1** (නා) (ආ + √දා + යු=අන)= නොදුන් දේ ගැන්ම. අනුන් අයත් දේ ගැන්ම. සොරකම. සු: වි: 53[28] කං: වි: 28[37] –**'ආදාන 2** (නා)= 1 එනම් ශික්ෂාපදය නුදුන් දෙය ගැන්මෙන් වැළකීමේ ශික්ෂාපදය. 2 එනම් පාරාජික ශික්ෂාපදය. යම් මහඉණක් අතිකකු අයත් පාදයක් අගනා වස්තුවක් සොරසිතින් ගනී නම් පරිජි වේය සි පැණවූ අදිනනාදාන පාරාජිකා පත්ති ශික්ෂාපදය. සි: ච: වි: 1[7] සා: පා: 218[17] ප්‍රා: පු: සා: 9[15] –**පාරාජික** (නා) (සං (පරාජ් + ණික)= එනම් පරිජි ඇවැත, සා: පා: 285[12]-218[12] (අදිනනාදාන 2 බලනු) –**සමුට්ඨාන** (නා) (සං + උ + √ඨා + යු=අන)[සං.සමුත්ථාන] =එනම් සමුට්ඨාන ආපත්තිය. යම් ඇවැතක් කායචිත්ත, වාචාචිත්ත, කායවාචා චිත්ත යන සමුට්ඨාන තුණෙන් නගීද ඒ අදිනනාදාන සමුට්ඨානා පත්ති නම් වේ. තෙළෙස් සමුට්ඨානයන්ගෙන් එකක්. "යා සචිත්තකෙහි තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති අයං අදිනනාදාන සමුට්ඨානා නාම." කං: ඒ: 2[15] වි: ම: 61[1]. (අඛාන සමුට්ඨාන බලනු.)

අදිස සන (නා) (න + දිසා + සන) (√ආස + යු= අන) අදිසාසනය. නො දික් අසුන. මෙහි දික් අසුන නම්; ඇඳ පුටු හැර යම් අසුනක් තිදෙනෙකුන්හට සැපසේ හිඳිනු හැකි නම් එය දික් අසුනයි. මෙය අනන දිසාසන පවත්මි දිසාසන යනුවෙන් ද හඳුන්ව යි. එසේ තිදෙනෙකුන්හට සැපසේ හිඳිනු නො හැක්කෝ අදිසාසන නම් වේ. එබඳු අදිසාසන ඇඳ පුටුවල සමානාසනික දෙදෙනෙකුන්ම හිඳිනට වටනේය. "අනුජානාමි භික්ඛවෙ දුවග්ගසස මඤ්චං දුවග්ගසස පීඨං" යනු චුල්ල වග්ග පාළියි. චූ: පා: B 86[35] චූ: පා:258[31] වි: වි: ටී: 468[31] සි: ච: වි: 64[8] කු: සි: සා: 69[31] වි: වි: 2840.

අදුකඛ මසුඛං (නා)= දුක් හෝ සැප හෝ නැති. දුක් සැප දෙකට ප්‍රතිපක්ෂ වූ තෘතීය වෙදනාව. උපෙක්ඛාව. චතුර්ධ්‍යානයේ එක් ලක්ෂණයක් වි: මා: සා: 404[18] මහා: පා: 324 පාරා: පා:4[14]

අදුට්ඨුල්ල (නා) (න + දුට්ඨුල්ල) (දුට්ඨු + ල්ල) [දුට්ඨුල්ල > දුඵල්ල > තුඵල්] තුඵල් නොවූ. පාරාජික, සඞ්ඝාදිසෙසාපත්ති දෙකහැර ඉතිරිවූ ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කට, දුබ්භාසිත, යන ආපත්තිසකඹ පඤ්චකය. "දෙවආපත්ති කඞ්ඛා දුට්ඨුල්ලා. අවසෙසා අදුට්ඨුල්ලා ච" සා:පා: 641[39]-972[30] පරි:පා:161[19](අදුට්ඨුල්ලා පත්ති බලනු) -අජ්ඣාචාර(නා)(අධි + ආචාර (ආ+√චර + ණ) [සං. අධ්‍යාචාර]= අදුට්ඨුල්ල ශික්ෂාපදයන් ව්‍යතික්‍රමණය කිරීම ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කට, දුබ්භාසිත යන ශික්ෂාපදයන් මැඬලීම. අනුපසම්පන්නයාහට ශුක්‍ර මොචනය හා කාය සංසර්ගය සමන ප්‍රාණාති පාතාදි ශික්ෂාපද පඤ්චකය ව්‍යතික්‍රමණය දුට්ඨුල්ල අජ්ඣාචාර නම් වේ. විකාල භොජනාදිය අදුට්ඨුල්ල අජ්ඣාචාර නම් වේ. ඒ හෙරණහට මුල පටන් පඤ්ච ශික්ෂාපද දුට්ඨුල්ල ද සෙසු ශික්ෂාපද අදුට්ඨුල්ල ද වේ. "හෙරණ පැවිද්දන් ශුක්‍ර විසර්ගාදි කළහොත් අඞ්ඝාවාර පර්‍යාපන්න ඛැවින් චාලුක සලිලාදි දඩුවම් කටයුතු" –"අජ්ඣාචාරෝ නාමාති ච අථඛණ්ඩං ව්‍රතන්නා අකත්තබ්බරූපත්තාව අනුපසම්පන්නසස සුක්කවිසට්ඨි ආදීනි දණ්ඩකම්ම වත්ථු පකඛං භජන්තී" කං: ඒ: 126[35] කං: වි: පි: 63[24] සා: පා: 64[31] සා: ඒ: 795[9] –'අ ඝාතී (නා)= තුඵල් නොවූ ඇවැත්. දුක්කට, දුබ්භාසිත, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනීය යන ඇවැත් සමූහය: පාරාජික, සඞ්ඝාදිසෙස ඇවැත් දුට්ඨුල්ල නම් දුක්කටාදි සෙසු ඇවැත් අදුට්ඨුල්ල නම්. 'දුට්ඨුල්ල' යන වචනය "දුට්ඨු + ථුල=දුට්ඨුල්ල' යනුවෙන් සිඞ්ව ඇති අටුවාචාරීන් වහන්සේගේ මතය බැව් දුට්ඨුල්ල ශබ්දය පිළිබඳ විසාරයෙන් පෙනේ. ඒ අනුව කෙලෙසයන්ගෙන් 'දුෂ්ට වූද; සථූල (විශාල) වූද, ආපත්තිහු දුට්ඨුල්ල නම් වෙත්. එසේ නො වූ

ආපත්තීහු අදුට්ඨුල්ල නම් වෙත්. "දුට්ඨුල්ලනති දුට්ඨුව කිලෙසෙහි දුට්ඨත්තා ථූලත්තුව අනිපුණ භාවතොති දුට්ඨුල්ලං" සං: පා: 1633[10]-1931[4] -943[14] **-සඤ්ඤී** (න)= තුළුල් ඇවැතක් නොවේය යන සංඥා ඇති. එබඳු කල්පනාව ඇති. ක: වි: 87[11].

අදුතිය (නා) (න+දුතිය) [සං. අද්විතීය]= දෙකක් හෝ දෙවැන්නෙක් හෝ නැති. පළමුවන: වි: වි: ටී: 136[7]

අදුභය (නා) (න+දුභය) [සං. දම්භක]= මිත්‍ර ද්‍රෝහී නොවූ. හිංසා නොකරන. ඔවුනොවුන්ට සතුරු නොවන. පොරොන්දු කඩ නොකරන මහා: ප: 402[19] සු: නි: අ: 2355 ජා: අ: ගැ: 1959.

අදූභල (නා)= යන්ත්‍ර පාෂාණය. මුව ආදී සතුන් අල්ලා ගන්නු පිණිස යොදන උගුලක්. එල. මෙයට යට වූ සතුන්ට යං නොහැකි යයි යෙති. ගල් භබක? ස. පා: 2786 වි වි: ටී: 170[18]- වි: වි: 302-වි: වි: ස: 92[19] **-පාෂාණ** (නා) [සං. පාෂාණ]= යන්ත්‍ර පාෂාණයෙහි නැහූ ගල. ස: පා: 339[21] සා: දී: 620[23] වි: වි. වි: 2009

අදෙස (නා) (න+දෙස)= [1] නුසුදුසු දෙශය. 2 නොමනා තැන. ඌනපඤ්චබන්ධන ශික්ෂා පද පදභාජනියෙහි සඳහන් පාත්‍රය නොතැබිය යුතු ඇඳ, පුටු ජාති, නාගදන්තාදි තැන්. පාරා: පා: 2764 ස: පා: 5143[10] ක: වි: 75[10] ක: වි: පි: 55[15] කු: සි: ස: 2530.

අදෙසනා ගාමිනි (නා)= දෙශනා ගාමිනී නොවන ඇවැත්. දෙසීමෙන් පිරිසුදු නොවිය හැකි ඇවැත් පාරාජිකාපත්තිය සහ සඞ්ඝාදිසෙස පත්ති. 1 ඡේදගාමිනි 2 **උඩ්ඩාන ගාමිනි** 3 **දෙසනා ගාමිනී** යයි ආපත්තිහු තෙවැදෑරුම් වෙත්. එහි 1 **ඡේදගාමිනී** නම්; ශ්‍රමණ ලිඞ්ගය සිඳීමෙන් නැගිසිටින ඇවැතයි. එනම් පරිජී ඇවැත් සතරයි. එවැන්නකුට නැවත උපසම්පදාවක් නොපිහිටන නමුත් නැවත පැවිදිව සාමණේර ශීලයෙහි පිහිටින්නට පුළුවන. 2 **උඩ්ඩානගාමිනී** නම්; සුදුසු පිළිවෙත් පිරීමෙන් නැඟී සිටින ඇවැතයි **එනම්** සඞ්ඝාදිශේෂාපත්තීහු ය. සඞ්ඝාදිශේෂාපත්තියකට පැමිණි භික්ෂුව වත් මානත් පුරා අබ්භාන කර්මය ලැබීමෙන් පිරිසුදු විය යුතු ය. උපසපන් භික්ෂුවක් ඉදිරියෙහි දෙසීමෙන් නැඟිසිටින ඇවැත **දෙසනාගාමිනි** නම්වෙයි. එනම් ථූලල්ලච්චයාදිආපත්ති සමූහයයි, දෙසනා ගාමිනි ඇවැත් හැර ඡේද්‍යනාමිනී, උඩ්ඩානගාමිනී ඇවැත් කොටස් දෙක අදෙසනා ගාමිනී ආපත්තිහු නම් වෙති. "අදෙසනා ගාමිනියාති පාරාජිකාපත්තියා වා සඞ්ඝාදිසෙසාපත්තියා වා" වූ: පා: 143 සා: පා: 8575 කු: සි: සා: 140[19] වූ: පා: B. 119 (ලා: ශ්‍රා:) බු: සි: වි: 162[17] වි: වි: ටී: 447[16]

අදෙසිත වත්ථු (නා) [සං. වාස්තු]= කුටි වාසනුව හෝ විහාර වාසනුව නොදෙසූ කර්මවාක්‍යයෙන් සම්මත නොකළ කුටි භූමිය හෝ විහාර භූමිය. මෙහි වත්ථු නම් භූමියයි. යම් ස්ථානයක කුටියක් කළමනාකල්හි කුටිභූමිය දෙසීම සඳහා භික්ෂූන් කැඳවිය යුතුය. පළමුව කුටි වාසනුව සීමා මණ්ඩලයක් මෙන් සම කොට සඞ්ඝයා හමුවට ගොස් උත්තරාසඞ්ගය එකස් කොට පෙරව වැඳිමහළු පිළිවෙළ නොඉක්ම සඟුන් වැඳ උක්කුටිකයෙන් හිඳ "අහං භන්තෙ සඤ්ඤුචිකාය කුටිං කත්තුකාමෝ අස්සාමිකං අත්තුද්දෙසං සොහං භන්තෙ සඞ්ඝං කුටිවත්ථුං ඔලොකනං යාචාමි" යනුවෙන් තෙවරක් යාචඤ්ඤ කළ යුතුය. එකල්හි රැස්වූ සියලුම සඞ්ඝයා හෝ අනුදත් දෙතුන්නමක් හෝ එහි වැඩමවා කුටිවාසනුව බැලිය යුතුය. එය අනාරම්භ (උපද්‍රව රහිත) සපරික්කමණ (උපචාර රහිත) කුටි වාසනුවක් නම් දෙසිය යුතුය. නොඑසේ නම් නොදෙසිය යුතුය. එය දෙසනුයේ මෙසේය. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝෝ අයං ඉත්ථන්නාමෝ භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමෝ අස්සාමිකං අත්තුද්දෙසං, සෝ සඞ්ඝං කුටිවත්ථු දෙසනං යාචති යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝෝ ඉත්ථන්නාමස්ස භික්ඛුනෝ කුටිවත්ථුං දෙසෙය්‍ය එසා ඤත්ති සුණාතු -පෙ- දෙසෙති යස්සා යස්මතෝ ඛමති ඉත්ථ-පෙ- දෙසනා සෝ තුණ්හස්ස යස්ස නක්ඛමති සෝ භාසෙය්‍ය දෙසිතං සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනෝ. කුටිවත්ථුං, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි" යනුවෙනි. මෙසේ නොදෙසූ කුටිවාසනුව **අදෙසිත වත්ථු** නම්. පාරා:

පා: 1.57 සං: වි: පි: 3119 සී: පා: 41131 වි: ම: 10533 පී: ඉ: 381

අදෙස (නා) (න+දෙස) (√දිස+ණ)= දෙස් නැති. වරද නැති. නිවරද.

අදඳ (නා [සං. ආර්ද්‍ර > පා: අද්ද > සිං.. අද]= තෙත්. **-ඝ** (නා)[සං. ආර්ද්‍රක]= හිඟුරු. අමු ඉඟුරු. අ: ප: ස: 632. **-සිඹියවෙර** (නා) [සං. ආර්ද්‍රක ඝෘඹවෙර]= අද්දිඟුරු. අමු ඉඟුරු ජා. අ: ගැ: 7026 **-හපථ** (නා)= ආර්ද්‍ර වූ හස්තය. තෙත් වූ අත ස: පා: 88832 වි: වි: ටී: 4563

අඳුරිඹඹ (නා = කළු පැහැ ඇති මල් විශෙෂ යක්. පෙණෙල මල්. නො දැරිය යුතු කළු පැහැ ඇති වහන්වල වණීය. ස: පා: 80610 වි: ඉ: ටී: 528221 ජා: අ ගැ: 2177.

අඩ (නා) [සං. අර්ධ-අධව > පා: අද්ධ]= 1 අර්ධය, භාගය, කොටස, කැබැල්ල. කාලය. 2 මාගීය. වි: මා: ස: 56516 අ: ප: ස: 2730 **-කාය** (නා) [සං. කාය]= අර්ධකාය. ශරීරයෙන් අඩක්. **-කාසික** (නා) (කාය+ණික)= ශරිරයෙන් අඩක් පමණ වූ. කටියෙහි පවත් හිස දක්වා නො දැරිය යුතු කොට්ටවල ප්‍රමාණය. වූ: පා. 2674 ස: පා: 89917 **-ශත** (නා)= කල් ඉක් මුණු. මහළු. රාජ පරම්පරා දෙකක් ඉක්මුණු කාලය. 2 මඟට පිළිපන්, මනව් පැමිණි. ප්‍රා: ප: 119 සී: පා: 8038-33 ප: සූ: 4232-2106 **-චන්ද** (නා)= අර්ධ චන්ද්‍රයා, අර්ධඳ. 1 නිමිති සතරකින් බඳින සීමාවක සටහණක්. "චතූහි චතුරස්සාවා සිඛාටක අඩ්ධචන්ද මුදිඞ්ගාදි සණ්ඨානා වා" 2 එක් පුෂ්ප විකෘතියක්. ස: පා: 77616 (අට්ඨ පුප්ඵ විකති බලනු) **-චන්දන 1** (නා) (චන්ද+න)= අඹ සඳ වැනි. අඹ සඳ වන් මල් දමින් වට කිරීම. අටවැදෑරුම් පුෂ්ප විකෘතීන්ගෙන් එකක්. බුදුන් උදෙනු පිණිස වත් භික්ෂූන් හා භික්ෂූණීන් විසින් නො කළ යුතු එක් මල්දම් ගෙතීමක්. ස: පා: 44736 වී: වි: 471 **-චන්දන 2** (නා)= අඹසඳ, එබඳු සටහණ. ඡත්‍ර පණීයන්හි ද, අඳුන්නල ආදියෙහි ද නො වටනා විකාර සටහන් විශෙෂයක්. ස: පා: 20821-20922 කු: සි: ස: 6418 **-චන්දපාෂාණ** (නා) [සං. අර්ධචන්ද්‍රපාෂාණ]= සඳකඩ පහණ. හිණිමුල. අර්ධයක් ඇතුළුකොට පිහිට වූ වලයාකාර පාෂාණය. ස: පා: 80519 වී: වි: ටී: 42718 **-දණ්ඩ** (නා)= අර්ධ දණ්ඩය. දෙරිඟන් පමණ දිග් වූ මුගුර. දෙරියන් පොලු කැල්ල. පාරා: පා: 467 වි: වි: ටී: 14886 ප: සූ: 459 (2) **-නී** (නා) [සං, අර්ධ නී]= දිගු කලක් පැවැත්මට සුදුසු. අර්ධාන ඝෙම. ස: පා: 41 වි: වි: ටී: 1025 සා: දී: 2919 **-පාලක** (නා)(√පාල+ණ්වු=අක)= අර්ධපාලක. ශරීරයෙන් අර්ධයක් පමණක් ආරක්ෂා කරන එක්තරා නිඝණ්ඨ කොටසක්: ශරීරයෙන් උඩුකය පමණ විසන ඝටිකය නග්නව ඇවිදිනා ශෙවතාම්බර නිඝණ්ඨයෝ. "ශරීර යෙන් අර්ධයක් රක්ෂාකරණ හෙයින් අර්ධපාලක යෝ නම්හු" කා: වි: පි: 12414 කා: වි: 1506 වි: ම: 26316 **-බාහු** (නා)= අර්ධ බාහුව. එක් ඊයක් සතරඟුල් ප්‍රමාණය. වැලමීම පටන් අංසකූටය දක්වා ඇති ප්‍රදෙශය. වේවැල් ආදී යම් කිසි වැලක් ගරු බඩු බවට පැමිණෙන ප්‍රමාණය. "උරෙහි සිට වැලමීට දක්වා මේ දෙඅතුර පමණවූ නොහොත් එක් වියත් සතරඟුල් පමණ වූ වේවැල් ආදී යම්කිසි වැලක් සඞ්ඝයාට දෙන ලද්දී ගරු භාණ්ඩ වේ." - "අර්ධ බාහු නම් උරෙහි සිට වැලමීට දක්වා මේ දෙඅතුරෙහි යි" කා: වි: පි: 1108 කු: සි: ස: 10811-26 කා: වි: 1394 වි: ලං:39114 ග: භ: වි: 3023 – 319 වී: නී: 1338 **-මණ්ඩල** (නා)= අඩ මැඩිලි, කුඩා මැඩිලි මහා: පා: 32435 ස: පා: 83534 අ: ප: ස: 4119 (අඩ්ඪ මණ්ඩලු බලනු) **-මාස 1** (නා)= අර්ධමාසය. අඩ මස. කුල දරුවකු පැවිදි කළ භික්ෂුව ඒ හෙරණ හට පාත්‍ර සිවුරු ගැණීම් ආදිය භික්ම වමින් ගත්පිරිසෙසින්වෙන සිටියයුතුකාලය. ප. සූ: 1936 (අඩ්ඪමාස බලනු) **-මාස 2** (නා) =දෙව්ලොව සමාර. වී ඇට දෙකහමාරක බර. ජා: අ: ගැ: 5514 **-මාසික** (නා) (මාස + ණික)= අඩමසක් අනර. සූ: ච්: 2328 **-යොජන** (නා) [සං. යොජන]= අඩ යොදුන. යොදුන් භාගය, දෙගව්ව. 1 ගණ භොජන ශික්ෂාපදයෙහි අනාපත්තිකර සපනවිධ සමයයන්ගෙන් අර්ධාන ගමන සමයෙහි දුරප්‍රමාණය. අඩ යොදුනක් යන්නහු විසින් ද, ගියහු විසින් ද, ගණ භොජනය අනුභව කටහැකිය. 2 සඞ්ඝභෙද සඞ්ඝාදිශෙෂ ශික්ෂාපදයෙහි සඞ්ඝයා බිඳුවීමට උත්සාහ කරණ භික්ෂුවගේ ඒ අදහස දුරලනු

පිණිස කරුණු කීමට ගිලන් භික්ෂුව නමුදු යා යුතු දුරප්‍රමාණය. 'අගිලානානං දූරෙපි භාරොයෙව සි" කී බැවින් ලෙඩුන් සඳහා අඩ යොදන ගත්හු. නො ලෙඩ වුව දුරට යායුතු යයි සේයි' ක: වි: පි: 37[17] සැ: පා: 439[8] ක: වි: 45[10]-103[22] සා: ම: 140[18] වි: වි: 422 පාචි: පා: 77[1] පා: මූ: වි: වි: 374[26]

අඩා (නි) [සං අඪ]= 1 එකාහනයෙන් නියම යෙන්. සත්‍යවහයෙන්. ප:සූ: 53[36](2) 2 මාඝීය.

අඩාන 1 (නා)= 1 කාලය, 2 මාඝීය, 3 දීඝීමාඝීය, 4 ආතම භාවය, "අඩාන නම් දෙනවුවෙන් වැනි නැන්': ධ: අ: ගැ: 12[12] මහා: පා: 56[23]-287[23] සැ: පා: 395[6] මි: වි: ථී: 177[23]-36 පාරා: පා: 259[37] සැ: වි: 5[37].

අඩාන 2 (නා)= මාඝීයේ යෑම. 1 "අඩාන නම් මහ යෑමඝී.:' වි: මා: සැ: 225[30] ධ: අ:නැ; 144[24] සා: දී: 555[26] **-කම්ම** (නා) [සං. කර්ම]= දුර ගමන් යනු හැකි. දුර ගමන් යනු ඉවසනු හැකි. මනො: පූ: 592[4] **-ගමන** (නා) (√ගම +යු=අන)= දීඝීමාඝීය. ග්‍රාමාන්තයෙහි අඩ යොදුනක් හෝ ඉන් ඔබ යෑම. "අඩාන ගමනෙ, ගම් අතුරු අඩ යොජන යන දුරු මඟ යෑමෙනි ද." කු: සි: සැ: 45[19] **-සමය** (නා)= දීඝීම ගීෂ්මයෙහි යන කාලය. ගණ නො ජන ශික්ෂාපදයෙහි සඳහන් සවැදෑරුම් සමය යන්ගෙන් එකක්. යටත්පිරිසෙසින් අඩ යොදු නක් දුර යනු කැමැති වේ නම් හෝ යේ නම් මහ ගියේ නම් හෝ මේ අඩාන ගමන සමය නම්වේ:එහිදී ගණනොජන ශික්ෂාපදයෙන්වත ඇවැත් නැති: පාචි:පා.77[1]=118[5] සැ:පා: 598[5] පා: මූ: වි: වි: 373[26] ක: වි: 103[23] **-දරථ** (නා) [සං. දරථ]= ගමන් විඩාව. මාඝී දුහය. **-පරිවෙජ්ද** (නා) (පරි + √ඡිදි + ණ)- කාල පරිවෙජ්දය. කාල සීමාව. පිටත්වන කාලය. 1 නිරොධසමාපත්තියට සමවදින්නහු විසින් කටයුතු පූර්වකෘත්‍ය සතරින් එකක්. 2 මරණානුස්මෘතිය සිහිකරන අට ආකාරයෙන් එකක්. (සෙසු තන්හි ද මෙසේ ම දත්නේය) සා: දී: 323[34] වි: මා, සැ: 561[21] සැ: වි: 18[18] කු: සි: සැ: 164[15] **-පරිස්සම** (නා) [සං. පරිශ්‍රම]= ගමන් විඩාව. **-මඝ** (නා) [සං. මාඝී]=අඩාන මාඝීය. දීඝී මාඝීය. යොදුන් දෙකකට වඩා දුර මාඝීය. "අද්ධාන මිඝඤති අඩාන සඞ්ඛාතං දීඝමඝඤං. න නගර විථී මඝඤති' අට්ඨ': සැ: පා: 479[17] ප: සූ: 157[17] සු; වි 27[11] වි: වි: ථී. 11[30]-460[26] මහා: පා: 7[14] **-පටිපන්න** (නා) (පටි + √පද+ත=අන) [සං. ප්‍රතිපන්න > පා: පටිපන්න]= දීඝීමාඝීයට පිළි පන්. දික්මගට පැමිණි. සු: වි, 27[18] මහා: පා: 7[24]-18[1] ම: පා: සැ: 12[27] පාරා: පා: 61[24] (අද්ධානගමන බලනු) **-ඵලමන්ත** (නා) අවසා වෙමින්නතා බලනු) **-සමුට්ඨාන** (නා) (සං + ථ + √ස්ථා + යු=අන) [සං. සමුත්ථාන]= සවැදෑ රුම් සමුට්ඨානයන් අතර පළමුවන, තුන්වන, සතරවන, සවන සමුට්ඨානයන්ගෙන් නඟින ඇවැත. හෙවත් ශික්ෂාපදය් චතුස්සමුට්ඨානික ශික්ෂාපද දෙකින් එකක්. කාය, කායවාචා, කාය චිත්ත, කායවාචා චිත්ත යන සමුට්ඨාන සතරින් නඟින ඇවැත. සමුට්ඨාන වශයෙන් සියලුම ආපත්තීහු සවැදෑරුම් වෙති. හෙවත් සියලු ආපත්තීන් ගේ සමුට්ඨානභෙද සතෙ නෙක් වෙති. 1 කාය 2 වාචා 3 කායවාචා 4 කාය චිත්ත 5 වාචා චිත්ත 6 කායවාචා චිත්ත යනුවෙන් එක් අඞ්ගයක් ඇති, අඞ්ග දෙකක් ඇති, අඞ්ග තුණක් ඇති, අඞ්ග සතරක් ඇති,අඞ්ග සයක් ඇති යනු ඒ ආපත්ති සමුට්ඨානයෝ වෙත්. සමුට්ඨාන පසකින් නඟින ඇවැතක් නැත. එහි එක සමුට්ඨාන ශික්ෂාපද තුණකි ච් සමුට්ඨාන පසකි. ති සමුට්ඨාන දෙකකි. චතු සමුට්ඨාන ද දෙකකි. ඡ සමුට්ඨාන එකකි. මෙසේ සියල්ල ශීර්ෂවශයෙන් තෙළෙසකි. එනම්; 1 පඨම පාරාජික සමුට්ඨාන 2 අදින්නාදාන 3 සඤ්ච රිත්ත 4 සමනුභාසන 5 කඨින 6 එළකලොම 7 පදසොධම්ම 8 අධාන 9 රෙඅසඤඤ 10 ධම්ම දෙසනා 11 භූතාරොචන 12 වොරීවුට්ඨාපන 13 අනනුඤඤත සමුට්ඨාන යනු ඒ තෙළෙස සි. සියලුම ශික්ෂාපද මේ තෙළෙසට අයත් වේ. මේ ශික්ෂාපද සවැදෑරුම් සමුට්ඨානයන්ගෙන් නඟින අයුරු පහත සඳහන් පට්ටිකාවෙන් දැනගනු වඩා පහසු ය,

සික්ඛාපද 13.	අචිත්තක සමුට්ඨාන 3.			සචිත්තක සමුට්ඨාන 3.			අඩ්ඨ
	කාය	වාචා	කාය වාචා	කාය චිත්ත	වාචා චිත්ත	කාය වාචා චිත්ත	
1 පඨම පාරාජික සමුට්ඨාන සීස.				—			1
2 අදින්නාදාන ,,				—	—	—	3
3 සඤ්චරිත්ත ,,	—	—	—	—	—	—	6
4 සමනුභාසන ,,						—	1
5 කඨින ,,			—			—	2
6 එළක ලොම ,,	—			—			2
7 පදසෝ ධම්ම ,,		—			—		2
8 අඩ්ඨාන ,,	—		—	—		—	4
9 ඵෙය්‍යසඤ්ඤ ,,				—		—	2
10 ධම්මදෙසන ,,						—	1
11 භූතාරොචන ,,	—	—	—				3
12 වොරිවුට්ඨාන ,,					—	—	2
13 අනනුඤ්ඤාත ,,		—	—		—	—	4

මෙයින් සමනුභාසන සමුට්ඨානයට ධුර නික්ඛිප සමුට්ඨාන යයිද කියති. මෙසේ ආපත්ති සමුට්ඨාන සයක් සහ ආපත්ති සමුට්ඨාන සීඝී තෙළෙසක්ද වෙති මෙහි ආපත්තියම් ශික්ෂාපද සීඝීයෙන් දක්වන ලදී. මේ සය ශික්ෂාපද සමුට්ඨාන යයි කියන ලද නමුදු මොවුහු ආපත්ති සමුට්ඨානයෝ වෙති. ව්‍යවහාර පහසුව පිණිස එසේ කියන ලදී. "එතානි හි කිඤ්චාපි ආපත්තියා සමුට්ඨානානීන් සික්ඛාපදස්ස. වොහාර සුඛත්ථං පනෙවං වුච්චන්ති" වි: ම: 60[19] සා: දි: 46[937] – 47[111] ක: වි: පි: 19[30] ක: වි: 21[35] – 22[29] වි: වි: ටී: 125[31] – 126[37] ස: පා: 194[16] –

–හින (නා)= විසි වයසට අඩු. උපසපන් වීමට වයස අඩුවූයේ අඩ්ඨාන හින නම්. එබඳු පුද්ගලයා උපසපන් නොකළයුතුය. "අඩ්ඨාන හිනෝ නාම ඌන වීසති වස්සෝ" ස: පා: 976[6] පරි: පා: 164[1] (අඩ්ඨඝින බලනු)

අඩ්ඨාපවවුපපන්න (නා) [ඍ. ප්‍රක්‍යුත්පන්න] පති සඤ්ඤෙහි පමන් චුතිය තෙක් අතර පැවැති කාලය. තෙ වැදෑරුම් පවවුපපන්න යන්ගෙන් එකක්. 1 ඛණ 2 සන්තති 3 අඩ්ඨා යයි පවවුපපන්නය තෙ වැදෑරුම් වේ. එහි උත්පාද, ජරා, භඞ්ග යන ත්‍රිවිධ ක්ෂණය ඛණ පවවුපපන්න නම්. එය පරෝප ක්‍රමයකින් විනාශ කළ නොහැක. තමන් ම විනාශ වන හෙයිනි. ජවන වාර හත අටක් සහාග අරමුණු වශයෙන් පැවැත නිරුද්ධ වන්නේ සන්තති පවවුපපන්න නම්. අවුවෙහි සිව ඔවරකයකට පිදිසියහුගේ ඇස්වල අඳුරු ගතිය යම්තාක් කල් පවතී ද, සිසිල් තැනකින් අවුත් ඔවරක යකට පිවිසිය හුගේ විෂභාග සෘතුගුණ පහළ

විමෙන් පළමු සිසිල් ගුණය යම්තාක් කල් නො නැසී පවතී ද, මේ අතර පැවැති කාලය සන්තති පච්චුපන්න නම්. ප්‍රති සන්ධියෙහි පටන් චුතියය තෙක් අතර කාලය අද්ධාපච්චුපන්න නම්. සන්තති අද්ධා යන පච්චුපන්න දෙකම විනාශ කළ හැකිය. ස: පා: 314¹ සා: දී: 602²⁶ සා: ෂ: 32⁶ (සන්තතිං විකොපෙති යනු බලනු)

අධික (නා) (අද්ධා + ණික) [සං ආධ්‍වණික]= මහිමය- "අධිකයෝ නම් මහිඝුසි" ජා: අ: ඝැ: 10²⁷.

අදඛ්ධ (න) (න + ධ්‍රුව) [සං. අධ්‍රුව]= අස්ථිර නො තහවුරු. ධ: අ: ඝැ: 199²¹.

අදඛ්ධාර (නා) (න + ද්වාර)= දොර නැති. දොර බෑ නැති. දොරක් නැති සෙනසුන.

අවෙජ්ඣ (න + වෙජ්ඣ) (වි + ඥා)[සං වෛධ්‍ය > වෙජ්ඣ]= දෙකක් නැති. එකම.-**මන** (නා)= දෙ සිතක් නැති. සෙනහ-- ප්‍රතිඝ වශයෙන් සිත් දෙකක් නැති.බුදුවරුන්ගේ ලක්ෂණයක්. "අවෙජ්ඣ මනසෝ, ආදර කළවුන් කෙරෙහි සෙනහ වශයෙන් හා අනාදර කළවුන් කෙරෙහි ප්‍රතිඝ වශයෙන් හා මෙසේ විධා ප්‍රවෘත්තවූ සිතක් නැත්තෙහි" ජා: අ: ඝැ: 32²¹-**වචන** (නා) (√වච+යු=අන)= වචන දෙකක් නැති. සත්‍යය හා බොරුය යන දෙකක් නැති. සත්‍ය වදන් ම ඇති. බුදුවරුන්ගේ ලක්ෂණයක්. "අවෙජ්ඣ වචනා, දෙබසක් ඇත්තාහු නො වෙත්. සබාය බොරුය යන දෙබස ඇත්තානු නොවෙති. සත්‍යවූ ම තෙපුල් ඇත්තාහුය යනුයි" ජා: අ: ඝැ: 20₂⁵.

අධක්ඛක 1 (නා) (අධෝ + අක්ඛක) (අක්ඛ + ක) අකු ඇටින් යට. දුට්ඨුල්ලචාචා සික්ඛාදිසෙස ශික්ෂා පදයේ ථුල්ලවචය සෞත්‍රයක්. යම් භික්ෂුවක් සත්‍රියක කෙරෙහි රාග සහිත සිත් ඇතිව වසමගු පසමග් හැර අකු ඇටින් යට දණ මඩලෙන් උඩ වණ්ණාදිය කෙරේ නම් ථුල්ලැසි වේ. පාරා: පා: 145²⁵. සා: වි: 36₂¹. ස: පා: 391³¹. ක: වි: පි: 27-⁴ (අක්ඛක බලනු)

අධක්ඛක 2(නා)= එනම් ශික්ෂා පදය. කාය සංසර්ගී රාගයෙන් තෙත්ව තමාගේ අකු ඇටින් යට දණ මඩල හා වැලමිටින් මත් තෙහි එම රාගයෙන් ම මන්වූ මිනිස් පුරුෂ යක්ඛුගේ ආමෙඩිණ පරාමෙඩිණාදිය ඉවසන මෙහෙණහට පරිජී ඇවැත්වන බැව් සඳහ ශික්ෂා අධක්ඛක නම් ශික්ෂා පදය. සු: ප: 5¹¹⁹ ස: පා: 963₂³.

අධම්ම(නා) (න+ධම්ම) (√ධර+රමම) [සං ධර්ම]= අධර්මය. ධර්මයට විරුද්ධ දෙශනාව. ධර්මානු කූල නොවූ ප්‍රඥප්තිය 1 "පුරෙ අධමෙමා දිපති" යනාදි තන්හි මෙන්ම අටලෝස් හෙදකර වස්තූන්හි ද, සූත්‍රානුත ක්‍රමයෙන් දශ කුශල කර්ම පථය ධර්මය වේ. දශ අකුශල කර්ම පථය අධර්මය වේ. 2 එසේම සතිපට්ඨාන සතරක, සම්‍යක් ප්‍රධාන සතරක සෘඞ්ධි පාද සතරක, බල ධර්ම පසක, බොධ්‍යඞග ධර්ම සතක, මාර්ග අටක, බොධිපාක්ෂිය ධර්ම සත්තිසක යනු ධර්මය වේ. සතිපට්ඨාන තුණක, සෘඞ්ධි පාද තුණක, සම්‍යක් ප්‍රධාන තුණක, ඉන්ද්‍රිය සයක, බල ධර්ම සයක, බොධ්‍යඞග ධර්ම අටක, මාර්ග නවයත යනාදිය අධර්මය වේ. 3 අටලෝස් හෙදකර වස්තූන්හි විනය ක්‍රමයෙන් ද්‍රව්‍යමාන වස්තු වෙන් චොදනා කොට, සිහිකරවා, ප්‍රතිඥ පරිදි කටයුතු කර්මය ධර්මය වේ. අභූත වස්තු වෙන් චොදනා නොකොට සිහි නොකරවා ප්‍රතිඥවෙන් තොරව කරන කර්මය අධර්මයවේ: සා: දී: 38³ වි: වි: ටී: 12⁴ -475²⁹. ස: පා:942₂⁰

මනෝ: සූ: 696⁶-කතිකා (නා) [සං කථික?] අධර්ම කතිකා වත. වස් එළඹෙන භික්ෂූන් විසින් "මේ තුන්මස කිසිවකු හා කථානෝ කළ යුතුය" යනාදීන් මූගව්‍රත සමාදන් ව්‍රම් ආදිය. "ඉමං තෙමාසං න කථෙතබ්බන්ති එවරූපං වත සමාදානං න කාතබ්බං; අධම්ම කතිකා හි එසා" ස: පා: 800¹⁵ (අධම්මික කතිකා වත්ත බලනු.)- **කම්ම** (නා) (√කර+ රමම) [සං කර්ම]= අධර්ම කර්මය. පෙළෙහි ආ පරිදි නොකරන කර්මය. ධර්මයට විරුද්ධ කර්මය. වත්තු × ඤත්ති අනුසාවණ සීමා පරිස සම්පත්තීන් ව්‍රපන්නවූ විනයකර්මය. 1 අධම්මෙන වග්ග කම්මං. 2 අධම්මෙන සම්ග්ග කම්මං 3 ධම්මෙන වග්ග කම්මං 4 ධම්මෙන

සංඝස්ස කම්මං" යනුවෙන් කම් සතරකි. මෙයින් "ධම්මෙන සම්මා කම්මං" යනු හැර සෙසු කම් අධම් කම් නම්.

1 අපලොකන කම් 2 ඤත්ති කම් 3 ඤත්ති දුතිය කම් 4 ඤත්ති චතුත්ථ කම්ය යි ධාර්මික කම් සතරකි එහි 1 **අපලොකන කම් නම්**; කයින් හෝ සිතින් එකී භූතවූ, සමගිවූ සඞ්ඝයාගේ අනුමතියෙන් නුගුණ කිරීමාදිවූ ඒ ඒ වස්තුව කීර්තනය කොට "රුච්චති සඞ්ඝස්ස" යි තෙවරක් අස්වා කටයුතුවූ කම්යයි. අපලොකන කම්ය; 1 ඔස්සාරණ 2 නිස්සාරණ 3 භණ්ඩුකම්ම 4 බ්‍රහ්ම දණ්ඩ 5 කම්ම ලක්ඛණ යයි පස් වැදෑරුම් වේ.

2 **ඤත්ති කම්ය** නම්; සමගි සඞ්ඝයාගේ අනුමතියෙන් එක ඤත්තියකින් කටයුතුවූ කම් යයි මේ කම්යන්ට කම්වාක්‍යය කිමක් නැත. ඒ ඤත්ති කම්ය; 1 ඔස්සාරණ 2 නිස්සාරණ 3 උපොසථ 4 පවාරණ 5 සම්මති 6 දාන 7 පටිග්ගහණ 8 පවත්තකඛස්න 9 කම්ම ලක්ඛණ යයි නවවැදෑරුම් වේ.

3 **ඤත්ති දුතිය කම්ය** නම්; එක ඤත්තියකින් හා අනුස්සාවණයකින් කළයුතු කම් ය යි. එය 1 ඔස්සාරණ 2 නිස්සාරණ 3 සම්මති 4 දාන 5 උද්ධාර 6 දෙසනා 7 කම්ම ලක්ඛණ යයි සත්වැදෑරුම් වේ.

4 **ඤත්ති චතුත්ථ කම්ය** නම්; එක ඤත්තියකින් හා අනුස්සාවණ තුනකින් කළයුතු කම්ය යි. එය 1 ඔස්සාරණ 2 නිස්සාරණ 3 සම්මති 4 දාන 5 නිග්ගහ 6 සම්පුග්ගහණ 7 කම්ම ලක්ඛණ යයි සත්වැදෑරුම් වේ.

මෙයින් අපලොකන කම්ය අපලොකනය කොටම කටයුතුය. ඤත්තිකම්ාදි වශයෙන් නො කටයුතුය. ඤත්ති කම්යද එක ඤත්තියක් නබා විනා අපලොකනාදි වශයෙන් නො කටයුතුය ඤත්ති දුතිය කම්යෙහි අපලොකනය කොට ද අපලොකනය නො කොටද කටයුතු කම්යෝ ඇත්තාහ. එසින් 1 සීමා සම්මති 2 සීමාසම්භේද 3 කථිනත්ථාර 4 චීවරදාන 5 කථිනුද්ධාර 6 කුටි වත්තු දෙසනා 7 විහාර වත්තු දෙසනා යන සත් වැදෑරුම් ගරු කම්යන් අපලොකනය කොට කරනු නො වේ. ඤත්ති දුතිය කම් වාක්‍යය අස්වාම කටයුතුය. 1 තිවිධරෙන අවිප

වාස සම්මති, 2 සත්ථත සම්මති, 3 භත්තුද්දෙසක 4 භණ්ඩාගාරික 5 චීවරපටිග්ගාහක 6 යාගු භාජක, 7 ඵලභාජක 8 ඛජ්ජභාජක 9 අප්පමත්තක විස්සජ්ජනක 10 සාටිය ග්‍රාහාපක 11 පත්ත ග්‍රාහාපක 12 ආරාමික පෙසක 13 සාමණේර පෙසක 14 මතක චීවරදාන 15 සේනාසන ග්‍රාහාපක යන පස්ළොස් සම්මුතීහු අපලොකනය කොට ද කරනු වේ. ඤත්ති චතුත්ථ කම්ය එයට නියමිත ලක්ෂණයෙන් විනා අන් අයුරකින් නො කට යුතුය. මෙසේ ඒ ඒ කම්යන්ට නියමිත පරිදි වත්තු ඤත්ති අනුස්සාවණ සීමා පරිස සම්පත්තීන් යුක්තව කරණ ලද්දේ ධම් කම්ද, එසින් විශේෂ වූයේ අධම් කම් ද වේ. "අප ලොකන ඤත්ති ඤත්ති දුතිය ඤත්ති චතුත්ථ සඞ්ඝාතං කම්මං ධම්ම කම්මං තප්පටිපක්ඛං අධම්ම කම්මං"

1 තජ්ජනීය 2 පබ්බාජනීය 3 පටිසාරණීය 4 නියස්ස 5, 6, 7. ත්‍රිවිධ ඵෙක්ඛපනීය යනුවෙන් කම්යෝ සත් වැදෑරුම් වෙති. ඒ ඒ කම්ය කිරීමට සුදුසු භික්ෂුවට **නියමිත කම්ය** තබා අන්‍යෙකක් කරණ ලද්දේ නම් ඒ අධම් කම් වේ: සෙසු තන්හිද මෙසේ ම දන්නෙන්ය. මහා: පා: 354[13]-16 කං: වි: 133-18- 136-20. කු: සි: ස: 70-26 බු: සු: ථි: 96-9 චු: පා: B ii-18 (ථ: ග්‍ර:) ඛ: වි: පි: 105-29. වි: වි: 2983-3015. පාරා: පා: 208-21-221-5. මහා: පා: 123 -28 ස: පා: 850-17 **සඤ්ඤි** (නා) (සඤ්ඤු + ඒ)= අධම් කම්ය යන සංඥා ඇති. එබඳු හැඟීම් ඇති. පාරා: ප: 221-8. **-චරණ** (නා) (√චර+ යු= අන; න=ණ)= අධම්යෙහි හැසිරීම: අධම්-චයස්ථාව. ස: පා: 667-22. **චරියා** (නා) (√චර+ රිය) [සං චර්‍යා > ප. චරියා]: අධම් චයස්ථාව අධම්යෙහි හැසිරීම දශ අකුශල කම්පථ යෙහි යෙදීම අධම්මචරියා නම් වේ. මනෝ: සූ: 331 11-706-10 8391 **චාරි-** (නා) (√චර ණි)= අධම්යෙහි හැසිරෙන සැනැත්තා. ප: සූ: 27816-**චුද්දසක** (නා) (√චුද + ඉ + ත + ක)= අධම්යෙන් චොදනා ලද සැනැත්තා. ස: පා: 97331 පරිපා: 1627 (අධම්ම චොදක බලනු) **-චොදක** 1 (නා) (√චුද + ණ්වු=අක): අධම් යෙන් චොදන: කරන්නා කරුණු පස්ළොසක නො පිහිටා අභූත වස්තුවෙන් චොදනා කරන්නා. 1 පරිසුද්ධකාය සමාචාරතා 2 පරිසුද්ධ

වචී සමා චාරතා 3 සබ්‍රහ්මචාරීසු මෙත්තා චිත්තතා 4 බහුසසුතතා 5 උභින්නං පාතිමොක්ඛානං සවානතාදිතා 6 කාලෙන වක්ඛාමි නො අකාලෙන 7 භූතෙන වක්ඛාමි නො අභූතෙන 8 සණ්හෙන වක්ඛාමි නො ඵරුසෙන 9 අත්ථසංහිතෙන වක්ඛාමි නො අනත්ථසංහිතෙන 10 මෙත්තචිත්තෙනා වක්ඛාමි නො දොසන්තරෝ 11 කාරුඤ්ඤතා 12 හිතෙසිතා 13 අනුකම්පතා 14 ආපත්තිවුට්ඨානතා 15 විනය පුරෙක්ඛාරතා යන පසළොස් ධම්මෙහි නො පිහිටා අසත්‍යයෙන් වොදනා කරන්නා අධම්මවොදක නම් වේ. සැ: පා: 426[18] වි: වි: ටී: 240[3]- සූ: ස: 1128-[24] පරි: පා: 213[14-17] 250-[8] 251[18-27]. **-වොදක 2** (නා)= අධම්මයෙන් වොදනා කරන්නා. නො අනුදත් කල්හි අභූතයෙන් රථවචනයෙන් යුක්තව අනාචීදූයි කරුණින් හා වෙම සහනත සිතින් වොදනා කරන්නා පරි: පා: 213[15] සූ: ප: 1126-[24]. **-දිට්ඨි** (නා) (√ දිස + ති; ත=ට) [සං. දෘෂ්ටි]= අධම්ම දෘෂ්ටිය අධම්ම කම්යක යන දෘෂ්ටිය ඇති. කම්ය සම්පූණී නොවන කරුණු පසින් එකක්. "පඤ්ච හාකාරෙහි කම්මං න උපෙති සයං වා කම්මං න කරොති-පෙ-කතවා පතකමෙම අධම්ම දිට්ඨි හොති" පරි: පා: 177[16] වි: වි: ටී: 476[21]-**වාදි** (නා) (√ වද + ණි)= අධම්මවාදියා ධම්ම අධම්ම කරන්නා: උත්සෙපනීය කම්ය කළහුට අනුව පවතින්නා. අවළොස් හෙදකර වස්තූන් ප්‍රකාශ කරන්නා. එබඳු භික්ෂුව. පාරා: පා: 208[29] මහා: පා: 410[2] මනො: පූ: 478[23] වි: වි: ටී: 128-413[28] ප:සූ: 276[15] ස: පා: 853[23]., (සත්‍රී: ලි: අධම්මවාදිනී)- **පරිසා** (නා)= අධම්මවාදි පිරිස තමන් ගත් අධිකරණය අනුනට නො දන්වා, වෙත එළඹ සවකීය අධිකරණය නො හඟවන පිරිස. අ: නි: 4616 **-පුග්ගල** (නා= අධම්මවාදී පුද්ගලයා. අධම්මවාදී භික්ෂුව. වූ: ප: 168[18] ස: පා: 682[7] **-ඵඛ්ඛ** (නා)= අධම්මවාදීවූ සඞ්ඝයා වූ: පා: 168[13] **-ඵඛ්ඛුල** (නා)= අධම්මවාදීවූ බොහෝ දෙනා. අධම්මවාදී පිරිස වූ: පා: 168[13]

අධම්මික (නා) (න + ධම්මික) (ධම්ම + ණික)= අධාර්මික. ධාර්මික නොවූ. ධම්මයට එකඟ නොවූ අධම්මිය යනුද දක්නේය. මහා: පා: 120[12] (සත්‍රී: ලි: අධම්මිකා)-**කතිකා වත්ත** (නා)= අධාර්මික කතිකාවත් ධම්මයට එකඟ නොවූ කතිකාව. "මේ තුන් මස ඇතුළත සියල්ලෝම අරණ්‍යක හෝ පිණ්ඩපාතිකාදී අවශෙෂ ධුතඞ්ගධාරීහු හෝ වෙත්වා. නැතඤෙත් සියල්ලෝම ඝෂිණාශ්‍රවයෝ හෝ වෙත්වා" යනාදීන් හෝ මේ තුන්මස තුළ සියල්ලන් විසින් උදෙසා පරිපුවඡාදිය නො කටයුතුය. පැවිදි නොකට යුතුය. කථා නො කටයුතුය. සීමාවෙන් බැහැර සිටියහුටද සඞ්ඝලාභය දියයුතුය යනාදීන් වස් විසූ භික්ෂූන් කරන කතිකාවත්. "යමෙක් මෙහි හිඳීද, සක්මන් කෙරේද: මේ මල් ගෙණ යමෙක් පූජා කෙරේද, හෙතෙම රහත්යයි" දැන ගණිමු යනාදි කතිකාවත්. සැ: පා: 360[20] වි: වි: ටී: 425[16] (අධම්මික වත්ත බලනු) **-කතිකා** (නා) (√ කර + ති; කති + ක? [සං. කථික. කෘති? දෙ. කාතිකා]= අධාර්මික කතිකාවත. "අධම්මික කතිකා නම් යම් කෙනෙක් සවීඥයන් විවෙකවැ වැඩහුන් තැනට ගියාහු නම් ආපත්ති යසි කියා මෙසේ ආපත්ති වශයෙන් කළ කතිකායි" ජා: අ: ගැ: 160[18] වි: වි: ටී 425[16] (අධම්මික කතිකවත්ත බලනු) **දාන** (නා) (√ දා + යු=අන)= අධාර්මික දානය. නවවැදූරුම් අධාර්මික දාන. සඞ්ඝයාට පිරිනැමූවක් 1 අන්‍ය සඞ්ඝයාට හෝ චෛත්‍යයකට හෝ පුද්ගලයකුට පිරිනැමීම; චෛත්‍යයකට පිරිනැමූවක් 4 අන්‍ය චෛත්‍යයකට හෝ 5 සඞ්ඝයාට හෝ 6 පුද්ගලයකුට හෝ පිරි නැමීම; පුද්ගලයකුට පිරිනැමූවක් 7 අන්‍ය පුද්ගලයකුට හෝ 8 අන්‍ය චෛත්‍යයකට හෝ 9 සඞ්ඝයාට පිරිනැමීම යනුවෙන් පරිවාර පාලියෙහි දක්නා නව වැදූරුම් අධාර්මික දානය. වි: ලි: 112[13]: 348[18] පරි: පා: 189[15] ස: පා: 993[15]-**පඤ්ඤත්ති** (නා) (ප + √ ඤා + ති) [සං. ප්‍රඥප්ති] අධාර්මික- ප්‍රඥප්ති අධාර්මික ප්‍රඥප්තිය නවය. සමථකඛ්ඛකයෙහි "අධම්මවාදී පුග්ගලා ධම්මවාදී පුග්ගලං සඤ්ඤාපෙති', යනාදීන් දැක්වූ කර්ණ පකඛ නවය. පරි: පා: 189[17] ස: පා: 999[23] (නව අධම්මික පඤ්ඤත්ති බලනු) **-පටිග්ගහ** (නා) (පටි + √ ගහ + ණ) [සං. ප්‍රතිග්‍රහ]= අධාර්මික දානය පිළිනැන්ම. නව වැදූරුම් අධාර්මික දානය පිළිගැන්ම: පරි: පා: 189[16] ස: පා: 993[17] (නව අධම්මික පටිග්ගහ බලනු)

-පරිභොග (නා) පරි+√ භුජ+ණ; ජ=ග) [සං. පරිභොග]= අධාර්මික පරිභොගය. නව වැදූරුම් අධාර්මික දූනය වැළඳීම. පරි: පා: 18916 සු: පා: 99317 (නව අධම්මික පරිභොග බලනු) **-චත්ත** (නා) (√වතු+ණ) [සං. වෘත]=වස් කාලය තුළ වත් පුරන්නවුන් විසින් "උදෙසිම් උදෙසවිම් නො කළ යුතුය. නො හඳුළ යුතුය, බණ දහම් නො ඇසිය යුතුය. මේ කටයුතුවල පමා නොවී මහණ දම් පුරමුයි කියා හෝ සියල්ලෝම දුහඟ සමාදන් වෙත්වා සයනය නො කොට සිටීමෙන් හා සක්මනින් කල් ගෙවත්වා. කිසිවකු සමඟ කථා නො කෙරෙත්වා. සත්තාහ කරණීයයෙන් ගිය තැනක නමුදු භාජනීය භාණ්ඩ ලබත්වා" යනාදී වූත සමාදන් වීම. සු: පා: 36020-90919 වි; වි: ටී: 42536 වි: ලං: 2786 වි: වි:3078.

අධම්මිය (නා) (න+ධම්මිය) (√ධර+රම්ම; ධම්ම+ණික; ණික=ඉය)= අධාර්මික, ධාර්මික නොවූ. (අධම්මික බලනු) **-පරිභොග** (නා)= අධාර්මික පරිභොගය. සිව් වැදූරුම් පරිභෝගයන්ගෙන් එකක්. ලජ්ජී පුද්ගලයා සතු අධාර්මික පිණ්ඩපාතය හෝ අලජ්ජී පුද්ගලයා සතු ධාර්මික පිණ්ඩපාතය හෝ අලජ්ජී පුද්ගලයා සතු අධාර්මික පිණ්ඩපාතය හෝ පරිභොග කිරීම අධාර්මික පරිභොග නම් වේ. මේ පරිභෝගය සිව්පසය පිළිබඳව ම වේ. මෙහි අධාර්මික නම් අඡවිධ කුල දූෂණාදියෙන් උපන් ප්‍රත්‍යය සි: "ධම්මියා ධම්මිය පරිභොගෝ පවවයවසෙනෙව වෙදිතබ්බෝ" සු: පා: 50321 සා; දී: 75526 **-මාන** (නා)= අධාර්මික කටයුතු කරනු ලබන. මහා: පා: 39615 සු: පා' 85321.

අධම්මෙන වගඝං උපොසථ කම්මං (නා)=අධම්මයෙන් වගීව පොහෝ කිරීම. සිව් වැදූරුම් උපෝෂථ කර්මයන්ගෙන් එකක්. නො කළ යුතු උපෝෂථ කර්මයක්. භික්ෂූන් සතරනමක් එක් විහාරයක වසන කල්හි එක් භික්ෂුවකගේ ඡන්ද පාරිශුද්ධිය නො ගෙණ තුන්නමක් පිරිසුදු පොහොය කරත් නම් හෝ තුන්නමක් වසන වෙහෙරෙහි එක් නමකගේ ඡන්දපාරිශුද්ධිය ගෙණැවිත් දෙනමක් පාමොක් උදෙසත් නම් හෝ මෙය අධම්මයෙන් කරන වගී උපෝෂථ කර්මය සි. එක් සීමාවක භික්ෂූන් සතර නමක් ඇතිකල පාමොක් උදෙසීම ද, දෙනමක් හෝ තුන්නමක් ඇතිකල පිරිසුදු පොහොය කිරීම ද අනු දන්නා ලදී. මෙහි ධම්මය එය වේ. එසේ නො කළ බැවින් අධම්ම නම් විය. ඡන්දය හා පාරිශුද්ධිය ගෙණ ඒම සඞ්ඝයා කෙරෙහි විනා ගණ – පුද්ගලයින් කෙරෙහි නො වේ. මෙහි ගණ – පුද්ගලයන් විසින් ඡන්ද පාරිශුද්ධි ආහරණයකළ බැවින් වග්ග නම්විය. "එකසීමාය වතූසු භික්ඛූසු විජ්ජමානෙසු පාතිමොක්ඛුද්දෙසොව අනුඤ්ඤතෝ තීසු දවීසුව පාරිසුද්ධි උපොසථෝ ච. ඉධ පන තථා අකතත්තා අධම්මෙනාති වුත්තං. යසමා පන ඡන්දපාරිසුද්ධි සඞ්ඝෙ එව ආගච්ඡති, න ගණෙ, න පුග්ගලෙ තසමා වග්ගෝති වුත්තං" මහා: පා: 12027 සු: පා: 78827 වි: වි: ටී: 42010 වි: වි: 2584-25-91. කු: සි: ස: 6516,

අධම්මෙන වගඝං පවාරණං (නා= අධර්මයෙන් කරන වගී පවාරණය. සිව් වැදූරුම් පවාරණ කර්මයන්ගෙන් එකක්. නො කළයුතු පවාරණ කර්මයක්. එක ම විහාරයෙහි භික්ෂූන් පස් නමක් වසන කල්හි එක් භික්ෂුවකගේ පවාරණය ගෙණැවිත් සෙසු සතර නම ගණඤත්තිය තබා පවරත් නම් හෝ සතර නමක් හෝ තුන්නමක් වසන කල එක් භික්ෂුවකගේ පවාරණය ගෙණවිත් සෙසු තුන්නම හෝ දෙනම සඞ්ඝ ඤත්තිය තබා පවරත් නම් හෝ මෙය අධර්මයෙන් කරන වගී පවාරණයයි. පස් නමක් හෝ පස් නමකට වැඩි වූයේ හෝ පවාරණයෙහි සඞ්ඝඤත්තිය ද, දෙනමක් තුන් නමක් සතරනමක් පවාරණයෙහි ගණ ඤත්තිය කැබිමද නියමය වේ මහා:පා:18016 සු: පා: 80036-80113 වි: වි: 2640

අධම්මෙන සමගඝං උපොසථ කම්මං (නා)= අධර්මයෙන් කරන සමගි පොහොය. සිව් වැදූරුම් උපෝෂථ කර්මයන්ගෙන් එකක්.නො කළයුතු උපෝෂථ කර්මයක්. සතර නමක් එක්ව පිරිසුදු පොහොය කරත් නම් හෝ තුන්නමක් හෝ දෙනමක් එක්ව පාමොක් උදෙසත් නම් හෝ මෙය අධර්මයෙන් කරන සමගි පොහොය වේ. සතර නමක් එක්වූ විට කටයුත්තේ සඞ්ඝුපොසථ යයි. දෙදෙනා හෝ තුන්දෙනා කරන පොහොය ගණ පොහොයයි. ඤත්ති තබා තුන් දෙනා කරන පොහොය හා ඤත්ති නො තබා

දෙදෙනා කරන පොහොය පිරිසුදු පොහොයයි එක් නමක් වූ විට කරනුයේ ඉටන් පොහොයයි. මහා: පා: 120[47] සා: පා: 788[32] සි: ව: 13[26] පී: පි: 2588.

අධමේමන සමගහං පවාරණං (නා)=අධර්මයෙන් කරන සමගි පවාරණය. සිව් වැදෑරුම් පවාරණයන්ගෙන් එකක්. නො කළ යුතු පවාරණයක්. භික්ෂූන් පස්නමක් වසන විහාරයෙහි ඒ පස්නම ම එකතුව ගණ ඝාතනීය තබා පවරත් නම් හෝ සතරනමක්, තුන්නමක්, දෙනමක් වසන විහාරයක ඒ සියලුදෙන රැස්ව සඞ්ඝ ඝාතනීය තබා පවරත් නම් එහි මෙය අධර්ම සමන පවාරණයයි. මෙහි අධර්මය නම් ගණයා විසින් නැඹිය යුතු ගණ ඝාතනීය සඞ්ඝයා විසින් නැඹීම හා සඞ්ඝයා විසින් නැඹිය යුතු සඞ්ඝ ඝාතනීය ගණයා විසින් නැඹීමත්ය. මහා: පා: 180[16] සා: පා: 801[3]

අධරාරණී (නා) [සං. අධරාරණී]= ගිනිගානා දඩු දෙකෙන් ඔට දණ්ඩ. උදුකබල දණ්ඩය, එක් භාජනීය භාණ්ඩයක් මාලාකර්මාදිය නො කටයුතු වූවක් වි: ල:391[32] සා: පා: 210[11] පා: මූ: පී: පි: 7[14] ගා: හ: පි: 42[34].

අධාරිත (නා) (න + ධාරිත) (√ධර + ඉ + ත)= නො දරන ලද. පාචි: පා: 141[29].

අධි (උ: සං:) 1 අධික 2 ඊශ්වර 3 අධ්‍යයන 4 අධිඥාන 5 ප්‍රාපති 6 නිශ්චය 7 උපරිභාව 8 අනිභවන 9 විශෙෂණ 10 ආධාර යන අර්ථයන්හි වැටෙන උපසර්ගයක්. අ: ප: සං: 157[34].

අධිකරණ 1 (නා) (අධි + √කර + යු=අන; න=ණ) [සං. අධිකරණ]= අධිකරණය. නඩු විනිශ්චය. යුක්ති විචාරණය. පස් සහ දැමියන්ගේ පාත්‍ර චීවරාදිය උදෙසා කරනු ලබන විනිශ්චය ව්‍යවහාරය. ගිහියන්ගේ නොයෙක් කෝලාහල ආදිය පිළිබඳ නඩු. සං: පා: 427[5]-1031[27].

අධිකරණ 2 (නා)= යමක් උදෙසා සමථයෝ පවතිද්ද ඒ අධිකරණ නම්. 1 සම්මුඛා විනය 2 සති විනය 3 අමූළ්හ විනය 4 පටිඤ්ඤාත කරණය 5 යෙභුය්‍ය සිකා 5 තස්ස පාපිය්‍ය සිකා 7 තිණවත්ථාරක යන සමථයන්ගෙන් සන් සිඳුවිය හැකි සියල්ල අධිකරණ නම්.

"යං අධිකිච්ච ආරබ්භ පටිච්ච සඞ්ඝාය සමථා වත්තන්ති තං අධිකරණන්ති වෙදිතබ්බං" සා පා: 427[7] (අධිකරණ 3 බලනු)

අධිකරණ 3 (නා)= අධිකරණ සතර. 1 විවාදාධිකරණ 2 අනුවාදාධිකරණ 3 ආපත්තාධිකරණ 4 කිච්චාධිකරණ යන සතර. "අධිකරණං නාම චත්තාරි අධිකරණානි"-මෙහි 1 **විවාදාධිකරණ** නම්; භික්ෂූන් විසින් අවලෝස් භෙද කර වස්තුන්නෙන් කරනු ලබන විවාද යයි. "අධ්‍යාරූඪා වත්ථූනි විවදන්තානං භික්ඛූනං යෝ විවාදෝ ඉදං විවාදාධිකරණං නාම. 2 **අනුවාදාධිකරණ** නම්; සිල විපත්තියෙන් හෝ ආචාර – දිට්ඨි – ආජීව විපත්තින්නෙන් හෝ භික්ෂුවක් විසින් භික්ෂුවකට කරනු ලබන චොදනාවයි. "සීල විපත්තියා වා ආචාර දිට්ඨි ආජීව විපත්තියා වා අනුවදන්තානං යෝ අනුවාදෝ උපවදනා වෙව චොදනා ච ඉදං අනුවාදාධිකරණං" 3 **ආපත්තාධිකරණ** නම්; සප්තාපත්තිසකඤ්ඤියන්ගෙන් හටගත් අධිකරණ යයි. "මාතිකාය ආගතා පඤ්ච විභඞ්ගෙ වෙති සත්ත ආපත්තික්ඛන්ධා': 4 **කිච්චාධිකරණ** නම්; සඞ්ඝයා විසින් කටයුතු වූ 1 අපලොකන කම් 2 ඤත්ති කම් 3 ඤත්ති දුතිය කම් 4 ඤත්ති චතුත්ථ කම් යන සතර පිළිබඳව කටයුතු විනිශ්ච යයි "යං සඞ්ඝස්ස අපලොකනාදීනං චතුන්නං කම්මානං කරණං ඉදං කිච්චාධිකරණං නාම"

මෙයින් 1 **විවාදාධිකරණය**; සම්මුඛා විනය, යෙභුය්‍යසිකා යන දෙවැදෑරුම් සමථයන්ගෙන් ද 2 **අනුවාදාධිකරණය**; සම්මුඛාවිනය, සති විනය, අමූළ්හ විනය, තස්සපාපිය්‍යසිකා යන සිව් වැදෑරුම් සමථයන්ගෙත් ද, 3 **ආපත්තාධිකරණය**; පටිඤ්ඤාත කරණය, තිණවත්ථාරක යන දෙවැදෑරුම් සමථයන්ගෙන් ද 4 **කිච්චාධිකරණය**; සම්මුඛා විනය සමථයෙන් පමණක් ද සන්සිඳේ.

මෙහි 1 **සම්මුඛා විනය නම්**; චුදක චොදක යන් හමුවට ගෙන්වා අධිකරණය විනිශ්චය කිරීමෙන් සන් සිඳුවීම යි. මෙය සඞ්ඝසම්මුඛතා, ධම්ම සම්මුඛතා, විනය සම්මුඛතා, පුග්ගල සම්මුඛතා යන මෙයින් යුක්ත විය යුතුය. 2 **සති විනය** නම්; රහතන් වහන්සේට ම දිය යුත්තකි. අනෙකකු විසින් රහතන්

වහන්සේට අහුතයෙන් චොදනා කරන ඒව උන්වහන්සේ රහත් බවත් එවැනි වරදක් නො කරන බවත් දැන ගැණීම පිණිස ද, නැහුණු චොදනාව අහුත බව දැන ගැණීම පිණිස ද, මේ සති විනය පණවන ලදී. යටත් පිරිසෙයින් අනාගාමී භික්ෂූන් වහන්සේට පවා මෙය දීම නුසුදුසු ය. "සමෘති විපුල භාවයට පැමිණි"යනුවෙන් අදහස් කරන්නේ රහතන් වහන්සේයි. සියලුම රහතන් වහන්සේට මෙය නොදෙති: චොදනාවක් නැහුණු කල්හිම සඞ්ඝයා ඤත්ති චතුර්‍ථ කර්‍මයෙන් සති විනය දෙති; "යදා පන ඛීණාසවස්ස භික්ඛුනො අමූලිකාය සීල විපත්තියා අනුද්ධංසිතස්ස සති විනයං යාචමානස්ස සඞ්ඝෝ ඤත්ති චතුත්ථ කම්මෙන සතිවිනයං දෙති". 3 **අමූළ්හ විනය** නම්; උමතුව සිටි භික්ෂුවට දෙන අධිකරණ සමථ යයි. උමතු වූ භික්ෂුවක් සිහි මුළාවීමෙන් යම් යම් ශ්‍රමණ සාරුප්‍ය නොවූ ඇවැත්වලට පැමිණෙනි. පසු කලෙක උමතු බැවින් මිදුණු ඒ භික්ෂුවට සෙසු භික්ෂූහු ඒ ඇවැත් ගැන අසමින් හිරිහැර කරති. මෙසේ කරදර සහිත වූ ඒ භික්ෂුවගේ නිදහස පිණිස අමූළ්හ විනය පැණවූ සේක: ඇඞ්ඝයාගෙන් ඤත්ති චතුර්‍ථ කර්‍මවාක්‍යයෙන් එය ලැබ පසු ඒ ඇවැත් ගැන විමසීමට සඞ්ඝයාට අවසර නැත. 4 **පටිඤ්ඤාත කරණ** නම්; ප්‍රතිඥව කරණ කොට කිරීමයි. මම මෙනම් ඇවැතකට පැමිණියෙමි. ඒ ඇවැත ඇවැතක් වශයෙන් දන්නෙමියි ප්‍රතිඥ කළහුට ආයති සංවරය පිණිස කරනුයේ පටිඤ්ඤාත කරණ යයි. සඞ්ඝාදිශේසාපත්ති විෂයෙහි පරිවාසාදිය යාචඤ්ඤ කිරීම පටිඤ්ඤා නම්. පරිවාසාදිය දීම පටිඤ්ඤාත කරණ නම්. "සඞ්ඝාදිසෙසෙ පරිවාසාදි යාචනා පටිඤ්ඤා. පරිවාසාදීනං දානං පටිඤ්ඤාත කරණං" 5 **තස්සපාපියසිකා** නම්; අධිකරණයක් විනිශ්චය කරන අතර අරගල ඇතිවීමෙන් එය සන්සිඳුවීමට බාධා පැමිණි කල්හි ඡන්‍දය විමසා ධම්මධම්මවාදීන් දැන ධම්මවාදීන් බහුල නම් උන්වහන්සේලාගේ කැමැත්ත පරිදි අධිකරණය සන්සිඳුවීමයි 6 **තස්ස පාපියසිකා** නම්; අපිරිසුදු කායවාක් කර්‍ම ඇති අලජ්ජී වූ උපවාද සහිත භික්ෂුවට සඞ්ඝයා විසින් කරනු ලබන දඬුවම යි. මේ කර්‍මය ලැබූ භික්ෂුව පිරිවෙස් පුරන්නකු මෙන් වත් පිරිය යුතුය. 7 **තිණවත්ථාරක** නම්: යම්කිසි අධිකරණයක් මූලකාරණය සොයන්නට යෑමෙන් ක්‍රූර වෙයි නම් හෙදය පිණිස පවතීනම් එය නො විමසා වසා දැමීමයි: අශුචියක් තණ කොළ ආදියකින් වසන්නාක් මෙනි. ඒ භික්ෂූන්ගේ පාරාජිකා සඞ්ඝාදිසෙස හා ගිහියන්ට **නිග්ගහකිරීම්** ආදි ඇවැත් හැර සෙසු ඇවැත් සියල්ල සියලු දෙනා වෙනුවෙන් එක් නමක් සඞ්ඝයා මැද දෙසී මෙන් අවසන් කරනු ලබන බැවින් තිණවත්ථාරක යයි කියනු ලැබේ. මේ **සපත සමථයන්** ගෙන් සන්සිඳුවනු ලබන අධිකරණයන්හා එහි මූල- සමුට්ඨාන- උකෙකාටනයන් පසු පිටුවේ සඳහන් පට්ටිකාවෙන් දැනගනු පහසු වේ. පරි: පා: 201[18] සා: පා: 98[4] කා: වි: 156[18] චූ: පා: R ii [18] (උ: ශූ:) වි: වි: වී: 488[18] ප: සූ: 308-35 (4) ම: පූ:3396.

අධිකරණ 4 (කා)=ආධාරය.චසතුව. අධිෂ්ඨානය. ස: පා 431[9] කා: වි: 433[31] කා: වි: පි: 345[35] **-කාරක** (නා)= (√කර + ණ්වු=අක)= අධිකරණ කාරකයා. සඞ්ඝයා ඉදිරිපයහි නඩු පැමිණිලි කරන්නා. තස්ස පාපියසිකාදි කර්‍ම කිරීමට සුදුසු වන එක් **අඞ්ගයක්**. චූ: පා 185[14] **-නිරොධ** (නා) (නි + √රුධ+ණ)= අධිකරණ **නිරොධය**. විනිශ්චය සාමර්‍ථ්‍යය: ධම්-විනය දෙකට හා ශාස්තෘ ශාසනයට අනුව මුලින් මුලට ගොස් විනිශ්චය සමථය කිරීම. අධිකරණයන් සහමුලින් නැති වූ තැන. පරි: පා: 179[9] සා: පා: 989[11] චූ: පා: B. 588[8] **-ංගාමිනි පටිපදා** (නා) (පරි+√පද + ; + ආ)= අධිකරණ නිරොධගාමිනී ප්‍රතිපදාව. සපත සමථ. මේ අධිකරණය සමථ දෙකින් ද මෙය සතරකින් ද, මෙය තුණකින් ද, මෙය එකකින් ද සන්සිඳේයයි මෙසේ අධිකරණයන් සන්සිඳුවන සපත සමථයන් දැන ගැනීම. අධිකරණයන් සහමුලින් නැති කිරීම පිණිස යා යුතු මාර්‍ගය. පරි: පා: 17[9] සා: පා: 889[13] **-භෙද** (න) (√භිද + ණ)= අධිකරණ භෙදයන්. විවාදාධිකරණාදි භෙද සතර 1 විවාදාධිකරණය, 2 අනුවාදාධිකරණය, 3 ආපත්තාධිකරණය. 4 කිච්චාධිකරණය යන සතර. ස: පා: 1002[14] (අධිකරණ 3 බලනු) **-මූල** (නා)= අධිකරණ මූලය;

අධිකරණ 4	අධිකරණ සමථ 7							අධිකරණ මූල 33	අධිකරණ සමුච්චාන 33	අධිකරණ උපශමතාවන 10	
	සම්මුඛා විනය	සති විනය	අමූළහ විනය	පටිඤ්ඤාත කරණ	යෙභුය්‍යසිකා	තස්ස පාපිය්‍යසිකා	තිණවත්ථාරක				
විවාදාධිකරණ	—				—			12 අ	18 උ	2 ක	
අනුවාදාධිකරණ	—	—	—			—		14 ආ	4 ඌ	4 ඛ	
ආපත්තාධිකරණ				—			—	6 ඉ	7 එ	3 ග	
කිච්චාධිකරණ	—							1 ඊ	4 ඔ	1 ඝ	

අ- 1 කොඩ උපනෘහ 2 මක්ඛපලාස 3 ඉස්සා මච්ඡරිය 4 මායා සාඨෙය්‍ය 5 පාපිච්ඡතා මහිච්ඡතා 6සන්දිට්ඨි පරාමාසිතා ආධානග්ගාහී දුප්පටි නිස්සග්ගිතා යන යුගල ධර්ම සයත් 7 ලොභ 8 දෝස 9 මෝහ 10 අලොභ 11 අදෝස 12 අමෝහ යන සයත් ඇතුළු දෙළස

ආ- විවාදාධිකරණයෙහි දෙළස සහ කාය-වචන යන දෙක ඇතුළු තුදුස

ඉ- 1 කාය 2 වාචා 3 කාය වාචා 4 කාය චිත්ත 5 වාචා චිත්ත 6 කාය වාචා චිත්ත

ඊ- කිච්චාධිකරණයෙහි එකම මූලයකි එනම් සඞ්ඝයායි.

උ- අවලෝස් හෙදකර වසතු (අධ්‍යාරූප හෙදකර වත්තු බලනු.

ඌ- සීල-ආචාර-දිට්ඨි ආජීව යන විපත්ති සතර.

එ- පාරාජිකාදි සප්ත ආපත්ති

ඔ- අපලොකන- ඤත්ති-ඤත්ති දුතිය-ඤත්ති චතුර්ථ යන කර්මසතර.

ක- සම්මුඛා විනය, යෙභුය්‍යසිකා

ඛ- සම්මුඛා විනය, සති විනය, අමූළහ විනය, තස්ස පාපිය්‍යසිකා.

ග- සම්මුඛා විනය, පටිඤ්ඤාත කරණ, තිණවත්ථාරක.

ඝ සම්මුඛා විනය.

හෙතුව. තෙතිස් මූලධර්ම. විවාදාධිකරණයෙහි දෙළොසක් ද, අනුවාදාධිකරණයෙහි තුදුසක් ද, ආපත්තාධිකරණයෙහි සයක් ද කිච්චාධිකරණයෙහි එකක් දැ සි අධිකරණ මූලයෝ තෙතිසක් වෙත්. එහි විවාදාධිකරණයෙහි මූලධර්මයන්ම; 1 කොධ – උපනාහ මක්ඛ පලාස 3 ඉස්සා මච්ඡරිය 4මායාසාඨෙය්‍ය 5 පාපිච්ඡතා මහිච්ඡතා 6 සන්දිට්ඨිපරමාසිතා ආධාන ග්‍රාහී දුප්පටි නිස්සග්ගිතා යන යුගල ධර්ම සයත් 7 ලොභ 8 දෙස 9මොහ 10 අලොභ 11 අදෙස 12 අමොහ යන සයත් ඇතුළු දෙළස වේ. අනුවාදාධිකරණයෙහි අධිකරණ මූල තුදුස නම්; විවාදාධිකරණයෙහි කී දෙළෙස හා කය වචන දෙකත් ඇතුළු තුදුසයි. ආපත්තාධිකරණයෙහි; 1 කාය 2 වාචා 3 කාය වාචා 4 කාය චිත්ත 5 වාචා චිත්ත 6 කාය වාචා චිත්ත යන මූලයෝයි. කිච්චාධිකරණයෙහි එකම මූලයනි එනම්; සඞ්ඝ ඝාති. පරි: පා: 173[8] සා: පා: 9895 1006[8] 1019[18] චි: චි: ටී: 488[18] -වාර (නා)= අධිකරණ වාරය. පරිවාර පාළියෙහි දක්නා අෂ්ට වාරයන්ගෙන් එකක්. "මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියෝ චතුන්නං අධිකරණානං කතමං අධිකරණං" යනු මෙථුන ධම්ම පාරාජිකා ශික්ෂා පදයේ අධිකරණ වාරයයි. සා: දී: 57[87] චි: චි: ටී. 16[14] -වූපසමන (නා) (වි + උප + √ සම + ණ= අන) [සං. වූපසම]= අධිකරණය සන්සිඳුවීම. ඒ ඒ සමථයන්ගෙන් කරන අධිකරණ සමථය සා: පා: 668' ටී: චි: ටී: 490[11] -සමථ (නා) (√ සම + ථ) [සං ශමථ]= අධිකරණසමථයන්. සිව්විදුරුම් අධිකරණයන් සන්සිඳුවන සත්වැදුරුම් අධිකරණ සමථයන්. සා: පා: 669[8] (අධිකරණ 2 බලනු) -සමුට්ඨාන (නා) (සං + උ + √ ඨා + ණ=අන) [සං සමුත්ථාන]= අධිකරණ සමුට්ඨානයන්. අධිකරණයන් හට ගැන්මේ හෙතු. විවාදාධිකරණය අවලෝස් හෙදකර වස්තූන් නිසා ද, අනුවාදාධිකරණය චතුර්විධ විපත්තීන් නිසා ද, ආපත්තාධිකරණය සපත්තාපත්තිසඤ්ඤයන් නිසා ද; කිච්චාධිකරණය චතුර්විධ සඞ්ඝ කෘත්‍යයන් නිසාද හටගනියි චතුර්විධ සඞ්ඝ කෘත්‍යයෝ නම්; 1 අපලෝකන කර්මය, ඤත්ති කර්මය, ඤත්ති දුතිය කර්මය, ඤත්ති චතුර්ථ කර්මය යන මෙ වූහු වෙත්. සා: පා: 989[8]- **සමුදය** (නා) (සං + උ + √ ඉ + ණ; √ ඉ= ඒ= අය)=අධිකරණ යන්ගේ හට ගැන්ම. අධිකරණය ඉපදීමේ හෙතුව වූ: පා: B. 588[4] සා: පා: 989[7] (අධිකරණ සමුට්ඨාන බලනු.)

අධිකරණී (නා [සං. කිණිහිර. කිණිර. සඞ්ඝ යාට දුන් පසු ගරු බඩු බඳට පැමිණෙන ලොහමය උපකරණයක්. ක: වි: පි: 138[86] ක: ච: පි: 109[19].

අධිකාර (නා) (අධි + √ කර + ණ)= 1 ප්‍රාඥ්‍ය නාව 2 උපකාරය 3 ප්‍රධාන, කෘත්‍ය සංවිධානයෙහි බලය 4 විශෙෂ ක්‍රියාව. පරිත්‍යාගය. ජා: අ: ගැ: 173[3] ධ: අ: ගැ: 142[25] මහා: පා: 53[17] ච: චි: ටී: 370[3].

අධිකිච්ච (නා) (√ කර + ත්වා) [සං කෘත්‍ය> පා: කිච්ච]= අරහයා. උදෙසා. පිණිස. සා: පා: 427[7]

අධිකුට්ටන (නා) (√ කුට + ය්‍ය= අන)= නැවත නැවත කෙටීම. වැඩියක් කෙටීම. නැවත කෙටීම් අඥ්ඤයෙන් කාමයන් ගෙරි මස් කොටන කැත්තක් හා කොළොඹු කඩක් වැනියයි සලකන්. සා: පා: 644[86] වි: ච: ටී 333[7].

අධිකුසල (නා)= සමථ විදර්ශනා භාවනා. "සමථ විපස්සනා අධිකුසලානාම්" ච: ච: ටී: 87[5] සා: ච: 338[86] සා: පා: 150[81].

අධිගත (නා) (අධ + √ ගමු + ත)= අවබොධකළ. "අධිගතො බො මය්‍හයං ධම්මො" මහා: පා: 42[3] – 38[1] සා: පා: 720[36] -ඤාණදස්සන (න)= අවබොධ කෙළෙමි යන සංඥ ඇති. අවබොධ නොකළ ඵත්තරි මනුෂ්‍ය ධර්මය අවබොධ කෙළෙමි යන හැඟීම ඇති. පාරා: පා: 91[13].

අධිගම (නා) අධි + √ ගමු + අ)= 1 අවබොධය. 2 ලොකොත්තර ධර්මය. "අධිගම නම් ලොවුතුරා ධම්" ධ: අ: ගැ: 22[16] මහ: පා: 113[14]. -ධම්ම (නා)- ඵත්තරි මනුෂ්‍ය ධර්මය බුදාදී ඵත්තම පුරුෂයන් විසින් අවබොධ කටයුතු ධර්මය. ච: චි: ටී: 203[15] සා: දී: 626[6]. -පුච්ඡා (නා)= ධ්‍යානාදිය පිළිබඳ විචාරීම. අවබොධ කටයුතු බැවින් ධ්‍යාන විමොක්ෂාදිය අධිගම නම්. ඒ අධිගම පිළිබඳ පුච්ඡාව. "අධිග නන්තබ්බතො අධිගමෝ.

ඤාණාදි අධිගමස්ස පුච්ඡා= අධිගම පුච්ඡා,' සා: දී: 626[14] වි: වි: ටී: 204[3] සී: පා: 349[23] **-සද්ධම්ම** (නා)= අධිගම සද්ධර්මය, ත්‍රිවිධ වූ සද්ධර්මයෙන් හෝ විවිධ වූ **සද්ධර්මයෙන්** එකක්. 1 පරියත්ති 2 පටිපත්ති 3 අධිගම යනුවෙන් සද්ධර්මය තෙවැදෑරුම් වේ. එහි **පරියත්ති සද්ධම්ම** නම්; පිටකත්‍රයට ඇතුළත් සියලු ම බුදු වචන යහි, 2 **පටිපත්ති සද්ධම්ම** නම්; තෙළෙස් ධුතාඞ්ග, තුදුස් කඳුවත්, දෙයසූ මහ වත් සහ ශීලසමාධි විදර්ශනා යන මේ සියල්ලයි 3 **අධිගම සද්ධම්ම** නම්; සෝවාන් ආදි මාර්ග සතරත්, ඵල සතරත්, නිර්වාණයත් වේ. "සද්ධම්ම දෙවේ. ආහම අධිගම විසින්. බුදු වදන් ආහම සද්ධම්ම වෙයි. මහපල නිවන් අධිගම් සඩවම වේ" සී: පා: 157[15] පා මු: වි: ඒ: 417[27] ච: අ: ගැ: 2[13].

අධිචිත්ත (නා)= අධිචිත්තය. ඉතා ම ශ්‍රේෂ්ඨ සිත. ලෞකික සමාධි භාවනාව. අෂ්ටසමාපත්තිය. "කාමාවචර අටවැදෑරුම් කුසල චිත්තයෝ ද, ලෞකික අෂ්ටසමාපත්ති චිත්තයෝ ද, චිත්ත නම් වෙත්. විපස්සනා පාදක අෂ්ට සමාපත්ති චිත්තය අධිචිත්ත නම්. මාර්ග ඵල චිත්තය ඉතුදු අධිචිත්ත වේ. සී: පා 741[23] කු: සි: සී: 2[23] ක: ඒ: පි: 7[26] සී: වි: 29[24] වි: ල: 263[15] **-සික්ඛා** (නා) [සං. ශික්ෂා]= අධිචිත්ත ශික්ෂාව. අධිචිත්තයෙහි හික්මීම. ත්‍රිවිධ ශික්ෂාවන්ගෙන් එකක්. කු: සි: ස: 1[14]

අධිචේත (නා) (√චිති+ණ)= අධි චිත්තය, සියලු සිත්වලට වඩා ශ්‍රේෂ්ඨ වූ අර්හත් ඵල චිත්තය. සී: පා: 587[22].

අධිවච සමුප්පන්න (නා)= එනම් නාම පදය. සිව් වැදෑරුම් නාමපදයන්ගෙන් එකක්. වචනාර්ථය අපෙක්ෂා නො කොට නැඹූ සිරිවඩසක, ධනවඩසක; අෂමරිසන, පාවච්ච, ආදී නාම යන්. තම කැමැත්ත අනුව තබන බැවින් යාදිවඡක යි ද මෙයට ම කියති. සී: පා 75[6] වි: වි: ටී: 49[26] වි: ම: ටී: 206[28] සා: දී: 251[16]

අධිවච සමුප්පන්නික (නා)= එනම් දර්ශනය. එක්තරා දර්ශනවාදයක්. හෙතුවක් නැතිව ලොකය හා ආත්මය හටගත්තේය යන දර්ශනය. ආත්මය හා ලෝක සඞ්ඛ්‍යාත වූ සකඤ්ඤ යන් හෙතු රහිතව කැමැත්ත පරිදි හට ගනිය සි ද, ඔවුන්ගේ ආකාර සහචරිතත්වයෙන් අධිවච සමුප්පන්න යි ද කියනු ලැබේ. මෙහි "අධිවච" නම් හෙතුරහිතව කැමැත්ත පරිදි යන අර්ථයි. සා: දී: 123[21] වි: වි: ටී: 27[27] සී: පා: 355.

අධිවාපත්තික (නා)= කලින් කල ඇවැතට පැමිණෙන භික්ෂුව. නො භික්මුණු බැවින් කලින් කල ඇවැතට පැමිණෙන පුද්ගලයා. "සලසා අවදනා ආවැන් ඇති" "අධිවාපත්තිකානි යො කදාචි කදාචි ආපත්තිං ආපජ්ජති සො කිඤ්චාපි ලජ්ජී හොති පකත තත්තා. දුබ්බචත්තා පනස්ස භික්ඛූ තථෙව පවිපජ්ජන්ති" ප:සූ: 105[27](3) පරි. පා: ගැ 12[3] සී: පා: 973[38] පරි: පා: 1624,

අධිට්ඨා (නා) (අධි+√ඨා+අ)= ඉටීම. අධිෂ්ඨාන කිරීම— **භාවන**= ඉටන, අධිෂ්ඨාන කරන.- **-භිච්චා**= 1 ඉටා, අධිෂ්ඨාන කොට. 2 ළඟ සිට. **-තබ්බ** = ඉටිය යුතු. (පු: ලී: **-තබ්බෝ** සන්ති: ලී: **-තබ්බා** නා: ලි: **-තබ්බං**) **-තබ්බක**= ඉටිය යුතු· **-තු**= ඉටීමට, ඉටනු පිණිස.- **-ති**= ඉටමි. අධිෂ්ඨාන කරමි. **-තී** (=අධිට්ඨෙති)= ඉටයි. **-එය්‍ය**= ඉටන්නේය. අධිෂ්ඨාන කරන් නේය. මහා: පා: 134[30] සී: පා: 319[17]-466[23] වි: ල: 61[27] වි: වි: ටී: 202[16]

අධිට්ඨාන (නා) අධි+√ඨා+යු=අන)= ඉටීම. අධිෂ්ඨාන කිරීම. **කණ්ඩ්** හා වචනයෙන් ඉටීම. සී: පා: 464[7] (අධිට්ඨාන **විනිච්ඡය** බලනු) **-'ආවිකම්ම** (නා)= අධිෂ්ඨාන ආවිෂ්කරණය. සිතින් ඉටා ගැන්ම. "මනසාධිට්ඨාන මෙව අධිට්ඨානාවි කම්මං" අභි: ප: 1474[82] **-'ඉද්ධි**(නා) [සං. ඍද්ධි > පා. ඉද්ධි]= අධිෂ්ඨාන කිරීම් වශයෙන් නිපන් ඍද්ධිය. දශ වැදෑරුම් ඍද්ධින්ගෙන් එකක්. බුදුන් විසින් ප්‍රති ක්ෂේප නො කළ ඍද්ධියක්. ප්‍රකෘතියෙන් එක්අයෙක්ව බොහෝදෙනා ආවර්ජනා කෙරේ ද, සියයක් හෝ දහසක් හෝ ලක්ෂයක් හෝ වෙමියි නුවණින් ඉටා ද, මෙසේ අධිෂ්ඨාන කිරීම් වශයෙන් නිපන් ඍද්ධිය. "අධිට්ඨාන ඉද්ධියා අනාපත්ති" සී: පා: 283[33] වි: වි: ටී: 171[34]-458[32] වි: ම: ටී: 380[3-20] **-'උපෙක්ඛ** (නා)= අධිෂ්ඨානෝපෙක්ෂාව. නව වැදෑරුම් උපොසථයන්ගෙන් එකක්. සාරා: ම: 229[22]

(අධිට්ඨාන උපොසථ බලනු) **-'උපග** (නා)= අධිෂ්ඨාන කිරීමට යොග්‍ය. ඉටීමට සුදුසු. **-ංචීවර** (නා)= ඉටීමට සුදුසු සිවුරු. තුන් සිවුර, වැසිසළුව, නිසීදනය, පසතුරුණ, කණ්ඩුපටිච්ඡාදනය, මුඛ පුඤ්ඡනය, පරිඛ්කාර චොළය, යන මේතෙක් දෑ අධිට්ඨානූපග්ගයෝ වෙත්. මෙහි **තුන්සිවුර** නම්; සඞ්ඝාටිය, උත්තරාසඞ්ගය, අන්තරවාසකය යන තුණ සි, **වැසිසළුව** නම්; වැසි සාරම්භය හැඳ නහන්නට අනුදත් සිවුර සි. **නිසීදනය** නම්; අතුට හිඳිනට අනුදත් සිවුර සි. **පසතුරුණ** නම්; සඟ සතු හැඳ පුටුවෙහි වෙර පැහැරීමෙන් අවදනා ඇවැතින් මුදනු සඳහා අනුදත් චීවර විශෙෂයකි. **කණ්ඩුපටිච්ඡාදනය** නම්; කණ්ඩුයාදි රොග ඇති සඟුන් සඳහා අනුදත් සිවුර සි. **පරිඛ්කාර චොළ නම්; සඞ්ඝාටි** ආදි විශෙෂ නාමයෙන් නො ඉටු පශ්චිම චීවරාවසාන කළ නො කළ යම් කිසි සිවුරකි. එහි සඞ්ඛ්‍යාවක් හෝ දිග පුළුලෙහි ප්‍රමාණයක් හෝ නැත. මෙයින් වැසි සළුව වැසි සමයෙහි පමණක් ඉටිය යුතුය, කණ්ඩු පටිච්ඡාදනය රොගය සුවවන තුරු පමණක් ඉටා ගත යුතුය. මේ දෙක ම ඉන්පසු විකල්පනය කළ යුතු ය. සෙසු සිවුරු සත විකල්පනය නො කොට අධිෂ්ඨාන කළ යුතු ය. ස: පා.463[37] කු: සි: ස: 15[12] (අධිට්ඨාන විනිවිඡය බලනු) **-'ංපත්ත** (නා)= අධිෂ්ඨාන කිරීමට සුදුසු පාත්‍රය. ශ්‍රමණ සාරූප්‍ය වූ අයොමය පාත්‍රය. **පඤ්චපාකයකින්** ද, **මැටිපාත්‍රය චීපාකයකින්** ද, පිසන ලද්දේ අධිට්ඨානූපග වේ. එක් පාකයකින් උනු වූ හෙවත් **කාකණිකමාත්‍ර** ප්‍රමාණ වූ මිළ නොගෙවා ඉතිරි වූ පාත්‍රය අධිට්ඨානූපග නො වේ. පාත්‍ර මිළ පහසු දිනක ගෙවනු මැනැවැයි පාත්‍ර හිමියා කිය තත් ඒ පාත්‍රය අධිට්ඨානූපග නො වේ. නියම පක ප්‍රමාණයෙන් උන වූ පාත්‍රය පාත්‍ර සඞ්ඛ්‍යාවට නො ගැණේ. එසේ ම නියම මිළ ගෙවන තුරු ද ඒ පාත්‍රය තමහට අහිමිය. ස: පා: 5 0[37] කු: ච: 74[1] කු: ච: පි: 54[33] සා: ම: 101[1] ච: ල: 72[38] (**පත්තාධිට්ඨාන** බලනු) **-'උපොසථ** (නා)= අධිෂ්ඨාන උපෝෂථය. පුඟුල උපෝෂථය. **කරන්නවුන්ගේ** වශයෙන් තෙවැදෑරුම් වූ උපොසථයන්හෙන් එකක්. ඉටන් පොහෝ නම්; "අජ්ජ මේ උපොසථො චාතුද්දසී" කියා හෝ "අජ්ජ මේ උපොසථො පණ්ණරසී" කියා හෝ උදෑසන කලාව සරන පොහොයයි. "අධිට්ඨාන උපොසථො පුගල සෙසව" සි: ච: 14[1] ම: පා ස: 519[14]A කු: සි: ස: 1446 ච: ච: 2574 **-ක්ෙඛත්ත** (නා) [සං. ක්ෂෙත්‍ර]= අධිෂ්ඨාන ක්ෂෙත්‍රය, වැසි සළුව ඉටීමට සුදුසු කාලය. වැසි සළුව පිළිබඳ ක්ෂෙත්‍ර සතරින් එකක්. ඇසළ පුර පසළොස්වක ගිය පැළවියෙහි පටන් ඉල් පුර පසළොස්වක දක්වා මේ සාරම්භය තුළ වැසිසළුව පිළිබඳ **පයේෂණ - කරණ - නිවාසන - අධිෂ්ඨානයන්** මේ සතරට මසුදුසුය. අධිෂ්ඨාන කළ යුත්තේ වස්ඵළබෙන දිනයෙහිය. සෑපා: 523[14] කු: ච: 32[34] සා:ම:105 **-කිවව** (නා)= අධිෂ්ඨාන කෘත්‍යය. අධිෂ්ඨාන කිරීම: ස: පා: 464[35] (අධිට්ඨාන විනිවිඡය බලනු) **-විකප්පන නය** (නා) (√නී + අ; ඊ=එ=අය)= පාත්‍ර චීවර අධිෂ්ඨාන සහ විකල්පනය කිරීමේ ක්‍රම. ච: ල: 71[4] (අධිට්ඨාන විනිවිඡය සහ විකප්පන විනිවිඡය බලනු) **-විජහන** (නා) (වි + √හා + යු=අන; (√හා + √හා) (ජ √හා)= අධිෂ්ඨානය අත් ඇරීම. ඉටන් බිඳීම. පාත්‍ර සිවුරුවල අධිෂ්ඨානය බිඳීම. 1 අනුනට දීමෙන් ද, 2 ගිහිවීමෙන් ද, 3 **ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයෙන්** ද, 4 කාලක්‍රියා කිරීමෙන් ද, 5 ලිඛිත පරිවර්තනයෙන් ද, 6 පවවු **ඛ්ගරණය** කිරීමෙන් ද, 7 සිදුරු වීමෙන් ද, යන **කරුණු** සතින් පාත්‍රාධිෂ්ඨානය අත් හරී. එසේ ම සොරුන් පැහැර ගැන්මෙන් හා විශ්වාසයෙන් **ගැන්මෙන්** ද අධිෂ්ඨානය අත්හරී යයි දක්නේය. "චොර හරණ විස්සාස ගාහෙහිපි විජහති යෙව"-"පය මුවව්විත්යට දෙඅතුලෙන් ඔබ්බේ එක් තණ ඔළක් නික්මෙන සිදුරෙකි නුදු ඝට සිවුරු සිඛයෙහි කියූ අනිකක් හට දීමෙන් යන ආදි අට කරුණෙනිදු පය ඉවන් බිඳේ"

1 අනුනට දීමෙන්ද, 2 පැහැර ගැන්මෙන් ද, 3 විශ්වාසයෙන් ගැන්මෙන් ද, 4 **ගිහිවීමෙන්** 5 ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයෙන් ද 6 කාලක්‍රියා කිරීමෙන් ද, 7 ලිඛිත පරිවර්තනයෙන් ද, 8 පවවු ඛ්ගරණයෙන් ද, 9 සිදුරු වීමෙන් ද යන මේ කරුණු නවයෙන් චීවරාධිෂ්ඨාන විජහනය වේ. මෙයින් පළමු කරුණු අටෙන් සියලු

2018.02.17 Pāḷigāmaṭṭhakathā Nā Uyyana Free Distribution

සිවුරු අධිෂ්ඨානය හරි. සිදුරක් වීමෙන් අධිෂ්ඨානය භරනුයේ තුන්සිවුරු පමණකි. එය ද සුළඟිල්ලෙහි නීඝපිටක් පමණ සිදුරක් වීමෙනි. "තත්ථ පුරිමෙහි අට්ඨහි සබ්බ චීවරානි අධිට්ඨානං විජහන්ති. ඡිද්දභාවෙන පන තිචීවරසෙස ච සබ්බට්ඨකථාසු අධිට්ඨාන විජහනං වුත්තං තඤ්ච නඛ පිට්ඨිප්පමාණෙනෙව ඡිද්දෙන" ස;. පා: 512[13]–465[29] කු: සි: ස: 217 සි: ව: වී: 334 373[1] වි: වි: 565–747 -චිනිච්ඡය (නා)= අධිෂ්ඨාන විනිශ්චය. චීවරාධිෂ්ඨානය සහ පාත්‍රාධිෂ්ඨානය කිරීමේ ක්‍රමය. අධිෂ්ඨානුපග චීවර ඝන්ගෙන් හෙවත් තුන්සිවුර, වැසිසළුව, නිසීදනය, පසතුරුණ, කණ්ඩු පටිච්ඡාදනය, මුඛ පුඤ්ඡනය, පරිකඛාරචොළය, යන මෙයින් තුන් සිවුර ඉවත්නහු විසින් රඳ, කප් කින්දු නැඹු, පමණින් යුත් සිවුරුම් ඉටිය යුතුය.

උඩත් පිරිසෙසින් සුගත්සිවුරට වඩා දිග පුළුලින් අඩුවූ සඟළ සිවුර සහ උතුරු සඟළ දිගින් මිටිපස්රියනක් හෙවත් සිවුරියන් හා එක් මිටිරියනක් ද, පුළුලින් මිටි තුන් රියනක් හෙවත් දෙරියන් එක් මිටිරියනක් ද වුයේ වටී. අන්තරවාසකය ද, දිගින් මිටිපස්රියන් හා පුළුලින් දෙරියන් වියත්වූයේ වටනේය. මේ කී පමණට වැඩිවූයේ හෝ අඩුවූයේ පරිකඛාර චොළ නාමයෙන් ඉවත්නේය. "දෙව චීවරස්ස අධිට්ඨානා ඤාණෙන වා අධිට්ඨෙති" වාචය වා අධිට්ඨෙති යනු බැවින් කායාධිෂ්ඨානය, වාචාධිෂ්ඨානයයි චීවරාධිෂ්ඨානය දෙවැදෑරුම් වේ. සඟළ සිවුර ඉවත්නහු විසින් "ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි" යි පුරාණ සඞ්ඝාටිය ප්චුබරණය කොට නව සඟළ සිවුර අතින් ගෙන "ඉමංසඞ්ඝාටිං අධිට්ඨාමි" සිතින් මෙනෙහිකොට මදක් සොලවා අතින් පිරිමදිමින් ඉටිය යුතුය. මේ කායාධිෂ්ඨානයයි. වචනයෙන් ඉටත් සඳ සඟළ සිවුර අත්පස නම් "ඉමංසඞ්ඝාටිං අධිට්ඨාමි" යි කියාද, අත්පස නොව දෙළොස් රියනින් දුර හෝ ඇතුළු ගබ හෝ පහ මතුයෙහි හෝ සාමන්ත විහාරයෙහි හෝ වේ නම් තුබූ තැන් සලකා 'එතංසඞ්ඝාටිංඅධිට්ඨාමි" යි වාග්භෙද කරමින් ඉටිය යුතු. උත්තරාසඞ්ගය සහ අන්තර වාසකාධිෂ්ඨානයද මෙසේමැයි. නම් පමණක් වෙනසි. අධිෂ්ඨාන කළයුතු සෙසු සිවුරු අතර වැසිසළුව වැසි සාරම්ම පමණක් ද කණ්ඩුපටිච්ඡාදනය රොගය සුවවන තුරු පමණක් ද, ඉටා ඉන් පසු විකප්පනය කළයුතුය. නිසීදන, පච්චත්ථරණ, මුඛපුඤ්ඡන, පරිකඛාර චොළ යන මෙය ද ඉටිය යුත්තේය. "පරිකඛාර චොළෙ ගණනා නත්ථි යත්තකං ඉච්ඡති තත්තකං අධිට්ඨාතබ්බමෙව" යනු කියූ බැවින් පරිකඛාර චොළගණනක් නැත. තුන් සිවුරු වුවද පරිභොග නිසා පරිකඛාර චොළ නමින් ඉවතු හැක්කේය. එසේ ඉටිමෙහි දී අත්පස තුබූ එක සිවුරක් නම් "ඉමං චීවරං පරිකඛාර චොළං අධිට්ඨාමි" සි ද, එකකට වැඩිනම් "ඉමානි චීවරානි පරිකඛාර චොළානි අධිට්ඨාමි" සි ද, ඉටිය යුත්තේය. අත් පස නොවේ නම් "එතං" "එතානි" සි යොදා ඉටිය යුත්තේය. "එවිකාපි පරියාපණ්ණපි චීවරපච්චුද්ධාරපච්ඡිම චීවරප්පමාණං පරිකඛාර චොළන්ති අධිට්ඨාතබ්බමෙව" යනු බැවින් පාත්‍රථවික, භෙරහන් ආදියද පරිකඛාර චොළ නාමයෙන් ඉටිය යුතු. රියනට වඩා අඩුවූ රෙදි කැබලි බිමෙඛාහන කොට්ට ගුදිරි කොදු පලස් පල්ලැක්කි ආදිය අධිෂ්ඨාන කොට කළ ද වරදක් නැත්තේය. මේ චීවරාධිෂ්ඨානය පිළිබඳ සංක්ෂෙප විනිශ්චයයි.

පාත්‍රාධිෂ්ඨානයෙහිදී නව වැදෑරුම් පාත්‍රයන් අතුරෙන් අපාත්‍ර සඞ්ඛ්‍යාවට ගැණෙන උක්කට්ඨකථ පාත්‍රය සහ ඔමකොමක පාත්‍රය හැර සෙසු පාත්‍ර සත අධිෂ්ඨාන කිරීමට සුදුසුය එහි අයොමය පාත්‍රය පඤ්චපාකයකින්ද, මැටිපාත්‍රය ත්‍රිපාකයකින් ද පිසන ලද්දේ අධිට්ඨානුපග වේ. චීවරාධිෂ්ඨානයෙහි කී පරිදි පුරාණ පාත්‍රය ඉදින් හමුයෙහි නම් "ඉමං පත්තං පච්චුද්ධරාමි" යි කියා හෝ නො හමුයෙහි නම් "එතං පත්තං පච්චුද්ධරාමි" යි කියා ප්‍රච්චුබරණය කොට නව පාත්‍රය අතින් පිරිමැද "ඉමං පත්තං අධිට්ඨාමි" යි කාය විකාරයෙන් කයින් හෝ වාග් භෙද කොට වචනයෙන් ඉටිය යුතුය. ඉදින් අත්පස නොවේ නම් "එතං පත්තං අධිට්ඨාමි" යි අධිෂ්ඨාන කළ යුතුය. ඉවත්නහු විසින් තමා හුදෙකලාව හෝ මෙරමා හමුයෙහි හෝ ඉවතු වටී. යම් කිසි භික්ෂුවක් පාත්‍ර දශයක් හෝ වැඩි ගණනක් හෝ ලැබ ඒ සියල්ල තමන් පරිභොග කරනු කැමැති නම් ඒ සියලුම පාත්‍ර එක ද

2018-02-17 Pāḷāṇārami - Na Uyana Free Distribution

අධිෂ්ඨාන නොකළ යුතුය. එක් පාත්‍රයක් ඉවා දෙවන දෑ එය පච්චුබරණය කොට අන් පාත්‍රයක් ඉවිය යුතුය මේ ක්‍රමයෙන් ඒ සියලුම පාත්‍ර අවුරුදු සියයක් නමුදු පරිභොග කළ හැක්කේය. මේ පාත්‍රාධිෂ්ඨානය පිළිබඳ සංක්ෂේප විනිශ්චයයි. සා: පා: 462¹-511²⁹ සි: ව: වි: 31³⁶-37¹⁰ කං: වි: 54⁷ වි: වි: 553-742 කං: වි: 54⁷-73³⁵ **-විරොධන** (නා) (වි + √යුජ + ණ)= අධිෂ්ඨාන විරොධය. ඉවතින් වෙන්වීම කු: සි: සා: 22⁹ (අධිට්ඨාන විජහන බලනු)

අධිපඤ්ඤා (නා) (ප + √ඤ + අ)= අධිප්‍රඥව. ලොකොත්තර මාර්ග භාවනාව. "අත්ථිදින්නං අත්ථිසිට්ඨං" යනාදීන් පවත්නා කම්මස්සකතා ඤාණය පඤ්ඤා නම් වෙයි. **අනිත්‍ය දුඃඛ අනාත්ම** වශයෙන් පිරිසිඳීම කරන විදර්ශනා ඥානය අධිප්‍රඥා නම් වන්නීය. මාර්ග ඵල ප්‍රඥාව ඉතුදු අධිප්‍රඥා වෙයි. පාරා: පා: 2²³⁴ සා: පා: 174¹⁰-²³ 741³³ කු: සි: සා: 1²⁰ සා: දී: 445² සා: වි: 291¹⁷

අධිපතති (ක්‍රි)= වහා ඉක්මවයි. ඉක්මනින් වැටෙයි. **අතී—පති—වති—පතති**—අනා—**පතිස්සති** පු: ක්‍රි: —**පතිත්වා** සා: මී: —**පතෙත්‍ය** වහා වැටෙන්නේය.

අධිපාතිමොක්ඛ (නා)= ශ්‍රේෂ්ඨ වූ ප්‍රාති මොක්ෂය. (පාතිමොක්ඛ බලනු)

අධිප්පාය (නා) [සං. අභිප්‍රාය]= අදහස. ඒ පිළිබඳ සිත. කැමැත්ත. **-භෙද** (නා)= අභිප්‍රාය භෙදය. නොයෙකුත් අදහස්. පඨම දුට්ඨ දොස සඞ්ඝාදිසෙස ශික්ෂාපද **වණ්ණනා**වෙහි සඳහන් අභිප්‍රායයන්. චංචනාධිප්පාය, අඤ්ඤා සාධිප්පාය, කම්මාධිප්පාය, වුට්ඨානාධිප්පාය, උපොසථ පවාරණට්ඨපනාධිප්පාය, අනුච්ඡවි නාධිප්පාය, ඛණ්ඩකථාධිප්පාය, යනුවෙන් අනෙක විධ වූ අභිප්‍රායයන් **කං**: වි: 42¹⁴ **සා**: පා: 429²⁷

අධිප්පෙත (නා) [සං. අභිප්‍රේත]= අදහස් කළ. අදහස් කරන ලද

අධිභාසති (ක්‍රි)= කියයි. අතී:- භාසි-**භාසිත්ථ**. වති:- **භාසති** අනා:- **භාසිස්සති**= කියන්නේය. මතු පවසයි.

අධිමත්ත (නා) [සං. අධිමාත්‍ර]= 1 පමණට වැඩි පමණ ඉක්මවූ. 2 ඉතා ඔලාරික. 3 ඉතා අධික. **වි: වි: ටී:** 1796 **මහා: පා** 52¹-92²⁷ **-වේදනා** (නා)= අධිමාත්‍ර වේදනාව. අධික වේදනාව. **වි: ම:** 65²⁶

අධිමන (නා)= අධිමනස මහා කරුණාදීන් යුක්ත වූ චිත්තය. **මහා:පා:** 23¹⁴ **ච:ච:ටී:** 364¹⁷

අධිමාන (නා)= අධිමානය. මා විසින් චතුරාර්ය සත්‍යය අවබෝධ කරණ ලදී යන මානය. "අධිමාන නම් සුපරිශුද්ධ ශීල සම්පන්න පිහිටා සමාධි භාවනා රූපාරූප සම්පත්ති විසීව පැවතුව හට හෝ විදර්ශනාහි යුක්තව සෝපක්ලෙශ උදයව්‍යය ඥන ලදුවහට හෝ මේ ධර්ම මා විසින් අධිගතයයි දැඩිව උපදනා මනි" කු: සි: සා: 1¹⁴ කං:වි: 32³¹ පාරා පා: 91³¹ සා:පා 348⁴ ප්‍රා: පු: **සා**: 1¹¹

අධිමාස (නා)= අධික මාසය. විරාඡාසය. මල මාසය. මෙම වෘෂභ මිථුන කටක සිංහ කන්‍යා යන රාශි ෂට්කයෙන් යම් රාශියක අමාවක් දෙකක් යෙදීමෙන් ලැබෙන වැඩි මාසය. සූර්‍ය්‍ය මාස දෙළසක් තුළ චාන්ද්‍රමාස තෙළෙසක් වීමෙන් අධික වන මාසය. ජ්‍යොතිශාස්ත්‍ර යෙහි මාස විභාගය චාන්ද්‍ර මාස සෞර මාස වශයෙන් දෙවැදෑරුම් වේ. චන්ද්‍රයා රාශි දෙළස ඉක්මවා ගියකල චාන්ද්‍රමාසයි. සූර්‍ය්‍යා එක රාශියක් ඉක්මවූ කල සෞර මාසයි. එහි චාන්ද්‍රමාසය අමාන්ත පූර්ණිමාන්ත වශයෙන් දෙවැදෑරුම් වේ. පුර පැළවිය පටන් අමාවක දක්වා පවත්නා මාසය අමාන්තයි අවපැළවිය පටන් පුරපසළොස්වක දක්වා පවත්නා මාසය පූර්ණිමාන්තයි. චාන්ද්‍රමාසයෙන් මාස 12 ක්වූ වර්ෂයට දින 354 කි සෞරමාසයෙන් මාස 12 ක්වූ වර්ෂයට දින 365 කි. යම් ප්‍රකෘති සම කාල යෙක්හි අමාවකාන්තයත් රවි සංක්‍රාන්තියත් එක් දිනෙකින් පටන් ගැනීමෙන් ක්‍රමයෙන් සෞරමාස 32 දින 15 පැ 31 විනාඩි 28 තත් පර 47 තෙවියේද එකල එක් චාන්ද්‍රමාසයක් අධික වේ ඒ මාසයත් සමග ඒ තුන් වැනි වර්ෂයෙහි මාස 13ක්වේ. ඒ අධිමාසය ඒ වර්ෂයේ විරාඡාස (=ඇසළ දෙකක්) වශයෙන් යෙදේ. මෙය ශාස්ත්‍රීය ව්‍යවහාරයෙහි වසසුඛකඛ්ඛන නාමයෙන් ද; ලෞකික ව්‍යවහාරයෙහි විරාඡාස- අධිමාස-යනාදි නාමයන්ගෙන් ද ප්‍රකට වේ. "රාජානෝ තතියෙ තතියෙ වස්සෙ වස්සං

උක්කඩ්ඨනාති" යනු අර්ථකථා පාඨ බැවින් "තතියෙ තතියෙ" යන සඞ්ඛ්‍යාපූරණ පදයන් භාජකස්ථානයෙහි තබා බුඛවශී සඞ්ඛ්‍යාව තුන්ගුණන් බෙදූ කල ශූන්‍යස්ථානයෙහි "තතියෙ තතියෙ වෙස්සෝ" යනු හා එකඟව අධිෂ්ඨානය වේ. මහා: පා: 155[10] සා: පා: 797[5] වි: ලි: 281[28] - 282[31] - 285[11] වංසා: සා: 5[34]

අධිමුච්චි (ක්‍රි) (අධි + √මුච + ඊ) 1 අධිෂ්ඨාන කෙළේය. ඉටියා. 1 ඇදහියා. වර්ත—මුච්චති. භවි -මුච්චිස්සා තුං-මුච්චිතුං. පාරා: පා. 27[36] ධ: අ: ගැ: 187[9]-219[12] සා: වි: 147[21] වි: ව: ටී: 187[13]

අධිමුත්තතා (නා)= පිළිවිදීම. අවබොධය: වි: ව: ටී: 427[33]

අධිමුත්තති (නා)= අධිමුක්තිය. අනිරුවිය. කැමැත්ත සන්‍තුහණ. පූර්ව්‍යජාතිවල කළ පුරුද්ද නිසා පවත්නා කරුණු කැමැත්ත. ගීත-ප්‍රණීත වශයෙන් දෙවැදෑරුම් අදහස්. "අධිමුත්තිනාම සත්ත්‍වානං පුබ්බ පරිචරිය වසෙන අභිරුචි. සා දුවිධා ගීතපණීත භෙදෙන" 17[26] සා: ද්‍රී: 64[10]-175[14] වි: ව: ටී: 17[26]-46[28]

අධිමොක්ඛ (නා= අධිමෝක්ෂය· අරමුණෙහි සිත පිහිටුවීම. සන්‍තුහණ කිරීම. සා: වි:147[19] අභි: සා: සා: 4[31]

අධිවචන (නා)- නම, නාමානන්තරය. සංඥාව. කා: වි: පි: 36[5]

අධිවත්ථ (නා) (අධි + √වස + ක්ත)= අධිපතිව වසන. "අධිවත්ථ දෙවතා,"අධිවැ වසන දෙව්" ධ: අ: ගැ: 175[5]

අධිවාස (නා) (අධි + √වස + ණ)= 1 ඉවසීම. 2 පිළිගැනීම.

අධිවාසන (නා)= ඉවසීම. පිළිගැණීම. මහා:පා: 16[7] -ඛන්ති (නා) (√ඛම + ති)= අධිවාසන ක්ෂාන්තිය, නුවණින් සලකමින් දුක් ඉවසීම. සා: පා: 359[18]-ජාතික (නා) (ජාති + ක)= ඉවසන සුභාව ඇති. ඉවසන සුලු. ම: පා: සා: 280[40]

අධිවාසෙති (ක්‍රි)= ඉවසයි. පිළිගණියි. අති: -වාසෙසි. වර්ත: -වාසෙති අනා: -වාසෙස්සති පරි: -වාසෙතු සම්: -වාසෙය්‍ය පූර: ක්‍රි: -වාසෙසිවා. තුං -වාසෙතුං. ව: කෘ: -වාසෙන්තා භා: නා: -වාසනං=ඉවසීම. පාරා: පා: 10[10]-11 මහා: පා: 16[7]. 264[28]-30

අධිවුත්තිපද (නා)= දෙවෙනි පද. දෘෂ්ටීන් ප්‍රකාශ කරන පද. සූ: වි: 74[13] පා: සූ: 11[21] (4)

අධිසීල (නා)= අධිශීලය. උත්තම ශීලය. ශ්‍රේෂ්ඨ ශීලය. උපසම්පදා ශීලය. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය. පඤ්චඞ්ග දශාඞ්ග ශීල යන මොහු ශීලයම වෙයි. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය වූකලී අධිශීලය නම් වෙයි. ඉහතදී මංගීඵල සම්ප්‍රයුක්ත ශීලයම අධිශීලය නම් වෙයි'— "අධිසීල නම් ප්‍රධාන වශයෙන් මාගීඵල සිත්වල යෙදෙන ශීලයයි. හෙවත් සම්මාවාචා සම්මා කම්මන්ත සම්මා ආජීව යන ත්‍රිවිධවූ විරති චෛතසිකය වේ." කු: සි: සා: 1[15] සා: පා: 741[22] ම: පා: සා: 527[8] මනෝ: පූ: 460[16] -විපත්ති (නා)=අධිශීල විපත්තිය. පාරාජිකා පත්තියට සහ සඞ්ඝාදිශේෂාපත්තියට පැමිණීම. "පාරාජිකඤ්ච සඞ්ඝාදිසෙසඤ්ච ආපත්තෝ අධිසීල -විපත්තෝ නාම" මහා:පා: 71[24]සා: පා: 739[18] 979[18] -සික්ඛා (නා) (√සික්ඛ + අ)= අධිශීල ශික්ෂාව. අධිශීලයෙහි හික්මීම. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙහි හික්මීම. "අධිසීල සික්ඛාති අධිකං උත්තමං සීලන්ති=අධිසීලං. අධිසීලඤ්ච තං සික්ඛිතබ්බතො සික්ඛාවාති= අධිසීල සික්ඛා." සා: පා: 173[18] කු: සි: සා: 1[15] වි: ව: ටී: 1[110][35]

අඛුනා (නි)= අලුත. "අඛුනානතෝ ඉමං ධම්ම විනයං" මහා: පා: 38[23]

අඞ්ඛ (නා)= යට. යටි පෙදෙස. අධඃ භාගය සා:වි: 266 -ගමවාත (නා)= යට බස්නා වාතය. මල මූත්‍ර පිටකරන යට බස්නා වාතය. වි: මා: සා: 858[15] -ගාමිනී (නා)= යටි හංබලා යන. ගඟබස්නාපෙදෙසට යන. පාචි: පා:68[34]සා: පා: 593[19] -ජානුමණ්ඩල (නා)= දණ මඬලෙන් යටි පෙදෙස. භික්ෂුණී විභඞ්ගයෙහි ප්‍රථම පාරාජික ශික්ෂාපදයෙහි "අඞ්ඛජාණු මණ්ඩල" සී වැලමිටින් යටි පෙදෙස ද ගන්නා ලදී. පාරා: පා: 145[33] සා: පා: 391[33] 671[25] ක: වි: 160[5] වි:ම: 272[28] -ත (අඩොත) (නා)= නොසේදූ, ධොවනය නොකළ වි:වි: 1332 -පාද (නා)= නොසේදූ පා. පාද ධොවනය නොකළ. -පණක (නා) (√ඵප + යු=අන + ක)= පා සෝදන තැන තබන පුවරුකඩ. වි: වි: ටී: 449[9] -ගාමි (නා) [සං නාමි]= නැබින් යට. නැබ මඬලෙන් යටි පෙදෙස. සා: පා: 1035[29] පරි: පා: 284[26] -මුඛ (නා)=යටිකුරු මුහුණු ඇතිව.

බීම බලාගෙන -විරෙවන (නා)= අඩොහාග යෙන් මල පහකරවීම. අඩොවිරෙවනය. දී: නි: B 26[17] -සිර (නා)= යටිකුරු වූ හිස් ඇති. බීම බල්වා. -සිස (නා)= හිස පහතට දැමූ. යටි කුරුවූ හිස ඇති.

අනාගාමික (නා) (න + අනාරික) (අගාර + ණික = ශාසනය. පැවිද්ද. (අනගාරිය බලනු) -මුනි (නා) [සං මුනි]= පැවිදිවූ ආර්‍යයෝ. සවැදැරුම් මුනිවරයන්ගෙන් එක් කොටසක්. "අනනාරික මුනිහු නම් ප්‍රව්‍රජ්‍යායැ සිටි ආර්‍යයෝයි" ජා: අ: ගැ: 238[5]

අනාගාරිය (නා) (න + අගාරිය) (අගාර + ණික; ණික=ඉය)= පැවිද්ද ශාසනය, බුදුබ ශාසනය. ගෘහජීවිතයට හිතවූ කෑම් වණික් ආදිය අනාරිය නම්. පැවිද්දෙහි එබන්දක් නැති බැවින් පැවිද්ද අනගාරිය නම්. 'එත්ථ ච යසමා අගාරස්ස හිතං කයි වණිජ්ජාදි කම්මං අගාරියන්ති වුච්චති. තස්මා පබ්බජ්ජාය නත්ථි තසමා පබ්බජ්ජා අනගාරියන්ති වුච්චති" සැ:පා :139[24] පාරා: පා: 14[9] මි: පා: සැ: 33[19] චි: ච්: ටී: 359[6] -චිනය (නා)= භික්ෂු ශීලය සපජාපත්තිසහිත යන්ට නොපැමිණීම. චතුපාරිසුද්ධි ශීලය 'දෙවැදැරුම් විනයයෙන් එකක් 'අනගාරිය විනයො ච සත්තා පත්තිකඛ්ඛෙ අනාපජ්ජනං පෙ-චතුපාරිසුද්ධි සීලංවා අනගාරිය විනයෙ'' සු: නි:අ: 255[28] (අගාරිය විනය බලනු) -සිප්ප (නා) [සං.ශිල්ප]= භික්ෂූන්ට සුදුසු ශිල්ප. සිවුරු නූල් ගැසීම, මැහීම ආදී ශ්‍රමණ පරිෂ්කාරයන් සකස් කිරීම. නාථ කරණ ධම්. 'ඉධ භික්ඛවෙ භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිඞ්කරණීයානි තත්ථ දක්ඛො හොති" යනාදීන් ඒ ඒ නැන වණිනා කළ භික්ෂුන්ට සුදුසු ශිල්ප සු, නි: අ: 255[28] (අගාරිය සිප්ප බලනු)

අනාඝ (නා) (න + අඝ)= කෙළවරක් නැති. සැ: පා: 8861[7]

අනාගතිපච්චික්ඛ (නා) (න + අගතිපච්චික) (√පච + ත; ත=ක; ව=ච) (පච්චක + ණික)= ගින් මෙන් පිසූ දෑය ප්‍රතික්ෂේප කරන කොළ ගෙඩි ආදියෙන්ම යැපෙන එක් තාපස නිකායක්. අටවැදැරුම් තාපසයන්ගෙන් එක් කොටසක් සු: නි: අ: 239[10] (අට්ඨවිධ තාපස බලනු)

අනඞ්ගණ (නා) (න + අඞ්ගණ)(√අඤ්ජ් + ණ)= රාගාදි කෙලෙස් රහිත අඞ්ගණ නම් රාගාදි යයි. එය නැත්තේ අනඞ්ගණ නම්. සිත අපිරිසුදු කරණ හෙයින් රාගාදීහු අඞ්ගණ යෝ නම් වෙත්. පාරා: පා: 4[16] සා පා: 102[12]

අනච්චෙක වීවර (නා)= (න + අච්චෙක වීවර)= අච්චෙක චීවර නොවූ. ආත්‍යයික චීවර නොවන. අච්චෙක චීවරය සමාන වූ. පාරා: පා: 290[7] සැ: පා: 530[33] (අච්චෙක චීවර බලනු)

අනවජ්ජ (නා) (අනු + අවජ්ජ)= අතිශයින් ආශ්චර්‍යවීවූ. නැවත නැවත පුදුම උපදවන. "ඉමා අනවජ්ජියා ගාථායො පටිහංසු" මහා:පා 4[31] සැ:පා: 721[7] වි: ච්: ටී: 597 මි: පා: සැ: 17[20]

අනජ්ඣාපත්ති (නා)(න + අජ්ඣාපත්ති)= ඇවැත් වලට නො පැමිණි. ඇවැත්වලට පැමිණීමට ප්‍රතිඝක්ෂ වූ. පරි: පා: 12[18] සැ: පා: 969[3]

අනජ්ඣාපන්න (නා) (න + අජ්ඣාපන්න) ඇවැතට නො පැමිණි. සැ: පා: 772[26] මහා: පා: 113[18]

අනජ්ඣිට්ඨ (නා) (න √අජ්ඣිට්ඨ) (අධි + √ඉස + ත)= අණ නොකළ. යාචඤ්ඤ නොකළ. සඞ්ඝයා විසින් සම්මත නොකළ. "න භික්ඛවෙ සඞ්ඝ මජ්ඣෙ අනජ්ඣිට්ඨෙන ධම්මො භාසිතබ්බො" මහා: පා: 122[3] සැ:පා: 789[26] (අජ්ඣිට්ඨ බලනු)

අනජ්ඣොහර (නා) (න+අජ්ඣොහර)= නොගිලිය හැකි· අනුභව නොකටහැකි. ක: ච්: පි: 56[24] (අජ්ඣොහර බලනු)

අනඤ්ඤ (නා) (න + අඤ්ඤ)= අනෙකක් නොවූ. එයම -ථා (නි)= අන්‍යපරිද්දෙකින් නොවූ. වෙනස් නොවූ. සැ: පා: 997[27] -ථාභාව (නා)= අන්‍යථාභාවී නොවූ ජාති ජරාමරණයන්ගේ අභාවයෙන් වෙනසකට නො පැමිණෙන, නිර්‍වාණය. -නෙය්‍ය (නා) (√නී+ණ්‍ය)= අන් මඟකින් නොදත හැකි. තමන් විසින් වඩන ලද මාර්ගයෙන්ම පැමිණිය යුතු. අන්‍ය කිසි මඟකින් අවබොධ කළ නො හැකි. මහා: පා: 3[24] සැ: පා; 726[26] මි: පා: සැ: 120[31] -පාවිනති (නා)= එනම් පවිති ඇවැත් සතර. "එතදෙව පඤ්චයං කත්වා අනඤ්ඤං පාවිත්තියං" යනුවෙන් පණවා වදළ පවිති ඇවැත්, 1 යො පන භික්ඛු සඞ්ඝිකෙ

විහාරෙ ජාතං පුබ්බූපගතං භික්ඛුං අනුපඛජ්ජ සෙය්‍යං කපෙපය්‍ය යස්ස සම්බාධො භවිස්සති සොපකකමිස්සතීති එතදෙව පච්චයං කරිත්වා ''අනඤ්ඤං පාචිත්තිය''ං- 2 ''යො පන භික්ඛු භික්ඛු එවං වදෙය්‍ය එහාවුසො ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමිති තස්ස දුපෙත්වා වා අදුපෙත්වා වා උය්‍යොජෙය්‍ය ගච්ඡාවුසො න මෙ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා පාසුහොතීති එත දෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තිය 3 යො පන භික්ඛු භික්ඛුස්ස සංවිච්ච කුක්කුච්චා උපපාදෙය්‍ය ඉතිස්ස මුහුත්තම්පි අඵාසු භවිස්සතීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තිය- 4 යො පන භික්ඛු භික්ඛූනං භණ්ඩන ජාතානං කලහජාතානං විවාදුපන්නානං උපස්සුතිං තිට්ඨෙය්‍ය ඉං ඉමෙ භණිස්සන්ති සොස්සාමීති එතදෙව පච්චයං කරිත්වා අන ඤ්ඤං පාචිත්තිය'ං'' යන පළිති ඇවැත් සතර. පරි: පා: 175[37] ස: පා: 985[4]

අනඤ්ඤූපදෙස (නා) (න + අඤ්ඤූපදෙස) (ප + √දිස + ණ) [සං. ප්‍රදෙශ]= අන්‍ය ක්‍රමයකින් නොව. පසිඳ කථා නැතිව. ඉඳුරා. කෙළින්ම. එතෙරි මනුෂ්‍ය ධම් පාරාජිකා පන්නිසෙහි අඹ රාසින් එකක්. කු: සි: ස: 8[26] ක: ව: පි: 60[8] ක: ව: 339 - 83[13] ව: ව: 311 (අඤ්ඤත්‍ර පදෙස බලනු)

අනඤ්ඤෙය (පු: ස්ත්‍රී:) (න + අඤ්ඤෙය) (ඇ + √ඤා=ය)= නොදන. දැනීමක් නැතිව ස: පා: 680[15]

අනට්ඨ (නා) (න + නට්ඨ) (√නස +; ස + ත= ඨ)= නොනටුවාවූ. නැති නොවූ. පැහැර නොගත්. ස: පා 463[13] පාරා: පා: 230[18] **-කායප්පස්සද්ධ** (නා)= නොනටුවාවූ කාය ප්‍රසාදය. සබ්‍රි නිමිත්තයෙහි හටගත් නොනටුවාවූ කායප්‍රසාදය ඇති වම්මිලයක හෝ සම්මොඩොලෙක සවකිය අඛණ්ඩජානය ප්‍රවෙණ කරන භික්ෂුවට පරිජි වේ. ''කාය ප්‍රසාදය වනාහි කම්ජ තෙජෝ ධාතුව පිහිටියාවූ සථානය ද, කෙණාග්‍ර ලොමාග්‍ර නඛාග්‍ර ශුෂ්‍රතා වම්මීන් ද, හැර අවශෂ සකල ශරීරයෙහි ව්‍යාප්තව පවත්නේ යි'' අ: ස: ස: 153[8] ක: ව: 2[17] ස: පා: 184[18]

අනණ (නා) (න + අණ) [සං. අනෘණ > පා. අනණ)= ණය නැති. උපසම්පදුපෙක්ඛක පුද්ගලයාගේ තෙළෙස් අන්තරායකර ධම්යන් නෙන් එකක්. මහා: පා: 105[1] ම: පා: ස: 22[14] - 31[27] (සත්‍රී: ලි: **අනණා**) චු: පා: 414[32]

අනතික්කම (නා) (න + අතික්කම) (අති + √කම + අ)= නො ඉක්මීම. **-නිය** (නා)= නොඉක්මිය යුතු. ස: පා: 580[18]

අනතිරිත්ත (නා) (න + අතිරිත්ත) [සං. අතිරික්ත > පා. අතිරිත්ත > සිං. අසිරිත්]= 1 අතිරික්ත නොවූ. අධික නොවූ. 2 කැප නොකළ. භොජන වර්ගයෙහි ප්‍රථම විකෘති ප්‍රවාරණ ශික්ෂාපදයන්හි සඳහන් භොජනය. 1 කපපිය කත 2 පටිග්ගහීත කත 3 උච්චාරිත කත 4 හත්ථපාසෙ සිතෙන කත 5 භුඤ්ජාවිනා කත 6 භුඤ්ජාවිනා පවාරිතෙන කත 7 අලමෙතං සබ්බන්ති වුත්තෙන කත යන සත් වැදෑරුම් විනය කර්මයන්ගෙන් කැප නොකරන ලද්දේ හෝ ගිලන්හට අධික නොවූයේ හෝ **අනතිරිත්ත** නම්. ''ඉමෙහි පන සත්තහි විනය කම්මෙහි කාරෙහි යං අතිරිත්තං කපපියං අකතං, යඤ්ච පන න ගිලානාතිරිත්තං තදුභයම්පි අනතිරිත්තං'' එය පදභාජනයෙහි ''අකපපිය කතං හොති -පෙ= න ගිලානාතිරිත්තං හොති එතං අනතිරිත්තං නාම'' යනුවෙන් දක්වන ලදී. එහි 1 **අකපපිය කත** නම්; අකැප දැය කැප කිරීමයි. එනම්; 1 නඛ්‍ය 2 අගනිය 3 සපය 4 නිබ්බට්ට බීජය 5 අබීජය යන පස් සමණ කැපයෙන් කැප නොකළ දෙය ද, අකැප මස් හා අකැප බොජුන් ද යන මේ සියල්ල අකපපිය නම්. ඒ අකැප දැය ''අලමෙතං සබ්බං''යි මෙසේ අතිරිත්ත හෙවත් කැප කරන ලද්දේ අකපපිය කත නම්. 2 **අපටිග්ගහිත කත** නම්; භික්ෂුව විසින් නොපිළිගන්නා ලද්දම් ''අලමෙතං සබ්බං''යි මෙසේ අතිරිත්ත හෙවත් කැප කරන ලද්දේයි, 3 **අනුච්චාරිත කත** නම්; කැප කරන්නට පැමිණි භික්ෂුව විසින් මඳක් මෑත් නොකොට හෝ ඒ දිගට නොනමා කැප කරන ලද්දයි. 4 **අහත්ථපාසෙ කත** නම්; කැප කරන්නට පැමිණිය හුනේ අත්පසින් පිටත සිරියකු විසින් කැප කරවන ලද්දයි. 5 **අභුඤ්ජාවිනා කත** නම්; පවාරණ පහොනක භොජනය නොවැළඳූ

Paññāpārami - Na Uyana Free Distribution

වහු විසින් කැප කරන ලද්දේයි. 6 **භුත්තා විනා පවාරිතෙන ආසනා වුට්ඨිතෙන කත** නම්; පවාරණ පහොනක හොජනය වළඳූ අසුනෙන් නැගී ඊටියහු විසින් කැප කරන ලද්දේයි. 7 **අලමේතං සබ්බන්ති අවුත්ත** නම්; වාග්හෙද කොට ම මෙසේ නො කියන ලද්දේයි. **න ගිලානා තිරිත්තය** නම්; ගිලානා තිරිත්ත නො වූ හොජන යයි. ගිලන්හුගේ භුක්තාවශෙෂය පමණක් ම ගිලානාතිරිත්ත නො වේ. අද හෝ හෙට හෝ කැමැති දවසක වළඳන්නේ යයි ගිලනහු වෙනුවෙන් ගෙණ එන ලද්ද ද ගිලානාතිරිත්තය වේ. .කැ: වි: 1084 සා: ම: 14416 පාචි: පා: 841 – 8527 සා: පා: 61021 කැ: වි: පි: 8325 වි: වි: 1308 ප්‍රා: පු: සා: 6726 සි: ව: වි: 5128 (අනතිරිත්තක යි ද දක්නේය) (අතිරිත්ත සහ අකපපිය බලනු) **-නිමන්තණ** (නා) (නි + √මන්ත + ණ) [සං. **නිමන්ත්‍රණ**]= එනම් ශික්ෂාපද දෙක. 1 යො පන භික්ඛු භුත්තාවී පවාරිතො අනතිරිත්තං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං" – 2 යො පන භික්ඛු නිමන්තිතො සහත්‍ථා සමා නො සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං තත්‍රායං සමයෝ චීවරදාන සමයෝ චීවරකාර සමයෝ අයං තත්‍ථ සමයෝ" යන ශික්ෂාපද දෙක. සා: පා: 9664 පරි: පා: 12699 **-පච්චය** (නා) පති + අය) [සං. **ප්‍රත්‍යය**]= අනතිරික්ත ප්‍රත්‍යය **අනතිරික්ත** හෙතුව කැ: වි: 11034 කැ: වි: පි: 8527 **-පමාණ** (නා)= ප්‍රමාණයට වඩා අධික නොවූ .කියන ලද **පමණට** වඩා නො වැඩි. කැ: වි: 5434 කැ: වි: පි: 4432 **-සඤ්ඤි** (නා)= අනතිරික්තය යන සංඥා ඇති. **අතිරික්ත** හොජනයෙහි **අනතිරික්තය** යන හැඟීම ඇති. පාචි: පා: 8424

අනතිසාර (නා) (න + අතිසාර) (අති + √සර + ණ)= **නිදොස්, නිර්දෝෂ.** වරදක් නැති. මහා: පා: 5232 ම: ඡ: සා: 19637 සා: පා: 97616

අනත්ත (නා) (න + අත්ත)= අනාත්මය., ආත්ම යක් නැත. සා: පා: 06111 **-මන** (නා)= නො සතුටු වූ සිත. නම වසඟයෙහි නො පවත්නා **සිත.** ප්‍රීතියෙන් හා සැපයෙන් නො තහවුරු වූ සිත. පාරා: පා: 19222 සා: පා: 4206

අනත්ථ (නා) (න + අත්ථ)= 1 අනර්ථය. අවැඩ. පිරිහීම. 2 අර්ථ හඬහය, **තේරුමක් නැති.** අර්ථ ශූන්‍ය වි: වි: වි: 50527 සා: පා: 85339–8596 චූ: පා: 3830 (අනත්ථක යි ද දක්නේය) **-ත** (නා)= න + අත්ථත) (ආ + √ථර + ත) **ආසන්නරණය** නො කළ නො අතුළ කඨිනය නො අතුළ වි: වි: වි. 43823 මහා: පා: 28816 **-ංකඨින** (නා)= නො අතුළ කඨිනය. සූවිසි මහා විපත්තීන්ගෙන් යුක්තව අතුළ කඨිනය. මහා: පා: 28817 සා: පා: 8238 කැ: ව: 7123 (අන්ධාර විපත්ති බලනු) **-ද** (නා)= අනර්ථදායී. අවැඩකරු. අවැඩ ගෙන දෙන. ස. පා: 85336 **-වාදී** (නා) (√වද + ණී)= අහෙතුක කථා **කරන්නා.** අවැඩ කරු වචන කියන්නා. ප: සූ: 27614 **-සංහිත** (නා)= අනර්ථයෙන් යුක්ත. අනර්ථ උපදවන. ජීවිතයට හෝ බ්‍රහ්මචර්‍යාවට අනතුරු පිණිස පවත්නා. "ලෞකික ලොකොත්තර අර්ථසිද්ධිය නොසලසන. පිරිස කැළඹෙන. චූ: පා: 39113 පරි: පා: 21536 සා: පා: 94911–10081 ප: සූ: 27621 ම: පු: 47819

අනත්ථාරුහ (නා) න + අත්ථාරුහ)= නො අතුළහු. කඨිනය නො අතුරන්නා. පරි: පා: 2297 (අත්ථාරුහ බලනු)

අනධිගත (නා) (න + අධිගත)= අවබොධ නො කළ. මාර්ග භාවනාවෙන් අවබොධ නො කළ. නොලැබ. පාරා: 9112 සා: පා: 34728

අනධිට්ඨාන (නා) (න + අධිට්ඨාන)= අධිෂ්ඨාන නොකිරීම. නො ඉටීම. කයින් හා වචන යෙන් කළ යුතු අධිෂ්ඨානය නො කිරීම. පිණ්ඩපාතික භික්ෂුවට කැප කරුණු පසෙන් එකක්. පරි: පා 17720 සා: පා 98527 වි: වි: ටී: 26234

අනධිට්ඨිත (නා) (න + අධිට්ඨිත) (අධි + √ඨා + ඉත)= නොඉටූ අධිෂ්ඨාන නො කළ. සා: පැ: 46034

අනධිමාන (නා) (න + අධිමාන)= අධිමාන රහිත. "අදිටෙයි දිටය සඤ්ඤිතාදි විසින් අධිගත ධර්‍ම ඇතේතෙම් යන අදිමන් නැති" **-ඉක** (න)= එබඳු භික්ෂුව. අදිමන් නැති මහණ. කු: සි: 63 (අධිමාන බලනු)

අනනුවජ්ජිය (නා) (න + අනුවජ්ජිය) (අනු + ජ්ව් + ණික; ණික=ඉය)= නො සුදුසු. සුදුසුකම්වලට

නො පැමිණෙන. මේහි ඡවි ශබ්දයෙන් කිය වෙනුයේ ශරීරය හෙවත් සුන්දර භාවයයි. ඒ ඒ ධර්මයන්ගේ සුන්දර භාවය හෙන නො දෙන කරුණු අනනුවජ්ජිය නම් වේ. ''නෙසං ඡවිං ජායං සුන්දරභාවං න අඤ්ඤති නානුගවජ්ජති'' සං: පා: 152[32] පාරා: පා: 18[28] (අනනුවජ්ජිකයි ද දක්නේය)

අනනුඤ්ඤාත 1 (නා) (න + අනුඤ්ඤාත) (අනු + √ඤ්ඤ + ත)= නො අනුදත්, නො පැණ වූ. අවසර නොදුන්. මහා: පා. 93[3] සං: පා: 7[51]

අනනුඤ්ඤාත 2 (නා)= එනම් ශික්ෂාපදය. ''යා පන භික්ඛූනි මාතා පිතූහි වා සාමිකෙන වා අනනුඤ්ඤාතං සික්ඛමානං වුට්ඨාපෙය්‍යපාචිත්තියං'' යනුවෙන් දක්නා මව්පියන් විසින් හෝ සවාමියා විසින් නො අනුදත් ශික්ෂාමානාව උපසපන් කරවන භික්ෂුණියට පවිති ඇවැත් නියමිත ශික්ෂාපදය, ප්‍රා:පු:ස: 50[10] **-සමුට්ඨාන** (නා)= එනම් ශික්ෂාපද: දෙවක, තුන්වන, පස්වන, සවන සමුට්ඨානයන්ගෙන් හටගන්නා ශික්ෂාපද. ආපත්ති සමුත්ථාන නෙළෙසින් එකක්. ''යා දුතිය තතිය පඤ්චම ඡට්ඨෙහි සමුට්ඨාති අයං අනනුඤ්ඤාත සමුට්ඨානා නාමාති''කැ:වි: 22[28](අඤ්ඤාන සමුට්ඨානබලනු)

අනනුබෝධ (නා) (න + අනුබෝධ) (අනු + √බුධ + ණ)= අවබෝධ නො කිරීම.

අනනුමෝදක(නා)(න + අනුමෝදක) (අනු + √මුද + ණවු=අක)= අනුමෝදන් නොවන්නා. කථිනය ඇතිරීම අනුමෝදන් නොවන භික්ෂුව, කඨිනය නො අතුරනු හැකි පුද්ගලයන් දෙදෙනාගෙන් එක් පුද්ගලයෙක්. පරි: පා: 229[10]

අනනුලෝම (නා) (න + අනුලෝම) [සං, අනුලෝම]= නුසුදුසු. අනුලෝම් නොවූ. පැවිද්දන්ට සුදුසු නොවූ, **-ඉක**=**අනනුලෝමික** (නා)= නුසුදුසු. ''අනනුවජ්ජිකතනා එවව අනනුලොම්කං.,' සං: පා: 152[38] = 511[19] පාරා: පා: 18[49] පරි: පා: 169[32]

අනනුශාස (නා) (න+අනුශාස) (අනු + √සාස + ණ)= අනුශාසනා නො කරන. ඒය + මන= අනුශාසනා නො කරන ලබන. ම: පා: ස: 150[4] (අනුසාසනා බලනු)

අනනුශ්‍රුත (නා) (න + අනුශ්‍රුත) (අනු + √ශ්‍රු + ත)= නො ඇසූ විරූ මෙයින් පෙර නො අසන ලද. මහා: පා: 16[6] ම: පා: ස: 38[21].

අනන්න (නා) (න + අන්න)= 1 අන්තයක් නැති. කෙළවරක් නැති, 2 නිර්වාණය. 2 අවකාශය. අ: ප: ස: 4[27] **-ජින** (නා)= නිර්වාණය අවබොධ කළ. පරිච්ඡේදභාව, පරිවෙඡද භාව රහිත බැවින් **නිවණ** අනන්ත නම්. එබඳු නිවණ අවබොධ කළ බැවින් බුදුහු ''අනන්ත ජින'' නම්. ජෛනයෝ ''අනන්තජින''යි **නිර්ග්‍රන්ථ** ඥාත පුත්‍රයන් හඳුන්වති. සං: පා: 103[410] වි: වි: ටී. 508[8] **-දස්සි** (නා) (√දිස + ණි; √දිස= දස්ස)= අනන්ත දර්ශී වූ. බුදුරජාණන් වහන්සේ. පරි: පා: 137[87].

අනන්තර (නා) (න + අන්තර)= අතරක් නැති. නිරන්තර. **-පච්චය** (නා) (පති + අය)= අනන්තර ප්‍රත්‍යය. සුව්සි ප්‍රත්‍යයන් ගෙන් එකක්. ''න විජ්ජති පච්චයුප්පන්නෙන සහ අනන්තරං එතස්ස පච්චයස්සාති අනන්තර පච්චයෝ'' යනු බැවින් ප්‍රත්‍යුත්පන්න ධර්මයන් අතර අතරක් නොදන්නා ප්‍රත්‍යය. අනාගත වශයෙන් අතරක් නැතිව ප්‍රත්‍යය වන ප්‍රත්‍යය. කඨිනය පිළිබඳව නම්; උදකාහරණාදි ප්‍රයොගයන් උපන් කල්ම ධොවනාදි පුවීකරණයන් පසුව උපදනා බැවින් උදකාහරණාදි ප්‍රයෝගය කඨිනවස්තුය අනාගත වශයෙන් අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මෙහි පුවීකරණ යනු. 1 ධොවන 2 විචාරණ 3 ඡේදන 4 බන්ධන 5 සිබ්බන 6 රජන 7 කප්පකරණ යන සත් වැදෑරුම් පුවී කරණ යයි. පරි: පා 230[25] ස: පා: 101[39] වි; වි: ටී: 502[21] **-හිත** (නා) (න+අන්තර+හිත)= අතරතුර කිසිවක් නැති. කළාල් සම්කඩ ආදී යමක් නො අතුළ. එබඳු බිම. වැලි පස් මිශ්‍ර වූ බිම. පාත්‍රය නොතැබිය යුතු බිම් පෙදෙසක්. ''නවඅනන්තර හිතාය භූමියා පතෙතා නිකඛිපි තබ්බා'' පාරා: පා: 12[11] ස. පා: 14[031] – 731[38] මහා: පා: 45[11]

අනන්තරා (න) (න + අන්තරා= කිසි අනතුරක් නැති. 1 දශවිධ අන්තරාවන්ගෙන් එකකිනුදු අනතුරු නැති. 2 සවහී මෝක්ෂ දෙකට අනතුරක් නැති. **-අඤ**= දශවිධ අන්තරාවන් ගෙන් අනතුරක් නැති. සඤ්: ලි: **අනන්තරායකිනී**= අනතුරක් නැත්තී: **ඉක**= (අනන්තරායික)= **අන්තරායකර** නොවන: ''ගමින බාධක වූ රාජ චොරාදි අන්තරායක් නැති'' 1 ශ්‍රඥප්ති

වද්‍යුපත්තීන් නොදැන ව්‍යතික්‍රමණය කිරීමෙන් සවතී මොක්ෂ දෙකට අනතුරු නොවන. 2 රාජචෝරාදී කථා නැති. සන්‍ර්: ලි: **-ඉනී** අනන්තරායකිනී= අනතුරක් නැත්තී. කු: සි: ස: 13[34] කැ: වි. 18[24] ඒ: ම: 24[39] ක: ව: පි: 39 සා: පා: 69[41] – 97[38] පාඒ: පා: 298[18] ප්‍රා: පු: ස: 50[74] **-ආපත්ති** (නා)= එකම් ඇවැත්. දෙවැදෑරුම් ආපත්ති ක්‍රමයකින් එකක්. අනන්තරායිකා ආපත්ති, අනන්තරායිකා ආපත්ති යයි ආපත්තීහු දෙවැදෑරුම් වෙත්. දැන දැන ව්‍යතික්‍රමණය කළ සප්තාපත්තිසකඛියෝ සවතී-මොක්ෂ දෙකට බාධා කරන්නුයි අනන්තරායිකා ආපත්ති නම් වන්නිය. එසේ නො දැන ව්‍යතික්‍රමණය කළ ප්‍රඥප්තිවද්ධාපත්තීහු සවතී-මොක්ෂ දෙකට අනතුරු නො කරන්නුයි අනන්තරායිකා ආපත්ති නම් වන්නිය. පටි: පා: 161[15] ස: පා: 973[38] – 273[3] **-සඤ්ඤී** (නා)= අනතුරක් නැත යන හැඟීම ඇති. ආපත්ති පටිවිජ්ඣන වන කරුණු දශයෙන් එකක්. යම් භික්ෂුවක් රාජ චෝරාදි දශවිධ අන්තරායන් අතුරෙන් යම් අනතුරක් නැති කල අනන්තරායිකා සංඥීව ම ආපත්ති ඡාදනය කෙරේ නම් ඒ ඇවැත පටිවිජ්ඣන වේ මය. ඉදින් හෙතෙම බියසුලු බැවින් අදුරෙහිදී අමනුෂ්‍යයන්ට හෝ චණ්ඩමෘගයන්ට බියෙන් අන්තරායිකා සංඥීව ඡාදනය කෙරේ ද, ඒ ඇවැත පටිවිජ්ඣන නො වේ. ක: වි: 484 ස: පා: 42[39] ඒ: ම: 120[20] කු: සි: ස: 13[34] බු: සි: ටී: 286 වි; ඒ: 505.

අනන්තරික (නා) (න + අනන්තර + ණික)= අතරක් නැති යහු, අනතුරුව සිටියහු. ළඟ සිටියහු.

අනපගත (නා) (න + අපගත)= කාරණයෙන් පහ නොවූ. හෙතුසහිත. ස: පා: 855[36] වි: වි: ටී: 445[17]

අනපදාන (නා) (න + අපදාන) (අප + √දා + යු= අන) 1 අපදාන විරහිත. 2 පිටිසිඳීමක් නැති. ආපත්තීන්ගේ පරිවේඡදයක් නැති. මෙහි අපදාන යනු පරිවේඡදයි, මහා: පා: 381[8] ස: පා: 852[6]

අනපලෝක (නා) (න + අපලෝක) (අප + √ලුව + ණ; ච=ක)= අපලොකනය නො කිරීම නො විචාරීම නො ඇසීම (අපලෝකන බලනු)

අනපලෝකෙති (ක්‍රි) (න + අප + √ලුව + ණෙ + ති;ච=ක)= නො විචාරයි. නො අසයි. අප ලොකනය නො කරයි. අති: **අනපලෝකෂි.** වති: **අනපලෝකෙති.** අනා: **අනපලෝකෙස්සති** සමී: **අනපලෝකෙය්‍ය.** පූ: ක්‍රි: **අනපලෝකෙඛා**= නො විචාරා. පාචි: පා: 222[39] ස: පා: 6.73[1] ආ: පු: ස: 121[2]

අනපාදිසික (නා) (න + අපාදිසික) අපාය + ණික)= අපායයෙහි නුපන්. අපාය හා නොවන. (අධ්‍යාරසනාපාදික බලනු)

අනභිහත (නා) (න + අභිහත) (න + අභි + √හ + ත)= අභිභානය නොකරන ලද. නො පිළිගන්නා ලද; නො කැඳවූ. අභිභාන කර්මය නො කළ. ආපත්ති පටිවිජ්ඣන කළ භික්ෂුව පිරිවෙස් පුරා වත්මාන සමාදන්ව විසූගණ භික්ෂු සඞ්ඝයා මැද අභිභාන කර්මය පිණිස ආරාධනා කටයුත්තේය. මේ අභිභාන කර්මය විසූති ගණයා විසින් තුන් වතුරස්‍රකම් වාක්‍යයෙන් කටයුතුය. එහි එක් තමක් නමුදු අඩු වීනම් අභිභාන කර්මය කොප්‍ය වේ. ඒ භික්ෂුවද අභිභාන නො කරන ලද්දේය. එබැවින් හෙතෙම **අනභිහතය.** ප්‍රා: පු: ස: 50[23] කැ: වි: 51[1] ස: පා: 455[1] පාරා: පා: 221[17] (අභිභාන බලනු)

අනභාවකත (නා) (අනු + අභාවං + කත)= පසුව නො වැඩෙන සේ විනාශයට පමුණුවන ලද. ක්‍රමයෙන් අභාවයට යන. පිළිවෙළින් නැසියන සේ කළ. සම්මසෝ ඛයධම්මා ති නමැති ශාස්තෘන්ගෙන් කෘෂ්ණා අවිද්‍යාමය හවමූලය නැවත නුපදින සේ විනාශ කළහ මෙහි "අනභාවගතා" යනු ද පාඨාන්තරයි එහි අනු + අභිජ්‍රියා= අනවජ්‍රියා යනු මෙන් 'අනු + අභාවං + ගතා= අනභාවිගතා'' යනු පදවෙඡ්දයි. පාරා: පා: 210–17 ස: පා: 831 සා: ම: 531

අනභාවකත (නා) අනභාවකත බලනු. ස: පා: 832

අනභිජ්ඣාන (නා) (න + අභිජ්ඣාන) (අභි + √ඣෛ යු=අන, √ඣෛ=ජ්ඣා)= නොදන්නේ චතුර්ථ පාරාජික ශික්ෂාපදයෙහි දක්නා පරිදි උත්තරි මනුෂ්‍ය ධර්මය තමන් කෙරෙහි ඇතැයි දැනීමක් නැතිව. "සවඝන්නානයෙහි නොඋපන් බැවින් තමා කෙරෙහි ඇතැයි නොදන්නේ" ප්‍රා: පු:

ස: 10^{25} ක: වි: 31^{89} සා: පා: 348^{83} පාරා: පා: 91^{85}

අනභිරත (නා) (න + අභිරත) (අභි + √රම + ත)= නො ඇල්ම. කාමදෘහයෙන් දැවෙන හෙයින් විසිරීගිය සිත් ඇති "ආයසම්‍ා සෙය්‍ය සකෝ අනභිරතෝ බ්‍රහ්මචරියං චරති" පාරා: පා: 1176 සා: පා: 3677

අනභිරති (නා) (න + අභි + √රම + ති)= නො ඇල්ම කලකිරීම. විඤ්ඤාණ සිත. පාරා: පා: 117^{14} සා: පා: 348^{23}–367^{20}

අනභිරද්ධ (නා) (න + අභි + √රහ + ත)= 1 නො සතුටු වූ. සුවපත් නොවූ, 2 සම්පූර්ණ නොවූ කල්පනා ඇති. උත්සාහවත් නොවූ සිත් ඇති පාරා: පා: 194^{30} මහා: පා: 797 සා: පා: 420^{8}–714^{0}

අනභිරද්ධි (නා)= නො සතුට. පාරා: පා: 194^{33} සා: පා: 420^{18} (අනභිරද්ධ බලනු)

අනමතග්ග 1 (නා) (අනු + අමත + අග්ග)= නො දන්නා ලද අත ඇති. සංසාරයේ එක් ලක්ෂණයක්. "**අනමතග්ගොයං භික්ඛවෙ සංසාරෝ. පුබ්බාකොටි න පඤ්ඤායති**" යන සංයුක්ත නිකායට්ඨ කථා පාඨය අනුව අවුරුදු සියයක් දහයක් හෝ නුවණින් අනුව ගොස් නමුදු අග නොදන්නා ලද්දේය යන අර්ථයෙන් **අනමතග්ග** නම් වේ. "**යදග්ගෙන වස්ස සුති මා භික්ඛවෙ න පඤ්ඤායති තදග්ගෙනෙව පඤ්ඤායති මාති, වෙමජ්ඣිකෙනෙව සත්තා සංසරන්ති**" යන සුත්තසඞ්ගහට්ඨ කථා පාඨයෙන් ද මුල් කෙළවර මෙන්ම අග කෙළවරත් නො දන හැකි සංසාරමධ්‍යයෙහි සත්ත්වයන් සැරිසරන බැව් කීහ. ධම්පියා අටුවා ගැටපදයෙහි විස්තර වනුයේ මෙසේය. "අනමතග්ගොයං, අනුව ගොස්නිමු තො පිරිසුන් කෙළවර ඇතියේයි. නොහොත් පුන පුන බලවත්වූ නොපිරිසුන් කෙළවර ඇතියේයි. **අනුග්ගන්ධා අමතං අපරිච්ඡින්නං අග්ගං යස්ස, පුබ්බපුන පෙක්ඛිබ්බා වා අපරිච්ඡින්නං අග්ගං යස්සඅයං අනමතග්ගොයන්තු වෙයි.**" මේ සියලු පාඨයන්ගෙන් පැවැසෙනුයේ සසරෙහි අග නො දන්නා ලද බවයි.

බෞද්ධ සංස්කෘත ග්‍රන්ථවල දක්නේ "අනවරාග්‍ර" යන පාඨයයි. මේ පාඨය මෙසේම සිංහල පොත්වලද දක්නේය. එහෙත් "අනමතග්ග" යන්නෙහි නැති අර්ථයක් "අනවරාග්‍ර" යන්නෙහි දකිමින් එයට "අත්මුල් නැති සසර" යයි ව්‍යාඛ්‍යාන කරති. එහිදී "අවර" යනුයෙන් අන්තය ද, "අග්‍ර" යනුයෙන් ආදිය ද ගණිති. ශ්‍රීසුමඞ්ගල ශබ්දකෝෂ කර්තෘවූ පණ්ඩිත වැලිවිටියේ සොරත නායක සථවිරයන් වහන්සේ මෙම ශබ්දය පිළිබඳව කර ඇත්තේ අගනා විවේචනයකි. කෙසේවතුදු පෞරාණික ආචාර්යවරයන් හා වර්තමාන විවේචකයන් අතර "අනමතග්ග". ශබ්දයට තවත් අවකාශ ඇත්තේය.

2 "**අනමතග්ගොයං භික්ඛවෙ සංසාරෝ. පුබ්බාකොටි න පඤ්ඤායති**" යන දෙශනා පාඨයෙහි "**පුබ්බාකොටි න පඤ්ඤායති**" යනු '**අනමතග්ග**" ශබ්දයේ යථාර්ථය පැහැදිලි කරන සෙදුමකි. බොහෝ පැරණි ඇදුරන් මේ වචනය පිළිබඳව විවිධ අදහස් දක්වන ලද්දේ "**අනු + අමතග්ග**" යි පදවෙන්ද කර අර්ථය සොයන්නට යැම නිසාය. මේ වචනය එසේ විසඳිය කිරීම යුතු නැත. එසින් නියම අර්ථය නො ලැබෙන බැවිනි. යම්ක් "පුබ්බාකොටි න පඤ්ඤායති" (=මුල් කෙළවර නො පෙණෙන්නේ) නම්; එබඳු තැන "**අපරා කොටි පඤ්ඤායති** (=පසු කෙළවර පෙනෙනුයේ) විය යුතුය. පෙර-පසු දෙකෙළවරම නොදක්නේ නම් එය "**පුබ්බාපරාකොටි න පඤ්ඤායති**" විය යුතුය. දෙශනා මාර්ගය එසේය. මේ දෙශනා පාඨයෙහි "පුබ්බා කොටි න පඤ්ඤායති" යි දෙශනා කරන ලද්දේ "**අනමතග්ග**" ශබ්දයාගේ අර්ථයම ප්‍රකට කරන පර්‍යාය පදයක් මෙන් නොව එහි විරුද්ධාර්ථ පදය පිණිසය. ඒ එසේමය. මේ පද දෙක අර්ථයෙන් එකකට එකක් විරුද්ධය. "**අනමතග්ග**" ශබ්දයෙන් පැවැසෙන්නේ "**අපරා කොටි පඤ්ඤායති**" යන අදහසය. මේ අර්ථය ගැණීමට මේ පදය '**න + න + මත + අග්ග**" යි විසඳීකර ගත යුතුය. "දෙවෘ න ඤෝ ප්‍රකාර මනුසරතෘ" යන ශාබ්දික නීතියෙන් නඤර්ථ දෙකක් එක තැන යෙදීමෙන් ප්‍රකෘති අර්ථය දෙන බැව් නියමය වේ.

ඒ අනුව "**මතො විදිතො අග්ගො=ඤාතග්ගො; න + මත=අමතග්ගො; න + අමතග්ගො= අනමතග්ගො**" යි විග්‍රහ කිරීමෙන් අග නොදන්නා ලද්දේ නොවේ හෙවත් අග දන්නා ලද්දේය යන අදහස මෙයින් පැවසේ. එසේ වූ විට "**අනමතග්ගො-පෙ-න පඤ්ඤායති**" යන දෙශනා පාඨයෙහි අදහස "මහණෙනි; සසර දන්නා ලද අග ඇත්තේය. එහෙත් මූල නොදක්නා ලැබේ" යනුයි. සංසාරයේ අවසානය නිර්වාණය වේ ඒ බැව් දෙශනාවේ ම දක්නේය. "පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති අවිජ්ජාය. ඉතො දුබ්බ අවිජ්ජා නා හොති අථ පච්ඡා සම්භවති එවඤ්චිතං භික්ඛවෙ වුච්චති, අථ ච පන පඤ්ඤායති ඉදප්පච්චයා අවිජ්ජාති. පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති භව තණ්හාය-පෙ-ඉදප්පච්චයා භව තණ්හාති' යනාදී දෙශනා පාඨයන්ද සසඳා බැලිය යුතුය.

මේ ශබ්දය සංස්කෘතයට නඟා ගත් "අනම තග්ග" - "**අනවරාග්‍ර**" ශබ්ද දෙකක් පැරණි සිංහල ලියවිලිවල සහ බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ වල දක්නේය. එයින් "**අනවරාග්‍ර**" යන්නට "අඹ මුල් නැති සසර" යනුවෙන් අරුත් ද දෙති. එහෙත් එබඳු අදහසක් "අනවරාග්‍ර" ශබ්දයෙහි නැත්තේය. මේ "අනවරාග්‍ර" ශබ්දය පාළි "**අනමතග්ග**" ශබ්දය වෙනුවට සඳ ගත් වැරදි රූපයකි. එහි "**අවර**" යනු පාළි-සංස්කෘත අපර ශබ්දයාගේ ප්‍රාකෘත රූප යයි. පාළි ශබ්ද ගාථා භාෂාවෙන් ලියූ බෞද්ධ පඬිවරු මෙබඳු පාළි ශබ්ද ප්‍රාකෘත ස්වරූප යෙන් ගාථා භාෂාවෙන් ලියූහ. බෞද්ධ සංස්කෘත සාහිත්‍යය මෙරට දියුණු වී යෑම නිසා ඒ ශබ්ද ද මෙරට සාහිත්‍යයට ඇතුළු විය. "**අනමතග්ග**" ශබ්දයේ නිරුක්තිය අප්‍රකට නිසා ඒ හා ශබ්දමාත්‍රයෙන් සමවනු පිණිස "**අනවරාග්‍ර**" ශබ්දය නිපදවා ගත්හ. මේ ශබ්ද දෙකට ම "අග්මුල් නැති" යන තේරුම් දීම එක සේ වරදය. විමසත්වා: වි: වි: පි: 38[34] ජා: අ: ගැ: 95[35] ධ: අ: ගැ: 76[20]-128[4]- 169[37]-177[5] ශ්‍රී: සු: ශ: 52 **-පරියාය** (නා) [සං. පර්‍යාය]= අනමතග්ග දෙශනාව ඇතුළත්. එබඳු දෙශනාව. ධ: අ: ගැ: 169[37]

අනමතග්ගිය (නා) (අනමතග්ග + ණික; ණික= ඉය)= අනමතග්ග දෙශනාව ඇතුළත්.

අනය(නා)(1 න + අය)(2 න+නය)= 1නො සැප සැපනැති. 2 අන්‍යාය. අක්‍රමය. ක්‍රම විරෝධි. **-ව්‍යසන** (නා) [සං. ව්‍යසන]= අනය ව්‍යසනය. "අනය නම් නො වැඩය. ව්‍යසන නම් පිඩාසි" • වි: මා: ස: 292[14].

අනරහ (නා) (න+අරහ) 1 රහත් නොවූ. 2 නො සුදුසු. සුදුසු නැති. සු: නි: අ: 124[32]

අනරිය (නා) (න + අරිය) [සං. අනාර්‍ය > පා: අන රිය]= 1 අනාර්‍ය. ශ්‍රේෂ්ඨ නොවූ. 2 උභතෝ ඛීණාසවකයෝ 3 පෘථග්ජනයෝ. වි: වි: ටී: 347[4]. **-ධම්ම**(නා)=අනාර්‍ය ධර්මය. සු:නි:අ:420[35] **-කථා** (නා)= අනාර්‍ය කථාව. සරා බිණීම. ම: පූ: 423[11] **-පරියෙසන** (නා) (පරි + √එස + යු=අන) [සං. පර්‍යේෂණ]= අනාර්‍ය පර්‍යේෂණය. වැරදි මගින් නිවන් සෙවීම. ප: සු: 141[9] **-වොහාර** (නා) [සං. ව්‍යවහාර]= 1 අනාර්‍ය ව්‍යවහාරය. බාලපෘථග්ජනයන්ගේ කථාව. 2 දැන දැන බොරුකීම. 3 අවැදගැරුම් අනාර්‍ය ව්‍යවහාරය. පාවි: පා: 2[22] ස: පා: 5[16] (අටඨ අනරිය වොහාර බලනු)

අනලස (නා) (න + අලස)= අලස නොවූ. කම් මැලි නැති. උත්ථානවීර්‍යයෙන් යුක්ත වූ. ස: පා: 395[5] - 670[14].

අනව (නා) (න + නව)= අලුත් නොවූ: පරණ. කු: සි: ස: 94[25].

අනවජ්ජ (නා) (න + න + වජ්ජ) [සං. අනවද්‍ය]= නිවැරදි. වැරදි නැති. අනර්ගිත. සු: **නි:** අ: 2[58][34] **-කම්ම** (නා)= නිවැරදි කටයුතු. දියුණුවට ඉවහල් වන ක්‍රියා. පොහොය සිල් සමාදන් වීම, වතාවත් කිරීම, ගස් සිටුවීම්, හේ දැව් තැනීම් ආදිය සහ ත්‍රිවිධ සුචරිත ක්‍රියා. සු: **නි:** අ: 259[32] **-පඤ්ඤත්ති** (නා) (ප + √ඤ්ඤ + ති) [සං. ප්‍රඥප්ති]= ප්‍රඥප්ති වද්‍ය ආපත්ති. දෙවැදෑරුම් ආපත්තීන්ගෙන් එකක්. ප්‍රඥප්තිවද්‍ය ආපත්ති නම්; යම් ඇවැතක සවිඤ්ඤාණක පක්ෂයෙහි සිත කුසල්හෝ අකුසල් හෝ අව්‍යාකෘත හෝ වේ ද, ඕ තොමෝ ප්‍රඥප්තිවද්‍ය නම් වන්නිය, "අනවජ්ජ පඤ්ඤත්තීති යාණණ ත්තී වජ්ජා" පාරා: පා: 161[22] ස: පා: 673[5] ක: වි: 231[11]. **-සුඛ** (නා)= නිවැරදි සැපය. ප: සු: 178[22].

අනවසෙස (නා) (න + අවසෙස) (අව + √සිස + ණ) [සං. අවශෙෂ]= කිසිවක් ශෙෂ නොවූ. කිසිවක් ඉතිරි නොවූ. ස:පා: 972[30] - **ආපත්ති** (නා)= පාරාජිකාපත්ති. පරිජි ඇවැත්. පරිජි ඇවැතට පැමිණියහු කෙරෙහි කිසි ශීලයක් ශෙෂ නොවන බැවින් පාරාජිකාපත්තිය අනවසෙසාපත්ති නම් වන්නීය. "එකො පාරාජිකාපත්තිකඛඤ්ඤො අනවසෙසාපත්ති නාම" පරි: පා: 161[18] ස: පා: 943[28]-972[30] වි:වි:ටි: 476[18]

අනවස්සව (නා) (න + අවස්සව)= තෙත් නොවීම. "ආයතිං අනවස්සවො හොති" පරි: පා: 73[15] සු: පා: 969[30]

අනවස්සුත (නා) (න+අවස්සුත) (අව + √සුද + ත = නො තෙත්, රාගයෙන් තෙත් නොවූ, මෛථුන රාගයෙන් තෙත් නොවූ. පරි: පා: 230[3] ප්‍රා පු: ස: 4[21] ජා: අ: ගැ: 25[18] (අවස්සුත බලනු)

අනසුරුත්ත (නා) (න + අසුරුත්ත)= අයහපත් වචන නොකියයුතු, විරුඬ වචන කීමට නොවටින. සඞ්ඝාමාවචර භික්ෂුව කෙරෙහි පිහිටිය යුතු එක් ලක්ෂණයක්. "අසුරුත්තං වුච්චති විඤ්ඤාණික කථා සඞ්ඛාතං අසුඳර වචනං. තං න කථෙතබ්බන්ති අත්ථො" පරි: පා: 218[25] ස: පා: 1012[4]

අනස්සාස (නා) (නු + අස්සාස)= ආශ්වාස ප්‍රශ්වාස රහිත සුක්ෂ්ම ගැණීම් හෙළීම් නැති. "අනස්සාසකො කාලමකාසි" පාචි: පා: 110[19] ස: පා: 636[6]

අනාකප්ප (නා) (න + ආකප්ප) [සං. ආකල්ප]= ආකල්ප විරහිත. ආචාර රහිත. ශ්‍රමණ සාරුප්‍ය නොවූ, **-සම්පන්න** (නා)= ආකල්ප සම්පත්තිය නැති. ශ්‍රමණ සාරුප්‍ය ආචාරයෙන් තොර. ආචාර ශීලයෙන් තොර. "සගාරවො සප්පතිස්සො විරොත්තප්පසම්පන්නො යනාදීන් දක්වන ලද ආචාර සම්පත්තිය නැති" මහා: පා: 41[2] ස: පා: 729[23] ම: පා: ස: 144[28]

අනාගත (නා) (න+ආගත)- නො පැමිණි. නොපත්. **-තෙල**(නා)=පොල්තෙල් කොහොඹතෙල් අබ තෙල් ආදිය. සත්තාහකාලික සඞ්ඛ්‍යාවට ගැණෙන තෙල්. පෙළෙහි නො ආ තෙල්, වි: ම: 178[18] **-ඵාණිත** (නා)= මී පුප් රසයෙන් කළ සකුරු. පෙළෙහි නො ආ සකුරු. මී පුප් දියෙහි බඳා ඒ මල් රසය දිය හා මුසු වූ කල ඒ දිය පිස කළ සකුරු. වි: ම: 179[12] **-භාර** (නා)= නො පැමිණි බර. තමහට අයිති නැති කටයුතු කිරීම. නවකයන් විසින් මහ තෙරුන් සතු කටයුතු කිරීම. 1 තෙරවස් නො පැමිණ තෙරතමක් විසින් ඉසිලිය යුතු විජිනිපත් ගැණීම් දම් දෙසීම් ආදිය ඉසිලීම. 2 පොහෝ පවුරුණු කිරීමෙහිදී පූර්වකෘත්‍ය පඤ්චකය සහ පූර්වකරණ චතුෂ්කයත්, ප්‍රාතිමොක්ෂොද්දෙශයත් යන දශ වැදෑරුම් සඵර භාරය (=මහතෙරුන් සතු කටයුතු) මහ තෙරුන් ගේ අනු දැනීමක් නැතිව කිරීම. "සම්මජ්ජනී පදීපෙ ච උදකං ආසනෙන ච භිඤ්ඤපාරිසුඬි ඵතුක්ඛානං භික්ඛු. ගණනා ච ඔවා දෙ පාතිමොක්ඛං ථෙරභාරොති වුච්ච තීනි ඉමං දසවිධං ථෙරභාරං නවකො හුත්වා ථෙරෙන අනජ්ඣිට්ඨෝ කරොතෙතං අනාගතං භාරං වහති නාම' පරි. පා: 165[18] ස: පා: 976[32] ම: පූ: 322[21] **-සම්පි** (නා) = පෙළෙහි නො ආ ගිතෙල්. මුව, රෙහෙණමුව ආදින්ගේ ගිතෙල්. සතිය ඇවැමෙහි දුකුළා ඇවැත් අවදින සත්තාහ කාලිකයක්. කැ: වි: 76[33] **කැ:** වි: පි: 56[36] වි: ම: 179[10] ස: පා: 520[38].

අනාගාමි (නා) (න + ආගාමි) (අ + √ගමු + ණි)= නො පැමිණෙන. පෙරළා නො එන. එනම් මාර්ගඵල ලැබූ පුද්ගලයා. සතර මාර්ගයෙන් සහ සතර ඵලයෙන් එකක්. පාරා: පා: 88[15]

අනාඝාත (නා) (න + ආඝාත) (ආ + √හන + ණ; √හන=ඝාත)= ආඝාත විරහිත, ක්‍රෝධ නැති. විෂකම්මන වශයෙන් ක්‍රොධය නසන ලද. වු: පා: 392[18] ස: පා: 950[17]

අනාඝාති(නා)= විෂකම්මන වශයෙන් ආඝාතය ඇත්තේ දේ. පරි: පා: ගැ: 34[24]

අනාචාර (නා) (න + ආචාර) (ආ + √චර + ණ)= 1 ආචාර විරහිත. කාය වාග් ආචාරයන්ගෙන් සිදු වන වැරදි. 3 නො කටයුතු 4 ප්‍රඥප්තිය ඉක්මවීම. 5 දුශ්ශීලභාවය. 6 මිථ්‍යා ජීවිකාවෙන් ජීවත්වීම. පාරා: පා 211[9] - 213[26] පාචි: පා: 84[35] - 94[21] ස: පා: 441[12] - 443[25] - 612[8] - 631[19] වි: මා: ස: 50[4] - 53[23] වි: ම: ටී: 35[8]

අනාවිඤ්ඤාණ (නා) (න + ආවිඤ්ඤාණ) (අ: + √වි + ත=ඤ්ඤණ)= ආවිඤ්ඤී නොවූ. පුරුදු නොකළ. කථාගතයන් වහන්සේ විසින් පුරුදු නොකළ කරුණු. චූ: පා: 333[15] සා: පා: 943[18] (අධ්‍යාරූප හෙදකර වපසු බලනු)

අනාණත්තික (නා) (න + ආණත්තික) (ආණා + තති + ක)=ඇණවීමෙන් ඇවැතට නොපැමිණිය යුතු බැවින් අනාණත්තික නම්. කං: වි: 24[3] කං: වි: පි: 124[6] (ආණත්තික බලනු)

අනාදර (නා)(න + ආදර)= ආදරය නැති. ධර්මය කෙරෙහි හා පුද්ගලයා කෙරෙහි ආදරය නැති පුග්ගලානාදරිය ධම්මානාදරිය යනුවෙන් දෙවැදෑරුම් වූ අනාදරය. සඞ්ඝ කර්මය කෙරෙහි අනාදර වූ. සා: පා: 1014[35] කං: වි: 161[9] ප්‍රා. ප්‍ර: සා. 8[16]

අනාදරිය 1 (නා)(අනාදර + ණික=ඉය)= අනාදර කිරීම. පුද්ගලයාට හෝ ධර්මයට අනාදර කිරීම, කං: වි: 121[20]

අනාදරිය 2 (නා)= එනම් ශික්ෂා පදය. පුග්ගලානාදරිය. ධම්මානාදරිය යනුවෙන් දෙවැදෑරුම් වූ අනාදර කිරීමෙහි; ‘අනාදරියෙ පාචිත්තියං’’ යනුවෙන් ඒකපදයෙන් අවවාද කළ පුද්ගලයාගේ හෝ ධර්මයට හෝ අනාදර කිරීමෙහි පවතී ඇවැත් වේය යි පණවා වදාළ ශික්ෂාපදය. ප්‍රා: ප්‍ර: සා: ‘4[14] සා: පා: 63[19] පාචි: පා: 112[19] -දුක්කට (නා) (දු + √කර + ත; ත=ට) [සං. දුෂ්කෘත > පා. දුක්කට > සි. දුකුළා]= එනම් දුකුළා ඇවැත ‘‘අරුණ නැගි කල නැගි සිටින්නෙමි යි සතුටුනන් කර දෙර නොවසා යම් මහණකු රෑ සැතපී එසේ ම අවදි වේ නම් ඔහුට අනාදරිය – දිවාසඤ්ඤා යන දුකුළා ඇවැත් දෙකක් වේ. ඉන් අනාදරිය දුකුළා ඇවැත් නිදුගත් කල්හි ම වේ. දිවා සඤ්ඤා දුකුළා ඇවැති අරුණ නැගීමෙන් පසු සිදු වන්නේය. එසේ සැතපියහු අරුණට පළමු නැගි සිටිකල අනාදරිය දුකුළා ඇවැත පමණකි’’ පා මූ: වි: වි: සා: 19[31] සා: පා: 203[21] වි: වි: වි: 136[33] සා: දී: 483[3] ජා: මූ: වි: වි: 41[3],

අනාදූ (පු: ක්‍රි:) (න + ආ + √දූ + ත්වා)= නොගොස. ප්‍රා: පු: සා: 45[33] කං: වි: 70[13]

අනාදිකම් (නා) (න+ආදි + කම්ම)= පළමුවෙන් නොකළ. අනුප්පත්තිකා කාරකාය. අනුප්පත්තිකා

යෙහි ආදි කර්මිකයා. ප්‍රථම පාරාජික ශික්ෂාපදයෙහි වැදිරියක හා සංවාසයෙහි යෙදුණු භික්ෂුව එහි අනුප්‍රාප්තියෙහි ආදි කර්මිකයා වේ. එබැවින් හේ අනාදිකර නම් වේ. ‘‘අනාදිකරොති මක්කටී සමණාදී අනුපඤ්ඤත්තිං කාරකො’’ පරි: පා: 162[4] සා: පා: 973[21] (ආදිකර බලනු)

අනාදිය (නා) (න + ආදිය) (න + ආ + √දා + ය + ත්වා; ත්වා=ය)= නොගෙන. නොපිළිගෙන. වචනයට ගරු බුහුමන් නොකොට. ආදරය නොකොට සා: පා: 271[15] – 554[14]

අනාදිය දූත (නා)= තාවකාලික. තාවකාලික වස්තුය ගැන්ම ‘‘කුක්කුකතං නාම අනාදිය දූතං වුච්චති’’ පරි: පා: 229[35] (කුක්කුකත බලනු)

අනාදියනෙතා (නා)= නොගන්නේ. වචනය නොපිළිගන්නේ. ගරු බුහුමන් නොකරන්නේ. සා: පා: 271[15] – 554[14]

අනාදියනෙතා ආපජ්ජති (ක්‍රි) (ආ + √පද + ය + ති)= නොහැණීමෙන් හෝ නොකිරීමෙන් ඇවැතට පැමිණෙයි. කප් බින්දු නොතබා සිවුරු පරිභොග කරනුයේ ඇවැතට පැමිණෙයි. ‘‘දුබ්බණ්ණකරණං අනාදියිත්වා චීවරං පරිභුඤ්ජන්තෙන පන අනාදියනෙතා ආපජ්ජති නාම’’ පරි’ පා: 163[3] සා: පා: 975[3]

අනාදීනව දස්ස (නා) (√දිස + නත; √දිස= දස්ස)= ආදීනව නොදක්නේ. වරද නොදක්නේ. නිවැරැදිය යන හැඟීම් ඇතිව. පාරා: පා: 17[11] සා: පා: 147[3]

අනානා කථික (නා)(න + නානා + කථා + ඉක)= නොයෙක් අනර්ථ කථා නොකරන. එබඳු කථා නොකරන්නා. සඞ්ඝාවාවචර (=ප්‍රතිපක්ෂාර්ථ ඇත්තවුන් ගෙන දිනිඹිය කරණ පිහිටුවන) මහණුන් විසින් නොකළ යුතු කථා නොකරන. පරි: පා 217[31] සී: පා: 1511[7] පරි: පා ගැ: 25[16]

අනානුවජ්ජ (නා) (න + අනුවජ්ජ) (අනු + √වද + ණ්‍ය)= උපවාද නොකළ. චෝදනා නොකළ මහා: පා: 115[16] සා: පා: 855[3]

අනාපත්ති 1 (නා) (න + ආපත්ති (අ + √පද + ති)= ඇවැතෙහි පැමිණීමක් නැති. වරදක්

නැති. ඇවැත් නැති. "අනාපත්ති, නිරාවති" ක: වි: පි: 78[8]

අනාපත්ති 2 (නා)= ඒ ඒ ශික්ෂාපදයන්ගේ අනාපත්ති වාරය. "අනාපත්ති අජානන්තස්ස අසාදියන්තස්ස" යනාදීන් දක්නා ශික්ෂාපදයන්ගේ අනාපත්ති වාරය: ස: පා: 943[29]-972[24] **-කරාධම්මා** (නා)= අනාපත්ති කර ධර්මයෝ. සපත්ත අධිකරණ සමථයෝ. "අනාපත්තිකරා ධම්මා නාම සත්ත සමථා" පරි: පා: 161[15] ස: පා: 572[13] **-කොඨාස** (නා)= අනාපත්ති කෝෂ්ඨාස. අනාපත්ති භූමිය. වි: ලි: 12[16] **-පණ්ණාරසක** (නා)= මහාවග්ග පාළි උපෝසථක්ඛන්ධකයෙහි දක්නා එක් අන්තර භේදයක්. පාමොක් උදෙසූ භික්ෂූන්ට ඇවැත් නොවන වාර පසළොස. "එක් ඛද්ධ සීමාවක් තුළ පිහිටි යම් කිසි විහාරාදියක වසන මහණුන් සිව් නමක් හෝ ඉන් වැඩි ගණනක් හෝ පොහො කරන තැනට රුස්ව පිරිසුදු සිතින්, ඒ සීමාව තුළ වැසි සියලුදෙනා වහන්සේ පැමිණියේ සලකමින් 1 පාමොක් උදෙසන කල හෝ 2 උදෙසා නිමකළ කෙණෙහි හෝ 3 උදෙසා නිමි කොට පිරිස නො නැඟිටි කල හෝ 4 කොටසක් නැඟිටි කල හෝ 5 සියලු පිරිස නැඟිටි කල හෝ එහි වැසි මහණුන් ඊට වැඩි ගණනක් පැමිණියේ නම් එ පසුව පැමිණි පැවිද්දන් විසින් නැවත පාමොක් උදෙසිය යුතුයි. පළමු පාමොක් උදෙසූ මහණුන් ඊට කාය සාමග්‍රීය දීම වටී. සම ගණනක් හෝ අඩු ගණනක්; දෙසන ඇසිල්ලෙහි පැමිණි කල ඒ පාමොක් උදෙසන මහණුන්ගේ අත්පසට පැමිණ දෙසූ පමණින් ඉතිරි කොටස ශ්‍රවණය කළ යුතු. පාමොක් උදෙසා නිමකළ ඇසිල්ලෙහි හෝ උදෙසා නිම කොට පිරිස නො නැඟිටිකල හෝ කොටසක් නැඟිටි කල හෝ සියලු පිරිස නැඟී සිටිකල හෝ සම ගණනක් හෝ අඩු ගණනක් පැමිණියේ නම් ඒ පාමොක් දෙසූ භික්ෂූන් සමීපයෙහි පාරිසුද්ධිය ආරොචන කළ යුතුයි. මේ හැම තන්හිම පාමොක් දෙසූ මහණුන්ට ඇවැත් නො වේ." මෙහි අනාපත්ති වාර පසළොසකි. ඒ අනාපත්ති වාරයන් පහත සඳහන් පට්ටිකාවෙන් දැනගනු වඩා පහසුය. මහා: පා: 1416 සා: ම: 2323 ම: පා: ස: 40237

අනෙකුත් භික්ෂූන් ආශ්‍රිත		පාතිමොක්ඛ උද්දිස්ස මානෙ	පාතිමොක්ඛ උද්දිඨ මත්තෙන	අවුට්ඨිතාය පරිසාය	එකව්‍යාය වුට්ඨිතාය පරිසාය	සබ්බාය වුට්ඨිතාය පරිසාය	භික්ෂුණීන් ආශ්‍රිත
	බහුතරය	—— 1	—— 4	—— 7	—— 10	—— 13	
	සම සමය	—— 2	—— 5	—— 8	—— 11	—— 14	
	පොකතරය	—— 3	—— 9	—— 9	—— 12	—— 15	

1-4-7-9-10-13 අනෙකෙසු භික්ඛූසු පාතිමොක්ඛං උද්දිසිතබ්බං
2-3 ,, ,, අවසෙසං සොතබ්බං
5-6-8-9-11-12-14-15 ,, ,, පාරිසුද්ධි ආරොචෙතබ්බා

අනාපාදික (නා) (න + ආපාදික) (අප ය + ණික)= අපාදික නොවන අපායෙහි නූපදින. සඤ්ඤාභෙදකකම්ම ක්‍රාවිඤ්ඤත්තියෙහි කියන ලද අවිඤ්ඤාපක අනාපාදිකයෝ. ස: පා: 1035[1] පරි: පා: 282[24] (අට්ඨාරස අනාපාදික බලනු)

අනාපුච්ඡා (පූ: ක්‍රි:)= [1] අනා විචාරා. නො අසා. නො පිළිවිස. 2 දහර ශ්‍රාමණේරාදී කිසිවෙකුන්ට පැවා නොවී. ප්‍රා: පු: ස: 59[18] ස: පා 568[16]

අනාමට්ඨ (නා) (න + ආමට්ඨ) (ආ + √මස + ත) ස + ත=ට්ඨ)= ආමශීනය නො කළ. සපශී නො කළ. **-පිණ්ඩපාත** (නා)= ඉඳුල් නො කළ පිණ්ඩපාතය. අගින් නො ගන්නා ලද ආහාරය. නො වැළඳූ පිණ්ඩපාත ආහාරය "සැදැහැවතුන් විසින් දෙන ලද තමන් නො වැළඳූ ආහාරය අනාමට්ඨ පිණ්ඩපාත නම. ඒ අනාමට්ඨ පිණ්ඩපාතය මවුපියන්ගට ද, මවුපිය උපස්ථායකයන් හට ද තමන් ගේ කටයුතු කරන්නා හට ද, පැවිදි වීම පිණිස වෙහෙර නැවැති සිටින්නාහට ද, රජය පතන සොරු හට ද. අධිපතියා හට ද, දීම වැරැදි නො වේ· මොවුනතුරෙන් පැවිදිවනු කැමැතිව වෙහෙර වසන්නාහට තමා පරිභොග කරන කැවියක නමුදු දීම වටී. අන් සියල්ලන්ටම ඔහු පරිභොග වූ බදුන්වල දිය යුතු" පා: මූ: ව: ව: ස: 71^{1} ව: ව: 493–494. ස: පා: 337^{34} සා: දී: 620^{8} ව: ව: ටී: 199^{15}

අනාමන්ත (නා) (න + ආමන්ත) (ආ √මන්ත + ණ)=ආමන්ත්‍රණය නො කිරීම. නො කැඳවීම **-චාර** (නා) (√චර + ණ)= ආමන්ත්‍රණයක් නැතිව හැසිරීම. කැඳවීමක් නැතිව යෑම. කඨිනොද්ධරණයට පෙර කඨිනය අතුල භික්ෂුවට ලැබෙන ආනිසංස පසෙන් එකක්. "අනාමන්තචාරනම් චාරිත්‍ර ශික්ෂාපදයෙහි කිනියෙන් විද්‍යමාන භික්ෂූහු නොපිළිවිස කුල ඝට යෑමයි"– "අනාමන්තචාරය නම්; ඇසළ අව පැළඳිය වස් ඉටා වප් පුර පුරපසළොස්වක් දවස මහපවාරණයෙන් පවරා දෙවෙනි දා පැළඳිය පටන් ඉල් පුර පසළොස්වක දක්වා යම්කිසි දවසක එදවස් අතුරන පරිද්දෙන් අනුදන වදළ කෙළින් සිවුර පිළිගෙන එතැන් පටන් හෙමන්ත සෘතුවෙහි කෙළවර මැදින් මස පුරපසළොස්වක් දින දක්වා අරම් වැසි භික්ෂුවක්හු නො පිළිවිස ගම් හැසිරීම හෙවත් එසේ නො විචාරා යෑමෙන් සිදුවිය හැකි චාරිත්‍ර ශික්ෂාපද මදින පවිනියෙන් නිදහස ලැබීමයි. මෙය පාචිත්තිය පාළියෙහි භික්ඛු විභඞ්ගයෙහි එන චාරිත්‍ර ශික්ෂාපද මදින පවිත්‍රය සඳහා කිරන ලදි. එහෙයින් කීහ. සමන්තපාසාදිකා නම් විනය අටුවාවේ "අනාමන්තචාරොති යාව කඨිනං න උද්ධරීයති තාව අනාමන්තෙත්වා චරණං කප්පිස්සති චාරිත්තං සික්ඛා පදෙන අනාපත්ති හවිස්සති ති අත්ථො" සි. ක: ව: පි: 431^{6} ක; ව: 45^{23} ස: පා: 820^{26}–985^{23} ව: වි: 155^{7}.

අනාමාස (නා) (න+ආමාස) (ආ + √මස + ණ) [සං. ආමශී]= ආමශීනය නො කළයුතු. භික්ෂු වක විසින් නො ඇල්ලිය යුතු වස්තු. 'මුතු මැණික් වෙරළුමිණි ආදි දශවිධ රත්නයන්ද, හැල් වී ආදී සප්ත විධ ධාන්‍යයන් ද, සත්‍රී රූපා කාර පෙතැලි රූ ද, සත්‍රී ආභරණද, පිඹිනා සක් කුලල් සහ බෙර ආදී තූර්‍ය භාණ්ඩ ද, කඩු කෝල් දුනු ආදි ආයුධ වර්ග ද, ගස්හි තුබූ ගෙඩි වර්ග ද, අනාමාසය. නො ඇල්ලිය යුතුය. රන් පිළිම හා පින්තල කරඬු ද, අනාමාසයයි කුරුන්දි අටුවාවේ කියයි." කු: සි: ස: 110^{23} සි. ව: වි: 68^{17} ස: පා: 386^{30} (387–388 විසතර) වි: වි: 344–347 ච: ව: ටී: 221^{12} සා: දී: 661^{2} **-දුකකට** (නා)= එනම් දුකුළාව. අට වැදැරුම් දුකුළාවන්ගෙන් එකක්: දශවිධ රත්න සප්ත විධ ධාන්‍ය, සහ ආයුධාදිය ආමශීනය කරන්න හුට වන දුකුළාව. "යං පන දසවිධ රතනං සත්තවිධං ධඤ්ඤං සබ්බඤ්ච ආයුධ භාණ්ඩාදිං ආමසනස්ස දුක්කටං වුත්තං ඉදං අනාමාස දුක්කටං නාම" ස: පා: 225^{8} (අට්ඨ දුක්කට බලනු.) **-වර්ජ්‍ය** (නා)=භික්ෂුවක විසින් ආමශීනය නො කළ යුතු වස්තු. (අනාමාස බලනු)

අනාරම්භ (නා) (න + ආරම්භ)(ආ + √රභ + ණ)= 1 ආරම්භ නොකළ. පටන් නොගත්. 2 නිරූ පද්‍රැත වූ, උවදුරු නැති: කුවිකාර ශික්ෂාපද ඇතිව සඳහන් දෙසීමට සුදුසු විහාර වසතුවේ එක් ලක්ෂණයක්. කිපිලලිකාදීන් ගේ ආසයා දී නෙලෙස් උවදුරින් ද, පුබ්බණ්හ අපරණ්හ නිශ්‍රිත ප්‍රදෙශ ආදී සොළොස් උවදුරින් ද විරහිත වූ. "කිපිලලිකාදීනං ආසයාදීහි තෙරසහි පුබ්බණ්හ නිස්සිතාදීහි සොළසහි උපද්දවෙහි විරහිතත්තා අනාරම්භං" ක: වි: 40^{8} ක: වි: පි: 312^{0} ස: පා: 408^{11} ප්‍රා:පු:ස: 18^{24} වි: ම: 104^{17}

අනාරොචන (න+ආරොචන) (ආ + √රුච + යු= අන)= 1 ආරොචනය නො කිරීම. නොදැන්වීම. 2 ආගන්තුකාදීන්ට නො දන්වීම. මා නත්තචාරික භික්ෂුවගේ රාත්‍රිභෝජනය වන කරුණු සතරින් එකක්. "වත් බහා නොසබා වත්මානත් සමාදන්ව සිටින අවස්ථාවක ආ ගන්තුකව එන සියලු භික්ෂූන්ට එය ආරොචනය කළ යුතුයි [ඒ] අවස්ථාවක ආරාමයට පැමිණි යම්කිසි භික්ෂුවකට රාත්‍රිය ගෙවෙන්නට කලින් ආරොචනය නො කළහොත් රාත්‍රී

ඡේදය වෙයි එසේ වූ අඩුව නැවතත් පිරිය යුතුයි" වු: පා: 9[11][8] ස: පෘ: 866[8][1] (රතන ඡේද බලනු.)

අනාලය (නා) (න + ආලය)= ආලයක් නැතිව. බැඳීමක්, ඇලීමක් නැතිව. වි: වි: ටී: 2[11][5]

අනාලාප (නා) (න + ආලාප) (ආ + √ලප + ණ)= කථා නො කිරීම: නො බිණීම. ස: පෘ: 1036[5] පරි: පා: 285[3]

අනාවාස 1 (නා) (න + ආවාස) (ආ + √වස + ණ) නො විසිය යුතු පෙදෙස. නව කර්මාන්ත ශාලාදිය ඇති ප්‍රදේශය. "අනාවාස නම් පැවිද්දන් නො වසන නව කර්මශාලාදී යම් කිසි පෙදෙසකි" ම: පා: ස: 416[8][6] ස: පෘ: 795[8][7]

අනාවාස 2 (නා)= භික්ෂූන් නැති ආවාසය පොහො කරන දින නො යායුතු ආවාසය "පොහො කරන දිනයෙහි භික්ෂූන් වහන්සේ වසන ආවාසයක සිට භික්ෂූන් නැති ආවාසය කට නො වැඩිය යුතු. එසේ වඩින සේක් නම් තමන් හා සිව් නමක් හෝ ඉන් වැඩිගණනක් ව වැඩම වීම ද, රාජාදී දශවිධ අන්තරාය අතුරෙන් එකක් පැමිණීවිට හුදෙකලාව වැඩමවීම ද, වැරදි නොවේ" ම:පා:ස: 415[3][5] ස: පා: 795[3][7]-863

අනාවාස 3 (නා)= ආවාස නො වන තැන්. ඕනෑත් ආදිය පුරන භික්ෂුව විසින් නො විසිය යුතු, එසේ ම නො පිවිසිය යුතු සෑ ගෙය, බෝ ගෙය, මුසුන් හල, අටල්ල, දන්හල, පැන්හල' වැසිකිලිය, දොරකොටුව යනාදිය. චූ: පා: 89[2][4] ස: පෘ: 864[3][6]

අනාවිල (නා) (න + ආවිල) (ආ + √විල + අ) [සං ආවිල]= නො කැළඹුණු. කැළඹීමක් නැති. **-සඞ්කප්ප** (නා) (සං + √කපප + ණ) [සං. කල්ප]= නො කැළඹුණු කල්පනා ඇති බව දශවිධ ආසීවාසයෙන් එකක්. කාම සඞ්කප්ප, ව්‍යාපාද සඞ්කප්ප, විහිංසා සඞ්කප්ප යන තුන ප්‍රහීණ කිරීම. ම: පා: ස: 127[8] (දස වාස බලනු)

අනාසා (නා) (න + ආසා)= ආශාවක් නැති. නූපන් ආශාව. වි. වි: ටී: 435[3][5] ස: පා:, 825[8][1] (ආසාවච්ඡේදිකා බලනු)

අනාසික (නා) (න + නාසිකා)= නැහැය නැති. පැවිදි නො කළ යුතු පුද්ගලයෙක්. පරිස දූෂක යෙක්. (නාසවජ්ඣ බලනු)

අනාසිතක (නා) (න + නාසිතක) (√නාස + ඉ + ත=ක)= නො නැසූ. 1 ලිඛිතනාසනා 2 දණ්ඩ කම්මනාසනා 2 සංවාසනාසනා යන තෙවැදෑරුම් නාසනාවන්ගෙන් නො නැසූ. පරි; පා: 162[1][3] ස, පා 974[5]-1029[6]

අනාහට (නා) (න + ආහට) (ආ + √හර + ත)= ළඟට නො පැමිණි. මෙවන නො පත්, මුව දෙරට නො පැමිණි. "අනාහටෙ, මුවට නෙ එළුවූ සඳ" ප්‍රා පු: ස: 103 [1][9] ස: පා: 664[2][0]

අනික්කඛත්ත රාජක (නා)= බැහැර නො ගිය රජහු ඇති සයනීඝරය හෙවත් සිරියහන් ගෙය. "අනික්කඛත්තා රාජා ඉත්තොති අනික්කඛත්ත රාජකා. තසමිං අනික්කඛත්ත රාජකෙ; සයනීඝරෙති අත්ථො" යනු අටුවාහි. "රජතෙමේ මේ සයනීඝරයෙන් නො නික්මුනේනු යි. සයනීඝරය හෙතෙමේ අනික්කඛත්ත රාජක නම් වේ" ක: වි: පි: 115[9] ස: පෘ: 653[1][9] ප්‍රා: පු: ස: 89[1][9] ක: වි; 141[1][5] (අනිහත රතනක බලනු)

අනික්කිත්තන (නා) (න + **නික්කිත්තන**) (නි + > ඛිප + ත)= නික්ෂේප නො කළ. බැහැර නො කළ. **-සික්ඛා** (නා) (√සික්ඛ + ආ)= ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය නො කළ. "අනික්කිත්ත සික්ඛා, නො පස් වකණ ලද සික ඇති මහණ". චිරත-ඛෙත්ත- කාල- පරියොග-පුඤ්ඤල- විඤ්ඤාණ යන ලක්ඛණ අනුව ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන නො කළ. කු: සි: ස: 5[1][8] ඛු, සි: ටී: 6[8][0] (සික්ඛා පච්චක්ඛාන බලනු)

අනිච්ච (නා) (න + නිච්ච)= අනිත්‍යය. නිත්‍ය නො වීම. එක සේ නො පැවැත්ම. පඤ්චුසක ඛ්ධය. ස: පෘ: 610[3][7] **-තා** (නා)= අනිත්‍ය ස්වභාවය. උපන් ධර්මයන් ඒ අයුරින් නො සිට ක්ෂණ භඞ්ගයෙන් බිඳීම.පඤ්චුසක ඛ්ධය. උත්පාද -ව්‍යය වශයෙන් අන්‍යථා ස්වභාවයට පැමිණීම. ස: පා: 311[1] **-'අනුපස්සනා** (නා) (අනු + > දිස + යු=අන + ආ; √දිස=පස්ස)= අනිත්‍ය වශයෙන් දැක්ම. රූපාදීන්හි අනිත්‍ය ස්වභාවය දැක්ම, ස: පා: 311[3] **-'අනුපස්සි** (නා) (අනු පස්ස + ණී)= අනිත්‍යානුදර්ශනයෙන් යුක්ත පුද්ගලයා. එබඳු භික්ෂුව. "ඉපද නැසෙන

සවභාව ඇති හෙයින් **පඤ්චුපාදානක්ඛන්ධ අනිච්චයි.** ඒ පඤ්චුපාදානක්ඛන්ධයන්ගේ ඉපදීම් නැසීම **අන්‍යථා භාවය අනිච්චතා** නම්. මෙසේ පඤ්චුපාදානක්ඛන්ධ **අනිත්‍යතා** වශයෙන් මෙනෙහි කිරීම **අනිච්චානු පස්සනා** නම්. අනිච්චානු පස්සනාවෙන් යුක්ත තැනැත්තේ **අනිච්චානු පස්සී** නම්. වි: මා: ස: 765[34] සී: පා: 311 [5] වි: ම: ටී; 260[26]

අනිසී (නා) (න + ඉසී)= සන්‍ථියක් නො වූ. පාරා: පා: 170[7]

අනිද්දිට්ඨ කාරක(නා)=කළහු නො දක්වන ශික්ෂා පද. කාරකයකු නො දක්වන ශික්ෂාපද ශික්ෂාපදයන්ගේ එක් භෙදයක්. භික්ෂු ප්‍රාතිමොක්ෂයෙහි; 1 සුක්ක විසටිය 2 මුසාවාද 3 ඔමසවාද 4 පෙසුඤ්ඤ 5 භූතගාම 6 අඤ්ඤවාදක 7 උජ්ඣාපනක 8 ගණභොජන 9 පරම්පර භොජන 10 සුරාමේරය 11 අඞ්ගුලි පතෝදක 12 හසධම්ම 13 අනාදරිය යන තෙළෙහි සහ භික්ෂුණී ප්‍රතිමොක්ෂයෙහි 14 තිරච්ඡානක 15 ජතුමට්ඨක යන දෙක ඇතුළු ශික්ෂාපද පසළොස අනිද්දිට්ඨ කාරක නම්. සෙසු ශික්ෂාපද ඒවාහි "යෝ පන භික්ඛු" "යා පන භික්ඛුනී" යනුවෙන් කාරකයා දක්නේය. මේ පසළොසෙහි එසේ නොදක්නා බැවින් අනිද්දිට්ඨ කාරක නම්. වජි:බු:ටී: 52[27] (අනුද්දිස්ස පඤ්ඤත්ති බලනු;

අනිබද්ධචාරිකා (නා)= බුදුවරුන්ගේ අතුරිත චාරිකාවෙහි එක් භෙදයක්. ගම් නියම්ගම පිළිවෙළින් වැඩමවීම. "යං පන ගාමං නිගමං නගරං පටිපාටියා චරති අයං අනිබද්ධ චාරිකා නාම" ප: සූ: 126[0]

අනිබද්ධවාස, (නා)= නිතර එකතැන නොවිසීම. "භගවා පඨමං බොධියං වීසතිවස්සානි අනිබද්ධවාසො අහොසි" ප: සූ: 1 [71]

අනිමන්තනික (නා) (න + නිමන්තනික)= නිමන්ත්‍රණය නො කළ. ආරාධනා නො කළ. නො පැවැරූ. (නිමන්තෙතීති බලනු) **-චතුත්ථ** (නා)= ආරාධනාවක් නැතිව පැමිණි සිව් වැනි ගණපූරකයා-ගණභොජන ශික්ෂාපදයෙහි ලැබෙන චතුර්ථ පඤ්චකයෙන් එකක්. භික්ෂූන් සතර නමකට දානයට ආරාධනා කළ විට තෙනමක් වැඩමවී නම්; එහි ගදිසියෙන් නිමන්ත්‍රණයක් නැතිව පැමිණි අන් භික්ෂුවක් ද කැඳවා ඒ භික්ෂුවගෙන් ගණපූරණය කොට දානය දේ නම් ඒ සතර වැනි භික්ෂුව අනිමන්තනික චතුත්ථ නම් වේ. නිමන්ත්‍රණයක් නැතිව පැමිණි සිව් වැන්නා බැවිනි. ස: පා: 598[13] වි:ව්: ටී: 317[28] (අනිමන්තනික චතුක්කය සී ද දක්නේය.)

අනිමිත්ත 1 (නා) (න + නිමිත්ත)= නිමිත්තක් නැති. හෙතු රහිත. සලකුණක් නැති. නො සලකුණ. "අනිමිත්තං කථාති නිමිත්තං අකත්වා" ස: පා; 501[81]

අනිමිත්ත 2 (නා)= නිමිතිරහිත. රාග දෙස මොහ යන නිමිති නැති. පාරා: පා: 104[81]–105[8] ස: පා: 3526

අනිමිත්තතා (නා) (අනිමිත්ත + තා)= **නිමිති** නැත්තී. **සත්‍ර නිමිති** නැත්තී. දුටුදැ ඇසූ වාචා සඬ්ඝා දිගෙහි ශික්ෂාපදයෙහි ආක්‍රෝශ **නිදේශයෙහි** එකොළොස් පදයන් ගෙන් එකක්. කෙසී සිදුරක් පමණ **නිමිති** ඇත්තී. "අනිමිත්තතාසීති නිමිත්ත රහිතතාසි. කුඤ්චිය පණාලි මත්තමෙව තව දක සොතනති වුත්තං හොති" ස:ප: 391[9] ක: වි: පි: 27[85] **-සීමා** (නා)= නිමිති රහිත සීමාව. සියල්ලෙන් සියල්ල නිමිති කීනීනය නොකොට සම්මත කළ සීමාව. හැම ඉලසින්ම **නිමිත්ත** කීනීන රහිත සීමාව. විපත්ති සීමා එකොළොසින් එකක්. මෙහි **නිමිත්ත** නම්; බද්ධ සීමාවේ අවසානය හඳුන්වන සලකුණුයි. එය 1 පබ්බත **නිමිත්ත** 2 වන **නිමිත්ත** 3 පාසාණ **නිමිත්ත** 4 රුක්ඛ **නිමිත්ත** 5 මග්ග **නිමිත්ත** 6 වම්මික **නිමිත්ත** 7 උදක **නිමිත්ත** 8 නදී **නිමිත්ත** යයි අට වැදෑරුම් වේ **නිමිති** කීනීනය කරන විට බස්නාහිරි දිශාවෙහි සිට නැඟෙනහිරි දිශාභිමුඛව "පුරත්ථිමාය දිසාය කිං **නිමිත්තං**" යනුවෙන් පෙරදිග්න් පටන් ගෙන පිළිවෙළින් "පුරත්ථිමාය අනුදිසාය"– "දක්ඛිණාය දිසාය"– "දක්ඛිණාය අනුදිසාය" "පච්ඡිමාය දිසාය"– "පච්ඡිමාය අනුදිසාය"– "උත්තරාය දිසාය"– උත්තරාය අනුදිසාය" යනුවෙන් අට දිග **නිමිති** කීනීනය කොට නැවත "පුරත්ථිමාය දිසාය කිං **නිමිත්තං**" යි පෙරදිග **නිමිත්ත** කීනීනය කරනලද්දේසියල් ලෙන් සියල්ල කීනීනය කිරීම් නම් වන්නේය. එසේ නොකළ සීමාව **අනිමිත්තා සීමා** නම්. ස: පා: 773[15]–1044[28] ම: පා: ස: 501[23]A වි: ව්. 256[3] වි:ල: 205[39] (අට්ඨ **නිමිත්ත** බලනු)

අනියත (නා) (න + නියත)= එනම් ඇවැත්. ඒකාන්තයෙන් සතිවූහන් නොකටහැකි පරිජී සඟවෙසෙස් පවිති යන ඇවැත් තුණෙන් නඟින ඇවැත. පාරාජිකා පත්තියට හෝ සඞ්ඝාදිසේෂාපත්තියටහෝ පාචිත්තියාපත්තියට හෝ පැමිණියේ යයි අපවිජාන මාන කල්හි අනිකකුට නිශ්චය නො කට හැකි බැවින් ද, පරිජී ආදි ඇවැත් තුණ අතුරෙන් යමක් ප්‍රතිඥ කෙරේ නම් ඒ ඇවැත අනුව නිශ්චය කටයුතු බැවින් ද, මීට අනියත යයි කියනු ලැබේ. "තිණ්ණං ආපත්තීනං යං ආපත්තිං වා පටිජානාති තස්ස වසෙන කාරෙතබ්බතාය අනියතෝ"-"අනියතෝ ප්‍රතිඥයෙන් කටයුතු බැවින් අනියත නම් වේ" ක: වි: 51[37] ප්‍රා: පු: ස: 32[28]සු: ප: 104[26] ප්‍රා: ව: 115[28] -**'ආපත්ති** (නා)= ආපත්තීන්ගේ එක් හෙදයක්. ආපත්තීහු නියත-අනියත වශයෙන් දෙවැදෑරුම් වෙත් එහි පඤ්චානන්තරීයකම්මාපත්තීහු නියත වෙත්. ඒ හැර සෙසු කම්මාපත්තීහු අනියත ආපත්තීහු නම් වෙත්. "පඤ්චානන්තරිය කම්මාපත්ති නියතා සෙසා අනියතා" පරි: පා: 162[8] ස: පා. 973[26] -**'උද්දෙස** (නා) (උ+√දිස √ණ)= අනියතුද්දෙසය. පස් වැදෑරුම් ප්‍රාතිමෝක්ෂ උද්දෙශයන් ගෙන් එකක්. ප්‍රාතිමෝක්ෂ උද්දෙශය හෙවත් පාමොක් උදෙසීම 1 භික්ඛුද්දෙසය 2 පාරාජිකුද්දෙසය 3 සඞ්ඝාදිසෙසුද්දෙසය 4 අනියතුද්දෙසය 5 විත්ථාරුද්දෙසය යනුවෙන් පස්වැදෑරුම් වේ එයින් **අනියතුද්දෙසය** නම්; "සුණාතු මේ භන්තෙ සඞ්ඝෝ-පෙ-ආවිකතාහිස්ස එාසු හොති" යනාදින් **භික්ඛු**නයේ ආදියේ සිට අනියත දක්වා උද්දෙසා සෙස්ස ශ්‍රුතයෙන් ඇස්විමසි. ක: වි: 26 -**පුග්ගල** (නා)= නියත නොවූ පුද්ගලයා. මිච්ඡත්ත නියත, සම්මත්ත නියත ධර්මයන්ගෙන් යුක්ත නොවූ පුද්ගලයා. මිච්ඡත්තනියත ධර්ම නම් පඤ්චානන්තරීය කර්ම සහ නියතමිථ්‍යාදෘෂ්ටි යයි. සම්මත්ත නියත ධර්ම නම් සතර මාර්ගඵලයි. "මිච්ඡත්ත නියත වූ හෝ සම්මත්ත නියත වූ ඒ දෘෂ්ටි සම්ප්‍රයුක්ත සතර සිත හා දෙමිතස් සඟයිය දෙයිත මිච්ඡත්ත නියත නම්. මාර්ග සම්ප්‍රයුක්ත සතර සිත සම්මත්ත නියත නම් සෙසු එකුනසූ චිත්තයෝ අනියත නම්වුත්තිසි." පරි: ප: ගැ: 12[5] ස: පා: 973[36] වි: වි: ටී: 492[18] පරි: ප: 162[10]

අනිස්සජ්ජිත්වා (පූ: ක්‍රි:) (න + නිස්සජ්ජිත්වා) (නී + √සජ + ඉ + ත්වා)= නිස්සජ්ජනය නො කොට රැකනැන්මට නොදී. මෙය රැක ගතුවයි නො කියා. "අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස" ස: පා: 463[17]-700[8] (නිස්සගගිය බලනු)

අනිස්සටඨ (නා) (න + නිස්සටඨ) නි + √සජ + ත; ජ + ත=ටඨ)= බැහැර නො කළ. තම අතින් හෝ තුබූ තැනින් වෙනස් නො කළ දෑ. පාරා: පා: 45[33] ස: පා: 216[33]

අනිස්සාරිත (නා) (න + නිස්සාරිත) (නි + √සර ඉ + ත)= බැහැර නො කළ. ඉවත් නො කළ. වි: වි: ටී: 510[16]

අනීක (නා)= ඇණිය. බළ සෙනඟ. යුද හමුදුව. (අණීකසී ද දක්නේය) =**දස්සන** (නා) (√දිස + යු=අන; + √දිස=දස්ස)= බළසෙන් දැක්ම. සිවුරඟ සෙන් දැක්මට යෑම. මෙහි අනීක නම් බළ ඇණියයි. එය 1 **භට්ඨානීක** 2 **අස්සානීක** 3 රථානීක 4 **පත්තානීක** යනුවෙන් සිව් වැදෑරුම් වේ භට්ඨානීක නම්; පශ්චිම වශයෙන් ඇතුන් තිදෙනෙකි. අස්සානීක-රථානීක දෙකද, මෙසේ මැයි. පත්තානීක නම්; ආයුධ ගත් පුරුෂයන් සතර දෙනෙකුගෙන් යුක්ත වූයේය. මේ අනීක සතරෙන් එකක් හෝ දැක්ම, දැක්මට යෑම අනීක දස්සන නම් වේ. ක: වි: 119[32] **ක: වී: පි:** 93[16] ස: පා: 634[9] (අණීක දස්සනයි ද දක්නේය)

අනීතික (නා) (න+ඊතික) (ඊති + ක)= උවදුරු රහිත. උවදුරක් නැති. පාරා: පා: 193[25]

අනිහත රතනක (නා)= රජ කිසොවගේ යහන් ගෙය මෙහි රතන නම් මෙහෙසියයි. පිවතට නො ගිය මෙහෙසිය ඇති සයනීඝරය අනිහත රතනක නම් වේ. "රතනං වුච්චති මහෙසී. නීහතන්ති නික්ඛන්තං, අනිහතං රතනං ඉතොයි අනිහත රතනකෙ. සයනී ඝරෙ අත්ථෙ' ස: පා: 654[2] ක: වි: පි: 115[16] ක: වි: 141[13] (අනික්ඛන්තරාජක බලනු)

අනියානික කථා (නා)= අනෙසීනීක කථා. නීවණට නො පමුණුවන කථා. සිව්පසය පිළිබඳ කථා. ස: පා: 723[29].

අනීලක (නා) (න + නීලක)= මැස්සන් නැති. මැසි පිළවුන් නැති. පිරිසුදු වූ. "සෙය්‍යථාපි බුද්ධ මධුං අනීලකං" පාරා: පා: 6[35] ස: පා: 122[25]

අනිහත කම්ම (නා)= දෙළොස් උකෙකාටන යන්ගෙන් එකක්. ප්‍රථම විවාදාධිකරණයෙහි ලැබෙන කම්තුයෙන් එකක්. පරි:පා: 17202 සා: පා: 1002[32]

අනු (උ: සා:) 1 පශ්චාදර්ථ 2 භාෂාර්ථ (=බහුල) 3 සාදෘශ්‍ය 4 අනුපරිපාටිය (=තොග සන්සිඳී පැවැත්ම) 5 අනුවෘත්ති 6 හීන 7 අධොභාව 8 අනුගත 9 හීන 10 අවකාශ 11 ලක්ෂණ 12 විප්සා 13 ඉත්ථම්භූත 14 භාගාදි අර්ථයන්හි පවත්නා උපසර්ගයක්. අ: ප: සා: 157[13] රූ: සි: සා: 437[14] -**'කඛර** (නා) (අනු + අකඛර (න + √ඛර + අ) = අකුරක් පාසා. පදසෝ ධම්ම පාචිත්තිය ශික්ෂාපදයෙහි ආපත්ති සාධක එක් අඛරයක්. ''රූපංඅනිච්චං''යන තන්හි 'රූ'කාර මාත්‍රයම අනුපසපත්‍ය හා එක්ව බෙණෙන මහණහට පවිති ඇවැත් වේ. සා: පා: 640[10] -**'අඩමාස** (නා)= අඩ මසක් පාසා, 1 පාමොක් උදෙසිය යුතු කාල සීමාව. ''අඩ්ඪමාසං උද්දෙසං ආගච්ඡන්තී'' - 2 භික්ෂුණී සඞ්ඝයා විසින් භික්ෂුසඞ්ඝයාගෙන් පොහොය පිළිවිසීමට හා අවවාද ලැබීමට ඵළඹිය යුතු කාල සීමාව. ප්‍රා:පු:සා: 13[29] වූ: පා: 399[5] -**කම්පා** (නා)= අනුකම්පාව. දයාව අනුන්ට පැමිණි දුකෙනිදිහට ගන්නා චිත්ත කම්පාව. ''අනුකම්පාති පරදුක්ඛෙන චිත්තකම්පනං'' සා:පා: 207[14]-735[7]පාරා: පා: 426[6]-**ඛේඛප** (නා) (√බිප + ණ)- අනුශාසන දියයුතු කැප බඩු 'අත්තේවාසිකොනාම යංකිඤ්චි අනුඤ්ඤාපිතබ්බං අනුපදා තබ්බං කප්පියභණ්ඩං'' සා: පා: 834[21] මහා: පා: 323[6] -**බුද්ද** 1 (නා) [සංස්කෘත්‍ය > පා: බුද්ද > සිං < කුදු]= අනුක්ෂුද්‍රක, ඉතා කුඩා. ''ඛුද්ද නාම කුඩාය, අනු ඛුද්ද නාම එයට කුඩාය'' කං: ව්: පි: 101[14] -**බුද්ද** 2 (නා)=අනුක්ෂුද්‍රක. ශික්ෂාපද විෂයෙහි දී සතර පරිජි ඇවැත්හැර සෙසු ඇවැත් කුඩා අනු කුඩා වේ. සඞ්ඝාදී සෙසාදිය ක්ෂුද්‍රක වන විට ථුල්ලච්චයාදිය අනුක්ෂුද්‍රක වේ, මේ ක්‍රමයෙන් සියලුම ශික්ෂාපදයන්ගේ ක්ෂුද්‍රානුක්ෂුද්‍රක භාවය වේ කියන ලදී කඞ්ඛාවිතරණී ටීකාවෙහි; 'ඨපෙත්වා චත්තාරි පාරාජිකානි අවසේසානි සබ්බානි සික්ඛාපදානි පරිත්තායෙන ඛුද්දකානි යේව හොන්ති අනුඛුද්දකානිච'' අවසාන වශයෙන් දුෂ්කෘතාපත්තිය ක්ෂුද්‍රක වන විට දුර්භාෂිතය අනුක්ෂුද්‍රක වේ ''සමන්ත භාසනසෙනාසනේ රෙණ මිලින්දරඤ්ඤා පුච්ඡිත වාහතං දුක්කටං මහා රාජ ඛුද්දකං දුබ්භාසිතං අනුඛුද්දකන්ති''- ''ඛුද්ද නම් ථුල්ලච්චයයි අනුඛුද්දනම්පාචිත්තියයි. මෙම නියමෙන් පඤ්චලහුකාපත්තීහු ඔවුනොවුන්ට ඛුද්දානුඛුද්ද නම් වේත්'' කං:ව්:පි: 101[13] වි: ම: 245[23] චූ: පා: 331[16] -**ගමා** (ක්‍රි) (√ගම + ඒ; ඒ=ආ) [සං. අගමත්]= අනුව ගියේය. අනුගමනය කෙළේය අති-**ගච්ඡති** වර්ත-**ගච්ඡති**= අනා:-**ගච්ඡිස්සති**= භවිෂ්‍යති සම්:-**ගන්ත්වා**=**ගන්ත්වාන** පම්:- **ගමනු**=**ගච්ඡතු** පූ: ක්‍රි:- **ගන්ත්වා**. තුං-**ගන්තුං** වක්‍ය:-**ගන්තෝ ගච්ඡමානා**=අනුවයන්නේ. මහා: පා: 14[33] -**ගහණ** (නා)(√ගහ + ණ)= අනුග්‍රහය. නැවත නැවත සඞ්ග්‍රහ කිරීම. ස: පා: 791[31] -**ගහණ තබ්බා** (නා) (√ගහ+එ+තබ්බ)= අනුග්‍රහ කට යුතුය. සඞ්ග්‍රහ කට යුතුය. අති; -**ගහණාති** වර්ත: -**ගණ්හාති** අනා: -**ගහණිස්සති** සම්: -**ගහණෙය්‍ය** පම්: -**ගණ්හාතු** පූ: ක්‍රි: =**ගහණිත්වා** වර්තෘ -**නගහණන්තෝ**= අනුග්‍රහ කරමින්. මහා: පා: 476-1284-6 ප්‍රා: පු: සා: 48[15] ස: පා: 791[31] -**ඡඩ්ඩන** (නා) (ඡඩ්ඩ + ණ්‍යු)= සුදුසු, යහපත් (අනනුවජ්ජ කර බලනු) -**ංවත්ත** (නා)= සුදුසු වත්. සාමීචි කර්මය. මග පිළියෙල කර දීම, පවන් සැලීම, පැනින් විමසීම් ආදිය. ස: පා: 580[15] -**ජානාති** (ක්‍රි) (අනු+√ඤ්ඤ + නා + ති; √ඤ්ඤ=ජා)= අනු දනියි. මැනැවැසි පිළිගණියි අති-**ජානිවති**- **ජානාති** අනා -**ජානිස්සති**. සම්: -**ජානෙය්‍ය**. පම්: -**ජානාතු**. පූ: ක්‍රි: -**ජානිත්වා** කර්ම කා:-**ඤාත** ණ්‍යු: තුං -**ඤාතුං** වක්‍ය -**ජානන්තෝ**= අනුදනිමින්. ''අනුජානාමි, අනුදනිමි.'' මහා: පා:19-22-127-229 චූ:පා: 648 B[9] පාරා:පා:131 -**සැසෙන** (නා) (අනු + √ඤ්ඤ + ත)= අනු දන්නා ලද. පිළිගන්නා ලද. 'අනුඤ්ඤාතොසි මාතා පිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය'' පාරා: පා: 13[23] සා: දා: 496[27] -**උපසම්පදා** (නා) (උප + සං + √පද + ආ)= අනුදත් උපසම්පදාව. ඥප්ති චතුර්ථ කර්මයෙන් අනුදත් උපසම්පදාව.''අනුඤ්ඤාත උපසම්පදාති ඤත්ති චතුත්ථ කම්මෙන අනුඤ්ඤාත උපසම්පදා'' - ''ඤත්ති චතුත්ථ උපසම්පදා නම් භික්ෂූන්ට මෙසමයෙහි දෙන උපසම්පදා යි'' වි: ලූ: 177[8] කං: ව්: පි: 151[11] ස; පා: 172[6] (අඨ්ඨ විධ උපසම්පදා බලනු) -**ංවාසි** (නා) [සං. වාසි] අනුදත් වැහැයි. කර දියල්ලෙහි (=කරබියලි-කරපියලි

සි ද දක්නේය.) ගෙවත් කර කොපුවෙහි ලා පරිහරණය කළ හැකි වැහැස. එක් භාජනීය භාණ්ඩයක්. දෑහැටි දඬු කැපීම් උක්දඬු සැසීම් කටහෑකි වැහැස. ඉන් වැඩි ගස් කැපීම් ආදී අනෙක් මහා කම්මාන්ත කටහැකි වැහැස අභාජනීය වේ එය ගරු බඩු සඞ්ඛ්‍යාවට ගැණේ. "වාසි ආදිසු යාය වාසියා යපෙත්වා දන්තකඨචේජ්දනං වා උච්ඡුතචජ්ජනං වා අඤ්ඤං මහා කම්මං කාතුං න සක්කා අයං භාජනීයා" – "අනුඤ්ඤාත වාසි නාම යා සිප්පිකාඅං පක්ඛිපිත්වා පරිහරිතුං සක්කා නි,' පා: මූ: වි: වි : 2796 චි: ල: 39128 කා: වි: 13826 කා: ටී: පි: 10819 ("මෙහි දූස්වූ වැහැය කුමක් දූසි කියා මින භෙදරක් පවතී. මේ වැහැය නම් දූලිපිහිය නොවේ. දෑහැටිදඬු කැපිය හැකිවූ ද, උක් දඬු සැස්ස හැකි වූ ද , වැහැස බෙදා ගත යුතු බවත්. ගස් කැපීම් ආදී අනික් මහා කම්මාන්ත කට හැකි වැහැය ගරු භාණ්ඩ වන බැවින් නො බෙදි ය යුතු බවත් මෙහි දක්වන ලදී හිඟකේ කපන දූලිපිනියෙන් දෑහැටි දඬු කැපීම් උක්දඬු සැසීම් ආදි කළ කල්හි නැවත එයින් ගසක් කැපීමෙකුත් කළ හැකිවේද? ගස් කැපීම් ආදී මහා කම්මාන්ත කට හැකි දූලිපිහියා කොයි රටේ නිබේ ද? එහෙයින් මේ වැ හැය නම් දූලිපිනිය නොවන බව නිශ්චය වේ.

දූලි පිහියට "වාසි" යන නාමයකුදු පාලි භාෂාවේ අප්‍රසිද්ධිය. බුරු- බුරසිපාටිකා- "න භික්ඛවෙ නහාපිත පුබ්බකෙන ඛුර හණ්ඩං පරිහරිතබ්බං" – "ඛුරගොසෙව අරඤ්ඤං පාපුණි" යන ආදී බොහෝ තන්හි පැණෙන ඛුර ශබ්දයම දූලිපිහිය සඳහා ව්‍යවහෘත බවත් සිංහල භාෂාවෙහුදු. "**ඝරය-ඝරගල- කර කොපුව කරගෙහි** ම රහත් බවට පැමිණි යේය" යන ආදි තන්හි පැණෙන ඛුර ශබ්දයෙන් බිඳි ආ 'කර" යන්න එයට සාඤ්ඤ වශයෙන් වැඩිදුරටත් ඉදිරිපත් කළ හැකි බවත් සැලකිය යුතුයි.

එසේ වී නම් වැහැය කවරේ දූසි නිශ්චයට යා යුතුය. දූන් වැය ය යි ව්‍යවහාර කරණු ලබන භාණ්ඩය හා ලොකු කුඩා පිහියා ද මෙයින් ගත යුතු බව හැඟේ. දෑහැටි දඬු කැපීම් ආදී සුළු කම්මාන්ත පමණක් කළ හැකි කුඩා පිහියා බෙදා ගත යුතු බවත් ලොකු පිහියා හා වැ ගරු භාණ්ඩ වන බවත් එකල නිශ්චය වේ. වැහැය යන්නෙන් පිහියා ගත යුතු බවට තවත් වැදගත් සාක්ෂ්‍යයක් ඇත. එනම් මේ ගරුභාණ්ඩ විනිශ්චය කථාවෙහි භික්ෂු නමක්හට අභිශයින් ප්‍රයෝජනවත් භාණ්ඩයක් වූ පිහිය ද ඇතුළත් විය යුතුමය. එය විශෙෂ නාමයකින් ඇතුළත් නො කරණ ලද බැවින් හා දෑහැටි දඬු කැපීම් ආදී ක්‍රියා වන්ට ප්‍රයෝජනවත් ය යි කී බැවින් ද 'වාසි" යන්නෙන් ම එය සඞ්ගෘහීත ය යි හැඟේ. අට පිරිකරට අයත් "වාසි" දූලිපිහියම ය යි නිශ්චය කොට ගතහොත් කරනැවැම් කුල යෙන් පැවිදි වූවන්ට අට පිරිකරක් නො ලැබේ. "න භික්ඛවෙ නහාපිත පුබ්බකෙන ඛුරහණ්ඩං පරිහරිතබ්බං" යන්නෙන් 'මහ ණෙනි, පෙර කරනැවැම් වූවහු විසින් කර බඩු පරිහරණය නො කටයුතුය යි වදළ බැවින් දූලිපිහිය පාවිච්චි කරන්නට ඔවුන්ට අවකාශයක් නැත එකල්හි ඔවුන්ට ලැබෙන්නේ සත් පිරිකරක් පමණකි" ගා: හ: වි: 264 දෑහැටි දඬු කපා හැණීමාදියට නියම කළ වැහැය වෙනුවට ලක්දිව වැසි භික්ෂූහු හිස රවුල් කපා ගැණීමට; අනු දූන වදළ දූලිපිහිය පරිහරණ කරති. එය එසේ ම නම් **"න භික්ඛවෙ නහාපිත පුබ්බකෙන ඛුරහණ්ඩං පරිහරිතබ්බං"** යනාදි ශික්ෂාවෙන් කරනැවැම් කුලයෙන් පැවිදි වූ භික්ෂූන්ට දූලිපිහිය කරගල කරකොපුව ආදි සියලු ඛුර භාණ්ඩය තහනම් කළ හෙයින් ඒ භික්ෂූන්ට අෂ්ට පරිෂ්කාරයක් නො ලැබේ. අට පිරිකර සවිකුලික භික්ෂූන්ට ම අයිති හෙයින් ඊට දූලිපිහිය අයිතිය යි සිතීම ආගම විරෝධ ආචිණ්ණ කිලුටක් වේ. දූලිපිහියට වාසි යන නාමයක් ද පාලි භාෂා යෙහි අවිද්‍යමානයි. **"දන්තකඨචේජ්දන වාසි- බුදුකවාසි** යන නම්වලින් දක්වන ලද අට පිරිකරට අයත් වැහැය නම් අර්ථකථායෙහි දක්වන ලද දෑහැටි දඬු උක් දඬු කසපැන් ආදී කන බොන දෙය හා මකස කුරි දඬු ඇඳ පුටු පා අවයවාදිය ද කපා කොටා ගැණීම් ආදියට සෑහෙන ගරු භාණ්ඩ නොවන යම් කිසි ආයුධයෙකි. ඒ බව **"යාය කායචි ආකාරය කත වාසිචෙව"** යන අර්ථ කථායෙන් මනාව ප්‍රකාශ වේ. එය වනාහි සමගර පින්වතුන්ගේ

මතයෙන් දණ්ඩක ශාසනය යි ද, එය මෙකල ව්‍යවහාර වන ලොකු දුනු පිහිය යි ද සල කති" නී: ශී: 35^{22}-

අට පිරිකරට අයත් පරිෂ්කාර වස්තූන් ගෙන් එකක් පාසා කාය පරිහාරි ය-කුවජී පරිහාරිය' යනුවෙන් දෙ වැදෑරුම් ප්‍රයෝජන යක් ඇත්තේය. එසින් "වාසි" නම් පරිෂ් කාරයෙහි දෙවැදෑරුම් ප්‍රයෝජනය දක්වනු යේ. "**වාසිපි තාය දනනඤඤවෙජදන කාලෙ මසඤවපිඨානං අඞ්ගපාද ච්චර කුවිදණ්ඩක සඡජන කාලෙ ච කාය පරිහාරිකා හොති. ලවුඡවෙජදන නාළිඤෙරාදි තවජන කාලෙ කුවජී පරිහාරිකා**" යනුවෙනි. මෙහි කරකම් කිරීම එසින් ලැබෙන ප්‍රයෝජනයක් මෙන් නො දක්වන ලදී. මේ කරුණු අනුව වාසි නාමයෙන් දැළිපිහිය ගැණීම වැරදිය: සූ: වි: 1436) -ංදණ්ඩ (නා)= අනුදත් වැයෙහි දඬ. කරවියල්ලෙනි ලා පරිහරණය කටහැකි අනු දත් වැයෙහි දණ්ඩ. එක් භාජනීය භාණ්ඩයක්. කු: සි: ස: 109^{12} **-කාප** (නා) (√තප + ණ)= පඤ්චාත්තාපය. පසුතැවිල්ල. අ: ප: ස: 24^{31} **—ථූනඤෙනා** (නා)= තතනන්නේ හෙවත් කොඳුරන්නේ. ජා. අ: ගැ: 182^{15} **-ථෙර** (නා) [සා. ස්ථවිර > පා: ථවිර > පා:ථෙර]= අනුතෙර, මහතෙරුන් අතතුරුව හුන් තෙර. **ස:** පා: 903^{37} **-දඤෙසති** (ක්‍රි) (අනු + √දිස + ණෙ + ති; √දිස=දස්ස)= සුදුසු පරිදි අර්ථය දක්වයි. නැවැත නැවැත දක්වයි. වූ: පා: 168^{16} ස: පා: 88^{17} **-දහති** (ක්‍රි) (අනු + √දහ + ති)= පෙළයි. හිරිහැර කරයි, වි: ල: 315^{10} **-දිනං** (නා)= දිනපතා. දවසක් පාසා. **-දූත** (නා)= තමා සමග යන දූතයා. ගිහින්ට ආක්‍රොශකිරීම නිසා පවිසාරණීය කර්මය කළ භික්ෂුවගේ ඇවැත් පිළිගැන්ම පිණිස එම භික්ෂුව සමග යන භික්ෂුව. පවිසාරණීය කර්මය කළ භික්ෂුව තමන් ආක්‍රොශ කළ ගෘහසථයාගෙ පෙණෙන තෙක් මානයේ සිට එහෙත් නො ඇසෙන පරිදි අනුදූත භික්ෂුව සමග ඇවැත් දෙසීමෙන් ඒ ගෘහසථයා කෙරෙහි කළ යුතු. ඉන් පසු කර්මය පවිප්පසසවහානය පිණිස සඞ්ඝයා අඇදිය යුතුය ආක්‍රොශ කළ ගෘහසථයා ඉදිරියේ දෙසන ඇවැත් පිළිගැනීම පිණිස අනුදූත භික්ෂුව සමග යා යුතුය. "ගහපතිනො දසසනූ පචාරං අවිජහා පෙඤා සවණූපචාරං විජහා පෙඤා —පෙ— සා ආපත්ති දෙසාපෙතබබා ති" – "පටිසාරණීය කම්මකතසස භික්ඛුනො අනුදූතො දූතබෙබාති" චූ: පා: 40^{25} – 43^{811} ධ: අ: ගැ: 138^{3} වි: වි: ටී: 448^{12} **-දයා** (නා)= අනුකම්පාව. කරුණාව, පාරා: පා: 42^{6} **-කා** (නා)= කරුණාව ඇති බව. ස' පා: 207^{13} – 408^{13} **-දඛංසන** (නා) (අනු + √ඛංස + යු= අන)= චොදනා කිරීම. පාරාජිකවසතුවකින් චොදනා කිරීම. යම් කිසි භික්ෂුවක් භික්ෂුව කගේ ඉදිරියෙහි සිට සස්නෙන් චුත කරවන අදහසින් "තවං මෙථුන ධම්මං පතිසෙවි" යනුවෙන් හෝ "අසසමණොසි" ආදී පදයන් ගෙන් හෝ චොදනා කිරීම. මේ අදහස් ප්‍රකාශ වනසේ හසතමුද්‍රාවෙන් තමන් හෝ චොදනා කිරීම. අනෙකකු ලවා හෝ චොදනා කර වීම. ක: වි: 41^{39} – 42^{7} සං: පා: 423^{11} (අනුඛ්ධංසෙති බලනු) **-ංඅධිප්පාය** (නා)= චොදනා කරන අදහස. වි: වි: ටී: 238^{6} ස: පා: 419^{8} **-දඛංසෙති** (ක්‍රි) (අනු + √ඛංස + ණෙ + ති)= චොදනා කරයි. චොදනා කරවයි. ගුණ මකයි, මැඩ පවත්වයි. දුට්ඨදොස සඞ්ඝාදි සෙසාපත්තියට ලජ්ජිවන පරිදි භික්ෂුවක් සස් නෙන් චුතකරවන අදහසින් "තවං මෙථුනං ධම්මං පතිසෙවි" හෝ "අසසමණොසි" යනාදි වචනයෙන් චොදනා කරයි හෝ කරවයි. අතී: -දඛංසෙසි වතී: -දඛංසෙති අනා: -දඛං සෙසසති සම්: -දඛං සෙයය පම්: -ංදඛ සෙතු පූ ක්‍රි: -දඛංසිසසා=දඛංසෙසා අතී කිං: -දඛං සිංසෙතා වසා: -දඛං සෙණෙනා= චොදනා කර මින් ක: ව: 42^{10} – 44^{18};පාරා: පා: 194^{11}–14 -200^{16} ම: පූ: 611^{28} ස: පා: 421^{31}–4231_{1} **-ධම්ම** (නා) 1 අනුධර්මය. වත, පැවැත්ම; "අයං තත්ථ සාමීචි අයං තත්ථ අනුධම්මතා, 2 ඔසාරණ කර්මය. 3 අර්ථානුරූප ධර්මය. 4 විදර්ශන භාවනාව. 5 ශීල විසුද්ධි ආදිය 6 ආර්ය මාර්ග ඵල ධර්මය. 7 ලොකොත්තර ධර්මයට අනුගත වූ සවභාවය. ම: පූ: 78^{5} වි: වි ටී: 828 වි: ම: 244^{21} පාරා: පා: 253^{19} උ: අ: 67^{38} සූ: නි: ආ 84^{13} – 354^{15} **-චාරී** (නා (√චර + ණී)= ධර්මයට අනුව හැසිරෙන්නා. ලොකොත්තර ධර්මයට අනුව පිළිපදින්නා, විදර්ශනා භාවනාවෙහි යෙදෙන්නා. ධ: අ: ගැ: 59^{4} සූ: නි: අ: 84^{11} **-ධාවති** (ක්‍රි)= දුවයි අනුව දිවෙයි. ධ: අ: ගැ: 151^{8}—**නාම** (නා)

අනෙනා (නා) [සං. අනන්තර්]= අභ්‍යන්තරය, ඇතුළත 1 සමීප 2 අවසාන 3 පදපූරණ 4 ශරීරාවයව 5 භාග 6 විනාශ 7 මර්‍යාදා 8 ලාමක යන අර්ථයන්හි වැටෙන අනන්ත ශබ්දය අ: ප: ස: 104^{30} (අනන්තබලනු) **-අටට** (නා=) අවල්ල ඇතුළත. උද්දෙසිත ශික්ෂාපදයෙහි චීවර නික්ෂේපයට සුදුසු ස්ථාන පස්ලොස්සෙන් එකක්. ''අටට නම් සතුරු රජුන් වැළැක්ම පිණිස ගඩොලින් කළ යන හිතුනි ඇති සිව්මහල් හෝ පස්මහල් ගෘහ විශෙෂයයි'' පාරා: පා: 233^{16} ස: පා: 472^{3} චී: ම: 145^{14} නා: චි: 58^{3} (කඨිනය නොඅතුළ නිස්සුවක් සඞ්ඝ සම්මුතියක් නැතිව ඉවූ තුන් සිවුරෙන් අත්පසින් වෙන්ව එක් අරුණකුදු නැණි නම් උද්දෙසිත ශික්ෂාපදයෙන් නියති පවති වේ. මෙහි චීවර නික්ෂේපයට (සිවුර තැන්පත් කිරීමට) සුදුසු ස්ථාන පස්ලොසකි. **1 ගාම** (නම්) 2 **නිවෙසන** (=ගෘහය) 3 **උද්දෙසිත** (=යානවාහනාදි බඳු සඹන ශාලාව) 4 **අටට** (=අවල්ල) 5 **මාළ** (=එක් කැණි මඩුලු ගත් සිව්රස් ගේ) 6 **පාසාද** (=දිග්ගෙය) 7 **හම්මිය** (=මිතුයෙහි සඳලු සහිතව කළ මුණ්ඩවර්ජනා ප්‍රාසාදය) **නාවා** (=කැව) 9 **සතට** (=පාමඟ සහ ගැල් යන මඟ) 10 **ඛෙත්ත** (=කුඹුර) 11 **ඛඤ්ඤකරණ** (=කළවිට) 12 **ආරාම** (=පුෂ්පාරාම හෝ ඵලාරාම) 13 **විහාර** (=ආවාසය, ඉගය සිද කියති) 14 **රුක්ඛමූල** (=ගස්මුල) 15 **අඡ්ඣොකාසය** (=අභ්‍යවකාසය) යනු ඒ පස්ලොසයි. මේ පස්ලොස් **නික්ඛෙපසථානයෝ** එකුපචාර, නානුපචාර යනුවෙන් දෙ වැදෑරුම් වෙත්. එයින් 1 ගාම, නිවෙසන, උද්දෙසිත ඛෙත්ත - ඛඤ්ඤකරණ - ආරාම - විහාර යන සප්තකයෙ; **පරික්ඛිත්ත අපරික්ඛිත්ත** යනුවෙන් ද; 2 අටට-මාළ-පාසාද-හම්මිය-නාවා-සතට-රුක්ඛමූල යන සප්තකය **එක කුල-නානා කුල** යනුවෙන් ද; 3 **අඡ්ඣොකාසය; සමානා, සන්තඛයන්තර, සන්තඛයන්තරමනා** පරං යනුවෙන් ද දෙවැදෑරුම් වේ. මෙයින් ගාමාදින් යම්කිසි පවුරකින් හෝ වැටකින් හෝ දිය අගලකින් හෝ **පරික්ඛෙප කරන** ලද්දේ එකුපචාර නම් වේ පරික්ඛෙප නොකරන ලද්දේ නානුපචාර නම් වේ. අටවාදින්හි එක කුලයකගේ හෙවත් එක රජකුගේ හෝ ග්‍රාම භොජකයකුගේ ගම එකුපචාර නම් වේ. නානා කුලයන්ට අයත් වූයේ නානුපචාර නම් වේ. අඡ්ඣොකාසයෙහි එකුපචාරය නම් මැද සිටිහඳු හාත්පස අබ්භන්තර සතක් ඇත්තේසි. හෙවත් එක්කෙළවරක සිට අනික් කෙළවරට දුර අබ්භන්තර තුදුසක් ඇත්තේසි. ඉන් ඔබ නානුපචාරවේ. අබ්භන්තරයක් අටවිසිරියනකි. විභංග සමංගනිපඨසංදිභා ථිනය අට්ඨවාවෙන් සහ විනයපඨ මඤ්ජුසාවෙන් දත්තේය) පාරා: පා: 233^{16} ස: පා: 272^{3} කං: 58^{4} චී: ම: 147^{17} **-අරුණ** (නා=) අරුණු ඇතුළත. අරුණ, ලොකය තිබියදී. ස: පා: 473^{26} (අරුණ කථා බලනු) **-ආපජ්ජති** (ක්‍රි) (ආ + √පද + ණ්‍ය + ති)= ඇතුළතදී ඇවැතට පැමිණෙනු ලැබෙයි. ඇවැතට පැමිණෙන එක් අවස්ථාවක්. **මයඤ්ච** දීන්ගේ උපචාර සීමාවට බැඳ සයනය කරන්නේ ඇතුළතදීම ඇවැතට පැමිණෙයි. පරි: පා: 168^{13} ස: පා: $9197-984^{25}$ **-ආරාම** (නා)= ආරාමය ඇතුළත. විහාරය ඇතුළ පුෂ්පාරාමය හෝ ඵලාරාමය ඇතුළ. උද්දෙසිත ශික්ෂාපදයෙහි චීවරනික්ෂේපසථාන පස්ලොසින් එක් තැනක්. පාරා:පා: 234^{25} ස:පා:472^{17} කං:චී:58^{3} චී: ම: 145^{25} (අනෙනා අටට බලනු) **-උද්දෙසිත** (නා)= භාණ්ඩශාලාව ඇතුළත. යාන වාහනාදි භාණ්ඩ තිබෙන ශාලාව ඇතුළ. උද්දෙසිත ශික්ෂාපදයේ එක් චීවර නික්ෂේප සථානයක් පාරා: පා: 233^{17} ස: පා: 472^{1}, අ: ප: ස: 30^{26} චී: ම: 345^{15} **-උපචාර සීමා** (නා)= උපචාර සීමාව ඇතුළත. උපචාර සීමා නම්; වැටක් හෝ ප්‍රාකාරයක් ඇති විහාරයෙහි ඒ වැට හෝ ප්‍රාකාරය ද, එසේ නොමැති විහාරයක නම් විහාර භූමියේ පරික්ඛෙපයට සුදුසු තැනින් පිරිසුන් මායිම් ද. වේ. තවද භික්ෂූන් තිතර රැස්වන තැන හෝ කෙළවර පිහිටි බොජ්ඣන් හල හෝ නිතර වසන ආවාස

යේ හෝ සිට ශක්තිමත් මධ්‍යම පුරුෂයකු විසින් ලෙඩඩුපෑත දෙකක් විසිකළ කල අවසාන ලෙඩඩුපෑතයාගේ නැවතීම් ස්ථානය ඇතුළත හෝ වේ. එබඳු උපචාර සීමාව ඇතුළත අනෙතා උපචරසිමා නම්. "අපි ච භික්ඛුනං ධුව සන්නිපාතඨානතෙතා වා පරියනෙතඨිත මහාජන සාලතෙතා වා නිබඩ වසනක ආවාස ෙතාවා ඨාම මජ්ඣිමසස පුරිසසස විත්තං ලෙඛවු පාතානං අනෙතා උපචාර සීමාති වෙදිතබබා. සා පන ආවාසෙ වඩ්ඪමානෙ වඩ්ඪති හායමනෙන හායති, යොජන සතමපි උපචාර සීමාවහොති" (මෙහි පරිසෙපයට සුදුසු තැන නම් විහාර පසිත්තයෙහි හත්ථසාලා ගිලන්හල් ආදි සෙනස්නෙහි පිරිබෙව් ඇත එහි හෝ නැත දිය හෙමෙහි සිට මාගම් දැමූ බදුන් දෙවි දිය හෙනතැන හෝ සෙනස්නෙන්දුරුවූ චෙතය ඔහණ බොධ්‍යඔහණයෙහි හෝ සිට බල මැදුම් පිරිමියකු අත් පහරා බල පමණින් දැමූ ඕටි ශෙන් ගන්නා පහණක් ගෙන තන්හි පරිසෙ පසථාන නම්") ක: ව්: පි: 40³¹ ස: ප: 84²³⁰ ම: ප: ස: 50³⁴A ක: ටී: 59¹¹-11⁷³² ව්: ම: 234²⁸ **-කුවජී** (නා)= කුස ඇතුළත: ඇතුළු කුස. **-කොට්ඨාගාරික** (නා) (කොට්ඨාගාර + ණික)=ඇතුළත කොටුගුළු ඇති. විහාරය ඇතුළත කොටුගුළු ඇති. පාරා:ප: 280⁹ස:ප: 515³⁶ **-ගබ්භ** (නා)= ශෂතුය ඇතුළත. කුඹුරු ආදී කෙත් ඇතුළත. උදෙසික ශික්ෂාපදයෙහි චීවර නිශෙසපයට නියමිත එක් ස්ථානයක්. පාරා: ප: 234¹⁴ **-ගඩ** (නා) [සං. අන්තර්ගත > පා= අනෙතාගධ > අනෙතාගඩ?]= ඇතුළත්. ඇතුළත් කොට "අනෙතාගධ ථෙරවාදන්ති ආහ ථෙරවාදෙපි අනෙතාකත්ථන්ති වුත්තං හොති" ව්:වි:ටී:64 **-ගබ්භ** නා= 1 ඇතුළු ශබ්. ඔවරකය ඇතුළත. 2 ඇතුළු කුස. කුස තුල. **-ගාම** (නා)= ඇතුළු ගම්, ගම ඇතුළත. පරිශෙපයෙන් වට කළ ගම් ඇතුළත උදෙසා සින ශික්ෂාපදයෙහි චීවරනිශෙසපයට යොග්‍ය එක් ස්ථානයක්. මෙහි ගම නම් එක් රජෙකුට හෝ ගම් මුදළියකුට අයිති ගම හා යම්කිසි පවුරකින් හෝ වැටකින් අගලකින් හෝ හාත් පස පිහිටි නදි තළාකාදි ජලාසයකින් හා පිරිකෙවී කළ ප්‍රදෙශයයි. එබඳු ගම් ඇතුළත. "අනෙතාගාමෙ වාසපථාය උපගතෙන අධිට්ඨිතං සඩ්ඝාටිං විනා සෙස චීවරෙහි පල්ලපි කාය නිසීදිතුං වට්ටති" කු:සි:ස: 114¹⁶ පාරා: පා: 232³⁴ ස: පා: 471²⁵ ව්: ම: ටී: 151³⁰ 86²⁸ ව්: ම: 14³⁵ **-චීවරහොග** (නා)= ඇතුළු සිවුරු ගබ. සිවුරු ගබතුළ. ඛ: අ: ගැ: 207²⁹ **-ජඳන** (නා)= ජදනය ඇතුළත. පියස්ස ඇතුළත. ඛ: අ ගැ: 176¹⁴ **-ජාණ** (නා)= සෙවණ ඇතුළත. සෙවණ පැතුරුණු පෙදෙස ඇතුළත. උදෙදාසින ශික්ෂාපදයෙහි චීවරනිශෙසපයට සුදුසු එක් ස්ථානයක්. පාරා: පා: 235³ ස: පා: 472¹⁹ **-ජීදු** (නා = ඇතුළත සිදුරු ඇති ව්: ව්: ටී: 352⁸ **-ජන** (නා)= ඇතුළු ජනයා. පිරිවර. **-ජාත** (නා)= එනම් දැසයා. සිව් වැදෑරුම් දැසයන්ගෙන් එක් දැසෙක්. සිය ගෙදර දැසියගේ පුතා. උතපතතියෙන් දැසයා පැවිදි නොකළ යුත්තෙක්. මෙබන්දකු පැවිදි කරන්නහු විසින් ඔහු දැස චාරිත්‍ර අනුව අදැසයකු කොට පැවිදි කරවිය යුතු. "පඩඩාජෙතබබා තත්ථ තත්ථ චාරිත්තවමෙන අදාසං කත්වා පඩඩාජෙතබබා" ස: පා: 26¹¹⁵-74⁷¹⁴ ව්: ව්: 216 ව්: ලං: 159¹⁸ අ: ප: ස: 70¹² **-දසාහ** (නා) (දස + අහ)= දස දවසක්. අධිට්ඨාන-විකපපනුපග චීවර හා පාත්‍රය නිසඟි නොවනු පිණිස ඉවීමට හා විකපිමට සුදුසු කාලය. අතිරෙක චීවරය හා පාත්‍රය ලැබ දස දවස ඇතුළත අධිෂ්ඨාන කෙරේ ද, විකල්පනය කෙරේ ද, ඒ භික්ෂුහට අනාපත්තිය. එසේ නොව යම් දවසක සිවුර හෝ පාත්‍රය ලැබුණේ නම් එදවස අරුණ පමන් එකොළොස්වන අරුණ නැගෙන තෙක් නොඉවා විකල්පනය ද නොකොට ළඟ තබාගෙන සිටියොත් දස දවස ඉක්මීමෙන් නිසඟි වේ. නිසඟිය නම් අනිකකුට නිස්සජ්ජනය හෙවත් පැවැරීම කටයුතුය යනුයි "ඉදං මෙ භනෙත චීවරං දසාහාතික්කනතං නිස්සඤ්ඤියං, ඉමාහං සඩ්ඝස්ස නිස්සජ්ජාමි" යි සඩ්ඝයාට හෝ "ගණස්ස"යි ගණයාට හෝ "පුග්ගලස්ස"යි යොදු පුද්ගලයකුට ෝ නිස්සජ්ජනය කොට "අහං භනෙත එකං නිස්සඤ්ඤියං පාචිත්තියං ආපන්නොා. තං පටිදෙසෙමි"යි ඇවැත් දෙසන්නේය. ස: පා: 463²⁴-467¹⁰ ප්‍රා: ව: 128²⁰ **-දවාදස භත්ත** (නා)= දෙළොස් දිනක් ඇතුළත රඳන්නක් නොවන පරිදි ප්‍රකෘති වචනය ඇසිය යුතු දුර. ස: පා: 644²⁰ **-ඔසැඳකරණ** (නා)= කලවිට ඇතුළත

උද්දෙසික ශික්ෂාපදයෙහි චීවර නික්ෂේපයට සුදුසු එක් සථානයක්. පාරා: පා: 234²⁰ ස: පා: 472¹⁷ වි: ම: 145¹⁴ (අනෙනා අටව බලනු) **නගර** (නා)= නුවර ඇතුළත. නගරය තුළ. වි: වි: ටී: 163³⁴ **-නදී** (නා)= නදිය තුළ. වි: වී: ටී: 415³⁴-418²⁰ **-නාවා** (නා)= නැව තුළ. උද්දෙසික ශික්ෂාපදයෙහි චීවර නික්ෂේපයට සුදුසු එක් සථානයක්. ගොඩ තුබූ නැව තුළ හෝ දියෙහි තුබූ නැව තුළ. පාරා: පා: 234¹⁶ වි: ම: 145³³ **-නිමුග්ගෝ ඔපා සිනි** (නා)= දිය ඇතුළත ගිලී වැඩෙන ප: සු: 150¹-269⁸ **-නිවේසන** (නා) (නි + √විස + යු=අන)= ඇතුළු නිවෙස්න. **නිවෙස්න** තුළ උද්දෙසික ශික්ෂාපදයෙහි චීවර නික්ෂේපයට සුදුසු එක් සථානයක්. භාණ්ඩාගාරාදිය නැති ගෘහ විශෙෂය. මෙහි "නිවෙසන" නම් "නිවෙසානන්තී උද්දෙසිකාදිනං වසෙන අකතාය පටිඤ්ඤය විඤ්ඤාපනං අධිවචනං" වි: ම: 145¹² පාරා: පා: 233⁸ **-පක්ඛ** (නා)- ඇතුළත පිසූ. අකැප කිළිය ඇතුළත පිසූ යාවකාලිකය සහ යාමකාලිකය අකැප බිම්හි සහසෙය්‍ය පොහොනා ගෙයි තැන්පත්ව තුබූ සඞ්ඝික වූ හෝ පෞද්ගලික වූ හෝ යාවකාලිකය හා යාම කාලිකය. අකැප කිළියෙහි පිසනලද්දේ අනෙනා පක්ඛ නම් වෙයි. "සදපි ආනන්ද අනෙනා වුත්තං තදපි අකප්පියං. යදපි අනෙනා පක්ඛං තදපි අකප්පියං" මහා: පා: 245³² ස: පා: 815²⁴ සි: ව: වි: 52²³ කු: සි: ස: 40¹⁴ ප: මු: වි: වී: 105²⁸ බු: සි: ටී: 64²³ (අනෙනා වුත්ත බලනු) **-පරිභෙඛප** (නා)= පරිභෝජය ඇතුළත. අජ්ඣාවසථය ක: වි: පි. 116³-¹⁰ **-පාසාද** (නා)= ප්‍රාසාදය ඇතුළත. පහය තුළ උද්දෙසික ශික්ෂාපදයෙහි චීවර නික්ෂේපයට සුදුසු එක් සථානයක්. මෙහි "පාසාද" නම් දිග් නෙයයි.. පාරා: පා: 233³⁵ ස: පා: 472⁵ **-පුර** (නා) [සං. අනතඃ පුර]= සිරියහන් ගබඩාව. පරි. පා: ගැ: 69 **-පපවෙසන** (නා) (ප+√විස+යු=අන)= සිරියහන් ගෙට පිවිසීම. එනම් ශික්ෂාපදය. රජු හෝ රජ බිසව පහ නොවූ අනතඃපුරයට පළමු වෙන් නොදන්වා සිරියහන් ගෙහි එළිපත ඉක්මවන භික්ෂුවට පවිති ඇවැත් සිදු වන **අනෙනාපුරපපවෙසන** නම් පවිති ශික්ෂාපදය. ක: වි: පි: 115²⁰ භි: ශි: 193⁴ (අනෙන පුර පපවෙසන යි ද දක්නේය) **-පුරිම පාරුත** (නා)=අනතඃ පුරසත්‍රින්ගේ සථ පෙරවීම. පරිමණ්ඩල ලක්ෂණයෙන් තොර එක් ගිහි පෙරවීම් ක්‍රමයක්. ඇතවුරන් මෙන් දෙඇස පමණක් දක්වා හිස වසා පෙරවුම. ස: පා: 896²⁵ කැ:වි:පි: 457 **-පූති** (නා)=ඇතුළත කුණු වූ. දුශ්ශීල වූ. සීල විපත්තියෙන් ඇතුළත කුණු වූ: වි: මා ස: 139¹⁴ සෑ: දි: 6³⁵⁶ **-මන** (නා)= ඇතුළත පිහිටි සිත් ඇති. නිතරම ඤාන කරන බැවින් ඇතුළත පිහිටි සිත් ඇති. ස: පා: 150⁵ **-මාල** (නා)= එක් කැණි මඩුලු ගත් සිව් රැස් ගේ. උද්දෙසික ශික්ෂාපදයෙහි සිවුරු තැන්පත් කිරීමට සුදුසු එක් තැනෙකි. පාරා: පා: 233³⁰ ස: පා: 472⁴ **-මාස** (නා)= ඇතුළු ඔඝ. මසක් ඇතුළත. **-මුඛ** (නා)= මුඛය ඇතුළත. මුව තුළ. වී: වී: ටී: 135¹⁰ **-රඤ** (නා)= තමන් වසන රට ඇතුළත. රජුගේ රාජධානිය තුළ. පාචි: පා: 292¹⁴ ස: පා: 967¹ කැ: වි: 185⁵ **-ලිත්ත** (නා) (√ලිප + ත)= ඇතුළත ආලෙප කළ. වි: වි: ටී: 229³⁴ **-ලෙප** (නා) (√ලිප + ණ)= ඇතුළත ආලෙප කළ. වි. වි: ටී: 231³¹ **-වඤ්ඤු** නා)= පරිභෝජ කළ වාසනුව තුළ. වි: වි: ටී: 151²⁹ **-වස්ස** (නා) - වස් කාලය තුළ. ඇතුළු වස. ඇතවස. පාචි: පා: 294¹ ජා: අ: ගැ: 132³⁶ **-වුත්ථ** (නා)= ඇතුළත තැන්පත් කොට තැබූ. අකැප බිම්හි සහසෙය්‍ය පොහොනා ගෙයි තැන්පත්ව තුබූ සඞ්ඝික වූ හෝ පෞද්ගලික වූ යාවකාලිකය. එබඳු ආහාරය නොවැළඳිය යුතුය. "තත්ථ සහසෙය්‍ය පහොනකෙ පදෙසෙ වුත්තං යාවකාලිකඤ්ච යාමකාලිකඤ්ච සඞ්ඝිකං වා උපසම්පන්න පුඤ්ඤලස්ස වා සන්තකං අනෙනා වුත්තං නාම හොති. තත්ථ පක්කං නාම යත්ථ කත්ථචි පන සයං පක්කං නාම තං සබ්බං අනජ්ඣොහරණීයං" කැ: වි: 111³³ ස: පා: 815³⁴ මනා: පා: 245³² පා:මු:වි:වි: 105³⁷-163⁴ **-සන්තාහ** (නා) (සන්ත + අහ)= සත්දවස තුළ පා: මු: වි: වි: 102¹⁴ සන්තාහකාලික බලනු) **-සාණි** (නා)= තිරය ඇතුළත. ධ: අ: ගැ: 194²⁴ **-සීමා** (නා)= සීමාව ඇතුළත. ඇතුළු සීමාව. ස: පා: 493¹⁰-979¹⁰-984²⁹ වි: වි: ටී: 265⁸-434³² **-සීමාය ආපජ්ජති** (ක්‍රි)= සීමාව ඇතුළතදී ඇවැතට පැමිණෙයි. වත් නොපුරන ආගන්තුක භික්ෂුව සීමාව ඇතුළත

ඇවැතට පැමිණේයි. "ආගනතුක වත්තං අදාසෙත්වා ස ජිත්තුපාහනෝ විහාරං පවිසනෙනා උපචාරසීමං ඔක්කන්තමත්තෙනාව ආපජ්ජති" සං: පාෘ979[10] 98[1][29] පරි: පා: 175[32] **-හම්මිය** නා) [සං. හම්‍ය]= සඳළු සහිත ගෙය තුළ. මතුගෙහි සඳළු සහිතව කළ මුණ්ඩවඡ්ජන ප්‍රාසාදය තුළ. උදෙදාසික ශික්ෂාපදයෙහි විවරනිස්සෙපයට සුදුසු එක් සථානයක්. පාරා: පා: 231[8] සං: පෘ: 472[5]

අක්ඛි (නා)= අක්ඛියා.ජාත්‍යක්ඛියා. පැවිදි නොකළ යුතු පරිසදූසකයෙක් මහා: පෘ: 101[28] සං:.පා: 770[2] **-කූටඨ කථා** (නා)= එනම් අටුවාව. ආන්ධ්‍ර දෙශීය භික්ෂුවක විසින් හෝ ආන්ධ්‍ර භාෂාවෙන් හෝ කළ සථවිර වාදයට විරුඬ මතාන්තර සඳහන්ව තුබූ අටුවාවක්. සාර: දී: 17[18] වි: වි. ටි: 5[37] **-කාර** (නා)= අක්ඛිකාරය, අඳුර. සිවිරඟ කථවර. සං:පා: 113[27] **-නඛ** නා)= කථවන් කුණු නිය ඇති තැනැත්තා. පැවිදි නොකළ යුතු පරිසදූසකයෙක්. සං: පා: 769[19] වි: වි: 25[11] **-මක්ඛික** (නා)= කනමැස්සෝ. ඩැහැ ලේ බොන මැස්සෝ. වි: මා: සං: 83[38]

අනෙසන (නා) (න+එසන)= සෙවීම. නුසුදුසු අයුරින් ප්‍රත්‍යය සෙවීම. එක්විසි **අනෙසුන්**. එක්විසි අනෙසුන් නම්; 1 වෙළඳුන 2 පත්තදුන 3 පුප්ඵදුන 4 ඵලදුන 5 සිනානදුන 6 දන්තකඨදුන 7 වාටුකම්මතා 8 මුඛසුපපතා 9 පාරිහාවකතා 10 ජඞ්ඝපෙසනික යන දසය ද, 11-16 **ආජීවහෙතුවෙන්** පණිවනලද ශික්ෂාපද හැට්කය ව්‍යතික්‍රමණය කිරීම ද, (අජඞ්ඝා ජීව බලනු) 17 කුහනා 18 ලපනා 19නෙමිත්තිකතා 20 නිප්පෙසිකතා 21ලාහෙනලාභං නිජිගිංසනතා යන පසද ඇතුළත් එක්විස්ස. එහි **වෙළඳුන** නම් හුණපත් ඇ දීමයි. **පත්තදුන** නම් පලා ආදිය දීමයි **සිනාන දුන** නම් නහන සුණු දීමය. **වාටුකම්මතා** නම් නිව වෘත්තියයි හෙළත් පහත් පැවැත්මයි. **මුඛසුපපතා** නම් සිත් ගන්නා පිණිස බොරු හා සබාගෙන් යුක්ත තෙපුල් බිණීමයි. **පාදිහාරක කථා** නම් සිත් ගන්නා පිණිස දරුවන් වැඩීමයි. **ජඞ්ඝ පෙසනික** නම් මෙකෙවර කොට ඇවිදීමයි. **නොමිත්තනකතා** නම් ප්‍රත්‍යය උපදවා ගනුපිණිස අනුන්ට කියන කරන කාය වාක් කර්මයි **නිප්පෙසිකතා** නම් දුන කර්මාන්තයයි. ජා: අ: ගැ: 231[5] වි: මා: සං: 76[4]

අප (උ:සං:)= 1 නිදේශ 2 පරිවර්ජන (දුරුකිරීම) 3පූජා 4 අපගත(=පහවීම) 5 වාරණ-(වැළැක්ම) 6 ද්‍රොහ කිරීම 7 ගතී 8 චොර **කර්ම** යනාදී අර්ථයන්හි වැටෙන උපසර්ගයක්. අ:ප:ස:158[29] රූ:සි:ස; 445[22] **-කාසනති** (ක්‍රි = එක් පක්ෂයකට අදින්. වෙන්කරන් අවුල් කරන් "**සෙ ඉමෙහි අධිකාරණහි වත්තූහි අපකාසනති**" චූ: පා 333[26] සං: පෘ: 94[15] **-ගත** (නා) (අප+√ගමූ+ත)= පහවූ, පහකළ. පු: ලි: **අපගතෝ** ස්ත්‍රී: ලි: **-ගතා** න: ලි: **-ගතං** පාරා: පා: 44[6] සං:පා: 212[33] **-ඤාණක** (නා)= පහවූ කථවන් පැහැ ඇති. **ළු-ල්** පුහුලන් නැති. කාළක යෝ **නම්** දුශ්ශීලයෝය. ඔවුහු පැහැයෙන් රන්වන් වූවත් කෘෂ්ණ ධර්මයන්ට අනුව පවත්නා හෙයින් කාළකයෝමය. එබන්දන් නැති පාරා: පා: 9[33] සං: පා: 133[6] (අපහත කාළකයනුත් පාඨයි.) සං: පෘ: 133[8] **-සෙක්ඛ්‍යාසකං** (නා)= බුදුසසුනෙන් පහකරන ලද. ශාසනශාසනයට එකඟ නැති. චූ:පා: 450[13] **-ඝඩක** (නා)= 1 යහපත් ප්‍රතිසන්ධිය නැතිකරන. 2 හීනවූ ප්‍රති සන්ධිය ඇති 3 දෙව්ලොව ඉපදීමට හුසුදුසු 4 නැවත මානා ගර්භයක උත්පත්තියක් නැති. වෙරඤ්ජා බ්‍රාහ්මණයා බුදුන්ට ආක්‍රොශ කළ අට වැදෑරුම් ආක්‍රොශ වස්තූන් ගෙන්එකක්. වෘද්ධයන්ට කළමනා අභිවාදනා දීගෙන් දෙව්ලොව ප්‍රතිසන්ධිය ලැබෙන බවද එය නොකිරීමෙන් හීනවූ ප්‍රතිසන්ධිය ලැබෙන බවද **සලකා** භාග්‍යවතුන් වහන්සේට දෙව්ලොව ප්‍රතිසන්ධියක් නැත යන අදහසින් වෙරඤ්ජා බ්‍රාහ්මණයා "අපගබෝහා භවං ගොතමෝ" යි ගර්හා කළේය. පාරා: පෘ: 5[32] සං: පා: 85[7] සා: ම: 6[16] **-චය** (නා) (අප+√චි+අ; ඉ=එ=අය) 1 කෙලෙසුන් නැසීම 2 පූජාව. පිදීම "අනෙක පරියායෙන අපචයසස වණ්ණවාදී" චූ: පා: 204[5] B. සං: පා: 155[3] සා: දී: 4 5[35] **-චිති** (නා)= පූජාව. පිදීම. අ: ප: ස:18[6] **-දිසිතබ්බා** (නා)= ඇදහිය යුතු. "න අප දිසිතබ්බා, නො ඇද හිය යුතු" පාචි: පා: 137[8] ප්‍රා: ව: 310[32] **-දෙස** (නා) (අප + √දිස + ණ]= 1 නිමිත්ත. 2 ලෙශය 3 කිම. **තෙන අපදෙසෙනාති** තෙන ලෙසෙන අ: ප: ස: 1 14[23] සාර:දී: 796[26] **-නිඛනති** (ක්‍රි) (අප + නි + √ඛා + ණ + නති)= සඟවත්. ඉවත්කොට සඟත්, අති: **-නිඛෙසි** වති: **-නිඛෙති** අනා: **-නිඛෙසති** සම්: **-නිඛෙයය** පම්: **-නිඛෙතු**: **-ප්‍රසම්: නිඛාපෙයය**= අනුන් ලවා සැඟවූයේ නම්: සඟ

එන්නේ නම්: පාචි: පා: 121[15] කැ: වි: 125[3] -මාර (නා) (අප + √මර + ණ)= අපසමාරය. එනම් රෝගය. පිත්තෙනාභාදය හෝ යසෙසා තුමාදය. පඤ්චාබාධයන්ගෙන් එකක්. අපසමාර රොගීයකු පැවිදි කිරීමට හෝ උපසපන් කිරීමට සුදුසු නැත. උපසම්පත්තියට අන්තරායකර ධර්මයක්. "අපපමත්තකෝපි අපමාරෙ ඨානා න පබ්බා ජෙතබ්බා" සැ: පා: 744[9] මහා: සා: 80[19] -ඤ්ඤ= අපසමාර රොගියා. එම රෝගයෙන් පෙළෙන්නේ. හීන රොගියා. ඔම්සවාද පාචිත්තිය ශික්ෂාපදයෙහි නිදානකථාවෙහි ඇවැත් අවදීන පහත් රොගයක්. පාචි: පා: 107 මහා: පා: 103[14] ම: පා: සා: 315[32] -ලා ළෙතති (ක්‍රි)= සිත් ගනිත්. සඛ්‍රහ කරත්. "අපලාලෙතීති -පෙ- උපට්ඨාන කරණත්ථෙ සඛගණ්හාති" සැ: පා: 757[7] මහා: පා: 94[27]- අති: -ලාළෙසි වති: -ලාළෙති අනා: -ලාළ සති සම්: -ලාලෙත්‍ය පම්: -ලාලෙතු කම්කෘ: -ලාළෙතබ්බා සත්‍රි ලි: -ලාලෙතබ්බා නලි: -ලාලෙතබ්බං "න භික්ඛවෙ අසඤ්ඤ පරිසා අපලාලෙතබ්බා යො අපලාලෙය්‍ය ආපත්ති දුක්කටස්ස" මහා: පා: 94[28] සැ: පෘ: 757[9] (අප ලාලෙතති - අපලාලෙතබ්බා, අපලාලෙය්‍ය යනුත් පාඨයි. ම: පා: සා: 297[19] -ලෙඛනඛණ්ඩ (නා)= පුසන්කුර. චු: පා: 255[24]-353[27] (අවලෙඛනකණ්ඩ යනුත් පාඨයි.) -ලෙඛනපිඨර (නා)= පුසන්කුරු දමන භාජනය. චු පෘ: 355[25] (අවලෙඛණපිඨර යනුත් පාඨයි.) -ලෙඛනෙති (ක්‍රි)= සුරාදමත්. පුසන් දඩින් වර්ෂ්පිස දමත්. චු: පා: 353[17] අති: -ලෙඛි වති: -ලෙඛති අනා:-ලෙඛි සති සම්:-ලෙඛය්‍ය පම්: -ලෙඛු පූ ක්‍රි: =ලෙඛිත්වා වකෘ: -ලෙඛයෙනා කම්කෘ: -ලෙඛිතබ්බ=පිසදැමීයයුතු. සුරාදැමිය යුතු චු: පා: 353[35]-354[15] (අවලෙඛනති යනුත් පාඨයි චු:පා: B. 292[28])-ලොකන (නා) (අප + √ලුව+ඝඤ; ච=ක)= විචාරීම. ඇසීම. -ංකම්ම (නා)= අපලොකන කර්මය සඞ්ඝයා විචාරා කරන කර්මය, සිව්වැදෑරුම් ඖර්මික කර්මයන්ගෙන් එකක්. සමගි සඞ්ඝයාගේ අනුමතියෙන් ඒ ඒ වස්තුව කිතිනය කොට "රුච්චති සඞ්ඝස්ස," යි තෙවරක් අස්වා කටයුතු කර්මය. අපලොකන කර්මය කිරීමෙහි දී රැස්වූ සඞ්ඝයාගේ අනුමතිය රැගෙන ව්‍යක්ත වූ භික්ෂුවක් විසින් ඒ කරනු ලබන ක්‍රියාව සඞ්ඝයාගෙන් ඇසිය යුත්තේය. නිදසුනක් නම් කණ්ඩක හෙරණහු බැහැර කිරීම පිළිබඳව අපලොකන කර්මවාක්‍යය මෙසේය:- "සඞ්ඝං භන්තෙ පුච්ඡාමි අයං කණ්ටකො සාමණෙරො බුද්ධස්ස ධම්මස්ස සඞ්ඝස්ස අවණ්ණ වාදී. මිච්ඡාදිට්ඨිකො; යං අජ්ජදග්ගෙ සාමණෙරා ලභන්තා දිරත්ත තිරත්තං භික්ඛූහි සද්ධිං සහ සෙය්‍යං තස්ස අලාභාය නිස්සරණං රුච්චති සඞ්ඝස්ස" යනුයි, අපලොකන කර්මය. 1 ඔසාරණ 2 නිස්සාරණ 3 භණ්ඩුකම්ම 4 බ්‍රහ්මදණ්ඩ 5 කම්ම ලක්ඛණ යන පස් තන්හි යෙදේ. "ඔසාරණං නිස්සාරණන්ති වෙත්ථ පදසිලිට්ඨතායෙතං වුච්චතං; පඨමං පන නිස්සාරණා හොති පච්ඡා ඔසාරණාති ආහ" යනු බැවින් මෙහි පළමුව නිස්සාරණය විස්තර කටයුතුය. **නිස්සාරණ** නම්: කණ්ටක හෙරණහු මෙන් දඬුවම් කිරීමෙන් බැහැර කිරීමයි. **ඔසාරණ** නම්: නිස්සාරණය කළවුන්ගේ පසු කලෙක භික්ෂූන්ට අනුකූල පැවතුම් දැක බැහැර කළහු ඇතුළු කර ගැනීමයි. **භණ්ඩුකම්ම** නම්: පැවිද්දවනු කැමැත්තහු ඇසෙන්නා ඉදිරියට පමුණුවා හිසකේ බහනු පිණිස සඞ්ඝයාගෙන් තුන්වරක් හෝ දෙවරක් හෝ වරක් පිළිවිසීමයි "ඉධ ඒ ඉමස්ස දූරකස්ස භණ්ඩුකම්මං ආපුච්ඡාමීතිපි සමණකරණං ආපුච්ඡාමීතිපි ඉමස්ස පබ්බජ්ජනා ආපුච්ඡාමීතිපි අයං සමණෙ හොතු කාමොතිපි අයං පබ්බජිතු කාමොතිපි වත්තුං වට්ටති" යනු විනයත්ථ මඤ්ජූසා කඞ්ඛා විතරණී ටීකායි. **බ්‍රහ්මදණ්ඩ** නම්; භික්ෂූන්ට රළු කරළු බසින් ආක්‍රොශ කරන දෙඩමුළු භික්ෂුවට අවවාද නොදීම් වශයෙන් සඞ්ඝයා තෙවරක් අස්වා චොදනා සාරණා නොම කියයුතුයැයි කරන කර්මයයි. මෙහි චොදනා නම් ආපත්තීන් කීමයි සාරණා නම් ආපත්තීන් නිශ්චය කිරීමයි. **කම්ම ලක්ඛණ** නම්; "කම්මමෙව හුත්වා ලක්ඛියති කම්ම ලක්ඛණං" යනු බැවින් කර්මය ම ලක්ෂණය කොට ඇති කර්මයයි. යම් භික්ෂුවක් උඟුරු විවරණාදි අපසාදකර හෙතූන් නිසා භික්ෂූන් විසින් නොවැන්දා යුතුයයි පණවන ලද්දේ ද, ඒ භික්ෂුවට නොවැඳීම භික්ෂුණී සඞ්ඝයාට ද, රුචි කෙරේයයි මෙහෙණ සස් නෙහි සිවි භික්ෂුණීන් විසින් කරන කර්මයයි. මෙය භික්ෂුණීන ම මුල්ව පණවන ලද්දේ නමුදු අවඡින්න චීවර, ජීර්ණ චීවර, නඨ චීවර, ගිලාන, බහුසුතාදි භික්ෂූන්ට සිවුරු ඇතෙත්

සෙනසුන් ආදිය දෙන්නවුන් විසින් ද, පරිභොග කටයුතු පුද්ග ලික්‍රියා පරිභොග කරන්නවුන් විසින් ද, ආවාස කරණාදිය උදෙසා ඉවත් කළ යුතුවූ වාක්‍යාදි වදනුන් ඉවත් කරන්නවුන් විසින් ද ආවාස පරිග්‍රහ නාදිය උදෙසා එබඳු ධර්මකථාවක් කරන්නවුන් විසින් ද, තෙවරක් අපලොකනය කොට ම කටයුතු වේ. මේ සියල්ල කර්මලක්ෂණයට ම ඇතුළත් වේ අපලොකනයෙන් කරන සම්මුතිය කර්මය. සැතති කම්මයෝ ගරු කම්මයෝ වෙත්. සා: පා: 1039[81]-10,0[5]-1051[1] කැ: වි: 133[47] වි: ම: 249[1] කැ: වි: පි: 104[16] චු: පා: B. v[1] (ඵ: ඉ:) **-ලොකෙනති** (ක්‍රි)= විචාරත්, විමසත්. අසත්. අති- **ලොකෙසි** වති- **ලොකෙති** අනා- ලොකෙස්සති සම්- **ලොකෙය්‍ය** පම්- **ලොකෙතු** පූක්‍රි- **ලොකෙත්වා** වකෘ- **ලොකෙත්වාන** වකර්මකෘ- **ලොකෙතබ්බං** (-ලොකෙම= විචාරමු- **ලොකෙස්‍ස** ම=විචාරන්නෙමු.) පාචි: පා: 307 පාරා: පා: 933-106 **-විදති** (ක්‍රි)= ප්‍රතික්ෂේප කරයි බැහැර කරයි සූ: වි: 2043 **-ලාභන** (නා)= පිරිසුදු කිරීම. සා: පා: 76333 වි: වි: ටී: 38389 **-සඤ්ඤ** (ක්‍රි) (අප + √සක + අ)= ඉවත් වෙව. "අපසක්කතාව හඟිනි" පාචි: පා: 17.4 අති— **සක්කි**= **සක්කෙසි** වති— **සක්කති** අනා— **සක්කිස්සති** සම්— **සක්කෙය්‍ය** පම්— **සක්කෙතු** පූක්‍රි:— **සක්කෙය්‍ය**. "නිස්සිතා අපසක්කන්ති" පාචි: පා: 7226 **-සාදෙති** (ක්‍රි)= තර්ජනය කරයි. අප්‍රසාදකර වචන කියයි වි: වි: ටී: 2229 **-සාදෙසි** (ක්‍රි)= ඉවත් කෙළේය පහ කෙළේය. සූ: වි: 49420 පාචි: පා: 1726 අති— **සාදෙසි** වති— **සාදෙති** අනා - **සාදෙස්සති** සම්— **සාදෙය්‍ය** පම්— **සාදෙතු**. පූක්‍රි- **සාදේත්වා**=සාදෙත්වා වකෘ- **සාදෙත්වාන**. "අපසාදෙතුං= ඉවත්කරන්නට පාචි:පා: 1726 - **සෙසනති**(ක්‍රි)= හේත්තුවෙත් "හිත්තිංඅපසෙසනති,බිත්තියටහේත්තුවෙත්" චූ:පා:B. 1128 චූ:පා 29612 අති- **සෙසෙසි** වති- **සෙසති** අනා- **සෙසස්සති** සම්- **සෙසය්‍ය** හේත්තුවන්නේ නම්; කර්මකෘ= **සෙසිතබ්බා** සත්‍රී- **සෙසිතබ්බා** නපුං- **සෙසිතබ්බං**. "න භික්ඛවේ පරිකම්මකතා භිත්ති අපසෙසිතබ්බා මහණෙනි පිරියම් කරන ලද බිත්තියට හේත්තු නොවිය යුතුයි" චූ: පා: B. 1128 **-සෙසන** (නා)= හේත්තුවීමට ආධාර වන ඇඳපුවු ආදිය සහ රුක් හෝ ටැම්, **භිත්‍ය** පරිභෝගය පිණිස වූ ඇඳපුවු ආදිය ද, හාන්සි වීමට ආධාර වන ටැම් හෝ රුක් ද **අපසෙසන** නම්. සාරා; ම: 3334 පාරා: පා: 7324-761 සා: පා: 3286 කැ: වි: පි: 2377 වි: ම: 8419 **-සෙසන ඵලක** (න)= හේත්තුවන පුවු) රුව. ඵලකය. පිටාටුව, පිටහටුව බංකුව. 'අනුජානාමි භික්ඛවෙ අපසෙසන ඵලකං, මහණෙනි හේත්තුවීමට ඵලකයක් (බංකුවක්) අනුදනිමි,, චූ: පා: B 11315 සා: පා: 328 කැ: වි: පි: 2317

අපකතත්ත (නා) (න+පකතත්ත)= 1 පාරාජිකා පත්තියට පැමිණියහු. 2 ත්‍රිවිධ උත්ක්ෂේපනීය කර්මය කළහු. එක්ව **සඞ්ඝකම්ම** නො කළයුතු පුද්ගලයා. "එවඤ්හි පකතත්තා නාම පාරාජිකං අනාපන්නා අනුක්කිත්තා ච" වි: වි: ටී: 1198 සා: පා: 1865[8]851[2] කැ: සි: සා: 1402[3] (**පකතත්ත** බලනු) **-සඤ්ඤත්ති** (නා)= උත්ක්ෂේපනීය කර්මය කළේය යන සංඥා ඇති. එබඳු හැඟීම් ඇති, සා: පා: 8706

අපච්චුඛාරක (නා) (න + පච්චුඛාරක)= පච්චුඛරණය නො කළ. චීවරප්‍රතිග්‍රාහකයා විසින් නො පසුදුළ. මා සතු වූ මෙය පරිභොග කරව නැතහොත් විහිදවයි යනාදි වශයෙන් පෙරළා නොදුන්. සාරා ම: 1581

අපඤ්ඤත්තත (නා) (න + පඤ්ඤත්තත)= නො පණවන ලද. සූත්‍රානත ක්‍රමයෙන් සහ විනය ක්‍රමයෙන් බුදුන් විසින් නො පණවන ලද. සූත්‍රානත ක්‍රමයෙන් සතිපට්ඨාන තුනක, මාඝාඞ්ග නවයක යනුද, විනය ක්‍රමයෙන් පරිජි ඇවැත් තුනක නිසඟි පවිති එක් නිසඟ යනු ද, නො පණවන ලද කරුණුය. බුදුන් විසින් නො පණවන ලද ධර්මය හා විනය පණවන ලද්දේය යි ප්‍රකාශ කිරීම සඞ්ඝයා බිඳුවන එක් කරුණකි චූ: පා: 33317 සා: පා: 94324 (අට්ඨාරස භෙදකර වත්තු බලනු)

අපටිඝඝහිත (නා) (න + පටිඝඝහිත)= නො පිළිගන්නා ලද, නො පිළිගත්. **-සත** (නා) භික්ෂුව විසින් නො පිළිගන්නා ලද සත් වැදෑරුම් කර්මාකාරයන්ගෙන් එකක්. හොජ්ජා වර්ගයෙහි ප්‍රථම විනය ශික්ෂාපදයන්හි සඳහන් වන භික්ෂුව විසින් දෙනා පිළිගන්නා ලද "අලමෙතං

අපණ්ඩක (නෑ= පණ්ඩක නොවූ. වි: ව: වී: 380[35] කැ: ව: පි: 75[8] (**පණ්ඩක** බලනු)

අපණ්ණක (නා) (න + පණ්ණක)= අවිරුද්ධ. නිවැරැදි වැරැදි නැති. ජා: අ: ගැ: 52[38] **-පටිපදා** (නා = අවිරුද්ධ ප්‍රතිපත්තිය. එකාන්ත ප්‍රතිපත්තිය, නියම මග සැ: පා: 864[9] ව: ම: 123[14] ව: ව වී: 449[22].

අපත්ත (නා) න + පත්ත)= පාත්‍ර නොවූ. පාත්‍ර සඛ්‍යාවට නොගැණෙන. අධිෂ්ඨානය කිරීමට හෝ විකල්පනය කිරීමට නුසුදුසු පාත්‍ර ඌන පඤ්චබන්ධන ශික්ෂාපද වර්ණනාවෙහි සඳහන් මුවව්විත් ඇට දැනුල් රෙඛා පසක් හෝ දස නුල් එක රෙඛාවක් හෝ ඇති මැටිපාත්‍රය සහ මහත් සිදුරු ඇති, පිළියම් කළ ද මට නොවී ආමිසය රැඳෙන යකඩ පාත්‍රය

1 ජාති වශයෙන් යකඩ පාත්‍රය, මැටි පාත්‍ර යයි පාත්‍ර දෙකකි. ' මෙයින් එකෙකක් 1 උත්තරාෂ්ට 2 මධ්‍යම 3 ඔමක යයි ප්‍රමාණත්‍රය යෙන් තෙවැදෑරුම්වේ. එහි 1 උත්තරාෂ්ටපාත්‍රය නම්: තල ඇට ලක්ෂයක් හෝ උඳු ඇට තෙළෙස් පලමක් හෝ නැතහොත් අටපතක් ගන්නා මඟධ නැලියෙන් දෙනැලියක් සහ ලින් පිසූ බත් ද, ඒ බතින් සතරෙන් කොට සක් පමණවූ අතින් ගෙන යා හැකි මුදහ සූප ය ද, ඒ බතෙහි අවසන් පිඬුව දක්වා හැම පිඬුවටම සුදුසුවූ මිත්ස්‍ය මාංසාදි අවුලුද ගන්නා පාත්‍රයයි. 2 මධ්‍යම පාත්‍රය නම් මෙයින් අඩක් ගන්නේයි. 3 ඔමක පාත්‍රය නම් ඉන් අඩක් ගන්නා පාත්‍රයයි මේ පාත්‍රත්‍රය නැවත එකෙකක් තෙමැදෑරුම් වේ. ඒ මෙසේයි. 1 උත්තරාෂ්ඨොත්තරාෂ්ට (=උත්තරචතුරාෂ්ටය) 2 උත්තරාෂ්ට 3 උත්තරාෂ්ටොමක 4 මධ්‍යමොත්තරාෂ්ට 5 මධ්‍යම 6 මධ්‍යමොමක 7 ඔමකොත්තරාෂ්ට 8 ඔමක 9 ඔමකොමක යනු වෙනි මෙහි උත්තරාෂ්ඨ පාත්‍රය නම්; පළමුවි කි දෙනැලියක් සහලින් පිසූ බත් සහ මුදහ සූපඤ ද, එයට සුදුසු ව්‍යඤ්ජනය ද, යම් කිසි පාත්‍රයක බහා හිරටයකින් හෝ හුයකින් එහි මුවව්ව අදනා ලද්දේ එම රාජිය හා ආහාරය සමව සිටිනම් උත්තරාෂ්ට පාත්‍රය වේ. එහි ආහාරය නොගැවේ නම් උත්තරාෂ්ටොමක ද, ඒ රාජිය ඉක්ම පවතී නම් උත්තරාෂ්ටොඩ්ඩ රාෂ්ට පාත්‍රය ද වේ. සෙසු පාත්‍ර දෙකෙහි ද ප්‍රභෙදය මෙසේම දන්නේය. මෙයින් පළමු සඛ්බං"සි කැප නොකළ හොජනය. සැ: පා: 610[38] කැ: ව: 108[10] (අනතිරිත්ත බලනු]

අපටිඤ්ඤත්ත (නා)= ප්‍රතිඤ්ඤත්ත නොවූ, නොසඟවනලද. ඇවැත් නොසඟවූ. වි: ම: 131[5] (**ආපත්ති පටිඤ්ඤත්ත** බලනු) **-ආචාර** (නා)= නොවැසිය යුතු යහපත් ආචාර ඇති සැ: පා: 855[35] ව: ව: වී: 445[10] **-පරිවාස** (නා) (පරි + √වස + ණ)= එනම් පරිවාසය. සිව් වැදෑරුම් පරිවාසයන්ගෙන් එකක්. තීර්‍යක් පරිවාසය. ඇවැත් සැඟවීමක් නැතිව පුරන පරිවාසය. යම්කිසිවෙක් අන්‍ය තීර්‍යක්යෙක්ව සිට එය අත්හැර බුදුසස්නෙහි පැවිදි උපසපන් ලබන්නට කැමැත්තේ වෙයි නම් ඔහුට මාස සතරක් පිරිවෙස් පිරීමට නියම කරනු ලැබේ. මෙහි ඇවැත් සැඟවීමක් නැති බැවින් "අපටිඤ්ඤත්ත" යන නාමයෙන් වෙන්කොට දක්වන ලදි. මෙය බුදු සස්නෙහි භික්ෂූන් ඉසින් නොලබන පිරිවෙසකි. සැ: පා: 859[38] වූ: පා: B. xxix (උ: ග්‍ර:) මහා: පා: 77[35] **-මානත්ත** (නා)=එනම් මානත්ත. සිව් වැදෑරුම් මානතයන්ගෙන් එකක්. ආපත්ති පටිඤ්ඤත්ත නොකළ භික්ෂූන්ට හෙවත් ඇවැත් නැති මහණක්හට පිරිවෙස් නොදී ආපත්තීන්ට පැමිණීම නිසා මානත සඞ්ඝාදිසයට සුදුසු බැවින් දෙන මානත. මානත නම් අබ්භානය ලබාගැනීමට පෙර සඞ්ඝයාට ගෞරව පිණිස සත් සඞ්ඝයා සතුටු කරනු පිණිසත් ඇවැත් අවන් භික්ෂුවකට කරනු ලබන විනය කර්මයකි. මැ: පා: සැ: 173[17] චූ: පා: B. xxxiv (උ: ග්‍ර:)

අපටිජානා (නා) (න + පටිජානා) (පටි + √ඤා= ජානා)= ප්‍රතිඥා නොකරන, නොපිළිගන්නා. ඒ: ව: වී: 254[18] අති:- **අපටිජානි** වර්ත:- **ජානාති** අනා:- **ජානිස්සති** සම්:- **ජානෙය්‍ය** පරි:- **ජානාතු** ප්‍රෂ්ඨ:- **ජානිත්වා** වක්‍ය:- **ජානනෙනා**= **ජානමාෂෙනා**= ප්‍රතිඥා නොකරනු ලබමින්. සැ: පා: 456[18]-457[5].

අපටිසඤ්ඤා (නා) (න + පටිසඤ්ඤා)= ප්‍රතිඥාවක් නැති පොරොන්දුවක් නොගෙන. දඩුවම් පිණිස විනයකර්මයක් පැමිණවීමේදී චුදිතයා ගෙන් ප්‍රතිඥාවක් නොගෙන පැමිණවීම විනය විරෝධී වේ. චූ: පා: 54[15] චූ: පා: B. iv[81] (උ. ග්‍ර:)

වන උත්කෘෂ්ටෝත්කෘෂ්ට පාත්‍රය සහ නව වන ඔමකොමක පාත්‍රය අපාත්‍රය. එය පාත්‍ර සංඛ්‍යාවට නො ගැණේ. සෙසු පාත්‍ර සත අධිෂ්ඨාන විකල්පනය කිරීමෙන් පරිභොගයට සුදුසුය. "ඉච්චෙතෙසු නවසු උක්කට්ඨුක්කට්ඨෝ ච ඔමකාමක්කොච්චාති දෙව **අපත්තා** සෙසා **සත්ත** ථමාණ යුත්තා නාම."

2 ථාන පසුව බැඳුන ශික්ෂාපදයෙහි මුව විසින් යට දැහුල් රෙඛා පසක් හෝ දසහුල් රෙඛාවක් හෝ ඇති මැටි පාත්‍රය හෝ මහත් සිදුරක් ඇති ද්‍රෝහයෙන් පිළියම් කළ තමුදු මට භෞවන ආමිස රූඳෙන යකඩ පාත්‍රය ද අපාත්‍රය හෙවත් පාත්‍ර සංඛ්‍යාවට නො ගැණේ. එබඳු පාත්‍රයක් ඇති භික්ෂුව විසින් **අන්** පාත්‍රයක් විනවිය යුත්තේය. "යස්ස පඤ්ච වා එකායෙව වා දසඛුලා, සෝ බහ්වාපි අපත්තෝ යෙව, අඤ්ඤෙසු විඤ්ඤත්තිපෙතබ්බා"- "අථ පන එකම්පි ජිඳ්දං ඔහෙතං කොති ලොහ මණ්ඩලෙන බද්ධම්පි මට්ටං න හොති, පත්තෝ ආමිසං ලඟති. අයං අපත්තෝ අඤ්ඤෙසු විඤ්ඤාපෙතබ්බා." ක: වි: 7334-7436-755 ක: වි: පි: 547 කු: සි: ස: 2428 ප්‍රා: ව: 17114 ස: පා: 51024-51417-24 **-ඝර** (නා)= පාත්‍රයක් නැත්තහු උපසපන් නොකළ යුතු පුද්ගලයෙක්. 'න භික්ඛවෙ අපත්තකෝ උපසම්පාදෙතබ්බෝ' මහා: පා: 1004. **-චීවරඝර** (නා)= පාත්‍රය හා සිවුරු නැත්තහු. උපසපන් නොකළ යුත්තෙක්. "න භික්ඛවෙ අපත්තකෝ චීවරකෝ උපසම්පාදෙතබ්බෝ" මහා: පා: 10114 **-කණ්ඩල** (න)= නොපැමිණි කාලය. **පත්තකණ්ඩල** නොවූ වි: වි: ටී: 3929 (පත්ත කණ්ඩල බලනු)

අපද (නා)= අවකාශය. පා නැත්තා. වි: වි: ටී: 1381

අපදාන (නා) (අප + √දා + යු=අන) 1 චරිතය. ආත්මවෘත්තය. 2 නො කැඩීම, නො සිඳී පැවැත්ම සාර: ටී: 7044 8825 වි: වි ටී: 2488

අපර (නා)= අනෙක්. වෙන පසු. පුං: ලි: **අපරෝ** ස්ත්‍රී: ලි: **අපරා**. නපුං: ලි: **අපරං**. **-කුසල** (නා)= පසුව කියයුතු කරුණු දන්නා. ඤත්තිය තබන කාලය දැනීමෙහි දක්ෂ. පණ්ඩිත විනයධර භික්ෂුවගේ එක් අඞ්ගයක්. පරි:පා: 17925-13031 ස: පා: 98927 **-නදී** (නා)= ගඞ්ගා නදියෙන් මෑත භාගය මෙගොඩ. වි: ඒ: ටී: 12125 **-භාගියා** (නා) [සං. භොදනීය]= එනම් දිවසින. සතරමහ දිවසිනෙන් එකක්. මෙරුපළුනයේ බටහිරදිග පිහිටි මණ්ඩලාකාරවූ දිවසින. **-ජ්ජුදිනා**)=[සං. අපරෙද්‍යුඃ]= අනෙක් දවස. ඊළඟ දිනය. පසු දිනය. "අපරජ්ජුගතාය ආසාළහියා පුරිමකොගාහෙතබ්බා, ඇසළ පුණු පොහොය ගිය අනෙක් (ඊළඟ) දිනයෙහි පුරිමිකය ගැන්විය යුතුයි" චු: පා: B. 8018 චු: ප: 2871 **-ණණ (නා)** [සං අපරාහ්න?]= එළු මුං තල කොල්ලු ආදි ධාන්‍ය. යාවකාලිකයට ඇතුළත් ධාන්‍ය විශෙෂයක්. අ: ප: ස: 6127 සි: ව: වි: 5425 වි: වි: 1362 (අපරණ්ණයි ද දක්නට ඇත)

අපරද්ධ (කා) (අපරාධ + අ)= වරද, වරදවන ලද. ස: පා: 1001.

අපරන්ත (නා)= අපරාන්තය, අනාගත සකඹි පඤ්චකය. අෂ්ට වස්තුක අවිද්‍යාවෙන් එකක්. වි: මා: ස: 1287 14 ධ: අ: ගැ: 1871 3 සු: වි: 8417 **-කප්පික** (නා) (කප්ප + ඉක)= අපරාන්තය පමණක් ගන්නෝ. අනාගත සකඹි පඤ්චකය පමණක් පිළිගන්නෝ. සිව්සාලිස් අපරාන්ත කල්පිකයෝ, "තත්ථ අනාගත කොට්ඨාස සඞ්ඛාතං අපරන්තං කප්පෙත්වා ගණ්හන්තීති අපරන්ත කප්පිකා, අපරන්ත කප්පා වා එතෙසං අත්ථීති අපරන්ත කප්පිකා" සු: වි: 8417.

අපරන්න (නා) [සං. අපරාහ්න?]= එනම් ධාන්‍ය වර්ගය. සප්ත ධාන්‍ය හැර උඳු මුං තල ආදී යාවකාලිකයට ගැණෙන ධාන්‍යවර්ග. ප්‍රධාන ශස්‍ය ඵල පුබ්බණ්ණ ද (පුබ්බණ්ණ) අප්‍රධාන ශස්‍ය ඵල අපරණ්ණ ද (අපරණ්ණ) වන බැව් ටීකාචාර්ය ශාරිපුත්‍ර මහා සඞ්ඝරාජ මතයයි. "සාලි වීහි ආදි පුබ්බණ්ණං පුරක්ඛතං සස්සඵලානි කත්වා තබ්බිපරියායතෝ මුග්ගමාසාදි අපරණ්ණන්ති වෙදිතබ්බං" සාර: දී: 3984 කං: වි: 409 ප්‍රා: ව: 7721 ස: පා: 6896 (අපරණ්ණ බලනු) **-නිස්සිත** (නා) [සං, නිශ්‍රිත]= අපරන්න නම් වූ උඳු මුං තල ආදී ධාන්‍ය වර්ග වැවෙන කෙත් අසල පිහිටි. කුටිකාර සඞ්ඝාදි සෙස ශික්ෂාපදයෙහි කුටි වස්තුව **සාරම්භ**(=උවදුරු සහිත) වන ස්ථාන සොළසින් එකක්. පාරා: පා: 17637 ස: පා 408 31 (අනාරම්භ බලනු)

අපරපඤ්ඤත්ත (නා) (න+පර+පඤ්ඤත්ත)= පර ප්‍රත්‍යය නැති. අන් ශාස්තෘවරයකුගේ ඇදහී

මක් හෝ අන් ශාසනයක පිහිටක් නැති. පිහිට පිණිස පැමිණිය යුතු අනෙකක් නැති. ඔහ: පා: 3411 ම· පා: ස: 4318 ප: සූ: 23,23 චූ: පා: B, 423

අපරාපතති (නා)(අපර + ආපතති)=පසු ඇවැත. පසුව පැමිණෙන ඇවැත පිරිවෙස් විසීම් ආදිය කරන්නවුන් විසින් පසුව පැමිණි ඇවැත, "අපරාපතතීති පාරිවාසිකාදීහි පච්ඡා ආපන්නා" මානත හැසිරෙන කාලයෙහි පැමිණි ඇවැතය සිද කියති. ස: පා: 17310 පරි: පා: 16486 පරි: පා: ගා: 1,36 (අනන්තරාපතති බලනු)

අපරාපතතීනං අනන්තරාපතති (නා)= මානත හැසිරෙන කාලයෙහි පැමිණි ඇවැත, මෙහි 1 පුබ්බාපතති. 2 අපරාපතති, 3 පුබ්බාපතතීනං අනන්තරාපත්ති 4 අපරාපතතීනං අනන්තරාපත්ති යන ආපත්ති හෙතු චතුෂ්කය දතයුත්තේය. එහි 1 **පුබ්බාපතති** නම් පළමුව අවන් ඇවැතයි: හෙවත් මානත හැසිරීමට පෙර පැමිණි ඇවැතයි 2 **අපරාපතති** නම් මානතට සුදුසු කාලයෙහි අවන් ඇවැතයි. හෙවත් පිරිවෙස් පුරමින් අවන් ඇවැතයි. 3 පුබ්බාපතතීනං **අනන්තරාපතති** යනු මූලාය පටිකස්සනයෙහි හෙවත් මූල විසුඩියෙහි අවන් ඇවැතයි මූලාය පටිකස්සනය නම් පිරිවෙස් පිරීම ආදිය කරන භික්ෂූන් ගරුකාපත්තියකට පැමිණ ප්‍රතිච්ඡන්න නො කළවිට වත් මානත් පිරූ දින පමණක් අස් කිරීම ද, ප්‍රතිච්ඡන්න කළවිට එකත් අස් කිරීම ද කරන සඞ්ඝ කර්මයයි: 4 **අපරාපතතීනං අනන්තරාපතති** නම් අඟවිසුදුකියෙහි අනන්තරාපත්තිය යි. කුරුන්දි අටුවාවෙහි වනාහි **පුබ්බාපතති** නම් පළමු අවන් ඇවැතය. **අපරාපතති** නම් මානතට සුදුසු කාලයෙහි පැමිණි ඇවැතය. **පුබ්බාපතතීනං අපරාපතති** යනු පිරිවෙස් පුරන කල පැමිණි ඇවැතය. **අපරාපතතීනං අනන්තරාපතති** යනු මානත හැසිරෙන කල අවන් ඇවැතැයි කියති, "ඉදං හි එකෙන පරියායෙන යුජ්ජති" යි මේය ද එක් ක්‍රමයකින් යෙදේයයි සමන්ත පාසාදිකා අටුවා යි. පරි: පා: 16 27 ස: පා: 9739 පරි: පා: ගැ: 11186-1211 ම: පා: ස: 1758

අපරාමට්ඨ නා) (න + පර + ආ + √මස + ත)= පරාමර්ශනය නො කළ, සපර්ශ නො කළ. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනා විසින් පරාමර්ශනය නො කළ. පිරිසුදු ශීලයේ ලක්ෂණයක්. වි: මා: ස: 13548 සු: වි: 37030 **-පාරිසුද්ධි** (නා)= අපරාමෘෂ්ට පාරිශුද්ධිය. තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් පරාමර්ශනය කරන ක්ලේශයන්ගේ පරාමර්ශනයක් නැති බැවින් පිරිසුදු වූ. වි: මා: ස: 12325 වි: ම: ටී: 2815-3012 **-සීල** (නා)= එනම් ශීලය. තෘෂ්ණා-දෘෂ්ටි වශයෙන් පරාමර්ශනයක් නැති ශීලය. "මම මේ ශීලයෙන් ප්‍රසිඩ හෝ අප්‍රසිඩ දෙවියෙක් වන්නෙමි"යි තෘෂ්ණා වශයෙන් ද, "ශීලයෙන් ශුඩිය වන්නීය"යි දෘෂ්ටිවශයෙන් ද; අල්ලා ගත්නාලද්ද පරාමර්ශ ශීලයයි. කල්‍යාණ පෘථග්ජනයා විසින් සොතාපත්ති ආදී මාර්ගඵල ලැබීමට සමාදන්වන ශීලය ද, සප්තශෛක්ෂ්‍යයන්ගේ මාර්ග චිත්තයන්හි යෙදෙන විරති චෙතනාදිය ද; තෘෂ්ණා දෘෂ්ටීන් විසින් නො ගත්නා ලද්දේ **අපරාමට්ඨ සීලයයි**. ස: සා: 7113 වි: ම: ටී: 2815-3013 වි: මා: ස: 12325-1359.

අපරික්කමන (නැ) (න + පරි + √කම + යු=අන)= උපචාර රහිත. කුටිද්වාර සඞ්ඝාදිසෙස ශික්ෂා පදයෙහි කුටි ඉඤ්ජුව උදෙසා ලැබිය යුතු උපචාරය නැති. මෙහි උපචාරය නම් ගොත් දෙදෙනෙකු යොදන ලද ගැලක් කුටිය සිසාරා (ඡදනාග්‍රයෙන් දිය වැහෙන සීමාවෙන් පිට) ගමන් කරවන්නට හැකි නම් ඒ උපචාර සහිතයි හෙවත් සපරික්කමනයි. එබඳු උපචාර නැත්තේ අපරික්කමනයි. ප්‍රා: ව: 7730 ක: වි: 402 ස: පා: 4094.

අපරික්ඛිත්ත (නා) (න + පරි + √ඛිප + ත)= පරික්ෂේප නොකළ. පවුරකින් හෝ කටුවැටකින් වට නො කළ. ස: පා: 47027-47128 21437 **-උපචාර** (නා)= පරික්ෂේප නො කළ ආරාමයාගේ උපචාරය, රතන ශික්ෂාපදයෙහි ගොරූපාදීන්ගේ ප්‍රවේශ නිවාරණය පිණිස කළ වති ආදියකින් පරික්ෂේප නො කළ ආරාමයාගේ ලෙඩ්ඩුපාත දෙකක් හෙන දුර. පාචි: පා: 15910 ස: පා: 6547 **-ආරාම** (නා)= පවුරකින් හෝ කටුවැටකින් පරික්ෂේප නො කළ ගම. ස: පා: 6781 (ගාමූපචාර සහ ඝරූපචාර බලනු) ස: පි: 2151.

අපරිගණහිත (නා) (න + පරිගණහිත)= **පවන්** නොගත්, ආරම්භ නො කළ· තමාගේයයි අයත් නො කළ. වි: වි: ටි· 1791 (පරපරිග්ගහිත බලනු)

අපරිසංසන (නා) (න + පරි + √සංස + යු=අන)= නොගැරීම. නොහැප්පීම. චූ: පෘ: B 248[15]

අපරිවත්තන (නා) (න + පරිවත්තන) [සං.පරිත්‍යක්ත]= අත් නොහළ, නුදුන් දේ. ගැණීමට සුදුසු නැනක තුබූ දය නමුත් අයිනිය මුදා නොදුන් දය, සෘ: පෘ: 2 6[88] පාරා: පෘ: 85[33].

අපරිවජ්ජන (නා)= ප්‍රාකාරාදී යම්කින් වටා මුවහ නොකළ: සාරා: දී: 789[1] **-ඔඛ** (නා)= ප්‍රාකාරාදියකින් වටා මුවහ නොකළ ඔවරකය සෘ; පෘ: 544[29] **-ංඵවර** (නා)= අපරිවිජ්ජන්නා (නොපිරිසුන්) ඔවරකයාගේ උපවාරය. සෘ: පෘ: 544[29] සාර: දී: 789[1]

අපරිණත (නා)(න + පරිණත`= නොපිරිනමන ලද. නොදෙන ලද. නොදෙන්නෙමුයි කියන ලද පාචි: පෘ: 153[88] **-ස ඤඤි** (නා නොපිරිනමන ලද්දේය යන හැඟීම ඇති. පාචි: පෘ: 153[24].

අපරි පාවින (නා) (න+පරි + √පව + ණි + ත)= නොපිඹනලද. පිළිඉඟළ නොකළ පාචි: පෘ: 7[14] (පරිපාවින බලනු) **සඤඤි** නා)= නොපිඹන ලද්දේය යන හැඟීම ඇති. පාචි:පෘ: 7[14]

අපරිපුණ්ණ (නා)= පරිපූර්ණ නොවූ. **සම්පුණ්ණ** නොවූ. චි: ච: ටී: 394[10].

අපරි සූර (නා)= උපසම්පද නොකළයුතු පුද්ගලයෙක්. පාත්‍ර සිවුරු සම්පූර්ණ නොවූ තැනැත්තා. ''අපරිපූරොනාම අපරිපුණ්ණ පත්ත චීවරෝ'' සෘ: පෘ: 976[11] පරි: පෘ: 164[3].

අපරිඝුන (නා)= පරිනව නොකළ. නිහඬ නොකළ පාචි: පෘ: 7[10]

අපරිභොග (නා) (න + පරි + √භුජ + ණ; ජ=ග) පරිභොග නොකළ පාචිචි නොකළ. සාර: දී: 398[12]

අපරිමණ්ඩල (නා (න + පරිමණ්ඩල) පරිමණ්ඩල ලක්ෂණ නැති. අසම්පූර්ණ. සාර: දී: 821[2] (පරිමණ්ඩල බලනු. **-නිවාසන** (නා) පිරිමඩුලු රහිතව හැඳීම. චි: ච: ටී: 341[11] (පරිමණ්ඩල නිවාසන බලනු)

අපරියන්ත (නා) [සං. අපර්‍යන්ත]- කෙළවරක් නැති. අවසානයක් නැති **-පාරිසුද්ධිසීල** (න;)= එනම් ශීලය. ''උපසම්පන්නානං අපරියන්ත සික්ඛාපදානං ඉදං අපරියන්ත පාරිසුද්ධි සීලං'' යි වදාළ බැවින් ගණනින් නොපිරිසුන් සිකපද ඇති උපසම්පන්නයන්ගේ ශීලය අපරියන්ත පාරිසුද්ධිසීල නම් වේ. සංවරවිනයයි කියූ සිකපද නවකෙළඳහස් එකසිය අසූ **ඇකාරි** පණස්ලක්ෂ සතිසක් විනය පිටකයෙහි විභංග වශයෙන් වදාළ බැවින් ගණනින් එසේ පසීන්න වුවත් නිරවශේෂ කොට සමාදන් වීම හා ලාභ-යශ-ඤාති-අඛ-ජීවිත වශයෙන් සීමා රහිත බව ගෙණ **අපරියන්ත** පාරිසුද්ධිසීලයයි කියනු ලැබේ. සෘ: සා: 71[14] චි: ම: ටී: 27[21]–29[6] චි: මා: ස: 119[35]

අපරියාපුණිත (නා)= නොහදුළ. නොහදුරන ලද. පාචි: පෘ: 141[33] (පරියාපුණන්ති බලනු)

අපරිවත්තන (නා)= පරිවර්තනය නොවන. ආපසු නොදීම. චි: ච: ටී: 351[17]

අපරිසංකිත (නා)= සිතින් සැක නොකළ. 1 පඨම දුට්ඨදෝස සඞ්ඝාදිසෙස ශික්ෂාපදයෙහි තෙවැදෑරුම් සැකයෙන් සැකයක් නැති. පරිසඞ්කිතය තෙවැදෑරුම් වේ, දිට්ඨ-සුත-මුත වශයෙන්. ඒ මෙසේයි. එක් භික්ෂුවක් ශරීරකෘත්‍යය පිණිස නොමුවකට පිවිසියේය එක් සත්‍රියක්ද ශරීරකෘත්‍යය පිණිස එහිම ගියාය. සත්‍රිය භික්ෂුව හෝ භික්ෂුව යසත්‍රී හෝ නොදුටු වේය දෙදෙනාම තම තමන් පැමිණි කිස අවසන් කොට නික්මුණාහුය. මෙම දෙදෙනාගේ පිවිසීමත් නික්මීමත් බලාසිටි එක් භික්ෂුවකට මේ දෙදෙනා පිළිබඳ සැක උපනි. මේ **දිට්ඨපරිසංකිත** නම්. භික්ෂු නමක් අඳුරෙහි සැඟවුණු තැනක සත්‍රියක් සමග කථා කරමින් සිටියේය. එය ඇසූ අන් භික්ෂු නෘකට සැක උපනි. මේ **සුත පරිසංකිත** නම්. ධූර්තයෝ රාත්‍රියෙහි සුවඳ මල් ආදියද, සුරාද රැගෙන වෙසඟනන් ද කැටුව පිටිසර බද විහාරයකට පැමිණියාහුය. එසේ පැමිණ ඒ රැ දම්හලෙහි ලැගුම් ගෙන සංවාසයෙහි ද යෙදී මල් සුවඳ ආදිය එහි දමා රැසින්ම නික්ම ගියාහුය. එහි එක් වත් සපන් සඟ නමක් අරුණට පළමුව නැගිට වත් පිළිවෙත් කරන්නෝ දම්හලෙහි තන්හි තන්හි වූ සුවඳ මල් ආදිය දැක පිදීම පිණිස විහාරයට ගෙන ගොස් තැනපත් කරනීය. කැන් කැබලි නිබුණු බෙහෙත් අරිඤ්ච වගීද පානය කෙළේය. වෙහෙර වැසි

භික්ෂූහු පැමිණ දම්හලෙහි මේ විප්‍රකාරය දූක පරිෂ්කාරන්නාහු යථොක්ත වත් සපන් භික්ෂුව කෙරෙහි සැක උපදවා ඒ භික්ෂුවගේ අත් හා මුව ඉවකර බැලුවාහුය. ඒ භික්ෂු නම ගේ කෘත්‍යාකෘයි ද සැක කළාහුය. මේ **මුතපරිසංකිත** නම්. මේ දිට්ඨ-සුත-මුත යන තෙවැදෑරුම් සැකයෙන් සැක නැත්තේ අපරිසංකිත නම්. එබැවින් අමූලක වූ. 2 (ත්‍රි කොටි පරිශුඛ මත්ස්‍ය මාංසයෙහිදී) තමන් උදෙසා මරණ ලද බවට සැකයක් නැති. කැප මාංසය. පාරා: පා: 195[32] සාර: ම: 68[4] වු: පා: B 204[21] වු: පා: 325[34] කං: වි: 422[6] සං: පා: 423[28] කං:වි:පි: 32[19] වි: ම: 107[15] (අමූලක බලනු)

අපරිසුඛ (නා)= නොපිරිසුදු. පිරිසුදු නැති. "අපරිසුද්ධා ආනඤ්ජ පරිසා" චු: පා: 376[30] සං: පා: 948[25] -**ආජීව** (නා)= අපිරිසුදු ආජීවය අයහපත් දිවිපෙවෙත වු: පා: 311[13] -**ඤාණ දස්සන** (නා)= අපිරිසුදු ඥනදර්ශනය ඇති. චු: පා: B 195[3] -**ධම්මදෙසනා** (නා) (√දිස+ඝ්‍ර= අන+ආ)= අපිරිසුදු දම් දෙසුම් ඇති. චු: පා: 311[35] -**වෙය්‍යාකරණ** (නා) [සං. ව්‍යාකරණ > වෙය්‍යාකරණ]= අපිරිසුදු විවරණය කිරීම්, විසතර කිරීම් ඇති. චු: පා: B192[3] -**සීල** (නා)= අපිරිසුදු සිල් ඇති. චු: පා: B 192[3]

අපවිනය (නා) (අපවිනය?)= ලබනු කැමැත්ත නිබ්‍බයදී. සිවුරු කොවස ලබන කැමැත්ත අත් නො හැර. "භික්ඛු අපත්ත කසිනෝ දිස ඔහම්කෝ පකකමති චිවර පටිච්ඡං අපවිනය මනෝ" මහා: පා: 300[16] -**නාවක** (නා)= කසිනකඛ්ඛකයෙහි වදළ නිට්ඨානනත්තික-සන්නිට්ඨානනත්තික- නාසනනත්තික යන කසි නුඛාරත්‍රය සථාන තුණකදී ගුණවීමෙන් ලැබෙන හෙද නවය. තමන් ගිය වෙහෙරට පෙරළා පැමිණ එනිදී සිවුර කිරීම, අතරමගදී හමු වූ භික්ෂූන් ගේ වචනයෙන් රැඳී සිවුර කිරීම, අතරමග නො රැඳී ගොස් සිවුර කොටස ඉල්ලා එන්නට යයි කීවූ භික්ෂූන් හා ඒකතුව සිවුර කිරීම යන මේ සථානත්‍රයෙහි සිවුර කිරීමෙන් සිදුවන නිට්ඨානනත්තික-සන්නිට්ඨානනත්තික- නාසනනත්තික යන ත්‍රික ත්‍රය. (විසතර මහාවගග පාළි සන්නයෙන් දන්නේය) මහා: පා: 302[6] ම: පා: සං: 89 [8] සං: කං: ච: 84.[1]

අපසාදිත (නා)= නින්ද කරන ලද. පහත් නොවූ. පාරා: පා. 153[22]

අපළිබොධ (නා)[සං. පරිබොධ- පරිරොධ]= පළිබොධයක්නැති.කරදරයක්,හිරිකැරයක් නැති දස පළිබොධයන්ගෙන් කරදරයක් නැති වි: වී: ටී: 309[5] වි: මා: සං: 216[20]

අපාද (නා)= පා නැති. එබඳු සතුන්. වි: වි: 231 -**ක** (නා)= පාහැති සතුන්. උරග ගණයේ සතුන්. -**කථා** (නා)= පා නැති සතුන් පිළිබඳ කථා. චිතියපාරාජික ශික්ෂාපදයෙහි පා නැති සතුන් පිළිබඳ විනිශ්චය. වි: වි: 231 සං: පා: 262[30] (අපදකථායි ද දක්නේය.)

අපාන (නා)= ප්‍රශ්වාස වාතය. අ: ප: සං: 8[16] සං: පා: 291[8]

අපාපුණ (නා)= කෙස්ස. යතුර. ප: සු: 131[18]

අපාය (නා = සැපයෙන් පහවූ. දුගතිය නිරය. ප: සු: 30[23] වි: මා: සං: 1006[3] -**ගමනීය** (නා)= අපායට යා යුතු. -**ගාමී** (නා)= (√ගමු + ණී)= අපායට යන සුලු. එබඳු සවභාව ඇති. -**මුඛ** (නා)= පිරිහීමේ දොරටු. විනාශයට හේතුවන කරුණු. මනෝ: පූ: 77[19] -**සහාය** (නා)= පිරිහීමට ආධාර වන. එබඳු මිත්‍රයා. සු: වි: 478[13]

අපාසිං (ක්‍රි)= පානය කෙළෙම්. බීවේමි. මහා:පා: 408[11]

අපාරාජිකකෙඛත්ත (නා)=පාරාජිකාවට ක්ෂේත්‍ර නොවූ. වි: වි: ටී: 123[5] (පාරාජික කෙඛත්ත බලනු)

අපාරුත (නා) [සං අපාවෘත]= විවෘත කරන ලද. 'අපාරුතාතෙසං අමතස්සදවාරා" මහා පා: 6[11] ම: පා: සං: 25[37]

අපාරුත (නා) (න + පාරුත)= පරික්ෂේප නොකළ. වට නො කළ. "උදපානෝ අපාරුතෝ හොති" චු: පා: 234[25] සං: පා: 893[31]

අපාසාදික (නා) (පසාද + ණික)= පැහැදීම් නොඑළවන. කායදුශ්චරිතාදි අකුශල කර්මය. සං: පා: 990[5] පරි: පා: 181[25]

අපි (ඵ: සං:) 1 ගෞරව 2 ගර්හා 3 සම්පිණ්ඩන 4 අපෙක්ෂා 5 වාරණ(=වැළැක්ම)6 ප්‍රශ්න 7 පිධාන (වැස්ම)8 ආශංසා යන අර්ථයන්හි වෘථෙන උපසර්ගයක්. අ: ප: සං: 158[25] -'**අයෙය්‍ය** (නා)

කිමෙක්ද? ආසීවෙති. පාචි: පා: 274[31] පු: ලි: -අඥ්ඤා සත්‍රී: ලි: -අඥ්ඤා පාචි: පා: 125[21] 274[30] -'එකත්තය (නා)= සම්හර. ඇතැම් අය මහා: පා: 5[32] -'එසඳ (නා)= සම්හර කෙනෙක. -'ඒවනාම(නි)=ඉතා සෙහෙක ඉතා මැනවි. පු: පු: ස: 191[15] -ඛාන (නා)= පියන, වැස්ම, චු: පා: 255[6] -නු (නි)= කිමෙක්ද? -ඤ්ඤු (නි)= බොහෝ සෙසින්, වැඩි වශයෙන්. තවද, "අපිසසු සිකඛු දිඝිඃ ඉමාය ඨාථාය වොදෙනන්" මහා: පා: 408 ස: පා: 858[17] ම: පා: ස: 42[15]

අපුඤ්ඤ (නා)= අකුසල්. පව් පාරා: පා: 68[9] ස: පා: 289[17]

අපුට්ඨ (නා) (න + √පුස + ත;ස + ත=ට්ඨ)= නොවිඳිනලු, නො අසනලද. පු:ලි: **අපුට්ඨෝ** සත්‍රී: ලි: **අපුට්ඨා** න:ලි: **අපුට්ඨං**. ස: පා: 331[6].

අපුත්තක (නා)= අපුත්‍රක දරුවන් නැති. -තා (නා)= දරුවන් නො ලබන බව: "අපුත්තක තාය පටිපන්නා සමණෙ ගොතමො" මහා: පා: 40[3] ස: පා: 729[16].

අපුබ්බං අචරිමං (නා)= පෙර පසු නොව. එක වර. එක ම කාලය තුළ.

අපූප (නා)= පූප, පිටියෙන් කළ කෑම. අ: ප: ස: 63[24].

අපෙක්ඛා (නා) [සං. අපෙක්ෂා]= අපෙක්ෂාව බලාපොරොත්තුව. කැමැත්ත කාය සංසර්ගය පිළිබඳ අපෙක්ෂාව: පු:ලි: **අපෙක්ඛෝ**= අපෙක්ෂාව ඇති. කායස සර්ගාපෙක්ෂාව ඇති මහණ. සත්‍රී:ලි: **අපෙක්ඛවති** (අපෙක්ඛා + වන්තු + ඊ)= අපෙක්ෂාව, බලාපොරොත්තුව ඇත්තී. පාචි: පා: 211[35] පාරා: සා: 833[15] ස: පා: 379[20]–390[7]–670[28].

අපෙති (ක්‍රි) (අප + √ඉ + ති)= පහවෙව. ඉවත් වෙව. ස: පා: 658[5].

අපෝ (නා)[සං. අලප]= 1 සවලපය, ටික. 2 අභාව, නැති. ක: ඒ: පි: 72[21] **-අඞ්ග** (නා) [සං. අඞ්ග]= මදක් අනතා. අනයෙන් අඩු වි: ලං: 307[32] ස: පා: 484[25] **-අස්සාද** (නා) [සං. ආස්වාද]= අල්ප වූ ආස්වාද ඇති. මද විඳීමක් ඇති ස: පා: 644[28] **-'ඥාණ** (නා) සවලප අවබොධයක් ඇති. මද දැනීමක් ඇති. පරි: පා: 226[6]

-'ආතඞ්ක (නා) [සං. ආතඞ්ක]= සවලප වූ රොග ඇති; ලෙඩ නැති. නිරෙ ග; ජීවිතය දුක් නොවූ. චු. පා: 239[33] උ: අ: 86[33] ඒ: වි: පී: 57[22] (අපපාඛාධ බලතු) **-'ආබාධ** (නා) [සං. ආබාධ]= 1 සවලප වූ ආබාධ ඇති ලෙඩ නැති. නිරොග. "ආතඞ්ක ආබාධයන්ගේ වෙනස හඳුන්වන උදහ අටුවාවේ මෙසේ දක්නේය. "අපපාඛාධන්ති ආදිසු **ආබාධොති** විසභාග වෙදනා වුච්චති; යා කාකදෙසෙ උපප ජ්ජිත්වාපි සකලසරීරා ඇසපටෙන ආබාධිතා විය ගණ්හාති **ආතඞ්කොති** කිච්ඡජීවිතකරෙ රොගො; අථවා යාපෙතබ්බ රොගො ආත ඞ්කා, ඉතරෙ ආබාධා, ඛුද්දකො වා රොගෙ ආතඞ්කා බලවා ආබාධා, කෙචි පන අජ්ඣත්ත සමුට්ඨානෙ ආබාධෙ, බහිද්ධා සමුට්ඨා නෙ ආතඞ්කොති වදන්ති තදුභයස්සාපි අභා වං පුච්ඡාති,, උ' අ: 86[34] චු: පා: 239[34] ඒ: වි: පී: 63[22] චු; පා: *B*. 696[23] සු; ඒ: 253[28]. **-'ආයුකා** (නා)= අල්පායුෂක, ආයුෂය මිදවූ ඉතා සවලපවූ ජීවිතය ඇති. "අපපායුකානි **ආතඤ්** බොධිසත්ත මාතරෙ හොන්ති" උ: අ: 194[8] 195[13] **-'ආහාර** (නා)= සවලපවූ ආහාර අනුභව ඇති. **නිරාහාර**. දෙතුන් පිඬක් පමණ වළඳනා. "අපපාහාරෙ සමණෙ හොතමො අපපාහාරතාය වණ්ණවාදි" සු: නි: අ: 155[16] මනෝ: සූ. 615[25] ධ: අ: ගැ: 31[33] **-'ඉච්ඡා** 1 (නා) [සං.ඊප්සා]= අලෙපවිච්. ඉවිඡා නැති, ආශා නැති. මේහි අපප ශබ්දය අභා වාර්‍ථයි 1 පවවයපපිවිච් 2 ධුතඞ්ගපපිවිච් 3 පරියත්ති අපපිවිච් 4 අධිගම අපපිවිච්චයයි අපපිවිච්තාවය සිඳ වැදුරුම් වේ. 1 **පවව ඡපපිවිච්** නම් විවරාදී සිව්පසය පිළිබඳ **ඇති** අලෙපවිච්තාවයයි. එබඳු ගුණයෙන් යුකත වූයේ දායකයාගේ අදහසද, දාන වසතුවගේ ප්‍රමාණයද, තමන්ගේ ශකතිය ද, දාන ප්‍රත්‍යය පිළිගණිසි. 2 **ධුතඞ්ගප්පිවිච්** නම් තමන් සමාදන් වූ ධුතාඞ්ග අනුනට නො දන්වනු කැමැත්තේසි. 3 **පරියත්තිඅප්පිවිච්** නම් තමන්ගේ බහුශ්‍රැත භාවය දන්වන්නට නො කැමැත්තේසි. යමෙක් ශ්‍රොතාපන්නාදීන් කෙරෙහි එක් ආසීපුද්ගලයෙක්ව එය දන්වනු නොකැමැත්තේද මේ **අධිගම අප්පිවිච්** නම් වේ. 1 අත්‍රිවිච්තා 2 පාපිවිච්තා 3 මහිවිච්තා 4 අපපිවිච්තායි ඉවිඡාව පිළිබඳ භෙද සතරකි. එහි

තමන් ලද දෙයෙහි සෑහීමට නො පැමිණ අනුන් ලද දෙයෙහි කැමැත්ත ඇති බව. 1 **අනිච්ඡතා** නම්. 2 **පාපිච්ඡතා** නම් තමන් කෙරෙහි අවිද්‍යමාන ගුණ ප්‍රකාශ කරන බව සහ පිළිගැන්මෙහි පමණ නොදන්නා බවයි. විද්‍යමාන ගුණ ප්‍රකාශ කරන බව සහ [පිළි ගැන්මෙහි පමණ නොදන්නා බව] 3 **මහිච්ඡතා** නම්. විද්‍යමාන ගුණය පවා මෙරමා දනු නොදී සහවන බව සහ [පිළිගැන්මෙහි පමණ දන්නා බව] 4 **අප්පිච්ඡතා** නම්. "අප්පිච්ඡෝති ඉච්ඡා විරහිතෝ. නිච්ඡෝ. නිත්තණ්හෝ. එසා හි බ්‍යඤ්ජනං සාවසෙසං විය, අත්ථෝ පන නිරවසෙසෝ." "සන්ත ගුණ නිගූහනතා පන පටිඝහණේ ච මත්තඤ්ඤුතා අප්පිච්ඡතා නාම" ප: සු: 114[32]-115[18] (2) වි: මහ: ස: 55[30] චූ: පා: 696 මනෝ. පූ: 766[6] (අපපන රිත බලනු) -**ච්ඡා** 2 (නා)= අලෙවිඡ, මදකින් වුවත් සතුටුවන. "තේහිකබූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනෝ [කුක්කුච්චකා සික්ඛාකාමා] චූ: පා: B 500[8] චූ: පා: 167[21] -ච්ඡ 1 (නා)= අලෙවිඡතාවය උදෙසා කරන කථා. දශ කථා වස්තූන්නෙන් එකක්. දශ කථාවස්තූනම්: 1 අප්පිච්ඡ කථා 2 සන්තුට්ඨිකථා 3 පවිවේක කථා 4 සංසග්ග කථා. 5 විරියාරම්භකථා 6 සීල කථා 7 සමාධිකථා 8 පඤ්ඤාකථා 9 විමුත්තිකථා 10 විමුත්ති ඤාණ දස්සන කථා යන දහයයි වි:ලං: 280[20] මනෝ:පූ: 615[3]-792[7] -**ඳඝ** 1 (නා) (අ + ඵ=ඛ)= දිය නුමුසු. "අපෙපාදක මධුපායාසෙන, දිය නුමුසු කිරි පක් මී ඔත් කිරිහඹිසෙන්" ධ: අ: ගැ: 120[9] 162[13] 260[21] සු: නි: 453[34] මහා: පා: 279[12] -**ඳඝ** 2 (නා) සුවලපවූ ජලය ඇති. චතුර නැති "සන්ති භික්ඛවෙ මග්ගා කන්තාරා අප්පෙපාදකා අප්පභක්ඛා" මහා: පා: 27[13] -**ඳඝසුඛ** (නා) [සං. ඵස්සුක]= අලෙපාතසහගත, ඵස්සාහය මද බව. ඵස්සාහය නැති. "යත්තහි නාම තථාගතස්ස අරහතෝ සම්මාසම්බුද්ධස්ස අප්පෙපාසුඛතාය චිත්තං නමති නෝ ධම්මදෙසනාය ඒති" මහා:පා: 55 සා:ම: 186[12] සු: දී: 386[18] උ: අ: 113[33] ප: සු: 120 ධ: අ: ගැ: 311 -**ඝ** (නා) (අපප + ක)= සුවලපවූ. "අපපකාපි කතා කාරා සීලවන්තෙ මහපඵලා" වි: මා: ස: 144[35] **ඝඵල** (නා) [සං: ඝඵර]= මද කබල් කඩ ඇති.. කැටකැබිලිති ඇති. "කඵලාති කප්පා බණ්ඩාති" පාචි: පා: 38[2] ස: පා: 550[36] කු: සි: ස: 83[21] (අජාත පඵවි බලනු) -**ඝඝිර** (නා) [සං. කෘච්ඡ්‍ර]= දුක් නැතිව. නිදුකින්. සු: චි: 267[24] ප: සු: 93[16] 347[15] -**කිච්ච** (නා) [සං. කාර්‍ය]= සුවලපවූ කාර්‍ය ඇත්තේ. නොයෙක් කටයුතුවල නොයෙදුණු කම්මාරාම, භස්සාරාම ආදියෙහි හෝ විහාර නවකම් කිරීම් ආදියෙහි හෝ නොයෙදුණු. සු: නි: 139[10] -**කිණ්ණ** (නා) [සං, ආකීර්ණ]= ආකීර්ණ නොවූ. ජනසමූහයා නොනැවසුණු. ජනශූන්‍ය මහා: පා: 36[3] ම: ප: ස: 131[26] චූ: පා: 276[29] ස: පා: 727[19] -**කිලමථ** (නා) [සං. කලමථ]= කලාන්ත නොව. හිරිහැර කරදර නැතිව. පාරා: පා: 259[30] චූ: පා: 64 -**ඛංඝ** (නා) [සං. දංශ]= ඩැහැ ලේ බොන මැස්සන් නැති. එබඳු මැසි මදුරුවන් ආදිය නැති. පඤ්ච සෙනාසනාඞ්ගයන්ගෙන් එකක්. 1 නාතිදූරනාදි 2 දිවා අපපකිණ්ණතාදි 3 අපපඩංසාදිතා 4 විවරාදි ලාභෝ 5 ථෙරානං භික්ඛූනං නිවාසෝ යනු වෙන් දක්නා පඤ්චසෙනාසනාඞ්ගයය. සා: දී: 563[5] වි: වි: ටී: 130[22] (පඤ්චසෙනාසනාඞ්ග බලනු) -**තර** (නා) [සං අල්පතර]= ඉතා අල්ප ඉතා කුඩා. මදවූ "අපෙපමත්තකං හගවා අවත්ති දකඛිණාපථෙ අඵපතරෙන ගණ්ඨන උපසමප දං අනුජානෙය්‍ය" මහා: පා: 230[4] කු: සි: ස: 159[33] (පූ: ලි: **තරෝ** සත්‍රී: ලි: -**තර** න: ලි: -**තරං**) -**ඛන** (නා)= සුවලප වූ ඛන ඇති. මහා: පා: 397[10] -**ඛර** නා)= සුවලප වූ දැරීම් ඇති. පරි:පා: 226[7] **නිඝෙඝ.ස** (නා) [සං. නිඝ්ඝෝෂ]= අල්පවූ නිඝ්ඝෝෂ ඇති නගරයෙහි පවත්නා ඝොෂය නැති "අපපනිඝ්ඝොසං, මද ගුගුම් හඬ ඇති" මහා: පා: 36[3] ස: පා: 737[10] ම: පා: ස: 31[24] ජා: අ: ගැ: 129[7] සා: ම: 200[3] -**පාණක** (නා) [සං. පාණක]= මද පහණ ඇති එබඳු පොලොව. පහණ නම් මිටින් ගත නොහැකි ලොකු ගල්ය. "මුට්ඨිපපමාණතො උපරිපාසාණා වෙදිතබ්බා" කු: සි: ස: 83[21-37] පාචි: පා: 38[2] සි: ච: ච්, 44[33] සා: ම: 117[29] වි: ලං: 115[1] (අජාත පඵවි බලනු) -**පුඤ්ඤ** (නා) - මදවූ පින් ඇති, **කාලකණ්ණි** "එතන ඛො පන සමයෙන මෙත්තිය භුම්මජකා භික්ඛූ නවකා වෙව හොන්ති අප්පපුඤ්ඤා ච" පාථා: පා: 221-181[34] ස: පා: 160[21] -**පංසු** (නා) [සං. පාංශු]= මද පස් ඇති. එබඳු පොලොව. පාචි:

පා: 3$1^{2}$ -බල (නා – මඳ බළ සෙනඟ ඇති. එබඳු රජ මහා: පා: 39$7^{11}$ -භක්ඛ (නා) [සං. භක්ෂ]= 1 මඳ ආහාර ඇති 2 අහාර නැති. "සන්ති භික්ඛවෙ මහා කන්තාරා අපෙපාදකා අපපහක්ඛා" මහා; පා: 27$9^{6}$ -භික්ඛුක (නා) (භික්ඛු + ක)= භික්ෂූන් සුවල්පවූ, භික්ෂූන් මදවූ. "තෙන ඛො පනායස්මතෙන අවන්ති දක්ඛිණා පථො අප භික්ඛුකො හොති" මහා:පා: 22$9^{13}$ -ඉන්ද්‍රිය (නා) (√භූජ් + ණි; ජ-ග)= සුවල්පවූ සම්පත් ඇති. මහා:පා: 39$7^{11}$ -මත්තක (නා)= සුවල්ප මාත්‍ර වූ. කුඩා. එබඳු වරද. "සන්ති භන්තෙ සමණ බ්‍රාහ්මණා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙසං අපපමත්තකෙපි කුක්කුච්චං උපජ්ජති" පාරා: පා: 4$3^{34}$ සු: වි: 42^{24} චු:පා: 30$0^{3}$ (ප්‍රු:ලි: -මත්තකා සන්‍ති ලි: මත්තිකා න: ලි: -මත්තකං) -ංවිස්සජ්ජක (නා)= කුඩා පිරිකර බෙදන භික්ෂුව. එනම් සම්මුතිය. තෙළෙස් සම්මුතීන්ගෙන් එකක්. තෙළෙස් සම්මුති නම් 1 හත්ථුද්දෙසක 2 සෙනාසන පඤ්ඤාපක 3 භණ්ඩාගාරික 4 චීවර පටිග්ගාහක 5 චීවර භාජක 6 යාගුභාජක 7 ඵලභාජක 1 ඛජ්ජභාජක 9 අප්පමත්තක විස්සජ්ජක 10 සාටියග්ගාහාපක 11 පත්තභාහාපක 12 ආරාමික පෙසක 13 සාමණෙර පෙසක යනුයි. අපමත්තක විස්සජ්ජක භික්ෂුව ඡන්දාදින් අනුයිඝට නොයන පවරන ලද්ද හා නො පවරන ලද්ද (දුන් පිරිකර හා නොදුන් පිරිකර) දන්නා හෙවත් ඒ පිළිබඳ සිහිකල්පනා ඇතියකු විය යුතුයි සඞ්ඝභා විසින් කම්ම වාක්‍යයෙන් සම්මත කළ එබඳු භික්ෂුව ඉදිකටු, වහන්, පිහිය, සිවුරුපරි, අංසබද්ධන ආදී කුඩා පිරිකර තැන්පත්කොට තබා උවමනා භික්ෂූන්ට එය දියයුතුයි චු:පා: B. 126^{3} සා:ප: 9$3^{15}$ චු:පා: 300^{14} සාර: දී: 47$8^{29}$ -මත්තිකා (නා) [සං. මාත්‍රකා] =සුවල්ප වූ මැටි ඇති. එබඳු පොළොව. පාචි: පා: 38^{7} (අජාත පඨවි බලනු) -මරුම්බ (නා) [සං. මරු=මරුව]= මඳවූ බොරලු ඇති. එබඳු පොළොව. මරුම්බාති කට සක්කරා වාලිකායෙව" යනුවෙන් බැඹින් මරුම්බ නම් කැට සකුරු (කැටකල්) ඇති වැලිමය. හෙවත් බොරලුය. කු: සි: ස: 8$3^{29}$ පාචි:පා: 38^{7} ස: පා: 550^{35} (ජාතපඨවි බලනු) -රජක්ඛ (නා) (අප + රජ + අක්ඛ) [බෞ: සං. රජසකා?] අල්පවූ රාගාදී රජස් ඇති. නුවණ නමැති ඇසෙහි අල්ප වූ රජස් ඇති "අපං රජං අක්ඛිං එතෙසන්ති= අපරජක්ඛා" මඳවූ කෙලෙස් රජස් ඇති ප්‍රඥා නෙත්‍ර ඇත්තාහ යන අර්ථයි. නොහොත් අපං රජං එතෙසන්ති අපරජක්ඛා" අනුත්සාහ වූ රාගාදී රජස් ඇති සත්ත්වයන යන අර්ථයි" වි: මා: ස: 490^{39} -ංජාතික (නා)= 1 නුවණැසෙහි මඳ වූ රාග දෙස මොහ රජස් ඇති. 2 සමාපත්ති වශයෙන් විශෙෂඥානය කළ (මතුවිය නොදී යටපත් කළ) කෙලෙස් ඇති නිදොකුණු සවභාව ඇති. පිරිසුදු. "අයං ඛො ආළාරො කාලාමො පණ්ඩිතො වියත්තො අපරජක්ඛජාතිකො" මහා පා: 6$7^{-32}$ ඡ: පා: ස: 27^{10} වි: මා: ස: 490^{39} සං:දී: 211^{20} ස: පා; 74^{4} වි:වි:ටී: 46^{87} -වාහන (නා)= අල්පවූ වාහන ඇති. යාන වාහන මඳ වූ. එබඳු පුදහලයා. මහා: පා: 39$7^{11}$ -විජිත (නා)= අල්පවූ විජිත ඇති. මඳ රටක් ඇති, එබඳූ රජ. මහා:පා: 39$7^{11}$ -සක්කර (නා) [සං. ශර්කරා]= මඳ හකුරු ඇති. මිටින් ගත හැකි ගල් මදක් ඇති පොළොව. 'මුට්ඨිපමාණා සක්කරා" යනු බැඹින් සක්කර නම් මිටින් ගත හැකි ගල්කැටයි. පාචි:පා: 38^{7} කු: සි: ස: 8$3^{29}$ ස:පා: 550^{34} (ජාත පඨවි බලනු) -සද්ද 1 (නා) [සං. ශබ්ද]= අල්පවූ ශබ්ද ඇති. මහත් හඬ නැති. සෙනසුනක පිහිටිය යුතු අඞ්ග පහින් එකක්. වි: වි: ටී: 180^{88} මහා: පා: 36^{3} (පඤ්ච සෙනාසනඞ්ග බලනු) -සද්ද 2 (නා)= මහත් සේ ශබ්ද නොකොට. දෙලොස්රියන්ගේ මත්තේ නො ඇසෙන සේ ශබ්ද නොකොට. ඇතුළුගම යන්නහු විසින් හා නික්මෙනහු විසින් කථා කළහැකි ශබ්ද ප්‍රමාණය. දෙලොස් රියන් පමණවූ ගෙහි මූල පළමුවන තෙරුන්ද, මැද දෙවන තෙරුන්ද, අග තුන්වන තෙරුන්ද හිඳ පළමුවන තෙරුන් දෙවන තෙරුන්සමග කථාකරන ශබ්දය එම දෙවන තෙරහට ඇසේද, අදහස වටහා ගනීද, තුන්වන තෙරහට එම කථාවේ ශබ්දය පමණක් ඇසේද, අදහස නොවැටහේද, මෙපමණකින් එම මහ තෙරුන්ගේ ශබ්දය "අප්පසද්ද" වේ. යම් ශයනයකින් තුන්වන තෙර එම කථාව තේරුම් ගන්නේ නම් ඒය "මහ සද්ද" නම් වේ. ප්‍රා පු: ස: 100^{86} වි: ලං: 29,^{16} ස: පා: 662^{24} කු: වි: 151^{24} -සමාරම්භ (නා) (සං + ආ + √රභ + ණ)= මඳ කටයුතු ඇති. කටයුතු

අධික නොවූ. තෙවීවරික භික්ෂුවගේ එක් ගුණයක්. "අපපඤ්ඤාරම්භතා, මඳ කිස ඇති බවය" වි: මා: ස: 162[10] **-සාවජ්ජ** (නා)= [සං. සාවද්‍ය]= **අල්ප සාවද්‍යවූ.** අල්ප වූ දෝෂය. ලොක වද්‍ය වශයෙන් හා විපාක වද්‍ය වශයෙන් අල්පවූ. ශික්ෂාපදයන්ගේ ලැබෙන එක් ප්‍රභෙදයක් "අපපඤ්ඤවජ්ජානි ලොක වජ්ජ වසෙනපි විපාක වජ්ජවසෙනපි විනිපි වජ්ජ හි අපපඤ්ඤාවජ්ජෝ අපප දෙසෙති අත්ථෝ" මනෝ: පූ: 424[12] සං: වි: 269[9] **-සුත්ත** (නා)= අල්පශ්‍රුත. ඇසූ තැනැක් නැති සුත්‍රගෙයාදී ඇසූ පිරූ තැනක් නැති. පිරිස් පරිහරණයට උගතමනාධම්මයන් ප්‍රගුණ නැති. තුගත්. මහා: පා: 57[10] ම:පා:ස: 239[31] වි:මා:ස: 122[25] ස:පා: 739[18]-749[19] **-හරිත** (නා)= 1 නිල් තණ ආදිය නොමැති තැන 2 මහල්ලක විහාර පාචිත්තිය ශික්ෂාපදයෙහි **පුබ්බණ්ණ** නම් වූ සත්ත ධාන්‍ය ස්ථ අපරණ්ණ නම් වූ මුං උඳු තල ආදිය නොවපුළ ස්ථානය. මහල්ලක විහාරය කරවන්නාවූ භික්ෂුව විසින් එහි වහල සෙවිලි කරණ විට දෙතුන් පරික්ෂේපයක් හෝ දෙතුන් මගක් **අපහරිත** ස්ථානයෙහිම හෙවත් **පුබ්බණ්ණ අපරණ්ණ** නොවපුළ තැනම සිට මෙසේ කරවයි විධාන කටයුතුය. "-**අපප හරිතෙ** යන මේ පාළියෙහි වචනය මදක් හැප්සුනේද අපහරිතයයි නොගත යුතු. **අපපිච්ඡා** යනාදියෙහි මෙන් **සවිප්‍රකාරයෙන්** නො හැප්සුනේම **අපප හරිත** යයි ගත යුතු" මෙහි 'අපප" ශබ්දය අභාවාර්ථයි. හරිත යනු යෙන් සාලි-වීහි ආදී සත්තවිධ ධාන්‍ය හා මුං මෑ ආදිය ගන්නේය, **ක:** වි: 96[18] ධ: අ: ගැ: 142[25] පාවි:පා: 51[33]-204[29] ස:පා: 574[16] මහා: පා: 407[9] ප්‍රා: පු: ස: 61[30] සාරා: ඕ: 128[26] ක: වි: පි: 72[21]

අපපකතඤ්ඤු (නා) (අ+පකතඤ්ඤු)= පණවන ලද්ද නොදන්නා. බුදුන් විසින් පණවන ලද ශික්ෂාපද නොදන්නා. විනය නොදන්නා. "යෙපි මෙ ගොවරෙ අපපකතඤ්ඤුනො තෙ දනි මේ ගොවරෙ පකතඤ්ඤුනො" මහා: පා: 348[21] ස: පා: 636[15] පරි: ගැ: 296 පරි:පා: 226[14] පාවි: පා: 111[16]-141[24]

අපපකාසනතා (නා)= ප්‍රකාශ නොකරමින්, නොපවසමින් පරි: ගැ: 27[12] (පකාසෙසි බලනු)

අපපගබ්භ (නා) (අ+පගබ්භ) [සං. ප්‍රගල්භ]= නොබුහුටිකම. ගර බුහුමන් කිරීම. **සංවරය.** අට තැනෙක්හි **කාය** ප්‍රගල්භයෙන් ද සිව් තැනෙක්හි වාග් ප්‍රගල්භයෙන් ද නොයෙක් තන්හි මනෝ ප්‍රගල්භයෙන්ද යුක්ත නොවූ. මෙබඳු තන්හි විනීතව සුදුසු සේ හැසිරෙන සුළු **නි:අ:** 139[25] (අට්ඨවත්‍ථූනි කායපාගබ්භිය බලං)

අපපවචය (නා) (න+පවචය) [සං. ප්‍රඛ්‍යය]= නො සතුට. දෞර්මනස. නොකැමැත්ත. මහා: පා: 122[22] සූ: වි: 407

අපපඤ්ඤත්ත (නා)= නො පණවන ලද බුදුන් විසින් නොපැණවූ ශික්ෂාපද. මහා:පා: 155[28] 409[19] පාචි: පා: 306[3] (පු:ලි: **අපපඤ්ඤදෙසනා** සන්‍ති ලි: **අපපඤ්ඤත්තා**, න:ලි: **අපපඤ්ඤත්තං**)

අපපටිකම්ම 1 (නා) (න+පටිකම්ම) [සං. ප්‍රතිකර්ම]= පිළියම් නො කළ. පිළියම් නොදැන හැකි. ඇවැතට පිළියම් නොකිරීම. දෙසනා ගාමිනී ඇවැතින් දෙසීමෙන් හා වුට්ඨාන ගාමිනී ඇවැතින් නැගී සිටීමෙන් පිළියම් නොකළ. **උත්ක්ෂේපනීය කර්මය** කිරීමට සුදුසු එක් කරුණක්. මහා: පා: 362[4]-395[23]

අපපටිකම්ම 2 (නා)= පිළියම් නොකළ හැකි. එබඳු ඇවැත. පාරාජිකාපත්තිය. "එකෙපා අපපටිකම්මා වුත්තා බුද්ධෙනාදිච්ච බන්ධුනා" පරි: පා: 161[20]-278[14] **-ංආපත්ති** (නා)= පිළියම් නොකළහැකි ඇවැත. පාරාජිකාපත්තිය පරි: පා: 161[20] **-ංකරණ** (නා)= ඇවැතට පිළියම් නොකිරීම. අලජ්ජී ලක්ෂණයක්, සඞ්ගී මොක්ෂ සමාපත් ආවරණය කිරීමක්. වි: වි: ටී: 263[4]

අපපටිකූල (නා) [සං. ප්‍රතිකූල]=පිළිකුල් නොවූ. ප්‍රිය මනාප, පිරිසුදු, "තුමෙහ ඛො නාත අනුරුද්ධ දෙව පුත්තා පියා මනාපා අපපටිකූලා මරණෙනපි වො අකාමිකා විනා භවිස්සාම" චූ: පා: 306[5] චූ: පා: B 140[12] (**අපපටිකූලසි** ද දක්නේය)

අපපටිසඞ්ඛානා (නා) (න+පටි+√කුස+යු= අන)= නො වැළැක්ම. ප්‍රතිශෝධනය නොකිරීම. පරි: පා: 210[17] ස: පා: 1007[18] (**අපටිසඞ්ඛානා** යනුද දක්නේය)

අපපටික්ඛ (නා)= නොබැලිය යුත්තා නොබලා ප්‍රතික්ෂේප කටයුතු පුද්ගලයා ප්‍රධානස්ථාන

යෙහි නොතැබිය යුතු භික්ෂුව. පාරාජිකාදි වසතුව, චතුර්විධ විපත්තිය, සප්තාපත්තිසඤ්ඤය, ශික්ෂාපදයන්ගේ නිදානය, පූර්වාපර වචනය සහ කම්, අධිකරණ, සමථයන් ද නොදන්, අදක්ෂ වූ ලාමක පිරිස්ඇති අගති ගාමී වූ භික්ෂුව අපපටිකඛ නම්. හේ නොබලා ප්‍රතිසේවන කටයුතුය. ජ්‍යෙෂ්ඨස්ථානයෙහි නොතැබිය යුතුය. පරි: පා· 219[87] සා: පා: 1014[26] සූ: ප: 1211[9]

අපපරිගහගීත (නා)= නොපිළිගන්නා ලද අකැප දේ. පඤ්ච අකප්පිය ලක්ෂණයන්ගෙන් එකක්. "පඤ්ච අකප්පියානි න පරිභුඤ්ජිතබ්බානි· අදින්නඤ්ච හොති අවිදිතඤ්ච හොති අකප්පියඤ්ච හොති අපරිගහීතඤ්ච හොති අකතාතිරිත්තඤ්ච හොති" පරි: පා: 178[14] (අපරිගහීත බලනු.)

අපපරිවජ්ජන (නා)= ප්‍රතිවර්ජනය නොවූ. ඇවැත් නොසැහවූ. (අපටිවජ්ජන බලනු)

අපපරිනිසජ්ජ (පු: ක්‍රි:) (න+පරි+නි+√සද්+ත්වා=ය) [සං. ප්‍රතිනිසද්‍යාඥ්‍ය]= නොකම්වා, ක්ෂමා නොකොට. බැහැර නොසොට ධ:අ:ගැ 155[21]

අපපරිනිසජ්ජගහ (නා)(පරි+නි+√සද්+ණ;ජ්-ග) [සං. නිසද්‍යගී]= බැහැර නොකිරීම. දුරු නොකිරීම. අත්නොහැරීම. චූ: පා:B 101[17] මහා: ප: 108[17]-181[3]-362[11] සං: ව්: 349[9]

අපපරිනිසජ්ජත්ත (නා)= අත් නොහළ, දුරු නොකළ, තමන් ගත් දෘෂ්ටිය අත් නොහරින ලද, ප්‍රා: පු: ස: 81[14] පාළි: පා: 134[9]

අපපරිපුගහල (නා) (න+පරිපුග්ගල)= ප්‍රතිපුද්ගලයන්හු නැති. සමානයෙක් නැති. අසමාන පුද්ගලයා. මහා: පා: 35[25]

අපපරිබඳ (නා)= පිළිබඳ නොවූ. නොබැඳි පවත්නා. බැඳීමක් නැති. "සචෙ අහං සම්ම පබ්බජිතා මම පරිබන්ධා අපපරිබන්ධා සා හොතූ" චූ: පා: B 142[14]

අපපරිහාන (නා) (න+පරිහාන) (පරි+√හා+යු-අන)= නොවැටීම්. ජා: අ: ගැ: 129[20]

කියා ද, එය ඇසු දුටු සෙසු භික්ෂූන් විසින් දෘෂ්ටිවිපන්න එම භික්ෂුවට 'ඇවැත්නි එසේ නොකියව" යනාදීන් තුන් යල දක්වා අවවාද කළ යුතුයි. එසේත් දෘෂ්ටිය නොහරී නම් සෙසු භික්ෂූන් විසින් එය හරවනු පිණිස දෘෂ්ටිය නොහැරීමෙහි උත්ක්ෂේපනීය කර්මය කළ යුතුයි. එම භික්ෂුවට කර්ම වාක්‍යාවසානයේ :"දිට්ඨි අපපටිනිස්සජ්ජන" නම් සුඛ පච්චි ඇවැත වේ. මෙය අරිට්ඨ භික්ෂුව උදෙසා පැණවූ බැවින් "අරිට්ඨ සික්ඛාපද නම් වේ. පාචි: පා: 133[32] ස: පා: 440[10]-644[32]

අරිත්ත (න) [සං: අරිත්‍ර[= ටීව. අ: ප: ස: 90[15]

අරිය (නා) [සං ආර්‍ය]= 1 ශ්‍රේෂ්ඨ, 2 නිවැරදි, පිරිසුදු 4 රහත්, 5 කෙලෙසුන් කෙරෙන් දුරු වූ.ස: පා: 97[15] පාරා පා: 5[4] -අට්ඨඞ්ගික මග්ග (නා)= ආර්‍ය අෂ්ටාඞ්ග මාර්ගය. 1 සම්මාදිට්ඨි 2 සම්මා සඞ්කප්ප 3 සම්මාවාචා 4 සම්මා කම්මන්ත 5 සම්මා ආජීව 6 සම්මා වායාම සම්මා සති 8 සම්මා සමාධි යන මාර්ගාඞ්ග අට. ප: සූ: 30[11] -උපොසථ (නා)= ආර්‍යශ්‍රාවකයන්ගේ උපෝසථය. බ්‍රහ්මචාරීපෝසථය. අඞ්ග; නි: 126[16] -භාස (නා)= 1. ආර්‍යයන්ගේ භාෂාව, මාගධී භාෂාව. ආර්‍යව්‍යවහාරය "තත්‍ර අරියකං නාම අරිය වොහාරෝ මගධ භාසා" 2. ආර්‍ය භාෂා කථාකරන්නා "අරියකෙන අරියකස්ස සන්තිකෙ, සික්ඛං පච්චක්ඛාති" ස: පා: 182[27] පාරා: පෙ: 276. පාරා: පා: 77[12] -ධම්ම (නා)= ආර්‍යධර්මය, පඤ්චශීලය මනෝ: පූ: 631[27] -පඤ්ඤ (නා)= ආර්‍යප්‍රඥාව, විදර්ශන ඥානය. -පුග්ගල (නා)=ආර්‍යපුද්ගලයෝ සෝවාන් ආදි මාර්ගඵලයන්ට පැමිණි පුද්ගලයෝ. -ඵල (නා)=ආර්‍ය ඵලය, අර්හත් මාර්ගඥානය. උතුම් ඵලය. -මග්ග (නා)=ආර්‍යමාර්ගය. ශ්‍රේෂ්ඨ මාර්ගය. -වාස (නා)= ආර්‍යවංශය. ආර්‍යවංශසූත්‍ර ප්‍රතිසංයුක්ත ධර්මකථාව. 1 ඉතරීතරෙන චීවරෙන සන්තුෂ්ඨි. 2 ඉතරීතරෙන පිණ්ඩපාතෙන සන්තුෂ්ඨි, 3 ඉතරීතරෙන් සේනාසනෙන සන්තුෂ්ඨි 4 භාවනාරති යනුවෙන් දක්නා ආර්‍ය වංශ සතර ම: මා: සා: 165[15] අඞ්ග: නි: 204[10] (ඉසාර මනෝරථ පූරණී අඞ්ගුත්තර අට්ඨ කථාවෙන් දක්නේහි. 487[18]) -විනය (නා)= ආර්‍ය විනය ශාසනය. "වුද්ධිහෙසා භික්ඛු අරියස්සවිනයෙ යෝ අවචයං අචචයතෝ දිස්වා යථාධම්මං පටිකරොති ආයතිං සංවරං ආපජ්ජති" අඞ්ග: නි: 849[1] මනෝ: පූ: 798[10] -විහාර (නා)= (වි + √හර + ණ)= ආර්‍යයන් විහාරය. ඵල සමාපත්තිය ම: මා: සා: -සච්ච (නා) [සං. සත්‍ය > සච්ච]= ආර්‍යයන් සත්‍යය. 1 දුක්ඛ 2 සමුදය, 3 නිරෝධ, 4 මාර්ග යන චතුරාර්ය සත්‍යය.

අරිස (නා)= එනම් රෝගය. අභිධ්. අ: ප: ස: 45[21]

අරු (නා)= වර්ණය, තුවාලය අ: ප: ස: 45[5]

අරුණ (නා) [සං. අරුණ]= අරුණෝ ලෝකය. හිරු උදාවන්නට පෙර පෙදිසින් නැගෙන හිරු එළිය සූර්‍යාලෝකය, මහාසත්‍යයකුගේ ඇසට බලු පැහැඇති අව්‍යක්ත රශ්මිවර්ණය. "අරුණෙනාම පුරත්ථිම දිසායං සුරියොදය නොපුරෙතරමෙව උග්ගතො භාසො. වි: ලං: 2[11] අ: ප: ස: 11[30] ම: ම: ටී: 424[18]. -උග්ගහ ආපජ්ජති (ක්‍රි)= අරුණු නැඟි කෙණෙහි ඇවැතට පැමිණෙයි. එකරත්ත ඡාරත්ත සත්තාහ දසාහ මාසාතික්‍රාන්තයෙහි පැමිණෙන ඇවැතට අරුණු නැඟි කෙණෙහි පැමිණෙයි. පරි: පා: 163[12] ස: පා: 975[21]- **උග්ගහ මන** (නා)= (ඵ + √ගම + යු= අන) [සං- උද් ගමන]= අරුණෝද්ගමනය, අරුණු නැඟීම. හිරු උදාවීමට පෙර පෙරදිග අහසෙහි දක්නා රක්ත වර්ණය වත්ත නිස්සේපණාදියට සුදුසු කාලය. ආචාර්‍ය උපාධ්‍යායන්ගෙන් කොරව බහි සීමායෙහි හැසිර නීස බිඳගන්නා නීස සමාදන්වූ භික්ෂුවටද, වස් කාලය තුළ උපචාර සීමාවෙන් පිටත ගොස් වස්සවෙජ්දයට පැමිණෙන වස්විසූ භික්ෂූන්ටද, අව්පවාස සීමාවෙන් පිටත තුන්සිවුරෙන් වෙන්ව වසන තෙවිවරික භික්ෂූන්ටද, සත්තබහන්තර සීමාවෙහි සහ සෙසුවාවට පොහෝනා කැනක අනුපසම්පන්නයන් හා සත්‍රීන් සමග එක්ව විසීමෙන් පවිති ඇවැත් අවදනා භික්ෂූන්ටද. වත ඉවතලීමෙන් රාත්‍රිවෙජ්දයට පැමිණෙන වත් පුරණ භික්ෂූන්ටද අරුණෝදාමනය දැන ගැනීමෙන්ම ශික්ෂාපද ආරක්ෂාවේ. වි: ලං: 21[29] පාරා: පා: 280[31] ම: ස: 1[379] ම: ම: ටී: 425[9] ක: ව: පි: 45[14] -**උපට්ඨාපන** (නා)= අරුණු නැන්වීම. රාත්‍රි අවසානයෙහි වන අරුණු කැඟීම. "එවං චිවර විප්පවාසාදිසුව සඞ්ඝත්ථෙරා රත්ති පරියොසානෙ ආගාමී අරුණවසෙනෙව අරුණුට්ඨාපනං වෙදිතබ්බං" ම: ම: ටී: 425[13] ම: ලං: 19[4] -**කාල** (නා)= අරුණෝ ලෝකය

උදවන කාලය. **වත්තනිකෙපනාදියට නියමිත කාලය** වලාකුළු ආදියෙන් නොවැසුණු පිරිසිදු අහසෙහි මස් ඇස් පැහැවත් මදරත් රැස් පෙණෙන කල පටන් අරුණු කාලය වේ පළිතාදියකින් වැසුණු තැනක් නම් යම් පමණ කාලයකින් විවෘත ස්ථානයෙහි රහතා ලොකය පෙනේ ද එතැන් පටන් අරුණ කාලය වේ. හිරුමඬල පෙනීමට එක් පැයකට හෝ දෙපැයකට පමණ පෙර කාලය අරුණ යයි නියමය වේ. දෙපැය කාලය වැඩියයි සමෙකුට විටහේනම් ඉර උදවීමට පෙර පැයක් කාලය අරුණ කාලයයි ගතයුතුය. වි: ලං: 21²⁸ **-වණ්ණ** (නා)= අරුණ වණ්ණය. මදරත් පැහැය. මත්ස්‍යයකුගේ ඇසට බඳු පැහැය වි: ලං: 21²⁶ (අරුණ බලනු.)

අරූප (නා)= 1 රූපයක් නැති 2 විරූප. සං: පා: 308³⁰.-**'අවචර** (නා) (අව + √චර + අ)=අරූප භාවනාව අරමුණු කිරීම් වශයෙන් හෝ අරූප භවයෙහි හැසිරෙන. අභි: ස: ස: 7³⁰ අභි: ව: 4²⁵ **-ංවිත්තන** (නා)= එනම් සිත (අ) අරූප භාවනාව අරමුණු කිරීම් වශයෙන් හැසිරෙන පවතින සිත හෝ (අ) ආකාසානඤ්චායතනාදි චතුර්විධ අරූප භවයෙහි හැසිරෙන-පවතින සිත හෝ (ඉ) අරූපාවචරයෙහි පවත්නා සිත හෝ අරූපාවචර නම් වේ. එනම් සිත් දෙළස. අභි: ව: 4²⁵ අභි: ස: ස: 7³⁰. **-භූමි** (නා)= එනම් භූමි. චතුර්විධ භූමින්ගෙන් එකක්. 1 ආකාසානඤ්චායතන 2 විඤ්ඤාණඤ්චා 3 ආකිඤ්චඤ්ඤං 4 නෙවසඤ්ඤානාසඤ්ඤං යන භූමි සතර. අභි: ව: 8¹² (5) (අරූපභූමි යනුද මෙයමැයි) **-ජීවිතින්ද්‍රිය** (නා)= එක් ජීවිතෙන්ද්‍රිය යක්. ජීවිතෙන්ද්‍රිය රූප-අරූප වශයෙන් දෙවැදෑරුම් වේ. එසින් අරූප ජීවිතෙන්ද්‍රිය විෂයෙහි උපක්‍රමයක් කළ නොහැක. එසේම එය විනාශ කරනුද නොහැක. උපක්‍රම කටහැකි වූයේද, විනාශ කටහැකි වූයේද රූප ජීවිතෙන්ද්‍රියම ය. රූප ජීවිතෙන්ද්‍රිය නැසීමෙන් අරූප ජීවිතෙන්ද්‍රිය ද නැසේ එයට ම අයත් බැවිනි මෙසේ සිදුවන ජීවිතෙන්ද්‍රිය විනාශය බල පවත්වන්නේ පවතුපන්න ජීවිතෙන්ද්‍රිය විෂයෙහි පමණකි. අතීත – අනාගත ජීවිතෙන්ද්‍රියයන්ගේ අභාවය නොවන හෙයිනි. කතිය පාරාජික ශික්ෂාපද පදභාජනියෙහි "ජීවිතින්ද්‍රියං උපච්ඡිජ්ජති" යනුවෙන් දක්නේ මේ රූප ජීවිතෙන්ද්‍රිය යි. පාරා: පා: 7 ²¹ සං: පා: 313²⁷

අරූපිය (නා)= [සං. අරූප්‍ය > අරූපිය] 1 "රූපියං යත්‍ර රත්‍රන් රිදී මසු කාවණු ඇත සතරට සාධාරණ නම්' යි කඞ්ඛා විතරණී ගැටපද බැවින් මේ සතරට අයත් නොවන දෑ. 2 රිදී නොවන. 3 රූපිය සංවොහාර ශික්ෂාපදයෙහි "අරූපියෙ රූපියසඤ්ඤී රූපියං වෙතාපෙති" යන තන්හි "අරූපියෙති ඛරපත්තාදිකෙ"යි කී බැවින් ඛර පත්‍ර ආදිය. **ඛරපත්තන** නම්; "ඛරසඞ්ඛාතං සුවණ්ණ පතිරූපකං වත්‍ථුං" යනු විමති විනොදනී ටීකා බැවින් රන් වැනි වසතුයි. 4 "අඟට වරාහාදි රූපයෙන් තළා වඩනලද රත්‍රන් රිදී දෙක රූපිය නම් වේ', රූ සටහන් ඇති රනරිදී කාසි. 5 කැපවත් හා දුකුළාවත්. වස්ත්‍රාදිය සහ මුතුමැණික් ආදිය. පාරා: පා 26⁹¹³ සං: පා: 605¹ කං: වි: පි: 52³³² වි: ම: 172³⁴ කු: සි: ස: 41³⁹ අ: ප: ස: 66³⁴ **—සඤ්ඤී** (නා)= රන් රිදී මසු කහ වණු නොවේය, ඛර පත්‍රාදිය යන හැඟීම ඇත්තේ. "රූපියෙ අරූපිය සඤ්ඤී රූපියං වෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං" පාරා: පා: 269¹³

අරෙ (නි)= ආමන්ත්‍රණයෙහි වැටෙන නිපාත පදයක්. "අරෙ, කොල." අ: ප: ස: I53¹⁰ වි: වි: ටී: 49²

අරොග (නා) (න + රොග) (√රුජ් + ණ; ජ=ග) =රොග නැති, නිරොග නොගිලන්. (පුං: ලි: **අරොගො** සංස්: ලි: **අරෝගා** නපුං: ලි: **අරොගං**) **-නත්තා** (නා)= නොගිලන් මුණුබුරන් ඇති. පාරා: පා: 2²²¹² **-පුත්තා** (නා)= නොගිලන් පුතුන් ඇති. "තෙන ඛො පන සමයෙන විසාඛා මිගාරමාතා අරොග පුත්තා අරොග නත්තා අනිමඛල සම්මතා" පාරා: පා: 222¹²

අලං (නි) [සං. අලම්]= 1 ප්‍රතික්ෂේප 2 ප්‍රතිෂේධ 3 පර්‍යාප්ත, ප්‍රයොජන නැති. යන අර්ථයන්හි වැටෙන නිපාත පදයක් අ: ප: ස: 153³⁵ සං: පා: 123¹⁶ 178³¹ කං: වි: පි: 17²⁷ **-'අභිඤ්ඤා දස්සන** (නා) (√දිස + ඤ=අන; √දිස=දස්ස)= කෙලෙස ප්‍රහාණයෙහි සමර්ථවූ විශුද්ධ ඥන දර්ශන ය. මෙහි ඤාණ නම් මහද්ගත ලොකෝත්තර ප්‍රඥාවයි. අ සින් දුටුවා මෙන් කරණ හෙයින් දස්සන නම් වේ. අරියවූ හෙවත්

උතුම්වූ ඤාණ දස්සනය, අරියඤාණ දස්සන නම් වේ. එය කෙලෙස විධ්වංසනයට සමර්ථ වූයේ අලමරිය ඤාණ දස්සන නම් වේ ධ්‍යානාදි උත්තරි මනුෂ්‍ය ධර්මය. මෙහි අරිය ශබ්දය ශුද්ධ පදාර්ථය වේ. ධ්‍යානාදිය නම්; විමොක්ෂ, සමාධි, සමාපත්ති, ඥානදර්ශන, මාර්ග භාවනා, ඵල සාක්ෂාත් කිරීම කෙලෙස ප්‍රහාණ, චිත්ත විනිවරණ, ශූන්‍යතාරයෙහි අභිරතිය ආදී මෙතොක් ධර්මයි කියනලදී විනයපිට මඤ්ඤූසා කඩිඨ විතරණී ටීකායෙහි "ඉධ පන මහගහත ලොකුත්තරාව වෙදිතබ්බානි ආහ මහගහත ලොකුත්තර පඤ්ඤා - පෙ - අරිය සද්දෝ චෙත්‍ථ සුඛ පරියායෝ. න ලොකුත්තර පරියායෝ ඣානාදි භෙදෙනි ආදී සඳ්දෙන විමොක්ඛ සමාධි සමාපත්ති ඤාණ සසන මග්ග භාවනා ඵල සච්ඡිකිරියා කිලෙසපපහාණ විනිවරණ තා චිත්තස්ස සුඤ්ඤතාරෙ අභිරතීති ඉමේ සඞ්ගහණාති" වි: ම: 79[33] කං: වි: 31[35] කං: වි: පි: 24[10] පාරා: පා 921 සං: පා: 348[37] ප්‍රා: පු: සා: 10[27] -**'ආවුසො** (නා) [සං. ආයුෂ්මාන් > ආයුසො > ආවුසෝ?] = ඇවැත්නි කම් නැත ආයුෂ්මත්නි ප්‍රයෝජනයක් නැත "අලං ආවුසො සත්තානං නෙසං යතොධම්මං රොචෙනත්තිති" චූ: පා: 328[22], 4294 -**'එතං සබ්බං** (නා)= යාවකාලික භොජනය කැප කරන භික්ෂුව විසින් කිය යුතු වාක්‍යය. 1 කැපවූ ද, 2 තමන් විසින් පිළිගත්තාවූද; 3 මඳක් ඔසවා හෝ බහා තබා හෝ පානා ලද්දාවූද, 4 දෙරියන් විසත් අත්පසට එළවන ලද්දාවූද, යාවකාලිකය කැප කරන භික්ෂුව "අලමෙතං සබ්බං" යි කිය යුතුය. මේ සිව්වැදෑරුම් භොජනය අයිරින් කරනුයේ 5 පවාරණය කොට අසුනෙන් නොනැහිටියේ හෝ 6 පවාරණය නොකොට සියලු ලෙසින් වැළඳුයේ හෝ ඇත දෙවැදෑරුම් විනය කර්මාකාරයෙන් යුත් භික්ෂුව 7 "අලමෙතං සබ්බං" යි වාග්භෙද කළේ සත්වැදෑරුම් විනය කර්මාකාරය සම්පාදනය කළේනම් වේ. කියනලදී කුද්දසික ටීකායෙහි "ඊදිසං චතුඞ්ගිඛාකාර සම්පන්නං භොජනං - පෙ - එවං දුවිධ විනයාකාර සම්පන්නෝ භික්ඛු අලමේතං සබ්බන්ති එවං භාසතු." මෙහි කැප නම් "භික්ෂූරු ලුහුණු ඇ කැප කළ බැව්හුදු අය පමස් නැති බැව්හුදු කුල දූෂණාදීන් නොඋපන් බැව්හුදු කප්පිය නම් වේ" කු: සි: සං: ං0[48] බු: සි: ටී: 51[10] -**'එතං සබ්බන්ති අවුත්තං** (නා)= "අලමෙතං සබ්බං" යි වාග් භෙද කොට ම නො කියනලද අනතිරිත්ත භොජනයේ එක් ලක්ෂණයක්. "අලමේතං සබ්බන්ති අවුත්තන්ති-පෙ-එවං අවුත්තං හොති අනතිරිත්තං" කං: වි: 108[17] කං: වි: පි: 83[38] සං: පා: 610[35] (අනතිරිත්ත බලනු) -**'එතං සබ්බන්ති වුත්තං** (නා)= "අලමෙතං සබ්බං" යි කියනලද අතිරික්ත භොජනයේ එක් ලක්ෂණයක්. සත් වැදෑරුම් විනය කර්මාකාර (සප්ත විනය කර්ම)යන් ගෙන් එකක්. යාවකාලිකය කැපකරන මහණ "**අලමෙතං සබ්බං**" කිය යුතුය. එහදී "අලමෙතං සබ්බන්ති" යි නිකාරය නොකිය යුතුය. කියනලදී. "එත්‍ථ නිකාරං අවත්වාව අලමෙතං සබ්බං එත්තකං වත්තුං වට්ටති යතු අවුවාසි"— "අලමෙතං සබ්බං සිය යුතුය. **නි** සිටුවයි. අල මෙතං සබ්බන්ති යූ හොතීදී නො කළා වෙයි" යතු විනය සන්නයි" මෙහි සප්ත විනය කර්ම නම් 1 කප්පියත්තය 2 පටිග්ගහිතකත්තය 3 උච්චාරිතකත්තය 4 හත්ථපාසෙයිතකත්තය 5 භුත්තාවිනා කත්තය 6 භුත්තාවිනා පවාරිතෙන ආසනා අවුට්ඨි තෙනත්තය 7 අලමෙතං සබ්බන්ති වුත්තෙන කත්තය යන මේයි. කං: වි: පි: 83[37] කං: වි: 108[26] කු: සි: සං: 31[13] (අනතිරිත්ත බලනු) **-කම්මනිය** (නා) (කම්ම + නිය) [සං. කර්මණ්‍ය]= කර්මක්ෂම වූ. කර්මයට යොග්‍ය වූ. මෛථුන සෙවනයට සුදුසු වූ. "කුඩ්‍යාදීන් ප්‍රවර්ත්තන හෙයින්ම අලං කම්මනිය වූ"—"අලං පරියත්තං කම්මනිය භාවායාති අලං කම්මනියං. තස්මි අලං කම්මනියෙ. යත්‍ථ. අජ්ඣා චාරං කරොන්තෙසා සක්කොනන්ති තං කම්මං කාතුං තාදිසෙති අත්‍ථො." සං: පා: 455[27] කං: වි: පි: 4[29] ප්‍රා: පු: සං: 31[25] පාරා: පා 225[17] **-කර** (ක්‍රි)= අලඞ්කාර කෙළේය. සැරසිය. වි: වි: ටී: 196 (අනී:-**කරි** වනී:-**කරොති** අනා:-**කරියති** පම්:-**කරොතු** සම්:-**කරෙය්‍ය** පූක්‍රි:-**කරිත්වා** තුං:-**කාතුං** අතීකා:-**කත** වත්තීකා:-**කරොනෙනා**= අලඞ්කාර කරමින්, සරසමින්) **-කාතුං** (තුං) (√කර + තුං) = කරන්නට සමර්ථවේ. සිසයින් කිරීමට සමර්ථවේ. ම: පා: සං: 253[8] පාචි: පා: 209[12] **-කාර** (නා) (අලං + √කර + ණ) = අලඞ්කාරයක්. ආභරණයක්. සැරසිල්ලක්. පළඳනාවක්. පාරා: පා: 279[5] අ: ප: සං: 39[38] **-ංභණ්ඩන** (නා)= පළඳන අබරණ. ඇඟිලි මුදු ආදිය., වි: වි: ටී: 168[38] **-ගොතම** (නා)= ගොතමිය කම් නැත උවමනා නැත. "අලං ගොතම මා තෙ රුච්ථි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ

ධම්මචිනයෙ අගාරසමා අනගාරියං පබ්බජ්ජාති." චූ: පා: B. 406[24] ස: පා: 951[9] —**දෙව** (නා) = දෙවයන්වහන්ස කම් නැත —**දත්ත** (නා)= දෙවදත්තයා කම් නැත. උවමනා නැත. "අලං දෙවදත්ත යො ඉච්ඡති ආරඤ්ඤකො හොතු" පාරා: පා: 206[5] ස: පා: 434[25] —**පණාමෙතුං** (තුං)= පණාමනය කරන්නට සුදුසු වේ. අත්හැරදමන්නට සුදුස්සෙකි. "පණාමනය කිරීම නම් "පණාමෙමි තං"-"මා ඉධ පටික්කමි" —"නීහර තෙ පත්තචීවරං"—නාහං තයා උපඨාපෙතබ්බො;' යනුවෙන් දෙශනා පාළියෙන් හෝ "මා මං නාමපපවෙසනං ආපුවඡි" යනාදීන් අටුවාහි කී ක්‍රමයෙන් හෝ සඞ්ඝිහාරිකයා උපාධ්‍යාය තෙරුන් වෙතට පැමිණීම වළක්වාලීම හා පා සිවුරු අස්කර ගන්නට නියම කිරීම ද, තමන්ගේ උපසම්පාදය වළක්වාලීම ද, කයින් හෝ වදනින් හෝ කය වදන් දෙකින් හෝ ඇණ වීමයි. පණාමනය කළ සඞ්ඝිහාරිකයන් අවවාදක්ෂම වී සමාව ඉල්ලුවිට එය දීමද, උපාධ්‍යාය තෙරුන්ගේ යුතුකමකි. එය ඉටු නො කෙළේ නම් ඔහුට දුකුළා ඇවැත්වේ පණාමනයකරනු ලැබූ සඞ්ඝිහාරික විසින් උපාධ්‍යාය තෙර සමා කළ යුත්තේය. එය නො කෙළේ නම් ඔහුටද දුකුළා ඇවැත්වේ. ම: පා: ස: 194[31] 233[27] පා: මූ: වි: වි: 260[24] ස: පා: 734[7] ධ: අ: ගැ: 274[18] (නිස්සයපණාමන බලනු) -**පමෙතුං** (තුං)= විමසීමට සම්ප්‍රාප්ත වූ. ඒ ඒ කරුණ නුවණින් සමකර බැලීමට දක්ෂ වූ. මහා: පා: 415[32] ස: පා: 856[16] -**භික්ඛු** (නා) (√භික්ඛ + රු) [සං. භික්ෂු]= මහණ: කම් නැත. "තීහඛෙහනී සමන්නාගතස්ස භික්ඛුනො සඞ්ඝමජ්ඣෙ උපොසථං ඨපෙන්තස්ස අලං භික්ඛු මා භණ්ඩනං මා කලහං මා විගහං මා විවාදන්ති ඔවදිත්වා සඞ්ඝෙන උපොසථො කාතබ්බො" පරි: පා: 170[11] ස: පා: 980[10] -**මොඝ ලල්ලාණ** (නා) (මුඝල + ණාන)= මුඟ්ඟන කම් නැත. "අලං මොඝලල්ලාන මා තෙරුවේ පඨවිං පරිවත්තෙතුං" පාරා: පා: 7[8] ස: පා: 123[15] -**වච නීය** (√වච + නීය)= කියයුතු නොවන. නො බිණිය හැකිව අත්හළ. හායඤ්ඤා භාවය ඉක්මවූ. සඤ්චරිත්ත සඞ්ඝාදිසෙස ශික්ෂාපදයෙහි ආපත්ති සාධක අඞ්ග පඤ්චකයෙන් එකක්. මෙහි "අලං" ශබ්දය නිවාරණාර්ථයි "මත්තඤ්ඤූතිකතා න නා ලං වචනීයතා (විමති විනොදනී ටීකාහි ද, ප්‍රාති මොක්ෂ වණ්ණනාහිද දක්නට "**නාලං වචනීය කා**?" යනුයි) පතිගණ්හන චිමංසන පච්චාහරණා නීයි ඉමා නෙසං පඤ්ච අඞ්ගානි" යන තන්හි "**න නාලං වචනීයතා**" යනු "**අලං වචනීය තා**"වය මැයි. කඞ්ඛාවිතරණී ටීකාවෙහි එය මෙසේ විසතර කරයි. "**න නාලං වචනීයතා**" ති යථා වුත්තනයෙන පරිවත්තා **අලං වච නීයා. නිවාරණත්ථොහි** එත්ථ අලං සද්දො. න අලං වචනීයා= නා ලං වචනීයා, න නාලං වච නීයා තස්සා භාවො නානාලං වචනීයතා. අථ වා වචනීයතා ඉවෙව වුත්තං හොති"—"න නා ලං වචනීයතා, සඞ්ඝමජ්ඣු විසින් ඇය මත්තෙහි නිග්‍රහ සඞ්ග්‍රහ වශයෙන් කිසිවක් නොකිණිය හැකිව නො හළ බවය"—යනු කඞ්ඛාවිතරණී හැටපදයි. "යාහි යථා යථා යෙසු යෙසු ජනපදෙසු පරිවත්තනාව හොති, භරියාභාවං අතික්කමති අයං"**අලංවචනියාති**" වුච්චති" විමතිවිනොදනී ටීකාවෙහි "**අලං**" ශබ්දය අභිධේයයෙහි සලකා ඔවුනොවුන් කෙරෙහි කැමැත්තක් නැතිව වෙන්වූ අඹුසැමියන් සකාන කරන්නට සුදුසු වචනය "**අලංවච නීය**" නමැයි කියයි. "ඉත්ථිවා පුරිසෙ වා උභොපි වා ජායභාවෙ සාමික භාවෙ ච නිකඛිත්ත ඡන්දතාය අවචනත්ත වියුත්තතත්තා දන අඤ්ඤමඤ්ඤ සමාගමත්ථං මා එවං අක රිත්ථාති ආදිනා මවචනීය වත්තබ්බතා **අලං අරහානි** = අලං වචනියා, අලං වා කත්තුං අරහං සකාන වචන මෙතෙසු ඉත්ථි පුරිසෙසු නි= අලං වචනියා. සකානකාරස්ස වචනං විනා අසංගවජ්ඣනකා පරිවත්තා මෙවාති අධිප්පායෙ" ස: පා: 401[31] කං: වි: 38[28_29] වි: ම: 102[7] කං: වි: පි: 301[3] පාරා: පා: 170[12] වි: වි: ටී: 227[1] ටී: වි: 376 -**සංවිධාතා** (තුං)= සංවිධාන කරන්නට සුදුසුයි. පාචි: පා: 209

අලාත (නා) [සං. අලාත] = හිනි පෙණෙලි. ස: පා: 637[28] වි: වි: 1617 (ජෝති සික්ඛාපද බලනු).

අලාබු (නා) = ලබු නව මහා ඵලයෙන් එකක්. යාවකාලිකයට අයත් වූවක්—කෙළි පිණිස නමුදු නො ඇල්ලියයුතු ඵල විශෙෂයක්. "ආදි සද්දෙන නාලිකෙර ලබුජතිපුඝ අලාබු—පෙ— සඞ්ඝහො දණ්ඩෙබ්බා පෙ-කීළාධිප්පායෙන ආම සනං නවට්ඨති" කං: වි: 114[34] කං: වි: පි: 88[25] කු: සි: ස: 32[26] සා: පා: 387[20] සාර: දී: 661[16] (අනාමාස බලනු)

අලකඛික (නා) (න + ලකඛී + ක) [සං. ලක්ෂ්මී > ලකඛී + ක]= නිඃශ්‍රීක. අභාග්‍ය. කාලකණ්ණි. පින්මද. "මය මෙවං මහා අලකඛිකා මයං අපප පුඤ්ඤා." පාරා: පා: 22[1] සා: පා: 160[21] අ: ප: සා: 13[25]

අලගද්ද (නා) [සං. අලගර්ද]= සර්පයා. නාගයා. **අලංගද්ද** යි කියයුතු තැන "**අලගද්ද**"යි කියති විමති විනොදනී ටීකා පාඨයි. **අලගද්දූ**නි වෙසි ආසිවිසෝ වුච්චති. සෝ හි අලං පරියත්තෝ ජීවිතහරණෙ සමත්ථෝ වා විස සඤ්ඤා තෝ ගද්දූ අස්සාති අලංගද්දූනි වත්තබ්බෙ **අලගද්දූ**නි වුච්චති" චූ: ච: ටී: 19[14] සාර: දී: 69[15] අ: ප: සා: 88[24] -**උපමා** (නා) සර්පයකු ගැණීමට බඳු උපමා ඇති. තෙවැදෑරුම් පඤ්ඤා පතියෙන් එකක්. සා: පා: 133[3] ච: ච: ටී: 19[12] සාර: දී: 69[15] (**අලගද්ද පරියත්ති බලනු**)- **පරියත්ති** (නා)= එනම් පඤ්ඤාපතිය. ත්‍රිවිධ පඤ්ඤාපතියෙන් එකක්. චීවරාදි සිවුපසඟ පිණිස හෝ ලාභ සත්කාරාදිය පිණිස බුඬවචනය ඉගෙණීම. සර්පයකු වරදවා ගැණීම මෙන් ත්‍රිපිටක බුඬවචනය ලාභ සත්කාරාදිය පිණිස ඉගෙණීම. "තත්‍ර යො බුඬවචනං, එවං චීවරාදිනිවා ලභිස්සාමි, චතුපරිස මජ්ඣෙ වා ඕ ජානිස්සන්තීති ලාභසක්කාරහෙතු පරියාපුණාති තස්ස සා පරියත්ති අලගද්ද පරියත්ති **නාම**. එවං පරියා පුණන්තොහි බුඬවචනං අපරියා පුණිත්වා නිද්දොක්කමනං වරතරං." ප: සූ: 89[1] සා: පා: 133[3].

අලච්ඡින්න (නා)= මහ ඇඟිලි සිඳුණු. පැවිදි නොකළයුතු පුද්ගලයෙක්. "න අලච්ඡින්නො පබ්බාජෙතබ්බො" මහා: පා: 101[19] සා: පා: 766[28] චූ: ච: 248[6] (අලච්ඡින්න යි ද දක්නේය)

අලජ්ජී (නා) (න + ලජ්ජී) (ලජ්ජා+ඒ)= ලජ්ජා නැති පුද්ගලයා. පවට ලජ්ජා නැතියහු. 1 දැන දැන ඇවැතට පැමිණෙයා. 2 අවන් ඇවැත් සහවන, 3 අනතිනාමී වන පුද්ගලයා. "අලජ්ජී සඤ්චිච ආපජ්ජනාදිනා අලජ්ජිලකඛණෙන සමන්නාගතො" සා: ප: 883[14] චූ: ච: ටී: 108[16] පරි: පා: 213[8] (පු: ලි: **අලජ්ජී**. ස්ත්‍රී ලි: **අලජ්ජිනී**) චූ: ච: ටී: 131[24] —**තා** (නා)= ලජ්ජා නැති බව. ඇවැතට පැමිණෙන කරුණු සයෙන් එකක්. 1 අලජ්ජිතා, 2 අසඤ්ඤණතා 3 කුකඤ්චපකතතා, 4 අකප්පියෙ කප්පිය සඤ්ඤිතා, 5 කප්පියෙ අකප්පිය සඤ්ඤිතා 6 සතිසම්මොසා යන මේ කරුණු සයෙන් ඇවැතට පැමිණේ. එහි **අලජ්ජිතා** නම්; අඤ්ඤාප බැව් දැන දැන ව්‍යතික්‍රමණය කිරීමයි. "කථං **අලජ්ජිතාය** ආදජ්ජති? අකප්පිය භාවං ජානන්තොයෙව මද්දිත්වා විනිකකමං කරොති" සා: පා: 646[20] කං: වි: 145 චූ: ච: ටී: 108[26] -**පරිහොග** (නා)= අලජ්ජීන් සමඟ කරන පරිහොගය. අබ්‍රහ්මචාරීව බ්‍රහ්මචාරියයි ප්‍රතිඥා කරන ශ්‍රමණ නාමය (ගොත්‍රභූ) පමණක් දරන්නවුන් සමඟ කරන පරිහොගය. 'තස්මා එවරූපෙහි පටිඤ්ඤාය භික්ඛූහි ගොත්‍රභූ පරියොසානෙහි සඞ්ඝං සමෙහාග පරිහොගො න වට්ටති. **අලජ්ජී පරිහොගොව** හොති" "අලජ්ජීහි සහ පරිහොගො අට්ඨකථායං පටික්ඛිත්තොතා" චූ: ච: ටී: 108[26-33] — 119[21] -**පුග්ගල** (නා)= අලජ්ජී පුද්ගලයා. අලජ්ජී භික්ෂුව. 1 දැන දැන ඇවැතට පැමිණෙන, 2 අවන් ඇවැතට පිළියම් නොකර සඟවන, 3 ඡන්දදීන් අගතියට යන භික්ෂුව. පරි: පා: 213[8] සා: පා: 883[14] සු: ප: 111[32] (**අලජ්ජී බලනු**) -**ලක්ඛණ** (නා)= අලජ්ජීන්ගේ ලක්ෂණ. චූ: ච: ටී: 108[27] (**අලජ්ජිතා බලනු**) -**වොහාර** (නා) [සං ව්‍යවහාර]= අලජ්ජී ව්‍යවහාරය. අලජ්ජියෙක යන භාවිතය. "සාමණෙරාදිනම්පි අලජ්ජී වොහාර දස්සනතො අලජ්ජී සාමණෙරෙහි හත්ථකම්මම්පි න කාරෙතබ්බන්ති වුත්තං" චූ: ච: ටී: 108[28]

අලත්ථ (ක්‍රි) (අ + √ලභ + ඒ=ත්ථ)= ලැබිය. "අලත්ථ උපසම්පදං" පාරා: පා: 133[3] (අතී: **අලභි**= **අලත්ථ** වර්ත: **ලභති** අනා: **ලභිස්සති** සම්: **ලබෙය්‍ය** පම්: **ලභතු** පුක්‍රි: **ලභිත්වා** වකෘ: **ලභමානා** සත්‍රි: ලි: **ලභන්ති** න: ලි: **ලභන්ත**ං= ලබමින්, ලබන්නහු)

අලබ්ධ සම්මුති (නා)= නොලද සම්මුතිය ඇති. භික්ෂු සම්මුතිය නොලැබූ. චූ: ච: ටී: 265[16] (අසඤ්ඤත්‍ර භික්ඛු සම්මුති බලනු)

අලමත්තතර (නා) (අලං + මත්ත + තර) [සං. මාත්‍ර > පා: **මත්ත**]- ඉතා සමර්ථ. අති දක්ෂ. "තුම්හෙ තෙන පණ්ඩිතතරා ච-පෙ-අලමත්ත තරාච" චූ: පා: 1[9] සා: පා: 857[4]

අලාත (නා) 172 වෙනි පිටුව බලන්නේය.

අලාබු (නා) 172 වෙනි පිටුව බලන්නේය.

අලාභ (නා) (න + ලාභ) (√ලභ + ණ = නොලැබීම. අලාභය, පාඩුව. "අලාභා වත මේ න වත මෙ ලාභා." පාරා: පා: 18[4] ස: පා: 756[19]

අලාභක (නා) (අලාභ + ක)= නොලැබීම. "මනාපිකං රූපං උපසංහරති ඉමං පසසිත්වා අලාභකෙන සුසසිත්වා මරිසසතීති" පාරා: පා: 76[17]

අලික (නා)= බොරුව. අසත්‍යය. අ: ප: ස: 191[11]

අලොණික (නා) (න + ලොණික) (ලොණ + ඉක) [සං. ලවණ > පා: ලොණ]= ලුණු නැති. ලුණු නොලද කැනකදී. "කපපති භනෙෙ සිඛතිනා ලොණං පටිහරිතුං යපප අලොණිකං භවිසසති තපප පරිභුඤජිසසාමීති. නාවුසො කපපතීති" චූ: පා: 443[37]

අලොහිත (නා) (න + ලොහිත)= ලේ නැති. දුට්ඨුල්ලවාචා සඞ්ඝාදිසෙස ශික්ෂාපද ආක්‍රොශ නිදේශයෙහි දැක්වූ එකළොස් පදයෙන් එක් පදයක්. විඅලි ගිය හෙයින් දකසොතඅාගේ පහව ගිය ලේවන් බව ඇති. එබඳු තැනැත්තිය. පාරා: පා: 1455 ස: පා: 391[12] සාර: ම: 55[25]

අලල (නා) [සං. ආර්ද්‍ර > පා: අද්ද > සි: අද] [සං. ආර්ද්‍ර > පා: අලල] (සංස්කෘතයෙහි "ද්‍ර" ශබ්දය පාළියට "ද්ද"—"ල්ල"සි දෙවිධියෙන් ම බිඳෙන්නේය. මෙහි ඒ දෙවිධියෙන් ම දක්වන ලද්දේ එබැවිනි. සං: ක්ෂුද්‍ර > පා: බුද්ද > සිං: කුදු; සං: ක්ෂුද්‍ර > පා: චුල්ල > සිං: සුළු; සං: ජිද්‍ර > පා: ජිද්ද > සිං: සිද (කෙසි සිද) සං: ජිද්‍ර > ප්‍රා: ජිල්ල > සිං: සිල > ඡිල; යනුදු සමානකර බලන්නේය)= තෙත්. නොවියලි. නොවේලුණු. කු: සි: ස: 86[28] 113[18] -ඔකාස (නා) [සං. අවකාශ]= තෙත් පෙදෙස. සත්‍රියගේ අඞ්ග ජාතයෙහි ප්‍රකෘති වාතය සපහි නොවන පෙදෙස. එහි තම අඞ්ගජාතය එක් තලැටක් ප්‍රමණ කුදු ප්‍රවෙශ කරන භික්ෂුව පරිජි වේ. ස: පා: 183[16] වි: වි: 6 —ඔසස (නා)=තෙත් හිසකේ. තෙත් හිසකෙස් ඇතිව. චූ: පා: 238[17] -පාද (නා)= තෙත් පා ඇතිව. පැහැ තැන දිය සටහන් පෙනේ නම් ඒ තෙත් පා ය. එබඳු තෙත් පයින් පිරිබඳ ගත් බිම හෝ සෙනසුන නොපැහිය යුතුය. පාපිස්න වනාහි පාඟනු වේ. ස: පා: 921[23] කු: සි: ස: 113[18] -රුකඛ (නා)= නොමළ රුක. නොවියලි ශස. නොමළ ශස ලා-ලඟවූ සහ හතු ගන්නාහටද. එහි අකුරු කොවන්නාහටද පවිති වේ. කු: සි: ස: 491[8] -වසස (නා)= තෙත් වසපු ඇතිව. චූ: පා: 238[17] -සරීර(නා)= තෙත් සිරුර. "මතෙ අලල සරීරෙ පාරාජිකකෙකතෙන පාරාජිකං" ස: පා: 190[5-14] වි: වි: 22 -සිඛතිවෙර (නා) [සං. ශාඛතිවෙර]= අඹු ඉහුරු. බීජඝාමයට ඇතුළත් වූවක්. කැප වූවක්. මෙය කැප නොකර විකොපනය කරන්නහුට දුකුළා වේ. වි: වී: 1028 ස: පා: 555[25] -හසත (නා)= තෙත් අත, අත්ල "පොළෝ බිඳිමි යන සිත් නැතිව තෙත් අත්ල බිම ඔබා රජස් ගැන්මි වටී" කු: සි: ස: 86[6] වි: වි: 974.

අලලි (නා)= සිහින් සහා කොළ. පත් රජන්හි අකැපවූ කොල විශෙෂයක්. 1 මුල්, 2 කඳ, 3 සුඹුලු, 4 පත්, 5 ගෙඩි, 6 මල් යනුවෙන් රඳන්හු සවැදුරුම් වෙති. එයින් පත් රඳන්හි සිහින් සහා කොළ අකැපය. සේසු සිඟල්ල කැපය. කු: සි: ස: 233[0] වි: වි: 2744.

අලලියිසසතති (ක්‍රි)= ඇලෙන්නෝය. එකතැන වසන්නෝය. "ඉමෙහි නාම සකුනතකා රුකඛ ගෙහසු කුලාවකානි කරිත්වා වසසාවාසං අලලී සිසසනති සඞ්කාසසිසසනති" ම: පා: ස: 425[19] කු: වි: පි: 36[10] වි: වි: 961

අව (උ: ස:)= 1 විරහය 2 අවබොධය 3 අධොභාවය 4 නිශවය 5 ශුඩිය 6 සවලපය 7 නිසූව 8 අවකෘෂය 9 ව්‍යාපත්තිය 10 හානිය 11 වාක් ක්‍රියාවය 12 සොරකමය 13 ඥකප්‍රාපතිය යන අර්ථවල වැටෙන උපසර්ගයක්. අ: ප: ස: 157[18] (බොහෝ තැන "අව" උපසර්ගයට "ඔ" ආදෙශ වේ) -කාරක (නා)= විසුරුවීම, වගුරුවීම, වීසිකිරීම 'සිත්වාවකාරකනත් සිත්වානි අවකිරිත්වා අවකිරිත්වා"—"වගුරුව වගුරුවා' ක: වි: පි: 128[21] ඛ: වි: 1: 3[12] (සිත්වාවකාරක බලනු) -කිරි (ක්‍රි) විසුරුවිය. වගුරුවිය. ක: වි: පි: 128[21] -කඛාරපාති (නා)= ඉතිරිවූ පිණ්ඩපාත හොජනය ඉඳුල් නොකොට දමන භාජනය. ' අවකඛාරපාතිනත් අතිරෙක පිණ්ඩදානං අපනෙත්වා ඨපනත්ථාය එකං සමුගග පාතිං ඩොවිත්වා ඨපෙති" ප: සු: 201[4] මහා: පා: 1774-4076 ධ: අ: ගැ: 99[14] -ගණ්ඩකාරක (නා)= කොපුලෙහි රැස්කොට තබා, වඳුරන් සේ කොපුල රැස්කොට තබා ආහාර නොවැළඳිය යුතුයි. ආහාර අනුභව නොකළයුතු පිළි

වෙලක්. පලා එල පිළිබඳව වරදක් නැති. ''න අව ගණ්ඩකාරකං භුඤ්ජිස්සාමීති සිකඛ කරණීයා'' ''ඉධ එලාඵලමත්තෙන අනාපත්ති'' උ: ප්‍රා: 79[84] ස: පා: 664[24] චූ: පා: 345[27] උපරි: පා: 39[35] ක: වි: 153[17] **-වෙජ්දක** (නා) (අව + √ඡිද + ණ = ඡේද + ණ්වු = අක) = සිදු සිදු, කඩ කඩා. ''න කබලා වවෙජ්දකං භුඤ්ජිස්සාමීති සිකඛා කරණීයා'' ක: වි: පි: 129[15] **-ඤාණාති** (ක්‍රි) (අව + √ඤ + නා + ති; √ඤ = ඥා) = අවඥ කරයි. අවමන් කරයි. පරි: ගැ: 29[8] (අතී: **ඤාති** වති:—**ඤානාති** අනා:—**ඤානිස්සති** සම්:—**ඤානෙත්‍ථ** පම්:-**ඤානාතු** පූක්‍රි:-**ඤානිඞ්ඛා** වක:-**ඤානෙතෙනා** = අවඥකරන්නේ. පරි: ගැ: 29[8]) **-ඤානිත්‍වා වෙඤානාති** (ක්‍රි) = නොදැන වළඟයි. පළමුව මව්සින් නොදක්නා ලදැයි හෝ නොඅසන ලදැයි කියා පසුව දක්නා ලදැයි හෝ අසන ලදැයි කීම. සඞ්ඝාමාවචර භික්ෂුව පිළිබඳව දතයුතු පූර්වාපර කරුණු. පරි: පා: 221[13-15] ස: පා: 1015[5] පරි: ගැ: 28[11] (අඤ්ඤත්‍ර අසුද්ධං පටිවරති බලතු) **-සඤ්ඤ** (නා) [සං. අවඥ]- නින්ද කිරීම. නින්ද වශයෙන් සලකන. පහත්කොට සලකන. ''අවඤ්ඤ තනති වඤ්චෙත්වා සුතං'' පාචි: පා: 7[81] ස: පා: 538[6] (අවඤ්ඤ යන්තු දක්නේය. ස: පා: 538[5]) **-මඤ්ඤති** (ක්‍රි) = අවමන් කරයි. නින්ද කරයි. ධ: අ: ගැ: 62[23] **-මාන** (නා) (අව + √මන + ණ) = නින්දුව. පහත්කොට සිතීම. තිරසකාරය. අ: ප: ස: 2[18] **-රූඪ** (නා) (√රුධ් + ත) වැළැක් වූ. වළක්වනලද. ස: පා: 634[24] **-ලිත්ත** (නා) (√ලිප් + ත) [සං. ලිප්ත] = පිටත ආලෙප කළ පිටත්හි සුණු මැටි ගහන්නෝ අධොමුඛ කොට ලිම්පනය කෙරෙති. එහෙයින් **අවලිත්ත** නම් වේ. ''ඡදනයේ පිටත සුණු පිරිසම් කළ. කුටි කාර සඞ්ඝාදිසෙස ශික්ෂාපදයේ සඳහන් ලක්ෂණ යක් ''අවලිත්තානාම ඡදනස්ස බහිලිත්තා'' පාරා: පා: 171[33] ස: පා: 466[26] ක: වි: 39[28] සාර: දී: 67.[1] න: වි: පි: 30[28] **-ලෙඛන සාටක**[2] (නා) [සං කාෂ්ඨ] = ප්‍රසන්කූර. පුසන. අසුචි පිස දැමූ කාෂ්ඨය. චූ: පා: B. 294[4] **-ලෙඛන පිඨර** (නා) [සං. පීඨර] = ප්‍රසන්කූරු දමන භාජනය. ''සචෙ අවලෙඛන පිඨරා පූරෝ හොති අවලෙඛන කට්ඨං ඡඩ්ඩෙතබ්බං'' චූ: පා: B. 294[4] (අව ලෙඛන පිඨර යනුත් පාඨයි.) (අපලෙඛන පිඨර බලතු) චූ: පා: 255[25] **-ලොඛන** (නා) (අව + √ලුව + යු = අන) = බැලීම ඇසිම. විමසීම. **-වාද** (නා) = අවවාදය. ඔවදන. අනුශාසනය. **-සිට්ඨ** (නා) (අව + √සිස + ත) [සං. අවශිෂ්ට] = ඉතිරි. ශෙෂ. අධික. ''බහුං සුත්තං අවසිට්ඨං හොති'' පාර: පා: 284[30] **-සෙස** (නා) (අව + √සිස + ණ) [සං. අවශෙෂ] = ඉතිරි අධික. **-සුත** (නා) (අව + √සුද + ත) = රාග යෙන් තෙත්වූ. කායසංසර්ගී රාගයෙන්, ඡන්දරාග යෙන් තෙත්වූ. ''අවස්සුතාති ලොකස්සාදමිත්ත සන්ථව වසෙන කායසංසග්ගරාගෙන තින්තා'' ක: වි: 161[29-166][1] ක: වි: පි: 132[16] ස: පා: 670[23-673][17] (පුං: ලි: **අවස්සුතෝ** සත්‍රී: ලි: **අවස්සුතා** නපුං: ලි: **අවස්සුතං**) **-හරණ** (නා) (අව + √හර + ල්‍යු = න; න = ණ) = සොරකම් කිරීම. අන් සතු වස්තුව සොර සිතින් ගැනීම. ස: පා: 217[2] **-ංචිත්ත** (නා) = සොරා ගැනීම් සිත. සොරසිත. ස: පා: 217[2] පාරා: පා: 45[25] **-හරි** (ක්‍රි) (අව + √හර + ඊ) = සොරකම් කෙළේය. පැහැර ගත්තේය. (අතී:-**හරි** වති:-**හරති** අනා:-**හරිස්සති** සම්: —**හරෙය්‍ය** පම්:—**හරතු** පූක්‍රි:—**හරිත්වා** අතීකෘ: —**හත=හට** වර්තෘ:—**හරෙන්තා**=සොරකම් කර මින්. පැහැර ගනිමින්. ස: පා: 214[30-217][24] පාරා: පා: 45[26-52][2] 574) (අඤ්ඤ මඤ්ඤං චීවරං කෙන අවහටන්ති පාරා: පා: 574) **-හරෙය්‍ය** (ක්‍රි) = සොරකම් කරන්නේද, ''තමා කෙරෙහි නහා තුබ්බා මම නොගන්මි යනාදීන් බොරු කියා භණිනම්'' පඤ්ච විසති අවහාරයන්ට ඇතුළත් එක භණ්ඩ පඤ්චකයෙහි සහ නානා භණ්ඩ පඤ්චකයෙහි තුන්වන අඞ්ගය. එක භණ්ඩ පඤ්ච කයෙහි සවිඤ්ඤාණක වස්තු වශයෙන්ද, නානා භණ්ඩ පඤ්චකයෙහි සවිඤ්ඤාණ අවිඤ්ඤාණක වස්තු වශයෙන්ද ලැබෙන තමන් වෙත පරෙස්සමට භාර දුන් යම්කිසි සතකු හෝ බඩුවක් මම නොහත්මි යි කියා නොදී ගැන්ම. ''අවහරෙය්‍යාති උපනිකඛිත්තං භණ්ඩං මෙ දෙතීති වුච්චමානෝ ''නාහං ගණ්හාමිති භණති'' ස: පා: 217[16] පාරා: පා: 45[36] **-හාර** (නා) (අව + √හර + ණ) = සොරකම. භික්ෂු ජීවිතයෙහි අවිජානය. වස්තු හිමියන් විසින් කසින් හෝ වදනින් නො දෙන ලද් දක් ලොභාදි චෙතනාව මුල්කොට ගැණීම. අදත්තාදාන පාරාජික විෂය වූ මේ අවහාරය මිනිසකු අයත් වූවක් විනා තිරිසන් ප්‍රෙත යක්ෂ දෙවාදීන් සතුවූවක් ගැණීම් ආදියෙන් සිදු නොවේ. ප්‍රභෙද හෙයින් අවහාරය විසිපස් වැදෑරුම් වේ. ඊට පස්විසි අවහාරය යි කියති.

ම: පා: සං: 492[9] සං: පෘ: 213[14] කං: ටී: පි: 21[16] කං: ටී: 26[1] (පඤ්චවිසති අවහාර බලනු) –ංඅඛ (න)= අවහාරයට නියම අඛය, කරුණු. අයි නාදුන් පරිජී ඇවැත සිදුවීමට නියම කරුණු. "පරපරිග්ගහිතඤ්ච හොති" යනාදීන් දක්නා කරුණු. පාරා: පා: 53[13] සං: පෘ: 218[16] –ංක (නා)= අවහාරකයා. සොරකම් කරන්නා. එබඳු භික්ෂුව. පාරා: පා: 52[14] —කාල (නා)= සොරාගත් කාලය. පස්විසි අවහාරයන් පිළිබඳ විනිශ්චයයෙහිදී සලකා බැලිය යුතු කරුණු පසින් එකක්. අවහාර විනිශ්චයයෙහිදී 1 වසතුව (භාණ්ඩය) 2 කාලය 3 දෙශය 4 අගය 5 පරිභොගය යන කරුණු පස විමසා බැලිය යුතුය. එහි **1 වසතුව** නම් සොරාගත් භාණ්ඩ යයි. අවහාරකයා විසින් "මම මෙය සොරකම් කෙළෙමි"යි කී නමුදු එපමණකින් ඇවැත් ආරොපනය නො කොට ඒ භාණ්ඩය සසවාමික ද, නැතහොත් අසවාමිකදැයි විමසිය යුතුය. එසේම සසවාමික වූවක් නමුදු එහි සවාමියාගේ ආලය පැවැත්තේ ද, නො පැවැත්තේදැයි විමසා අසිතිය පැවැති කාලයක නම් එහි අගය කරවා ඇවැත් ආරොපනය කළ යුතුය. නිරාලය කාල යක පැහැර ගත්තේ නම් ඇවැත් ආරොපනය නො කොට බඩු හිමියන් ඉල්ලන කල එය දිය යුතුය. **2 කාලය** නම් සොරාගත් කාලයයි. යම් බඩුවක් යම්කලෙක සොරා ගත්තේද, ඒ කාල යේ එහි අනය අනුව ඇවැත් වේ: සමහර බඩු වක අගය කලින් කල අඩු වැඩි වේ. **3 දෙශය** නම් බඩුව සොරකම් කළ දෙශයයි. යම් පළාත කදී යම් බඩුවක් සොරකම් කළේද, ඒ දෙශයේ ඒ බඩුවේ අගය අනුව ඇවැත් වේ. **4 අගය** නම් සොරකම් කළ බඩුවෙහි වටිනාකමයි. එය පරණ වනවිට හෝ දිරා යන විට හෝ අගයෙන් අඩු වේ. නව භාණ්ඩයක අනය අධික වේ. **5 පරිභොගය** නම් භාණ්ඩ පරිභොගයයි. පරිභොගය නිසා බඩුවක අගය පිරිහේ. පාදයක් අනනා බඩුවක් සොරකම් කළේ නමුදු එය එක දිනක් හෝ බඩු හිමියා පරිභොග කරන ලද්දක් නම් පාදයක් නො අගනේය. පරිභොගය නිසා අගය අඩුවූ බැවිනි. එබැවින් එහි සොරකම් කළ භික්ෂුවට පරිජී ඇවැත් ආරොපනය නො කළයුතු. මෙසේ මේ කරුණු පස අදින්නාදාන පරිජී ඇවැත් හි විමසා බලා ඇවැත් නැගිය යුතුය. "එවං ඉමානි තුලද්ධිසා පඤ්ච ඨානානි ඔරෙය්‍යත්ථං විවකඛණෙ ආපත්තිං වා අනාපත්තිං වා ගරුකං වා ලහුකං වා ආපත්තිං යථා ඨානෙ ඨපෙය්‍යාති" සං: පෘ: 219[29]-220[29]-222[12] පී: ටී: 44 –ංදෙස (නා)= සොරකම් කළ දෙශය. සං: පා: 220[32] (අවහාර කාල බලනු)

අවඞ්ඝ (නා) [සං. අපාඞ්ඝ]= නෙත් කෙළවර. නෙත් කෙළවර විසිතුරු සටහන් කිරීම. "න භික්ඛවෙ භික්ඛුනියා අවඞ්ඝං කාතබ්බං" චූ: පා: B 450[3] සං: පා: 953[8] චූ: පා: 410[17] පී: ටී: 2959

අවච (නා)= කුඩා. පහත්. "චීවර ඩොවන රජ නාදීනි ඛණ්ඩකපරියාපන්නානි ච අඟසීසාල වත්තාදීනී ආභිසමාචාරිකානි අවචානි (කම්මා නි) නාම" සං: පා: 74[17]

අවචනීය (නා) (න + √වච + නීය)= නො කිය යුතු. අවවාද නො කටයුත්තා "ආයසමා ඡන්නො භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනියං අකාසි"

අවණණ (නා) (න + වණණ)= ගැහීව. නින්දව. අපකීර්තිය. නොගුණ. දුටඨුල්ල වාචා සඞ්ඝාදි සෙස ශික්ෂාපදයෙහි අවණණ නම්: "අනි මිත්තාසි, නිම්මිත්තමත්තාසි" යනාදීන් දෙමඟ උදෙසා බණන ප්‍රතොදෙපම ගහීසි" සං: පා 672[12]-741[39] කං: ටී: පි: 2635 **-හාරිකා** (නා)= නොගුණ ගෙණ යෑම. තැනින් තැන නුගුණ කියා ඇවිදිමින් පස සෙවීම. වි: ම: සං: 791[1] (නිපෙසිකතා බලනු)

අවඤ්ඤු (නා)= අවසතුක, හෙතුරහිත. වසතුවක් නැති. ආපත්ති සාධක කරුණක් නොවූ. නිරර්ථක. වි: ටී: ටී: 235[1]

අවඤ්ඤනීය කම්ම (නා)= එකම් කර්මය. නොහමුවෙහි කටයුතු කර්ම අටෙන් එකක්. උත්තරු විවරණාදි අප්‍රසාද කර හෙතුන් නිසා එබඳු දේ කරන භික්ෂූන මාගම් සඟුන් විසින් නොවැඳිය යුතුය. "අඤ්ඤියො සො භික්ඛවෙ භික්ඛූණී සඞ්ඝෙන කාතබ්බො"යි මෙසේ අනුදත් කර්මය. "පඤ්චහුපාලි අඞ්ගෙහි සම න්නාගතස්ස භික්ඛුනො භික්ඛුණී සඞ්ඝෙනෙව කම්මං කාතබ්බං. අවඤ්ඤියො සො භික්ඛවෙ භික්ඛු භික්ඛුණී සඞ්ඝෙන" යනු පරිවාරපාළි බැවින් කරුණු පසකින් යුත් භික්ෂුවට භික්ෂු ණීන් විසින්ම මේ අවඤ්ඤනීය කර්මය කළ යුතු ය. එනම්; 1 විවරිතා කාසං භික්ඛුණීනං

දසෙසති 2 උත්තරිං දසෙසති 3 අභිඤ්ඤාතං දසෙසති 4 උභො අංසකූටෙ දසසති 5 ඔහාසනී ගිහී සවපයොජෙති යන කරුණු පසයි. යම්කිසි භික්ෂුවක් භික්ෂුණීන්ට 1 සිය සිරුර විවෘතකර පෙන්වා ද, 2 දෙ කලව නහා පෙන්වා ද, 3 අභිඤ්ඤාතය පෙන්වා ද, 4 දෙවුර පෙන්වා ද, 5 අසද්ධම්ම පිණිස කථාකරයි ද පුරුෂයන් අසද්ධම්ම පිණිස භික්ෂුණීන් සමග යොදවා ද යන මේ කරුණු පස යි. මේ කම්ම කරනු පිණිස මාගම් සතුන් මෙහෙණ අසපුවෙහි රැස්විය යුතුය. එහිදී එක් ව්‍යක්ත මෙහෙණක් "අය්‍යෙ අසුකො නාම අය්‍යා භික්ඛුණීනං අපසාදිකං දසෙසති. එතස්ස අය්‍යස්ස අවන්දිය කරණං රුච්චතීති භික්ඛුණී සඞ්ඝං පුච්ඡාමි දුතියම්පි-පෙ-තතියම්පි භික්ඛුණී සඞ්ඝං පුච්ඡාමි"යි මෙසේ තුන්වරක් අස්වා අපලොකන කම්මයෙන් **අවන්දිය කම්ම** කළ යුතුය. එවක් පටන් ඒ භික්ෂුව භික්ෂුණීන් විසින් නොවැන්ද යුතුය. පසුකලෙක නිරොතප්ති පිණිටා සංවර වූයේ නම් ඒ භික්ෂුව විසින් භික්ෂුණීන් සමා කරවිය යුතුය ඒ පිණිස මෙහෙණ අසපුවට නොගොස් විහාරයෙහි සඞ්ඝයා වෙත හෝ ගණ-පුද්ගලයන් වෙත හෝ පැමිණ "අහං භන්තෙ පටිසඞ්ඛා ආයතිං සංවරෙ තිට්ඨාමි. න පුන අපසාදිකං දසෙසසාමි භික්ඛුණී සඞ්ඝො මඤ්ඤං බ්‍රහතු"යි සමා කරවිය යුතුය. ඒ සඞ්ඝයා හෝ ගණයා හෝ එක භික්ෂුව හෝ එම මහණහු සමග මෙහෙණවරට ගොස් "අහං භික්ඛු පටිසඞ්ඛා ආයතිං සංවරෙ සිතො. ඉමිනා අවචයං දෙසෙත්වා භික්ඛුණී සඞ්ඝො ඛමාපිතො. භික්ඛුණී සඞ්ඝො ඉමං පඤ්හං කරොතු"යි ඒ බව දන්වා භික්ෂුව වැඳිය යුත්තෙක් කටයුතුය. පසුව මෙහෙණවරට රැස්වූ භික්ෂුණී සඞ්ඝයාට මෙය භික්ෂුණීන්ගෙ විසින් නෙවරක් අස්වා අපලොකන කම්මයෙන්ම ඒ භික්ෂුව වැඳිය යුත්තෙක් කටයුතුය. භික්ෂුණී සඞ්ඝයා විසින් අප්‍රසාදකාරක භික්ෂුව නොහමුවෙහි කරන බැවින් මෙය අසම්මුඛා කරණීය නම් වේ.—"ඔසාරණාදි නාමාන්තරයකට නො ගොස් අපලොකන නාමවෙයෙන්ම සිටි හෙයින්ම මෙතෙම කම්ම ලක්ඛණ නම් වෙයි"—ඉදඤ්හි කම්මලක්ඛණං නාම භික්ඛුණී සඞ්ඝ මූලකං පඤ්ඤත්තං" – ස: පා: 952[14]-1040[21]-1046[36]-1047[27] ක: වි: 134[7] ක: වි: පි: 104[87] චූ: පා: 405[23] පරි: පා: 258[12] චූ: පා: B. 434[7] ඒ: වි: 2998 (අසම්මුඛා කම්ම බලන්න)

අවන්දිය (නා) (න + වන්දිය) (√වන්ද + ණිච-ඉය) [සං. වන්ද්‍ය > පා: වන්දිය]= නො වැඳිය යුතු. එබඳු භික්ෂුව. අවන්දනීය කම්ම කළ භික්ෂුව භික්ෂුණීන් විසින් නො වැන්ද යුතුය. "අවන්දියො සො භික්ඛවෙ භික්ඛු භික්ඛුණී සඞ්ඝෙන කාතබ්බො" චූ: පා: 405[10] චූ: පා: B. 434[7] (අවන්දනීය කම්ම බලන්න) **-පුග්ගල 1** (නා)= නො වැන්ද යුතු පුද්ගලයෝ. **"දස ඉමෙ භික්ඛවෙ අවන්දියා"**යි චුල්ලවග්ග පාළි සෙනාසනක්ඛන්ධකයෙහි උපසපන් භික්ෂූන් විසින් නො වැන්ද යුතු පුද්ගලයෝ දසදෙනෙක් දක්වන ලදහ. එනම්; 1 පසුව උපසපන් වූවහු 2 අනුපසපන්හු 3 නානා සංවාසක අධර්මවාදී වැඩිමහල්ලහු 4 මාගම්හු 5 පණ්ඩකහු 6 පිරිවෙස් පුරන්නහු 7 මූලාය පටිකස්සනයට සුදුස්සහු 8 මානතට සුදුස්සහු 9 මානත හැසිරෙන්නහු 10 අබ්භාන කම්මයට සුදුස්සහු යන මේ දසදෙනායි. චූ: පා: 281[10] සා: පා: 914[18]-1033[14] පරි: පා: 191[10] **-පුග්ගල 2** (නා)= නො වැන්ද යුතු පුද්ගලයෝ. පරිවාර පාළි උපාලි පඤ්චකයෙහි පඤ්චකයෙක්හිදී නො වැන්ද යුතු පුද්ගලයෝ පස්විසිදෙනෙක් දක්වන ලදහ. එහි 'දස ඉමෙ භික්ඛවෙ අවන්දියා" යනුවෙන් චුල්ලවග්ග පාළි සෙනාසනක්ඛන්ධකයෙහි දැක්වූ දශදෙනා ද ඇතුළත්වෙති. ඒ නො වැන්ද යුතු **පස්විසි** පුද්ගලයෝ මෙවුහු වෙත්. 1 ඇතුළුගම පිවිසියහු (ගමනක් යන භික්ෂුව) 2 විපියවෑපිවිසියහු 3 අඳුරෙහි සිටියහු **4** යම්කිසි කටයුත්තක යෙදී සිටියහු **5** නිදන්නහු **6** කෑදූ බොන්නහු **7** වළඳන්නහු 8 යම්කිසි කරුණක් සිතමින් හුන්නහු 9 සතුරු පක්ෂයෙහි සිටි විසභාග පුද්ගලයන්හු 10 නිවිසහු වූවහු 11 කැවිලි කන්නහු 12 අනුභව කරන්නහු 13 මළ පහකරන්නහු 14 මූත්‍ර කරන්නහු 15 උත්ක්ෂෙපනීය කම්ම කළහු 16 පසුව උපසපන් වූවහු 17 අනුපසපන්හු 18 නානා සංවාසක අධර්මවාදී වැඩියන්හු 19 මාගමන්හු 20 පණ්ඩකහු 21 පාරිවාසිකහු 22 මූලාය පටිකස්සනයට සුදුස්සහු 23 මානතට සුදුස්සහු 24 මානත හැසිරෙන්නහු 25 අබ්භානයට සුදුස්සහු යන මේ පස්විසි දෙනා නො වැන්ද යුත්තෝය. මෙහි 15 උත්ක්ෂෙපනීය කම්ම කළහු (අ) ඇවැත පෙන්වා දෙනවිට එය නො දැකීම්

(ආ) ඇවැතට පිළියම් නොකිරීම (ඉ) ලාමක දෘෂ්ටිය නොහැරීම යන ත්‍රිවිධ කරුණෙන් උත්සෙපනීය කර්ම කළහුයි. 18 නානා සංවාසකා නම් ලබ්ධි නානාසංවාසකයා සහ කර්ම නානාසංවාසකයායි. "නානාසංවාසකො නාම ලද්ධි නානාසංවාසකොපි කම්ම නානාසංවාසකොපි" යනු කුද්දසික ටීකායි. කුද්දසික නම් ග්‍රන්ථයෙහි නොවැදිය යුතු පුදගලයන් අතර **හරුකටඨ** නමින් දක්වන ලද්දේ මෙහි දැක්වූ 21 පරිවාසික 22 මූලාය පටිකස්සනාරහ 23 මානත්තාරහ 24 මානත්තචාරී 25 අබ්භානාරහ යන මේ පුදගලයෝයි. මේ පස්විසි දෙනා තෙන් 10 නිවිසතු වූවහු සහ 15 උත්සෙපනීය කර්ම කළහු නොවැන්ද යුතුයයි පණවා වදුළ බැවින් ඒ දෙදෙනා වඳිනහුට දුකුළා ඇවැත් වේ. ඉතිරි තෙවිසි දෙනාගෙන් මූල පටන් තුදුස්වැනියහු (1—14) ඇතුළු තෙළෙස් දෙනා නුසුදුසු ස්ථානයෙහි සිටිනවුන් බැවින් නො වැන්ද යුතුය. වැදීමෙන් ඇවැත් නොවේ. ඉතිරි දසදෙනා ආපත්ති විසතුක බැවින්ම නොවැඳිය යුත්තෝ වෙත්. ඔවුන් වඳින භික්ෂූන්හට නියමයෙන්ම ඇවැත් වේ. "ඉති ඉමෙසු පඤ්චකෙසු තෙරසජනෙ වන්දනාසස අනාපත්ති. ඛාදසන්නං වන්දනාය ආපත්ති" යනු සමන්ත පාසාදිකා විනය අටුවායි. ස: පා: 1025[10] පරි: පා: 19[21-27][29] කු: සි: ස: 60[12] බු: සි: ටී: 86[86] චු: පා: 281[10] ත්‍රි: ටී: 661 (උ: ටී:) චු: පා: B. 62[5].

අවසෙසික සඞ්ඛත (නා)= වැඩි ලකුණු නැති. එබඳු කාලය. "වහරමසැයි සමමත නොලද" ප්‍රථම ශාසනාසන ශික්ෂාපද නිර්දේශයෙහි සඳහන් '**අවසෙසික සඞ්ඛත**" යනුයෙන් වැඩි ලකුණු නැති හෙමන්ත—ගිම්හාන සෘතු දෙක්හි අට මස ගතයුතු වුවද, හෙමන්ත සෘතු වෙහින් වැස්ස පවත්නා හෙයින් එය හැර මෙයින් ග්‍රීෂ්මර්තුවේ සිව් මස ම ගතයුතුය. එබැවින් වස්සාන කාලයෙහි සහ හෙමන්ත කාලයේ අභ්‍යවකාශයෙහි අසුන් පණවා නොතැබිය යුතුයි. කවුඩන් හෝ පක්ෂීන් නිති වසන රුක්මුල්වල ද අසුන් පණවා තබන්නට නුසුදුසුය. අලෙහාකාසික ඛුතඛ්ඛය දරන්නහු විසින් සඞ්ඝික හැදපුටු ආදිය හැර පෞද්ගලික සෙනසුන්ම පණවාගත යුතුයි. සඞ්ඝික සෙනසුන් ගතයුතු නම් වැව්වැලින් හෝ නියඳින්ම විය යුතු සෙනසුන් ගත යුතුයි. අරණ්‍යෙහි වැසි භික්ෂූන් කෙරෙහි පැහැදුණු සිතැත්තෝ සඞ්ඝික පරිභොගයෙන් පරිභොගය පිණිස ඇඳපටු ආදිය පිරිණැමූහ. අරණ්‍යවාසය හැර යන භික්ෂූනු සෙනසුන් සාමන්ත විහාරවාසී භික්ෂූන්ට පවරා යායුතුයි. සහාය භික්ෂූන් නොලබත් නම් තෙමෙනසේ සැඟපත්තෙකුට යා යුතුයි. සැලිදුල් බොජුන් හල් ආදිය පිණිස මුසුන් ගතහොත් අවසන්හි එය මුසුන් හල් හිමි තැබිය යුතුයි පා: වි: ඛා: 4[1][32] සාර: දී: 806[13] ස: පා: 564[18] කං: වී: ටී: 68[14] වි: වි: 1052 කං: වි: 91[16]

අවාකපාන (නා) (න + වාතපාන)= බා කවුළු නැති. "තෙන බො පන සමයෙන විහාරා අවාතපානිකා හොන්ති" වු: පා: 26[4][33]

අවාපුර (ක්‍රි) [සං අපාවෘත] විවෘත කළ මැනැවි. "අවාපුරෙතං අමතස්ස ද්වාරං" ඛු: පා: ස: 21[20] මහා: පා: 2[18] ("අවාපුරෙතං අමතස්ස දවාරං"—"අපාවෘතා තෙසං අමතස්ස ද්වාරා" යනුවෙන් මහාවගග පාළි මහාඛන්ධකයෙහි දක්නා මේ "අවාපුර"—"අපාවෘත ශබ්දයෝ සංස්කෘත "අපාවෘත" ශබ්දයාගේ ප්‍රභව රූප යෝ වෙත්) (අපාරුත බලනු)

අවාපුරණ (නා) [සං. අපාවරණ]= යතුර. කෙස්ස. "ගවක්ඛානඤ අවාපුරණං ආදාය" අ: ප: ස: 3[136] මහා: පා: 885

අවායාපිත (නා) (න + වායාපිත)= නොවියවන ලද. "අවායාපිතෙ වෙමතිකෙන" පාරා: පා: 285[24]

අවාස (නා) (න + වාස) (√වස + ණ)=නොවිසීම. වාසය නොකිරීම. "අවාසය පටිසඤ්ඤුති" මහා: පා:128[12] සා: පා: 756[20]-1022[12]

අවිකප්පන (නා) (න+විකප්පන) (වි + √කප්ප + යු=අන)= විකල්පනය නොකිරීම. අසිතිය නොමුදලීම. කං: වි: 12[5][34] (විකප්පන බලනු)

අවිජ්ජා (නා) [සං. අවිද්‍යා > පා: අවිජ්ජා]= අවිද්‍යාව, නොදැනීම. 1 බුඛ 2 ධම්ම 3 සඞ්ඝ 4 සික්ඛා 5 පුබ්බන්ත 6 අපරන්ත 7 පුබ්බන්තාපරන්ත 8 ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නධම්ම යන අට තන්හි නොදැනීම. චතුරාර්‍ය සත්‍යය නොදැනීම. පාරා: පා: 5[15] ස: පා 106[5]-110[24] 112[1]-714[34] —**ඉණඩාසඛාස** (නා)= අවිද්‍යා නමැති අණ්ඩකොෂය, බිත්තු කටුව. පාරා: පා:

4^{1} සං: පා: 112^{4} -ආසව (නා)= අවිද්‍යා ශ්‍රවය. සතර ආශ්‍රවයන්ගෙන් එකක්. (ආසව බලන්න)

අවිඤ්ඤත්ති (නා) (ව් + √ඤ්ඤ + ති) [සං. විඥප්ති] =නොදැන්වීම.

අවිඤ්ඤත්ත (නා) (න + විඤ්ඤත්ත) (ව් + √ඤ්ඤ + ත) [සං. විඥත්ත]= නොදත්. පඤ්චේන්ද්‍රියයන් හැර පිරිසුදුවූ විඤ්ඤාණයෙන් නොගත් අරමුණ. "අඤ්ඤත්‍ර පඤ්චහි ඉන්ද්‍රියෙහි සුද්ධෙන විඤ්ඤාණෙනෙව අගහිතං අවිඤ්ඤත්තන්ති වෙදිතබ්බං" අවිඥත්ත වූවක් විඥානය කියා හෝ විඥත්ත වූවක් අවිඥප්තිය කියා හෝ වාග් විඥප්තියෙන් දැන්වීම යනුවෙන් අනාසී ව්‍යවහාර දෙකකි. සං: පා: 536^{15} පාචි: පා: 2^{28} (අට්ඨ අනරිය වොහාර බලන්න)

අවිඤ්ඤු (නා) (න + විඤ්ඤු) (ව් + √ඤ්ඤ + රු)= නුවණ නැති. මෝඩයා. ඉඳුරන් වසන නැති මිනිල්ලා. අදක්ෂයා, පෙතැලි රුවක් වැනි කිසිවක් නොවැටහෙන්නා. "අවිඤ්ඤුස්ස සාවෙති මිගලුලකස්ස වා පොසකරූප සදිසස්ස වා ගරු මෙධස්ස වා සමයෙ අකොවිදස්ස ගාමදාරකාණං අවිඤ්ඤුකං පත්තානං සාවෙති" "ගරු මෙධස්සානි ආරම්මණෙසු ළහු පවත්තිතාය අභාවතො දක්ඛිනතිකතාය ගරු පඤ්ඤස්ස. මන්දපඤ්ඤස්සාති වුත්තං හොති" සං: පා: 183^{1} පාරා: පා: 27^{12} වි: වි: ටී: 115^{28} සාර: දී: 459^{9}

අවිතක්ක (නා) (න + විතක්ක) (ව් + √තක්ක + අ) [සං. විතර්කී]= විතර්කී රහිතවූ. ප්‍රථම ධ්‍යානයෙහි පැවැති විතර්කී—විචාර දෙක භාවනාවෙන් ප්‍රහීණ කළ බැවින් ද්විතීය ධ්‍යානයෙහි නැත. "භාවනාය පහීණත්තා එතසම්ං එතස්ස වා විතක්කෙකා නත්ථීති අවිතක්කං" සං: පා: 95^{5} පාරා: පා: 4^{9}

අවිදිත (නා) (න + විදිත) (ව් + √විද + ඉ + ත)= නොදත්. ඒ පිළිබඳ සිතක් නැති සං: පා: 986^{15}

අවිනය (නා)= විනය නොවූ. නිස්මිම්ක් නැති. සූත්‍රාගත පඨියෙන් හෝ විනය පඨියෙන් විනය නොවූ. සූත්‍රාගත පඨියෙන් රාගාදීන්ගේ අසංවරයද, විනය පඨියෙන් වත්ථු ඤත්ති-අනුසාවණ-සීමා-පරිස විපත්තීන්ද අවිනය නම් වේ. සං: පා: 943^{3} -වාදී (නා) (√වද + ණී)= අවිනය වාදියා. සංවර විනය ප්‍රතිසංයුක්ත කථා නැතියහු. "අවිනයවංදිති න සංවර විනය පටිසංයුත්තස්ස වත්තා" ප: පු: 276^{16}

අවිනයං අවිනයොති දීපෙති (ක්‍රි)= අවිනය අවිනයැයි ප්‍රකාශ කරත්ද; සඞ්ඝ සාමග්‍රියට ඉවහල් කරුණක්. චු: පා: 333^{31}

අවිනයං විනයොති දීපෙති (ක්‍රි)= අවිනය විනයැයි ප්‍රකාශ කරත්ද? අඡාදශ්‍ර හෙදකර වදාතුන්ගෙන් එකක්. සූත්‍රාගත පඨියෙන් සහ විනය පඨියෙන් අවිනය වූවක් විනය යි ප්‍රකාශ කිරීම චු: පා: 333^{18} සං: පා: 943^{3} (අවිනය බලන්න)

අවිනිවජ්ජිත (නා + විනිවජ්ජිත) (ව් + නි + √ජ්ද + ඉ + ත)= විනිශ්චය නොකළ. පරි: පා: 202^{17} සං: පා: 10^{31}

අවිනිපාත ධම්ම (නා)= අපායයෙහි නොවැටෙන සුභාව ඇති. සෝවාන් වූවහු. සෝවාන් වූයේ අපායයෙහි නුපදියි. අපායගමනීය ධර්මයන් ක්ෂය කළ බැවිනි. "ඉමෙසංහි සාරිපුත්ත පඤ්චන්නං භික්ඛුසතානං යො පච්ඡිමකො භික්ඛු සො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධි පරායණොති" පාරා: පා: 93^{4} සං: පා: 133^{27} (මෙහි සඳහන් **විනිපාත** ශබ්දයෙන් මෙන්ම "කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං **විනිපාතං** නිරයං උපපජ්ජිය්‍ය" යනුවෙන් දක්නා **විනිපාත** ශබ්දයෙන් කියවෙනුයේ අපායයෙහි උපදින්නවුන් **විනිපාත** වන බවයි හෙවත් විරුඹව වැටෙන බවයි. මේ විනිපාතය හෙවත් විරුඹව වැටීම නම් ගෙල පහළට දමා පය ඔසුකුරු කොට වැටීමයි අපායයෙහි උපදින්නෝ එසේ උපදිත්. සූත්‍ර නිපාතයෙහි සහ අභිධම්මකොශයෙහි.

"එතෙ පතන්ති නිරයෙ—
උද්ධපාදා අවංසිරා
ඉසීනං අනිවත්තාරෙ—
සංයතානං තපස්සිනං"
"විපසීසා මතිර්යාති—
ගතිදෙසං රිරංසයා
ගඤ්ඡත්‍යානාභිකාමොන්‍යඃ—
ඌර්ධපාදඃ සනූනාරකඃ

යනුවෙන් දක්නේ මේ විනිපාතනයයි) පාරා: පා: 93^{4} සං: පා: 133^{27} අභි: කොෂ: 266^{6}

අවිප්පටිසාර (නා) (න + විප්පටිසාර) (ව් + පටි + √සර + ණ)= විපිළිසර නොවූ. කනස්සල්ල

නොවූ. මව්සින් පව් කරනලදුයි ද, පින් නොකරන ලදුයි ද යනුවෙන් විපිළිසර (ඥානස්සල්ල) නොවූ. නො තැවෙන. "අවිප්පටිසාරොති කතාකතං නිස්සාය විප්පටිසාරා භාවො. සන්තාපාභාවොති." "අධම්මවුදිතකස්ස—පෙ—ධම්මවොදකස්ස උපාලි භික්ඛුනො පඤ්ඩහා කාරෙති අවිප්පටිසාරෙ උපදහා තබෙඩා" ඒ: ඒ: ටී: 33[18] චූ: පා: B: 400[1-15] සී: පා: 101[316] චූ: පා: 394[14]

අවිප්පවාස (නා) (න+විප්පවාස) (වි+ප+√වස+ණ) [සං. විප්‍රවාස]= වෙන්ව විසීම තුන් සිවුරෙන් එක් සිවුරකින් හෝ වෙන්ව අරුණ නැඟීම. සී: පා: 4693[0]-7841[4] පා: මූ: වි: I71[22] —**කම්මවාචා** (නා) (√වච+ණ+ආ)= අවිප්පවාස සීමා සම්මත කරන කම්වාක්‍යය. සමාන සංවාසක සීමාව සම්මතකොට ඒ සීමාවගේ මැදලනීකර්මය පිණිස අවිප්‍රවාස කර්මවාක්‍යය ද දෙශනා කළයුතුය. "හපපපාසං අවිජහන්තෙන හි කම්මවාචාය භමානසංවාසක සීමං සම්මන්නිත්වා තස්සා දළනී කම්මත්තං **අවිප්පවාස කම්මවාචාපි කත්තබබා**" ඒ අවිප්පවාස කර්මවාක්‍යය මෙසේය. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝා! යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමානසංවාසා එකූපොසථා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝෙන තං සීමං නිච්චරෙන අවිප්පවාසං සම්මන්නෙය්‍ය ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. එසා ඤත්ති. සුණාතු-පෙ-සඞ්ඝෝ යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමානසංවාසා එකූපොසථා සඞ්ඝෝ තං සීමං නිච්චරෙන අවිප්පවාසං සම්මන්නති ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච, යස්සායස්මතො ඛමති එතිස්සා සීමාය නිච්චරෙන **අවිප්පවාසාය** සම්මුති ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. සම්මතා සා සීමා සඞ්ඝෙන නිච්චරෙන අවිප්පවාසා. ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච ඛමති සඞ්ඝස්ස තස්මා "තුණ්හී එවමෙතං ධාරයාමි" යනුයි. පා: මූ: වි: වි: 171[19]-178[11] චි: ලං: 208[3] -**සම්මුති** 1 (නා = එනම් **සම්මුතිය**. "අවිප්පවාසා සම්මුති=අවිප්පවාසාය වා සම්මුති" යනු විනයාලංකාර පාඨ බැවින් සඞ්ඝයා විසින් ගිලන් භික්ෂුවට තුන් සිවුරෙන් වෙන්ව අරුණු නැඟීමෙන් නිසඟි පවිති නොවනු පිණිස දෙන අවිප්පවාස සම්මුතිය. නිච්චර නාම යෙන් ඉවු තුන්සිවුරෙන් වෙන්ව **එක්** අරුණු කුදු ගත කළහොත් නිසඟි පවිති වේ **සඞ්ඝයා** විසින් ඤපති විතීය කම්වාක්‍යයෙන් ගිලන් භික්ෂුහට "**අවිප්පවාස සම්මුතිය**" දෙනු ලැබේ. එබඳු සම්මුතියක් ලද භික්ෂුව අධිෂ්ඨාන කළ තුන් සිවුරෙන් එකකින් වෙන්ව අරුණු නැඟීමෙන් නිසඟි පවිති ඇවැත් නොවේ. මේ සම්මුතියෙන් ලැබෙන අනුසස් නම් තමන් වෙන්ව විසූ සිවුර නිසඟි නොවීම හා පවිති ඇවැත් නොවීමය. "කොපනෙසං ආනිසංසො? යෙන චීවරෙන විප්පවසති තං නිස්සඟ්ගියං න හොති. ආපත්තිඤ්ච න ආපජ්ජති" යනු විනය අටුවායි. අවිප්පවාස සම්මුති යාචනයද, එම සම්මුතිය දෙන කර්මවාක්‍යයද පාරාජික පාළි චීවර වග්ගයෙහි උදෙසූ සික්ඛාපදය හෝ මහාවග්ග පාළි උපොසථක්ඛන්ධකය හෝ බලා දන්නේය. පාරා: පා: 2[138] සී: පා: 4693[0] කං: වි: 57[55] ප්‍රා: ව: 131[18] චි: වි: 603 චි: ම: 117[84] චි: ලං: 253[8] මහා: පා: 118[17] —**සම්මුති** 2 (නා)= බද්ධ සීමාවෙහි තිච්චර විප්පවාස සුවය පිණිසද, දළනි කර්මය පිණිසද, කර්මවාක්‍යයෙන් කරන එනම් සම්මුතිය. **"එවං බද්ධාය ච සීමාය තිච්චරෙන විප්පවාස සුඛත්ථං දළහී කම්මත්ථඤ්ච අවිප්පවාස සම්මුති කාතබබා"** යනු පාළිමුත්තක විනය විනිශ්චය භාථයි. මහ සීමාවෙහි තෙවීවරික භික්ෂූන් කැමැති නැනක සිවුරු තබා අරුණු නැඟීමෙන් එම සිවුරු නිසඟි නොවනු පිණිස කරන සම්මුතිය. ඤත්ති දුතිය කර්මවාක්‍යයෙන් සීමාව සම්මතකොට එසේ සම්මත කළ සීමාවෙහි කර්මවාක්‍යයෙන්ම **අවිප්පවාස සම්මුතිය** කටයුත්තිය. සීමා සම්මතයෙහිදී පළමුව බද්ධසීමාව සම්මතකොට පසුව අවිප්පවාස සම්මුතිය ද, සීමාසම්භනයෙහිදී පළමුව අවිප්පවාස සම්භනයකොට සුව බද්ධසීමා සම්භනයද කටයුතුය. "සීමං හික්ඛවෙ සම්මන්නන්තෙන පඨමං සීමා සම්මන්නිතබබා. පච්ඡා තිච්චරෙන අවිප්පවාසො සම්මන්නිතබබා"-"සීමං භික්ඛවෙ සම්භනන්තෙන පඨමං තිච්චරෙන අවිප්පවාසො සම්භනිතබබා, පච්ඡා සීමා සම්භනිතබබා" යනු පාළියි පා: මූ: වි: වි: 171[19]-178[11] ම: පා: ස: 504[79] චි: ලං: 208[8] චි: පි: 256[8] (අවිප්පවාස කම්මවාචා බලනු) —**සීමා** (නා) (√සි+මා)= එනම් සීමාව. පසළොස් සීමාවන්ගෙන් එකක් තෙවැදෑරුම් බද්ධ සීමාවන්ගෙන් හෝ එකක්. "අවිප්පවාස සීමා නම් තුන් සිවුරු ඔහුගෙන්

අධිෂ්ඨාන කළ සිවුරු නිසඟි නොවන සීමා වයි. ඒ වනාහි තෙවීවරික භික්ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස මහසීමාවෙහි හෝ බණ්ඩ සීමාවෙහි සම්මත කරනු ලැබේ "—එහිම අවිප්පවාස සීමාව, සම්මත කළ තුන්යොදුන් මහා සීමාවෙහි හෝ බණ්ඩ සීමාවෙහි කැමැති තැනක සිවුරු තබා ඒ ඒ සීමාවන්ට අයිති මායිම හෙවත් නිමිති ඇතුළත පහසු තැනක අරුණ. ඉක්මවීමෙන් තෙවීවරික භික්ෂූන්ගේ සිවුරු නිසඟි නොවේ. ඒ සීමාවන්ගේ උපචාර යෙහි අරුණ ඉක්මවීමෙන් නිසඟි වන්නේය. එනම් බණ්ඩ සීමාවේ නිමිත්ත හා එහි සිමන්ත රික නිමිත්තත් අතර අරුණ ඉක්මවීම නම් නිසඟි වේ. ඒ බිම් ගමට අයිතිවන බැවිනි. තවද මහ සීමාවෙහි සිවුරු තබා බණ්ඩ සීමාවෙහි හෝ බණ්ඩ සීමාවෙහි සිවුරු තබා මහා සීමාවෙහි හෝ විසිමෙන් ද සිවුරු නිසඟි වන්නේය. සීමා දෙකක් බැවිනි"—**"හත්ථපාසං අවිජහනෙනහි කම්මවාචාය සමානා සංවාසඤ්ච සීමං සම්මන්නිත්වා තස්සා දළහි කම්මත්ථං අවිප්පවාස කථවවාවාපි කතකම්මා. එවං හි සීමං සමූහනිස්සාමානි ආගතා සමූහණිතුං න සක්කිස්සන්ති"** පා: මු: වි: වි: 171[19] –173[25] ම: පා: ස: 499[20]A–504[19]A

අවිරුළුණි (නා) (න+විරුළුණි) (වි + √රුහ + ත; රුළහ + ණී) [සං. විරූඪ > පා: විරුළ්හ]= නොනැගෙන, වැඩීමක් නැති. හටගැන්මක් නැති. ස: පා: 999[31] පරි: පා: 200[3] **-ධම්මා** (නා)= නොවැඩෙන සුභාව ඇති. ප්‍රකෘතිශීලයෙන් නොවැඩෙන සුභාව ඇති. පාරාජික වූවෝ. පඬුවන් වූ කොළ නැවත නිල්වන් නොවන්නාක් මෙන් පරිජි අවන්නෝ නැවත එම උපසපන් ශීලයෙන් නොවැඩෙන්නෝය. "එවං පාරාජිකාපි පූන පකති සීලාභාවෙන අවිරුළුණි ධම්මා හොන්තීති අත්ථො" ස: පා: 99[22] පරි: පා: 200[3] මහා: පා: 97[3]

අවිලුත්ත (නා) (න + විලුත්ත) (වි + √ලුප + ත) [සං. විලුප්ත]= පැහැර නොගත්. විලෝපනය නොකළ. බලයෙන් උදුරා නොගත්. පාරා: පා: 230[20] ස: පා: 463[16] ක: වි: පි: 45[27]

අවිවදමාන (නා) (න+විවදමාන) (වි + √වද + මාන)= විවාද නොකරනු ලබන. ධර්මය නම් මේ ය. මේ ධර්මය නොවේයැ යනාදීන් විවාද නොකරන. "සම්මොසා හි සඞ්ඝා සම්මොදමානෝ අවිවදමානෝ එකුදෙසෝ ඵාසු විහරතීති" පාරා: පා: 209[19] ස: පා: 438[31] ක: වි: 451[7] (පුං: ලි:—**අවිවදමානෝ** සත්‍රී: ලි:—**මානා** නපුං: ලි:—**මානං**)

අවිසංවාදක (නා) (න + වි+සං + √වද + ණ්වු= අක)= බොරු නොකියන. ප: සු: 172[28] (විසංවාදක බලනු)

අවිසාරද (නා) (න + විසාරද)= බිය ඇති. බිය පත්ව. උ: අ: 290[39]

අවිසෘජිත (නා) (න+විසෘජිත) (වි + √සජ + ඉ + ත) [සං. විසෘජිත]= නොදුන්. කිසිවකුගෙට පරිත්‍යාග නොකළ. ක: වි: පි: 45[22] ක: වි: 571[4]

අවිහෙසා (නා) (න + විහෙසා) (වි + √හිංස + ණ + ආ) [සං. අවිහිංසා]= හිංසා නොකිරීම. කරුණාවගේ පූර්වභාගය. "අවිහෙසාති අවිහිංසනා. එතෙහි කරුණා පුබ්බභාගං දස්සෙති' "න හි නාම භික්ඛවෙ තස්ස මොඝපුරිසස්ස පාණෙසු අනුද්දයා අනුකම්පා අවිහෙසා භවිස්සතීති" ස: පා: 207[13] පාරා: පා: 426

අවීචි (නා) (න + වීචි)= එනම් නිරය. අටමහ නිරයෙන් එකක්. මෙහි **වීචි** නම් ගිනිදැල්ය. එයින් අතරක් නැති හෙයින් **අවීචි** යයි යෙති. අ: ප: ස: 89[10] **-නිරය** (නා)= ගිනිදැලින් අතරක් නැති නිරය. අටමහ නිරයෙන් එකක්. චූ: පා: 332[8] ස: පා: 941[14]

අවුත්ත (නා) (න + √වව+ත)= නොකියනලද. ස: පා: 101[16] (පුං: ලි: **අවුත්තා** සත්‍රී: ලි: **අවුත්තා** න: ලි: **අවුත්තං**)

අවුත්තා ඩොවති (ක්‍රි)= නොකියන ලද්දී සෝදයි. චීවර වර්ණයෙහි පුරාණ චීවර ශික්ෂාපදයෙහි එක් අනාපත්තිවාරයක්. නොනැ මෙහෙණක ලවා පුරාණ චීවරයක් සෝදවීම් ආදිය කරන භික්ෂුවට නිසඟි පවතී වේ. එහෙත් නොකියනලද මෙහෙණක් එසේ ධොවනාදිය කෙරේනම් නිසඟි පවතී සිදු නොවේ. මෙහි "නොකියන ලද" යනු අවවාද ලබනු පිණිස හෝ උදෙසනු පිණිස හෝ පැමිණිවිට කිලිටි සිවුර දැක තුබූ තැනින් ගෙන "දෙන්න සඞ්ඝමිනි සෝදන්නෙමියි' ගෙන්වා ධොවනාදිය කරන්නී නම් මැය "අවුත්තා ඩොවති' නමු. ස: පා: 477[27] පාරා: පා: 239[16]

අවූපසඤ්ඤා (නා) (න+වූපසඤ්ඤා) (වි + උප + √සම් + ත) [සං. ව්‍යුපශාන්තා]= විශෙෂයෙන් නො සන්සිඳුණු. ව්‍යුපසම්මනය නොවූ. දෙමළාස් උකෙසාටනයන්නෙන් එනක්. කිවවාඩිකරණයෙහි ලැබෙන කෙවැදෑරුම් උකෙසාටනයන්ගෙන් හෝ එනක්. උකෙසාටනය නම් උගුළුවීමයි. පරි: පා: 202[18] සා: පා: 1003[2]

අවෙක්ඛිතාචාර (නා) [සං. අපෙක්ෂිත > පා: අපෙකඛිත > අවෙකඛිත + ආචාර] සිහිනුවණින් යුත් ආචාර ඇති. "ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති" ආදීන් දක්නා උප පරීක්ෂිත ආචාරයෙන් යුක්තවූ මහා: පා: 415[19] සා: පා: 855[3]

අවෙච්චපසාද (නා) (අව + √ඉ + ත්‍යා=ච්ච) [සං. අවෙත්‍ය]= දැන පැහැදීම ගුණය අවබොධවීමෙන් පැහැදීම. "අවෙච්චපසාදෙනි ගුණෙ අවෙච්ච ඤාතත්‍තා උපපන්නෙ අවලුපසාදෙ" මෙනෝ: පූ: 435[1]

අවෙදි (ක්‍රි) (අ + √විද + ඊ)=දන්නේය. "යතො ඛයං පච්චයානං අවෙදි" මහා: පා: 2[14] සා: පා: 716[10]

අවෙහඩ්ඩිය (නා) (න + වෙහඩ්ඩිය) (වි + √හප් + ණ; විහඩ්ඩ + ණ්‍ය=ෂ්‍ය)- නො බෙදිය යුතු ගරු බඩු. සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයකු විසින් පෙරළීම් (මාරු කිරීම්) වශයෙන් නොව සතුකිරීම් වශයෙන් අනෙකකුට නොදිය යුතු නොබෙදිය යුතු ගරු බඩු. මේ වස්තු සියලු භික්ෂූන් විසින්ම සාධාරණ ලෙස පරිභොග කළ හැකි පරිදි ආරාමාදියෙහි තැන්පත් කොට තැබිය යුතුයි. අවෙහඩ්ඩිය වස්තූන්දූ බෙදන්නාට ථුල්ලච්චය ආපත්තිවේ. මේ ගරු බඩු රාශි වශයෙන් පසක් ද සරූපවශයෙන් පස්විස්සක් ද වේ. ඒ මෙසේයි.

(1 මල්වතු සඟපොල් (පලතුරු) වතු 2 ආරාම භූමි 3 ප්‍රාසාදදී සෙනසුන් 4 එකී සෙනසුන පිහිටි සථානය (වත්ත) 5 හැඳ දුටු 7 ගුදිරි 8 කොට්ට (කන්වයින්) 9 ලොහොසැලී 10 ලොහො

	1 වන රාසිය	2 වන රාසිය	3 වන රාසිය	4 වන රාසිය	5 වන රාසිය
අවිසෑ ජපිය අවෙහඩ්ඩිය ගරු භණ්ඩ	1 ආරාම 2 ආරාම වත්තු	3 විහාර 4 විහාර වත්තු	5 මඤ්ච 6 පීඨ 7 භිසි 8 බිම්බොහන	9 ලොහකුම්භි 10 ලොහ කටාහ 11 ලොහ භාණක 12 ලොහ වාරක 13 වාසි 14 ඵරසු 15 කුඨාරි 16 කුදාල 17 නිඛාදන	18 වලලි 19 වේළු 20 මුඤ්ජාතිණ 21 බබ්බජාතිණ 22 සතිණ 23 මත්තිකා 24 දාරුභණ්ඩ 25 මත්තිකාභණ්ඩ

කටාරම් 11 ලොහොසැල 12 ලොහොකල 13 වැ 14 පොරෝ 15 කෙවේරි 16 උදලු 17 හියන් 18 වේවැල් ඇ වැල් 19 හුණ 20 මුදු තණ 21 බබුස් තණ 22 ඉලුක් ඇ ගේ සොයන තණ 23 මැටි 24 ලී බඩු 25 මැටිමුවා බඩු. මෙහි විසතර ඒ ඒ තන්හි දක්නේය)

මෙහි වස්තු මූලවෙජ්ජය වශයෙන් අවිස්සජ්ජිත ද අවෙහඞ්ගිය ද වේ. පරිවර්තන (මාරු කිරීම්) වශයෙන් අනෙකකුට දෙන්නහුට ද අනාපත්තිය. "මූලවෙජ්ජවිස්සෙන අවිස්සජ්ජියං අවෙහඞ්ගිය්‍යඤ්ච. පරිවත්තනවසෙන පන විස්සජ්ජනත්තස්ස පරිභුඤ්ජනත්තස්ස ච අනාපත්ති" මේ ගරු භාණ්ඩ චීවර පිණ්ඩපාත හා බෙහෙත් පිණිස පවරා දෙන්නට නොවටනේය. සථාවර භාණ්ඩයක් සමග ද, ගරු භාණ්ඩයක් සමග ද පෙරළි (මාරු) කරන්නට වටී. සථාවර වස්තු අතර කෙත්, වතු විල්, ඇල ඝන මෙබඳු දෙය භික්ෂු සඞ්ඝයා විසින් සොයා බලනට පිළිගන්නට හෝ ඉවසන්නට හෝ නොවටනේය. කැපකරුවන් විසින්ම චාරිත දෙනින් පිළි යෙළවූ කැප බඩු වටී. ආරාමයක් සමග ආරාම ය, ආරාම වත්තය ඝන දෙක ද විහාරයක් සමග විහාරය, විහාර වත්තය ඝන දෙකදූයි මේ සතරම මාරු කරන්නට වටී (ගරු භණ්ඩ පරිවත්තන බලනු). ස: පා: 913[27] ග: හ: වි: 45[22] කු: සි: ස: 106[37] වී: ව: 2850 ක: වි: 137[36] ක: වි: පි: 106[14] චු: පා: 289[30] චු: පා: B. vii.

අවෙහාසකුටි (නා) (න + වෙහාස + කුටි)= මෙහි "අවෙහාස" නම් බිමයි. එබැවින් අවෙහාස කුටි නම් බිම කරණලද කුටියයි. වෙහාස කුටි නම් මධ්‍යම පුරුෂයකුගේ හිස මතු තලාදසේ යට නොගැටෙන සේ මත්තෙහි හුසුන් තල ඇති මහල් සහිත කිළියයි. 'අවෙහාස කුටියා නි භූමිසං කතපණ්ණ සාලාදිසු අනාපත්ති" ක: වි: පි: 71[21] ස: පා: 572[35] පාචි: පා: 517 (වෙහාසකුටි සික්ඛාපද බලනු)

අවෙච (ක්‍රි) (අ + √වච + ඊ; අ=ඕ)= කීවේය. "අවෙචානි අහාසි" ස: පා: 80[20] පාරා: පා: 5[16]

අව්‍යාකත (නා) (න + ව්‍යාකත) [සං. ව්‍යාකෘත > පා: වි. කත > ව්‍යාකත]= අව්‍යාකෘතවූ. ප්‍රඥා ව්‍යාකෘත භාවය නැති. 1 පාදෙහිත් උදෙසීමෙහිදී නම් ප්‍රාතිමොක්ෂය ප්‍රගුණ නැති 2. කම්වාක්‍යය ඇස්වීමෙහිදී නම් කම්වාක්‍යය පිළිබඳ ප්‍රගුණ භාවයක් හෝ අර්ථාවබෝධයක් නැති. "ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඤ්ඤා ඤාපෙතබ්බා"යි ඥප්ති චතුර්ථ කම්වාක්‍යය මහ සඟනහට ඇස්වීමෙහි නිර්දිෂ්ට ව්‍යකත භික්ෂුව; උතුකාෂ්ටය මධ්‍යමය හිනයයි තුන් ප්‍රකාර වේ. ඉන් අර්ථකථා සහිත විනය පිටකය කටපාඩම් ඇති මනාසේ විනිශ්චය දත් මහණ උතුකාෂ්ට ව්‍යකතයා වේ. ඥප්ති චතුර්ථ කම්වාක්‍යය පමණක් කටපාඩම් ඇති එහි අර්ථ මනාසේ දත් මහණ පශ්චිම ව්‍යකතයා වේ. මේ දෙයාකාරයට මධ්‍යම ප්‍රමාණ වූ ප්‍රගුණත්වය හා අර්ථාවබෝධය දරන මහණ මධ්‍යම ව්‍යකතයා නමි. මෙසේ ප්‍රගුණත්වයක් හෝ අර්ථාවබෝධයක් නැත්තේ **අව්‍යකතයයි** දතයුතුයි"–"අව්‍යත්තා ති පඤ්ඤාවෙය්‍යත්තියෙන විරහිතා" ම: පා: ස: 1[04][13] ස: පා: 735[15]—977[26]

අව්‍යාකත චිත්ත (නා)= අව්‍යාකෘත චිත්තය. ක්‍රියා චිත්තය. රහතන් වහන්සේ ඇවැතට පැමිණෙන සිත. "අසඤ්චිච සහගාරසෙය්‍යාදිං අව්‍යාකත චිත්තෙන ආපජ්ජති යං අරහාව ආපජ්ජති සබ්බං අව්‍යාකත චිත්තෙනාව ආපජ්ජති" ස: පා: 977[33] වි: ම: 62[13] සාර: දී: 472[31]

අව්‍යාපජ්ඣ (නා)= ව්‍යාපාද රහිත. ක්‍රොධ නැති. තරහ නැති. දුක් නැති. වි: මා: ස: 94[9]

අව්‍යාපාද චිත්තකම්ම (නා)= අව්‍යාපාද චිත්තක්‍රිය. අවෛර චිත්තය.

අසංකිලිට්ඨ (නා) (න + සංකිලිට්ඨ) [සං.සංක්ලිෂ්ට]= නො කිලිටි. කිලිටි නොවූ. "පරිසුඛං මෙ සීලං පරියොදාතං අසංකිලිට්ඨන්ති" චු: පා: 311[4]

අසංඛත (නා) (න + සංඛත) (සං + √කර+ත)= නිර්මාණය. හේතුමූලක ධර්ම ප්‍රත්‍යයන් විසින් සංස්කරණයකළ නොකළ. අ: ප: ස: 1[35] මනෝ: පූ: 388[1] **-ධාතු** (නා)= නිර්මාණය. අ: ප: ස: 5[31]

අසංඛ්‍යෙය්‍ය (නා)= එනම් සඞ්ඛ්‍යාව, ගණන. සඞ්ඛ්‍යාවක් කරන්නට නො හැකි. අ: ප: ස: 65[12]

අසංසට්ඨ (නා) (න + සංසට්ඨ) (√සට්ඨ + සූ= අන)= නොගැටීම. සටහනය නොකිරීම. මහා: පා: 44[20]

අසංවර (නා)= සංවර නොවීම. හීන, කඝ, වචන යන. ඳ්වාරත්‍රය හික්මවා නොගැණීම. ශික්ෂා පද ව්‍යතික්‍රමණය. පරි: පා: 215 සා: පා: 96011 —**චාර** (නා)= **සංවර කිරීම** දුෂ්කරවූ දෙරටුව. චක්ෂුරාදි පඤ්චේන්ද්‍රිය සහ හීන කඝ වචන යන තුන් දෙර. ධ: අ: ඤ: 27110

අසංවාස 1 (නා) (න + සංවාස) (සං + √වස + ණ)= 1 එක්ව නොවිසීම. 2 ලජ්ජී පුද්ගලයන් සමඟ එක්ව විසීමක් නැති. කර්ම සංවාස, උද්දෙස සංවාස, ශික්ෂා සංවාස යන මෙහි ලජ්ජී භික්ෂූන් සමඟ එක්වීමක් නැඩි පරිදි අවත් පුඟුලා. මෙහි **සංවාස** නම් **"එකං කම්මං එකුද්දෙසෝ සමසික්ඛතා"** යනු බැවින් 1 අපලොකන කර්ම 2 ඤත්තික කර්ම 3 ඤත්ති දුතියකර්ම 4 ඤත්ති චතුත්ථකර්ම යන මේ චතුර්විධ විනය කර්ම සීමාභ්‍යන්තරයෙහි වූ පකතත්ත (පාරාජික නොවූ) භික්ෂූන් එක්ව සමගිව කළ යුතු බැවින් **එක කම්ම නම්** වේ 1 නිදානුද්දෙස 2 පාරාජිකුද්දෙස 3 සඞ්ඝාදි සෙසුද්දෙස 4 අනියතුද්දෙස 5 විත්ථාරුද්දෙස යන පස්වැදෑරුම් පාමොක් උද්දෙසීම් එක්ව උද්දෙසිය යුතු බැවින් **එකුද්දෙස** නම් වේ. කර නැවැම් කුලයෙන් පැවිදිවූවන් උද්දෙසා පැණ වූ ශික්ෂාපද හැර එක්ව වැඳීම්, වැළඳීම්, ගම් පිවිසීම්, වත්පිළිවෙන් කිරීම්, උගෙණීම්, විවාරීම්, හැදෑරීම් ආදිය සමගිව කිරීම් වශයෙන් ලජ්ජී භික්ෂූන් විසින් හික්මිය යුතු බැවින් සෙසු සියලු ශික්ෂාපද **සමසික්ඛතා** නමු. මේ එක කර්මාදියෙහි එක්ව විසීම නම්වූ **සංවාසය** පරිජී අවත් පුඟුලා සමඟ නැත්තුයි මහතෙම **අසංවාස** නම් වේ. අසංවාස පුද්ගලතෙම සියලු සඞ්ඝ කර්මවලදී ගණපූරණය පවා නොලබන්නේය. "මෙහි අපලොකන කර්මාදි සතර **කර්මසංවාස** නම් වෙයි. පඤ්චවිධවූ උද්දෙසය **උද්දෙස සංවාස** නම් වෙයි. **ඕකඩ්ඩා සංවාස** නම් චාරිත්‍ර වාරිත්‍ර ශික්ෂා දෙකයි." කැ: වි: පි: 18333 වි: වි: ටී: 12011 වි: ම: 57124 කැ: වි: 20128 සාර: දී: 46339 සා: පා: 18644 පාරා: පා: 27128

අසංවාස 2 (නා)= එක කර්මාදිසංවාසයට නුසුදුසු. එබඳු පුද්ගලයන් කු: සි: ස: 72114 (අසංවාසික බලනු)

අසංවාසික (නා) (අසංවාස + ණික)= එක **කර්මාදි** සංවාසයට නුසුදුසු. එබඳු පුද්ගලයෝ. උත්ක්ෂේපනීය කර්මය කළහු, අනුපසපන්හු, මෙහෙණහු, පරිජී අවත්තහු, නානාසංවාසක යහු, සීමාවෙන් බැහැර සිටියහු, අහසෙහි සිටියහු ද යන මේ පුඟුලන් සහ එකොළාස් අභව්‍ය පුද්ගලයෝද, අසංවාසිකයෝ වෙත්. මෙහි උත්ක්ෂේපනීය කර්මය **කළහු** නම් කර්ම නානාසංවාස සංඛ්‍යාත තෙවැදෑරුම් **උත්ක්ෂේපනීය කර්මය** කළහුයි. **අනුපසපන්හු නම්** ශික්ෂමානා, ශ්‍රාමණේර, ශ්‍රාමණේරී, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කළහු යන මොවුහුයි. **නානා සංවාස** නම් 1 ලබඩි 2 කර්ම 3 සීමා යන තෙවැදෑරුම් නානා සංවාසකයෝයි. **කර්ම නානාසංවාසක** නම් උක්ඛිත්තකයෝයි. **2 ලබඩි නානාසංවාස** නම් "උක්ඛිත්තානු වත්තකො ලදඩි නානාසංවාසකො" යනු බැවින් **උත්ක්ෂේපනීය කර්මය** කළවුන්ගේ ලඬඩිය ගෙන මොවුහු ධර්මාදීහයි ඔවුන්ට අනුවර්තක වූවෝයි. **3 සීමා නානාසංවාස** නම් "ඛණ්ඩිම ගතො සීමා නානාසංවාසකො මතො" යනු බැවින් සීමාවෙන් පිට සිටිනෙයි. එකොළොස් අභව්‍ය පුද්ගලයන් ඇතුළු මේ සියල්ලෝ **අසංවාසිකයෝ** වෙත්. කු: සි: ස: 7011 බු: සි: ටී: 555 (අභබ්බ පුග්ගල බලනු)

අසංවිජ්ජමාන (නා) (න + සංවිජ්ජමාන) [සං. සංවිද්‍යමාන]= අවිද්‍යමාන, නොදක්නා. සා: පා: 348125

අසංවිහිත (නා) (න + සංවිහිත)= 1 සංවිධාන රහිත. 2 නො දන්නා. සා: පා: 804121

අසංසඝ (නා) (න + සංසඝ) (සං + √සජ + ණ)= අසංසර්ගය. නොඇලීම. පස්වැදෑරුම් සංසර්ගයෙන් වියුක්තවූ. එක්ෂනාවූ. ප: සූ: 121134 (අසංසට්ඨ බලනු)

අසංසට්ඨ (නා) (න + සං + √සජ + ත) [සං. සංසෘෂ්ට]= නොහැඟුණු. නොඇළුණු. වෙන්වූ. 1 සවණ 2 දස්සන 3 සමුල්ලාප 4 සම්භොග 5 කාය යන පස්වැදෑරුම් සංසර්ගයෙන් වෙන්වූ. මෙහි **1 සවණ සංසඝනාම්** අනුන් විසින් කියන්නා ලබන රූපාදී සම්පත්තිය හෝ තමා විසින්ම කරනු ලබන සිනහසීම් හිඟැසීම් ශබ්දය අසන්නහුට ශ්‍රොත්‍ර විඥාන විපි වශයෙන් උපන් රාගයයි. **2 දස්සන සංසඝනාම්** විසභාග රූපයන් බලන්නහුට චක්ෂුර් විඥාන විපි වශයෙන් උපන් රාගයයි. **3 සමුල්ලාප සංසඝ** නම් ඔවුනොවුන් අල්ලාප සල්ලාප

වශයෙන් උපන් රාගයයි. භික්ෂුණීඋක සහිතක දෙයක් භික්ෂුවක විසින්ද, භික්ෂුවක් සහිතක දෙයක් භික්ෂුණීඋක විසින්ද, පටිසෝග කිරීම් වශයෙන් උපන් රාගය 4 **සමෙසාග සංසඝී යයි.** ඔවුනොවුන් අත් ගැණීම් ආදී වශයෙන් උපන් රාගය **5 කාය සංසඝීයයි.** ප: සූ: 1195 **-විහාර** (නා)= අමිශ්‍රවූ විහාර ඇති. කාය විවෙක ඇති. ''දහර මහණ ආදීන් හා අමිශ්‍රවූ විහාර ඇති'' ජා: අ: ගැ: 55

අසංහාර (නා) (න + සං + √හර + ණ)= ගෙණ යා නො හැකි ධ: අ: ගැ: 9134

අසංහීර (නා)= අකම්පිය, කම්පා නොවන. පැකිලීමක් නැති. ''චිත්තයෙ ඛො පනස්ස යිතො හොති අසංහීරො පටිබලො හොති' ච: ලං: 3343 පරි: පා: නැ: 3488

අසක්කාර (නා) (න + සං + √කර + ණ) [සං. **සත්කාර**]= සත්කාර නො කිරීම. උපසථාන නො කිරීම. මහා: පා: 40828 **-සකත** (නා)= සත්කාර නො කළ නො කරන ලද සත්කාර ඇති. ''ඉධ අමෙහෙහි අසක්කරියමානා -පෙ- අසක්කාර පකතා—පක්කමිස්සන්ති වා විබ්භමිස්සන්ති වා'' මහා: පා: 40829

අසක්‍ය (නා)= (න + සක්‍ය) [සං. **ශාක්‍ය**]= ශාක්‍ය නො වූ. ශාක්‍ය වංශයට අයිති නැති, එහි නුපන්. **—ධීතා** (නා)= ශාක්‍ය දුව නියක් නොවූ. මෙහෙණක් නොවූ. ''අසස්සමණී හොති අසක්‍ය ධීතා'' පාචි: පා: 217[11] **-පුත්ත** (නා)= ශාක්‍ය පුත්‍ර නොවූ. බුඩ පුත්‍ර නොවූ. ''අසක්‍ය පුත්තා, අශාක්‍ය පුත්‍රයයි, අබුඩ පුත්‍රයයි සේසි'' ක: ච: පි: 17[18] **-පුත්තිය** (නා) (පුත්ත + ඉය) ශාක්‍ය පුත්‍රයෙක් නොවූ. ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කළයුතු ඔවිප්‍රකාරයෙහි දෙවන සෙඛ පද දෙවිස්සෙන් එකක් ගිහි ආදීන් ගැණෙන අඥාකාරයෙන් හෝ එකක්. ''අසක්‍ය පුත්තිය නොහි මං ධාරෙහීති එවං වුත්තානං ගිහි ආදීනං අඤ්ඤතරභාවෙ ඨිතානඤ්ඤෙව ඉමෙසං ඛාවිසතියා ඛෙත්තවත්ථූනං'' ක: ච: 1922 **—ංභාව** (නා)= ශාක්‍ය පුත්‍රයකු, බුඩ පුත්‍රයකු නොවන බව, භික්ෂුවක් නොවන බව. පාරා: පා: 2610 **-ංවෙවචන** (න)= ''අසක්‍ය පුත්තිය'' යනුයෙහි පසීඋ වචන—ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය පිණිස ''අසක්‍ය පුත්තිය'' යනු හා සමාන අර්ථ ඇති වචන. ''න සම්මා සම්බුඩ පුත්තොත්‍ති මං ධාරෙහි න අනන්ත බුද්ධිපුත්තො න අනොම බුඩ පුත්තො න බොධි පඤ්ඤුණ පුත්තො න ධීර පුත්තො න විගත මොහ පුත්තො න පහින්න බීල පුත්තො න විජිත විජය පුත්තොත්‍ති මං ධාරෙහීති එවමාදි අසක්‍ය පුත්තිය වෙවච නෙන සිකඛා පච්චක්ඛානං හොති'' පාරා: පා: 2627 ස: පා: 18120

අසඛ්කච්චික (නා) (අසඛකච්චික?) (න + සඛකච්චික) [සං. **සංකක්ෂිකා?**]= තත වැස්ම නැතිව. තත වසා පෙරෙව් සිවුර නැතිව. සඛකච්චිකය නම් අකු ඇටින් යට නැඹ මඩලින් උඩ පෙදෙසෙහි වූ සිරුර වසනු පිණිස මෙහෙණහට අනුදත් සිවුරයි. ''යා පන භික්ඛුණී අසඛකච්චිකං ගාමං පවිසෙය්‍ය පාචිත්තියං'' (මෙහි ශුඩ පාඨය ''සංකච්ඡිකං''යි විය යුතුසේ පෙනේ. ''කච්ඡ'' නම් කිසිල්ලය, එහි වූවා ''කච්ඡිකා'' නමු. එනම් සන්ත්‍රින් පළඳනා තනපටයි. එය සංසකෘතයෙහි **''කක්ෂිකා''** යනු දක්නේය. **සංසකෘත භාෂා,** පාළියට වඩා සිවේ එබැවින් මෙහි ශුඩපාඨය ''සංකච්ඡිකා'' යි සිතීමට අවකාශ ඇත්තේය. විමසිය යුතුය) පාචි: පා: 3426 ක: ච: 2029 ප්‍රා: ප්‍ර: ස: 5227 ක: ච: පි: 13819

අසඛ්කමනීය (නා) (න + සං + √කම් + නීය)= ගෙණ යා නොහැකි—නො පැමිණිය හැකි. සංක්‍රමණය නොකට හැකි. පරි: පා: ගැ: 1324

අසඛ්කත (නා) (න + සඛ්කත)= සලකුණක් නැතිව. සටහණක් නො කොට. ''න භික්ඛවෙ අනුපරිවෙණියං පාතිමොක්ඛං උද්දිසිතබ්බං අසඛ්කතෙන'' මහා: පා: 11614 ස: පා: 78233

අසඛ්ගහිත (නා) (න + සං + √ගහ + ඊ + ත) [සං. **සඛෘහීත**]= සඛ්‍රහ නො කළ. එකට එකතු නො කළ. හුයකින් හෝ නො අමුණන ලද. ''සෙය්‍යථාපි සාරිපුත්ත නානා පුප්ඵානි ථලෙ නික්ඛිත්තානි සුත්තෙන අසඛ්ගහිතානි තානි වානො විකිරති විධමති විද්ධංසෙති'' පාරා: පා: 786

අසච්ඡිකත (නා) (න + සච්ඡිකත) [සං. සහ + අක්ෂි > පා: අච්ඡි; සහ + අච්ඡි]= සාක්ෂාත්කෘත නොවූ. ඉන්ද්‍රිය විෂය නොවූ. ඥානී භාවනාවෙන් අවබොධ නො කළ. ස: පා 34729 පාරා: පා: 10589

අසඤ්චිච්ච (පූ: ක්‍රි:) (න + සං + √චිති + ත්වා=ය)= නො සිතා. ''අනාපත්ති භික්ඛු අසඤ්චිච්ච අජානන්තස්ස'' ක: ච: 3I17-15581 පාරා: ඥා: 781= 14119 ස: පා: 56030

අසඤ්ඤත (නා) (න + සඤ්ඤත) (සං + යත)= සංයමයක් නැති. කායාදී ද්වාරත්‍රයෙහි හික්මීමක් නැති. නැන්පත්කමක් නැති. "කායෙන කණ්ඨා බහවෝ—පාපධම්මා අසඤ්ඤතා" පාරා: පා: 9[38] සං: පා: 347[8] ධ: අ: ගැ: 173[89]

අසනි 1 (නා) (න + සති) (√සර + ති)= සිහි නොකිරීම. අන්‍ය විහිත වීම. ඒ පිළිබඳව සිහි නැතිව සමහර ශික්ෂාපදයන්හි එක් අන්‍ය පත්ති වාරයක්. "අන්‍ය විහිත සමාතිකවෑ හෝ අත්‍රන් හා බැණෑ බැණෑ හෝ" සං: පා: 386[1] -555[37]-560[34]-661[13] පාරා: පා: 141[19] පාචි: පා: 38[23]-40[4]-213[18] ජා: අ: නැ: 136[41] කං: වි: පි: 65[22]

අසනි 2 (නා)= නැති කම. "අසනි අනතරායෙ, අනතුරක් නැති කම" දෘෂ්ටි අන්ධාරායෙන් අනතුරක් නැති කම. සා: වි: 12[8]

අසනිය ඝාතක (නා) (න + සත්‍ථඝාතක) (√හන + ණ්වු= අක; √හන=ඝාත)= ශස්ත්‍රයකින් නොනැසිය යුතු. ආයුධයකින් විනාශ නොකළ යුතු. ආයුධයකින් හසා විනාශ කළ නොහැකි බුව ශරීරය සහ පාරිභොගික දෑසතු. සාර: දී: 151[4] ධ: අ: ගැ: 110[33]

අසනීක (නා) (න + සත්‍ථික) (සත්‍ථ + ඉක)= වෙළෙඳාම පිණිස බඩු ගෙණ ඇවිදින පිරිසක් නැවිව. 'ජඞ්ඝසත්‍ථ සකටසත්‍ථ' යනා සාමී යක් නැතිව. කං. වි: පි: 139[22] පාරි: පා: 293[12] කං: වි: 185[7] ප්‍රා: පු: සං: 4[213]

අසද්ධම්ම (නා) (න + සද්ධම්ම)= නිව ජනයන්ගේ සවභාවය. පහත් පැවතුම. අසත් ධර්මය. පහත් අදහස් ඇතියවුන් විසින් සෙවනය කළ යුතු ධර්මය. මෛථුන ධර්මය. කාය සංසර්ගය. "අසද්ධම්මඤ්ච අසතං නිච ජනානං ධම්මං" සං: පා: 153[16-18,11-67]327 991[26] —**පටිසංයුත්ත** (නා)= අසත් ධර්මයෙන්, මෛථුන ධර්මයෙන් යුක්තවූ. වි: වි: ටී: 2[225] සං: පා: 96[12] —**වචන** (නා)= නොමනා නෙපුල්. නුසුදුසු කථාකිරීම. තතියසඞ්ඝාදිසෙස ශික්ෂාපදයෙහි මෛථුන සංයුක්ත වචන. වි: වි: ටී: 2[25] සං: පා: 300[15] කං: වි: පි: 27[12] (ඔනාසෙය්‍ය බලනු)

අසද්ධා (නා)= ශ්‍රද්ධාවක් නැති. ඇදහිමක් නැතිව "යොහි—පෙ—අසඤ්ඤාදි දොස සංයුත්තොව හුත්වා පරිසං පරිහරති තස්ස පරිසං සීලාදිනි පරිහායන්ති යෙව" සං: පා: 739[8]

අසන 1 (නා) (√අස + යු=අන = ආහාරය. භෝජනය. අඛාළ භොජනය. 1 ඔදන, 2 කුම්මාස, 3 සත්තු, 4 මච්ඡ, 5 මංස යන පසින් එකක්. වැළඳීම. කං: වි: පි: 82[5] කු: සි: සං: 27[28] පරි: පා: ගැ: 341

අසන 2 (නා)= 1 ඊතලය. 2 පියාගය 3 විසි කිරීම. අ: ප: සං: 53[14]-134[13]

අසනං පඤ්ඤායති (ක්‍රි) (ප + √ඤ + ය + ති)= ආහාරය පෙනේ. විපකතභොජනය පෙනේ. පවාරිත භොජනයෙහි එක් ලක්ෂණයක්. යම් කිසි භික්ෂුවක් වළඳන අතර වළඳවන්නා විසින් වැළඳීමට ගෙණෙන ලද භොජනයක් වළඳනු නොකැමැතිව කයින් හෝ වචනයෙන් ප්‍රතික්ෂේප කරයි නම් ඒ භොජනය එම භික්ෂුව විසින් පවාරිත ය. එහෙත් එපමණකින් ප්‍රතික්ෂේප නොවේ. 'පඤ්චහි ඛ්‍යාලි ආකාරෙහි පවාරණා පඤ්ඤායති අසනං පඤ්ඤායති, භොජනං පඤ්ඤායති, හත්ථපාසෙ ඨිතො, අභිහරති, පටික්ඛිපෙ, පඤ්ඤායති" යනු පරිවාර පාළි බැවින් මේ අර්ථය පැහැදීමට යුත් ප්‍රතික්ෂේපය පවාරිත වේ. "අසනං පඤ්ඤායතීති ආදිසු විපකතභොජනං දිස්සති, භුඤ්ජමානො වෙසො පුග්ගලෝ හොතීති අත්ථෝ" යනු බැවින් "අසනං පඤ්ඤායති" යනුවෙහි වළඳන්නාවූ පුද්ගලයෙක් වෙයි යන අර්ථයි. එනම් විපකත භොජුන් ඇති පවාරිතයායි. මෙහි **අසන** නම් අත්පත්‍ය සිටියහු විසින් ළඟවන ලදින් ප්‍රතික්ෂේප නළ ඔදනය, කුම්මාසය, සත්තුය, මච්ඡය, මංසය යන මෙයින් එක්තරා බොජුනකි. පවාරණ පහොනක ඔදන නම් හැල් ආදී සපතවිධ ධාන්‍ය අතුරෙන් යම් ධාන්‍යයකින් පිසනලු ලැබූ බතයි. කැඳද නිවුණු කල්හි හැන්දෙන් ගත් කැන් පෙනේ නම් එය ද භොජන සඞ්ඛ්‍යාවට ම යේ. **කුම්මාස** නම් යව පිටියෙන් පිසූ රොටි ආදියයි—මුං පිටි ආදියෙන් පිසන ලද්දේ සුදුසු නොවේ. **සත්තු** නම් සපතවිධ ධාන්‍යයන්ගෙන් යම්ක් බැද කුඩුකර පිළියෙළ කළ අත්සුණු ආදියයි. ආහාරය පිණිස ගණු ලැබූ සියලු මත්ස්‍ය මාංස පවාරණ යොනියය. "අඛාළ බොජුන් ඇත්තේ පව රිතයයි කියනලදී." සං: පා: 605[4]-607[10] පාචි: පා: 83[36] සාර: ම: 14[35] කං: වි: 105[19-1.61] කං: ටී: පි: 82[1] පරි: පා: ගැ: 341

අසනි (නා) [සං. අශනි]= හෙන. වජ්‍රායුධය. අ: ප: සං: 6[19] ධ: අ: නැ: 185[12]

අසංඛත (නා)= 1 අවිද්‍යමාන, 2 අසත්පුරුෂ, 3 ශාන්ත නොවූ, අශාන්ත. "අපි ච යො දෙය්‍ය ධම්මො සෝ න දින්නොතඤ්ච බො නො අසංඛතා" පාරා: පා: 1^{09} සං: පා: 348^{25} කු: සි: සං: 8^{48} ප්‍රු: ලි: **අසඞ්ඛතා** සන්ස්: ලි: **අසංඛතම්** න: ලි: අසංඛතං.) **-සමඞ්ගිතා** (නා)= තමා වෙත නැති ගුණ පෙන්වීම. ප්‍රත්‍යක්ෂ ප්‍රතිලාභය පිණිස අවිද්‍යමාන ගුණ ප්‍රකාශ කිරීම. කු: සි: සං: 8^{14}

අසංවිති ආපත්ති (නා)= අවිද්‍යමානවූ ඇවැත. නෙ පැමිණී ඇවැත හෝ ඇවැතට පැමිණී මෙන් පසු නැඟී සිටී හෝ දෙසුවාවූ හෝ ආරොචනය කරන ලද ඇවැත. "එවං අසංවිතියා ආපත්තියා තුණ්හි භවිතබ්බං" ක: ව්: 14^{44} ප්‍රා: පු: සං: 5^{18}

අසංසන්දී (නා) (න+සන්සන්දී) (සං+ √සුස+ ණි) = නොසතුට.—**තා**= නොසතුටු බව, ලද පමණින් සතුටු නොවන බව. පාරා: පා: 19^{22} සං: පා: $1o4^{20}$

අසංසන්න (නා) (න+සන්න)= නොවසනලද. වැහැවොලතිබූ පටවාදීන් නොවසනලද. කු: සි:සං: 4^{14} සං පා: 101^{16} පාරා: ප්‍ර: 30^{26}

අසඤ්ඤ (නා) (න+සඤ්ඤ) [සං. සඤ්ඤි]= සංඥාවක්, සැකයක් නැතිව. සං: පා: 9417 චූ: පා: B. 220^{3} (අසඤ්ඤසිද දක්නේය) චූ: පා: $33o^{21}$

අසංනිධිකාර (නා) (න+සන්නිධිකාර) (සං+ නි+ √ධා+ ඉ; √කර+ ණ=කාර)= තැන්පත් නොකළ. එබඳු භොජනය. ව්: ව්: ටී: 482^{3}

අසප්පාය (නා) (න+සප්පාය) [සං. අසත්ප්‍රාය > පා. අසප්පාය]= සැප නොවන. නො සැප වූ "අසප්පායා පරිමිත භොජනං නිස්සාය, සැප නොවන. පමණ නොදන්න අහර වැළඳීම් නමැති ප්‍රයොග විපත්තියට පැමිණ"—"සෙ, අසප්පායානි චේව භොජනානි භුඤ්ජී" ව්: මා: සං: 88^{26}–89^{39} පාරා: පා: 71^{14} ව්: ව්: ටී: 184^{18} පාවි: පා: 313^{14} ප්‍රා: පු: සං: $9o^{19}$ —**තා** (නා)= නොසැප බව. භාවනාවට නුසුදුසු අවලෝස් සෙනසුන් දෙසින් එකක්. විසභාග අරමුණු නිසා හෝ අමනුෂ්‍ය උපද්‍රව නිසා හෝ සැප නැති. සාර: ද්: 562^{21} ව්: ව්: ටී: 180^{15} වි: මා: සං: 216^{1} (අටඨාරස සෙනාසන දෙස බලනු)

අසබල (නා) (න+සබල) [සං. සබර > පා. සබල] =කබර නැති. කැලැල් නැති පිරිසුදු ශීලයේ ලක්ෂණයක්. ව්: මා: සං: 135^{16}

අසබ්භකථා (නා)= අසභ්‍ය කථා. මෛථුන ධර්මය පිළිබඳ කථා. "අයඤ්හි මෙථුන කථා නාම සඝමා දුට්ඨුල්ලකථා අසබ්භකථා" සං: පා: 184^{16}

අසභාග වුත්ති (නා)= වෙනස් පැවතුම් ඇතිව. සමාන පැවතුම් නැතිව. යම්සේ භික්ෂූන් අරෙහි පැවතිය යුතුද එසේ නොපවත්නා. "අඤ්ඤම ඤඤං අගාරවා අපතිස්සා අසභාග වුත්තිකා විහරෙය්‍යාථ?" සං: පා: 539^{24} චූ: පා: 281^{4} චූ: පා: B 61^{38} පාචි: පා: 19^{36}

අසමනුඤ්ඤාභියමාන (නා)= නොවිචාරණු ලබන. නොවිමසනු ලබන. "අසමනුඤ්ඤාභියමානොතිත කෙනචි වුච්චමානො" වි: ම: 89^{5} ක: ව්: 32^{19} ප්‍රා: ප්‍ර: සං: 19^{33} පාරා: 90–200

අසම්මුඛාසන (නා) (න+සම්මුඛාසන) (සං+ අනු+ √භාස+ ඤු=අන)= සම්මුඛාභාෂණ කර්මය නොකිරීම සඞ්ඝභෙද, භෙදානුවත්තක, දුබ්බච, කුලදූසක සඞ්ඝාදිසෙසාපත්තීන්ගේ කළයුතු සම්මුඛාසන කර්මය නොකිරීම. ඇපත් චතුර්වර්ග කර්ම වාක්‍යය දෙසා නොහික්මවීම. "අනාපත්ති අසම්මුඛාසනත්‍ථාය" පාරා: පා: 208^{24}–211^{4}–213^{20}–221^{7} ප්‍රා: ප්‍ර: සං: 22^{11} සං: පා: 439^{21} ව්: ම: $1i5^{17}$ (සම්මුඛාසන බලනු)

අසමාදවාර (නා) (න+සමාදවාර) (සං+ ආ+ √වර+ ණ)= ඉටු සිවුරු නොගෙණ වියෝවීම කඨිනය ඇතුරු භික්ෂූන්ට ලැබෙන අනුසස් පසින් එකක්. චීවර විප්පවාසය. කෙළින් සිවුර පිළිගත් තැන් පටන් හෙමන්ත සෘතු යෙහි කෙළවර මැදින් දින මස පුරපසළොස්වක් දින දක්වා චීවර නාමයෙන් අධිෂ්ඨාන කළ තුන්සිවුරෙන් තමන් තබනු කැමැති සිවුරක් තබා හැමය. හෙවත් එසේ හැමෙන් සිදුවිය හැකි තිචීවර විප්පවාස නිසඟි පචිත්තියෙන් නිදහස ලැබීම නම් ආනිශංසය. "අසමාදාන චාරොති චීවරං අසමාදාය චරණං, චීවරවිප්පවාසෙ කපටිස්සතී ති අත්ථෙ" යනු සමන්ත පාසාදිකා පාඨයි. "අසමාදානචාර නම් නාමින් ඉටු සිවුරු නොගෙණ වියෝවැ හිඳීමයි" ක: ව්: පි: 431^{6} ක: ව: 48^{14} ක: ව්: 53^{26} සං: පා: 820^{29} (අසමාදාර—අසමාදානචාර යනුත් පාඨයි. අසමාදාය චාරෝ=අසමාදචාරෝ යන මෙහි ය කාර ලොපයයි. සංවිධාය අවහාරා සංවිදුවහාරෝ යන තන්හි මෙන් මෙහිදු (අසමාදචාරෝ) සාධුත්වය වේයයි කඨින වංසයෙහි දක්නේය?)

අසමාදුවාර (නා)= අසමාදවාර බලන්නේය.
අසමාදුනවාර (නා)= අසමාදවාර බලන්නේය. **ක:** වි: 53[26] **සා:** පා: 820[29]

අසමානාසනික (නා) (න + සමාන + ආසනික) (√ආස + ඝ=අන; + ඉක)= සමානාසනික නොවූ. එක අස්නෙහි නොහින්ද යුතු. "සම්වස් ඇත්තේද, එක් වසකින් හෝ දෙවසකින් වැඩි වූයේ හෝ අඩු වූයේ **සමානාසනිකය**. සෙසු හැම **අසමානාසනිකය**. පණ්ඩකය, සත්‍රිය, උභතෝ ව්‍යඤ්ජනකය යන තිදෙනා හැර සමානාසනික—අසමානාසනික සියල්ලන් හා දීඝීඝාසනයෙහි හිඳිනට වටනේය. දීඝීඝාසනය නම් තිදෙනකුන්ගට පලක් බැඳ හිඳිනට පොහොනා ආසනයයි. "**අනුජානාමි** භික්ඛවෙ යපෙත්වා පණ්ඩකං මාතුගාමං උභතෝ ව්‍යඤ්ජනකං අසමානාසනිකෙනි සහ දීඝාසනෙ නිසීදිතුන්ති" වු: පා: 2,8[27] කු: සි: ස: 69[17] සි: ව: වි: 67[15] වි: වි: 2838.

අසමාහිත (නා) (න + සමාහිත)– එකඟ නොවූ සිත් ඇති. වික්ෂිප්තවූ පුද්ගලයන්. —**පුග්ගල පරිවජ්ජන** (නා)= වික්ෂිප්ත සිත් ඇතියවුන් දුරු කිරීම. 1 සමාධි සමෙබාධ්‍යඞ්ගයාගේ උත්පාදය පිණිස පවත්නා කරුණු එකොළොසින් එකක්. දශවැදෑරුම් අපිණා කෙෂ ශ්‍රාවකයන්ගෙන් හෝ එකක්. "අසමාහිත පුද්ගලයන් දුරලීම නම්; ධ්‍යාන ප්‍රාප්තියට නොපිළිපන් අනෙක කාර්‍යයෙහි නියුක්තවූ වික්ෂිප්ත හෘදය ඇති පුද්ගලයන් දුරින් ම දුරු කිරීමය." වි: මා: ස: 3233-3250 **සා:** පා: 3073[5] වි: මා: ස: 3097

අසම්පජාන (නා) (න + සම්පජාන) (සං + ප + √ඤ + ඝ=අන; √ඤ=ඤා)= නොදැන්ම. සිහි නුවණින් තොර, නොදන්නා. **සාර:** දී: 570[16]

අසම්ඵප්පලාප (නා) (න + සම්ඵප්පලාප) (ප + √ලප + ණ)= හිස් වචන නොකියන. **නිරර්ථක** වචන කථා නොකරන. **පරි:** පා: ගැ: 2611 (සම්ඵප්පලාප යනුයෙහි නිරුක්තිය අප්‍රකටය. බෞද්ධ සංස්කෘතයෙහි මේ වෙනුවට දක්නේ **සම්භින්නප්පලාප** යනුයි. **සාර:** දී: 292[26] **අභි:** ධ: සඞ්ග: 4 73

අසම්මුඛ (නා) (න + සම්මුඛ) (සං + √මුහ් + ත) [සං. සංප්‍රාඥව]= සඳහන් නොකළ. **සා:** පා: 183[25]

අසම්භින්න (නා =නොබුන්, නොමුසු. මිශ්‍ර නොවූ. "අසම්භින්න ඛීරපායාසං, දිස නුමුසු කිරි පිඬු" ධ: අ: ගැ: 1391[6]

අසම්මෙහාග (නා) (න + සම්මෙහාග) (සං + √හුජ් + ණ; ජ්=ග)= සම්මෙහාගයක් නැති. ධර්මාමිස සම්මෙහාගය නොකිරීම. "ධම්මිසම්මෙහාගය, ආමිස සම්මෙහාගයයි (සම්මෙහාගය) විප්‍රකාර වේ. ධර්මය ඉගැන්වීම හා ඉගෙණීමත් ධර්ම සාකච්ඡාවත් ධර්ම සම්මෙහාග නම්. විවරාදි සිව්පසය එක්ව පාලනය කිරීම හෝ ඒසේ කරමින් පරිහෝගය හෝ අනුභවය හෝ නතුදෙනු කරගැණීම හෝ ආමිස සම්මෙහාග නම් වේ" — 'අථ බෝ වෙස්සා ලිච්ඡවි සඞ්ඝස්ස කිර මෙ පත්තෝ නිකකුජ්ජිතෝ අසම්මෙහාගොමිනි කිර සඞ්ඝස්නාති තස්සේව මුච්ඡිතෝ පපති" වු: ප: 43[21]-237[34]-238[10] ම: පා: ස: 481[3]B. වි: වි: ටී: 461[20]

අසම්මත (නා) (න + සම්මත) (සං + √මන + ත)= සම්මත නොකළ. නොපිළිගත්. නියම නොකළ. සඞ්ඝ සම්මතයෙන් (කර්ම වාක්‍යයෙන්) සම්මත නොවූ. **සා:** පා: 784[14] **පා:** මු: වි: ඛ: 16,[14] ඛ: ඛ: ටී: 409[10] **කා:** ඛ: 97[26] **ප්‍රා:** පු: **සා:** 47[18] **මහා:** පා: 120[1]

අසම්මාවත්තනා (නා)= යහපත්සේ නොපැවැත්ම. මනාව නොපිළිපැහැම "අනුජානාමි භික්ඛවෙ අසම්මාවත්තනත්තං පණාමෙතුං" **මහා:** පා: 51[20] **ම:** පා: ස: 193[21]

අසම්මුඛා (න) (න + සම්මුඛ)= නොහමුව. අනහිමුඛය. ඉදිරියෙහි නැති. **අ:** ප: ස: 178[12] **මහා:** පා: 364[8] —**කත** (නා)= අනහිමුඛයෙහි කළ. නොහමුවෙහි කරන ලද. එබඳු කර්ම. **වු:** පා: 36[25] **සා:** පා: 859[3] (අසම්මුඛා කරණීය බලනු) —**කරණීය** (නා)= නොහමුයෙහි කටයුතු කර්ම. **සම්මුඛාකරණීය, අසම්මුඛාකරණීය** කියා විනය කර්ම දෙකකි. එයින් 1 සඞ්ඝ සම්මුඛතා 2 ධම්මසම්මුඛතා 3 විනය සම්මුඛතා 4 පුග්ගල සම්මුඛතා යන කරුණු සතර සම්පූර්ණව ඇති කල්හි කළයුතු විනය කර්මය සම්මුඛා කරණීය නම්. ඒ කරුණු නැති කල්හි කරනු ලබන විනය කර්ම අසම්මුඛා කරණීය නම්. එබඳු අසම්මුඛා කරණීය කර්ම අටකි. එනම් 1 දූතෙන උපසම්පදා 2 පත්ත නිකුජ්ජන 3 පත්තුක්කුජ්ජන 4 ඵිම්මාතක සම්මුති 5 සෙඛ

සම්මුති 6 බ්‍රහ්මදණ්ඩ 7 පකාසනීයකම්ම 8 අවන්දිය කම්ම යන මේ අටයි. මේ කර්‍ම අට නො හම්වෙති කළ කල්හිම අකොප්‍ය වේ ''ඉදං අට්ඨවිධම්පි කම්මං අසම්මුඛා කතං සුකතං හොති අකුප්පං'' සං: පා: 1040[22] පා මු: වි: වි: 355[26] මහා: පා: 365[8] (අවන්දනීය කම්ම බලනු)

අසම්මුඛ (නා) (න+සම්මුඛ) (සං+ √මුස+ත)= නො මුළාවූ. එළඹ සිටි සිතියෙන් යුතු. ''උ්ඨිතා සති අසම්මුඛා'' පාරා: පා: 45 සා: පා: 896

අසම්මෝද (නා) (න+සම්මෝද) (සං+ √මුද+ණ)= නො සතුට. —**ත්‍ථ**= නො සතුට, නො සතුටු කථාව. එබඳු කථා කිරීම. ''නිත්‍ථෙන නිකරවෙ සඞ්ඝෙ අධම්මියම්හෙ අසම්මෝදිකාය චත්තාමානාය'' මහා: පා: 385[15] සා: පා: 853[23].

අසල්ලීන (නා) (න+සල්ලීන) (සං+ √ලී+ යු= අන)= නො හැකුළුණු. ''ආරද්ධං ඛො පන මෙ බ්‍රාහ්මණ විරියං අහොසි අසල්ලීනං'' පාරා: පා: 44 සා: පා: 894

අසාත (නා) (න+සාත) [සං. සාත]=නො මිහිරි. අප්‍රිය සා: පා: 629 පාචි: පා: 147[31] මහා: පා: 863[1]

අසාදියන (නා)= 1 නො ඉවසන. 2 නො විඳින. 3 සෙවුනා සිත නුපදවන. දැනගත් කල්හිද සෙවන චිත්තය නුපදවන. මෛථුන ධම්ම පාරාජිකාවේ සහ කාය සංසර්ගී සඞ්ඝාදිශේෂාපත්තියේ එක් අනාපත්තිවාරයක්. පාරා: පා: 34[4]-35[19]-141[19] සා: පා: 1932[4] චි: වි: ටී: 211[6] (පු: ලි: **අසාදියනෙනා** සන්‍ත්‍රි: ලි: **අසාදියනත්තා** න: ලි: **අසාදියනා** ''අනාපත්ති භික්ඛවෙ අසාදියනත්තස්ස''—අසාදියනත්තියා'') (සාදෙති බලනු).

අසාධාරණ (නා) (න+සාධාරණ) (සහ+ √ධාර+යු=අන; න=ණ)= සාධාරණ නොවූ. සමාන නැති. අප්‍රතිඥාත වූ. අ: ප: සා: 96[1] **-ආපත්ති** (නා)= සමාන නොවූ ඇවැත්. භික්ෂුණීන් හා භික්ෂූන්ටද, භික්ෂූන් හා භික්ෂුණීන්ටද අසමාන වූ ඇවැත්. ලිඛිත පරිච්ඡේදයෙන් නැහී සිටින ඇවැත්. ''උභින්නම්පි පන අසාධාරණා පත්ති ලිඛිත පාතුභාවෙන වුට්ඨානි'' පාරා: පා: 35[25-31] චි: ම: 115[32] සා: පා: 1971[1]-9821[1] පරි: පා: 1731[9] සාර: දී: 479[19] (අසාධාරණ සික්ඛාපද බලනු) **-පඤ්ඤත්ති** (නා)= අසාධාරණ ප්‍රඥප්තිය. භික්ෂු භික්ෂුණී දෙපක්ෂයෙන් එක්පක්ෂයකට පමණක් නියත පණත්. නව වැදෑරුම් ප්‍රඥප්තීන්ගෙන් (ශික්ෂාපදයන්ගෙන්) එකක්. ''සුඛ භික්ඛූනමෙවහි සුඛ භික්ඛුනිනං වා පඤ්ඤත්තත්තා සික්ඛාපදං අසාධාරණ පඤ්ඤත්තති'' චි: ම: 593[3] සා: පා: 959[18] ක: වි: 21[16] වි: වි: 779 (උ:වි:) **-පාරාජික** (නා) (පරා+ √ජි+ණික)= එතම් පරිදි ඇවැත් සතර. භික්ෂූන් හා සාධාරණ නොවූ භික්ෂුණීන්ට පමණක් විශෙෂවූ 1 උඛහජාතු මණ්ඩලික 2 වජ්ජ පටිච්ඡාදක 3 උක්ඛිත්තානුවත්තක 4 අට්ඨ වත්‍ථුක යන පාරාජිකාපත්ති සතර. කු: සී: සා: 831 චි: ම: 2736 සී: ව: වි: 2835 චූ: පා: B. 4748 වි: වි: ටී: 4963[8] පරි: පා: ගැ: 1988 **-විනිච්ඡය** (නා)= ඒ ඒ ශික්ෂාපදයන් පිළිබඳ විශෙෂ විනිශ්චය. සියලුම ශික්ෂාපදයන්ගේ සාධාරණ විනිශ්චය; 1 නිදාන 2 පුග්ගල 3 වත්‍ථු 4 පඤ්ඤත්ති 5 ආණත්ති 6 ආපත්ති 7 අනාපත්ති 8 විපත්ති 9 අඞ්ග 10 සමුට්ඨාන විධි 11 කිරියා 12 සඤ්ඤා 13 චිත්ත 14 වජ්ජ 15 කම්ම 16—17 ත්‍රිකද්වයවිධි යන කරුණු සතළොසින් වේ.මේ කරුණින් විශෙෂවූ විනිශ්චය අසාධාරණ විනිශ්චයයි. මෙහි ත්‍රිකද්වය විධිය යනු කුසල ත්‍රික විධිය, වෙදනා ත්‍රික විධිය යන දෙකයි ඇවැතට පැමිණෙන භික්ෂු තෙම අකුසල සිත ඇතිව හෝ කුසල සිත ඇතිව හෝ අව්‍යාකෘත සිත ඇතිව හෝ පැමිණෙයි මේ කුසල ත්‍රික විධියයි. එසේම ඇවැතට පැමිණෙන්නේ දුක්ඛ වෙදනාවෙන් හෝ සුඛ වෙදනාවෙන් හෝ උපෙක්ෂා වෙදනාවෙන් යුක්තව හෝ පැමිණෙයි. මේ වෙදනා ත්‍රික විධියයි. ''අසාධාරණ විනිච්ඡයොති අදින්නාදානාදීහි සබ්බෙහි සික්ඛාපදෙහි අසාධාරණ විනිච්ඡයො'' චි:ම: 583[4] ක:වි: 21[3] (සාධාරණ විනිච්ඡය බලනු) **—සික්ඛාපද** (නා)= සමාන නොවූ ශික්ෂාපද. භික්ෂුණීන් සහ භික්ෂූන්ට භික්ෂූන සහ භික්ෂුණීන්ටද එකසේ සාධාරණ නොවූ ශික්ෂාපද. මෙහි භික්ෂුණීන් හා අසාධාරණ භික්ෂු ශික්ෂාපද 46 කි. භික්ෂූන් හා අසාධාරණ භික්ෂුණී ශික්ෂාපද 130 කි. උභය අසාධාරණ ශික්ෂාපද 176 කි. භික්ෂු—භික්ෂුණී උභය සාධාරණ ශික්ෂාපද 174 කි. එය පාළියෙන් සඳහන් පට්ටිකාවෙන් දත් නේය.

2018.02.17

සික්ඛාපද	භික්ෂුණීන් හා අසාධාරණ 46	භික්ෂූන් හා අසාධාරණ 130	උභය අසාධාරණ 176	උභය සාධාරණ 174
පාරාජික		4	4	4
සඞ්ඝාදිසෙස	6	10	16	7
අනියත	2		2	
නිස්සග්ගිය පාචිත්තිය	12	12	24	18
සුද්ධ පාචිත්තිය	22	96	118	70
පාටි දෙසනීය	4	8	12	
සෙඛිය				75
එකතුව	46	130	176	174

මෙහි භික්ෂුණීන් හා **අසාධාරණ ශික්ෂාපද සත ලිස් සය** අතර **සඞ්ඝාදිසෙස සය** නම්; 1 සුක්‍ර විසර්ග 2 කාය සංසර්ග 3 දුට්ඨුල්ලවාචා 4 අත්ත කාමපාරිචරියා 5 කුටිකාර 6 විහාරකාර යන ශික්ෂාපද සයයි. **අනියත** නම්; එනම් ශික්ෂාපද දෙකයි. **නිස්සග්ගිය පාචිත්තිය දෙලොස** නම්; 1 පුරාණ චීවර 2 චීවර පටිග්ගහණ 3 කොසිය 4 සුද්ධ කාලක 5 දෙවනාග 6 ඡබ්බස්ස 7 නිසීදන 7 සන්තන 8 එලකලොම 9 එලකපලිබෝධ ධොවාපන 10 පත්ත 11 වස්සික සාටික 12 සාසඞ්ක යන දෙළසයි. ශුද්ධ පාචිත්ති ශික්ෂාපද දෙවිස්ස නම්; භික්ෂුණී වර්ගයෙහි **දක්ඛා** 1 ඔවාද 2 අපඛඩත 3 භික්ඛුණී උපස්සය 4 ආමිස 5 චීවරදාන 6 චීවර සිබ්බන 7 සංවිධාන 8 කාලාතිරුහණ 9 පරිපාචිත 10 රහොනිසජ්ජ යන දසය සහ 11 පරම්පර භොජන 12 පවාරණ 13 අභිහට්ඨු පවාරණ 14 චික්කාල භොජන 15 සන්නිධි භොජන 16 අවේලක 17 දුට්ඨුල්ල 18 සංචරිත 19 රාජාගාර පුර 20 විකාල ගාමප්පවේසන 21 නිසීදන 22 උසසික සාටික යන දෙවිස්සයි. **පාටිදෙසනීය සතර** නම්; 1 අඤ්ඤාතිකා පටිග්ගහණ 2 වොසාසමාන 3 සෙඛ සම්මත 4 ආරඤ්ඤක යන සතරයි. **සියල්ල එකතුව සතළිස් සයකි.** මේ ශික්ෂාපද භික්ෂුණීන් හා අසාධාරණය. එබැවින් භික්ෂූන්ටම සාධාරණය.

භික්ෂූන් හා අසාධාරණ භික්ෂුණී ශික්ෂාපද **එක් සිය තිස** අතර 1 උබ්භජාණු මණ්ඩලික 2 වජ්ජ පටිච්ඡාදක 3 උක්කොටනාණුවාහනක 4 අඩ්ඪකුළික යනු **සතර පරිජ්ඡේද—සඞ්ඝාදිසෙස දශය** නම්; 1 උස්සය වාදිකා විහාර 2 වුඩ්ඪාපන 3 ගාමන්තර ගමන 4 ඔසාරණ 5 අවස්සුත 6 උය්‍යෝජන 7 පවාරක 8 අධිකරණ 9 සංසට්ඨවිහාර 10 දුතිය සංසට්ඨවිහාර යන දශයයි **නිසග්ගි පාචිති දෙළස** නම් භික්ෂුණීන්ට පණවා වදාළ එම ශික්ෂාපද දෙළසයි. **සයානූ ශුද්ධ පාචිති** නම්; භික්ෂුණී විභඞ්ගයෙහි පණවා වදාළ 1 ලසුණභක්ඛ 2 අඤ්ඤාකාර භක්ඛ 3 තඤ්ඤභක්ඛ 4 තුවට්ටභක්ඛ 5 චිත්තාගාර භක්ඛ 6 ආරාමභක්ඛ 7 ගබ්භිනීභක්ඛ යන සම දශය බැහින් ශික්ෂාපද ඇති ඛීණාසවාකාරයෙහි සැත්තෑවක් සහ 8 කුමාරීභූත භක්ඛ 9 ඡත්තූපාහණභක්ඛ යන ඛීණාවයෙහි තෙළෙස බැහින් ලැබෙන අවිස්සද ඇතුළු සයානූවක ශික්ෂාපදයි. **පාටිදෙසනය අට** නම්; භික්ෂුණීන්ට පැණවූ එනම් ශික්ෂාපද අටයි මේ සියල්ල එකතුව **එක්සිය තිසයි.** මේ ශික්ෂාපද භික්ෂූන් හා අසාධාරණය. එබැවින් භික්ෂුණීන්ට ම සාධාරණය.

උභය අසාධාරණ ශික්ෂාපද **එක්සිය සය සැත්තැව** නම්; භික්ෂුණී අසාධාරණ සය සාළිස සහ භික්ෂු අසාධාරණ එක්සිය තිස ඇතුළු ශික්ෂාපද සමූහයයි.

උභය සාධාරණ ශික්ෂාපද එක්සිය සිව් සැත්තැව අතර **පාරාජික සතර** නම්; 1 මෙථුන ධම්ම 2 අදින්නාදාන 3 මනුස්ස විඟහ 4 උත්තරි මනුස්ස ධම්ම යන සතර පරිජ්ජයි. සඞ්ඝාදිසෙස සත නම්; 1 සඤ්චරිත්ත 2 සඤ්ඤ හෙද 3 හෙදනුවත්තක 4 අමූල 5 අඤ්ඤභාගිය 6 දුට්ඨදොස 7 කුලදූසක යන ශික්ෂාපදයි. **නිසඟි පචිත්ති ෙතළොස** නම්; නිසඟි සික දෙළස හැර උභය විභඞ්ගයෙහි ලැබෙන 1 නිස්සිත චීවර 2 විප්පවාස 3 අකාල චීවර 4 චීවර විඤ්ඤත්ති 5 උපනිධිසාදියන 6 උපක්ඛට 7 පරෙවෙක චීවර 8 චීවරෙවෙකාපන 9 ජාතරූප රජත සාදි සන 10 රූපිය සංවොහාර 11 කය විඤ්ඤත්ති සම පඤ්ඤත්ත 12 නවපත්ත චෙතාපන 13 හෙඨඤ්ඤ 14 චීවර අච්ඡින්දන 15 චීවර විඝාසාහාරපන 16 චීවර විකප්පන 17 අතෙවෙක චීවර 18 අත්තනෝ පරිණාමන යන ශික්ෂාපදයි **ශුද්ධ පාචිත්තිය ශික්ෂාපද සැත්තැව** නම්; 1 මුසාවාදවග්ග 2 භූතගාමවග්ග 3 භොජන වග්ග 4 චාරිත්තවග්ග 5 දිට්ඨිවග්ග 6 ඡොතිවග්ග 7 ධම්මිකවග්ග යන මේ වග්ගසත්තකයෙහි එක වග්ගයක දශය බැගින් ඇති ශික්ෂාපදයි. **සෙඛිය පන්සැත්තැව** නම්; 1 පරිමණ්ඩල වග්ග 2 උජ්ජග්ඝිකා වග්ග 3 ඛම්භකත වග්ග 4 සක්කච්චවග්ග 5 කබලවග්ග 6 සුරු සුරු කාරක වග්ග යන එක වග්ගයක දශය බැගින් ලැබෙන ශික්ෂා සැට ද, පාදුන වග්ගයෙහි වූ ශික්ෂා පසළොසද ඇතුළත් පන්සැත්තැවසි. එක්සිය සිව්සැත්තැවක්වූ මේ සියල්ල භික්ෂූන්ට මෙන්ම භික්ෂුණීන්ට ද එකසේ සාධාරණය. එබැවින් මෙය උභය සාධාරණ ශික්ෂා නමු. චි: චි: 810 සිට 835 දක්වා (උ: චි:) පරි: පා: 19824-19928. චි: චි: ටී: 4981 සා: පා: 9 8828

අසාමඟඟ නා) (න + සාමඤ්ඤ) (සමඤ්ඤ + ණ)= සමගි නොවූ අසමගිවූ. මහා: පා: 11810

අසාවඥි (නා) (සාවඤ්ඤ + ඊ)= සමග්ග නොවූ. අසමගිවූ. චි: ම: 1174 **-පක්ඛිය** (නා) (පක්ඛ + ණික=ඉය)= අසමගි පක්ෂයෙහි වූ. නො සමග පක්ෂය සෙවූ නා. කලහකාරක. චි: ම: 1174 ක: වි: 463 ක: චි: පි: 3786 **-ංවචන** (නා) අසමගි පක්ෂයෙහි වූවන්ගේ වචන. කලහකරුවන්ගේ වචන. "අසාමඟඟි පක්ඛිකා භවා අසාමඟඟි පක්ඛිකා. කලහකාරකා. තෙසං වචනං අසාමඟඟි පක්ඛිය වචනං" චි: ම: 1174 ක: චි: පි: 3786 ක: චි: 463.

අසාරද්ධ (නා) (න + සාරද්ධ) (සං + √රභ + ත) [සං. සංරබ්ධ?]= පහවූ කෙලෙස් දැහ ඇති. **කොලසුන් පිළිබඳ දෑවිමක් නැති.** බර ඇරුණු. බරක් නැති. "පස්සථෝ කාථෝ අසාරද්ධෝ" පාරා: පා: 45 සා: පා: 899

අසාරෙවෝ (පූ: ක්‍රි:) (න + සාරෙවෝ) (√සර + ණෙ + ත්වා)= සිහි නොකරවා **-ඛතං හොති** (ක්‍රි)= සිහි නොකරවා කරන ලද්දේ වේ ද. අධර්ම කර්මයක එක් ලක්ෂණයක්. "අසාරෙත්වා කතං හොති" චූ: පා: 429

අසාවෙතඛාමෝ සාවෙති (ක්‍රි)= නො අස්වනු කැමැත්තේ අස්වසි ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය නොවන එක් ආකාරයක්. ශික්ෂාපදයාගේ පෙළ කියයි ද. විමසා ද, උගන්නා කෙරේ ද, මේ "අසාවෙතුකාමෝ සාවෙති" නම් වේ. පාරා: පා: 2711 සා: පා: 18285

අසාහසික (නා) (න + සාහසික) (සහසා + ණික) = ඉක්මන් නොවූ. නො විමසීමෙන් හුසුළුසු වචන කියන, එබඳු කටයුතු කරන. සඞ්ඝාමා වචර (අධිකරණ විනිශ්චය කරන) භික්ෂුව කෙරෙහි පිහිටිය යුතු එක් ලක්ෂණයක්. "අසාහසිකෙන භවිතබ්බන්ති න සහසා කාරී නා භවිතබ්බං; සහසා දුරුත්ත වචනං න කථෙ තබ්බන්ති අත්ථෝ" පරි: පා: 21821 සා: පා: 101138

අසි (නා) [සං. අසි]= කඩුව. එක් ආයුධයක්. "අසිස්ස විජ්ජාතලති" පාරා: පා: 7223 අ: ප: සා: 5324 චූ: පා: 24330 සා: පා: 89434 **-ඵරු** (නා)= කඩු මිට. ධ: අ: ඇ: 26821 **-පුත්ති** (නා) [සං. අසිපුත්‍රි]= සිරිඟ. එනම් ආයුධය. අ: ප: සා: 5331 **-ලොම පුරිස** (නා)= කඩු බඳු ලොම් ඇති පුරුෂයා, එබඳු ප්‍රේතයා. "අද්දසං අසිලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං" පාරා: පා: 11311 සා: පා 36227 **-සූණූපමා** (නා) (අසි සූණ + උපමා) [බෞ: සං: අසි සූණා]= මස් ලොඹුවක මස් තබා කඩුවෙන් කෙටීමක් වැනි. ගෙරිමස් කොටන කැත්තක් හා කොළොඹු කඩක් වැනි. කාමයන්ගෙන් සත්ත්වයන් නැසෙන බව දැක්වීමට යොදන

උපමාවක්. වසතුකාම නමැති කොලොඹුවෙහි කෙලෙස කාම නමැති කඹුවෙන් කෙරීමක් වැනි "අසිසූණූපමා අධිකුට්ටනටෙයන"— "අසිසූණාති එත්ථ යථා සූණාය උපරි මංසං ඨපෙත්වා අසිනා කොට්ටෙනති එවම්මේ සත්තා වත්ථුකාමත්ථාය කිලෙස කාමෙහි කන්තිං කොට්ටෙත්වා හොන්ති" සං: පා: 644[25] ප: සූ: 110[19] සාරා: ම: 162[6] පාචි: පා: 152[36]B

අසිඛිත (නා) (න + සිඛිත) (√සික්ඛ + ඉ + ත)= නොහික්මුණු. ඒ ඒ ශික්ෂාපදයන්හි හෝ කායාදි චාරිත්‍රයෙහි හික්මීමක් නැති. **-සික්ඛා** (නා)= ශික්ෂාපදයන්හි නොහික්මුණු. ශික්ෂාවන් නුදුන් හෝ දුන් ශික්ෂාපදයන් කොපනය කළ ශික්ෂාමානාවක විසින් අවුරුදු දෙකක් හික්මිය යුතුයයි පැණවූ පාණාති පාතාදි ෂට්ඨමීයෙහි නොහික්මුණු. එබඳු ශික්ෂාමානාවක් උපසපන් නොකළ යුතුය "අසික්ඛිත සික්ඛානාම සික්ඛා වා න දින්නා හොති දින්නා වා සික්ඛා කුපිතා" පාචි: පා: 353[39]B. වූ: පා: "මෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිත සික්ඛාය සික්ඛමානාය උභතො සංඝෙ උපසම්පදා පරියෙසිතබ්බා" පාචි: පා: 355[29]B. වූ: පා: 398[22] ප්‍රා: පු: ස: 47[34]

අසිත (නා) (න+සිත)= 1 නඵ පැහැය. 2 අනුභව කළ. 3 එනම් තාපසයා. අ: ප: ස:-158

අසිනිකඛඞ්ඛ වත්ත (නා)= අසූ මහ කඳුවත් බඹකයන්හි දක්නා අසුවක් වත්. තජ්ජනියාදි කම් කළ කාලයෙහි සහ පරිවාසාදි කාලයෙහි පිදුම යුතු දෙවිසි කඳුවත් ආදිවූ අසූ මහ කඳුවත්. එහි පිරිවෙස් විසූ භික්ෂූන් වෙතුවෙන් පණවන ලද "න උපසම්පාදෙතබ්බං—පෙ— න ඡත්තූය චඞ්කමන්තෙන චඞ්කමෙ චඞ්කමිතබ්බං" යනුවෙන් දැක්වූ වත් සැට හයකි. "න භික්ඛවෙ පාරිවාසිකෙන භික්ඛුනා පාරිවාසික බුඩ්ඪතරෙන—පෙ—මූලාය පටිකස්සනාරහෙන මානත්තාරහෙන මානත්තචාරිකෙන අබ්භානාරහෙන භික්ඛුනා සඞ්ඝං එකච්චිං න්‍හාසෙ වුට්ඨබ්බං" යනුවෙන් දැක්වූ වත් සමූහය පිඬුකොට පස් ආකාරයකි ගත් බැවින් එය සමඟ එක්සැත්තෑවකි. "න පඤ්චහත්තස්ස භික්ඛුනො අභිවාදනං—පෙ—නහානෙන පිඨිපරිකම්මං සාදිතබ්බං" යන සියල්ල එකකි. එවිට දෙසැත්තෑවකි. "න පඤ්චහතෙනා භික්ඛු සිල විපත්තියා අනුඛංසෙතබ්බා" යනාදීන් දැක්වූ දශයත් සමඟ දෙයාසූවකි. මේ සියල්ල අඩුවැඩි වුවද එය ගිණීමට නොගෙන අසූවක් කඳුවත්යයි කියති. "අඤ්ඤත්ථ පන අට්ඨකථා පදෙසෙ අපඤ්චකං ඨාන මිච්ඡකං වා ගණ්හන්තූපගං න හොතීති **අසිනිකඛඞ්ඛ වත්තානීති** වුච්චති" සාර: දී: 553[37]–554[16] ජ.: අ: ගැ: 104[11] සං: පා: 29[11] (වෙ අසිනිඛඞ්ඛ වත්ත බලනු)

අසිමා 1 (නා) (න+සීමා) (ප්‍රා: ලි: **අසිමෝ** නපු: ලි: **අසිමා** = සීමාවක් නොවන. බද්ධ සීමාවක් නොවන. බද්ධසීමාවට ක්ෂෙත්‍ර නොවන. නදිය සමුද්‍රය සහ ජාතස්සරය. "සබ්බා භික්ඛවෙ නදී අසීමා සබ්බෙ සමුද්දා අසීමා සබ්බෙ ජාතස්සරෙ අසීමෙ" යනුවෙන් සියලු නදිය දහදිය සහ ජාතස්සරය බද්ධසීමාවට ක්ෂෙත්‍ර නොවේ. එබැවින් අසීමා නම්. "සබ්බා භික්ඛවෙ නදී අසීමානි ආදිනා නදී සමුද්දජාතස්සරා බද්ධසීමාය අඛෙත්ත භාවෙන වුත්තා" යනු විමති විනොදනී ටීකායි නදී ආදිහු උදකොත්ථඤ්ඤ සීමාවට ම ක්ෂෙත්‍රයෝ වෙත්. එම්තත්ත කීර්තනයෙන් එහි බද්ධ සීමාවක් කරන ලද්දීද එය සීමාවක් නොවන්නිය. නදිය සමුද්‍රය සහ ජාතස්සරය සභාවදෙයන්ම බද්ධසීමා වැනිය. එහි කොතැනත් සඞ්ඝකම්මි කිරීම වටනේය. කියන ලදි සමන්ත පාසාදි කාවෙහි "යා කාචි නදී ලක්ඛණපත්තා නදී නිමිත්තානි කිත්තෙත්වා එතං උදකුක්ඛෙපං සීමං කරොමාති කතාපි අසීමාව හොති. සා පන අත්ත නොසභාවෙනෙව බද්ධසීමා ඉදිසා. සබ්බ මෙපා සඞ්ඝ කම්මං කාතුං වට්ටති." "නදී ආදියෙහි සීමා සම්මතයක් නැති. එහි සහන රැස්ව අත්පස නොපිරිහෙලා වැඩ උන් කල සීමාව ඇති වේ. එසේ නමුදු සහනගේ අන්පස් සිට සිව් දිගට ගුල ක්‍රිඛකයන් ගුල විසි කරන්නාසේ ජලය විසිකොට සීමාව වෙන් කර ගන්නේය. ඒ ජලය වැටුණු තැනින් ඇතුළත උදකුක්ඛෙප සීමාව වේ." "ඉන් බැහැර තවත් සඞ්ඝ කොටසකට එසේම සීමාවක් ඇතිකර ගන්නට පුළුවන. මේ උදකුක්ඛෙපයෙහි ප්‍රයොජනය වේ. එසේ කල ඒ මධ්‍යයෙහි උපචාරයට උදකුක්ඛෙපයක ප්‍රමාණ අවකාශයක් ඉඩහැරිය යුතුය" යනු මහාවගග පාළි සන්නසි සං: පා: 785[17] ම: පා: ස: 361[32] වි: ඒ: ටී: 418[8] වි: ලෑ: 224[38] පා: මු: ටී: වි: 180[4] වි: ටී: 2569 කං: ඒ: 2[6]

අසිමා 2 (නා)=සීමාවක් නොවන. උඩක්පිරිසෙසින් තුන් යොදුනට කෙසඟක් නමුදු වැඩි වූ හෝ යටත්පිරිසෙසින් අබහාන කම්මාහි ඳදාගෙයකු ඇතුළු විසිඑක් නමකට නො පොහොසත් සේ ද සම්මත කළ සීමාව. සං: පා: 780⁵ දී: වි: 2566 (විපත්ති සීමා බලනු)

අසිමා 3 (නා)=සමූහනය කළ සීමාව. **කම්වාචාය** යෙන් සමූහනය කළ හෝ ඥාසනන්තර්ධාන යෙන් සීමාවක් නොවන අවිප්පවාස සීමාව. "අයං හි සීමා නාම කම්මවාචාය වා අසිද්ධා නොහි සාසනන්තරධානේන වා" සං: පා: 784⁸⁰

අසිසඤ්ච (නා)= හිස නොගැවෙන. මධ්‍යම පුරුෂයකුගේ හිස මතු නලාදෙයේ ඝට නොගැවෙන. වෙහාස කුටියෙහි උස ප්‍රමාණය. "වෙහාස කුටි නාම මජ්ඣිමස්ස පුරිසස්ස අසිසඤ්චා" පාචි: පා. B. 61¹ සං: පා: 572⁸⁰ වි: වි: 1100 සාර: දී: 812¹⁰

අසිසකා (නා) (න + සිස + ක)= හිස නැති. එබඳු ශරීරය. කවඤ්ධරූපය. අඳුසං අසිසකං කවඤ්ධං වෙහාසං ගච්ඡන්තං" පාරා: පා: 114⁸¹

අසු (නා)= ප්‍රාණය. අ: ප: සං: ⁵⁵³⁴

අසුක (නා) (අසු + ක) [සං. අසෙෂ > පා: අසු]= අසුවල්. පාරා: පා: 88¹² සං: පා: 342²⁸

අසුකක (නා) (න + සුසඛ) [සං. ශුෂ්ක > පා: සුක්ඛ]: නොවියලි. නොමිළ නොමළ වෘක්ෂලතාවන්. "අසුක්ඛං ජීවන්ත්ව සිටී" කං: වි: පි: 65¹³ —**මානිකා** (නා)= නොවියලි ඇල. වි: ලං: 5⁵¹⁸

අසුචි (නා) (න + සුචි) 1 අපිරිසුදු 2 ශුක්‍ර 3 අමේධ්‍යය 4 අපිරිසුදු කාය කම්මාදිය 5 අලජ්ජී "නොපිරිසුදු කාය කම්මාදිය ඇති බැවින් ශුචි නොවූ" "අසුචීති කාය වචීකම්මෙමනි සම්මන්නා ගතෝ" වි: මා: සං: 13⁵³⁷ පාරා: පා: 117¹⁴-1.8¹ සං: පා: 883¹⁴-1012²³ අ: ප: සං: 3816 වි: වි: ටී: 11⁵¹⁶ චූ: පා: 373⁷

අසුත (නා) (න + සුත) (√සු + ත)= නොඅසන ලද. කිසිවකු විසින් කියන ලද්දක් නොඇසූ. අමූලක සඞ්ඛාදියෙහි ශික්ෂාපදයෙහි අමූලක ජාරාජිකාවෙහි එක් අඞ්ගයක්. ත්‍රිකොටි පරිශුද්ධ මත්‍සය මාංසයෙහි එක් අඞ්ගයක්. නිඝණ්ඨන් උදෙසා මරා ගෙණෙන ලදැයි නොඇසූ සං: පා: 420²⁵-435³⁴-536¹³ පා: මූ: වි: වි: 25⁵⁷ පාරා: පා: 19⁴³⁴

අසුතං සුතං මේ (නා)= නොඅසන ලද්දක් මවිසින් අසන ලදැයි කීම. අට වැදූරුම් අනාදීන්‍ය ව්‍යවහාරයන්ගෙන් එකක්. පාචි: පා: 2²³-3¹ සං: පා: 536¹³ (අඤ්ඤ අනරිය වොහාර බලනු)

අසුද්ධ (නා) (න + සුද්ධ) (√සුධ + ත)= 1 අපිරිසුදු. 2 එක් පරිජී ඇවැතකට පැමිණියහු. "අසුද්ධා හොන්ති පුග්ගලෝ අනුසඤ්ඤතරං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නෝ" පාරා: පා: 198¹ **-දිට්ඨි** (නා)= අපිරිසුදු වූවෙක්ෂ යන දෘෂ්ටිය ඇති. පරිජී ඇවතට පැමිණියේය යන දැකීම ඇති. පාරා: පා: 199⁵ **-ංසමාන** (නා)= අපිරිසුදු වූවෙක්ෂ යන දැකීම ඇති එබඳු තැනැත්තා. පාරා: පා: 198¹⁴ **-පරිඝඩිත** (නා = අමූලිකව අසුඛයයි සැක කරන ලද. මුල් රහිතව පරිජී ඇවැත් අවන්නේයයි සැක කළ පරි: පා: 215¹⁰ සං: පා: 10(9¹⁵

අසුභ (නා) (න + සුභ)= ශුභයක් නැති. පිළිකුල්. අනිෂ්ට. අඝභපත්. පාරා: පා: 67²³ වි: මා: සං: 461³⁶ **-'අනුපස්සි** (නා) (අනු + √දිස + ණි: √දිස=පස්ස)= අශුභය අනුව දක්නේ. එක් කම්ඨස්ථානයක්. ප: සූ: 349¹⁴ **-කථා** (නා)= ශරීරය පිළිබඳ අශුභ කථාව. "මහණෙනි බහියක් පමණවූ මේ සිරුරෙහි ඉතා සියුම් ලෙස පිරිස්සන්නහුට නමුදු මුතුමැණික් ආදී කිසි යම් රත්නයක් හෝ සඳුන් අගිල් ආදී සුවඳ දෙයක් හෝ නොලැබිය හැක. දුර්ගන්ධවූ එසේම පිළිකුල් කටයුතු වූ අසුචියක් ම දක්නට ලැබේ. එහෙයින් මෙහි ඇලීම් නොකට යුතුය යනාදීන් අශුභ නිඃශ්‍රිත වූ කථාව. "තෙන ඛෝ පන සමයෙන භගවා භික්ඛූනං අනෙක පරියායෙන අසුභ කථං කථෙති" පාරා: පා: 67²⁷ සාරා: ම: 29²⁸ සං: පා: 285⁵ **-නිමිත්ත** (නා)= අශුභ නිමිත්ත. උඹුමාතකාදී අශුභ නිමිති. මි: මා: සං: 436³⁴ **-භාවනා** (නා)= අශුභ භාවිතාව පිළිකුල් භාවනාව. කෙසාදින්හි හෝ උඹුමාතකාදින්හි අශුභාකාරය ගෙන කරන භාවනාව. "අසුභ භාවනාය වණ්ණං භාසති" පාරා: පා: 67²⁸ සං: පා: 285²² **-විහාරී** (නා)= අශුභ ධ්‍යානයෙන් වසනුගේ. ධ: අ: ගැ: 35⁸ **-සඤ්ඤා** (නා)= පිළිකුල් සංඥාව. ධ: අ: ගැ: 42⁵ **-සමාපත්ති** (නා)- අසුභ සමාපත්තිය.

"ආදිස්ස ආදිස්ස අසුභ සමාපත්තියා වණ්ණං භාසති" පාරා: පා: 67[24] සං: පා: 28[629]

අසුර (නා) (න+සුර)= අසුරයෝ. අ: ප: සං: 5[19] **-දූත** (නා)= අසුරයන්ට බදු දත් ඇති තැනැත්තා. මුව්හි බැහැර උඩට හෝ යටට නික්මුණු දත් ඇතියහු. පැව්දි නො කළ යුතු පරිස දූසකයෙක් සං: පා: 768[33] වි: වි: 2502 පා: මු: මි: ව්: 235[4] **-භවන** (නා)= අසුර පුරය. යොදුන් දසදහසක් වූ අසුර ලොකය. සං: පා: 736 වි: මි: පි: 47[30]

අසුරුත්ත (නා) (න+සු+උත්ත)= අයහපත් වචන විරුඬ වචන. සං: පා 1012[4] (අනසුරුත්ත බලනු)

අසෙඛ (නා) (න+සෙඛ) (√සික්ඛ+ණ)= (අසෙඛ බලනු) සං: පා: 1022[20] අ: ප: සං: 5[1]

අසෙඛ (නා) (න+සෙඛ)= රහතන් වහන්සේ. අධිශීල අධිචිත්ත අධිප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂා වෙහි හික්මෙන සප්ත ආර්යයෝ සෙඛයෝ (=ශෛක්ෂ) නම් වෙත්. ඒ ශෛක්ෂ ධර්මයන් ඉක්ම අහිත් ඵලයෙහි සිටි ක්ෂීණාශ්‍රවයෝ අසෙඛ නම් වෙත්. සං: පා: 172[19] අ: ප: සං: 5[1] **-මුනි** (නා)= එනම් මුනිවරයා. ත්‍රිවිධ ශික්ෂා වෙහි හික්මවිය යුතු නැති රහතන් වහන්සේ ධ: අ: ගැ: 236[15]

අසෙවනඤ්ඤ (නා) (න+සෙවනඤ්ඤ) (√සිව+ණ; =සෙව+යු+අඤ්; =සෙවන+ක)= 1 වත්කිරීමක් නැති. 2 අසම්මිශ්‍ර. පරිකර්මාදියෙන් මිශ්‍ර වීමක් නැති. 3 සභාවයෙන් මධුර. ආණාපාණ සති සමාධියෙහි එක් තත්ත්වයක්. සෙසු සමාධි භාවනාවන්ගේ මෙන් ශාන්ත භාවයට නිමිත්තවූ පරිකර්මයක් හෝ නිවරණ විගමනයෙන් සෙසු ධ්‍යානයන්හි උපදින ශාන්ත බව හෝ නැති. සභාවයෙන්ම ශාන්තවූ "අසෙවනකොව සුඛෝ විහාරෝ" යනුවෙහි නාසස සෙවනාතීත ශාන්තාප්‍රණීතනාවාවහ වූ කිසි සෙවනයෙක්=වත් කිරීමෙක් මොහට නැත්නුයි අසෙවනඤ්ඤ නම් වි: මා: සං: 647[11] පාරා. දී: 69[23] සං: පා: 2,1[24] අ: ප: සං: 9[325]

අසෙනාසනික (නා) (න+සෙනාසනික) (සෙනාසන+ණික)= සෙනසුන් නැත්තහු. වස් නො විසිය යුතු භික්ෂුවක්. පස්වැදෑරුම් ඡදනයන් ගෙන් දක්ඛරා ඡදනයක් ඇති, ඉඳුදු දොර බැදුම් ඇති, සෙනසුනක් නැති භික්ෂුව වස් නො විසිය යුතුය. හේ **අසෙනාසනිකඞ්ග**. නැවිහි ද, සත්වයෙහි ද, වජයෙහි ද, සෙනසුන් නැත්තනු විසිතුදු වස් විසීමෙහි ඇවැත් නොවේඃයි යෙති ව්: ලං: 273[33]-274[2] කු: සි: සං: 103[14]-106[8]-[18] පා: මු: මි: ව්: 197[27] ම: පා: සං: 452[27]

අසෙස (නා) (න+සෙස) (√සිස+ණ)= ඉතිරි නැති. සියලු "අසෙසකතා, නො ඉතිරි බව" ක: ව්: පි: 81[30] අ: ප: සං: 94[12] **-විරාගනිරෝධ** (නා) (නි+√රුධ්+ණ)= නිරවශෙෂ විරාග නිරොධය. විරාග සඞ්ඛ්‍යාත මාර්ගයෙන් කළ නිරවශෙෂ නිරොධය. සං: පා: 715[10] ම: පා: සං: 4[30]

අසෝක (නා)= 1 එනම් රජ. 2 ශොකයක් නැති 3 එනම් ගස. හෝපලු ගස. අ: ප: සං: 7ං[19] **-පිණ්ඩි** (නා)= අශොක අතු හෝ මල් සමූහය. මේ අතර මල් අවුණන්නහුට දෙසක් නැති. "අසෝක පිණ්ඩියා වා අන්තරෙසු පුප්ඵානි පවෙසෙතුං න දෙසෝ." "අසෝක පිණ්ඩියාති අසෝක සාඛානං පුප්ඵානං වා සමූහෝ; සාරත්ථ දීපනියං පන අසෝක පිණ්ඩියා ති අසෝක පුප්ඵචඞ්ගදෙ මඤ්ජරිකායාති වුත්තං" සං: පා: 446[27] ව්: ලං: 51[23] වි: වි: 475 සි: ව: වි: 68[18] (වි) පා: මු: ව්: ව්: 19[80]

අසම (නා)= ගල, පළිතය. අ: ප: සං: 82[33] **-පුප්ඵ** (නා)= ගල්මල. ගල්සෙවෙල්. අ: ප: සං: 61[3]

අසම්මාන (නා)= එනම් මානය. අහංකාරය. ම: පා: සං: 12[14] සං: පා: 719[11] ධ: අ: ගැ: 25[16]

අසස 1 (ක්‍රි) (√අස+ඊ)= වන්නේය. "සාම ණෙරො අස්සං, හෙරණෙක් වන්නෙමි" පාරා: පා: 23[32]

අසස 2 (නා)= [සං. අස්‍ය > අස්ස] ඔහුට, ඔහුගේ, සත්‍රී: **අස්සා**=ඇයට, ඇයගේ.

අසස 3 (නා)= 1 අශ්වයා. තුරඟා. 2 අශ්වශිල්පය. "අස්සසම්මපි සික්ඛති අශ්වශිල්පයෙහි හික්මෙයි. අසුන් එළවීමෙහි පුරුදු වෙයි" චූ: පා: 257[18] අ: ප: සං: 50[21] **-කණ්ණ** (නා)= 1 එනම් පළිතය, සල්ගස. අ: ප: සං: 77[10] **-කර 1** (නා)= කොටථවා. එක් අඹේ ජාතියක්. සත්‍රී: ලි: **-කරී** (නා)= කොටළුදෙන. "සෙය්‍යථාපි භික්ඛවෙ අස්සකරී අත්තවධාය ගබ්භං ගණ්හාති" චූ: පා: B. 168[9] අ: ප: සං: 3[23] **-කර 2** (නා) =මෙරු පාදයෙහි නානයෝ. අ: ප: සං: 88[20] **-පථ** (නා)

= ඇසැතු (ඇසතු) ගඝ. අ: ප: ස: 75 **-සඤ්චරණ** (නා)= අසුන් පිට අතුරන ඇතිරි. එක් මහ අසුනක්. සි: ව: වි: 66[7] (අකපපිය සයන බලතු) **-හණ්ඩ** (නා = අස්ගොවිවෝ. "හත්ථි හණ්ඩා අස්ස හණ්ඩා දූසෙසුං" ම: පා: ස: 2:8[15] **-මංස** (නා)= අශ්වමාංසය. අසුන්ගේ ඔස්. භික්ෂූන්ට වැළඳීමට තහනම් දශමාංස යෙන් එකක්. කු: සි: ස: 40[18] (අකපපිය මංස බලතු) **-මණ්ඩලික** (නා)= අස්මඩුල්ල. අසුන් වඩන තැන. අසුන් දශදෙනෙකුන් වසන තැන එක අස්මඩුල්ලකි. "යෙහි අස්සමණ්ඩලිකාසු භික්ඛූනං පත්ථපත්ථ පුලකං පඤ්ඤත්තං හොති" පාරා: පා: 6[12] ස: පා: 117[33] සාර: දී: 331[28] **-මාරක** (නා)= කණේරු. එනම් ගස. අ: ප: ස: 79[7] **-මුට්ඨික** (නා)= (අසම මුට්ඨිකා?) එනම් තාපස නිකාය. ඉලක් හෝ යම්කිසි ආයුධයක් රැගෙන ඇවිදිමින් සාහසික වූ විට ඉදිරියට හමුවූ ගසක පොතු තලා කමින් පොහොසගිල් ඉටා බඹ විහරණ වඩන එනම් තවුස් නිකාය. සු: නි: අ: 239[11] **-යමඛ** (නා)= එනම් යානය. පඤ්ච මහා යානයන්ගෙන් එකක්. ප්‍රධාන වශයෙන් අශ්වයකු මරා කරන මහා යාගයක්. අ: ප: ස: 56[26] (විසාර මනෝ රථ පූරණී 507[31]-736[30] පිටු බලන්නේය.) **-යුජ** (නා)= 1 වප් මස, සරත් සෘතුවට අයිති මාසයක්. 2 අස්විද නැකත. අ: ප: ස: 10[22]-12[33] **-සම්මද්ද** (නා)= අශ්වයන් නිසා වන සම්බාධය. හිරිහැර. පාචි: පා, 180[35] ස: පා: 653[37] **-සාලා** (නා)= අස්හල. කුටිකාර සික්ඛාදි සෙස ශික්ෂාපදයෙහි කුටි වසතුව උවදුරු සහිත වන එක් පෙදෙසක්. අස්හල ඇසුරු කළ පෙදෙස. "අස්සසාලා නිසජ්ජං වා හොති" පාරා: පා: 176[30]

අස්සම (නා) [සං. ආශ්‍රම]= අසපුව. පන්සල. තවුස් අරම. තපස්වීන්ගේ වාසස්ථානය. "ආසයස්ස අසමස්ස සමකරණතෝ, විසමානං වා කාය වචීමනෝ කම්මානං සමකරණතෝ, කසිකම්මාදි පරිස්සම රහිතත්තා වා, අස්සිකානං සුඛදුඃඛකත්තා වා අස්සමෝ"ති කියූ අසපුවෙක්" ජා: අ: ගැ: 1[16] ම: පා: ස: 76[9] ධ: අ: ගැ: 107[27] අ: ප: ස: 30[23]-56[8]

අස්සමණ (නා) (න √සමණ)= ශ්‍රමණයෙක් නොවූ. දුශ්ශීල. වි: මා: ස: 138[41] පාරා: පා: 23[32] **-භාව** (නා)= මහණකු නොවන බව. ගිහියකු බව. පාරා පා: 23[9] **-වචන** (නා) "අස්සමණ" ශබ්දය හා සමාන අර්ථ ඇති ශබ්ද. දුස්සීල, පාපධම්ම, අසුචි, සඞ්කස්සර සමාචාර, පටිච්ඡන්න කම්මන්ත, අස්සමණෝ සමණ පටිඤ්ඤා, අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරී පටිඤ්ඤා, අන්තොපූති, කසම්බුජාත, කොණ්ඩ යනාදීන් ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙහි "අස්සමණ" ශබ්දය හා පර්‍යාය ශබ්ද. පාරා: පා: 26[36] ස: පා: 181[16] සාර: දී: 448[28]

අස්සමණී (නා) (න + සමණ + ඊ)= භික්ෂුණියක් නොවූ. මෙහෙණක් නොවූ. පරිජි අවන් මෙහෙණ. "අස්සමණී හොති අසක්‍යධිතා" පාචි: පා: 39[3]

අස්සමණෝති මං ධාරෙහි (ක්‍රි)= අශ්‍රමණයෙක් යයි මා දරව. මා ශ්‍රමණයෙක් නො වේයයි සලකව. ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කරන දෙවිසි සෙත පදයන්ගෙන් එකක්. පාරා: පා: 26[5] ස: පා: 181[15] වි: වි: ටී: 116[12]

අස්සව (නා)= 1 කීකරු. 2 ප්‍රඥා, සැරව. 3 සොවූ. අ: ප: ස: 45[4]

අස්සවණ 1 (නා) (න + සවණ) (√සු + යු=අන; න + ණ) [සං. ශ්‍රවණ]= ශ්‍රවණය නො කිරීම. නො ඇසීම. "අස්සවණතා ධම්මස්ස පරිහානත්ථි" මහා: පා: 20[19] ස: පා: 122[28]

අස්සවණ 2 (නා)= කැප අකැප නො ඇසීම ඇවැතට පැමිණෙන කරුණු පසින් එකක්. එකම වෙහෙර වසන නමුදු විනයධර තෙරුන් වෙත පැමිණ කැප අකැප විමසා නො ඇසීමෙන් හෝ එම තෙරුන් සෙස්සනට කියන කැප අකැප ද නො අසනුයේ. හෝ නො ඇසීමෙන් ඇවැතට පැමිණෙන්නේය. පරි: පා: 257[19] ස: පා: 1022[1] පරි: පා: ගැ: 35[5] වි: වි: ටී: 505[28]

අස්සසති (ක්‍රි) (ආ + √සස + අ + ති)= ආශ්වාස කරයි. (අතී: **අස්සසි** වතී: **අස්සසති** අනා: **අස්සසිස්සති** සමී:—**සෙය්‍ය** පමී:—**සතු** පු: ක්‍රි:—**සිත්වා** වකා:—**සසන්තා**=ආශ්වාස කරමින්) පාරා: පා: 69[36]-70[2]

අස්සාමණක (නා) (න + සාමණක) (සමණ + ණ + ක)= ශ්‍රමණයන්ගේ කාර්‍යයක් නොවූ. මහණුන් විසින් කළ යුතු ක්‍රියාවක් නොවන. අස්සාමණකං අකප්පියං අකරණීයං" පාරා: පා: 18[19] ස: පා: 152[31] චූ: පා: 2[11] සාර: දී: 410[18]

අසාමික (නා) (න + සාමික) (සාමි + ණික)= 1 අස්වාමික. හිමියකු නැති. 2 කරවා දෙන දායකයකු නැති 3 අන් කිසි සාමියකු නැති. "සඤ්ඤත්තිකාය පන භික්ඛුනා කුටිං කාරය මානෙන අසාමිකං අත්තුද්දෙසං පමාණිකා කාරෙතබ්බා." "කරවා දෙන හිමියකු නැති ගෙයින් අස්වාමිකවූ" පාරා: පා: 174[83] සා: පා: 402[7] ප්‍රා: ප: සා: 17[13] කං: ච්: 39[84]

අසාස (නා) (ආ + √සස + ණ) [සං. ආශ්වාස]= ඇතුළට පිවිසෙන වාතය. පිටතට නික්මෙන වාතය අස්සාස සී ද දක්නේය "මවි කුස උපන්සඳ නික්මෙනුවට අවකාශ නො ලද වාතය මව්කුසින් නික්මෙන්ම පිටතට නික් මෙන බැවින් ඵනප ඤති ක්‍රම වශයෙන් විනය අට්ඨකථාවෙහි ඇතුළත්හි නාසාවාතය ගෙණ "ආ ආදෙන ශ්වාසඃ=ආශ්වාසඃ"යි නික්මෙන නාසාවාතය ආශ්වාස නමැයි කිවු. පළමු නාසාවාතය ඇද ඉක්බිති බාහිර කරන බැවින් සූත්‍රාගත අට්ඨකථාවෙහි භාවනා ක්‍රමයෙන් ආදි වෙහි නාසාවාතය ගෙණ "ආ ආදෙන ශ්වාසඃ= ආශ්වාසඃ"යි වදනා නාසාවාතය ආශ්වාස නමැයි කිහු. විනය අට්ඨකථාවෙහි ඵනපත්ති ක්‍රම යෙන් කීවා සිට්ඨකථා ප්‍රවෘත්ති ක්‍රම ම භාවනාවට කැමැති විය යුතු බැවිනුදු "අස්සාසාදි මජ්ඣ පරියොසානං සතියා අනුගවජ්ජනෝ අජ්ඣත්තං විකෙපගතෙන චිත්තෙන" යන පෙළ ඇති බැවිනුදු සූත්‍ර අට්ඨකථාවෙහි කී නියාම මැනැවි යනු සත්‍යයි." පාරා: පා: 69[36] සා: පා: 294[85] ච්: ච්: ටී: 177[10] ච්: මා: සං:656[12]-858[34]

අසාවව (නා)= අශීඝ්‍ර හගන්දර ප්‍රමේහාදීන්ගේ වශයෙන් නිතර වැගිරෙන අපිරිසුදු දේ. ලේ සැරව. පාච්: පා: 192[19] සා: පා: 657[15] මහා: පා: 332

අසාසක (නා) [සං. ආශාසක? ආශ්වාසක?] ප්‍රාණීනා. බලාපොරොත්තු "පුත්තබ්බ මේ හත්ථත්ත කුමාරස්ස සතෝ පඤ්ච අස්සාසකා අහෙසුං" ම: පා: සූ: 122[4] සා: පා: 727[5]

අසු 1 (නි)= පදපූරණාර්ථයෙහි යුජ්පාතයක්. අ: ප: සූ, 154[18]

අසු 2 (නා) [සං. අශ්‍රු]= කඳුලු. ච්: මා: සූ: 6 5[16] -පගණ්හණකම්මට්ඨාන (නා) (අසු + ඊ)= කඳුලු වැගිරෙන අයුරු ඇතයහු. පැවිදි නො කළ යුතු පුද්ගලයෙක්. සා: පා: 768[10] ච්: ච්: 2498 පා: මු: ච්: ච්: 234[16] -මුඛ (නා) =කඳුලු මුසු මුහුණු ඇති. හඬන තැනැත්තා. ඛ: අ: ගැ: 57[25]

අසුත (නා) (න + සුත) (√සු + ත)= නො අසන ලද. කොට ඇසූ. සා: පා: 428[22] (අසුත බලන් නේය) -පුබ්බ (නා) [සං පූර්ව]= නො ඇසූ විරූ. මින් පෙර නො අසනලද, "ඉමා අනච්ඡරියා ගාථාඉයෝ පටිහංසු පුබ්බෙ අසුත පුබ්බා." ම: පා: සූ: 16[18]

අසුතවා (නා) = නො අසන ලද තැනැත්තා. සූත්‍ර ගෙය්‍යාදි ධර්මය තුනත් පුදහුදා. ඇසූ පිරූ තැන් නැත්තා. මනෝ: පූ: 382[8]

අසුසාසි (ක්‍රි)= ශ්‍රවණය කෙළේය. ඇසීය. "අසෙසාසි බො භගවා ථිදු ත්‍රාහං සද්දං" පාරා: පා: 6[19]

අහං (නා)= මම. "අහම්පාපසමන්තා කිඤ්චි නවක්‍රාමි කල්‍යාණං වා පාපකං වෝ" ප්‍රා: පූ: ස 24[39] -කාර (නා)- අහංකාරය. මමය යන හැඟිම. ගර්ව. අභිමානය. අ: ප: සූ: 25[3]

අහත (නා) (න + හත)= 1 අලුත්. පරිභොග නොකළ. නො මැඩුණු. 2 අලුත් වස්ත්‍රය. කසිනය අතුළහැකි සතළොස් සමාපත්තියෙන් එකක්. "අහතෙන අප්පතං හොති කසිනං" මහා: පා: 289[7] සා: පා: 824[22] -කප්ප (නා) [සං. කල්ප]= 1 අලුත් වැනි. පරිභොග නොකළා වැනි. 2 එක් වරක් දෙවරක් සේදූ වස්ත්‍රය. කසිනාරම්භය කළ හැකි සතළොස් සමාපත්තීන් එකක්. "අහතකප්පෙන අත්ථතං හොති කසිනං" මහා: පා: 289[2] සා: පා: 824[22]-836[28] -වත්ථ (න)= අලුත් වස්ත්‍ර. නවපිළි. "අහතවත්ථ, හා පිළි" ජා: අ: ගැ: 338

අහත්ථපාස (නා) (න + හත්ථපාස) [සං. පාණිව > පා: පත්‍ථස > පාස?]= අත්පස නොවූ. අත්පසින් බැහැර වූ. දෙපියන් විෂ්කම්භයෙන් බැහැර වූ. සා: පා: 610[31]

අහස්පාසෙසනත (නා)= අත්පසෙහි නො සිටියකු විසින් කැප කරන ලද. කැප කරන්නට පැමිණියහුගේ අත්පසින් පිටත සිටියකු කැප කරවන ලද අනතිරිත්ත භෝජනයෙහි එක් ලක්ෂණයක්. පාචි: පා: 100[35] සා: පා: 610[31] කං: ච්: 108[18] කං: මූ: පි: 82[3] (අනතිරිත්ත බලන්නේය,)

අහරිත (නා) ('න+හරිත)= නො නිල්. තණ නැති. එබඳු බිම. වි: වි: 1950

අහස (නා)= 1 එනම් සඞ්ඛ්‍යාව. එක්සත් ගණනක්. 2 බෙදයෙහි වැටෙනු නිපාතයක්. අ: ප: ස: 65[10]

අහාපෙති (ක්‍රි) (න+හාපෙති)= නො පිරිහෙලයි "අහා පෙනෙනත. නො පිරි හෙලන් නහු විසින්" පරි: පා: ගැ: 218[29]

අහි (නා)=සර්පයා, නාගයා. පාරාජික පාළි විනීය පාරාජික ශික්ෂාපදයෙහි සඳහන් පරිදි අහි ගුණ්ඩිකාදීන් විසින් ගත් සර්පයා. සාර: දී: 462[3] අ: ප: ස: 88[33] චූ: පා: 264[6] පාරා: පා 51[19] ස: ප්‍රා: 262[8] -කුණප (නා) [සං. කුණප]= 1 සර්ප කුණපයක්. සර්පයකුගේ මළසිරුරක්. 2 ඉතා පිළිකුල් පාරා: පා: 69[2] ස ප්‍රා: 288[21] ප: සූ: 74[22] -ගුණ්ඩිකා (නා) [සං. අහිගුණ්ඩිකා]= අහි ගුණ්ඩිකායා. සර්පයන් නටවන්නා. නසින් අල්ලන්නා. අ: ප: ස: 89[5] ස: පා: 262[8] -ජාතක (නා) (ජාත+ක)= විස හතු. නයි හතු. "අහි වජාතක මකුළං, විස ගතු කැකුළු"—"සප්පානි අහිවජාතක මකුළං ඉපකෙන පංසුං ගහෙත්වා ඵගහවජ්ඣති" වි: මා: ස: 561[4] -නාග (නා)= සර්ප රාජයා "අහිනාගෝ පාවෙකාව පජ්ජලි" ම: පා: ස: 8[13] -මේඛලික (නා) (මේඛලා+ණික)= සප්වැල පළඳනාව. සර්පයන් නෙත් සැදුණු මෙවුල්දමකින් යුතු. 'අථ බෝ දෙවදත්තෝ—පෙ—අහිමේඛලිකාය අජාත සත්තුස්ස කුමාරස්ස උවජ්ඣෙඝ පාතුරහොසි" චූ: පා: 309[23] චූ: පා: B. 154[8] ඛ: අ: ගැ: 53[3] -රාජකුල (නා)= සර්පරාජ කුලය. 1 විරූපාක්ෂ 2 එරාපථ 3 ඡබ්‍යාපුත්‍රක 4 කණ්හා ගොතමක යන සර්පරාජකුල සතර චූ: පා: B. 640[5] වි: වි: වී: 457[9] -වාතක (නා)= එනම් රෝගය. විෂ වාතය හැම්බෙමින් හටගන්නා මාරණාන්තික රෝගයක්. "අහිවාතක රෝගය නම් සර්පයන්ගේ විෂ ධූමය හෝ විෂ මල් ආදිය හෝ සපශී කළ වාතයෙන් හටගන්නා තොකොත් සර්ප විෂ වැනි රෝගයකි. මීට මාරි රෝග සී ද නම් වේ. මේ රෝගය යම් ගෙදරක ඇතිවී නම් එහි වසන මැස්සන් පවන් ගවයන් දක්වා පළමු තිරිසන්හුද, ඉක්බිති දැසිදස් ආදී මිනිස්හු ද අවසන්හි ගෙහිමියෝ ද යන සියල්ලෝම මරුමුවට පත් වන්නාහ"—"එතෙ යම් ගෙය කට වන එතෙන් දෙර බාඳ බිත් පළා නික්මෙන් මේ දිවි ලැබෙයි යෙත්. අහිවාතක රෝග නම් විෂ වාත හමුළු සද වන රෝවෙක් යෙත් මෙ" ඛ: අ: නැ: 62[12] ම: පා: ස: 282[6] ස: පා: 749[10] ජා: අ: ගැ: 127[16] -විජ්ජා (නා)= සර්ප විද්‍යාව. සර්පයන් දමට කළ විට එයට බෙහෙත් කිරීම සහ සර්පයන් ගෙන්වන විද්‍යාව. විෂ වෙද කම. එක් තිරශ්චීන විද්‍යාවක්. සූ: වි: 67[24]

අහිංසා (නා) (න+හිංසා) (√හිංස+අ+ආ)= හිංසා නො කිරීම. නො පෙළීම ධ: අ: ගැ: 239[33].

අහිත (නා)= හිත නොවූ. දියුණුවක් නැති. පිරිහීම. "අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං" ප: සූ: 25[22]

අහිරික (නා) (න+හිරික) (හිරි+ක) [සං. අහ්‍රික]- ලජ්ජා නැති. "යා තා. ඉත්ථියෝ ජිණ්ණකා ඛුත්තිකා අහිරිකායෝ" 2 එනම් කෙලෙස ධර්මය පාරා: ධ: 143[25] ස: පා: 390[2] වි: මා: ස: 1150[7] (පු: ලි: අහිරිකෝ සන්: ලි: අහිරිකා න: පු: අහිරිකං)

අහිනිඝ්‍රය (නා) (අහීන+ඉන්ද්‍රිය)= නො පිරිහුණු ඉඳුරන් ඇති. වි: මා: ස: 964[1]

අහු ක්‍රි (අ+√හු+ඊ=ඵ)= වූයේය. "අහු විපපටි සාරෝ" පාරා: පා: 65[7] ස: පා: 289[7]

අහුදෙව (නි) (අහු+එව) [සං. අභූදෙව] වූයේමය. "අහුදෙව කුසකුවවං" පාරා: පා: 68[7] ස: පා: 289[3]

අහෙතු (නා) (න+හෙතු)= හෙතුවක් නැති, කාරණයක් නිමිත්තක් නැති. -ක= හෙතු රහිත. කරුණු රහිත. මනෝ: පූ: 401[13] -දිට්ඨි (නා)= එනම් දෘෂ්ටිය. එක් මිථ්‍යා දෘෂ්ටියක්. සත්ත්වයන්ගේ සිත කෙලෙසීමට හෝ පිරිසුදු වීමට හෙතුවක් නැත, කර්මයෙහි විපාක නැත, සනාදීන් පවත්නා දෘෂ්ටිය. ස: සා: 107[17] -පටිසන්ධික (නා) (පටි+සං+√ධා+ඉ) [සං. ප්‍රතිසන්ධි]= අලොභ, අදෝස, අමෝහ යන තුන්හෙතුවෙන් කොර ප්‍රතිසන්ධිය. අපාය ප්‍රතිසන්ධිය සහ මනුෂ්‍ය ජාත්‍යන්ධාදීන්ගේ ප්‍රතිසන්ධිය. හීනයන්ගේ සහ වත්තු විපන්නයන්ගේ ප්‍රතිසන්ධිය. මාඝී ප්‍රතිලාභය පිණිස නුසුදුසු පණ්ඩකාදීන්ගේ ප්‍රතිසන්ධිය. මොවුන්ගේ පැවිද්ද වළක්වන ලදී. "වත්තු විපන්නතාදිනා පබ්බජ්ජූප සම්පදඤ අනරහභාව සංඛාතෙහි පණ්ඩක තිරච්ඡානගත උභතෝ ඛඤ්ජකා හි තයෝ වත්තු විපන්නා අහෙතු පටිසන්ධිකා. තෙසං සඞ්ඝෝ අවාරිතෝ. මග්ගෝ පන වාරිතෝ අභබ්බා හි තෙ මග්ගපටිලාභාය. වත්තු විපන්නතා පබ්බජ්ජාපි තෙසං පටික්ඛිත්තා" වි: ම: 91[24] කු: සි: ස: 9[24] වි: වි: වී: 210[24] ස: පා: 36[3] වි: ලං: 163[4] -යොනි (නා)= තිරිසන්

යොනියය. ඛ: අ: ගැ: 212⁷ (අහෙතු පච්චයික බලන්නේය.) **-වාද** (නා)= එනම් දෘෂ්ටික වාදය. සත්ත්වයන්ගේ විශුද්ධිය ආදියට හෙතුවක් නැත යන වාදය. ප: සූ: 94⁸

අහෝ 1 (නි) විසමයෙහි වැටෙන නිපාතයක්. අ: ප: ස: 154⁸

අහෝ 2 (නා)= දවස. දිනය. "අහොරත්තානුසික්ඛිතා" ප: සූ: 221³⁰(1) **-රත්ත** (න) [සං. අහොරාත්ර]= අහෝ රාත්‍රය. රූ දුවල් ප: සූ: 221³⁰.

අහෝසි (ක්‍රි)= වූ භූයය. "බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං අහොසි" පාරා: පා: 8³⁶ **-කම්ම** (නා)= එනම් කර්මය. විපාක නොදෙන බවට පැමිණි කර්මය. මනෝ: පූ: 395³

අළකඤ (නා)= 1 හෙළ වරා. 2 පිස්සු බල්ලා. අ: ප: ස: 79²⁴

අළාර (නා)= වක්වූ දෙය අ: ප: ස: 68⁷.

ඌනපූරණය

අතිමහන්තං කබළං (නා) [සං. කවල]= ඉතා මහත්වූ බත් පිඬුව. මොනර බිජුවට වඩා පමණින් වැඩි වූ බත් පිඬුව. භික්ෂුවක විසින් නො වැළඳිය යුතු බත් පිඬුවක පමණ. මොනර බිජුවට වැඩි බත් පිඬුව **අතිමහන්ත කබළ** නම්. කුකුළු බිජුවට කුඩා වූයේ **අති ඛුද්දක කබළ** නම්. මෙයින් මධ්‍යම ප්‍රමාණ වූ ආලෝපය ගෙණ වළඳත් වරී. "පිඬු මහත් කොට වටා වළඳන් දුකුළා වේ. කුකුළු බිජුවට කුඩා නො කොට මොනර බිජුවට මහත් නො කොට වැටියැ යුතු. මොනර බිජුවට මහත් වුව වරජී. කුකුළු බිජුවට කුඩා වුව වරජ නැති"—"මූල ඛාදනියාදි හෙදෙ පන සබ්බ බජ්ජකෙ එලා එලෙ ව අනාපත්ති" සි: ව: වි: 84²⁶ කං: වි: 153¹ කං: ව: පි: 1-85 ප්‍රා: පු: ස: 67²⁴

අනුඝරක (නා)= ගෙයක් පාසා. "ගච්ඡථ තුම්හෙ තාතා බ්‍රහ්මණඝරං ආදාය නාළියා වාපකෙන අනුඝරකං ආහිණඤ්ඨ" මහා: පා: 284⁸ (අනු ඝර ඝනුද දක්නේය)

අනුපාදින්නක (නා) (න + උපාදින්නක) (උප + ආ + √දා + ත=ඉන්න + ක)= තෘෂ්ණා දෘෂ්ටින් යුක්ත කර්මය විසින් නො ගන්නා ලද හෝ නුපන් රූප. වාක්ඵලතාදිය. ප්‍රථම පාරාජික ශික්ෂාපද විනිශ්චයයෙහි දක්නා පරිදි **නිමිත්ත** ප්‍රතිවේධනය කළ වස්තුාදිය. "තත්ථ උපාදින්නකෙන වා අනුපාදින්නකං ඝට්ටියතු, අනුපාදින්නකෙන වා උපාදින්නකං, අනුපාදින්නකෙන වා අනුපාදින්නකං උපාදින්නකෙන වා උපාදින්නකං සබ්බෙ ඝ න්තෙ පඨමෙ පාරාජිකං හොතීති වුත්තං" ස: පා: 191²³ වි: වි: 4 වි: වි: ස: 2,19 සාර: දී: 479⁸³ (උපාදින්නක බලන්නේය)

අනුමතිකප්ප (නා)= විශාලා නුවර වජ්ජීපුත්‍රක භික්ෂූන් ඉපදවූ දශ වස්තුවෙන් එකක්. එක් සීමාවක් තුළ වසන භික්ෂූන්ගේ ඡන්දය නො නෙණ පොහෝ පවුරුණු කොට පසුව ඡන්දය ගැණීම කැපය, එය චිරීකර්මයක් නොවේය යන මතය. "අනාගතානං ආනන්ත කාලෙ අනුමතිං ගහෙස්සාමීති නෙසු අනාගතෙසු යෙව වා ගහන සඞ්ඛ්‍යා කම්මං කත්වා පච්ඡා අනුමතිං ගහෙතුං නපපති; වග්ගකම්මං න හොතීති අධිප්පායෝ" සාර: දී: 93³⁵ චු: පා: 444¹¹

අපඤ්ඤාපෙති (ක්‍රි)= ඉවත් කරත්. අහකට අදිත්. "උදකෙන නෙමෙත්වා නෙමෙත්වා අපඤ්ඤාපෙති" මහා: පා: 236³⁴—237¹⁻⁵

අපච්චක්ඛාය පූ: ක්‍රි) (න + පච්චක්ඛාය)] (පති + ආ + √ඛා + ත්වා=ය)= ප්‍රතික්ෂේප නො කොට. ප්‍රත්‍යාඛ්‍යාන නො කොට. "සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා සික්ඛාසමාදානං අපරිච්චජිත්වා දුබ්බල භාවඤ්ච අප්පකාසෙත්වා" ස: පා: 175⁵ ප්‍රා: පු: ස: 8¹⁷ (සික්ඛං පච්චක්ඛාන බලන්නේය)

අඵල (නා)= මහා ඵල, ලොකු නෙඩි ජාති. ["ඵල නම් කරඹ ආදි ක්ෂුද්‍ර ඵලයි. අඵල නම් පනස ලබුජ ආදි මහා ඵලයි" කං: වි: පි: 128⁹

අලංසාටක (නා)= එක් බමුණෙක්. 'බොහොම කොට කා මහත්ව ගිය බඩ ඇති හෙයින් නැඟි සිට පිළි හැඳ නොහී "අලං සාටක"යි කියන "අලංසාටක නම් බමුණුද" වි: මා: ස: 85¹⁰

අවංසිර (නා)= යටට ලු සිස ඇති. ගෙල පහළට දමා. "අපායයෙහි වැටෙනවුන් විනිපතනය වන අයුරු. "එතෙ පනන්ත නිරයෙ—උඞ්ඩපාදා අවංසිරා" ස: පා: 13 ²⁷ අනි: ධ: කොං: 26⁶ (අවිනිපාත ධම්ම බලන්නේය)

ව්‍යාකරණ විභාග දැක්වූ වචනානුක්‍රමණිකාව

List of Grammatical Analysis

(මෙහි පළමුවන අඩංගුයෙන් පිටුව ද, අනතුරුව ඡේදය සහ පෙළ ද, දැක්වේ.)

අංස 1-1[1]
අංසකූට 1-1[6]
අංස බද්ධක 1-1[10]
අංස භණ්ඩික 1-1[14]
අංස වට්ටක 1-1[26]
අකට 1-1[30]
අකටාඤ්ඤ ධම්ම 1-1[34]
අකත 2-1[37]
අකතඤ්ඤූ 2-1[8]
අකත වෙදී 3-1[17]
අකත්ත 3-1[42]
අකප්පිය 3-2[18]
අකම්ම 7-1[6]
අකම්මනීය 7-1[10]
අකරණ 7-1[28]
අකරණීය 7-1[30]
අකලලක 7-2[8]
අකසිර 7-2[15]
අකසිරලාභී 7-2[17]
අකාමක 7-2[30]
අකාරක 8-1[7]
අකාරණ 8-1[11]
අකාලඤ්ඤූ 8-2[4]
අකාලික 8-2[24]
අකිච්ඡ 8-2[28]
අකිඤ්චි 8-2[33]
අකිරිය 8-2[35]
අකිරියවාදී 8-2[22]
අකුසකුසල 9-2[1]
අකුපප්‍ප 9-2[14]
අකොප්‍ය 10-1[4]
අකොසල්ල 10-2[7]
අක්ක 10-2[10]
අක්කන්ත 10-2[23]
අක්කෙකාච්ඡි 10-2[36]
අක්කෙකාඝ 10-2[42]
අක්ඛ 11-2[4]
අක්ඛණ වෙධී 11-2[14]
අක්ඛත 11-2[21]
අක්ඛ දස්ස 11-2[24]
අක්ඛ ධුත්ත 11-2[31]
අක්ඛන්ති 11-2[38]
අක්ඛම 12-1[4]
අක්ඛය 12-1[7]
අක්ඛයිත 12-1[8]
අක්ඛර 12-1[15]
අක්ඛරික 12-1[29]
අක්ඛසිස 12-1[36]
අක්ඛාත 12-1[40]
අක්ඛාන 12-2[1]
අක්ඛි 12-2[6]
අක්ඛුද්දි 12-2[31]
අගණනූපග 13-1[33]
අගති 13-1[29]
අගමන 13-2[6]
අගරු 13-2[17]
අගාමක 13-2[26]
අගාර 13-2[41]
අගාරක 13-2[43]
අගාරව 14-1[8]
අගාරික 14-2[1]
අගාරිය 14-2[14]
අගාළහ 14-2[36]
අගිලාන 14-2[39]
අගහඩ්ඩ 15-2[40]
අඟල 16-2[12]
අඟි 17-1[30]
අඟනක 18-1[43]
අඟසිය 18-2[32]
අඩක 19-1[11]
අඩකුර 19-1[13]
අඩකුස 19-1[15]
අඩඛ 19-1[19]
අඩඛජාන 19-2[4]
අඩහාර 20-1[13]
අඩගුටඨ 20-1[36]
අඩගුතතර 20-2[1]
අඩගුල 20-2[13]
අඩගුලි 20-2[16]
අඩගුලෙය්‍යක 21-1[9]
අවකඛුස්ස 21-1[11]
අවණ්ණිකත 21-1[15]
අවාලෙති 21-1[20]
අවාවෙතුකාම 21-1[29]
අවිත්තක 21-1[34]
අවිත්තීකත 21-2[36]
අවිර 21-2[40]
අවීචරක 22-1[18]
අවොදක 22-1[36]
අවොපත 22-2[1]
අවචනමා 22-2[3]
අවඩ්ඪා 22-2[9]
අවවජ 22-2[10]
අවවය 22-2[13]
අවවාඩාය 23-2[16]
අවවායත 23-2[18]
අවවාසික 23-2[22]
අවවාරද්ධ 23-2[30]
අවවාවදති 23-2[35]
අවවාවදථ 23-2[41]
අවවාසත්ත 24-1[1]
අවවි 24-1[4]
අවවුගහත 24-1[10]
අවවුණහ 24-1[15]
අවවුසත්ත 24-1[19]
අවෙවාදත 24-2[7]
අවඡ 24-2[12]
අවඡති 24-2[16]
අවඡඩ්ඩික 24-2[21]
අවඡත්ත 24-2[28]
අවඡරා 24-2[37]
අවඡරිය 24-2[39]
අවජ්ජාදති 25-1[1]
අවජ්ජාදත 25-1[9]
අවජ්ජාදෙති 25-1[11]
අවඡී 25-1[22]
අවඡිජ්ජ 25-1[24]

අවජිඤති 25–21
අවජිඤන 25–212
අවජිඤන 25–226
අවජිසසනති 26–113
අවජුපති 26–118
අවජුපති 26–124
අවජුපති 26–133
අවෙජද 26–140
අජඩෙසති 26–9
අජ 26–211
අජනර 27–18
අජඤඤ 27–110
අජදධුක 27–114
අජාන 27–230
අජාතසතතු 28–128
අජානං 28–138
අජිකා 28–226
අජිගුවජනිය 28–231
අජින 29–11
අජිර 29–214
අජ්ජ 29–214
අජ්ජතගග 29–237
අජ්ජව 29–240
අඤඤ 30–11
අඤඤක 32–240
අඤඤතත 30–122
අඤඤතාසි 30–135
අඤඤයන 32–23
අඤඤාචරති 30–139
අඤඤාචාර 30–241–88317
අඤඤායක 32–26
අඤඤිවඨ 32–218
අඤජලි 33–113
අඤජස 33–128
අඤජිත 33–130
අඤඤ 33–134
අඤඤතර 33–238
අඤඤතතත 37–29
අඤඤතා 37–212
අඤඤ 37–239
අඤඤභාගිය 38–111
අඤඤු 40–11
අඤඤුණ 40–15
අඤඤුණතා 40–110
අඤඤුතක 40 124
අඤඤුතබබ 40–143
අඤඤුතා 40–23
අඤඤුතික 40–26
අටන 41–117
අටලි 41–122
අටවි 41–126
අටට 41–28
අවක 41–214
අවසසර 41–238
අවාල 41–243
අවාලක 42–11
අටඨපන 52–135
අටඨාන 59–27
අටඨාන 59–212
අටඨි 65–136
අටඨික 65–143
අටඨිමය 66–123
අඩඪ 66–211
අණ 68–220
අණිමා 68–229
අතකකාවචර 69–21
අතවජ 69–22
අතිකකමති 70–136
අතිවව 71–15
අතිපාතෙති 71–24
අතිබාළහ 71–220
අතිමඤඤිසසති 71–228
අතිරිතත 41–23—72–131
අතිරෙක 72–137
අතලින 75–231
අතිවතතති 75–241
අතිසය 76–119
අතිහරති 76–24
අතීත 76–217
අතෙකිවජ 77–211
අතත 77–216
අතුජ 81–126
අතුවජා 81–130
අතථ 81–137
අතරති 83–113
අතචාර 84–136
අති 86–23
අථ 86 225
අථුලලවජජ 87–11
අදඩඪ 87–18
අදදමපපිය 87–117
අදඤඤන 87–133
අදුපෙවා 87–220
අදින්න 88–16
අදුටඨුලල 88–110
අදුතිය 89–17
අදුතය 89–110
අධ 90–15
අධඩ 90–116
අධති 90–25
අධඩා 91–18
අධඩින 93–19
අධඩුව 93–112
අධොඡඤ 93–116
අධකකක 93–133
අධමම 93–29
අධමමික 95–110
අධමමිය 96–117
අධාරිත 97–123
අධිකරණ 97–129
අධිකාර 100–210
අධිතිවව 100–215
අධිකුවවන 100–218
අධිගත 100–227
අධිගම 100–234
අධිවෙන 101–128
අධිවඨා 101–215
අධිවඨාන 101–225
අධිපපාය 104–126
අධිපෙපත 104–136
අධිමතත 104–141
අධිමුචචි 105–19
අධිවපප 105–127
අධිවාස 105–130
අනගාරික 106–16
අනගාරිය 106–112
අනඤඤපකතික 106–137
අනඛණ 106–21
අනවෙචක චීවර 106–26
අනවජරිය 106–29
අනවඤඤට්ඨ 106–219
අනඤඤය 107–127
අනට්ඨ 107–130
අනණ 107–21
අනතිකකම 107–26

අනතිරිත්ත 107–29
අනතිසාර 108–137
අනධිට්ඨිත 108–283
අනනුවජ්ජිය 108–241
අනනුසූයක 109–18
අනනුබෝධ 109–124
අනනුමෝදක 109–126
අනනුලෝම 109–132
අනනුසාස 109–138
අනනුසසුත 109–142
අනන්තරිත 110–130
අනපදූන 110–135
අනපලෝක 110–140
අනපලෝකෙත්ති 110–21
අනපායික 110–28
අනබ්භිත 110–211
අනභාවකත 110–225
අනභිජ්ඣා 110–237
අනභිරත 111–13
අනභිරති 111–18
අනභිරද්ධ 111–111
අනමතග්ග 111–118
අනමතග්ගිය 112–143
අනඝ 112–21
අනරිය 112–28
අනවජ්ජ 112–226
අනවඤ්ඤ 113–11
අනවඤ්ඤත 113–113
අනසුරුත්ත 113–118
අනාකප්ප 113–128
අනාගාමී 113–225
අනාඝාත 113–229
අනාචාර 113–235
අනාවිඤ්ඡ 114–1
අණානත්තික 114–16
අනාදරිය 114–116
අනාදූ 114–139
අනාදිකර 114–141
අනාදිය 114–28
අනානාකථික 114–230
අනානුවජ්ජ 114–237
අනාපත්ති 114–240
චතුහත්ථපපමාණන්ති" – "**ආචරිය ධනුනා**, නවඞියත් ඇඳිර දුන්නෙන්" ක: වි: පි: 58[19] වි: වි: ටී: 145[17] වින: ම: 188[13] වි: ම: ටී: 82[29] සා: පෑ: 216[20] වි: මා: සා: 177[20] සාර: දී: 496[22] (අජ්ජ ධනු බලනු) -**පරම්පරා** (නා) [සං. පරම්පරා] = ආචාර්‍ය පරම්පරාව, ඇදුරු පරපුර. ථෙර තරඞ්ගය. විනයපිටකය පිළිබඳ ආචාර්‍ය විනිශ්චය පරම්පරාව, උපාලි දාසක, සොණක, සිඟාල, මොග්ගලිපුත්ත තිස්ස යන මහ රහතන් වහන්සේගෙන් දඹදිව ද, මිහිඳු මහ රහතන් වහන්සේගෙන් ලක්දිව ද, පැතුරුණු ආචාර්‍ය පරම්පරාව. ආචාර්‍ය පරම්පරාව දැන්ම විනය ධරයාගේ එක් ලක්ෂණයකි. "තීණි හි විනය ධරස්ස ලක්ඛණානි ඉච්ඡිතබ්බානි, කතමානි තීණි? සුත්තඤ්චස්ස සවාගතං හොති -පෙ- **ආචරිය පරම්පරා** බෝ පනස්ස සුග්ගහිතා හොති සුමනසිකතා සූපධාරිතානි ඉදං තතියං' ස: පෑ: 185–32 1653–29 1667 පරි: පෑ: 179[29] ක: වි: පි: 13[10] වින: ම: 238[20] වි: වි: ටී: 106[8] සාර: දී: 432[35] ක: වි: 15[30] -**පාචරිය** නො [සං. ප්‍රාචාර්‍ය] = ආචාර්‍ය ප්‍රාචාර්‍ය ආචාර්‍ය නම් ගුරුවරයාගේ. ප්‍රාචාර්‍ය නම් ගුරුවරයාගේ ගුරුවරයාගේ. "ආචරියස්ස ආචරියෝ. පාචරියෝ" යනු විග්‍රහයි. "කින්නු තෙ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං **ආචරිය පාචරියානං** භාසමානානං" දී: නි: 73[9] සු: වි: 177[35] අඞ්ගු: නි: 97[23] -**භාගිය** (නා) [සං. භාගීය] = ආචාර්‍යවරයාගේ භාගීය. ඇදුරු බිරිඳ. දී: නි: 45[28] (3) සු: වි: 619[2] අඞ්ගු: නි: 32[14] -**භාග** (නා) (√භජ + ණ; ජ = ග) = ආචාර්‍ය භාගය. ඇදුරු බෑලූ. ශිල්ප උගැන්වූ ගුරුවරයාට දෙන පුද පඬුරු. "ආචරිය භාගෝ, ඇදුරු බෑලූ" ජා: අ: ගැ: 37[27] සා: පෑ: 337[10] වි: වි: ටී: 198[35] වි: ලං: 41[2–6] -**මාගම** (නා:) = ආචාර්‍ය මාගීය. ආචාර්‍යයන්ගේ කථාමාගීය, වි: මා: සා: 230[20] වි: ම: ටී: 99[24] -**මත්ත** (නා) [සං. මාත්‍ර] = ආචාර්‍ය සමාන වූ. ගුරුවරයකු වැනි. එක් වසකුදු නැති භික්ෂුවට සවසක් වූ භික්ෂුව ආචාර්‍යමාත්‍රය හෙවත් ගුරුවරයකු වැනිවේ. එසේ වනුයේ සවසක් වූ භික්ෂුවට දසවස් වනවිට වසකුදු නැති භික්ෂුවට සිව්වසකි. එහිදී සිව්වස් භික්ෂුව දසවස් භික්ෂුව ඇසුරුකොට වසන්නේය. එබැවින් ගුරුවරයකු වැනි වේ. මෙසේම එක්වස් භික්ෂුවට සත්වස් වූ භික්ෂුව ද, දෙවස් භික්ෂුවට අටවස් භික්ෂුව ද, ආචාර්‍ය මාත්‍රය. නවවස් භික්ෂුව තෙවස් භික්ෂුවටද, දසවස් භික්ෂුව සිව්වස් භික්ෂුවට ද, ආචාර්‍ය මාත්‍රය "අවසිකස්ස ජබ්බසෙසා **ආචරිය මත්තා**" සා: පෑ: 807[2] මහා: පෑ: 221[19] ම: පෑ: සා: 613[29] -**මතික** (නා) මත + ඉක) = ආචාර්‍ය මතයෙහි ම පිහිටි. ගුරුමතය නො ඉක්මවන. ආචාර්‍ය මතය ම ප්‍රකාශ කරන. "ආචරියමතියං නිස්සායෙතා **ආචරිය මතිකොසි** ගන්තෙ. ආචරිය මතිං කායති කථෙතීති ආචරිය මතිකෝ" සි ගත ආචාර්‍ය මතයම කියන්නෙ යන අර්ථ වේ" වි: මා: සා: 236[34] -**මුඛ** (නා) [සං. මුඛ] = ආචාර්‍ය මුඛය ගුරුමුව. ගුරුවරයකු හමුව. "**ආචරිය මුඛතෝ** අනුග්ගහීතත්තා එවං ආචරියා වදන්තීති සඤ්ඤාතුං නාසක්කි" වි: මා: සා: 230[21] -**මුට්ඨි** (නා) [සං මුෂ්ටි] = ගුරුමිට, ගුරුවරයන් ශිෂ්‍යයනට නොකියන කොටස. "නත්ථානන්ද තථාගතස්ස ධම්මෙසු **ආචරිය මුට්ඨි**" "**ආචරිය මුට්ඨිං** ආචාර්‍යයන් නොකියා තබන යන අර්ථයි" ජා: අ: ගැ: 141[14] සු: වි: 379[26] දී: නි: 62[4] -**ලක්ඛණ** (නා) [සං. ලක්ෂණ] = ආචාර්‍ය ලක්ෂණ. ගුරුවරයකු වෙත පිහිටිය යුතු සුදුසුකම්. නිසදීමට සුදුසු ගුරුවරයකුගේ (නිස්සයාචරිය) ලක්ෂණ. මහාවගපාළි මහාඛන්ධකයෙහි "පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං න නිස්සයෝ දාතබ්බෝ න සාමණෙරෝ උපට්ඨාපෙතබ්බෝ න අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතෝ හොති" යනු පටන් "උපසම්පාදෙතබ්බ පඤ්චක සොළසවාර නිට්ඨිතං" යනු අවසන් කොට මේ අතර කරුණු පස පස ඇතුළත් ඡේදක සොළසකි ඒ සියල්ල පිඩු කිරීමෙන් කරුණු අසූවක් වේ. ඉන් කරුණු සතළිසකින් අසම්පූර්ණ භික්ෂුව හෙරණකු උපසපන් කරගැනීමට ද, වෙත නවත්වා ගැනීමට ද, නිසදීමට ද, සුදුසු නොවේ. ඉතිරි කරුණු සතළිසෙන් යුක්තවූයේ හෙරණකු උපසපන් කර ගැනීමාදියට සුදුසු වන්නේය. "ඉදානි යං පුබ්බෙ අනුජානාම් භික්ඛවෙ ව්‍යත්තෙන -පෙ- නිස්සයං දාතුන්ති සඞ්ඛ්‍ය පතෝ උපජ්ඣාවරියානං ලක්ඛණං වුත්තං" සා: පෑ: 738[32] ම: පෑ: සා: 243[2] වි: ලං: 199[8] (විස්තර ම: පෑ: සා: 243 පිටුව බලා දත් නේය.) -**ලෙස** (නා) (√ලිස + ණ) [සං.

ලෙශ] = ආචාර්‍ය ලෙශය. ගුරුවරයා හා එක්තරා කොටසකින් සමාන බව. දුටුයා දෙස සඞ්‍ඝාදිසෙස ශික්‍ෂාපද පඤ්ඤත්තියෙහි දශලෙශයන්ගෙන් එකක්. යම් කිසි ගුරුවරයකු (ආචාර්‍යවරයකු) ගේ අතැවැසි භික්‍ෂුවක් පරිජී ඇවැත් අවන්නහු දැක ඒ නම් ඇති අනෙක් ආචාර්‍යවරයකුගේ අතැවැසි භික්‍ෂුවකට පරිජී ඇවැතින් වොදනා කිරීම. එසේ කරන භික්‍ෂුවට වචනයක් පාසා සඟ වෙසෙස් ඇවැත් වේ. පාරා: පා: 201[27] 203[1] විත: ම: 111[35] (දසලෙස බලනු) **-වත්ත** 1 (නා) [සං වෘත්ත?] = ඇදුරුවත්. ගුරුවරයන් විසින් අතැවැසියනට කළයුතු වත්. චුල්ලවගඟපාළි වත්තක්ඛන්ධකයෙහි සහ මහාවගඟපාළි මහාක්ඛන්ධකයෙහි "ආචරියෙන භික්ඛවෙ අන්තෙවාසිකො සඞ්ගහෙතබ්බෙ, අනුග්ගහෙතබ්බො උද්දෙසෙන පරිපුච්ඡාය ඔවාදෙන අනුසාසනියා" යනු පටන් "වුඩ්ඨා නමස්ස ආගමෙතබ්බං" යනු අවසන් කොට එක්සිය දෙතිසක් වූ වත්. චු: පා: 387[15] මිහා: පා: 62[6] ධ: අ: ගැ: 39[25] සී: ලං: 290[7] **-වත්ත** 2 (නා) = ඇදුරුවත්. අතැවැසියන් විසින් ගුරුවරයනට කළයුතු වත්. චුල්ල වගඟපාළි වත්තක්ඛන්ධකයෙහි සඳහන් "කාලස්සෙව උට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දන්තකට්ඨං දාතබ්බං" යනු පටන් "වුඩ්ඨානමස්ස ආගමෙතබ්බං" යනු අවසන් කොට ඇති අතැවැසියන් විසින් ගුරුවරයනට කළයුතු එක්සිය දෙපණසක් වත්. චු: පා: 392[29] 367[4] සි: ව: වි: 83[19] 84[38] සී: මා: ස: 240[11] මහා: පා: 42[29] ධ: අ: ගැ: 39[25] **-කථා** (නා) ආචාර්‍ය වරයන් කෙරෙහි කළයුතු වතාවත් පිළිබඳ විස්තර කථාව. සී: ලං: 290[5] **-වාද** 1 (නා) (√වාද + ණ) [සං. වාද] = ආචාර්‍ය වාදය. ප්‍රඥප්ති විනයෙහි සිව් වැදෑරුම් භෙද යෙන් හෝ සිව්වැදෑරුම් විනයෙන් හෝ එකක්. අට්ඨකථාව, අටුවාව. ධම්-විනය දෙක පිළිබඳව බුදුරදුන් වදාළ විස්තර දෙශනාව "අට්ඨකථාපාළි" යි ධම් සඞ්ග්‍රාහක මහ රහතන් වහන්සේ විසින් සම්මත කරන ලද්දීය. "ආචරියවාද" යනුෂු එය මැයි. "**ආචරිය වාදෙ** නාම ධම්මසඞ්ගාහකෙහි පඤ්චහි අරහන්ත සතෙහි ඨපිතා පාළි විනිම්මුත්තා ඔක්කන්තික විනිච්ඡයපවත්තා අට්ඨකථා තන්ති" සං: පා: 161[26] 162[6] 163[9] වි: ලං: 97[34] සාර: දී: 430[1] සී: සී: ටී: 103[30] සු: සී: 395[13] **-වාද** 2 (නා) = ආචාර්‍යවාදය. ඒ ඒ ආචාර්‍යවරයන්ගේ මතාන්තර. තම ආචාර්‍යවරයන්ගේ හෝ මත සා: පා: 856[11-18] **-වාද** 3 (නා) = ආචාර්‍යවාදය. සථවිරවාදයෙන් අන්‍යවූ භික්‍ෂුනිකාය. මහාසංඝිකාදි අටළොස් භික්‍ෂුනිකායයෝ. "සබ්බෙ අඨාරස **ආචරිය වාදා** දුනියෙ දිස්සරතෙ උප්පන්නා" සාර: දී: 97[27] කථා: අ: 80[8] (අඨාරස ආචරියවාද බලනු) **-වෙවචන** (නා) = ආචාර්‍යවරයාට යෙදෙන පදීය නාම. ගුරුවරයා යනුවට යෙදෙන සමාන අර්‍ථ ඇති ශබ්ද. "යො මං පබ්බාජෙසි, යො මං අනුසාවෙසි, යාහං නිස්සාය වසාමි, යාහං උද්දිසාපෙමි, යාහං පරිපුච්ඡාමි, යො මං උද්දිසති, යො මං පරිපුච්ඡාපෙති, යන පදීය ශබ්ද. ආචරිය වෙවචනයෙන් **ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යානය** පිණිස යොදන ශබ්ද. "එවං **ආචරිය වෙවචනෙන** සික්ඛා පච්චක්ඛාතා හොති" සං: ප: 180[11] පාරා: පා: 26[28] (ආචරියං පච්චක්ඛාමි බලනු.) **-වංස** (නා) = ආචාර්‍ය වංශය. ආචාර්‍ය වාදය. අට්ඨකථා. ධම් සංඛ්‍යාහක මහරහතන් වහන්සේ විසින් ආචාර්‍ය වංශයෙන් ගෙනා අට්ඨකථා "ධම්මසඞ්ගාහකාදි ආචරියවංසෙන ආභතා අට්ඨකථා **ආචරිය වංසොති** ආහ" සී: සී: ටී: 102[28] සා: පා: 161[29] **-සන්තික** (නි) ආචාර්‍ය සමීපය, ගුරුහමුව සී: මා: ස: 248[17] **-සම** (නා) = ආචාර්‍යවරයා හා සම, ගුරුවරයකු වැනියහු කමටහන් දීමට සුදුස්සෙක්. සී: මා: ස: 292[9-34] **සුද්ධි** (නා) = ආචාර්‍ය ශුද්ධිය. ගුරුපරපුරින් ආ පිරිසුදු දැනීම. "අත්තනො මතිං පහාය **ආචරිය සුද්ධියා** වත්තා හොති" ස: පා: 165[33].

ආචරියක 1 (නා) = (ආචරිය + කම්ම) ආචාර්‍ය කර්‍මය, සිය ගුරුන් කළ වැඩ. "අහං ඛො පන සුසික්ඛිතො අනවයො සකෙ **ආචරියකෙ** කුම්භකාර කම්මෙ පරියොදාත සිප්පෙපා" පාරා: පා: 41[28] සාරා: ම: 21[22] ස: පා: 206[27] (ආචරිය කම්ම බලනු.)

ආචරියක 2 (නා) (ආචරිය + ක) = ආචාර්‍ය භාවය, ආචාර්‍යවාදය. තම ගුරු මතය. "සන්ති භගවා එකෙ සමණ බ්‍රහ්මණා මනොප දොසිකං **ආචරියකං** අගාහඞ්ඛුං පඤ්ඤපෙන්ති" දී: නි: 20[15] (3) සු: සී: 601[24].

ආචරියං පච්චක්ඛාමි (ක්‍රි) = ආචාර්‍යවරයා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ගුරුවරයා අත්හරිමි. ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙහි යෙදෙන දෙවිසි ක්ෂෙත්‍ර පදයන්ගෙන් එකක්. සං: පෘ: 180⁸ ක: වි: 191⁹.

ආචාම (නා) (ආ + √වම + ණ) [සං. ආවාම] = 1 කැළඳ, බහින් පෙරූ කැළඳ. "**ආචාම** යනු බහිනි (හි?) කැළඳට නම්. 2 දඹුබත්. දංකුඩ. අ: ප: සා: 64⁵ ජා: අ: ගැ: 149¹⁶ මනෝ: පූ: 447²⁶ සු: වි: 231¹⁶ **-කුණ්ඩක** (නා) = කැළඳ හා කුඩු, "**ආචාමකුණ්ඩකං** අපි, "බහිනි වූ කැළඳ හා කුඩුත් ලබන බව යහපතැසි" ජා: අ: ගැ: 149¹⁶ ධ: අ: ගැ: 230³⁴ **-භක්ඛ** (නා) = දඹුබත් බුදින. ආචාම නම් බත් සැළියෙහි ලැගුණු දඹුබත් (දන්කුඩ) ය. එය බුදින්නේ **ආචාම භක්ඛ** නම්. සු: වි: 232¹⁶ මනෝ: පූ: 447²⁶ අඞ්ගු: නි: 320¹².

ආචාර 1 (නා) (ආ + √චර + ණ) [සං. ආචාර] = හැසිරීම, යහපත් පැවැත්ම. චාරිත්‍රය. "**ආචාර** නම් චාරිත්‍රයයි" **ක**: වි: පි: 2⁵.

ආචාර 2 (නා) = මිථ්‍යා ජීවිකාවෙන් වැළැක්ම. කුලයන් සගන්නා පිණිස හුණපත් දීම් ආදී මිථ්‍යා ජීවිකායෙන් වැළැකීම. කායික වාචසික අව්‍යතික්‍රමණය. සිලසංවරය. සං: පෘ: 577¹ වි: ම: සා: 51¹ (ආචාරගොචර බලනු.) **-අජීයා** (නා) [සං. ආජී] = ආචාර ආජීයෝ. පස් වැදෑරුම් ආර්‍යයන්ගෙන් කොටසක්. 1 ආචාර 2 ලිඛිත 3 සිල 4 දසසන 5 පටිවෙධ යනුවෙන් ආර්‍යයෝ පස්වැදෑරුම් වෙති. **එහි "ආචාර ආජීයෝ නම් යහපත්වූ** ආචාර ඇත්තාහුයි" ජා: අ: ගැ: 121²⁶ **-කුලපුත්ත** (නා) ආචාර කුලපුත්‍රයෝ. ආචාර සම්පන්නයෝ. පහත් කුලයක උපන් නමුදු සැදැහැතියෝ. "යත්තත් කුලප්‍රසූතද වුව ආචාර සම්පන්නයො ආචාර කුලපුත්‍ර නම් වෙත්." ධ: ප්‍ර: 273²⁵ වි: මං: සා: 49¹⁸ වි: ලං: 157¹² **-ගොචර** (නා) = ආචාරය හා ගොචරය. මේහි ගොචර නම් භික්ෂූන් විසින් යා යුතු, හැසිරිය යුතු, සැදැහැති කුලයයි. වෙශ්‍යාදි අගොචරස්ථාන හැර ශ්‍රද්ධා සම්පන්න කුල සෙවනයයි. මිථ්‍යා ජීවිකායෙන් වැළැක්ම සහ හුණපත් ආදිය නොදීම **නම්** වූ ආචාරය හා සැදැහැති කුල සෙවනය නම් වූ ගොචරය. සං: පෘ: 577¹ වි: මං: සා: 53¹ වි: ම: ටී: 35⁴ ධ: අ: ගැ: 130¹⁸ **-ංසම්පන්න** (නා) = ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූ. සං: ප: 577¹ මනෝ: පූ: 319¹⁹ වි: ම: ටී. 35⁴ (ආචාර ගෝචර බලනු.) **-දිට්ඨි** (නා) (√දිස + ති?) [සං. දෘෂ්ටි] = ආචාරය හා දෘෂ්ටිය. ආචාර විපත්තිය හා දිට්ඨි විපත්තිය. පරි: පෘ: 214¹ සා: පෘ: 1008³⁷ 1009¹ ක: වි: 157¹ **-පණ්ණත්තිවිනය** (නා) = ආචාර විනය සහ ප්‍රඥප්ති විනය. "**ආචාර විනය** නම් ආචාර යෙහි හසළ බවයි ආචාර සමාචාර විසින් රක්නා චාරිත්‍ර ශීලයයි. **පණ්ණත්ති විනය** නම් වදුළ විනය නො ඉක්මවන බවයි. ශික්ෂා පදයෙහි කියූ නියෙන් රක්නා චාරිත්‍ර ශීලයයි." ජා: අ: ගැ: 222²⁸ **-විනය** (නා) = ආචාරයෙහි හසළ බව. ආචාර සමාචාර විසින් රක්නා චාරිත්‍ර ශීලය. ජා: අ: ගැ: 222²⁹ **-විපත්ති** (නා) වි + √පද + ති) [සං. විපත්ති] = ආචාර විපත්තිය. පාරාජික. සඞ්ඝාදිසෙසාපත්ති දෙක හැර ඉනිරි පඤ්චාපත්ති සඤ්ඤය. "එත්ථ පඨමා දෙව ආපත්තික්ඛන්ධා සීල විපත්ති නාම. අවසෙසා පඤ්ච **ආචාර විපත්ති** නාම" "ආචාර විපත්ති නම් පඤ්ච ලහුකාපත්තියි." සං: පෘ: 959³² පරි: පෘ: 265¹ විනි: ම: 60²⁴ 144⁴ ක: වි: 57¹⁷ ක: වි: පි: 19¹⁸ මහා: පෘ: 204³¹ 205¹ ක: වි: 57¹² – **ංචොදනා** (නා) (√චුද + ය + අන + ආ) = ආචාර විපත්තියෙන් චොදනා කිරීම. සිව්වැදෑරුම් චොදනාවන්ගෙන් එකක්. පාරාජික සඞ්ඝාදිසෙස දෙක හැර ඉනිරි පඤ්චා, පත්තිසඤ්ඤයන්ගෙන් චොදනා කිරීම. **සං**: ප: 423² ක: වි: 157¹ **-ංචොදනා පුච්ඡා** (නා) = ආචාර විපත්ති චොදනාව විචාරීම. සිව්වැදෑරුම් විපත්තීන්ගෙන් එකක්. පරි: පෘ: 228¹² (විපත්ති පුච්ඡා බලනු.) **-විපන්න** (නා) (වි + √පද + ය = අන) = ආචාරයෙහි විපන්නවූ. "**ආචාර විපන්න** නම්; අනියතය, පවිනිය, පටිදෙසනීය, සෙඛියය, අධිකරණ සමථය යන පඤ්ච ආපත්තිසඤ්ඤයන් අතුරෙන් යම්කිසි ඇවැතකට පැමිණ නැගී නො සිටි මහණ වෙයි. නැගී සිටි කල ආචාර විපන්න නො වේ." ම: පෘ: සා: 239²⁷ ස පෘ: 739¹⁵

95^{931} පරි: පා: 184^{422} වි: ලං: 198^{827} මහා: පා: $8^{.15} - 91^{3-6}$ **-සණ්ඨාන** (නා) = ආචාර සණ්ඨානය, හැසිරෙන පිළිවෙළ සැ: පා: 795^{17} **-සීල** (න) = ආචාරශීලය. පැසැවූ ශීලය. චාරිත්‍ර ශීලය. පැරැණියන් විසින් පවත්වාගෙන ආ සිරිත් විරිත්. **ආචාරසීල** නම් පසැඳසීලය මැයි.” “චාරිත්‍ර සීල නම් ආචාර සීලයයි” – “ඒ ඒ කුලයන්ගෙ ඒ ඒ දෙශවාසීන්ගෙ එ එ පාෂණ්ඩයන්ගෙ එ එ කුලාදියෙහි පුළු පුරුෂයන් විසින් එ එ වරද නොකිරීමෙහි හිම් කොට තබන ලද චාරිත්‍රය **ආචාර ශීල** නම්. බ්‍රාහමණාදීන්ගෙ අමද්‍යපානාදි කුල ධර්මය, සමහර ජනපද යෙක අහිංසනාදි දෙශ ධර්මය තීර්ථිකයන්ගෙ යම නියමාදි පාෂණ්ඩ ධර්මයි.” වි: මා: සැ: 46^{33} ජා: අ: ගැ: 88^{15} 192^{8} 222^{32} වි: මා: සැ: P. 13^{18} (ඌ: ග්‍ර:) (පරවාහැර සංසකාරණය)

ආචික්ඛණ 1 (නා) (ආ + $\sqrt{}$විකඛ + ණ) = දැන්වීම, කීම. ආරොචනය කිරීම. විත: ම: 98^{10} (ආචික්ඛනා යි ද දක්නේය පාරා: පා: 73^{26}.)

ආචික්ඛණ 2 (නා) = තනිය සඞ්ඝාදිසෙස ශික්ෂාපදයෙහි දක්නා පරිදි දෙමග උදෙසා කීම.” **ආචික්ඛණ** නම්, “කථං දදමානා සාමිකස්ස පියා හොති” යි පුළුවුන් මාගමට “එවං දෙහි එවං දෙන්නී සාමිකස්ස පියා භවිස්සසි” යනාදීන් කීම්.” කැ: වි: පි: 27^{8} විත' ම: 98^{10}.

ආචික්ඛති (ක්‍රි) = 1 කියයි, දන්වයි. ආරොචනය කරයි. 2 තනිය සඞ්ඝාදිසෙස ශික්ෂාපද පදභාජනියෙහි සඳහන් පරිදි දෙමග උදෙසා කියයි. (අති: **ආචික්ඛි** වර්ත: **ආචික්ඛති** අනා: **ආචික්ඛිස්සති** සම්: **ආචික්ඛෙය්‍ය** පරි: **ආචික්ඛතු** පූර්: ක්‍රි: **ආචික්ඛිච්චා** තුං: **ආචික්ඛිතුං** වර්: කෘ: **ආචික්ඛයොනා** සත්‍රී: ලි: **ආචික්ඛමානි** කර්: කෘ: **ආචික්ඛිතබ්බා**: සත්‍රී: ලි: **-තබ්බා** නප: ලි: **-තබ්බං** = කියයුතු, දැන්විය යුතු.) **ආචික්ඛති** නාම පුථෝ හණහි එවං දෙහි, එවං දෙන්නී සාමිකස්ස පියා භවිස්සසි මනාපාවානි” පාරා: පෙ: 145^{1} විත: ම: 98^{10} 275^{24} සැ: පා: 771^{1-13} චූ: පා: 275^{7}.

ආචිණ්ණ (නා) (ආ + $\sqrt{}$චි + ත = ඉණණ) [සං. ආචීර්ණ] = 1 පුරුදු කළ, එබඳු සිරිත්. 2 ප්‍රකෘතිය, සවභාවය. ජා: අ: ගැ: 45^{33} 122^{26} 138^{15} 218^{11} පරි: පා: 217^{1} ධ: අ: ග: 231^{14} 146. **-කප්ප** 1 (නා) = ආචිණ්ණ කල්පය, විශාලා මහනුවර වජ්ජි භික්ෂූන් ඉපදවූ දශවස්තු වෙන් එකක්. ආචාර්‍ය උපාධ්‍යායයන් පුරුදු කළ දේ එසේම කිරීම කැපය යන මතය. “කො සො ආවුසො **ආචිණ්ණ කප්පොනි? කප්පති** භනෙන ඉදමෙම උපජ්ඣායෙන අජ්ඣාචිණ්ණං ඉදමෙම ආචරියෙන අජ්ඣාචිණ්ණන්නි තං අජ්ඣාචරිතුං” චූ: පා: 444^{13} සැ: පා: 194 **-කප්ප** 2 (නා) = පුරුදු සිරිත්. පුරුදු කළ පැරැණි සිරිත්. “තෙ පොරාණකෙන **ආචිණ්ණකප්පෙන** නිකබ්බ පසසිත්වා උපධාවන්ති නිකබ්බ අපසා දෙන්ති” මහා: පා: 87^{17} ම: පා: සැ: 282^{3-35} සි: ව: වි: 79^{2} **-පරිචිණ්ණ** (නා) = පුරුදු කළ, නිතර පුරුදු කළ. එබඳු සිරිත්. ජා: අ: ගැ: 138^{15} **-සමාචිණ්ණ** (නා) (සං + ආ + $\sqrt{}$චි + ත = ඉණණ) = පුරුදු කළ, මොනවට පුරුදු කළ. එබඳු සිරිත්. “අරුණුගහමනතො පඨාය යාව මජ්ඣන්හි කො අයං බුඩානං අරියානං **ආචිණ්ණ සමාචිණ්ණා** හොජනසස කාලො නාම” විත: ම: 225^{28}.

ආචිණ්ණං තථාගතෙන (නා) = තථාගතයන් වහන්සේ විසින් පුරුදු කළ, එබඳු සිරිත්. සූත්‍රානුත ක්‍රමයෙන් නම් දින පතා පල සම වන් සම වැදීම, මහ කුළුණු සම්වන් සම වැදීම, බුදු ඇසින් ලොව බැලීම. යම්නිසි කරුණක් නිසා දහම් දෙසීම ද, විනය ක්‍රම යෙන් නිමන්ත්‍රණය ලැබ වස් වැසීම, අප ලොකනය කොට සැරි සැරීම, පවාරණය කොට සැරි සැරීම, ආගන්තුකයන් සමග පළමුව පිළිසඳර කථාවෙහි යෙදීම ද, තථා ගතයන් විසින් පුරුදුකළ කරුණුය. චූ: පා: 336^{11} 337^{13} සැ: පා: 943^{17} පරි: පා: 224^{7} (අඞ්ගාරස හෙදකර වත්තු බලනු.)

ආචෙරක (නා) ආචරිය + ණික) = ආචාර්‍යවාදය. ආචාර්‍ය මතය. “**ආචෙරකම්පි ච** සකෙ විසාරදෙ” මහා: පා: 415^{34} සැ: පා: 856^{10}.

ආජඤ්ඤ (නා) [සං. ආජන්‍ය] = 1 ශ්‍රෙෂ්ඨ 2 එනම් අඹයා, තමා පිටහුන්නහුගේ අදහස් දන්නා අඹයා. ධ: අ: ගා: 120^{3} (ආජානීය බලනු.) **-රථ** (නා) = ආජානීය

අශ්වයන් යෙදූ රථය. "යථාහි ආජඤ්ඤයුත්තෙනා රථො **ආජඤ්ඤරථොති** වුච්චති, එවම්ඛාපි පණ්ඩිත සංසට්ඨානි භොජනානි පණ්ඩිත භොජනානි" ක: වි: 112[8] ක: වි: පි: 86[20].

ආජානාති (ක්‍රි) (ආ + √ඤ + නා + ති, √ඤ = ජා) = දනියි දැනගනියි. (අතී: **ආජානි** වතී: **ආජානාති** අනා: **ආජානිස්සති** සම්: **ආජානෙය්‍ය** පමී: **ආජානාතු** පූ: ක්‍රි: **ආජානිත්ථා** = **ජානිත්ථා** = **ඤත්ථා**, තුං, **ආජානිතුං** වක්‍රා: **ආජානමානෙනා** කම් කෘ: **ආජානි තබ්බො** – **තබ්බා** = **තබ්බං** = දත යුතු. ජා: අ: ගැ: 79[25].

ආජානීය (නා) [සං. ආජානීය] = 1 එනම් අශ්වයා. ජානිසම්පන්න අශ්වයා. 2 කාරණා කාරණ දන්නා, කටයුතු නොකටයුතු දත් තැනැත්තා. "අස්දම්සැරිහු යම් කාරක් කොළෝ දඒ වහාම ජන්න බැවින් **ආජානීය** නම් වෙත්" ධ: අ: ගැ: 74[34] අ: ප: ස: 50[25] **-සිඛව** (නා) = සිඛව රට උපන් ආජානීය අශ්වයෝ ධ: අ: ගැ: 74[31].

ආජිඤ්ඤාසභයි (නා) එළු ගිනෙල්, එළු කිරෙන් නිපන් ගිනෙල්. ක: වි: 112[34].

ආජීව (නා) = ආජීවය, ජීවිකාව. දිවිපෙවෙත ප්‍රත්‍යය සෙවීමට කරන උත්සාහය. වි: මා: ස: 81[11] 106[18] 107[23] 110[24] 111[14] ධ: ප්‍ර: 186[24] චූ: පා: B 194[8] ධ: අ: ගැ: 12[32] **-අට්ඨමඤ්ඤිල** (නා) ආජීවාෂ්ටමක ශීලය. ආජීවය අට වැනි කොට ඇති ශීලය. ආදිබ්‍රහ්මචරියක ශීලය. 'සුපරිසුද්ධ ත්‍රිවිධ කායකර්මය හා චතුර්විධ වාක් කර්මය හා පරිශුද්ධ ආජීවය යන මේ ආජීවාෂ්ටමක ශීලය" – "මග්ගබ්‍රහ්මචරියස්ස ආදිභාව භූතත්තා ආදිබ්‍රහ්මචරියකං, **ආජීවට්ඨමඤ්ඤිලසෙඨං** අධිවචනං" වි: මා: ස: 37[15–20] වි: මූ: ටී: 28[10] ආදිබ්‍රහ්මචරියක බලනු.) **-කාරණ** (නා) (√කර + ය්‍යු = අන; න = ණ) = ආජීවය හෙතුකොට. වි: ම: ස: 60[20] වින: ම: 144[7] (ආජීවහෙතු බලනු.) **-පාරිසුද්ධි** (නා) = ආජීව පාරිශුද්ධිය, පිරිසුදු දිවි පැවැත්ම. ආජීවපාරිසුද්ධි සීලය. වි: මා: ස: 26[32] 104[37] **-ඤිල** (නා) = ආජීවපාරිශුද්ධි ශීලය. ආජීවය (දිවිපැවැත්ම) හෙතුවෙන් පණවන ලද පාරාජිකාදි ශික්ෂාපද සය නො ඉක්මීම සහ කුහනා ලපනාදි වශයෙන් පැවැති මිත්‍යා ජීවයෙන් වෙන්වීම. වි: මා: ස: 48[31] 66[17] වින: ම: 144[7] ස: පා: 95[934] වි: ම: ටී: 44[8] (අජ්ඣාජීව බලනු) **-භණ්ඩක** (නා) = ජීවත් වීමට සුදුසු වස්තු. ජීවිතය පැවැත්වීමේ උපකරණ. ජා: අ: ගැ: 80[22] **-විපත්ති** (නා) = ආජීව විපත්තිය, වැරදි ජීවිකාව. මිත්‍යා ආජීවය. සිව්වැදෑරුම් විපත්තින්ගෙන් එකක්. ආජීවය හේතුවෙන් පැණ වූ ශික්ෂා පද සය "ආජීව හෙතුපඤ්ඤත්තානි ඡසික්ඛා පදානි **ආජීවවිපත්තිනාමං**" වින: ම: 60[26] ස: පා: 42[34] 95[934] ක: වි: පි: 9[20] **ක:** වි: 21[31] පරි: පා: 198[7] 220[24] අංගු: නි: 165[29] **-ංවොදනා** (නා) = ආජීව විපත්තියෙන් වොදනා කිරීම. සිව් වැදෑරුම් වොදනාවන් ගෙන් එකක්. ආජීව හෙතුවෙන් පැණ වූ ශික්ෂාපද ඡවිකයෙන් වොදනා කිරීම. ස: පා: 422[29] 423[4] 100[94] **-ංප්පච්චය** (නා) = ආජීව විපත්තිය විවාරීම. සිව්වැදෑරුම් විපත්තින් ගෙන් කවර විපත්තියක් දැයි විවාරීම. පරි: පා: 228[12] (විපත්ති පුච්ඡා බලනු.) **-සම්පද** (නා) [සං. සම්පත්ති] = ආජීව සම්පත්තිය, යහපත් දිවි පැවැත්ම. අංගු: නි: 165[39] **-හෙතු** (නා) = ආජීවය නිසා, ආජීවය හෙතු වෙන්. දිවි පැවැත්ම නිසා. "**ආජීව හෙතු**, ජීවිකා හෙතුවෙන්, මෙසේ කල ප්‍රත්‍යයෙන් අකලාන්නාව ජීවත් වෙමියි යන අභිප්‍රායෙ නැයි සෙ. ආජීව කාරණ යනු එයට ම පර්‍යායයි" වි: මා: ස: 66[19] ක: වි: පි: 45[29] ජා: අ: ගැ: 231[11].

ආජීවක (නා) [සං. ආජීවික] = නගන වූ එක් තාපස නිකායක්. උඩුකය නිසිල්ලෙහි පමණක් එක් වස්ත්‍රයක් දරණ යටිකය නිසිවක් නො දරන නිර්‍ග්‍රන්ථ පරිවාසයට සුදුසු පිරිසක්. දෙවැදෑරුම් නගනපරිව්‍රාජක යන්ගෙන් හෝ එක් කොටසක්. අකිරියවාදී තාපස නිකායක්. "**ආජීවකො** භවිස්සතීති කාසායානි අනාදාය නගෙනා ව ආජීවකානං උපස්සයං ගච්ඡති" ස: පා: 181[10] 762[21] මා: පා: ස: 258[14] වි: වි: ටී: 372[16] 387[27] වි: ලං: 165[7] මනෝ: පූ: 649[18] (ආජීවිකයි ද දක්නේය. ධ: අ: ගැ: 100[14]) **-භය** (නා) = මිථ්‍යාජීවය නිසා

මරණ කාලයෙහි උපදනා භය "මිච්ඡාජීව නිමිත්තං මරණකාලෙ උපජ්ජන භයං **ආජීවක භයං**" අභි: ධ: ප්‍ර: 208[12] (ආජීවිකා භය යනුත් පාඨයි.) **-සාවක** (නා) [සං. ශ්‍රාවක] = ආජීවික ශ්‍රාවකයෝ, ආජීවිකයෝ. "**ආජීවක සාවකෙහි** සද්ධිං උය්‍යානං අගමංසු" ස: පා: 181[13] පරා: පා: 153[16] වු: පා: B. 706[12] අංගු: නි: 133[11] **-සෙය්‍යා** (නා) ($\sqrt{සි}$ + ණ්‍ය) [සං. ශය්‍යා] = ආජීවික සයනය, ආජීවිකයන් මෙන් නිශ්ශත්‍රව නිදීම. පාචි: පා: 248[16].

ආජීවික (නා)]සං. ආජීවික] = එනම් නිකාය. නගන වූ එක් තාපස කොටසක් ධ: අ: ගැ: 100[14] මි: ප්‍ර: ටී: 372[12] (ආජීවක බලනු) **-භය** (නා) = ආජීවය නිසා උපන් භය. අභි: ධ: ප්‍ර: 208[12] (ආජීවක භය බලනු.)

ආට (නා) = එක්තරා පක්ෂි විශෙෂයක්. හැන්දක් වැනි තොට ඇති පක්ෂි විශෙෂයක්. අ: ප: ස. 86[26] (**ආටානි** දිබ්බමුඛ සකුණා? වි: ලං: 43[24] දක්නේ නමුදු අනි ධානපපදීපිකාවෙහි දක්නේ" "දබ්බිමුඛ ද්‍රව්‍ය" අ: ප: ස: 86[26] යනුයි.)

ආටානාටිය (නා) = එනම් සූත්‍රය. දීඝනිකායේ පාටික වගීයට අයත් සූත්‍රයක්. "**ආටානාටියනති** ආටානාට නගරෙ බද්ධත්තා එවං නාමං" – "ආටානි දිබ්බමුඛ සකුණා, තෙ ආටා නදන්ති එත්ථාති ආටානාටා, දෙවතගරං, දාටානාටෙ කතං **ආටානාටිය** සුත්තන්ං" වි: ලං: 43[34] සු: වි: 701[37].

ආඩපින (නා) = කැන්පත් කළ. ණය ගන්න වුන් විසින් පෙරළා ණය දෙන තුරු ණය හිමියා වෙත තබන ලද්ද. ස: පා: 261[10] වි: වි: ටි: 163[14] සාර: දී: 517[29].

ආඩ්ඪ (නා) = ආඪකය, ලාස්ස. ලහසුව. අ: ප: ස: 66[19].

ආණත්තනි (නා) [සං. ආඥප්ත] = අණ කළ, නියම කළ. "න භික්ඛවෙ ථෙරෙන **ආණත්තෙනන** අගිලානෙන න සම්මජ්ජිතබ්බං" විනි: ම: 32[3] 72[8].

ආණත්ති 1 (නා) (ආණා + ති) [සං. ආඥප්ති) = අණ කිරීම. නිස්සය පනාමනය බිඳෙන කරුණු වලින් එකක්. "අණකිරීම නම් නිස්සය **පණාමනයයි**. "**ආණත්තිඅඤව** පඤ්චමී" මහා: පා: 69[30] ස: පා: 736[35] ම: පා: ස: 233[26] නිස්සය පණාමන බලනු.)

ආණත්ති 2 (නා) ඇණවීම ප්‍රාණාතිපාතයෙහි ලැබෙන සවැදෑරුම් ප්‍රයෝගයන්ගෙන් එකක්. අසුවලා මරවයි අණ කිරීම. "**ආණත්ති** යොනි අසුකං නාම මාරෙහීති අඤ්ඤං ආණාපෙන්තස්ස ආනාපනං" ක: වි: 29[29_38] කු: සි: ස: 7[26].

ආණත්ති 4 (නා) = ආඥව, අණ නියමය. අදත්තාදාන පාරාජිකාවෙහි සහ මනුෂ්‍ය විග්‍රහ පාරාජිකාවෙහි එක් අඞ්ගයක්. කු: සි: ස: 7[4-28], විනි: ම: 72[7] 84[14].

ආණත්ති 4 (නා) = ශික්ෂාපදයන්ගේ සාධාරණ විනිශ්චයෙහි දතයුතු සපත දශා කාරයෙන් එකක්. "එත්ථ **ආණත්තිති** ආණාපනං වුච්චති" ක: වි: 21[29] නි: ශි: 296 **-ක්ඛණ** (නා) [සං. ක්ෂණ] = ඇණ වූ ක්ෂණය. නියම කළ මොහොත "ආණාපකස්ස **ආණත්තික්ඛණෙ** ආපත්ති" විනි: ම: 13[28] **-නියාමන** (නා) = ඇණවීම සිදු කරන, ඇණවීම් ප්‍රයොගය ඝිඬකරන. මනුෂ්‍යවිග්‍රහ පාරාජිකාවෙහි ප්‍රාණාතිපාතය පිළිබඳ ඡවි ප්‍රයෙ:ගයෙහි **ආණත්තිය** සිදුකරන 1 වත්ථු 2 කාල 3 ඔකාස 4 ආවුධ 5 ඉරියාපථ 6 කිරියා විසෙස යන කරුණු සය. මෙහි 1 **වත්ථු** නම් මැරිය යුතු පුද්ගලයායි. 2 **කාල** නම් පෙරවරු ආදී කාලයයි. 3 **ඔකාස** යනු ගම, වනය, ගෙයක් හෝ දෙර ආදියයි. 4 **ආවුධ** යනු කඩු අඩයට් ආදියයි. 5. **ඉරියාපථ** නම් මැරිය යුතු පුද්ගලයාගේ යැම් හිදීම් ආදියයි. 6 **කිරියාවිසෙස** නම් විදීම් සිදීම් බිඳීම් කැඩීම් ආදියයි. මේ වත්ථු ආදිය ඇණ වූ පරිදිම අණ ලැබූවහු විසින් කරන ලද නම් එසේ අණ කළහුට ඇවැත් වේ. එසේ නොව වැරැද වී නම් කළහු ඇවැතින් මිදේ කි: වි: 30[2] විනෘ: මෘ: 83[25] ස: පා: 319[14] සි: ව: වි: 23[20] **-පයොග** (නා) ආණත්තික පපයොග බලනු.)

ආණත්තික 1 (නා) (ආණා + නි + ක) = ඇණ වීම කරන්නා. අණවන එබඳු වචනය. ක: වි: පි: 3[24] වි: වි: 245.

ආණත්තික 2 (නා) = ඇණවීම් කරන්නා, අදින්නාදාන පාරාජිකාවෙහි සාහත්‍යික පඤ්චකයෙහි එක් අඞ්ගයක්. අසුවලාගේ

බඩු සොරකම් කරවයි. ඇණවීම. "**ආණත්තිකා** නාම අසුකසඝාතඛණ්ඩං අවහරාති අඤ්ඤං ආණාපෙති" ක: වි: 26^{24} විත: ම: 82^{30} වි: වි. 41 -**පයොග** 1 (නා) = ආණත්තික ප්‍රයොගය, ඇණවීම. විත: ම: 83^{25} -**පයොග** 2 (නා) = ආණත්තික ප්‍රයොගය. ආදිත්‍යානුත්ත පාරාජික ශික්ෂා පදයෙහිදී ඇණ වූ කෙණෙහි ම මෙරමා අයත් බඩු ගැන්මෙහි යෙදීම. "තං ඛණං එව ගහණේ නියුජ්ජනං **ආණත්තිකපයොගෝ**" විත: ම: 72^{18} සි: ව: වි: 20^{7} -**මනුස්සඝාත** (නා) = ඇණවීමෙන් කරන මනුෂ්‍ය ඝාතනය. සු: ප: 132^{12}

ආණා 1 (නා) [සං. ආඥා] = අණ, ව්‍යවස්ථාව, නීතිය. අ: ප: ස: 48^{29} ධ: අ: ගැ: 204^{9}

ආණා 2 (නා) = පැණවීම, මේ ශික්ෂාපදය ඉක්මී මෙහි මෙනම් ඇවැත වේ යයි ඇවැත් වශයෙන් පැණවීම "ඉමස්මිං විනිච්ඡයමේ අයං නාම ආපත්තීති එවං ආපත්තිවසෙන ආණාපනං පඤ්ඤාපනං **ආණා**" විත: ම: 28^{10} 33^{4} -'**අරහ** (නා) [සං අර්ඝ] = අණ කිරීමට සුදුසු. ආඥාවන් පැණවීමට සුදුසු. බුදුහු. "ආණං පණෙතුං (?) අරහතීති **ආණාරහා**" වි: වි: ටී: 17^{18} ස: පා: 12^{23} -**ඛෙත්ත** (නා) [සං. ක්ෂෙත්‍ර] = ආඥා ක්ෂෙත්‍රය. ත්‍රිවිධ බුද්ධක්ෂෙත්‍රයන්ගෙන් එකක්. කෙළ ලක්ෂයක් සක්වළ රතන, ඛණ්ඩ, ධජගහ, ආටානාටිය, මෝර ආදී පරිත්‍රාණ සූත්‍රයන්ගේ අනුභාවය පවත්නා කෙළ ලක්ෂයක් සක්වළ කෙළවර කොට ඇත්තේ **ආණාඛෙත්ත** නම්. මෙතෙක් තැන සිටී දෙවියන් පිළිගත් බැවින් එනම් වීය. ස: පා: 104^{13} සාර: දී: 235^{22} ප: සූ: 80^{7} (4) චි: මා: ස: 985^{37} -**චක්ක** (නා) = ආඥාචක්‍රය. අණසක. **අණ**. "මයා **ආණාචක්කං**" ස: පා: 6^{27} විත: ම: 244^{1} ප: සූ: 231^{33} (2) -**දෙසනා** (නා) ($\sqrt{}$දිස + යු = අන + ආ) [සං. දෙශනා] = ආණාදෙශනාව. විනය පිටකය. ආඥ බහුලව දෙශනා කළ බැවින් විනය පිටකය **ආණා දෙසනා** නම්. "එත්තෙනි ආණාරහෙන භගවතා ආණාබාහුල්ලෙන දෙසිතත්තා **අණාදෙසනා**" ස: පා: 12^{23} සාර: දී: 63^{1} -**පාණසති සමාධි** (නා) (ආනාපාණසති සමාධි බලනු) සාර: ම: 30^{9} -**පාතිමොක්ඛ** (නා) (ප + අති + මොක්ඛ) [සං ප්‍රාතිමොක්ෂ] = ආඥා ප්‍රාතිමොක්ෂය දෙවැදෑරුම් ප්‍රාතිමොක්ෂයන් ගෙන් එකක්. "ආඥ ප්‍රාතිමොක්ෂය නම් භික්ෂු භික්ෂුණීන්ගේ සඳෙහවූ කායවාක් සමාචාරයෙහි දශවිධ අනුසස් සලකා" මෙනම් වරදෙහි මෙනම් ඇවැතයි" යි පැණ වූ ආපත්ති විධි ඇති භික්ෂු භික්ෂුණීන් විසින් අඩ මසක් පාසා උදෙසිය යුතු ප්‍රාතිමොක්ෂ ය යි. ශික්ෂාපද පැණවීමෙන් පසු උදෙසන ප්‍රාතිමොක්ෂය."සුණාතු මෙ භනෙන්ත" යනාදීන් උදෙසන ප්‍රාතිමොක්ෂය. විත: ම: 29^{32} ස: පා: 125^{20} 126^{18} -**වීතික්කම** (නා) (වි + අති + $\sqrt{}$කම + අ) [සං. ව්‍යතික්‍රම] = ආඥ ව්‍යතික්‍රමය. අණ ඉක්මවීම. නියමය කඩ කිරීම. පස් වැදෑරුම් අනන්තරායකර ධර්මයන්ගෙන් එකක්. දැන දැන ඇවැතට පැමිණීම. "සඤ්චිච්ච ආපන්නා පත්තියෝ **ආණා වීතික්කමනන්තරායිකා** නාම" ස: ප: 643^{33} 644^{4} -ං**අනන්තරා** (නා) [සං. අනන්තරා] = එනම් අනන්තරාය කර ධර්මය. පස් වැදෑරුම් අනන්තරායකර ධර්මයන්ගෙන් එකක්. දැන දැන ඇවැතට පැමිණීම. පරිජී ඇවැතක් නම් භික්ෂුභාවය ප්‍රතිඥ කරන තුරු ද, සඟ වෙසෙස් ඇවැතක් නම් එයින් නැගී සිටින තුරු ද, අනන්තරාය කරයි. ඉන් ඔබ නොවේ. සෙසු ඇවැත් දෙසන තුරු අනන්තරායික වන්නීය. සඟ මොක් දෙකට අනන්තරාය කරනුයෙන් මෙන්ම වේ. "සඟඝමොක්ඛානං අන්තරායං කරොන්තීති අන්තරායිකා" ස: පා: 643^{32} 644^{4} -**සමඞ්ගී** (නා) = ආඥ සම්පන්න වූ. ආඥවෙන් යුක්ත වූ ජ: අ: ගැ: 154^{23}.

ආණාපෙති (ක්‍රි) = අණ කරවි, නියම කෙළේ ය. නියොග කෙළේ ය. "අන්තරාමග්ගෙ මනුස්සෙ **ආණාපෙසි**." – "අථඛො බ්‍රහ්මදත්තො කාසිරාජා මනුස්සෙ **ආණාපෙසි**" වූ: පා: 276^{10} මහා: පා: 399^{16}.

ආණි (නා) [සං. ආණී] = 1 අකුර අග ගසන කණුව. ඇණය. කඹ ඇණය. 2 ඇණිය, බළ ඇණිය. අ: ප ස: 51^{16} ස: පා: 573^{9} විත: ම: 236^{29} (අනික බලනු.) -**ගණ්ඨි** (නා) = ඇණ හා පෙති. ඇණ ගැසීමෙන් සහ පෙති හෙලීමෙන් ශොභාව නැති කරන ලද පාත්‍රය. රාගචරිතයාට සුදුසු පාත්‍රයක ලක්ෂණ. "**ආණිගණ්ඨිකා**හතො, ඇණින් හා පෙතින් නසන ලද ශොභා ඇති; ඇණ

නම් සිදුරු තැන ගසන ඇණය. ගණඬි නම් එහි හෙලන පෙතිසි" වි: ම: සං: 250[30] වි: ම: ටී: 108[5] චිත: ම: 78[10] (ආණිගණඬි කාහත? යි ද දක්නේ ය. සං: පා: 221[26]) -**ඩොළ** (නා) (ආණිඩොළක බලනු.) (ආණිඩොලයිද දක්නේය. සං: ප.: 391[13]) -**ඩොළක** (නා) = ඔසප් වූ මෙහෙණට අනුදත් චීවර (වස්ත්‍ර) යක්. කොට රෙද්ද? රෙදි මූඩිය. "අනුජානාමි භික්ඛවෙ **ආණි ඩොළකං**" -"සදෘ **ආණි ඩොළකං** සෙවසිති" චූ: පා' 414[11] චූ: පා: B. 460[14] 461[18] (ආණිඩොලක යි ද දන්නේ ය.) -**පට** (නා) ඇණ පට. පටාණිය. "**පටාණි** නම් හැඳ පා සිළු නො ගිලිහෙන පිණිස පිටසැ හොවා ගසන ඇණයි" ක: වි: පි: 71[29] චිත: ම: 211[6] ක: වි: 95[31] (පටාණි බලනු සං: ප: 573[9]) -**මංස** (නා) = ඇණ පටක් මෙන් හිවී ගිය මස් ඇති. පිටතට නික්මුණු ඇණ මස් ඇති සත්‍රී නිමිත්ත. එබඳු නිමිති ඇති සත්‍රිය. ක, වි: පි: 27[17] චිත: ම: 97[25] සං: පා: 391[16] (සිඛරිනී බලනු.) -**රක්ඛක** (නා) = ඇණි රක්නා. බළ සෙනඟ රක්නා. චිත: ම: 236[29] සං: පා: 634[7].

ආතඞ්ක (නා) [සං. ආතඞ්ක] = රොගය, ලෙඩය. අ: ප: සං: 44[33].

ආතත (නා) = එනම් බෙර විශෙෂය. පසඳ තූර්‍යයෙන් එකක්. සමින් වළඳනා ලද එක් මුහුණින් යුත් සැළ බෙර. වජ්‍ර හෙරි ආදිය. අ: ප: සං: 20[34] 21[1] -**විතත** (නා) = එනම් බෙර විශෙෂය. පසඳ තූර්‍යයෙන් එකක්. හැම පසින් සමින් වැසූ පණාබෙර ආදිය. අ: ප: සං: 21[7].

ආතප (නා) (ආ + √තප + අ) [සං. ආතප] = අව්ව, සූර්‍යයී සන්තාපය. ඉර අව්ව. ජා: අ: ගැ: 83[2] වි: ම: සං: 83[31].

ආතප්ප (නා) = වීර්‍යය. කෙලෙසුන් තැවීම පිණිස කරන වීර්‍යය. අංගු: නි: 495[21] මනෝ: පූ: 643[25].

ආතප්පණ? (නා) = අථර්ණ වෙදය. චිත: ම: 289[26] (ආථබ්බණ බලනු.)

ආතාපි (නා) (අ + √තප + ණි) = වීර්‍යී ඇති, කෙලෙසුන් තවන වීර්‍යී ඇති. "ඨානං අපපමත්තස්ස **ආතාපිනො** පහිතත්තස්ස විහරතො' පාරා: පා: 5[16] වි: මා: සං: 14[15] ධ: අ: ගැ: 48[2] 184[31] (සත්‍රී: ලි: **ආතාපිනී** = කෙලෙස් තවන වීර්‍යී ඇති, කව්වි ගොතම අපපමත්තා **ආතාපිනියො** පහිතත්තා විහරන්තීති" පාරා: පා: 263[38].)

ආතුර (නා) [සං. ආතුර] = 1 රොගියා, ලෙඩා. ගිලනා. 2 දුකට පැමිණියහු. වි: මා: ස, 125[18] අ: ප: සං: 44[30] ධ: අ: ගැ: 231[2] 188[7].

ආතොජ්ජ (නා) [සං. ආතොද්‍ය] = ආතතාදි පසඳවකය. අ: ප: සං: 21[11].

ආථබ්බණ (නා) [සං. අථර්ණ] = අථර්ණ වෙදය. සිව් වෙදයෙන් එකක්. විද්‍යාමය ප්‍රයොගය ඇතුළත් එක් වෙදයක්. අථර්ණ වෙදයට අයත් මන්ත්‍ර ප්‍රයොගය. "**ආථබ්බණ** නම් එකහනි? අශෝදීන් මරා යාග කරණ සැටි කියන වෙදයෙකි" ක: වි: පි: 141[3] වි: වි: ටී: 352[17] සු: නි: අ: 452[21] සං: පා: 314[36] 315[3] සාර: දී: 603[24] -**මන්ත** (න) = අථර්ණ වෙදයේ උගන්වන අනුන් නසන මන්ත්‍ර. නිඝ්‍ර නිඝ්‍රණින් විසින් නො හදුළ යුතු වෙද මන්ත්‍ර විශෙෂයක්. බාහිරසමය යන්හි උගන්වන පරූපඝාතකර මන්ත්‍ර. "**ආථබ්බණ මන්තා** නාම අථබ්බ වෙද විහිතො පරූප ඝාත කරො මන්තො" වි: වි: ටී 352[17] සං: පා: 700[19] ක: වි: පි: 141[3] සු: නි: අ: 452[21] චිත: ම: 289[26] සාර: දී: 603[23] (ආථබ්බන යි ද දක්නේය. සං: පා: 700[19])

ආථබ්බණික (නා) (අථබ්බණ + ණික) = අථර්ණ වෙදය දන්නා. එය හදුරන. අථර්ණ වෙදය පිළිබඳ මන්ත්‍ර. තෘතීය පාරාජික ශික්ෂාපද පද භාජනියෙහි සඳහන් විජ්ජාමය පයොග. "කතමො විජ්ජාමයො පයොගො? **ආථබ්බණිකා** අථබ්බණං පයොජෙන්ති" සං: පා: 314[36] 315[3] සාර: දී: 603[22]

ආදුතබ්බ (නා) (ආ + √දු + තබ්බ) = ප්‍රවෙශ කටයුතු. පිවිස විය යුතු. ගත යුතු. චිත: ම: 283[31].

ආදුන (නා) (ආ + √දු + යු: අන) = 1 ගැණීම. 2 පිළිසිඳ ගැණීම. වි: මා: සං: 153[37].

ආදුන වටටි (නා) = බෙහෙත් ගැල්වූ පිළි වැටිය. "වච්චමගෙහ හෙසජ්ජ මක්ඛිතා **ආදුනවටටි** වා වෙළ නාලිකා වා වට්ටති. සං: පා: 812[26].

ආදූනාධිප්පාය (නා) = පැහැර ගන්නා අදහස ඇති, සොර කම් කරන සිත ඇති. "වොරොහිකඛවෙ **ආදූනාධිප්පායොා** අපපං රත්තියා සුපති" අඛු: නි: 438[21].

ආදූය 1 (පු: ස්ත්රී:) (ආ + √ දූ + ඛා: = ය) = 1 රැගෙන, ගෙන. මහා: පා: 291[2]. (ආදියෙය්‍ය බලනු)

ආදූය 2 (නා) = ගැණීම, පිළි ගැණීම, "තස්ස **ආදූයස්ස** අවණ්ණං හඤ්ඤං මානෙ කුපිතොා හොති" – "තස්ස **ආදූයස්ස,** ඒ තිරිසන්‍යතන සවාමීහු අයත් ගැනීමගේ ද" ම: පා: සං: 253[37] මහා: පා: 79[10] -**ඡණ්ඩක** (නා) = ආදූය ඡට්ඨය. මහා වගඛ පාළි කඛිනකඛණ්ඩකයෙහි දැක්වූ කඨිනානුද්ධාරය වන ක්‍රම සයක්. මහා: පා: 291[12] ම: පා: සං: 761[21] -**භාණවාර** (නා) = මහා වගඛ පාළි කඛිනකඛණ්ඩක යෙහි දැක්වූ එක් පරිවෙජ්දයක්. චීපපකත චීවරය රැගෙන යෑමෙන් කඨිනානුද්ධාරය වන අයුරු දැක්වූ බණවර. මහා: පා: 295[10] -**සන්නාහ** (නා) = ආදූය සඡනකය. මහා වගඛ පාළි කඛිනකඛණ්ඩකයෙහි දැක්වූ චීපප කත චීවරය රැගෙන යෑමෙන් කඨිනානුද්ධාරය වන වාර සඡනකයක්. මහා: පා: 290[4] (සමා දූය පකකමනි බලනු.)

ආදූස (නා) [සං. ආදර්ශ] = කැටපත. කන්නාඩිය. ආදර්ශ තලය "න භිකඛවෙ **ආදූසෙ වා** උදපත්තෙ වා මුඛ නිමිත්තං ඔලොා කෙතබබං" – "මුහුණ පැනෙන ලොහ භාජනාදි **ආදූස** යන්නෙහි ගැණේ සි" කු: සි: සං: 64[15] චූ: පා: 218[8] සං: පා: 888[34] දී: නි: 6[4] සු: චී: 64[27]. -**තල** (නා) = ආදර්ශ තලය. කැටපත. චී: මා: සං: 301[13] 1505[11] -**පඤ්හ** (නා) = කැටපතක දෙවතාවකු ආරැඹ කරවා ප්‍රශ්න චිචාරීම. එක් තිරශ්චීන චිද්ධුවක්. දී: නි: 9[12] සු: චී: 70[2] -**මණ්ඩල** (නා) = ආදර්ශ මණ්ඩලය. කැටපත් තලය, කැටපත. චී: මා: සං: 303[29] 411[13]. 988[9]

ආදි (නා) (ආ + √ දා + ඉ) [සං ආදි] = 1 මූර්ධ 2 ප්‍රකාර 3 සමීප 4 අවයව 5 ආදිය 6 අන්ත 7 භාග 8 ශ්‍රෙෂ්ඨය යන අර්ථවල වැටෙන නාම පදයක්. අ: ප: සං: 130[26] – **කම්මික** (නා) (**කම්ම** + ණික) = ආදිකර්මිකයා, පළමුව කළහු. ශික්ෂා ප්‍රඥප්තීන් පැණවීමට පෙර වරද කළහු. ආදි කර්මිකයනට ඇවැත් නැති. අනාපත්ති අජානන්නස්ස – පෙ – **ආදි කම්මිකස්ස** පාරා: පා: 36[32] චින: ම: 65[28] සං: පා: 194 ක: චි: පි: 99[21] චි: මා: සං: 911[34] -**කම්මිකා** (නා) (කම්මික + ආ) = පළමුව කළ තැනැත්තී ශික්ෂා පද පැණවීමට පෙර වරද කළ මෙහෙණ. "අනාපත්තී-පෙ-**ආදිකම්මිකා යාති**" පාචි: ප: 326[12]. – **කර** (න) = පළමුව කළ, ආදි කර්මිකයෝ. **"ආදිකරොති** සුදින්න පෙරාදි ආදිකම්මිකොා" සං: පා: 973[27] පරි: පා: 162[3] (ආදිකම්මික බලනු) – **කල්‍යාණ** (නා) : ආදියෙහි යහපත් වූ. මුල යහපත් වූ. බුදුරදුන්ගේ ධර්ම දෙශනාවෙහි එක් ආකාරයක්. "ආදිමජ්ඣ පරියොසාන කල්‍යාණොා" යනු ශීල සමාධි ප්‍රඥ ගැන කියත්. මෙය තදඟ විඛ්‍යූන් සුමුසේ පහන් ගැන කියත් මෙ" ධ: අ: ගැ: 10[23] ප: සූ: 168[30] චින: ම: 34[31] සං: පා: 77[36] 78[1] පාරා: පා: 1[13] අඛු: 75 – **ඨපන** (නා) (ආදි + ඨපන) = ආදිකොට තිබීම, ආදරයෙන් හෝ තිබීම. සිව් ඉරියව්වෙහි කරන කුහක පැවැත්ම චි: මා: සං: 67[26] 74[28] චි: ම: ටී: 46[18] අභි: ධ: ප්‍ර: 1998[8] (අට්ඨපන බලනු) – **බ්‍රහ්මචරියක** (නා) (බ්‍රහ්මචරිය + ක) = දෙවැදරුම් ශීලයන්ගෙන් එකක්. මාගී බ්‍රහ්මචර්‍යයට ආදියෙහි ඉපදවිය යුතු බැවින් එනම් වූ ශීලය. ආජීවාෂ්ටමක ශීලය. උභතොා විභඞගයට හෙවත් පාරාජිකපාළි, පාචිත්තිය පාළි දෙපොතට අයිති ශික්ෂාපද රාශිය. "මාගී බ්‍රහ්මචර්‍යාවට ආදි නෙයින් ආදි බ්‍රහ්මචරියක නම් වූ පාරාජිකා සඞඝාදිසෙස සඞඝාත මහා ශීලයන් ගෙ" – "**ආදිබ්‍රහ්ම චරියකා** උභතොා විභඞග පරියාපන්නා සික්ඛාපෙතං අධිවචනං. කෙනෙවාහ උභතොා විභඞග පරියාපන්නං ආදි බ්‍රහ්මචරියස්ස ආදි භූතානි චත්තාරි මහාසීල සික්ඛාපදානි" චි: මා: සං: 22[22] 35[19] 37[20] චි: ලං: 98[38] සං: පා: 739[27] මහ: පා: 76[20] අ: ප: සං: 596 පරි: ගැ: 15[7] මනොා පූ: 443[36] චි: චි: ටී: 371[5] -**මජ්ඣපරියොසාන** (නා) [සං. ආදිමධ්‍ය පර්‍යවසාන] = මුල මැද අග. ශීල, සමාධි, ප්‍රඥ, ධ: අ: ගැ: 10[23] (ආදිකල්‍යාණ බලනු)

ආදිච්ච (නා) (අදිති + ණ්‍ය) [සං. ආදිත්‍ය]- සූර්‍යයා, අදිතියගේ පුත්‍රයා. ජා: අ: ගැ: 56[5] අ: ප: සං: 11[8] – **'උපඛාන** (නා) = හිරු දෙව්යන් පිදීම, ජීවිකාව පිණිස හිරු දෙවියා

පිදීම. සු: වි: 70^{5} දී: නි: 9^{13} – **පථ** (නා) = ආදිත්‍ය පථය, සූර්‍යයා යන ගමන් මාර්ගය, අහස. අ: ප: ස: 9^{5} – **පාක** (නා) ($\sqrt{}$පච + ණ; ච = ක) = අව්වෙහි කැකෑරීම, අව්වේ තබා හුණු කිරීම. අඹ පාන වර්‍ගයන් පරිභෝගයට ගත හැකි එක් ක්‍රමයක්. "ඉමානි අට්ඨ පානානි සීතානිපි **ආදිච්චපාකානි** නිපි වට්ටන්ති අගහිපාකානි න වට්ටන්ති" ස: පා: 517^{15} 817^{18} කු: සි: ස: 32^{22} **ක**: වි: 115^{2} වි: වි: 794 2687 2691 - **බන්ධු** (නා) = සූර්‍ය බන්ධු, සූර්‍ය වංශයේ උපන් බුදුනට නමක්. **ක**: වි: පි: 154^{10} සු: වි: 532^{21} පරි: පා: ගැ: 391^{1} අ: ප: ස: 42^{1}

ආදිත්ත (නා) ආ + $\sqrt{}$දිප + ත) [සං. ආදීප්ත] = හැම තැනම ඇවිල ගත්. දිලියෙන, "**ආදිත්තාය**, ආදියෙහි පටන් හැම තැන ඇවිලි ගිනි ඇති" – "උදකං මක්ඛෙඤ්ඤ **ආදිත්තං**" වි: මා: ස: 97^{20} 1602^{23} ප: සූ: 84^{4} 231^{23} ජා: අ: ගැ: 187^{1} ධ: අ: ගැ: 226 261^{28} පාරා: 114^{27} 193^{26} මහා: පා: 31^{22} – **වොළ** (නා) = ඇවිල ගත් වස්ත්‍ර ඇති. එබඳු තැනැත්තා. අඹු: නි: 956^{16} -**පරියාය** (නා) = එනම් සූත්‍රය. බුදුන් උරුවෙල් දනව්වෙහිදී උරුවෙල් කසුප් ඇතුළු නිඝණ්ඨයන් දහසකට දෙසූ "සබ්බං භික්ඛවෙ **ආදිත්තං**" ආදී සූත්‍රය. මහා: පා: 31^{22} වි: මා: ස: 97^{33} 1220^{18} ජා: අ: ගැ: 46^{20} -**සරීර** (නා) = ගින්නෙන් දිලිලෙස සිරුරු ඇති. ඇවිලගත් සිරුර. ජා: අ: ගැ: 218^{16} -**සිස** (නා) = හිස ගිනි ගත්. ඇවිලගත් හිසක් ඇති. අඹු: නි: 956^{16}.

ආදිනන දණ්ඩ (නා) = ගන්නා ලද දඬු ඇති, දඬු ගත්. මහා: පා: 404^{2}.

ආදිනන සත්ථ (නා) [සං. ශස්ත්‍ර] = ගන්නා ලද ආයුධ ඇති. ආයුධ ගත්. "තෙසං හි නාම භික්ඛවෙ රාජූනං **ආදිනන දණ්ඩානං ආදිනන සත්ථානං** එවරූපා ඛන්ති සොරච්චං භවිස්සති" මහා: පා: 404^{2}.

ආදියෙය්‍ය (ක්‍රි) (ආ + $\sqrt{}$ද + ය + එය්‍ය) = ගන්නේය. 2 සවාමිහු විසින් කයින් හෝ වචසින් නොදුන් ආරාමාදි වස්තුව සටන් බැණ ගන්නේය. අදින්නාදාන පාරාජිකාවෙහි පස්විසි අවහාරයන් අතර නානා භණ්ඩ පසඳුවකයෙහි සහ එක භණ්ඩ පසඳුවකයෙහි එක් අඩගයක්. පාරා: පා: 492^{6} කු: සි: ස: 5^{12} සි: ව: වි: 241 ස: පා: 217^{11} **ක**: වි: 253^{7} 264 (අනී: **ආදියි** වතී: **ආදියති** අනා: **ආදිඝ්ඝති** සම්: **ආදියෙය්‍ය** පම්: **ආදියතු**. පූ ක්‍රි: **ආදිඝ්ඝිතවා** – **ආදාය** වක්‍රා: **ආදියහෙනා** = ගණිමින්, පැහැර ගණිමින්.) වි: ලං: 391^{2} ස: පා: 217^{11} **ක**: වි: 267.

ආදිසති (ක්‍රි) (ආ + $\sqrt{}$දිස + ති) = ගෙන හැර දක්වයි ඉදිරියෙහි මෙන් කොට පෙන්වයි. "නිම්නෙනන **ආදිසති**" අඹු: නි: 104^{22}.

ආදිසස (පූ: ක්‍රි:) (ආ + $\sqrt{}$දිස + ත්වා) = උදෙසා, පිරිසිඳ, නියම කොට "**ආදිසස ආදිසස** අසුභ සමාපත්තියා වණ්ණං භාසති" – "**ආදිසස** දිත්වා" – "**ආදිසස**, උදෙසා" පාරා: පා: 67 236^{27} ස: පා: 286^{29} **ක**: වි: පි: 27^{25} **ක**: වි: 36^{21} 61^{14} -**දිනන** (නා) = උදෙසා, නියම කොට දෙන ලද, එබඳු සිවුර. මෙය ගණයාටය, මෙය ඔබට යයි දෙමි කියා හෝ දෙනු කැමැතිව පාමුල තබා හෝ දෙන ලද සිවුර අකාල චීවරය. පාචි: පා: 275^{33} ස: පා: 682^{34} 683^{1} **ක**: වි: 170^{4}.

ආදීනව (නා) [සං. ආදීනව] = දෙෂය, වරද, උවදුර. "සුදින්නෙන කලඤ්ඤ පුඤ්ඤෙන අබ්බුදං උප්පාදිතං **ආදීනවෙ** උප්පාදිතෙ" පාරා: පා: 19^{3} ස: පා: 147^{27} ධ: අ: ගැ: 101^{6} අ: ප: ස: 101^{31} -**ඤාණ** (නා) = ආදීනව ඥානය. භඞ්ගානු පස්සනා වශයෙන් සියලු සංඝකාර යන්ගේ ආදීනවය දන්නා ඥාණ වි: මා: ස: 1602^{7} -**දස්සාවි** (නා) ($\sqrt{}$දිස + ණි = ආවි; $\sqrt{}$දිස = දස්ස) = දෙස් දක්නා සුළු. වරද වරද මෙන් දක්නා. සු: වි: 742^{27} -**සඤ්ඤා** (නා) = ආදීනව සංඥාව, ආදී නවානුපස්සනා ඤාණ සංඥාව. සු: වි: 762^{16}.

ආඳු (නි) = නොහොත්, එසේ නැතහොත්. "**ආඳු** නොහොත් උදහු යු සේයි" ධ: අ: ගැ: 22^{20} (අදු යි ද දක්නේය.)

ආඳුචාප (නා) = පරම දුනු, විශාල දුන්න. "**ආඳුචාපං**, පරම දුනු" ජා: අ: ගැ: 216^{18}

ආදෙය්‍යවාචෝ (නා) = ගතයුතු වචනොපදෙශ ඇති, එබඳු තැනැත්තා. "තෙන ඛෝ පන සමයෙන අනාථ පිණ්ඩිකො ගහපති -පෙ- **ආදෙය්‍ය වාචෝ**" චූ; පා: 276^{18} චූ: පා: B 461^{2} 471^{7} (2) සු: වි: 684^{22}.

ආ දෙවනා (නා) (ආ + $\sqrt{}$දීව + යු = අන + ආ = වැලපීම, උදෙසා හැඬීම. සු: වි: 578^{5}

ආදෙවෝ (නා) = උදෙසා වැලපීම. ''ආදිසස ආදිසස දෙවනති රොදනති එතෙනානි = **ආදෙවෝ**'' සු; චි: 578⁵.

ආදෙසනාපාටිහාරිය (නා) = ආදේශනා ප්‍රාතිහාර්‍ය. අනුන්ගේ සිත් දැන ධර්‍මදේශනා කිරීම. ''පරස්ස චිත්තං ඤත්වා කථනං **ආදෙසනා පාටිහාරියං** ''චි: චි: ටී: 474²⁸ මනෝ: පූ: 462²⁹ ධ: අ: ගැ: 55²¹ අඞ්ගු: නි: 104 -°**අනුසාසනී** (න) = ආදේශනා ප්‍රාතිහාර්‍යානු ශාසනය. කරුණුදක්වා දම් දෙසීම ''අථඛෝ ආයසමා සාරිපුත්තෝ **ආදෙසනා පාටිහාරියානුසාසනියා** භික්ඛු ධම්මිය කථාය ඔවදි අනුසාසි'' වූ: පා: B 214¹⁹ වූ: පා: 329¹ චි: චි: ටී: 474²⁸ මනෝ: පූ: 462²⁹

ආධානග්ගාහී (නා)(√ගාහ + ණී) = බැසගත්, ගිලුණු. දැඩිසේ ගත්නා ලද. ''**ආධානග්ගාහිනී** දළහානාහි'' ''ආධානගාහිතා, අයොනිසෝ දුස්ගහණය යන **ආධානග්ගාහිතා** යැ'' චි: මා: සං: 257³¹ සං: පා: 969³³ සූ: චි: 608 ⁹ 759³ චි. ම: ටී: 107¹³ සාර: දී: 706¹

ආධාර (නා) (ආ + √ධර + ණ) = ආධාරය, 2 අධිකරණ කාරකය. 3 පාත්‍රාධාරය 4 තෝ තැන්න අ: ප: 145¹⁵ (ආධාරක බලනු)

ආධාරක 1 (නා) (ආ + √ධර + ණ + ක) = ආධාරය, පාත්‍රාධාරය. පාත්‍ර වළල්ල වේවැල් ආදියෙන් කළ බිම් වළල්ල. එක් ගරු භාණ්ඩයක්. ස: පා: 567²⁰ ක: චි: 140³ ජා: අ: ගැ: 26²⁶ ක: චි: පි: 112²¹ කු: සි: ස: 26¹⁹ ධ: අ: ගැ: 190²⁰ 225²⁸

ආධාරක 2 (නා) = ආසනය, දණ්ඩාසනය. චි:ලං: 73⁸ ජා: අ: ගැ: 198⁹

ආධාවනති (ක්‍රි) (ආ + √ධාව + නති) = ඉදුරා දිව එත්. පෙරළා දිවත්. (අතී: **ආධාවී** වතී: **ආධාවිඃ** අනා: **ආධාවිස්සතති** සම්: **ආධාවෙය්‍ය** පම්: **ආධාවතු** ප්‍රක්‍රි: **ආධාවිත්වා** වකා: **ආධාවනෙනා** දිව එමින්.) ''ධාවන්තිපි **ආධාවනන්තිපි**'' පාරා: පා: 114²¹ සං: පා: 448³⁰ ජා: අ: ගැ: 126¹⁴ පාචි: පා: 181³⁰

ආධාවිත්වා (පූ: ක්‍රි:) දිව, **ආධාවිත්වා** පරිධාවිත්වා, දිව පැන ඇවිදින'' ජා: අ: ගැ: 58³⁰

ආධි (නා) = චිත්ත පීඩාව. අ: ප: සං: 25¹⁴

ආධිපච්ච (නා (අධිපති + ණ්‍ය) [සං. ආධිපත්‍ය] ආධිපත්‍යය, අධිපති භාවය. -**පරිවාර** (නා) = ආධිපත්‍යය සහ පරිවාර සම්පත්තිය අධිපති බව සහ පිරිවර. ජා: අ: ගැ: 160³³

ආධිපතෙය්‍ය (නා) (අධිපති + ණෙය්‍ය)- අධිපති භාවය, ආධිපත්‍යය. අඞ්ගු: 963²⁸

ආධ්‍මත (නා) (ආ + √ධ්‍මා + ත) = සැලෙන ලද, කම්පා වූ කම්පාවන. අ: ප: සං: 98³⁵

ආන (නා) [සං. ආන]= ආශ්වාසය. හුස්ම ඉහළට ගැණීම. හුස්ම ගැණීම. **''ආනන්ති** අස්සා සෝ'' සං: පා: 291⁸ 294²⁵ අ: ප: සං: 8¹⁷ -**අපාන** (නා) [සං. ආපාන]= ආශ්වාසය සහ ප්‍රශ්වාසය පිටකරන හුස්ම. **''ආනාපානෙ** පරිගහෙත්වා, වදනා නික්මෙනා නොහොත් නික්මෙන වදනා වාත විෂය වූ කර්‍මස්ථානයන් ගෙන'' ජා: අ: ගැ: 36⁹ සං: පා: 291⁸ -°**සති** (නා) = ආනාපාන සතිය. ආශ්වාස ප්‍රශ්වාස යන් අරමුණු කොට ගන්නා සිහිය. දශ අනුස්මෘතීන් ගෙන් එකක්. සං: පා: 291¹² චි: මා: සං: 467⁷ අඞ්ග: නි: 20²³ 27⁹ ජා, අ: ගැ: 36 ⁹ -°**සතිකම්මට්ඨාන** (නා) = ආනාපාන සතිකමටහන. සම්සතළිස් කම්ටහනින් එකක්. ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කොට වඩන කමටහන. චි: මා: සං: 651²⁷ -°**සතිසමාධි** (නා) = ආනාපාන සතිය සමග උපදින සමාධිය ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කොට පවත්නා සිහිය සමග සිතේ ඇතිවන එකඟකම. ''අයම්පි ඛෝ භික්ඛවෙ ආනාපානසති සමාධි භාවිතෝ -පෙ- සුඛෝ ච විහාරෝ'' – ''ආනපාන සතියා යුත්තෙනා සමාධි **ආනාපානසමාධි**. පාරා: පා 69²² සං: පා: 291¹³ සාර: ම: 309චි: ම: සං: 645⁶ (ආණාපාණසති සමාධි යනුද දක්නේය ප: රා: පා: 63²²)

ආනඤ්ජ (නා) = කම්පා නොවීම, නො සැලීම. පලා නො යෑම. ජා: අ: ගැ: 98²⁷ (ආනෙඤ්ජ බලනු)

ආනඤ්ජාභිසඞ්ඛාරණ (නා) = ''**ආනඤ්ජාභිසඞ්ඛාරණ** නම් සටන් දුටු කල නොපලනා පිණිස අළුනෙහි ලා භික්මවන යොගයි'' ජා: අ: ගැ: 98²⁷

ආනණ්‍ය (නා) (අනණ + ණ්‍ය) = ණය නැති බව, (අනණ බලනු) -**පරිභොග** (නා) = අනෘණ පරිභොගය, ණය නැතිව සිටී පසය

වැළඳීම, සිල්වත්ව ප්‍රත්‍යවෙක්ෂා කොට සිවි පසය වැළඳීම. "යොපානයං සිලවතො පච්චවෙක්ඛිත පරිභොගො සො ඉණපරි පරිභොගස්ස පච්චනීකත්තා **ආනණ්‍යපරි භොගොවා** හොති" වි: මා: ස: 115⁵.–²⁷ වි: ම: ටී: 63¹² වි: ලං:102²¹

ආනන්තර (නා) (ආනන්තරික බලනු)

අනන්තරික (ත) (අනන්තර + ණික) [සෘ. ආනන්තර්‍ය] = එනම් කම්. අනතුරු අත් බෙවෙහි විපාක දෙන කම්. එබඳු පාපකම් කළහු. පැවිදි නො කළයුතු පරිස දූෂක යෙක්. ස: පා: 764¹

ආනන්තරික 2 (නා). – අනතුරුව හුන්, ළඟ හුන් නිඝණ්ඨ. "අනුජානාමි භික්ඛවෙ සභි කරණ්ඩෙ **ආනන්තරිකං** භික්ඛුං ආපුච්ඡිත්වා ගන්තුං" චු: පා: 343³¹

ආනන්තරිය (නා) (අනන්තර + ණික = ඉය) [සං. ආනන්තර්‍ය] = පඤ්චානන්තර්‍ය කම්ය, කළහු පැවිදි උපසපන් කිරීමට නුසුදුසු පාප කම්යක්. "එතස්ස පබ්බජ්ජාව උප සම්පදාව පටික්ඛිත්තා" ස: පා: 765³⁵ විත: ම: 46³³ ජා: අ: ගැ: 31¹⁵ **–ඛම්ම** (නා) = ආනන්තර්‍ය කම්ය, අනතුරු අත් බෙවෙහි විපාක දෙන 1 මාතෘඝාතක 2 පිතෘඝාතක 3 අරහන්ත ඝාතක 4 සඞ්ඝ භෙදක 5 ලොහි තුප්පාදක යන පස අකුශල පක්ෂයෙන් ද, අෂ්ට සමාපත්තිය කුශල පක්ෂයෙන් ද ගැණෙන කම්. මනො: පූ: 365⁷ ප: සූ: 77² (4) **–ධම්ම** (නා) = අනතුරු භවයෙහි විපාක දෙන චෙතනාදි ධම්. වි: වි: ටී: 332²⁷.

ආනන්ද 1 (නා) = ධම් භාණ්ඩාගාරික මහ රහතන් වහන්සේ. බුදුරජාණන් වහන්සේගේ අග්‍ර උපස්ථායකයන් වහන්සේ. ස: පා: 299¹⁰ චූ: පා: 330¹³.

ආනන්ද 2 (නා) = 1 සන්තොෂය, සතුට 2 එනම් මත්‍සර්‍යය අ: ප: ස: 146 592⁷ සාර: දී: 254²⁹.

ආනිසංස (නා) [සං. ආනෘශංස] = 1 අනුසස් 2 වටිනාකම, අගය 3 ප්‍රයොජන 4 විපාකයය ස: පා: 694²⁹ 695⁴ 696³ ජා: අ: ගැ: 192¹⁸ වි: මා: ස: 31¹⁵ 296³⁹ ක: වි: පි: 135¹⁰ විත: ම: 133² 281²¹ ධ: අ: ගැ: 6²¹ 31²⁰ 41³⁰ **–චීවර** (නා) = ආනිසංස චීවරය, පරි කම් නො කරනලද කඨිනානිසංස ඇති චීවර වස්ත්‍රය. "යො පන **ආනිසංස චීවරං** ආදාය පක්කමති" විත: ම: 136¹² වි: වි: 2711 **–මූල චීවර** (නා) = කඨිනානිසංස මූලක චීවරය. පරිකම් නො කළ චීවරය. පච්චාසා චීවරය. "නිඞ්ගතෙ **ආනිසංසමූලකෙ** චීවරෙ පච්චාසා චීවරෙති අත්ථො" විත: ම: 131²⁵ 136¹⁶ **–වග්ග** (නා) = ආනෘශංස වර්ගය. පරි වාර පාළියේ එක් ප්‍රකරණාංශයක්. සු: ප: XV⁴.

ආනිසදද (නා) (ආ + නි + √සද + අ) = ඉදුම්, නිසීදන මාංසය, තව්ටම. ස: පා: 769¹⁰ **–මංස** (නා) = නිසීදන මාංසය, තව්ටම. වි: ලං: 167⁵ ස: පා: 769¹¹.

ආනීත (නා) (ආ + √නී + ත) = ගෙන එන ලද, පමුණුවන ලද, එළවන ලද, එබඳු දේ. අ: ප: ස: 991⁹

ආනුපුබ්බි (නා) අනු + පුබ්බ + ණි) [සං. ආනුපූර්වී] = පිළිවෙළින් පවත්වන, ක්‍රමවත් **–කථා** (නා) = අනු පිළිවෙළ කථාව, බුදුන්ගේ ධම් දෙසනාවෙහි එක් ආකාරයක්. "**ආනුපුබ්බිකථං**, දත් ඇ අනුක්‍රම දීපක කථා. දාන කථා සීල කථා ආදී වූ පිළිවෙළ කථාය යනුයි" – "අනුපුබෙබන කසිරමානා කථා. වට්ටඤ්ඣාසයහට දාන සීල කථා සග්ග කථා, විවට්ටඤ්ඣාසයහට කාමාදීනව නෙක්ඛම්මානි සංස චතුසච්ච කථා **ආනුපුබ්බි කථා** නම්" ධ: අ: ගැ: 10¹⁴ 33¹⁷ 54¹³ 60³ 135¹² ජා: අ: ගැ: 12²¹ 26² මනො: පූ: 625²⁵ 754¹⁶ සු: වි: 195⁶ වි: වි: ටී: 362³.

ආනුභාව (නා) (ආනුභාව + ණ) = ආනුභාවය, බලය, උපාය, තෙජස. "**ආනුභාවෙන**, තෙජින්" – "**ආනුභාවං**, උපාය" ධ: අ: ගැ: 94³³ ජා: අ: ගෑ: 177¹⁵.

ආනෙඤ්ජ (නා) (න + √ඉඤ්ජ + ණ) = අවල, කම්පා නො වන, නො සැලෙන. ස: පා: 102⁹. **–පත්ත** (නා) [සං ප්‍රාප්ත] = කම්පා නො වන, නො සැලෙන, එබඳු භික්ත. ශ්‍රද්ධාදියෙන් හාත්– පස අල්වානත් සිත අශ්‍රද්ධාදියෙන් කම්පා නො වේ. චතුර්ථධ්‍යාන සමාධි චිත්තය. අභිඥාවට කාරණාවූ ගුණ අටෙන් එකක්. "සො එවං සමාහිතෙ චිත්තෙ – පෙ – කම්ම නියෙ සිතෙ **ආනෙඤ්ජූපත්තෙ** ආසවානං ඛය ඤාණාය චිත්තං අභිනින්නාමෙසිං" පාරා: පා: 317 420 ජා: අ: ගැ: 11² ස: පා: 102²⁰

සාරා: ම: 7[37] සාර: දී: 326[8] 328[13] වි: මා: ස: 916[36] ආනෙඤ්ජපත්තියිද දක් වන්නේය.)

ආනෙඤ්ජ (නා) (න + √ඉඤ්ජ් + **ණ**) = කම්පා නො වන, නො සැලෙන "ආනෙඤ්ජ නම් නො සෙලවීමයි" සාරා: ම: 39[38] **-අභිසඞ්ඛාර** (නා) = අරූපාවචර කුසල චේතනා සතර. වි: ම: ස: 128[831] **-විහාර සමාපත්ති** (නා) = චඤ්චල නො වන ඵල සමාපත්ති විහරණය, විඳින ලද ඵල සමාපත්ති විහරණය. ධ: අ: ගැ: 204[30] **-සමාධි** 1 (නා) = චතුර්ධ්‍යාන සමාධිය, කාය වාක් චිසඳන රහිත වූ චතුර්ධ්‍යාන සමාධිය. ශබ්ද කණිටකයන්ගෙන් නැඟී සිටීමට නුසුදුසු වූ රූපාවචර සමාධිය. 'ඉදඟං ආවුසෝ - පෙ - **ආනෙඤ්ජං සමාධිං** සමාපත්තෝ - පෙ - සද්දං අසෝසිං" පාරා· පා: 116[6] වි: වි: ටී: 209[38] සාරා: ම: 39[35] ස: පා: 364[36] සාර: දී: 636[28] **-සමාධි** 2 (නා) = අරූපාවචර සමාධිය. "**ආනෙඤ්ජානි** අරූපාවචර සමාධි වුච්චති" සාර: දී: 636[31].

ආප (නා) = ජලය. "**ආපෙ** ච සඞ්ඝාටිරජූප වාහනෙ, සිවුරෙහිද රජස් ශොධන ජල යෙහි ද" වි: මා: ස: 116[11-24].

ආපජ්ජති (ක්‍රි) (ආ + √පද + ය + ති; [සං. ආපද්‍යති] = පැමිණෙයි. "'ආපත්තිං **ආපජ්ජති**, ඇවැතට පැමිණෙයි" (අතී: **ආපජ්ජී** වතී: **ආපජ්ජති** අනා: **ආපජ්ජිස්සති** සම්: **ආපජ්ජෙය්‍ය** පමී: **ආපජ්ජිතු** පූ ක්‍රි: **ආපජ්ජිත්වා** වක්‍රා: **ආපජ්ජමානා** සත්‍රී: ලි: **ආපජ්ජනති** = පැමිණෙන්නී) වින: ම: 144[35] ස: පා: 981[3] 1036[1] 1038[38].

ආපණ (නා) [සං. ආපණ] = සල්පිල, අවන් හල. නොයෙක් වෙළෙඳ බඩු විකුණන ශාලාව. "**ආපණන්ති** නානා භණ්ඩානං අනෙකවිධං ආපණං පසාරෙන්ති" - "**ආපණො** කාරාපිතො හොති" ස: පා: 953[15] චූ: පා: 410[11] අ: ප: ස: 30[24] මහා: පා: 157[17] ච: අ: ගැ: 140[10] 285[29] **-දවාර** (නා) = අවුණු දෙර, අවන්හල, සල්පිල. ධ: අ: ගැ: 140[10] **-සාලා** (නා) = අවන් හල, වෙළෙඳ හල. "**ආපණ සාලා** කාරාපිතා හොති" මහා: පා: 157[17] 158[26].

ආපණ්ඩක (නා) (ආපණ + ණ්ඩක) = වෙළෙන්ද, වෙළෙඳමෙහි නියුක්තයා. "**ආපණ්ඩකස්ස** වෙය්‍යකං අවහරිත්වා ආයසමන්තං දළ්හිකං එතදවොච" පාරා: පා: 67[13] ධ: අ: ගැ: 140[10] අ: ප: ස: 64[19]

ආපත්ති 1 (නා) (ආ + √පද + ති) = 1 ඇවැත, වරද 2 පැමිණීම. ඒ ඒ ඇවැතට පැමිණීම. "**ආපත්තිඤ්ඤෙව** වචනෙනාපි නාමඤ්ඤෙව ආපත්තිඤ්ච ගහිතා හොති" ස: පා: 187[6] ක: වි: 49[18]

ආපත්ති 2 (නා) = ශික්ෂාපදයන්ගේ සාධාරණ විනිශ්චය පිණිස දහයුතු සපත දශාකාර යෙන් එකක්. පූර්ව ප්‍රයෝග සහප්‍රයෝග වශයෙන් වූ ආපත්ති භෙදය. "පූර්ව ප්‍රයෝග නම් නිධාන සොරා ගන්නා පිණිස එහි මත්තේ වළ ආදි කරණු පිණිස වාසි ඵරසු ආදී පරියෙසනයෙහි අදත්තාදාන පූර්ව භාග යෙහි වන දුක්කටයි. ආදි ශබ්දයෙන් සහ ප්‍රයෝග ගත්හු" ක: වි: පි: 1[12] ක: වි: 21[19] **-අඞ්ග** (නා) = ඇවැතෙහි අවයව. ඇවැතක් වීමට සුදුසු කරණු ක: වි: පි: 62[11] (ආපත්ති ආපජ්ජන බලකු) **-අඤ්ඤභාගිය** (නා) (ආපත්තඤ්ඤ භාගිය) (අඤ්ඤභාග + ඉය = අඤ්ඤභාගිය) [සං. අන්‍ය භාගීය) = අඤ්ඤ භාගීය ආපත්තිය. ආපත්තියෙන් අන්‍ය කොට සක් හා සම්බන්ධ වූ. "**ආපත්තඤ්ඤභාගියෙන** වොදනං ච, අඤ්ඤ භාගිය ආපත්තියෙන් වොදනාවද" ක: වි: පි: 36[28] පාරා: පා: 200[28] ස: පා: 432[2-7] 433[34] **-අධිකරණ** 1 (නා = ආපත්තාධිකරණය. මානිකාවෙහි සඳහන් පසඳා පත්තිසඤ්ඤිය සහ විභඞ්ගයෙහි ථුල්ලච්චය, දුබ්භාසිතය යන දෙකත් සමග වන සප්තාපත්තිසඤ්ඤිය ආපත්තාධිකරණ නම්. ස: පා: 428[6] 886[3] සාරා: ම: 69[3] ක: වි: පි: 35[3] 131[5] ක: වි: 157[4] 158[13] වින: ම: 1[6][33] සු: වි: 762[34] **-අධිකරණ** 2 (නා) = ආපත්තාධිකරණය. ඇවැත්වලට සුදුසු පිළියම් කිරීම "ගරුක ලහුකාදි වශ යෙන් හා පාරාජික සඞ්ඝාදී සෙසාදි වශයෙන් දක්වා නිබෙන ඇවැත්වලට පැමිණි භික්ෂූන් විනිශ්චය කර ඇවැත්වලට සුදුසු පිළියම් යෙදීම ආපත්තාධිකරණය නම්. එය සම්මුඛා විනය, පටිඤ්ඤාත කරණය, තිණ වත්ථාරකය යන සමථ තුණෙන් සන්සිඳ විය යුතුයි" චූ: පා: B. Vii පරි: පා: 159[1]

-'**ආපජ්ජන** 1 (ආ + √පද + ය + යු = අන) = ඇවැතට පැමිණීම කයින් හා වචනයෙන් වන ඇවැතට පැමිණීම. කු: සි; සැ: 126[23] බු: සි: ටී: 151[4] -**ආපජ්ජන** 2 (නා) = ඇවැතට පැමිණීම. 1 අලජ්ජිතා 2 අසඤ්ඤතා 3 කුහකතුච්චපකතතා 4 අකප්පියෙ කප්පිය සඤ්ඤිතා 5 කප්පියෙ අකප්පිය සඤ්ඤිතා 6 සති සම්මොසා යන සයංකාරයෙන් සිදුවන ආපත්ති ආපජ්ජනය හෙවත් ඇවැතට පැමිණීම. අකැප බව දැන දැනම ව්‍යතික්‍රමණය කොට ඇවැතට පැමිණෙනුයේ අලජ්ජිතා යෙන් වේ. අඥාන පුදුගල තෙමේ කටයුතු දැ නො කිරීමෙන් සහ නො කටයුතු දැ කිරීමෙන් අසඤ්ඤතායෙන් ඇවැත් අවදී කුකුසින් මඩනා ලද බැවිනුදු මෙසේම ඇවැතට පැමිණෙ කැප - අකැපයෙහි කුකුසක් උපන් කල එය විමසා නො දැන කැපය අකැපය වශයෙන් ද, අකැපය කැපය වශයෙන් ද ගෙන කරන්නේ කුකුසින් ඇවැතට පැමිණේ. අකප්පියෙ කප්පිය සඤ්ඤිතා, කප්පියෙ අකප්පියෙ සඤ්ඤිතා යනුදු මෙසේ මැසි. සහසෙය්‍ය චීවර විප්පවාසාදි ශික්ෂා පදයන් ව්‍යතික්‍රමණය කරනුයේ සහිසම්මොසයෙන් ඇවැතට පැමිණේ කා: වි: 14[2] සැ: පා: 64 [20] වි: වි: ටී: 108[36] කු: සි: සැ: 126[23] බු: සි: ටී: 151[18] මනෝ: පූ: 443[29] -**ආරොචන** (නා (ආ + √රුහ + යු=අන)= ආපත්ති ආරොචනය කිරීම. ඇවැත් දැන්වීම. ගරුකාපත්තියකට පැමිණ එය සමාන සංවාසක උපසපන් භික්ෂුවකට ආරොචනය කිරීම. ගරුකාපත්ති යකට පැමිණි භික්ෂුව එදින ම අරුණට පළමු අවේරි සහාග භික්ෂුවකට දැන් විය යුතුය. "අවේරිසහාග මත්තමෙව පමාණං" සි ආරොචනය පිළිගන්නහු ගේ අවේරි සහා ගත්‍වය පමණක් පමණ වේ. ආරොචනය කිරීමට අනන්තරාවක් නැතිව එදින ම (= ඇවැත් අවන් දින ම) ආරොචනය නො කෙළේ නම් අනිරෙක වශයෙන් දුකුළා ඇවැතක් ද වේ. ආරොචනය කරන භික්ෂුව විසින් එක් සහාග අවේරි භික්ෂුවක් වෙත එළඹ සිවුර එකස් කොට පෙරව උක්කුටික යෙන් හිඳ ඇඳිලි බැඳ "තුයහං සන්තිකෙ එකං ආපත්තිං ආවිකරොමි" කියා හෝ "ආවිකරාමි" - "ආරොචෙමි" සි හෝ "මම එකං ආපත්තිං ආපන්නං භාවං ජානාහි" කියා හෝ ආරොචනය කළ යුතුය. මෙසේ කෙබඳු ක්‍රමයකින් හෝ සැල කළ කල ඇවැත් ආරොචනය කළේ වේ. වසතුව හෝ ඇවැත හෝ වසතු ආපත්ති දෙක ම හෝ සඳහන් වන සේ ආරොචනය කටයුතුය. "තත්‍ර සුක්කා විසට්ඨි වත්ථුකෙඩ ව ගොත්‍රනාමඩ සඩ්ඝාදි සෙසොති නාමකෙඩ්වව ආපත්ති ච" කා: වි: 49[14] සැ: පා: 871[11] සාර: ම: 43[21] චින: ම: 121[5] ම: පා: සැ: : 22[21]A (ආපත්ති ආවී කරණ බලනු) -**ආරොපන** (නා) = ආපත්ති ආරොපනය. ඇවැත ගෙන හැර පැම. වි: වි: ටී: 446[6] චින: ම: 131[19] . -**ආවිකරණ** (නා) (ආවී + √කර + අන,න = ණ) = ආපත්ති ආවිකරණය, ඇවැත් පැවසීම. "මේ ආවී කරණය ඇවැතින් නැගී සිටීමය, ආරොචනය නිරීමය යි විප්‍රකාර වේ. ඇවැත් දෙසීම ඇවැතින් නැගී සිටීම නම්. ආරොචනය නම් නැවත ඇවැත් දෙසන තුරු මෙනම් ඇවැත කට පැමිණි බැව් දනුවසි දැන්වීමයි. එහි ප්‍රයොජන නම් සාපත්තිකව ප්‍රාතිමොක්ෂය ශ්‍රවණයෙන් සිදුවන දුකුළාවෙන් වැළකීම හා අනියතාදි ඇවැතකට පැමිණි මහණ ඇවැත් දෙසීමෙන් සුඛයට පැමිණීම ද, සඩ්ඝාදිසෙසයකට පැමිණි මහණ වත්මානත් පුරා අබ්භානයෙන් සුඛය ලැබීම ද, පාරාජිකා පත්තියට පැමිණි මහණ සාමණේර භූමියට පැමිණීමෙන් ආයනි භවයට පිහිටක් ලැබීම ද වේ." ම: පා: සැ: 521[25]B. -**උප්පත්තිකාරණ** (නා) = ආපත්තින්ගේ උත්පත්ති කාරණ, ඇවැත් ඉපදීමේ හේතු. සමුට්ඨානසය. 1 කාය 2 වාචා 3 කායවාචා 4 කාය චිත්ත 5 වාචා චිත්ත 6 කායවාචා චිත්ත යනුවෙන් ආපත්ති සමුට්ඨාන සයකි. මෙයින් පළමු තුන අචිත්තකය. පසු තුන සචිත්තකය. "**ආපත්තුප්පත්තිකාරණ** සංඛාතෙහි ඡහි සමුට්ඨානෙහි වා ආපත්තිං ආපජ්ජෙය්‍යාති" බු: සි: ටී: 151[6] කා: වි: 21[33] -**කර** (නා) - ඇවැත් කරන, ඇවැත් වන. අනුප්‍රඥප්තිය. "අනුප්පඤ්ඤත්තිං ච නාමෙසා **ආපත්තිකරා** ච හොති" කා: වි: 33[30] චින, ම: 61[36] - **කරාධම්ම** (නා) = ඇවැත් සිදු කරන කරුණු. සවැදැරුම් ආපත්ති සමුට්ඨා නයෝ ආපත්තිකර ධර්මයෝ වෙත්. "**ආපත්ති කරාධම්මා** නාම ඡආපත්ති සමුට්ඨානානි එතෙසං හි වසෙන පුග්ගලෝ ආපත්තිං ආපජ්ජති තසමා ආපත්ති කරානි වුත්තානා" සැ: පා: 972[21] පරි: පා: 161[15] -**කාරක**

(නා) = ඇවැත් කරන, ඇවැතට හෙතුවන, ඇවැත සිදු කරන. පාරා: පා: 183[4] ස: පා: 411[34] -**කුසලතා** (නා) (කුසල + තා) = ආපත්ති දැනීමෙහි දක්ෂතාවය. පස්වැදෑරුම් වූ ද, සත්වැදෑරුම් වූද ඇවැත් පිළිබඳ මනා දැනීම. "**ආපත්ති කුසලතාති** පඤ්චන්නඤ්ච ආපත්තික්ඛන්ධානං ඤාණං" මනෝ: පූ: 333[22] අඞ්ගු: නි: 51[11] -**ඛන්ධ** (නා) [සං සඛන්ධ > පා: ඛන්ධ] ආපත්තිසඛන්ධය, ඇවැත් සමූහය. 1 පාරාජික 2 සඞ්ඝාදිසෙස 3 ථුල්ලච්චය 4 පාචිත්තිය 5 පාටිදෙසනීය 6 දුක්කට 7 දුබ්භාසිත යන ආපත්තිසඛන්ධ සප්තකය. "සත්තන්නං **ආපත්තික්ඛන්ධානං** අඤ්ඤතරා ආපත්ති" විභ: ම: 37[1] 144[6] ස: පා: 1034[17-69] පරි: පා: 204[18] ක: ළි: 11[21] 57[21] -**ගරුක** (නා) = ගරුකාපත්තිය. සඟ වෙසෙස් ඇවැත. පරි: පා: ගැ: 46[31] (ගරුකාපත්ති බලනු). -**ජදන** (නා) √ ජද + යු = අන) ඇවැත් සැඟවීම. ඇවැත් වැසීම. අලජ්ජි භාවයෙන් නෝ අඤ්ඤ භාව යෙන් **කාය** වාක් දෙකින් **කරන** ඇවැත් සැඟවීම. "අලජ්ජිතාඤ්ඤතරඤ්ඤතාපත්ති කාය වාචානි ජාදයෙ" කු: සි: ස: 126[16] බු: සි: ටී: 152[11] -**ජනන** (නා) = ඇවැත් සැඟවීම. කු: සි: ස:133[1] බු: සි: ටී: 21[10] (ආපත්ති පටිච්ඡන්න බලනු) -**ජනක** (නා) √ජන + ණ්වු = අක) ඇවැත් උපදවන; ඇවැත් සිදුවන කු: සි: ස: 93[13] -**ජානිඝ** (නා) = ඇවැත කුමකින් උපදීද? ආපත්තාධිකරණයේ ආපත්තිය කෙසේ වේද? පරි: පා: 203[13] පරි: පා: ගැ: 22[10] ස: පා: 1005[28] -**ථුල්ලච්චයස්ස** (ක්‍රි) ථුල්ලච්චය + අස්ස) = ථුල්ලච්චය ඇවැත්වේ. තුලාසි නම් ඇවැත වේ. පාරා: පා: 29[35] (**ආපත්ති පාරාජිකස්ස** බලනු) -**දුක්කටස්ස** (ක්‍රි) (දුක්කට + අස්ස) (√අස + ඊ) = දුකුළා ඇවැත් වේ දුක්කට නම් වූ ආපත්තිය වේ දුක්කට නම් වූ ව්‍යති ක්‍රමණයට හෝ පැමිණේ. විභ: ම: 69[25] පාචි: පා: 17[6] ස: පා: 321[24] -**දුබ්භාසිතස්ස** (ක්‍රි) (දුබ්භාසිත + අස්ස) = දුබ්බැසි ඇවැත්වේ. පාචි: පා: 17[22] (ආපත්ති දුක්කටස්ස බලනු) -**දෙසනා** (නා) (√දිස + යු = අන + ආ) = ඇවැත් දෙසීම. අවත් ඇවැත් අත් භික්ෂූවක් ඉදිරියේ කිම. **ආපත්ති** දෙශනාව තෙ වැදෑරුම් වන්නීය. 1 පාරාජිකාපත්ති දෙසනා, 2 ගරුකාපත්ති දෙසනා 3 ආපත්ති දෙසනා යනුවෙන්. පරිජි අවත් මහණක් භික්ෂූභාවය අත් හැරීම පාරාජිකා දෙසනා නම්. සඟ වෙසෙස් ඇවැතකට පැමිණියකු ඒ ඇවැතින් තැගීම ගරුකාපත්ති දෙසනා නම්. මෙහි ආපත්ති දෙසනා (=ඇවැත් දෙසීම) යනු වෙන් අදහස් කරනුයේ ථුල්ලච්චයාදි ඇවැත් දෙසීමය. ගරුකාපත්තියකට පැමිණි භික්ෂූව එයින් පිරිසුදුවීම පිණිස විනය කම් කිරීමේ දී පැමිණි ඇවැත භික්ෂූවකට ආරොචනය නො කර ගතකළ දින ගණනට පිරිවෙස් පිරිය යුතුය. ඇවැතට පැමිණි දිනම එය අත් භික්ෂූවකට ආරොචනය කළහොත් සදිනක් මානත පුරා අබ්භාන **කම්ම** කර ගැනීමෙන් පිරිසුදු විය හැකිය. ගරුකා පත්තිය දෙශනා ගාමිනී නොවේ. උට්ඨාන ගාමිනීය එහෙත් ගරුකාපත්ති සඳහා වත් පුරන්නට නො වනු පිණිස ද, වත් පිරීමේ දින ගණන අඩු කරගනු පිණිස ද ඇවැත් දෙසන සියලුම අවස්ථාවලදී ගරුකාපත්ති ආරොචනය කිරීම මැනැවි. එසේ කිරීමේ දී තමා පැමිණි ගරුකාපත්තිය නිශ්චය වශ යෙන් දන්නේ නම් ඒ ඇවැතේ නමම ගෙන ආරොචනය **කරනු** වටී. තමා කෙතෙක් ගරුකාපත්තීන්ට පැමිණියේදැයි නිශ්චය වශයෙන් නො දන්නේ නම් තමන් පැමිණි සියලුම ඇවැත් ආරොචනය **කරමි**" යන අදහසින් "සබ්බාපත්තියො ආවිකරොමි" හෝ "සබ්බාපත්තියො ආරොචයාමි" කියා හෝ ආපත්ති ආරොචනය කොට පසුව අනෙක් ඇවැත් දෙසිය යුතුය. "ආපත්තිං දෙසෙන්තෙන පන අත්තනො අපච්චක්ඛිකං නිකඛිපං උපසඞ්කමිත්වා සක්කච්චං නිවාසෙත්වා සක්කච්චං පාරුපිත්වා තස්ස සන්තිකෙ උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා" යනු බැවින් ඇවැත් දෙසන්නහු විසින් තමන් හා සහාග වූ භික්ෂූවක් වෙත එළඹ සකසා හැඳ පෙරව ඔනු වෙන උක්කුටුක යෙන් හිඳ දොහොත් මුදුනේ තබා පළමුව තමා අවත් ලහුකාපත්ති කියා "මේ ඇවැත් මුල් කොට දැන නොදැන අවත් ලහුක විස භාග ඇවැත් නුඹ කෙරෙ දෙසමි"යි ආරොචනය කොට "අහංභන්තෙ සම්බහුලා නානා වත්ථුකා ආපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමි" යි දෙසිය යුතුය. පිළිගන්නහු විසින් "පස්සසි ආවුසො තා ආපත්තියො" යි ද, දෙසන්නහු "ආමභන්තෙ පස්සාමි" යි ද

උපෝසථික (නා) (උ + පකඛ) = හින්නෙන් දුවුණු සිරුරු ඇති, එබන්දහු. 'ඉදඟං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔතරන්තො අද්දස ඉත්ථිං **උපෝසථිකං** ඔකිලිනිං ඔකිරිනිං" පාරා: පා: 114[17] සා: පා: 363[32] (උපකඛ යි ද දක්නේය.)

උපෝසථික මුඛ (නා) = මහත් උඩු තොල් ඇති මුහුණින් යුතු, එබඳු පුද්ගලයා. පැවිදි නො කළ යුතු පරිස දූෂකයෙක්. "එළමූඛො වා **උපෝසථික මුඛො** වා" සා: පා: 768[30] හෙ: සි: ව්: 126[3]

උපෙජ්ජති (ක්‍රි) (උ + √පද + ය + නති) = උපදින්, හටගනින්. (අති: **උපජ්ජ** වර්: **උපජ්ජති** අනා: **උපජ්ජිස්සති** සම්: **උපජ්ජෙය්‍ය** පම්: **උපජ්ජතු** පූ: ක්‍රි: **උපජ්ජිත්වා** තුං: **උපජ්ජිතුං** වක්‍රා: **උපජ්ජමෙනා** සත්‍රී: ලි: **උපජ්ජමානි** කර්මා: **උපජ්ජිතබ්බා - තබ්බා - තබ්බං** = ඉපදිය යුතු) ජා: අ: ගැ: 14[22] පාරා: පා: 262[17]

උපෙට්පාවි (නා) (උ + පවිපාවි) [සං. උත්පරිපාවි] = උපිළිවෙළ. පිළිවෙළ ඉක්ම, ක්‍රම විරොධිව. සා: පා: 354[36] ජා: අ: ගැ: 48[31] ක: ව්: පි: 80[17]

උපෙණ්ඩනා (නා) = අපහාස කිරීම, නින්දා කිරීම. චි: මා: සා: 79[31-37] ව්: ම: ටී: 478

උපෙණ්ඩිත (නා) (උ + පණ්ඩිත) = නින්දා කරන ලද. කෙළි කවටකම් කළ. "තථාහි පනාහං ආවුසො ඉමෙසං එළක ලොමානං කාරණා මනුස්සෙහි **උපෙණ්ඩිතොති**" පාරා: පා: 262[25]

උපෙණ්ඩියමාන (නා) = නින්දා කරනු ලබන. කෙළි කවටකම් කැරෙන. "**උපෙණ්ඩියමානො** මඬ්කු අහොසි" පාරා: පා: 262[20] පාචි: පා: 380[9] මහා: පා: 330[3]

උප්පණ්ඩුප්පණ්ඩුකජාතො (නා) (උ + පණ්ඩු + පණ්ඩු + ක) = පඬුවන් පැහැ ඇති වූයේ, හට ගත් ඉතා පඬු පැහැඇත්තේ. ඉදී රත්පැහැවූ

පත්‍රයක් මෙන් සුදුමැලිවූයේ. "සො දුනි තං එතරහි කිසො ලූඛො දුබ්බණ්ණො **උප්පණ්ඩුපණ්ඩුක** ජාතො ධමනිසන්ථත ගත්තො" පාරා: පා: 17[38] සං: පා: 150[2] සාරා: ම: 14[7] ජා: අ: ගැ: 84[23] වි: වි: ටී: 370[1] මහා: පා: 313[17] ධ: අ: ගැ: 113[22] 268 [18]

උපණෙඬති (ක්‍රි) (උ + √පඬ් + ණෙ + ති) = කෙළි කවට කම් කරයි. නිතු කරයි. "උදුසිතා සඬ්ං උණ්හසන්තිපි -පෙ- **උපණෙඬන්ති** පි" - "දෙව්යො දිස්වා **උපණෙඬන්ති** උතුනී දුනි දෙවො පුප්ඵං දෙවස්ස උප්පන්නං" පාරා: පා: 150[8] මහා: පා: 249[38] 310[25] සං: පා: 390[9] ධ: අ: ගැ: 177[4]

උපණෙඬන්තා (පු: ක්‍රි:) = කෙළිකවට කම් කොට, නිතුකොට. ධ: අ: ගැ: 91[31]

උපණෙඬසුං (ක්‍රි) = කවට කම් කළහ. සිනහ සුණාහ. "මනුස්සා තං භික්ඛුං පස්සිත්වා **උපණෙඬසුං**" - "තා භන්තෙ වෙස්සා භික්ඛුනියො **උපණෙඬසුං**" පාරා: පා: 262[19] මහා: පා: 329[16] සං: පා: 497[10] ධ: අ: ගැ: 177[4]

උපතන (නා) (උ + √පත + යු = අන) [සං. උත්පතන] = 1 උත්පත්තිය, ඉපදීම. 2 උඩිව ගමනය, උඩට යෑම. අ: ප: ස: 151[24]

උපතිත්වා (පූ: ක්‍රි) (උ + √පත + ඉ + ත්වා) = උඩට වැටී, උඩ පැන. (අනී: **උපතී** වනී: **උපතන්ති** අනා: **උපතිස්සති** සමී: **උපතෙය්‍ය** පමී: **උපතතු** පූ: ක්‍රි: **උපතිත්වා** තුං: **උපතිතුං** වකෘ: **උපතතෙනා** අතී: කෘ: **උපතිතෙනා** කම්: කෘ: **උපතමානෙනා** = උඩට වැටෙනු ලබන්නේ, උඩ පනිනු ලබන්නේ)" "තස්ස තෙ අසි **උපතිත්වා උපතිත්වා** තස්සෙව කායෙ නිපතන්ති" - "තතො පපටිකා **උපතිත්වා** භගවතො කායෙ රුහිරං උප්පාදෙසි" පාරා: පා: 113[12] චූ: පා: 320[28]

උපතති (නා) (උ + √පත + ති) [සං. උත්පත්ති] උත්පත්තිය, ඉපදීම. අ: ප: ස: 14[22]

උපථ (නා) [සං. උත්පථ] = නොමඟ, අමාගීය "**උපථෙන**, නො මඟින්, වලිනැසි සේයි" "**න උපථෙන** ගච්ඡෙත්තා -පෙ- සික්ඛා **කරණීයා**" ජා: අ: ගැ: 116[20] ක: වි: 155[29] අ: ප: ස: 28[5] ප්‍රා: පු: ස: 107[25] **-ගමන** (නා) කොමඟ යෑම. සඳ හිරු නැකැත් තරු නො මඟින් යෑම. "චන්දිමසූරියානං **උප්පථගමනං** භවිස්සති" දී: නි: 8[18] **-චාර** (නා) = නොමඟ යෑම. ධ: අ: ගැ: 235[10] 256[33]

උපපන්න (නා) [සං. උත්පන්න] = 1 උපන්, ඉට ගත්. 2 විෂකාඝාතය නො කළ, යටපත් නො කළ. "**උප්පන්නුප්පන්නෙන** පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති" පාරා: පා: 69[29] සං: පා: 291[32]

උපපබ්බජිත (නා) (උ + පබ්බජිත) = පැවිදි කම්හි හිලිහුණු, සිවුරුහළ, "**උපපබ්බජිතො** ගිහීවි" ධ: අ: ගැ: 99[23] 34[23]

උපපබ්බාජෙතා (පූ: ක්‍රි:) (උ + ප + √වජ් + ණෙ + ත්වා) = උපැවිදි කරවා. සිවුරු හරවා (අනී: **උපපබ්බාජෙසි** වතී: **උපපබ්බාජෙති** අනා: **උපපබ්බාජෙස්සති** සමී: **උපපබ්බාජෙය්‍ය** පමී: **උපපබ්බාජෙතු** තුං: **උපපබ්බාජෙතුං** පූ: ක්‍රි: **උපපබ්බාජෙත්වා** වකෘ: **උපපබ්බාජෙතෙනා** කම්: කෘ: **උපපබ්බාජෙතබ්බා - තබ්බා - තබ්බං** = උපැවිදි කළයුතු, සිවුරු හැරවිය යුතු) ජා: අ: ගැ: 63[17] ධ: අ: ගැ: 32[25] 194[20]

උපල 1 (නා) [සං. උත්පල] = එනම් සඛ්‍යාව, ගණනක්. අ: ප: ස: 65[11]

උපල 2 (නා) [සං. උත්පල] = උපුල්. දියෙහි හටගන්නා මල් විශෙෂයක් "අපෙපකච්චානි **උප්පලානි** වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙජානානි" අ: ප: ස: 92[22] මහා: පා: 6[2] **-ගන්ධ** (?) **පච්චත්ථිකා** (නා) =මිනිසුන්ගේ හදවත් උපුටමින් මං පැහැරීම් ආදිය කරන්නෝ. මෙහි ගන්ධ ශබ්දයෙන් කියවෙනුයේ හෘදය වස්තුවයි. **උප්පල** යනු උපුටාලීමයි. දෙව්යනට බිලියම් පිණිස මිනිසුන්ගේ හදවත් උපුටමින් එයින් දෙව්යන් පුදමින් මං පැහැරීම් ආදිය කරන්නෝ **උප්පලගන්ධ පච්චත්ථිකයෝ** නම් වෙත්. පාරා: පා: 33[28] සං: පා: 192[22] **-පත්ත** (නා) [සං. පත්‍ර] = උපුල් පතක් උපුල්මල් පෙත්තක්. "අන්තමසො **උප්පලපත්තෙනපි** මුත්තකරණෙ පහාරං දෙති" පාවි: පා: 292[22] 293[14] සං: පා: 687[16] **-මාලා** (නා) = උපුල් මල් දම. සෙය්‍යථාපි භන්තෙ ආනන්ද -පෙ- **උප්පලමාලං වා** වස්සිකමාලං වා -පෙ- ලභිත්වා චූ: පා: B. 416[4] චූ: පා: 393[23] **-හත්ථ**

(නා) = උපුල් මල් මිටිය. "ඉමං භන්තෙ භගවා පඨමං **උප්පලහත්ථං** උපසිඞ්කතු" මහා: පා: 3174 ම: පා: ස: 80416 සා: පා: 82925

උප්පාටෙති (ක්‍රි) = උපුටයි, උදුරයි. "**උප්පාටෙති**, උපුරන්නේයි - උපුට දමන්නේයි සේයි" ජා: අ: ගැ: 744

උප්පාටෙත්වා (පූ: ක්‍රි:) (උ + √පුට + ණෙ + ත්වා) උපුටා, ගලවා. "ඡව්ං **උප්පාටෙත්වා** හරන්ති" චූ: පා: B. 206

උප්පාත (නා) [සං. උත්පාත] = එක් නිරඟවීන විද්‍යාවක්] උලකාපාත පෘථිවිකම්පනාදිය කියන විද්‍යාව. "**උප්පාතං**, උලකාපාත දිග්දාහ භූමි චාලාදි උත්පාත ප්‍රතිබද්ධ විද්‍යාසි" වි: මා: ස: 844=21 වි: ම: ටී: 4717 (**උප්පාද**) යි ද දක්නේය. සු: වි: 679) (**උප්පාද** බලනු.)

උප්පාද 1 (නා) [සං. උත්පාද] = අසනිපාත පෘථිවි කම්පනාදිය. සත්ත්වයන්ට පැමිණෙන ඉෂ්ටානිෂ්ට ආදිය ප්‍රකාශ කරන පෘථිව්‍යාදි භූතයන්ගේ විකාරය. එක් තිරශ්චීන විද්‍යාවක් "තෙ එවරූපාය තිරච්ඡාන විජ්ජාය -පෙ- අඞ්ගං නිමිත්තං **උප්පාදං** සුපිනං "දී: නි: 714 සු: වි: 679 අ: ප: ස: 557 (මෙහි නිදසුන් පිණිස දැක්වූ පාඨය වි: මා: ස: 844 වි: ම: ටී: 4711 දක්නේ උපපාත යනු වෙනි) (උපපාත බලනු)

උප්පාද 2 (නා) [සං. උත්පාද] = උපන්. ඉපදීම හට ගැන්ම. ධ: අ: ගැ: 1617 **-වය** (නා) [සං. ව්‍යය] = උත්පත්තිය සහ විනාශය. "**උප්පාදවය** ධම්මිනො, උදයවය පිහිටි පියවි ඇතියවුහු" සංඝකාර ලක්ඛණය. ධ: අ: ගැ: 3423

උප්පාදින (නා) [සං. උත්පාදින] = උපදවන ලද. හට ගැන්වූ "සුදිත්තෙන කලඤ්ඤපුත්තෙන අබ්බුදං **උප්පාදිතං** ආදීනවො **උප්පාදිතො**" පාරා: පා: 1714

උපසිලාවිත (නා) = ඉපිලෙන බව. අනි: ධ: ප්‍ර: 1079 23 1081 24 (උබ්බිල්ලාවිත බලනු)

උපසීළෙත්වා (පූ: ක්‍රි:) = පෙළා. "**උපසීළෙත්වා** පෙළයි. පසින් යතයි යූසේසි" ධ: අ: ගැ: 22223

උබ්බට්ටන (නා) = ඉළීම. **ඇඟ ඉළීම**. අ: ප; ස: 4135 සා: පා: 70920

උබ්බට්ටාපෙති(ක්‍රි)(උ + √වට්ට + ණාපෙ + ති)= ඇඟ උළයි. ශරීර සම්බාහනය කරවයි. "**උබ්බට්ටෙත්වා**, උළා" - "**උබ්බට්ටාපෙය්‍ය**, උලවාද," - **උබ්බට්ටෙත්වා**, උළය්" පාචි: පා: 3838-33 කං: මි: පි: 14513 සා: පා: 70919 ජා: අ: ගැ: 4817 ධ: අ: ගැ: 26013

උබ්බට්ඨක? (නා) = උඩ සිවි. එසේ උඩ සිවින එක් අවෙලක කොටසක්. මතො: පූ: 46428 අඞ්ගු: නි: 1819 (පපඤ්ච සූදනි (හේ: වි:) 3229 "උබ්බට්ඨක" යි දක්නා මේ වචනය "**උබ්භට්ඨක**" යි විය යුතුය) (උබ්භ බලනු)

උබ්බත්තෙත්වා (පූ: ක්‍රි:) (උ + √වතු + එ + ත්වා) පෙරළා. උපුටා. "**උබ්බත්තෙත්වා**, පෙරළා නොහොත් හුපුල්ලා" ජා: අ: ගැ: 22021 ධ අ: ගැ: 10128 35115

උබ්බදඛපිණඩික (නා) = උඩට නැඟුණු මස් පිඬු ඇති උඩට හෝ පහතට නෙරාගිය ජඞ්ඝා ඇතියහු. පැවිදි නො කළ යුතු පරිස දූෂකයෙක්. සා: පා: 76913

උබ්බසති (ක්‍රි) (උ + වසති) = වතයෙහි වෙසෙයි "**උබ්බසති**, වල වෙසෙයි" ජා: අ: ගැ: 127.

උබ්බාහාපෙතබ්බං (නා) = උ + √වහ + ණාපෙ + තබ්බ = එකතු කරවිය යුතුයි. රැස් කරවිය යුතුයි. රැස් කරවා ගෙන්විය (=ඇදවිය) යුතුයි. "ලවාපෙත්වා **උබ්බාහාපෙතබ්බං උබ්බාහාපෙත්වා** පුඤ්ඤං කාරාපෙතබ්බං" චූ: පා: 30528

උබ්බාහිකා (නා) (උ + බාහිකා) = වෙන් කිරීම. "අධිකරණයක් විනිශ්චය කිරීමට රැස්වූ සඞ්ඝයා අතරින් විමසා බලා එහිදී කථා කිරීමට සුදුසු භික්ෂූන් සම්මත කරගත් පසු අනෙක් භික්ෂූන් කිසිවක් කථා නො කළ යුතුයයි කතිකාවත් කිරීම උබ්බාහිකා නම් වේයි. අසම්මත භික්ෂූන් කථාවෙන් බැහැර කිරීම මෙහි පරමාර්ථය යි" කඞ්ඛති දුතිය කම්ම වාක්‍යයෙන් අධිකරණ විනිශ්චය පිණිස සඞ්ඝයා සම්මත කරගත් පසු ඒ පිරිසෙහි අන් කිසිවකු කථා නො කළ යුතුයයි අස්වා අධිකරණ විනිශ්චය කළයුතු. "උබ්බහන්ති වියොජෙන්ති එතාය අලජ්ජිනං තජ්ජනිංවා කලහංවාති = **උබ්බාහිකා**. සඞ්ඝ සම්මුති-පෙ -තෙහි සම්මතෙහි විසුං වා නිසීදිත්වා තස්සා එව වා පරිසාය අඤ්ඤෙහි න කිඤ්චි කථෙ

තබ්බන්ති සාවෙත්වා තං අධිකරණං විනිවිජ්ඣ තබ්බං'' –**"උබ්බාහිකාය,** තේරීම පිණිස" – "දසහඞ්ගෙහි සමන්නාගතෝ භික්ඛු **උබ්බාහිකාය** සම්මන්නිතබ්බෝ'' චූ: පෘ: B. xii 4 (උ: ඉ:) වි: වී: ථී: 2397 පරි: පෘ: ගැ: 3521 ස: පෘ: 88620 චූ: පෘ: 2005 2012 44816 ක: වී: 15710 සාර: දී: 69128 **-විනිවිජ්ඣය** (නා) = භික්ෂූන් දෙතුන් නමක් තෝරාගෙන කරන විනිශ්චය. චුල්ලවග්ගපාළි සමථක්ඛන්ධකයෙහි "සීලවාහොති" ආදී අඞ්ග දශයෙන් යුක්ත භික්ෂූන් දෙතුන් නමක් තෝරාගෙන කරන අධිකරණ විනිශ්චය. විනි: ම: 25026 චූ: පෘ: 2004–24 ක: වී: පි: 10512 ක: වී: 15719

උබ්බාළහ (නා) (උ + බාළහ) [සං. බාඪ > පෘ: බාළ්හ] = පෙළුණු, පීඩාවූ. කළ කිරුණු. හිරිහැරයට පැමිණි. "සෝ භික්ඛු තස්ස සකුණ සඞ්ඝස්ස සදෙදන **උබ්බාළෙහා**" – "ඉමෙහි **උබ්බාළෙහා** භගවා පකාසෙන්තා" – "ආවාසෙ වසසූපගතා භික්ඛූ වාළෙහි **උබ්බාළහා** හොන්ති"–"**උබ්බාළහස්ස,** -බාධිත යහට" – "**උබ්බාළහා,** පෙළුන ලදුවෝ?" "**උබ්බාළහා,** පීළිතා" පාරා: පෘ: 17313 මහා පෘ: 16534 40824 ස: පෘ: 4061–8 චූ: පෘ: 23029 වි: මා: ස: 43339 ධ: අ: ගැ: 10720 22227 ජ: අ: ගැ: 7711

උබ්බිගග (නා) [සං. උද්විගන > පෘ: උබ්බිගග] = බියෙන් කම්පාවන, බියෙන් වෙවුලන. "භගවතෝ අවිදූරෙ ඨිතෝ **උබ්බිගගෝ** උසසඞ්කී උත්‍රසෙතා පත්ථෙධින කායෙන අට්ඨාසි" "-**උබ්බිගග** හදයෝ, බියෙන් කම්පන ළඳැනියහු" චූ: පෘ: 31913 ධ: අ: ගැ: 12930

උබ්බිජ්ජනති (උ + √ජිජ + නති) = බිය වෙත්, කම්පා වෙත්. කලකිරෙත්. "මනුසසා පසසිත්වා **උබ්බිජ්ජනතිපි** උත්තසන්තිපි පලායනතිපි" – "**උබ්බිජ්ජිංසු,** කලකිරුනාහු" මහා: පෘ: 836 ම: පෘ: ස: 26818 ජා: අ: ගැ: 14828

උබ්බිනය (නා) (උ + විනය) = විනය විරුඬ. විනය පෙරළා. "උදධම්මං **උබ්බිනයං** කත්වා, පහකොට, ධර්ම විනය පෙරළා යසි සේසි" – ක: වී: පි: 169 ස: පෘ: 76431 සාර: දී: 38226 විනි: ම: 4733 ක: වී: 183

උබ්බිල්ල (නා) [බෙෂ: සං: උද්විල්ය=ඕඉද්විල්ය] [සං. උද් + වෙලා? උද්පලව?] = 1 ඉපිලීම. අධික සන්තොෂය. 2. උඩඟුකම. උද්ඝාතය. පෘ: සු: 13730

උබ්බිල්ලාවිත (නා) [සං. උද් + පලවිත] = 1 ඉපිලෙන සුභාවය ඇති. 2 උඩඟුවූ හෝ. "**උබ්බිල්ලාවිතෝ** භාවෝ=උබ්බිල්ලාවිතත්තං -පෙ- උඩ්ඩවභාවාය **උබ්බිල්ලාපන** පීතියා එතං අධිවචනං" – "**උබ්බිල්ලාවිතෝ** හුත්වා, උඩඟු සොරුප ඇතිව" – "**උබ්බිල්ලාවිතා කාරං,** ඉපිලෙන ආරක්" – "උග්ඝාතෝ **උබ්බිල්ලාවිතත්තං**" -"ඉෂ්ටයෙහි ඉපිලීමටද" -"සිත්හුගෙ මැලිනභාවය සංක්ෂෝභය උබ්බිල්ලභාවය යන මොවුන් කරන්නා වූ නීවරණාදීන් කෙරෙන්" – සු: වි: 4116 ජා: අ: ගැ: 11727 ධ: අ: ගැ: 8023 වි: මා: ස: 38412 9189 ස: පෘ: 107 සාර: දී: 338 (අභිධම්ම ප්‍රදීපිකා සමෙමාහවිනොදනී ව්‍යාඛ්‍යායෙහි **"උබ්බිල්ලාවිත"** යනුවට **"උපපිලාවිත"** යනු ශුඛ පාඨය මෙන් ගෙන ඇත. එහි මෙසේ ද දක්නේය. **"උපපිලාවිත** නම් උදග්‍රතා (ඔද වැඩි බැව්) සඞ්ඛ්‍යාත නොසන්සුන් බවයි. වික්ෂෙපයට නොසන්සුන් බවට හෙතුවූ හෝ ප්‍රීතියගේ ප්‍රවෘත්ති ආකාරයෙකි. -පෙ-උපපිලාවිතන්ති උදග්ගතා සඞ්ඛාතෝ අවූපසමභාවෝ" යි දක්වා අවසානයෙහි මෙසේද කියති. "සිංහල පොත්හි **"උබ්බිල්ලාවිතං"** යන පාඨය දක්නා ලැබේ. හේ විමසිය යුතුයි" අභි: ධ: ප්‍ර: 208124) (උපපිලාවිත බලනු)

උබ්බි (නා) [සං. උර්වී] = පොළොව. අ: ප: ස: 2615

උබෙබජනීය (නා) (උ + √ජිජ + අනීය) = බිය උපදවන. **"උබෙබජනීයෝ,** ඇසුදුටුවන්ට භය උපදවන්නේ යි" ධ: අ: ගැ: 611 ජා: අ: ගැ: 8031 11327

උබෙබග (නා) (උ + වෙග) [සං. උද්වෙග] = ලොමු ඩැහැ ගන්නා භය. "එවිගස ලොමු දැ ගන්නා භය **උදෙවග** නම් වේ." ජා: අ: ගැ: 6312 (උත්තානස) බලනු) **-පීති** (නා)= උද්වෙග ප්‍රීතිය. උත්ක්ෂෙපිකා ප්‍රීතිය. පස් වැදෑරුම් ප්‍රීතීන්ගෙන් එකක්. ශරීරය අහසට නැංවීමට තරම් වෙගවත් වූ ප්‍රීතිය. ජා: අ: ගැ: 2628 වි: මා: ස: 34622 34819 34714 9287

උඹ (නා) [සං. ඌර්ධ්ව]= උඩ, උඩපෙදෙස. "උඹ ශබ්දය ඌර්ධ්ව පර්‍යායයි" ක: ටී: පි: 132[15] (සං. ඌර්ධ්ව ශබ්දය පාළියෙහි **උද්ධ, උඹ, උඬ්ඪ** යන රූපත්‍රයෙන්ම දක්නේය. "උද්ධං පාදතලා අධෝ කෙස මත්ථකා" ආදී තන්හි "උද්ධ" ශබ්දය ද, **"උඹඨඨානං"** ආදී තන්හි **"උඹ"** ශබ්දය ද යෙදී ඇත **"උඬ්ඪ"** ශබ්දය ප්‍රාකෘතයෙහි ප්‍රකටය. සිංහලට "උඩ" යන ශබ්දරූපය ලැබෙනුයේ මේ **"උඬ්ඪ"** රූපය ඔස්සේය.) - **'අකඹක** (නා) (අකඹ + **ක**) [සං අක්ෂක] = අකු ඇවින් උඩ. අකු ඇවින් උඩ, දනින් පාත සත්‍රියක ගේ ගුණ අයුණු විසින් තුළුල් තෙපුල් කියන භික්ෂුවට දුකුළා ඇවැත් වේ. 2 අකු ඇවින් උඩ රාග සහිත පුරුෂයකුගේ කයින් කය ආමශීනය කරන මෙහෙණට ථුලැසි ඇවැත් වේ. පාරා: පා: 145[38] පාචි: පා: 239[15] සා: පා: 391[33] 671[24] සි: ව: ටී: 27[19] වින: ම: 98[22] ක: ටී: 36[22] - **කප්පර** (නා) [සං. කූර්‍පර] = වැලමිටින් උඩ. දෙවෙනි. මහා සඤ්ඤයෙන් උඩ. යම් මෙහෙණක් රාසින් ඇතිව එබඳු පුරුෂයකුගේ අකු ඇවින් යට දන මඩලෙන් උඩ ආමසන පරාමසනාදිය ඉවසා නම් ඇයට පරිජි ඇවැත් වේ. දන මඩලින් උඩ (උඹහ ජානු මණ්ඩල) සි කී බැවින් වැලමිටින් උඩ ද එයින් ම කිවා වේ. **"උඹහකප්පරම්පි** උඹහජානු මණ්ඩලෙනෙව සඞ්ගහිතං"සා: පා: 670[34] පාචි: පා: 238[27] ක: ටී: 160[5] වින: ම: 272[9] - **ජානු මණ්ඩල** (නා)= දන මඩලෙන් උඩ. 1 සත්‍රිය කගේ වසමග පසමග තබා අකු ඇවින්යට දනමඩලෙන් උඩ ගුණා ගුණ කියන භික්ෂුවට ථුලැසි ඇවැත් වේ. 2 යම් මෙහෙණක් කාය රාගයෙන් තෙත්ව තමා අකු ඇවින් යට දනින් මත්තේ කාය සංසර්ගී රාගයෙන් තෙත් පුරුෂයකුගේ කායඋපස්‍ථාදිය ඉවසා නම් ඇය පරිජි වේ. සා: පා: 391[32] 657[14] 670[34] පාරා: පා: 145[36] පාචි: පා: 238[8-27] සි: ව: ටී: 28[32] වින: ම: 98[21] ක: ටී: පි: 27? -**ජානුමණ්ඩලික** (නා) = භික්ෂුණීන්ට සාධාරණ එක් පාරාජිකාවක්. සූවිසි පාරාජිකාවන්ගෙන් හෝ භික්ෂුණීන්ට සාධාරණ අෂ්ට පාරාජිකාවන්ගෙන් හෝ එකක්. කාය සංසර්ගී රාගයෙන් තෙත් වූ මෙහෙණක් එබඳු පුරුෂයකු විසින් තමා අකු ඇවින් යට දන මඩලින් උඩ කරන කාය සංසර්ගීය ඉවසා නම් පරිජි ඇවැත් වන්නේ යයි පැණවූ ශික්ෂාපදය. **"උඹහජානු මණ්ඩලිකාති** ඉදං පන ඉමිස්සා පාරාජිකාය නාමං" සා: පා: 671[2] පාචි: පා: 238[10] සාර: දී: 638[2]

උඹඨඨක (න) (උඹහ + ඨ + ක) = උඩ සිටි එක් අවෙලක පිරිසක්. **"උඹඨඨකොපි** හොති ආසන පටික්කිත්තෙහා" අඞ්ගු: නි: 181[6] මනෝ: පූ: 464[23] (උඹඨඨක බලනු)

උඹහණ්ඩික (නා) = ඔසවා ගත් බඩු පොදි ඇති. බඩු පොදි ඔසවා ගත්තවුන් සේ පෙණෙන. "අදද්‍දස බෝ භගවා -පෙ- සමඹහුලෙ භික්ඛූ චීවරෙහි **උඹහණ්ඩිතෙ"** මහා: පා: 324[34] ම: පා: සා: 820[11] 821[11] සා: පා: 836[13]

උඹහත (නා) (උ + හත) [සං. උද්ධෘත] = උදුළ, උඩරණය කළ. කසීනය උඩරණය කළ. අෂ්ට මාතෘකාවන්ගෙන් එකකින් හෝ අන්න රූබහාරයෙන් හෝ උඩරණය කළ "උඹහතෙ උදුළකල්හි" - **"උඹහතංකිර** තසම්ං ආවාසෙ කසීනං" ක: ටී: පි: 437 මහා: පා: 289[32] සා: පා: 460[18] 824[33] වින: ම: 132[17]

උඹහතං කසිනං තිණ් (නා) = "නිටසිත චීවරසම්ං පන භික්ඛුනා උඹහතසම්ං කසිනෙ" යනාදි ශික්ෂාපද තුණ. සා: පා: 965[34] පරි: පා: 18[3]

උඹහාර (නා) = උඩරණය කිරීම. කසීනය උඩරණය කිරීම. අට්ඨමාතිකා උඹහාර, අන්තරූබහාර යනුවෙන් ලැබෙන දෙවැදෑරුම් කසීනුබහාරය. "අට්ඨිමා භික්ඛවෙ මාතිකා කසිනස්ස **උඹහාරාය"** - **"උඹහාරො** දුවිධො අට්ඨමාතිකා උඹහාර අන්තරූබහාර වසෙන"- **"උඹහාරා** උඩරණං" මහා පා: 285[15] ටී: ලං: 379[27] 380[11] වින: ම: 132[19] 136[5] -**මූලික** (නා) = උඹහාරය මුල්කොට ඇති, උඹහාර මූලක කසීනුද්ධාරය. **"උඹහාර මූලකො** අපෙපා එවරූපො න දූතබෙබා" සා: පා: 695[31] 696[1]

උඹහිද (නා) = එනම් ලුණු වර්ගය. පස්වැදෑරුම් හෝ දෙවැදෑරුම් ලුණුවලින් එකක්. වැලි ගැරූ ලුණු. සුවඳ ලුණු. "යම්කිසි පෙදෙසක බිම කෙරෙන් උඩට නැඟි ලුණුමැටි පුලුස්සා නිපදවා ගත් ලුණු වර්ගයකි." - "අනුජානාමි භික්ඛවෙ ලොණානි හෙසජ්ජානි සාමුද්දං කාළලොණං සිඞ්ගවං **උඹහිදං** බිළාලං" මහා: පා: 236[27] පරි: පා: 165[6] අ: ප: සා: 63[18] පරි: පා: ගැ: 12[29] ම: පා: සා: 646[30] ටී: ටී: ටී: 430[12]

උබහුජ්ජිකා (පූ: ක්‍රි:) = ඔසවාගෙන, සිවුර උස්සා ගෙන "තෙන ඛෝ පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ -පෙ- **උබහුජ්ජිකාපි** පවිසන්ති" චූ: පා: 353[23] චූ: පා: B. 292[6] 293[7] පාරා: පා: 40[23]

උභ (නා) = දෙක. විසඞ්ඛ්‍යාව. උභ ශබ්දය විශබ්ද වාචී වූයේ බහු වචනාන්ත ද වේ. රූ: සි: සා: 374[1]

උභතෝ (නි: නි:) = උභය පාර්ශ්වයෙන්, දෙපසින්. ක: වි: පි: 16[16] **-අවස්සුත** (නා) = දෙපසින් තෙත් වූ. භික්ෂුණීය ද පුරුෂයා ද යන දෙපසින් ම කාය සංසර්ගයෙන් තෙත් වූ. උබහතූනු මණ්ඩලික පාරාජික ශික්ෂාපදයෙහි පරිජි ඇවැත්වීමේ එක් අඞ්ගයක්. **"උභතෝ අවස්සුතෙ** -පෙ- ආපත්ති පාරාජිකස්ස" පාචි: පා: 239[8] සා: පා: 671[5] **-කාජ** (නා) = දෙකෙළවර කද, දෙකළවර බර එල්වූ කද, තොග ඉසිලිය යුතු කදක්. "න භික්ඛවෙ **උභතෝ කාජං** හරිතබ්බං" චූ: පා: 251[23] කු: සි: සා: 124[10] වි: වි: 2818 චූ: පා: B. 728[21] **-ධාරා** (නා) = දෙපැත්තම කැපෙන මුවහත ඇති. දෙදිසායෙන් මුවහත් ඇති ජා: අ: ගැ: 421[1] **-පඤ්ඤත්ති** (න) = උභතෝ ප්‍රඥප්තිය. භික්ෂු-භික්ෂුණී දෙපක්ෂයට සාධාරණව පැණවූ ප්‍රඥප්තිය. නව වැදෑරුම් ප්‍රඥප්තීන්ගෙන් එකක්. "උභින්නම්පි පඤ්ඤත්තත්තා **උභතෝ පඤ්ඤත්ති**" සා: පා: 959[25] ක: වි: 21[17] පරි: පා: 1[5] වින: ම: 59[33] **-පඤ්ඤත්ත** (නා) = දෙපසින්ම හෝ දෙදෙනා විසින්ම පැහැදුණු. උපාසක-උපාසිකා යන දෙදෙනම පහන් වූ. "සාවත්ථියං අඤ්ඤතරං කුලං **උභතෝ පඤ්ඤත්තං** හොති" පාචි: පා: 199[3] සා: පා: 659[9] **-බ්‍යඤ්ජන** (නා) = සත්ත්‍ව නිමිත්ත සහ පුරුෂ නිමිත්ත යන දෙකින් ම යුක්ත වූ. උභතෝ බ්‍යඤ්ජනකයා. පැවිදි උපසපන් ලැබීමට නුසුදුසු එක් අභව්‍ය පුද්ගලයෙක්. **"උභතෝ බ්‍යඤ්ජනකෝ** භික්ඛවෙ අනුපසම්පන්නෝ න උපසම්පාදෙතබ්බෝ, උපසම්පන්නෝ නාසෙතබ්බෝ" මහා: පා: 996 කු: සි: සා: 931 සා: පා: 1881 391[18] 764[39] ක: වි: පි: 839 ජා: අ: ගැ: 319 වින: ම: 48[14] සි: ව: වි: 2928 **-බ්‍යඤ්ජනකූපජ්ඣාය** (නා) = උභතෝ බ්‍යඤ්ජනයකු උපාධ්‍යාය කොට, උපාධ්‍යාය වීමට නුසුදුසු එක් පුද්ගලයෙක්. "න **උභතෝ බ්‍යඤ්ජනකූපජ්ඣායෙන** උපසම්පාදෙතබ්බා" මහා: පා: 994 **-බ්‍යඤ්ජනාසි** (ක්‍රි) = උභතෝ බ්‍යඤ්ජනයෙක් වෙහි. දුට්ඨුල්ලවාචා සඞ්ඝාදිසෙස ශික්ෂාපදයෙහි එකොළොස් ක්ෂෙත්‍ර පදයන්ගෙන් එකක්. එහි ම ශුඛ ක්ෂෙත්‍ර පද තුනින් එකක්. "ඉමෙසු **එකාදසසු** පදෙසු සිඛරිණිංසි සමසි න්‍යාසි **උභතෝ බ්‍යඤ්ජනාසිනි** ඉමානි තීණි යෙව පදානි සුද්ධානි" සා: පා: 391[18] පාරා: පා: 145[7] ක: වි: 36[11] වින: ම: 98[1] 99[2] ("උභතෝ බ්‍යඤ්ජනකාසි" ද දක්නේය. වින: ම: 97[26]) **-රතනූපධානක** (නා) (රත්න + උපධාන + ක) = හිස් දෙර හා පාමුල රත් කන් වසින් ඇති. එබඳු ආසන. තොග කැප අස්නක්. කු: සි: සා: 66[14] (උභතෝ ලොහිත කූපධාන බලනු) **-ලොහිත කූපධාන** (නා) (ලොහිත + ක + උපධාන) = හිස් දෙර හා පා මූල රත් කන්වසින් ඇති, එබඳු ආසනය. හිඳිනට හෝ හොවිනට නුසුදුසු එක් මහ අසුනක්. **"උභතෝ ලොහිත කූපධාන** නම් හිස් දෙර පාමුලැ රත් කන්වසිනි" සි: ව: වි: 63[15] සා: පා: 808[11] මහා: පා: 226[16] ජා: අ: ගැ: 94[15] කු: සි: සා: 66[14] **-වණ්ටික** (නා) (වණ්ට + ඉක) = නැව් දෙපසට සිවින සේ ගෙතූ, එබඳු මල්දම. තොග ගෙතිය යුතු මල් දමක් සා: පා: 445[15] **-වණ්ටික මාලා** (නා) = නැව් දෙපසට සිවින සේ ගෙතූ මල් දම්. තොග ගෙතිය යුතු මල්දමක්. පාරා: පා: 216[12] සාරා: ම: 76[11] චූ: පා: 256[28] **-විහඞ්ග** (නා) = උභතෝ විහඞ්ගය, උභය විහඞ්ගය. පාරාජිකා පාචිත්ති පොත් දෙක. නිස දෙන ඇදුරුකු විසින් දැන සිටිය යුතු කරුණක් "නිස දෙන්නට නිසි ඇදුරු **උභතෝ විහඞ්ග** කම්ම කම් විනිසයැ කඳුවත සහිත් එක් පොතෙක යන මෙතෙක් බණ වර පිරිවහා ආපත්ති අනාපත්ති දන වටී" සි: ව: වි: 67[6] සා: පා: (උභය විහඞ්ග බලනු). **-විහඞ්ග භාණක** (නා) = උභතෝ විහඞ්ගය කියන්නෝ. පාරාජිකා, පාචිත්ති දෙ පොත හදාලා වූ භික්ෂූන්. අටළොස් මහා ගණයෙන් එක් කොටසක්. පරි: පා: ගැ: 232[2] පරි: පා: 124[25] (අඞ්ගරස මහා ගණ බලනු). **-සඞ්ඝ** (නා) = භික්ෂු සඞ්ඝයා සහ භික්ෂුණී සඞ්ඝයා. මෙහෙණක විසින් උපසපන් වීම, පැවරීම, මානත් සමා දන් වීම ආදිය කළයුතු සඞ්ඝයා. "වස්සං වුට්ඨාය භික්ඛුනියා **උභතෝ සඞ්ඝෙ** තීහි ඨානෙහි පවාරෙතබ්බං" "-දෙව වස්සානි ඡසු

ධම්මෙසු සික්ඛිත සික්ඛාය සික්ඛමානාය උභතෝ සඞ්ඝෙ උපසම්පදා පරියෙසි තබ්බා" වූ: පා: 398[17] 399[13] ක: වි: පි: 14[29] ස: පා: 476[17] 585[16] ක: වි: 168[10] **-සඞ්ඝෙ උපසම්පන්න** (නා) = භික්ෂු – භික්ෂුණී සඞ්ඝයා කෙරෙහි උපසපන් වූ. භික්ෂු සඞ්ඝයා වෙත ඥප්ති චතුර්‍ථ කර්‍මයෙන් සහ භික්ෂුණී සඞ්ඝයා වෙත ඥප්ති චතුර්‍ථ කර්‍මයෙන්දැයි අර්‍ථ වාචික විනය කර්‍මයෙන් උපසපන්වූ මෙහෙණ. උභතෝ සඞ්ඝෙ උපසම්පන්නා නම්‍මු ස: පා: 476[17] 846[25] වූ: පා: 399[13].

උභය (නා) [සං. උභය] = දෙක, දෙ කොටස. ක: වි: පි: 9[11] 16[16] **-කඞ්ඛඞ්ඛ** (නා) [සං. සකාඞ්ඛක] = උභය ඛඞ්ඛකය. චුල්ල වග්ග පාළිය සහ මහා වග්ග පාළිය පරි: පා: ගැ: 1[7] **-ක්ඛය** (නා) [සං. ක්ෂය] = එකම් මරණය. ආයුෂය හා කර්‍මය ක්ෂය වීමෙන් සිදුවන මරණය. ධ: අ: ගැ: 63[30] **-සෙනක** (නා) [සං. සෙනක] = ශ්‍රමණ ලිඞ්ගය (= මහණ කම්) සහ උපෝසථ පවාරණාදි සංවාසය සොරකම් කළ තැනැත්තා, තෙ වැදුරුම් ථෙය්‍ය සංවාසකයන්ගෙන් එක් අයෙක්. යමෙක් තෙමේ ම පැවිදිව, වෙහෙරට ගොස් භික්ෂූන් ගේ වස් ගණන් ගනී ද, උපෝසථ පවාරණාදියෙහි පෙනී සිටී ද, මෙතෙමේ භික්ෂු ලිඞ්ගය සහ සංවාසය සොරකම් කළ බැවින් **උභය සෙනක** නම් වේ. ස: පා: 759[8–21] වි: වි: 2526. ක: වි: 17[6–24] **-පඤ්ඤත්ති** (නා) = උභය ප්‍රඥප්තිය. භික්ෂු භික්ෂුණී දෙපක්ෂයට සාධාරණ සේ පැණවූ ප්‍රඥප්ති, ශික්ෂාපද. පරි: පා: ගැ: 21 (උභතෝ පඤ්ඤත්ති බලනු). **-පාතිමොක්ඛ** (නා) = උභය ප්‍රාතිමෝක්ෂය. භික්ෂු ප්‍රාතිමෝක්ෂය සහ භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය "උභයානි ඛො පනස්ස පාති මොක්ඛානි විත්ථාරෙන සඞ්ගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තිනී සුවිනිච්ඡිතානි" පාවි: පා: 66[36] ස: පා: 10[14] 578[31] මහා: පා: 73[3] **-මිස්සක** (නා) = එකම් පවීතය. පස් හා ගල් මිශ්‍ර වූ සීමා සම්මතයෙහි පවීත නිමිත්තට සුදුසු වූ තෙවැදුරුම් පවීතයන්ගෙන් එකක්. "නිච්ඡො පබ්බතො සුද්ධ පංසු පබ්බතො සුද්ධ පාසාණ පබ්බතො **උභය මිස්සකා** නි" ස: පා: 773[34] **-වාමන** (නා) = 1 හිසින් සහ සිරුරින් මිටි වූ. භූත රූපයක් බදු තැනැත්තා. 2 ජඞ්ඝා වෙන් සහ කටියෙන් හෝ මිටි වූවහු. 3 යටි කය සහ උඩුකය හෝ මිටි වූවහු. පැවිදි නො කළයුතු පරිෂ දූෂකයෙක්. ස: පා: 767[3–25] **-විපන්න** 1 (නා) = කුවිකාර සඞ්ඝාදිසෙස ශික්ෂාපද විභාගයෙහි දක්නා පරිදි අදෙශිත වාසතුවක්වීම සහ ප්‍රමාණාතික්‍රාන්තවීම. මේ දෙකින් නැසුණු. දෙශනාවට වෙනස් වූ. ක: වි: 40[22] චින: ම: 105[22] ක: වි: පි: 31[28] **-විපන්න** 2 (නා) = විශුද්ධිමාර්‍ගී ධුතාඞ්ග නිර්දේශයෙහි දැක්වූ පරිදි තෙමේත් ධුත නොව අනුන්ට ධුතාඞ්ගයෙන් අවවාද කරන්නා. වි: මා: ස: 195[28] **-විභඞ්ග** (නා) = උභය විභඞ්ගය. සූත්‍රය. පාරාජික පාළි සහ පාචිත්තිය පාළි යන දෙපොත. විභඞ්ග නම් භික්ෂු-භික්ෂුණී වශයෙන් දෙවැදෑරුම් වූ ශික්ෂා පද සමූහයයි. එය පාරාජික පාළි – පාචිත්තිය පාළි යන දෙ පොත්හි දක්නේය. එබැවින් එය උභය විභඞ්ග නම්. පරි: පා: ගැ: 33[12] **-සම්පන්න** (නා) = විශුද්ධි මාර්‍ගී ධුතාඞ්ග නිර්දේශයෙහි දැක්වූ පරිදි තෙමේත් ධුතව අනුන්ට ද ධුතාඞ්ගයෙන් අවවාද කරන්නා. වි: මා: ස: 195[31]

උභො (නා) [සං උභෞ] = 1 දෙදෙන 2 දෙක, දෙ කොටස. චූ: පා: 307[2] **-අත්ථ** (නා) = උභයාර්‍ථය, මෙලොව සහ පරලොව යහපත. "එවඤ්ච තුම්හාකං උභො අත්ථා පරිගහිතා භවිස්සන්තීති" පාචි: පා: 310[28] **-උපකච්ඡක** (නා) = දෙකිසිල්ල. සම්බාධස්ථානය. රහස් පෙදෙස. "සම්බාධො නාම **උභො උපකච්ඡකා** මුත්තකරණං" පාචි: පා: 293[3] ස: පා: 686[23] ක: වි: 173[26] **-නානප්පකාරක** (නා) = "නානප්පකාරක" යනුයෙන් පටන් ගැණෙන ශික්ෂාපද දෙක. රූපිය සං වොහාර සහ කය චිත්තය යන ශික්ෂාපද දෙක. ස: පා: 964[22] ප්‍රා: පු: ස: 48[4–6] පරි; පා: 126[4]

උම්මඟ 1 (නා) [සං. උන්මාර්‍ග] = නො මඟ. අන් මඟක්. "උපකො ආජීවකො -පෙ= **උම්මඟං** ගහෙත්වා පක්කාමි" මහා: පා: 7[33] ම: පා: ස: 31[28] සාරා: ම: 189[27]

උම්මඟ 2 (නා) = ප්‍රඥව, නුවණ. අවිද්‍යා නමැති අන්ධකාරයෙන් ඉල්පී සිටින බැවින් ප්‍රඥව උම්මඟ නම් වේ "**උම්මඟෙන**, නුවණ ඉස නැගීම, ප්‍රඥ ශීර්ෂය" – "**භද්දකො තෙ උම්මඟෙන**" පරි: පා: ගැ: 17[16] පරි: පා: 196[1] ස: ප: 997[19]

උම්මජ්ජන (නා) (උ + √මජ්ජ් + යු = අන) [සං. උන්මාජ්ජන] = ඇඟ ඉළීම. අ: ප: ස: 41[35]

උම්මඩ්ඩ (නා) = උඩුමුව සිදුර. තෙල් සැන්දෙහි උඩ සිදුර. "**උම්මඩ්ඩං** නාම උද්ධමුඛ ඡිද්දං" ස: පා: 230[34]

උම්මත්ත (නා) [සං, උන්මත්ත] = 1 උම්මත්ත කයා, පිස්සා. සිහි මුළාවූවහු. ඒ ඒ ශික්ෂා පදයන්හි අනාපත්ති වාරයෙහි ගැණෙන්නේ නෙක්. භූතා වෙශයෙන් හෝ පිත කිපීමෙන් උමතු වූවහු. 2 බද්ධ පිත්තය කිපීමෙන් උමතුවූවෝ ශික්ෂ පද මැඩීම නිසා එබන්දනට ඇවැත් නැති. "බද්ධපිත්තං පන පිත්ත කොසකෙ ඨිතං. තමහි කුපිතෙ සත්තා උම්මත්තකා හොන්ති. විපල්ලත්ථ සඤ්ඤා හිරොත්තප්පං ඡඩ්ඩෙත්වා අසාරුප්පා චාරං චරන්ති. ලහුක ගරුකානි සිකඛා පදානි මද්දනතොපි න ජානන්ති. – පෙ – එවරූපස්ස උම්මත්තකස්ස අනාපත්ති" – "**උම්මත්ත** නම් යකඛුම්මත්ත පිත්තුම්මත්තාසි" ස: පා: 181[38] 182[2] 193[17] 270[19] ක: වි: පි: 17[33] පාරා: පා: 54[33] 141[20] ක: වි: 24[25]

උම්මත්තක (නා) (උම්මත්ත + ක) = උන්මත්ත කයා, උමතු වූවහු. (උම්මත්ත බලනු)

උම්මත්තක සම්මුති (නා) = උම්මත්තක භික්ෂුව. උම්මත්තකයකු වශයෙන් සලකා නොහමු යෙහි කරන එම සම්මුතිය. නො හමුයෙහි කරන (=අසම්මුඛා කරණීය) කම් අටෙන් එකක්. උම්මත්තක සම්මුතිය දුන් පසු එම භික්ෂුව සහ මැද සිටියත් සඞ්ඝයාගෙන් බැහැර සීමාවේ සිටියත් එයින් කරන විනය කර්මයට බාධාවක් නොවේ. "දින්නං සඞ්ඝෙන ගඟාසස භික්ඛුනො උම්මත්තකස්ස **උම්මත්තක සම්මුති**" මහා: පා: 133[1] ස: පා: 1040[18] ක: වි: 157[37] වින: ම: 268[22] (අමුළුහ විනය බලනු)

උම්මත්තිකා (නා) (උම්මත්ත + ඉක + ආ) = උමතු වූ තැනැත්තිය. එබඳු භික්ෂුණිය. භික්ෂුණී විභඞ්ගයෙහි ඒ ඒ ශික්ෂාපදයන්හි අනාපත්ති වාරයෙහි ගැණෙන්නියක්. "අනා" පත්ති –පෙ– උම්මත්තිකාය ආදිකම්මිකායානි පාචි: පා: 294[19] 295[22] ධ: අ: ගැ: 122[30]

උම්මදන (නා) = වත්සුණු, මුහුණ තවරන සුවඳ සුණු. "නානා **උම්මදනෙහි** උම්මද්‍ය පෙනත්" ස: පා: 889[5]

උම්මද්‍යුපෙය්‍ය (ක්‍රි) = උ + √මද් + ණ්‍යුපෙ + එය්‍ය) = ඇඟ උලවන්නේය. ඇඟ උලවා නම් හෝ "යා පන භික්ඛුණී භික්ඛුණියා– සිකඛමානාය –පෙ– උම්මද්‍යුපෙය්‍ය වා පරිමද්‍යුපෙය්‍ය වා පාචිත්තියං" ප්‍රා: පු: ස: 52[2] පාචි: පා: 383[28] (අනී: **උම්මද්‍යුපෙසි** වතී: **උම්මද්‍යුපෙති** අනා: **උම්මද්‍යුපෙස්සති** සමී: **උම්මද්‍යුපෙය්‍ය** පමී: **උම්මද්‍යුපෙතු** තුං: **උම්මද්‍යුපෙතුං** පූ: ක්‍රි: **උම්මද්‍යුපෙත්වා** ව: කෘ: **උම්මද්‍යුපෙත්වා** – ඇඟ උලවමින්) පාචි: පා: 333[13–17]

උම්මද්දිතබ්බං (නා) = තැවරිය යුතු, "න මුඛං **උම්මද්දිතබ්බං**" චු: පා: B. 634[7] චූ: පා: 218[21]

උම්මද්දෙනති (ක්‍රි) = තවරත්. වත්සුණු මුහුණෙහි තවරත්. "තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ මුඛං ආලිම්පන්ති මුඛං **උම්මද්දෙන්ති**" චු: පා: B. 634[2] ස: පා: 889[5]

උම්මසන (නා) (උ + √මස + යු = අන) = 1 මතු යෙහි තබා සපශී කිරීම. තමාගේ කය සත්‍රියගේ කය මතුයෙහි තැබීම. 2 උඩට එස වීම. "**උම්මසනා** නාම උද්ධං උච්චාරණා" පාරා: පා: 133[31] ස: පා: 381[17] සාරා: ම: 53[38]

උම්මා (නා) = ධාන්‍ය විශෙෂයක්. අ: ප: ස: 62[1]

උම්මාද (නා) (උ + √මද + ණ) [සං. උන්මාද] = උමතුව, වියරුව, විකාරය, පිස්සුව. ක: වි: 157[36] පරි: පා: ගැ: 14[31] අ: ප: ස: 25[10]

උම්මාපුප්ඵ (නා) = දියබෙරලිය මල්. "**උම්මා පුප්ඵ** නම් දිය බෙරලිය මල්" ජා: අ: ගැ:217[6] සු: වි: 391[16]

උම්මාර (නා) = එලිපත. "**උම්මාරෙ**, එළියේ" ධ: අ: ගැ: 109[15] 203[5] 285[30] ජා: අ: ගැ: 37[36] අ: ප: ස: 31[24] වි: වි: ටී: 327[13]

උම්මිහනති (ක්‍රි) (උ + √මිහ + ණ) = මුත්‍ර කෙරෙත්, "යෙසං නො දූරකා උභඅදනතිපි **උම්මිහනතිපි**" පාරා: පා: 257[28] ස: පා: 495[8] පාචි: පා: 147[18] සර: දී: 748

උම්මිලන (නා) (උ + √මීල + යු = අන) [සං. උන්මීලන] = ඇසහැර බැලීම. ඇස දල්වා බැලීම. සාර: දී: 658[3]

උම්මිලෙතා (ප්‍ර: ක්‍රි:) = ඇස දල්වා බැලීම, ඇස තහා බැලීම. වි: මා: ස: 300[36] 301[17] ජා: අ: ගැ: 153[0]

උම්මුඛ (නා) [සං. උල්මුක] = ගිනි පෙනෙලි. අ: ප: ස: 8[5] (උම්මුකක බලනු)

උම්මුකක (නා) [සං. උල්මුක] = ගිනි පෙනෙලි. ගිනි පෙනෙහෙලි. ජා: අ: ගැ: 127[13] 147[11] 126

උම්මුජ්ජ (නා) = ඉල්පීම, දියෙන් ඉල්පීම. "නජ්ජා තෙරඤ්ඤරාය -පෙ- **උම්මුජ්ජ** නිම්මුජ්ජම්පි **කරොනති**" මහා: පා: 29[15]

උම්මුජ්ජති (ක්‍රි) (උ + √මජ්ජ + ති) = හිස නඟයි. දියෙහි ගැලී සිට හිස ඔසවයි. "උදකෙ හස්සාධිප්පායො නිම්මුජ්ජති වා **උම්මුජ්ජති** වා පලවති වා ආපත්ති පාචිත්තියස්ස" - "**උම්මුජ්ජති** වා, හිස නඟා" - "තෙ ජවිලා -පෙ- නජ්ජා තෙරඤ්ඤරාය **උම්මුජ්ජනතිපි** නිම්මුජ්ජනතිපි" පාචි: පා: 130[3] **ක**: වි: පි: 94[14] මහා: පා: 29[15] සාර: ම: 197[24] (උම්මුජ්ජිත්වා බලනු)

උම්මුජ්ජිත්වා (පූ: ක්‍රි:) = කිමිද, ගිලී. "**උම්මුජ්ජිත්වා**, කිමිද හෙවත් මුඹවැ පැවැත" - "**උම්මුජ්ජනෙනා**, කිමිදුනේ" ජා: අ: ගැ: 134[12] 233[2] සාර: ම: 197[24]

උය්‍යාන (නා) [සං. උද්‍යාන] = උයන ක්‍රීඩා කරන උද්‍යානය. "දෙහි මෙ අය්‍යපුත්ත **උය්‍යානං** ආරාමං කාතුනති" ස: පා: 698[12] අ: ප: ස: 73[29] වු: පා: B. 488 -**නිස්සිත** (නා) = උයන් ඇසුරු කළ, එබඳු ස්ථාන. කුටිකාර සඞ්ඝා දිසෙස ශික්ෂාපදයෙහි කුටිවාසතුව උපද්‍රව සහිත වන (=සාරම්භ) සොළොස් කරුණින් එකක්. පාරා: පා: 176[28] ස: පා: 408[11] -**පාල** (නා) (√පාල + අ) = උයන්පල්ලා. උයන් ගොවිවා, "රාජා පසෙනදි කොසලො **උය්‍යාන පාලං** ආණාපෙසි" පාචි: පා: 177[24]

උය්‍යාම (නා) [සං. උද්‍යම] = උත්සාහය. වීර්‍යය. අ: ප: ස: 239

උය්‍යුත්ත (නා) [සං. උද්‍යුක්ත] = කරණලද උද්‍යොගය ඇති, ගමන් නික්මුණු, සටනට සන්නඬව නිකුත් සිව්රඟ සෙනඟ. ගමන් නික්ම එක තැනෙක හුන් යුද සෙනඟ. "**උය්‍යුත්තනනති** කත උය්‍යොගං, ගාමතො නික්ඛන්තනති අත්ථො" - "ඡබ්බග්ගියා භික්ඛූ උය්‍යුත්තං සෙනං දස්සනාය අගමංසු" පාචි: පා: 122[4] ස: පා: 634[2] **ක**: වි: පි: 92[15] ප්‍රා: පු: ස: 72[31] පරි: පා: ගැ: 5[14] ඛ: අ: ගැ: 250[19] -**සඤ්ඤී** (නා) = සටන් පිණිස නික්මුණු සෙනාවය යන හැඟීම ඇතිව. "උය්‍යුත්තෙන **උය්‍යුත්තසඤ්ඤී** දස්සනාය ගච්ඡති" පාචි: පා 123[10] -**සෙනා** (නා) = යුදපිණිස ගමන් නික්මුණු සිව්රඟ සෙනඟ. "**උය්‍යුත්තසෙනං**, යුදපිණිස ගමන් නික්මුණු චතුරඞ්ගිනී සෙනාව" -"**උය්‍යුත්තසෙනා** නාම ගාමතො නික්ඛම්ම්ත්වා නිවිඨාහොති පයාතා" **ක**: වි: පි: ප්‍ර 92[31] පු: ස: 72[31] පාචි: පා: 122[4] 132[2] වි: මා: ස: 1602[2-23] -**සික්ඛාපද** (නා) = එනම ශික්ෂාපදය. යැමට සුදුසු කරුණක් නැතිව යුද්ධය පිණිස නික්මුණු හස්ත්‍යනීකාදී සෙනාව දක්නා පිණිස යැමෙන් පවිති ඇවැත් සිද්ධවන උය්‍යුත්ත සෙනා (දස්සන) ශික්ෂාපදය. හි: ශි: 16[26] පාචි: පා: 123[25]

උය්‍යොජෙති (ක්‍රි) (උ + √යුජ + ණෙ + ති) = යවයි, පිටත්කර යවයි. යොදවයි (අතී: **උය්‍යොජෙසි**, වතී: **උය්‍යොජෙති** අනා: **උය්‍යොජෙස්සති** සම්: **උය්‍යොජෙය්‍ය** පම්: **උය්‍යොජෙතු** පූ: ක්‍රි: **උය්‍යොජෙත්වා** තුං: **උය්‍යොජෙතුං** වක්‍රා: **උය්‍යොජෙනෙනා** = පිටත්කර යවමින්) "ඉධාහං කස්සප තං **උය්‍යොජෙත්වා** තාවතිංසං ගනුත්වා" -"දූපෙත්වා වා අදූපෙත්වා වා **උය්‍යොජෙය්‍ය**" මහා: පා: 28[1-6] ස: පා: 726[13] ප්‍රා: පු: ස: 70[6-34]

උය්‍යොධික (නා) (උ + √යුධ + ණ්වු + ක) = ඉදිරියට පැන පැන යුද්ධ කිරීම, සටන් කරන තැන. "අඤ්ඤතරොපි ඡබ්බග්ගියො භික්ඛු **උය්‍යොධිකං** ගන්ත්වා කණ්ඩන පටිවිඩෙ හොති" පාචි: පා: 125[1-31] ස: පා: 634[29] ප්‍රා: පු: ස: 73[30] පරි: පා: ගැ: 5[14] **ක**: වි: පි: 93[10] සු: මි: 62[32] -**සික්ඛාපද** (නා) = එනම් ශික්ෂාපදය. දෙතුන් රැයක් යුදසෙනඟෙහි වසමින් යුද්ධ කරණ තැන හෝ සෙනඟ ගණින තැන හෝ සෙනාසනාදිවෙසසථානය හෝ සෙනානිකයක්

හෝ දක්නා පිණිස යැමෙන් පවිති ඇවැත් සිදුවන බැව් දැක්වෙන උපෝසථික නම් ශික්ෂාපදය සි: ශී: 16^{31} ප්‍රා: පු: ස: 73^{30}

උර (නා) [සං. උරස්] = 1 ළය, පපුව. 2 සිත. ජා: අ: ගැ: 60^{28} 104^{7} අ: ප: ස: 37^{33} ධ: අ: ගැ: 57^{38} චූ: පා: 215^{3-6} 102^{2} **-ග** (නා) [සං. උරග] = සර්පයා, නයා. අපාදක දීඝී ජාතීන්. අ: ප: ස: 82^{24} කු: සි: ස: 40^{21} **-මංස** (නා) = සර්ප මාංසය. අපාදක දීඝී ජාතීන්ගේ මස්. නො වැළඳිය යුතු මාංස දශයෙන් එකක්. කු: සි: ස: 40^{21} (අහිමංස බලනු.) **-චක්ඛ** (නා) [සං. උරචක්‍ර] = උර චක්‍රය, උරසක. එනම් ආයුධය. "**උරචක්ඛ** නම් පාෂාණමය වූ හෝ මාණික්‍යමය වූ හෝ කර මුවහත් ඇති වටවූ ගිනිගෙනෑ දිලියෙන **කරලූ කල** කැපෙන මෙසින් සැව පරලොව උපන් පාපී සත්ත්වයාහට දුඃඛාවහවූ ආයුධ විශෙෂයකි" ජා: අ: ගැ: 51^{31} **-ච්ඡද** 1 (නා) = සන්නාහය, යුඩයට අඳින ඇඳුම. අ: ප: ස: 51^{31} **-ච්ඡද** 2 (නා) = මුතුහර මෙන් උරයෙහි පළඳන මල්දම. නො කළ යුතු, නො ගෙතිය යුතු මල්දමක්. "**උරච්ඡදං** කරොනතිපි කාරාපෙනතිපි" චූ: පා: 256^{31} පාරා: පා: 213^{33} 216^{15-21} සු: පා: 444^{22} 445^{19} සාරා: ම: 76^{16} චූ: පා: 22^{4}

උරණ (නා) [සං. උරණ] = පොර ගසන එළු වෝ, බැටළුවෝ. අ: ප: ස: 68^{28}

උරණී (නා) (උරණ + ඊ) = එළු දෙන. පොර ගසන එළු දෙන. අ: ප: ස: 68^{32}

උරබ්භ (නා) [සං. උරභ්‍ර] = පොර ගසන එළු වෝ. සු: ඕ: 207^{9} අ: ප: ස: 68^{28} (ඔරබ්භික (බලනු.)

උරු (නා) = 1 වැලි 2 විශාල, මහත්. විශාලවූ දේ. අ: ප: ස: 89^{36} 94^{7}

උරුවෙලා (නා) = උරුවෙල් දනව්ව. එනම් ප්‍රදෙශය. "බුඩො භගවා **උරුවෙලායං** විහරති නජ්ජා තෙරඤ්ජාය තීරෙ" මහා: පා: 1^{4}

උලාර (නා) (උළාර බලනු) සාරා: ම: 53^{6}

උලුඞ්ක (නා) = සැන්ද, එ. දිය වත්කිරීමට ගන්නා කිණිස්ස. ස: පා: 901^{13} ක: ඕ: පි: 106^{34} ධ: අ: ග: 126^{34} 128^{20} ජා: අ: ගැ: 176^{29} (උළුඞ්ක බලනු.)

උලූක (නා) [සං. උලූක] = මහ මූහුණා බක, මූහුණා, පියා බළලා. අ: ප: ස: 86^{28} කු: සි: ස: 62^{29} ජා: අ: ගැ: 140^{6} **-චම්මපරිකඛට** (නා) [සං. පරිසඤ්ඣත] = මහ මූහුණන්ගේ සමින් සිසාරා මහන ලද, එබදු වහන්. පියා බළළුන්ගේ සමින් මැසූ වහන්. නො දැරිය යුතු වහන් විශෙෂයක්. "**න උලූක චම්මපරිකඛටා** උපාහනා ධාරෙතබ්බා" මහා: පා: 220^{23} ම: පා: ස: 611^{8} ස: පා: 806^{29} කු: සි: ස: 62^{29} වි: වි: 2654 **-පක්ඛ** (නා) [සං. පක්ෂ] = මහ මූහුණු පියා පත්. එය ගොනා කළ සිවුරු. නො හැන්ද යුතු සිවුරු විශෙෂයක්. "**උලූක පක්ඛං** නිවාසෙත්වා -පෙ- යෙන භගවා තෙනුපසඞ්කමි" මහා: පා: 341^{21} කු: සි: ස: 22^{25} සු: වි: 232^{30} පාරා: පා: 35^{4} අඞ්ගු: නි: 181^{4} **-පක්ඛික** (නා) = මහ මූහුණු පියාපත් ගොනා කළ සිවුර හෝ අදනය. සු: වි: 232^{30} අඞ්ගු: 146^{8}

උල්ලඞ්ඝන (නා) (උ + √ලඝි + යු = අන) = 1 උඩ පැනීම, 2 උඩට එසවීම. තම කයින් ස්ත්‍රියගේ කය එසවීම. "**උල්ලඞ්ඝනා** නාම උද්ධං උච්චාරණා" පාරා: පා: 133^{32} ස: පා: 380^{33} 381^{21} සාරා: ම: 53^{38}

උල්ලපති (ක්‍රි) = ප්‍රකාශ කරයි. කියයි. "උත්තරි මනුස්ස ධම්මං ආරාසම්‍ා මහා මොග්ගල්ලා නො **උල්ලපති**" පාරා: පා: 112^{25} (උල්ල පනති බලනු.)

උල්ලපනා (නා) (උ + √ලප + යු = අන + ආ) = උසස් කොට බිණීම. ලාභ සත්කාරාදිය හෙතු වෙන් පවිටු අදහසින් තමා උසස් නැත තබා බිණීම. එක් කුහක ධර්මයක්. වි: මා: ස: 67^{33} පාරා: පා: 112^{25}

උල්ලපනති (ක්‍රි) (උ + √ලප + නති) = පොළඹවන කථා කෙරෙත්. "අහෝ භිම්යනි" යනා දීන් කාමයෙහි පොළඹවන කථා කරත්. "තා ආයස්මතො උදායිනා සද්ධිං එව සනතිපි **උල්ලපනතිපි**" පාරා: පා: 143^{26} ස: පා: 390^{3} සාරා: ම: 55^{21}

උල්ලික්ඛිත (නා) (උ + √ලිඛ + ඉ + ත) = අඬකිත, සලකුණු කළ. පමණ ගන්නා ලද. දිගින් පුළුලින් පමණ ගැන්මට ඒ ඒ තැන සලකුණු පිණිස නිය අගින් ගටන ලද. ස: පා: 823^{10} **-මත්ත** (නා) = උල්ලික්ඛිත මාත්‍රය, අඬකිත

මාත්‍රය. කඹින විවරයෙහි සූවිසි විජතතින් ගෙන් එකක්. දිගින් හා පුළුලින් පමණ ගැන්මට ඒ ඒ තැන සලකුණු පිණිස නිය ආදියෙන් ගැටූ රෙඛා මාත්‍රයකින් හෝ නූල් ගැසූ පමණකින්" - "න **උල්ලිඛිත මත්තෙන** අත්ථතං හොති කඹිනං" - "**උල්ලිඛිත මත්තෙන**, සන් ගත් පමණින්" ක: ව: 72⁸ මහා: පා: 288¹⁷ ස: පා: 823¹⁰⁻¹⁵ පරි: පා: ගැ: 29¹⁵

උල්ලිඛග (නා) = ලිඛග විපඤ්ඤය. ක: වි: පි: 28¹¹

උල්ලිඛන (නා) (උ + √ලිප + ත) [සං. උල්ලිඛන] = උඩුමුව කොට ආලෙප කළ. ඇතුළත ආලෙප **කළ** කණු, තලාන, දෙරඬා, වා කවුළු දුම් නළ ආදිය තබා අවශෙෂ ලෙපා වකාශයන් බිත්තිය සමග එක් කොට ඇතුළත සුණු හෝ මැටි ආලෙප කළ කුටිකාර සඞ්ඝාදිසෙස ශික්ෂා පදයෙහි සඳහන් එබඳු කුටිය. "ඇතුළෙහි ගහන්නෝ ඌර්ධවමුඛ කොට සුණු මැටි ගහති එහෙයින් **උල්ලිඛන** නම් වේ." - "බිම පටන් බිතත් සෙවෙනි වසා මැටියෙන් හෝ සුන්නෙන් හෝ දෙර කවුළු ආලොකාවකාශ හැර ඇතුළතින් **ලිපන** බැවින් උල්ලිපන නම්" ක: වි: පි: 30³² කු: සි: ස: 12¹² **ක**: ව: 39¹⁹ ස: පා: 406²⁶ පාරා: පා: 174³³ විනඃ ම: 103¹⁹ -'**අවලිඛන** (නා) (අව|√ලිප + ත) [සං. අවලිපන] = ඇතුළත, පිටත සුණු මැටි ආලෙප **කළ**, එබඳු කුටිය. කුටිකාර සඞ්ඝාදිසෙස ශික්ෂා පදයෙහි දක්නා ප්‍රමාණික වූ එක් කුටියක්. "පිටත්හි සුණු මැටි ගහන්නෝ අධොමුඛ ලිම්පනය කරති. එහෙයින් අවලිපන නම් වේ" - "ඇතුළතින් පිටතින් **ලිපන** බැවින් උල්ලිපනාව ලිපන නම්" - "**උල්ලිඛනාව ලිඛනා** නාම තථෙව ඡදනඤ්ඤ අඤ්ඤා ච බහි ච ලිත්තා" ක: වි: පි: 30²⁵ කු: සි: ස: 12¹⁴ පාරා: පා: 174³³ ස: පා: 406²⁷

උල්ලුම්පතු (ක්‍රි) (උ + √ලුප + තු) = 1 නහා සිටුවාවා. උඩරණය කෙරේවා. 2 අකුශල යෙන් නහා කුශලයෙහි පිහිටුවාවා. 3 සාමණෙර භාවයෙන් නහා භික්ෂුභාවයෙහි පිහිටුවන සේක්වා. "**උල්ලුම්පතු** මං භනෙත සඞ්ඝා අනුකම්පං උපාදාය" මහා: පා: 105¹⁴ ස: පා: 735⁵ 771⁵

උල්ලෙඛන 1 (නා) (උ + √ලුව + ණ, ව = ක) උපරිභාගය, උඩ, උඩ පෙදෙස සිට. "සබෙ විහාරෙ සන්තානකං හොති **උල්ලෙඛනා** පඨම ඔහාරෙතබ්බං"-"**උල්ලෙඛනකතු** උඩංඔලොක නට්ඨානං උපරිභාගන්ති අත්ථො" මහා: පා: 442⁶ චූ: පා: B. 300²⁵ ම: පා: ස: 1581⁹ ස: පා: 732⁸ වි: ලං: 289¹⁹ සාරා: ම: 203¹⁸

උල්ලෙඛන 2 (නා) = ගුදිරියෙහි යට ඇතිරිය. යට ගුදිරි උරය. "අනුජානාමි භික්ඛවෙ **උල්ලෙඛනං** කත්වා භිසිං ඔතඞ්කිතුන්ති" චූ: පා: B. 20⁴ ස: පා: 900²¹ චූ: පා: 267²¹

උල්ලෙව (නා) = වියන, උඩු වියන. අ: ප: ස: 41³¹

උල්ලෙල (නා) (උ + √ලුල + ණ) = 1 ඇළලීම, කැළඹීම. 2 මහරළ. ජා: අ: ගැ: 196²⁶ අ: ප: ස: 89³²

උවාළ (නා) = එනම් භික්ෂුව. තස්ස පාපිය්‍යසිකා **කම්ම** කරනු ලැබූ භික්ෂුව. චූ: පා: 184¹

උසභ 1 (නා) [සං. ඍෂභ] = සප්ත ස්වරයෙන් එකක්. ගවයාගේ නාදය. "ඍෂභ නම් ස්වරය" අ: ප: ස: 193⁰⁻⁸³

උසභ 2 (නා) = ඉස්බ, එනම් දුර ප්‍රමාණය. රියන් 140 ක දුර. යෂටි 20 ක හෝ දුර. "සත්රියන් යටින් විසි යටෙක් උසබෙක් නම්" ධ: අ: ගැ: 43³⁵ 119²² 180⁶ 212²⁷ අ: ප: ස: 28¹⁷

උසභ 3 (නා) ඔසබ්ය, වංඇපල, එනම් බෙහෙත. අ: ප: ස: 80³⁰

උසභ 4 (නා) [සං. ඍෂභ > පා: වසභ, උසභ] 1 ගවයා, හරකා. 2 සම්භාවනාවෙහි යෙදුණු විට උත්තමාර්ථය දෙන ශබ්දයක්. අ: ප: ස: 68¹ 93²⁰ ධ: අ: ගැ: 65¹ 207³⁴ -**දාන** (නා) දෙනුන් හෝ ගවයන් දීම. අකුසල් වුව ද, ලොකයෙහි කුසල් මෙන් සම්මත පඤ්චදාන යන්ගෙන් එකක්. 2 ගවයන් අතර ගවයකු මුදා හැරීම. "පඤ්චදානානි අපුඤ්ඤානි පුඤ්ඤ සම්මතානි ලොකසම්මි මජ්ජදානං-පෙ-**උසභ දානං** චිත්තකම්මදානං" - "**උසභදානං** දෙනුන් හා ගොන් දීමය" පරි: පා: 178¹⁸ පරි: පා: ගැ: 14²³ ස: පා: 986¹⁰ මනොඃ පූ: 80⁵² -**ඵල** (නා) = ගවයන්ගේ පොර ඇණ ගැණීම. එක්

විසූක දර්‍ශනයක්. දී: නි: 50[15] **-ලකඛණ** (නා) = ගවයන්ගේ ලක්‍ෂණ කිම. එක් නිරඟවීන විද්‍යාවක්. දී: නි: 52[21]

උසිර (න)=සුවඳහොට, බඹුස් තණමුල්. "උසිරං, සුවඳ හොට ද, නොහොත් ලමහද" එනම් බෙහෙත් වර්‍ගය. යාචිජීවිකවූ මුල් බෙහෙදක්. "අනුජානාමි භික්ඛවෙ මූලානි හෙසජ්ජානි හළිද්දිං -පෙ- උසිරං හද්දමුත්තකං" මහා: පා 235[22] සී: පා: 613[15] කු: සි: ස: 3[411] අ: ප: ස: 82[17] ධ: අ: ගැ: 264[27] **-පාදුකා** (නා) = කමල නම් තෘණ විශෙෂයෙන් කළ පාදුකාව. කැප නැති එක් මරවැඩි විශෙෂයක්. ස: පා: 807[13] ම: පා: ස: 619[36] (**කමලපාදුකා** බලනු) **-මය** (නා) = බඹුස් තණවලින් කළ, විජිනිපත. සුවඳහොටින් නිම කළ වීජනිය. කැප වූ විජිනිපතක්. "අනුජානාමි භික්ඛවෙ නිසෙසා වීජනියො -පෙ- උසිරමයං මොර පිඤ්ඡමයන්ති" චූ: පා: 243[3] චූ: පා: B. 706[6]

උසිරධජ (නා) = එනම් පර්‍වතය. බෝ මැඩ සිට ගවී පන්සියයක් ඔබ්බෙහි ප්‍රත්‍යන්ත ජනපදයාගේ උතුරු දිග සීමාව. මධ්‍ය මණ්ඩලයෙහි හෝ එක් සීමාවක්. "**උත්තරදිසාය උසිරධජෝ** නාම පබ්බතො" මහා: පා: 232[10] ම: පා: ස: 637[4-31]

උසු (නා) [සං ඉෂු] = ඊය, ඊතලය. "තසස තෙ **උසු** උපපතිත්වා උපපතිත්වා තසෙසව කායෙ නිපතන්ති" පාරා: පා: 113[19] **-කාර** (නා) = ඊතල වඩුවා. ධ: අ: ගැ: 147[11] අ: ප: ස: 69[20] **-ලකඛණ** (නා) = ඊතල ලක්‍ෂණ කිම. එක් නිරඟවීන විද්‍යාවක්. දී: නි: 52[18] **-ලොම** (නා) [සං. රොම] = ඊතල බඳු ලොම් ඇති, එබඳු තැනැත්තා. "අද්දසං **උසුලොමං** පුරිසං වෙහාසං ගච්ඡන්තං" පාරා: පා: 113 **-පෙත** (නා) = ඊතල බඳු ලොම් ඇති ප්‍රෙතයා. "තසමා **උසුලොම පෙතො** ජාතො" ස: පා: 363[1] **-වඤ්ඣ** (නා) ඊතල බඳු ලොම් ඇති ප්‍රෙතයා පිළිබඳ කථා වස්තුව. ස: පා: 362[34] **-වඩ්ඪකි** (නා) = හී වඩුවා. ඊතල සාදන්නා. අ: ප: ස: 69[30]

උසුම (නා) [සං. උෂ්ම] = උණුසුම, රස්නය. ජා: අ: ගැ: 176[28] ධ: අ; ගැ: 128[20]

උසුය (නා) [සං. අසූයා] = ඊර්‍ෂ්‍යාව, ගුණයෙහි පවා දොස් කිම. අ: ප: ස: 24[25] ධ: අ: ගැ: 233[13] **-ක** (නා) = ඊර්‍ෂ්‍යා කරන්නා. "**උසූයකා** ඉමෙ සමණා සක්‍යපුත්තියා" චූ: පා: 316[25] කු: සි: ස: 10[5] **-ංපණ්ඩක** (නා) = එනම් පණ්ඩකයා. පස්වැදෑරුම් පණ්ඩකයන් ගෙන් එක් පණ්ඩකයෙක්. පැවිද්දට හා උප සම්පදාවට සුදුසු පුද්ගලයෙක් "ආසිත්ත **උසූය පණ්ඩකානං** පන පබ්බජ්ජා ච උපසම්පදා ච න නිවාරිතා" -"**උසූය පණ්ඩක** නම් මෙර මාගේ අධ්‍යාචාර දූක ඊර්‍ෂ්‍යා උපදවා ගත් කල්හි සන්හිදෙන කාම පරිදාහ ඇත්තේයි" ක: වි: පි: 15[16] ස: පා: 758[27] ක: වි: 17[3] කු: සි: ස: 10[9-35] බු: සි: පි: 16[42]

උසූයයති (ක්‍රි) (√උසූය + නයි) = ඊර්‍ෂ්‍යා කෙරෙත්. "උසූයකා ඉමෙ සමණා සක්‍ය පුත්තියා දෙවදත්තසස ලාභසක්කාරං **උසූ යයති**" චූ: පා: 316[28] මහා: පා: 276[20]

උසෘඪකිත (නා) (උ + සඪකා + ඉ + ත) = සැක කළ, මහාජනයා විසින් සැක කරණ ලද. "පඤ්චහබෙහි සමන්නාගතො භික්ඛු **උසඪකිත** පරිසඩ්කිතො හොති" පරි: පා: 177[21] පරි: පා ගැ: 14[13] ස: පා: 985[32] ධ: අ: ගැ: 257[12]

උසඪනි (නා) (උ + සඪකා + ඊ) = සැක ඇති. හටගත් සැක ඇති තැනැත්තා. "දිවා දිවසස භීතො උබ්බිග්ගො **උසඪනි** එත්‍රසෙනා සභසා අන්තෙපුරං පාවිසි" චූ: පා; 317[1]

උසද 1 (නා) (උ + √සද + අ) [සං. උත්සද] = ඇලීම, රාග, දෙස, මොහ, මාන, දිට්ඨි යන උත්සදයන්. "**යඤ්ඤසසද** නත්ථි කුහිඤ්චි ලොකෙ" මහා: පා: 3[5] ම: පා: ස: 95[-24] ස: පා: 718[19] සාරා: ම: 182[36]

උසද 2 (නා) [බෞ: සං:] = ඔසුපත් නිරය. සොළොස් ඔසුපත් නිරය. ජා: අ: ගැ: 125[24] වි: මා: ස: 722[7]

උසන්න 1 (නා) [සං. උත්සන්න] = රැස්වූ, බොහෝ රැස් කළ. "සඞ්ඝසස භණ්ඩාගාරෙ චීවරං **උසන්නං** හොති" මහා: පා: 285[3] 322[20] ස: පා: 832[33] සාරා: ම: 152[30]

උසන්න 2 (නා) = බලවත්, ශක්තිමත් සම්පන්න. ජා: අ: ගැ: 61[29]

උසසය (නා) = උත්සන්න වීම, නැගී සිටීම, ඉල්පීම. ස: පා: 675[6] **-වඤ්ඣ** (නා = උසසය වාදිකා වස්තුව, විවාද කිරීම පිළිබඳ කථාව.

ක: වි: 163[10] **-වාද** (නා) = කලහ කිරීම, විවාද කිරීම, කලහ කරන්නා, විවාදකරන්නා. **-වාදිකා 1** (නා) (වාද + ඉක + ආ) = කලහ කරන්නී, විවාද කරන්නී. මාන වෙගයෙන් සහ ක්‍රොධයෙන් කලහ කරන මේහෙණ. **"උස්සයවාදිකා,** විනිශ්චය මහාමාත්‍යයන් කෙරෙහි යුකති බණන පිණිස ක්‍රොධමානොත්සන්නා වශයෙන් විවාද කරන්නී" ප්‍රා: පු: ස: 11[26] (2) ස: පා: 675[6] පාචි: පා: 249[1] **ක:** වි: 163[1] පරි: පා: 120[5] **-වාදිකා 2** (නා) = එනම් ශික්ෂාපදය. ගෘහපති ආදීන් සමග ක්‍රොධමානොත්සන්නා වශයෙන් විවාද කරණ භික්ෂුණිය සඟ වෙසෙස් ඇවැත් අවදින බව ප්‍රකාශිත ශික්ෂාපදය. සු: ප: 72[25] **-වාදිකා විභාර** (න) = එනම් සඞ්ඝාදිසෙස ශික්ෂාපදය. භික්ෂුණී විහඞ්ග සත්‍යාරසකයෙහි ප්‍රථම ශික්ෂා පදය. සු: ප, VIII[32] (උස්සයවාදිකා 2 බලනු) **-සමුට්ඨාන** (නා) = එනම් ශික්ෂාපද දෙක. උස්සයවාදිකා ශික්ෂාපදය. පරි: පා: 127[7] ස: පා: 966[10] (දට්ඨසමුට්ඨානික බලනු)

උස්සරථ (ක්‍රි) (උ + √සර + ථ) = දුරුවවු හෙවත් පහවවු. ජා: අ: ගැ: 102[16]

උස්සව (නා) [සං. උත්සව පා: උස්සව] = උත්සවය. සැණකෙළිය. මහ උත්සවය. ඇසළ උත්සවය. පවාරණ උත්සවය. නැකැත් කෙළි ආදි උත්සවයන්. "මනුස්සා යඤ්ඤසු ඡණේසු **උස්සවෙසු** විසාඛං මිගාර මාතරං පඨමං හොජේනති" පාරා: පා: 222[13] 278[10] ස: පා: 455[27] ධ: අ: ගැ: 121[11] 249[12]

උස්සහති (ක්‍රි) (උ + √සහ + ති) = උත්සාහ කරයි. වීර්‍ය කරයි හැකි වෙයි. සමත් වෙයි (අනී: **උස්සහි** වත්: **උස්සහති** අනා: **උස්ස හියාති** සම්: **උස්සහෙය්‍ය** පම්: **උස්සහතු** පූ: ක්‍රි: **උස්සහිත්වා** තුං: **උස්සහිතුං** වක්‍ය: **උස්සහනෙනා**= උත්සාහ කරමින්.) **"උස්සහසි** ත්වං ආනන්ද භික්ඛූනං එවරූපානි චීවරානි සංවිදහිතුන්ති **උස්සහාමි** භගවාති" – **"කාහං** න **උස්සහාමි** අනිරතෝ අහං බ්‍රහ්මචරියං චරාමි" මහා: පා: 324[15] පාරා: පා: 15[22] 175[13] ම: පා: ස: 819[37] ස: පා: 835[29] 408[1] චූ: පා B. 334[28] මහා: පා: 402[32]

උස්සාදයිංසු (ක්‍රි) (උ + √සාද + ය=ඉංසු) = ඉතිරි කළහ. ශෙෂ කළහ. "සෙය්‍යථෙත ගාහෙන්නා සෙය්‍යා **උස්සාදයිංසු"** චූ: පා: 286[16] චූ: පා: B. 78[23] 79[33]

උස්සාදියිත්ථ (ක්‍රි) = පෙරලා ගෙණ ගියාහුය. ආපසු ගෙණ ගියාහුය. "ඛාදනීයං **උස්සා දියිත්ථ"** පාචි: පා: 116[26] සාරා: ම: 152[14]

උස්සාදෙතා (නා) = උසස් කරන්නා, තම පක්ෂය හුවා දක්වන්නා. අධිකරණයට ඉදිරි පත් වූ භික්ෂුව බොහෝ දෙනාට අප්‍රිය වන කරුණු පසකින් එකක්. **"උස්සාදෙතා** හොති, තම පක්ෂය හුවා කියන්නේ වේද" පරි: පා: ගැ: 32[26] පරි: පා: 242[25]

උස්සාදෙති (ක්‍රි) = ඔසවා දමයි. ගසා දමයි "යං හොති මහා සමුද්දෙ මතං කුණපං තං ඛිප්පඤ්ඤව තීරං වාහෙති ථලං වා **උස්සා දෙති"** චූ: පා: 377[20] චූ: පා: **B** 356[15] 357[19]

උස්සාදෙත්වා 1 (පූ: ක්‍රි:) = උස් කොට, උඩට විහිදුවා. "චීවරං සඞ්ඝරනෙත්ත චතුරඞ්ගුලං කණ්ණං **උස්සාදෙත්වා** චීවරං සඞ්ඝරිතබ්බං" මහා: පා: 59[18] චූ: පා: B 3[14] 335[5] ම: පා: ස: 154[25]

උස්සාදෙත්වා 2 (පූ: ක්‍රි:)= ඉවත් කොට. විසුරුවා හැර. "ඝනභූනාහං සමණා උදකං **උස්සා දෙත්වා** -පෙ- චඞ්කමෙය්‍යනති" මහා: පා: 29[25] ම: පා: ස: 100[35]

උස්සාදෙය්‍ය (ක්‍රි) (උ + √සද + එය්‍ය) = රැස් කරන්නේය. එකතු කරන්නේය. ස: පා: 441[25] (උස්සාරෙය්‍ය යී ද දක්නේය)

උස්සාපෙත්වා (පූ: ක්‍රි:) = ඔසවා, උස්සා. "අද්ද සා ඛෝ භගවා -පෙ- තං චීවරං **උස්සාපෙත්වා** පුනප්පුනං විමජ්ජන්තං" පාරා: පා: 235[26] සාරා: ම: 87[31]

උස්සාරණ (නා) (උ + √සර + ය = අන = ණ) = ඉවත් කිරීම, මඟහැර යෑම. මඟ හැරීම. දුරු කිරීම. ක: වි: පි: 144[15] ජා: අ: ගැ: 99[17] ස: පා: 678[31]

උස්සාරිත (නා) = රැස්වූ. එක් තැන් වූ. "කානා කුලා පබ්බජිතා එකතෝ **උස්සාරිතා"** පාරා: පා: 211[17]

උස්සාරෙත්වා (පූ: ක්‍රි:) = ඉවත් කරවා. "සෙට්ඨී පුත්තස්ස විකාරං සල්ලක්ඛෙත්වා ජනං **උස්සා රෙත්වා"** මහා: පා: 314[1] ජා: අ: ගැ: 99[17]

උස්සාරෙය්‍ය (ක්‍රි) (උ + √සර + ණෙ + එය්‍ය) = රැස් කරන්නේය. එකතු කරන්නේය.

"සෙය්‍යථාපි නාම මහා වාතෝ වායනෙනා -පෙ- එකතෝ **උස්සාරෙය්‍ය**" පාරා: පා: 211[15] (**උස්සා**දෙය්‍ය යි ද දක්නේය.)

උස්සාව (නා) [සං. අවශ්‍යාය] = පිනි. පිනිබිඳු. "**උස්සාව** බිඳු තකතනං විය, පිනිබිඳු තනී නයක් වැන්න පිනිබිඳුයෙන් තහමියි සිතීමක් වැන්න." ජා: අ: ගැ: 3934 ධ: අ: ගැ: 23239

උස්සාවනනනිකා (නා) (උ + සාවන + අනතික) = එනම් කුටිය. සතර **කැපකිරි** අතුරෙන් එකක්. භික්ෂුවක් හෝ භික්ෂූන් උදෙසා ගෙයක් (කුටියක්) සදන විට පදනම ආදිය සකස් කර පළමුව පිහිටුවන කණුව හෝ ගඩොළු සඬහයා විසින් අල්ලාගෙන "**කප්පිය** කුටිං **කරොම්**" යන වාක්‍යය තෙවරක් කී පසු සදන ගෙය හෝ කුටිය. මෙහි උස්සාවන නම් වැඹ හෝ ගඩොළු උඩට ඔසවා තැබීම සහ "කප්පිය කුටිං කරොම්" යන ශ්‍රාවණ යයි. එහි අනතයේ (=ශ්‍රාවණානතයේ) කරනු යෙන් "**උස්සාව නනනිකා**" නම් වන්නීය. "ඵමනානං භිතතිපාදනං වා එකමනං ? (උගහමනං?) උඛං **කත්වා** ඨපනං **කප්පියකුටිං කරොමානි** වාචාය සාවනඤ්ච අනතං යසමා සා උස්සාවනතතා. තථා ච වුත්තතා. එමහ පනිට්ඨානඤ්ච වචන පරියොසානඤ්ච සම කාලමෙව වට්ටතීති" බු: සි: ටී: 7612 කු: සි: ස: 518 සි: ව: වි: 52223 සි: ව: ප්‍ර: 17911 ස: පා: 81413 81535 මහා: පා: 27324

උස්සාහ (නා) [සං. උත්සාහ] = උත්සාහය. වීර්‍යය. "තත්‍ථ තෙ යාවජීවං **උස්සාහො කරණීයො**" මහා: පා: 10620 ජා: අ: ගැ: 186

උස්සිඤ්චන (නා) (උ + √සිඤ්ච + යු = අන) = ඉසීම, දිය ඉසීම. "උදකං **උස්සිඤ්චන** ඝටිකාය, දිය ඉස්නා **කැදැල්ලට**" ජා: අ: ගැ: 993 10423

උස්සිඤ්චනිය කදදමං (නා) [සං. **කර්‍ම**] = ඉසිනු හැකි මඩ නො බොල්වූ මඩ, විකොපනය කිරීමෙන් ඇවැත් නො වන්නක්. කු: සි: ස: 8587

උස්සිත (නා) = ඔසවනලද, එස වූ, නඟා බඳින ලද. අ: ප: ස: 12615

උස්සිතමනති? (නා) (උස්සි + මනතු + ඊ) = (උස්සිතමානී?) = මානයෙන් යුක්ත **කථා** ඇත්තේ, පවිටු කථා ඇති. බොහෝ දෙනාට අප්‍රියවන එක් කරුණක්. මානුස්සත්ත **කථා** ඇතියහු. පරි: පා: 2429 පරි: පා: ගැ: 3220

උස්සිස (නා) = හිස්දෙර. ඇදෙහි හිස තැබීම. "**උස්සිස කරණත්‍ථාය**, හිසතබන්නට" – "විවරං වා උත්තරා සඬගං වා **උස්සිස කරණත්‍ථාය** දෙනති" ජා: අ: ගැ; 6330 ස: පා: 54226

උස්සිසක (නා) = හිස්දෙර ජා: අ: ගැ: 1819 ධ: අ: ගැ: 10212

උස්සුකක (නා) [සං. ඔත් සුක්‍ය] = 1 උත්සාහය, වීර්‍යය. 2 උපාය පයේෂණය. මාගීය සෙවීම. "සචෙ උපජ්ඣායසස චීවරං **කාතබබං** හොති සදධි විහාරිකෙන කාතබබං, **උස්සුකකං** වා කාතබබං" මහා: පා: 4618 ස: පා; 7333 0 කු: සි: ස: 1041 0 පාචි: පා: 3248 ප්‍රා: පු: ස: 4327 ධ: අ: ගැ: 27214

උස්සූර (නා) = හිරුඋදාව, ඉර නැඟීම. උදය කාලය. "**උස්සූරෙ** හතතං නීහරිස්සති" මහා: පා: 32933 ජා: අ: ගැ: 1496 ම: පා: ස; 83033 ධ: අ: ගැ: 22811

උස්සොළහනති (ක්‍රි) = සිවුරුවම් කරත්. "ධාව නතිපි ආධාවනතිපි උස්සොළහනතිපි" චූ: පා: 2231 25721 සාරා: ම: 7723 චූ: පා: B. 7481 7492 පාරා: පා: 21421 (උස්සොළෙහනති යනුත් පාඨයි)

උස්සොළහි (නා) = අධික වීර්‍ය, අධික උත්සාහය. ප: සු; 57 අ: ප: ස: 2317

උස්සොළහිස්සනති (ක්‍රි) = සිවුරුවම් කරන්නාහුය. සිවුරුවම් කරන්නාහුද? පාරා: පා: 2175

උහුංකාර (නා)=මහමුහුණා, බකමුහුණ, "උහුං" යන හඬ නඟන පක්ෂියා. අ: ප: ස: 8628

උළාර (නා) [සං. උදාර] = බෞ: සං: ඔදාර] උසස්, ශ්‍රෙෂ්ඨ, විපුල, ප්‍රණීත. මහත්. සු: වි: 6386 අ: ප: ස: 1128 ධ: අ: ගැ: 12418 -**උළාර** (නා) = ඉතා ශ්‍රෙෂ්ඨ, උදාරතර, සාර: දී: 3771 3 -**පූජා** (නා) = මහපූජා පිණ්ඩපාත තූරියඝොෂ ගන්ධමාලා ධජ පතාකාදීන් කරන පූජා. ධ: අ: ගැ: 2513 -**නොගකුල** (නා) = උදාර සම්පත් ඇති කුලය. ප: සු: 697 (4) සාර: දී: 37713 -**සමහාවිත** (නා) = ශ්‍රෙෂ්ඨයනි

සමඟාවිත වූ, උසස්යයි පිළිගත්. "හදදා කාපිලානී බහුස්සුතා හොනි භාණිකා -පෙ- **උළාර සම්මාවිතා**" පාචි: පා: 322 25 සී: පා: 696 27

උළුඩක (නා) = හැන්ද, සාළුව, එව. දිය ඉස්නා සැන්ද, එක් ගරු භාණ්ඩයක්, ජා: අ: ගැ: 176 29 239 19 ධ: අ: ගැ: 40 9 සී: පා: 315 35 (උලුඩක බලනු) **-භික්ඛා** (නා) = සැඳි බත්. **කෙණෙසි** අහර. පිණ්ඩාහාරය. ජා: අ: ගැ: 63 16

උළුම්ප (නා) [සං උඩුප] = පහුර. "මනුස්සා **උළුම්පං** බන්ධිත්වා අච්චරවතියා **නදියා** ඔසා දෙනති" පාරා: පා: 62 29 මහා: පා: 263 25 අපදා: 90 8

ඌ

ඌකා (නා) [සං. යූකා] = 1 උකුණෝ 2 එනම් මාන විශෙෂය. ලිකඛ සතක්. අහලෙන් 14 න් කොටස. "එසේ වූ ලිකඛා සතෙක් **ඌකා වෙක්** නම් වෙයි." අ: ප: සී: 28 12 ජා: අ: ගැ: 14 6 105 16 226 22 ධ: අ: ගැ: 233 5 **-සිර** (නා) = උකුණු හිස. චක්ඛු ප්‍රසාදයේ ප්‍රමාණය දක්වන උපමාව "**ඌකාසිර** සමූ පමං, උකුණු ඉස් හා සම උපමා ඇත්තෙයි" වි: මා: සී: 1055 34

ඌන (නා) [සං ඌන] = උනු, අඩු. (ප්‍රු: ලි: **ඌනො** ස්ත්‍රී: ලි: **ඌනා** න: ලි: **ඌනං**) **-'දර** (නා) = අඩු වූ කුස ඇති, බඩගිනි වූ "**ඌනුදරෝ**, සා කුස් ඇත්තේ" ජා: අ: ගැ: 149 30 **-ගණ** (නා) = අඩු වූ ගණය ඇති. ගණය නම් සතර නමක් හෝ ඉන් වැඩි වූයේයි. එයට අඩු වූයේ ඌන ගණ නම්. මානතෙහි හැසිරෙන භික්ෂුව උපසපන් භික්ෂූන් සතර නමක් හෝ ඉන් වැඩියෙන් වෙසෙන ස්ථානයක මානත පුරනතුරු සරිය ගත කළ යුතුයි එසේ වෙසෙන ස්ථානයක එක් රැයක හෝ උපසපන් භික්ෂූන් සතර නමට අඩු වී නම් ඒ රැය සිදී යෙයි ඒ රැය වෙනුවෙන් නැවත පිරිය යුතු "**ඌනො ගණෙනාති** එත්ථ ගණෙනති වත්තාරෝ වා අතිරෙකා වා" සී: පා: 867 9 චූ: පා: 91 18 චූ: පා: B, xii 12 (ඵ: ග්‍ර:) (ඌනෙ ගණෙ වරණං බලනු) **-කර** (න) = ඉතා අඩු වූ ක: වි: 50 17 **-දවාදස වස්ස** 1 (නා) = දෙළොස් අවුරුද්දෙන් අඩු. පිළිසඳ පටන් දෙළොස් වසක් නැති. පුරුෂ සමාගමයට පැමිණි පිරිපුන් දෙළොස් වසක් නැති තැනැත්තිය උපසපන් කෙරේ නම් පවිති ඇවැත් වේ. ප්‍රා: ප්‍රු: සී: 49 29 පාචි: පා: 356 28 **-දවාදස වස්ස** 2 (නා) = දෙළොස් වස් නැති උප සපන් වීමෙන් වස් දෙළොස නො පිරුණු, එබඳු මෙහෙණක් උපාධ්‍යාය ව හෙරණින් උප සපන් කෙරේ නම් පවිති ඇවැත් වේ. "**ඌන දවාදස වස්සා**, උපසම්පදෙ විසින් නො පිරිපැසුණු දෙළොස් වස් ඇත්තී" ප්‍රා: ප්‍රු: සී: 49 18 පාචි: පා: 368 27 සී: පා: 964 3 **-දවාදසවස්ස සම්මත** (නා) = එනම් ශික්ෂා පද දෙක "යා පන භික්ඛුනී ඌන දවාදස වස්සං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං" "යා පන භික්ඛුනී පරිපුණ්ණ දවාදස වස්සා සඞ්ඝෙන අසම්මතා වුට්ඨාපෙය්‍ය පාචිත්තියං" යනු වෙන් කුමාරීභූත වර්ගයෙහි දක්නා ශික්ෂාපද දෙක. සී: පා: 964 ප්‍රා: ප්‍රු: සී: 497-9 පරි: පා: 155 29 **-දසවගග** (නා) = දශවර්ගීයට අඩු. දස නමකින් අඩු. උපසම්පදා කර්මයක් නො කළ යුතු භික්ෂු සඞ්ඛ්‍යාව. 1 චතුවගග 2 පඤ්ච වගග 3 දසවගග 4 වීසතිවගග 5 අතිරෙක වීසති වගග යි සඞ්ඝයා පස් වැදෑරුම් වෙති. එහි චතුවගග සඞ්ඝයා අබ්භාන කර්ම උප සම්පදා කර්ම සහ පවාරණය ද හැර සෙසු සඞ්ඝ කර්ම කිරීමට සුදුසුය පඤ්ච වගග සඞ්ඝයා අබ්භාන කර්මය සහ මධ්‍ය දෙශයෙහි උපසම්පදාව හැර සෙසු කර්මයෙහි ද. දසවගග සඞ්ඝයා අබ්භාන කර්මය හැර සෙසු කර්මයෙහිද සුදුසුය. දසවගග සඞ්ඝයා විසින් උපසම්පදා කර්මය කළ හැකිය. ඉන් අඩු වී නම් කරනු නො හැක. "න භික්ඛවෙ ඌන දස වග්ගෙන ගණෙන උපසම්පාදෙ තබ්බා. යො උපසම්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස" මහා: පා: 56 11 කු: සි: ස: 71 15 **-දසවගග** (නා) = දසවසින් අඩු උපසපන් වීමෙන් දස් වස් නොවූ. භෙරණ නමක් උපසපන් නො කළ යුතු භික්ෂුවකගේ එක් ලක්ෂණයක්. දසවස් නොවූ

භික්ෂුවක විසින් උපසපන් නො කටයුතුය. නිස නො දිය යුතුය. හෙරණකුගෙන් උව ටැන් නො ලද යුතුය. "අපරෙහි පි භික්ඛවෙ -පෙ- භික්ඛුනා න උපසම්පාදෙතබ්බං න නිස්සයෝ දාතබ්බෝ න සාමණෙරෝ උපට්ඨා පෙතබ්බෝ. අස්සඩ්ඩෝ හොති -පෙ- **ඌන දසවස්සෝ** හොති" මහා: පා: 56^{8} 75^{11} 76^{5} 77^{4} සා: පා: 74^{01} ම: පා: සා: 245^{35} **-දස වස්සෝ** (නා) = දස වස් අඩු, එබඳු භික්ෂුව. සා: පා: 977^{22} පරි: පා: 167^{2} **-දස වස්සෝ ආපජ්ජති** (ක්‍රි) = දසවස් අඩු භික්ෂුව ඇවැතට පැමිණෙයි. අඩු දසවස් ඇති භික්ෂුව "මම පණ්ඩිතයෙක්මි, ව්‍යක්ත යෙක්මි" යි පිරිස ලවා උපස්ථාන කරවා ගන්නේ නම් එබඳු උනු දසවස් මහණ තෙමේ ඇවැතට පැමිණෙයි. එහෙත් දසවස් ඇත්තේ එහිදී ඇවැත් නො අවදී. සා: පා: 977^{24} පරි: පා: 167^{2} **-පඤ්ච බන්ධන** 1 (නා) = බැඳුම් පස කින් අඩු. සම්පූර්ණ නොවූ බැඳුම් පසකින් යුක්තවූ. උනු පස් බැන් පා ඇති භික්ෂුවක විසින් අළුත් පාත්‍රයක් විනවා ගනී නම් නිසඟි පවිති වේ. යම් පාත්‍රයක දෙ අඟුල් ගැස්මක් වේද, ඒ ගැස්මෙහි යට කෙළවර පාත්‍ර විදිනා කටුවකින් විද සමකොට හුයකින්, නියඳ කෙන්දකින්, ඊයමින් හෝ බෑඳ, ආමිස නො ලැගීම පිණිස ද, ඊයමින් හෝ එබඳු ඉටි විශෙෂයකින් හෝ වසා දැමිය යුතුයි. පසුව පාත්‍රය අධිෂ්ඨාන කොට පරිභොගයට ගත හැකිය. කුඩා සිදුරු කොට හෝ බැඳිය යුතුයි. පැණියෙන් පිසගත් ගල් කුඩු මිශ්‍රණ යෙන් හෝ පිළියම් කට යුතුයි දෙ අඟුල් පමණවූ රෙඛා දෙකක් හෝ සතරඟුල් පමණ එක් හිරක් වේ නම් එහි බැම් දෙකක් තැබිය හැකි යි. එබඳු රෙඛා තුනක් හෝ සාඟුල් එක් රෙඛාවක් වූ කල බැම් තුණක් ද, දූඟුල් රෙඛා සතරක් හෝ අටඟුල් එක් රෙඛාවක් හෝ වූ කල බැම් සතරක් ද, තැබිය හැකිය. දූඟුල් රෙඛා පසක් හෝ දසඟුල් එක් රෙඛාවක් හෝ වී නම් එය අපාත්‍ර සඞ්ඛ්‍යාවට ගැණේ. එහි දී අනෙක් පාත්‍රයක් වින වා ගත යුතුයි. සාරා: ම: 102^{13} සා: පා: 513^{19} ක: වි: 74^{19} පාරා: පා: 275^{6} **-පඤ්ච බන්ධන** 2 (නා) = එනම් ශික්ෂාපදය, යම් මහණකු හෝ මෙහෙණක පිළියම් පසකින් අඩු පාත්‍රය ඇති කල්හි අනෙක් අලුත් පාත්‍රයක් විනවා ගැණීමෙන් සිඩ වන

ඌන පඤ්ච බන්ධන නම් නිසඟි පවිතිය. නි: ශී: 9^{4} ප්‍රා: පු: සා: 491^{6}-321 (2) **-පඤ්ච මාසක** (නා) = මිසු පසකට අඩු, එ පමණ වටිනා බඩුවක්. මිසු පසක් පාදයකි. එ බැවින් පාදයකට අඩු. කහවණුවෙන් විස්සෙන් භාගයකට හෝ අඩු. එබඳු වස්තුවක් සොර සිතින් ගන්නා මහණ හට ථුලැසි වේ. පාරා: පා: 54^{9} **-පඤ්ච වස්ස** 2 (නා) = අඩු පස් වස් ඇති, එම භික්ෂුව. නිස නො ගෙන නො විසිය යුතු භික්ෂුව. මහා: පා: 90^{4}-15 91^{4} **-පඤ්ච වස්සෝ ආපජ්ජති** (ක්‍රි) = උනු පස් වස් ඇති මහණ ඇවැතට පැමිණෙයි. එබඳු භික්ෂුව "මම පණ්ඩිතයෙක්මි, ව්‍යක්ත යෙක් මි"යි නිස නො ගෙන වසන්නේ නම් හේ ඇවැතට පැමිණෙයි. සා: පා: 977^{28} පරි: පා: 167^{5} **-පණ්ණරස වස්ස** (නා) = පසළොස් වයස් වූ. වයස පසළොසක් නොවූ· එබඳු දරුවන්. 'අනුජානාමි භික්ඛවෙ **ඌන පණ්ණරස වස්සං** දුරකං කාකුඩ්ඩෙසපකං පබ්බා පෙතුන්ති" මහා: පා: 87^{26} (කාකුඩ්ඩෙසපක බලනු). **-බන්ධන වස්සිකා** (නා) = එනම් ශික්ෂාපද දෙක. ඌන පඤ්ච බන්ධන ශික්ෂා පදය සහ වස්සික සාටික ශික්ෂාපදය. පරි: පා: 126^{5} සා: පා: 964^{23} **-මාසක** (නා) = මස්සකින් අඩු හුනිඳ දෙකකින් අඩු එබඳු වස්තුව සොර සිතින් ගන්නා භික්ෂුවට දුකුළා ඇවැත් වේ. "**ඌන පඤ්ච මාසකෙ වා** -පෙ- යානා වා‍වෙති ආපත්ති දුක්කටස්ස" පාරා: පා: 641^{4}-29 අ: ප: සා: 65^{24} ම: පා: සා: 490^{1}-B **-වීසති ගණ** (නා) = විසි නමකට අඩු වූ සඞ්ඝයා එක නමකුදු අඩු වූ විංශති වගී සඞ්ඝයා. එබඳු සඞ්ඝයා විසින් අබ්භාන කම්ම කරණ ලද්දේ නම් එම සඞ්ඝයා දුකුළා ඇවැත් අවදිනි "**එකෙන වෙ ඌනෙ වීසති ගණෙනා** භික්ඛු සඞ්ඝෙ තං භික්ඛුං අබ්භෙතබ්බ -පෙ- නෙව භික්ඛු ගාරයහා" ප්‍රා: පු: සා: 30^{5} සා: පා: 454^{36} පාරා: පා: 221^{16} **-වීසති වස්ස** 1 (නා) = උනු විසි වයස් ඇති, පිළිසඳ පටන් නො පිරිපුන් විසි වයස් ඇති යහු උපසපන් නො කළයුත්තෙක්. "යො පන භික්ඛු ජානං ඌන වීසති වස්සං උප සම්පාදෙය්‍ය සො ච පුග්ගලෝ අනුප සම්පන්නො තෙ ච භික්ඛූ ගාරයහා" ප්‍රා: පු: සා: 78^{15} සා: පා: 642^{17} මහා: පා: 86^{25} 87^{3} 103^{23} ක: වි: 127^{7} **-වීසති වස්ස** 2 (නා) = නො පිරිපුන් විසි හවුරුදු ඇති, විසි වයස්

නො වූ. එබඳු මෙහෙණ. එබඳු හෙරණියක් උපසපන් කරන ලද නම් පවිති ඇවැත් වේ. ප්‍රා: පු: ස: 48[29] (2) පාචි: පා: 363[31] 364[2] **-වීසති වස්ස** 3 (නා) = එනම් ශික්ෂා පදය. උනු වීසි වයස් ඇති පුහුලකු දැන දැන උපසපන් කිරීමෙන් උපාධ්‍යාය භික්ෂු හට සිදුවන ඌන වීසති වස්ස නම් සුඛ පවිතිය. නි: ශී: 18[15] ස: පා: 642[9] **-සංවාස නාසනා** (නා) = එනම් ශික්ෂාපද තුන. ඌන වීසති වස්ස, උකඛිත්තකෙන සඞ්ඝ සංවාස, නාසිතක සාමණේර සමෙහාග යන ශික්ෂා පදත්‍රය. පරි: පා: 125[22] ස: පා: 963[11].

ඌනඤ (නා) (ඌන + ක) = උනු, අඩු. **-අඩඪතෙය්‍ය කංස** (නා) = කහවණු දහයකට අඩු, එබඳු අගය ඇති ලහු පාපුරණය = පොරෝනය. පාචි: පා: 289[16] ප්‍රා: පු: ස: 29[23] (2) (අඩ්ඪතෙය්‍ය කංසපරම බලනු) **-චතුඤකංස**) (නා) = කහවණු සොළසකට අඩු. කංසය නම් සතර කහවණුවකි. කහවණු සොළ සකට අඩු අගය ඇති ගරු පාපුරණය එබඳු ගරු පාපුරණයක් විනවන මෙහෙණ එහි විමති වූවා නම් දුකුළා වේ. පාචි: පා: 288[3] **-ඡකඛතතුං** (නි) = සවරකට අඩු පාරා: පා: 253[25] **-ඡඛඛස්ස** (නා) = සවසකින් අඩු. එබඳු කැලය නවසත්තයක් දුරිය හැකි කාලය. මහණ සම්මුතියක් නැතිව සවසකින් අඩු කාලය තුළ නව සත්තයක් කෙරේනම් නිසඟි පවිති වේ. පාරා: පා: 259[9] ස: පා: 495[18] **-තිඤඛතතුං** (නි) = තෙවරකට අඩු. චීවර වඟියේ රාජ ශික්ෂාපදයේ දක්නා පරිදි තෙවරකට අඩුවෙන් වොදනා කිරීම. පාරා: පා: 253[26] **-සඤඤ,** (නා) = අඩුය යන හැඟීම, එම කල්පනාව. පාචි: පා: 288[4] **-සඤඤි** (නා) = අඩුය යන හැඟීම ඇත්තේ, එබඳු භික්ෂුව. පාරා: පා: 263[19].

ඌනඤ්ඤ පාරිපූරියා (නා) = ඌන පූරණය පිණිස. ඌන චීවරයාගේ පූරණය පිණිස. පාරා: පා: 236[33] ප්‍රා: පු: ස: 36[21] (තනිය කඨින සිකඛා පද බලනු).

ඌනෙ ගණෙ චරණං (නා) = ඌන ගණ යෙහි හැසිරීම. මානතෙහි හැසිරෙන භික්ෂු වගේ රාත්‍රිවෙඡ්දය වන කරුණු සතරින් එකක්. "වත්තාරෝ ඛො උපාලි මානත්තා චාරිකඤ්ඤ භික්ඛුනො රත්තිවෙඡ්දා සහවාසො, විප්පවාසො, අනාරොචනා, **ඌනෙ ගණෙ චරණන්ති**" වූ: පා: 91[18] ස: පා: 867[9] (ඌන ගණ බලනු).

ඌම් (නා) [සං. ඌර්ම්] = රළ. අ: ප: ස: 89[31] ජා: අ: ගැ: 141[4] ධ: අ: ගැ: 244[30] **-භය** (නා) =රළ නිසා හටගත් භය. කොධුපායාසය. අභි: ධ: ප්‍ර: 206[33]

ඌරු (නා) [සං. ඌරු] = කළවය. **"ඌරුහි** අඞ්ගජාතං පිළෙන්තස්ස අසුචි මුච්චි" – **"ඌරුයා** පොත්ථනිකං බන්ධිත්වා -පෙ- සඟස්ස අන්තෙ පුරං පාවිසි" –**"ඌරුං** කොට්ටා පෙන්නි" පාරා: පා: 129[5-18] චූ: පා: 317[1] 409[26] ජා: අ: ගැ: 389 732[2] අ: ප: ස: 383[1] **-'අට්ඨි** (නා) = කළවා ඇට. "එකං **ඌරට්ඨිං** එක් **කළවෙ** ඇටෙක" වි: මා: ස: 616[20] 620[3] ධ: අ: ගැ: 242[26] **-'අන්තරිකා** (නා) = කළවා අතර. දෙකළවය අතර. "එහි හන්තෙ **ඌරන්තරිකාය** සටෙවහි" පාරා: පා: 393[4] 401[3] **-පබ්බ** (නා) [සං. පර්ව] = ඌරු සන්ධිය. **දණ, දණමඬල.** අ: ප: ස: 383[2] **-බද්ධාසන** (නා) = ඌරු බද්ධාසනය. පලක් බැඳ හිඳීම. දෙකළවය අධො බඳිනයෙන් හිඳීම. **"ඌරු බද්ධාසනන්ති** ඌරුනම්ධො බඳිනවසෙන නිසජ්ජා' – "ඉමං පල්ලඞ්කං යි **ඌරුබද්ධාසන** සඳහා කියත්" – "පල්ලඞ්කන, හාත්පසින් **ඌරුබද්ධාසනය**" සාර: දී: 544[4] වි: මා: ස: 953[18] ධ: අ: ගැ: 37[7] සු: වි: 146[37] ස: පා: 294[1] **-මංස** (නා) = කළවා මාංසය. කළවා යෙහි මස්. "පොත්ථනිකං ගහෙත්වා **ඌරු** මංසං උක්කන්තිත්වා දුසියා අදාසි" මහා: පා: 251[5] වි: මා: ස: 613[31] ධ: අ: ගැ: 121[17]

ඌරුඤ්ඤ (නා) = විවෙක ඇති. කරදර නැති ප: සු: 184[7] (4)

ඌස (නා) = කරමැටි. අ: ප: ස: 261[5]

ඌසර (නා) = කරමැටි බිම **"ඌසර** යනු කර නැගෙන භූමියට නම්" අ: ප: ස: 262[0]

ඌහචච (පූ: ක්‍රි:) [සං. ඌහතය] = 1 කිලිටි කොට මලපහකොට, සිරුරු මල විහිද, 2 පැහැර **"ඌහචච** යනුයෙහි අර්‍ථය හනිත්වා යනු – පැහැරා යූසේසි" ජා: අ: ගැ: 126[23] 194[16]

ඌහඤ්ඤි (ක්‍රි) (උ + √හන + ර්) = අපිරිසුදු විය. කිලිටි විය. "මා විහාරෝ රජෙන

ඌහඤ්ඤිති, වෙහෙර රජසින් කිලිටි නොවේ වශි" මහා: පා: 4431 ම: පා: සු: 15832 චූ: පා: 33937 3577

ඌහත 1 (නා) උඩට නැඟුණු අව් සුළඟින් මියලි උඩට නැඟුණු. රජස්. "හිමහානං පඨමේ මාසෙ **ඌහතං** රජෝ ජල්ලං" පාරා: පා: 6925 සු: පා: 29138

ඌහත 2 (නා) = අපිරිසුදු වූ කිලිටි වූ බැහැර අසුචි වැකුණු. "සබෙ වච්ච ඛුට් **ඌහතා** හොති ධොවිතබ්බා" චූ: පා: 35420 සු: පා: 94819 (ඌහච්ච බලනු)

ඌහදනති (ක්‍රි) (ඌ + √හද + නති) = මිල පහ කරත්. "යෙසං නො දුරකා **ඌහදනතිපි** උම්මිහනතිපි උභූරෙහිපි බජ්ජනති" – "සෙනා සනං **ඌහදනතිපි** උම්මිහනතිපි" – **ඌහද නතිපි**, පුරිසයෙන් වැකෙනිපු" පාරා: පා: 25722 පාචි: පා: 14718 ධ: අ: ගැ: 15613 සු: පා: 4958 සාර: දී: 74821

ඌහදිත (නා) = මිල පහකළ, අපිරිසිදු කළ. අසුචි නැවැරැණු. සු: පා: 94819

ඌහන (නා) [සං. ඌහන] = චිතකීය, අරමුණ පිළිබඳ පරිකල්පනය. "ආරම්මණසස පරිකපප නනති ආහ **ඌහනනති** වුත්තං හොති" – නත්ථි චිතකෙකා. **ඌහනනති** වුත්තං හොති" සාර: දී: 30314 සු: පා: 9123 පි: ම: ටී: 6120 (ඌහා බලනු)

ඌහණන (නා) = මිල පහ කළ. වර්චස් කොට අපිරිසිදු කළ "වච්චස් කොට නසන ලද" ජා: අ: ගැ: 12628

ඌහසනති (ක්‍රි) (ඌ + √හස + නති) = මිඳ සිනහ සෙත්. සිනහ සි මඳ මඳ සිනහ සෙත්. "යා තා ඉත්ථියො – පෙ – තා ආයසමතො උදයිතා සද්ධිං **ඌහසනතිපි**" පාරා: පා: 14326 සු: පා: 3902

ඌහා (න) [සං. ඌහා] = චිතකීය. අරමුණ පිළිබඳව චිතකී කිරීම. අ: ප: සු: 323 සු: පා: 9123 (ඌහත බලනු)

එ

එක (නා) [සං. එකඃ] = 1 සඞ්ඛ්‍යාව, ගණන. 2 සමාන 3 අසහාය අන්‍ය 5 ශ්‍රෙෂ්ඨ යන අර්ථ වල වැටෙන නාමපදයක්. "**එක පුගගලො** හිකඛවෙ ලොකෙ උපපජ්ජමානො උපපජ්ජති බහුජනහිතාය" යනාදියෙහි **එක**ශබ්ද සංඛ්‍යා වාචිය. "අරියවිනයෙනිවා -පෙ සපපුරිස ධම්මෙනිවා **එකෙ එකසෙවස** සමෙ සම්භාගෙ නජ්ජාතෙ" යනාදි තන්හි තුල්‍ය වාචිය. "**එකො** වරෙ බගහ විසාණකපෙපා" යනාදියෙහි අසහාය වාචිය. "සසසතො අත්තානව ලොකොවාති **ඉවෙවඤ්ඤ** අභිවදනති" යනාදියෙහි අන්‍යවාචිය. ශ්‍රෙෂ්ඨවාචි ද වේමැ යි" රූ සි: සු: 3749 (පුං: ලි: **එකො** සත්‍රී: ලි: **එකා** න: ලි: **එකං**) –'**අංස** (නා) [සං. අංස] = එක් උරහිසක්. එක් දසරුව. එක් උරය. "අථඛො බ්‍රහ්මා සහම්පති **එකංසං** උත්තරා සඞ්ඝං කරිත්වා දක්ඛිණං ජාණුමණ්ඩලං පුථවියං නිහන්ත්වා" මහා: පා: 59 අඞ්ඝු: 4122 සු පා: 9979 පරි: පා: 19528 –'**අංසපාරුපන** (නා) = එක් උරයක් වසා පෙරවීම. වම් අත විවෘත කොට සිවුර දසරුවෙහි ලා ගැන්ම. "යථා ච පාලිකාරකො හිකඛු **එකංසපාරුප නෙන** පාරුතං වාමබාහුං විවරිත්වා චීවරං අංසකූටෙ ආරොපෙති" –"**එකංසපාරුප නෙන** එකස් කොට පෙරවීමෙන්" සු: පා: 8972 ක: වි: 15020 ක: වී: පි: 1257 –'**අංසං චීවරං කත්වා** (පූ: ක්‍රි:) සිවුර **එකස්** කොට පෙර වැ. උතුරු සඟල මනාව පෙරවැ. "**එකංසං චීවරං කත්වාති**, එකසම්ං අංසකූටෙ චීවරං කත්වා සාඩ්ඩකං උත්තරාසඞගං කත්වාති අත්ථො" සු: පා: 9979 පරි: පා: 19528 –'**අංසව්‍යාකර ණීය** (නා) – එතම් ප්‍රශ්නය. එකාන්තයෙන්ම, කෙළින්ම පිළිතුරුදී විසඳිය යුතු ප්‍රශ්න. "වකඛ්‍ං අනිච්චන්ති පුඤ්ඤෙන ආම අනිච්චන්ති එකංසෙනෙව ව්‍යාකාතබබං -පෙ-අයං **එකංස ව්‍යාකරණීයො** පඤ්හා" මනෝ: පූ: 42096 අඞ්ඝු: නි: 12030 21615 –'**අංසික** (නා) = (අංස + ඉක = උතුරු සඟල. **එකස්** කොට පෙරවන සිවුර. උත්තරා සඞ්ඝය. තනිපට සිවුර. "**එකංසිකසසාසි**, උත්තරාසඞ්ඝ චීවර යාගේද" කු: සි: සු: 1716 –'**අංසෙන** (නා) = එකාන්තයෙන්. නියතයෙන්. "**එකංසෙන** ගොතමී ධාරෙය්‍යාසි" චූ, පා: 40215 –'**අකඩිඤාණ** (නා) = එක් ඇසක් කණවූවහු

කණ. පැවිදි නොකළයුතු පරිසදූෂකයෙක්. සං: පා: 76923 -**අගාරික** (නා) (අගාර + ඉක) = එක් ගෙදරකින් පමණක් භික්ෂාව ලබන එක් තාපස කොටසක්. **එකාගාරිකෝ වා** හොති **එකාලොපිකොවා**" දී: නි: 12223 සු: වි: 2328 ප: සූ: 371 මනෝ: පූ: 46415 අඞ්ගු: නි: 180 31938 -**අඞ්ගික** (නා) = (අඞග + ඉක) එක් අඞගයක් ඇති. ක: වි: 2135 ධ: ඇ: ගැ: 21027 -**අත්‍ථරණ** (නා) (ආ + √ථර + ණ) [සං. ආස්තරණ] = එකම ආස්තරණය ඇති. පාවාරාදීන්ගේ එක් කෙළ වරක් ඇතිරීම. "**එකත්‍ථරණාපි** තුවටෙවනහි' පාරා: පා: 2143 21625 -ං**පාපුරණ** (නා) [සං. ප්‍රාවරණ] = එකම ඇතිරිය සහ එකම පෙරවීම ඇති. "**එකත්‍ථරණ පාපුරණෙ**, පාවාරාදීන්ගේ එක් කෙළවරක් අතුට එක් කෙළවරක් පෙරව හෙවීමෙන් එකක් ම ආස්තරණ පාවාරණ කොට ඇතිව" - "**එකත්‍ථරණ** පාපුරණෙ, එකම අතුරෙයි එකම පෙරවයි යන අර්ථය." පාරා: පා: 2143 පරි: පා: ගැ: 723 පාචි: පා: 32126 සං: පා: 69618 (-ං**පාවුරණකී** ද' දක්නේය චූ: පා: B. 6858) -**අදධානමගගං** (නා) [සං. අඞ්ගාන මාර්ග] = එක් දීඝිමාර්ගය. එක් අදන් මග "ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීහි සද්ධිං සංවිධාය **එකද්ධාන මගගං** පටිපජ්ජන්ති" පාචි: පා: 7811 7910 ක: වි: 10017 ප්‍රා: පු: සං: 6419 (අඞ්ගාන මඟ බලනු) -**අනුසන්ධික** (න) = **එක**ම අනුසන්ධියක් ඇති, සන්තපථ්‍යානාදි **සූත්‍ර**. එක කරුණක් මාතෘකා කොට එහි විභාග දැක්වීමෙන් දෙසූ **සූත්‍ර**. සාර: දී: 8815 වි: වි: ටී: 2021 -**අනුසාවන** (නා) = එක් වර අනුශ්‍රාවණය කිරීම. එක්වරම කර්මවාක්‍යය කීම, ඇස්වීම. උපසම්පදා පෙක්ෂක දෙතුන් නම **එක**වර **කම්**වාක්‍යය කියා උපසම්පදා කිරීම "අනුජානාමි භික්ඛවෙ දොතයො **එකානුසාවනෙ කාතුං**" -"**එක**තො සඞ්ඝෙව **එක**සම්මං ඛණෙ අනුසාවනං එතෙ සන්ති **එකානුසාවනා**" මහා: පා: 10318 වි: වි: ටී: 3896 (අනුසාවන **කම්**ම බලනු) සං: පා: 77121 102918 -**අභපවිච්ඡනන** (නා) = එක් දවසක් ප්‍රතිච්ඡන්න කිරීම. එක් දිනක් ඇවැත් සැඟවීම. ම: පා: සං: 16921 චූ: පා: 188 -**ආබද්ධනිමිත්තක** (නා) = එකට බැඳි පවත්නා නිමිත්ත. සීමාබන්ධනයෙහි මඟහ නිමිත්ත පිළිබඳ එක් විශෙෂයක්. විහාරය හාත්පස සිවු දිගෙහිම එකාබද්ධ වූ සිවු මගක් වූ කල එයින් එකක් කිහිනය කර සෙස්ස කිහිනය නො කිරීම. එය එකාබද්ධ බැවිනි. සං: පා: 77516-18 -**ආබද්ධනමුඛ ලොම** (නා) = හිසකෙස් හා එකට බැඳුණු බැම ලොම් ඇතියහු පැවිදි නොකළ යුතු පරිසදූෂක යෙක්. සං: පා: 7682 හෙ: සි: වි: 12421 වි: වි: 2494 -**ආරක්ඛ** (නා) = එළඹ සිටි සිහිය. දශආර්‍යවාසයන් ගෙන් එකක්. "**එකාරක්ඛොනි** උපට්ඨිත සතිනා" වි: වි: ටී: 3662-7 ම: පා: සං: -**ආලොපික** (නා) එක බත් පිඬෙන්ම යැපෙන. එක් තාපස කොටසක්. දී: නි: 12223 ප: සූ: 372 මනෝ: පූ: 46416 අඞ්ගු: නි: 180 -**ආවත්ත** (නා) [සං. ආවර්ත] = සතුරු පක්ෂයෙහි සිටි විසභාග පුද්ගලයා භික්ෂුවක විසින් නොවැළඳිය යුත්තෙක්. වෛරී පුද්ගලයා සං: පා: 10243 පරි: පා: ගැ: 3711 (එකාවත්ථාගීද දක්නේය, පරි: පා: 27224) -**ආසන** 1 (නා) = එක අස්න; එකම ආසනය. "**එකාසනෙපි** නිසීදන්ති" පාරා: පා: 2142 -**ආසන** 2 (නා) එකාසනය, සම්වස් ඇති භික්ෂුව හෝනා හිඳුනා ඇඳ හෝ පුටුව. පාරිවාසික භික්ෂුව පකතත්ත හෙවත් උත්ක්ෂෙපනීය කර්මය නො කළ භික්ෂුව සමග නො හිඳිය යුතු අසුන. "න පකතත්තෙන භික්ඛුනා සද්ධිං **එකාසනෙ** නිසීදිතබ්බං" චූ: පා: 814 8725 සං: පා: 86516 -**ආසන** 3 (නා) = එක් අසුනෙහි වැළඳීම. වි: මා: සං: 14934 (එකාසනිකඞග බලනු) -**ඉන්ද්‍රිය** (නා) = **එක** ම ඉන්ද්‍රිය, වෘක්ෂලතා දින්ට ඇතැයි සැලකූ ඉන්ද්‍රිය. කායින්ද්‍රිය, (ජීවිතෙන්ද්‍රිය?) "**එකින්ද්‍රියං** සමණා සක්‍ය පුත්තියා ජීවං විහෙඨෙන්ති" - "හරිතාණි තිණානි සම්මද්දන්තා **එකින්ද්‍රියං** ජීවං විහෙඨෙන්තා" "**එකින්ද්‍රියන්ති** කායින්ද්‍රියං සඤ්ඤාය වදන්ති" -"රූපෙන්ද්‍රියයන්ට අයත්ව විද්‍යමානවන වස්තුවක් හෙයින් මෙසේ කියන ලදී. එහෙත් භූතගාමයන් පිළිබඳව **මනින්ද්‍රිය**යක්ද අපෙක්ෂා කෙරෙති" පාරා: පා; 18436 පාචි: පා: 4729 මහා: පා: 15331 ම: පා: සං: 42518 සාර: ම: 6321 (මේ එකින්ද්‍රිය ශබ්දය කායින්ද්‍රිය සඳහා කියන ලදැයි අටුවායෙහි දක්නේය, එහෙත් මෙහි එකින්ද්‍රිය ශබ්දයෙන් අදහස් කරනුයේ කායින්ද්‍රිය නොව ජීවිතෙන්ද්‍රිය යි ගැණීමට කරුණු ඇත. "ජීවසඤ්ඤිනොහි මොඝපුරිසා

මනුස්සා රුක්ඛසම්ං'' (පාරා: පා: 185[7] පාචි පා: 485) ආදී තන්හි දැක්වෙනුයේ වෘක්ෂලතා වන් සත්ත්ව විශෙෂයක මෙන් සමහරුන් සැලකූ බවයි. ''ජීවසඤ්ඤිනෝ යි යෙදුවේ එබැවිනි. මේ කියනුයේ ජෙන හකනිකයන් උදෙසාය. ඔවුහු වෘක්ෂලතාවන් සත්ත්ව සඞ්ඛ්‍යායෙහිලා සලකති. වෘක්ෂලතාවන් සත්ත්ව සඞ්ඛ්‍යාවෙහිලා සැලකුවෝ ඔවුන්ගේ (=වෘක්ෂලතාවන්ගේ) ජීවිතෙන්ද්‍රිය හෙවත් ජීවය පමණක් දුටහ. සෙසු ඉන්ද්‍රියයන් නො දුටහ. එබැවින් වෘක්ෂලතාවන් **''එකින්ද්‍රිය''** නමින් ගත්හ එකින්ද්‍රිය ශබ්දය සමග ජීව ශබ්දය යොදා ඇත්තේ ද එබැවිනි මෙබඳු තැන එකින්ද්‍රිය ශබ්දය ජීව ශබ්දයාගේ විශෙෂණයක් මෙන් ගනු සුදුසුය. බුඩ දෙශනාවේ **එකින්ද්‍රිය** යනු යෙදුවේ ජෙන ඝානිත්‍යයේ දක්නා **වනස්සපතිකාය** පිණිසය. වනස්පති කායයාගේ ජීවත්වය පෙන්වන දශවෙකාලික සූත්‍රයේ මෙසේ කියයි. ''අග්ගබීයා මූලබීයා පොරබීයා සංඝබීයා බීයරුහා සම්මූච්ඡිමා තණලයා **වණස්සතිකායා සබ්බා විත්ත මංතමක්ඛායා** අණෙගජීවා පුතෙසත්තා අන්නත්ථ සත්තපරිණතිණං'' (දශවෙකාලික සූත්‍ර 1183) මෙයට විවරණයක් ලියන ජෙනා චාර්‍ය ජෙන ධර්මදිවාකරයෝ ''**වනස්සපතිඃ සවෙතනඃ** බාල්‍යාද්‍යවස්ථාසඳර්ශිතාත්, ඡේදන භෙදනාදිභිර්මලානතාදි දර්ශනාච්ච මනුෂ්‍ය ශරිරවත්''යි සවසමය අනුව වනස්පතිකාය යාගේ සවෙතනත්වය පෙන්වති. මේ කරුණු අනුව බුඩ දෙශනාවේ එකින්ද්‍රිය නමින් හැඳින් වෙනුයේ ජෙනයන් වනස්පතිකාය නමින් හඳුන්වන වෘක්ෂලතාවන්ගේ සවෙතනිකත්වය හෙවත් ජීවිතෙන්ද්‍රිය බව පිළිගත යුතුය විමසත්වා) -**'උතුතරිකනිකාය** (නා) = පරිවාර පාළියෙහි **එක්** ප්‍රකරණාංශයක්. **එක**කට අධික වූ කරුණු සඞ්ග්‍රහ කොට දැක්වූ ප්‍රකරණාංශය. පරි. පා: ගැ: 178 පරි: පා: 16115 සු: ප: xiv31 -**'උදෙදස** (නා) = එක්ව උදෙසීම **එක්ව** පැවැති පාමොක් උදෙසීම ඇති. පස් වැදෑරුම් ප්‍රාතිමොක්ෂය **එක්ව** උදෙසීම. සමාන සංවාසක සඞ්ඝයාගේ ලක්ෂණයක්. ''සම ගෙනාහි සඞ්ඝා සමෙමාදමානා අවිවදමානා **එකුදෙදසෙ** ඵාසු විහරති'' පාරා: පා: 2728 2076 29 19 සං: පා: 1867 ප්‍රා: ප්‍ර: සං: 2124 **ක**: වි: 4518 **ක**: වි: පි: ං726 වින: ම: 5727 -**'උපචාර** 1 (නා) = එකුපචාරය. උදෙසිත ශික්ෂාපදයෙහි 1 ගාම, 2 නිවෙසන 3 උදෙදා සිත 4 අට්ට 5 මාල 6 පාසාද 7 හම්මිය 8 නාවා 9 සත්ථ 10 ඛෙත්ත 11 ඛණ්ඩඵුල්ලකරණ 12 ආරාම 13 විහාර 14 රුක්ඛමූල 15 අජ්ඣොකාස යනු වෙන් විවර නික්ෂෙපස්ථාන (තැන්පත් කොට තැබිය යුතු තැන්) පසළොසකි ඒ **එක**ක් බැගින් **එකුපචාර** - නානුපචාර විසින් දෙවැ දුරුම් වේ **එ**හි **එකුපචාර** නම් ප්‍රාකාරයකින් හෝ පරිඛාදියකින් හෝ පරික්ෂිප්තව **එක** කුලයකට අයත්වූයේයි. ''ප්‍රාකාරපරිඛාදීන් පරික්ෂිප්තවැ **එක**කුලසඞ්ගික වීනම් **එකුප චාරය**. අපරික්ෂිප්ත වැ **එක** කුලායත්ත නමුදු පරික්ෂිප්තවැ නානාකුලායත්ත වී නමුදු නානු පචාරයි'' ක: වි: පි: 465 සං: පා: 4711 පාරා: පා: 23225 **ක**: වි: 581 -**'උපචාර** 2 (නා) = එකුපචාරය. **එක්**මගකින් පිවිස අභ්‍යවකාශ යට නො පැමිණ සෙනසුන අවට හැමතැනම යනු හැකිසේ තැනූ ප්‍රාසාදය. සඟසෙය්‍ය ශික්ෂාපදයේ සඳහන් ප්‍රාසාද **ලක්ෂණයක්**. සං: පා: 543[29] වි: වි: ටී: 300[28] -ංඅජ්ඣොකාස (නා) [සං. අධ්‍යවකාස] = එකුපචාර අධ්‍යවකාශය. ''අගාමකෙ අරඤ්ඤෙ සමන්තා සත්තබ්භන්තරා **එකුපචාරෙ**'' යි කී බැවින් විඛ්‍යාටවී ආදී අගාමක අරණ්‍යයෙහි හා මනුෂ්‍ය බඛයන් දියපිටින් ගොස් නැවත මෙහි ලග්නට නො එන පමණ්ඩුර සමුද්‍රදීපක යෙහි හා ලැබෙන සත්තබ්භන්තරය.'' - ''මැද සිටියහු අවවින් අබ්භන්තර සතක්. **එක්** කෙළවරක සිට අනෙක් කෙළවරට අබ්භන්තර තුදුසකි **එක්** අබ්භන්තරයක් අටවිසි රියනකි. එය **එකුපචාර අජ්ඣොකාස** නම් **ක**: වි: පි: 465 පාරා: පා: 2354 සපා: 47131 **ක**: වි: 591 -ංගාම (නා) = එකුපචාර ග්‍රාමය. **''ගාමො එකුපචාරෙ** නාම **එක**කුලස්ස ගාමෙ භොති පරික්ඛිත්තෙ නා ච'' යනු බැවින් ප්‍රාකාරපරිඛා දීන් පරික්ෂිප්ත වූ **එක** කුලසඞ්ගික (=එක කුලයකට අයිති) **එක** කුටික ග්‍රාමයයි. මෙහි **එක** කුලය නම් **එක** රජකෙනෙකුගේ හෝ ග්‍රාමයයි. සං: පා: 47022 **ක**: වි; පි: 468 පාරා: පා: 23223 -**'උපොසථ** (නා) = එකුපොසථය, **එක්ව** පොහෝ කිරීම, **එක්ව** සඞ්ඝකම් කිරීමට සුදුසු සමාන සංවාස සීමාවේ **ලක්ෂණයක්** ''යා සා සඞ්ඝස්ස සීමා සම්මතා සමානසංවාසා **එකුපොසථා**'' මහා: පා: 11928 1204 වි: ලෑ: 22620 -**උප්පාද** (නා) = (උ/පද + ණ) [සං උත්පාද] = **එක්ව** ඉපදීම් ඇති.

පරි: පා: 237[9] පරි: පා: ගැ: 31[29] (එකු පපාද **එකනිරොධ** බලනු.) -**ංඑකනිරොධ** (නා = **එක්ව** ඉපද **එක්ව** නිරුඬ වන. අනන්තරුබ්භාර සහුබ්භාර යන කසීනුද්ධාර දෙක. මෙහි නිරුද්ධීම නම් උද්ධාරයයි. "පුරිමා දෙ අත්ථාරෙන සදිසං **එකතො නිරුජ්ඣනති** උද්ධාරභාවං පාපුණනති" -"අනන්තරුබ්භාර සහුබ්භාර දෙක අත්ථාර මූලක අනුසසින් **එක**කුත් නොතබා හැම ම අනුසස් නසයි" පරි: පා: 237[9] පරි: පා: ගැ: 31[31] සි: පා: 1017[18] -**ංනානා නිරොධ** (නා) = **එක්ව** ඉපද වෙන් වෙන්ව නිරුඬ වන්නෝ. අනන්තරුබ්භාර සහුබ්භාර දෙක හැර සෙසු කසීනුද්ධාරයෝ එකුපපාද නානා නිරොධයෝ වෙත්. පරි: පා: 2.7[11] සි: පා: 1017[20] -**කම්ම** 1 (නා) = **එක්ව** සඬ්ඝ කම් කිරීම. පොහෝ පවුරුණු **එක්ව** කිරීම. "**එකකම්මනති** ආදීහි උපොසථ පවාරණා යෙව වුත්තා" සි: ප: 702[20] පාචි: පා: 348[19] ප්‍රා: පු: ස: 45[30] (2) (සංවාස බලනු) -**කම්ම** 2 (නා) = අපලොකනාදි චතුර්විධ සඬ්ඝ කම්ය පකතත්ත භික්ෂූන් සමග **එක්ව** කටයුතු බැවින් අපලොකනාදි චතුර්විධ සඬ්ඝකම්ය **එකකම්ම** නම් වේ. "අපලොකනාදි චතුබ්බිධම්පි සඬ්ඝකම්මං සීමා පරිච්ඡින්නෙනාහි පකතත්තෙනාහි භික්ඛූහි **එකතො** කත්තබ්බත්තා **එකකම්මං** නාම" ඛින: ම' 57[25] **ක**: වි: 20[29] **ක**: වි: පි: 18[21] -**කුටි** (නා) = **එක්** කුටියක් හෝ ඇති, ගම. **ක**: වි: පි: 46[8] -**කුල** (නා **එක**කුලය. **එක්**රජකෙනෙකු හෝ **එක්** ග්‍රාම හොජකයකු ඇති. එබඳු ගම. ස: පා: 470[22] -**ඝර** (නා) = **එක**ට ඝනවූ, **එක**ාබද්ධ වූ. සෙය්‍යථාපි හත්ථෙ සෙලො පබ්බතො අවිජ්ඣෙදා අසුසිරො **එකඝරතා**" මහා: පා: 217[36] -**චඞ්කම** (නා) = [සං. චඞ්ක්‍රම.] = **එක** සක්මන. අබ්භානාර්හ භික්ෂුව සමග **එක** සක්මනෙහි සක්මන් නොකට යුතුය. "න **එක චඞ්කමෙ** චඞ්කමිතබ්බං" චූ: පා: 81[6] -**චරියා** (නා) [සං. චර්‍යා] =**එක**ලාව හැසිරීම, හුදෙකලා ජීවිතය විවේකය ජා: අ: ගැ: 177[6] -**චාරික භත්ත** (නා) = එනම් බත ඉතා ප්‍රිය බැවින් සියලු දෙනාටම ලැබීම පිණිස වෙන් වෙන් ඝිනිකාවෙන් ලැබිය යුතු බතක්. වි: ම: ටී: 2351 සි: පා: 416[24] 932[27] සාර: දී; 685[26] (**එක**චාරිය භත්තායි ද දක්නේය. සි: ප: 932[28]) -**චාරිකවත්ත** (නා) = **එක**ලාව වසන්නහු විසින් පිරිය යුතු වත්. ඇතුළුවස තනිව වසන්නහු විසින් පිරිය යුතු වත්. භාවනාව "අනෙනාවසෙසෙ **ඒකචාරිකවත්තං** පූරසිංසුයෙව" - "**එකචාරිකවත්තභාවනා** කම්මං" සි: ප: 910[1] වි: වි: ටී: 467[28] ධ: අ: ගැ: 31[22] -**ඡඳන** (නා) [සං. ඡදන] = **එක** පියස්ස ඇති, එබඳු කාමරපෙළ. "**එකඡඳන** ගබ්භපාළියො සඞ්ගාය වුත්තාං" සි: ප: 545[3] -**ඡන්න** (නා) (√ඡද + ය = අන) **එක** පියස්ස ඇති, එබඳු ආවාසය පිරිවෙස් වසන භික්ෂුව විසින් පකතත්ත භික්ෂුව සමග නො විසිය යුතු ගෙය. චූ: පා: 80[26] සි: පා: 864[3] -**ඡන්න ආවාස** (නා) - **එක්** පියස්සක් ඇති ආවාසය. **එක්** වහලක් ඇති වාසස්ථානය. **එක්** පියස්සෙන් ජලය වැටෙන ප්‍රදෙශය ද **එක**ච්ඡන්න ආවාසයට ඇතුළත්වේ. පාරිවාසික භික්ෂුව හෝ උත්ක්ෂේපනීය කර්මය ලද භික්ෂුව හෝ පකතත්ත භික්ෂුව සමග **එක** ඡන්න ආවාසයෙහි නො වැස පියස්සෙන් වෙන්වූ ආවාසයකම විසිය යුතුය. චූ: පා: 80[26] සි: පා: 864[15] චූ: පා: B. xii[20] -**ඨාලක** (නා) (ඨාල + **ක** = **එක** මිලාව. පැන්බොන බඳුන. "න භික්ඛවෙ **එකඨාලකෙන** පානබ්බං" චූ: පා: B 6:46 චූ: පා: 236[22]–257[3] - **දිවස** (නා) = **එක්** දිනයක්. **එක්** දවසක්. **ක**: වි: පි: 79[21] -**දිසා** (නා) [සං දිශා] = **එක්** දෙසක. **එක** පැත්තක. වි: වි: ටී: 457[16] -**දෙවසික** (නා) = **එක්** දවසෙක. **එක** දවසකම. **ක**: වි: පි: 79[3] -**දෙස** (නා) = **එක** කොටසක්. **එක්** භාගයක්. වි: වි: ටී: 397[25] කු: සි: ස: 63[5] -**නිකායසික** (නා) = **එක** නිකායයෙහි වූ. සව නිකායික භික්ෂූහු සාර: දී: 492[37] වි: වි: ටී: 205 -**නිරොධ** (නා) = **එක්ව** නිරොධය ඇති. පරි: පා: ගැ: 31[30] (එකුපපාද **එක** නිරොධ බලනු). -**නානික** (නා) = **එක**වර නොයෙක් ප්‍රකාරයෙන් සමවැදීම් ඇති, එබඳු ධ්‍යානය, වි: මා: ස: 910[20] -**පටලික** (නා) (පටල + ඉක) = **එක්** පට ඇති, එබඳු වහන්. "**එකපටලික** උපාහනා, **එක්**පට වහන්" ජා: අ: ගැ: 148[6] (**එක**පලාසික බලනු). -**පටට චීවර** (නා) = **එක්**පට සිවුර, තනිපට සිවුර. ස: පා: 661[2] වි: මා: ස: 262[37] -**පණ්ණවජ්ජතන** (නා) = **එක** පණ්වජ්ජත්‍රය 1 සෙතවජ්ජතා 2 කිලඤ්ජවජ්ජතා 3 පණ්ණණවජ්ජතා යන තෙවැ දෑරුම් ජත්‍රයන්ට අනුලොම් වූ **එක්** ජත්‍රයක්. තලපත් ආදී **එකම** පත්‍රයකින් කළ ජත්‍රය.

"**එකපණ්ණවිජ්ජනනති** තාලපණ්ණාදිනා එකෙන පණ්ණෙන කත ඡත්තං" -"**එක පණ්ණවිජ්ජන** නම් තලපතයි" ස: පා: 818[38] 894[33] චි: වි: ටී: 462[6] කු: සි: ස: 1241[9] බු: සි: ටී: 1491[8] නි: ශී: 36[32] -**පද** (නා) = 1 එක පදය. 2 එක කොටස. 3 එක පියවර. චි: වි: ටී: 180[35] -**පරිච්ඡේද** (නා) (පරි÷ඡ්/ඡිද + ණ) [සං. පරිච්ඡේද] = එකම පරිච්ඡේදය, එක කොටස. එකවගීය. "රූපියං අසඤ්ඤිවාදකං උපඤ්ඤුනි ඉමානි තීණි **එකපරිච්ඡේදානි**" ස: පා: 422[35] 652[17] මි: වි: ටී: 336[4] -**පරියාඝන** (නා) = එක් වරක් වටකළ. එක් වෙළුම්පටක් ඇති. එබඳු කාය බන්ධනය මෙහෙණක විසින් කාබහන බැඳිය යුතු පිළි වෙළ. "අනුජානාමි භික්ඛවෙ භික්ඛුනියා **එකපරියාඝනං** කායබන්ධනං" චු: පා: 409[6] ස: පා: 952[37] චු: පා:- B. 446[12] -**පලාසික** (නා) (පලාස + ඉක) = එක් පට ඇති, එබඳු වහන්. භික්ෂූන්ට අනුදත් එක් වහන් වෙසෙසක්. "අනුජානාමි භික්ඛවෙ **එකපලාසිකං** උපාහනං" මහා: පා: 218[28] 219[3] ස· පා: 806[1] -**පලලඞ්ක** (නා) [සං. පර්‍යඞ්ක] = එක පළඟ. එකපර්‍යඞ්කය. එක් වරකුදු නොනැගිට බැඳ ගත් පළඟ ඇතිවම. "අථඛෝ භගවා -පෙ- රාජායතනමූලෙ සත්තාහං **එකපල්ලඞ්කෙන** නිසීදි විමුත්තිසුඛ පටිසංවෙදී" මහා: පා: 3[28] ස: පා: 714[26] -**පස්ස** (නා) [සං. පාර්‍ශ්ව] = එක් පසෙක, එක පැත්තක. චි: වි: ටී: 161[4] -**පාපුරණ** (නා) [සං. ප්‍රාවරණ] = එක් පොරෝනය. එක් පොරෝනය ඇතිව, එක්ව නිදීම. "න **එකපාපුරණෙන** තුවට්ටිතබ්බං" චු: පා: 236[17] (එක පාවුරණයි ද දක්නේය චු: පා: B. 684[12] (එකත්ථරණපාපුරණ යනු බලනු). -**පුග්ගල** (නා) = එක පුද්ගලයා. තනි භික්ෂුව. "සෝ දෙසෙය්‍ය -පෙ- සඞ්ඝමපේක්ඛ වා ගණමපේක්ඛ වා **එකපුග්ගලෙ** වා" මහා: පා: 113[10] -**පුත්තක** (නා) (පුත්ත + ක) = එකම පුතා. අනේ එකම පුතාය. "තඞ ඛොසි තාත අම්හාකං **එකපුත්තකොසා**" පාරා: පා. 12[6] ස. පා: 140[9] -**පොරිස** (නා) (පුරිස + ණ) [සං. පෞරුෂ] = 1 එක බඹය, 2 පියවර සයක් හෝ සතක් පමණ වූ සෙවණැල්ල. "ඡසත්තාපද පරිමිතානි ඡායා **පොරිසානි** වුච්චති" - "පියවර සයකින් හෝ සතකින් පරිමිතවූයේ **පොරිස නම්**" චි: වි: ටී: 394[15] සාරා: ම: 218[17] ස: පා: 771[16] (ඡායා මෙතබ්බා බලනු.)-**බන්ධන** (නා) එක බඳිනයක් ඇති පාත්‍රය. පාරා: පා: 287[18] (ඌන පඤ්ච බන්ධන බලනු) -**බීජී** (නා) = එනම් සෝවාන් පුද්ගලයා. එක ම සකෘබ් බීජ යක් ඇති පුද්ගලයා. "අත්තභාව සඞ්ඛාතං එකං යෙව බන්ධබීජං තස්ස අත්ථිති **එකබීජී** යනුවෙ" - "ඉදින් මතුයෙහි තුන්මාගීයන්ගෙ විදර්‍ශනා තොමෝ බලවත්වේ නම් **එකබීජී** නම් වෙයි" චි: මා: ස: 1748[21] -**භණ්ඩපඤ්චක** (නා) (පඤ්ච + ක) = අදින්නාදාන පාරාජිකාවේ පස්වසි අවහාරයන් ඇතුලත් පස් පඤ්චකයන්ගෙන් එක් පඤ්චකයක්. 1 ආදියෙය්‍ය 2 හරෙය්‍ය 3 අවහරෙය්‍ය 4 ඉරියාපථං විකොපෙය්‍ය 5 ඨානා චාවෙය්‍ය යන මෙයින් එකකින් හුදු සවිඤ්ඤාණක වස්තුවක් ගැණීමෙන් සිදුවන අවහාරය. ක: චි: 26[1] ස: පා: 218[6-26] සි: ව: චි: 193[1] -**භන්න** (නා) = එක් වේලක පමණක් අනුභව කිරීම. "දුක්කරං ජීවිං **එකභන්නං** එක සෙය්‍යං" යනාදීන් සාජීවයෙහි දුර්ලභ බව පහළ නො කොට" - "**එකභන්නං**, එක් වේලෙහි මතු බත්" ප්‍රා: පු: ස: 8[18] ධ: අ: ගැ: 2735 -**භනනික** (නා) (භන්න + ඉක) = එක් වේලේ වළඳන. මධ්‍යාහ්න කාලය තුළ පමණක් වළඳන. පෙරවරු දසවරක් හෝ වළඳන්නේ නමුදු එක භත්තික වේ. "සෝ බීජගාම භූතගාම සමාරම්භා පටිවිරතෝ හොති **එක භත්තිකෝ**" සාර: දී: 1'1[28] ප: සූ: 174[5] අඞ්ගු: නි: 1293[4], 3221 -**භව** (නා) =එකභවය. ප්‍රතිසන්ධියෙන් සහ ව්‍යුතියෙන් පිරිසුන් භවය. චි: මා: ස: 1015[14] -**භාජන** (නා) = එක්බඳුන. බොහෝ දෙනෙක් එක් බඳුනෙහි වැළඳීම. "න භික්ඛවෙ **එකභාජනෙ** භුඤ්ජිතබ්බං" චු: පා: 236[15] ස: පා: 833[34] චු: පා: B. 684[10] -**භික්ඛු** (නා) = එක භික්ෂුවක්. එක් මහණෙක්. -**මංසඛු** (නා) = එක ඇද. එක යහන "න **එකමංසඛුවෙ** තුවට්ටිතබ්බං" චු: පා: 236[16] චු: පා: B. 684[11] පාචි: ප:: 321[15] -**මංස** (නා) = එකම මාංසය. මිනිස් මස්. වැළඳීමෙන් ථූලැසි ඇවැත්වන මාංසය. "**එකමංසෙ** ථූලල්ලච්චයං" පරි: පා: 278[4] ස: පා: 1027[7] -**මූලක** (නා) = එක් පදයක් මුල් කොට දැක්වීම. ප්‍රථම සඞ්ඛ්‍යාදිසෙස ශික්ෂාපදයෙහි ආරොග්‍යවඩ්ඪ යන පදය මුල් කොට දැක්වූ වක්‍ර හෙදය. පාරා: පා: 122[20] ස: පා: 373[24] (දසවක්‍ඛ බලනු) -**මූලකනය** (නා) = එක මූලකන්‍යාය. එක් පදයක් මුල්කොට දැක්වීමේ

න්‍යාය ක්‍රමය. (එකමූලක බලනු) **-රජ්ජු** (නා) = එක් රැහැණ. එක්වැල **රැහැණ**. එක් අනුලොම් කායබන්ධනයක් කු: සි: ස: 8120 සි: ව: වි: 717 **-රතනී** (නා) [සං රාත්‍රි] = එක් රෑයක්. "සචෙ තෙ කස්සප අගරු වසෙය්‍යාම **එකරතනිං** අග්‍යාගාරෙනි" මහා: පා: 2211 **-රස** (නා) = එකම රසය. විමුක්ති රසය. ධර්ම යෙහි විද්‍යමාන වන **එකම** රසය "සබ්බන්තං **එකරසං** විමුත්තිරසමෙව" ස: පා: 981 **-ලක්ඛණ** (නා) [සං ලක්ෂණ] = එක ලක්ෂණය ඇති. එකම සවභාවය ඇති. වි: වි: ටී: 1513 **-වටට** (නා) [සං. වෘත්ත] = එක්වැල. **එක්වැල රැහැණ** සඞ්ඝසන්තක වී නම් ගරු බඩු වන්නක්. ක: වි: 1399 ක: වි: පි: 11016 **-වස්ස** (නා) = එක් වස් ඇති. උපසපන් වීමෙන් එක් වස් වූ, එබඳු භික්ෂුව "කති වස්සොසි ත්වං භික්ඛුනි **එක වස්සා** අහං භගවතිනි" මහා: පා: 5621 2316 **-වාචා** (නා) = එක් වචනය· **එක** වරක් පමණක් කිම **එක** වරක් කී පමණින්. ක: වි: පි: 128 **-වාචාය දෙස්සෙය්‍ය** (ක්‍රි) = එක් වචනයකින් **එක්** වරක් පමණක් දෙසන්නේය. නව වැදෑරුම් ප්‍රණීත භොජන යන් විනවා වළඳන භික්ෂුව නානා වසතුක ඇවැත් නවයකට පැමිණේ. ඇවැත් දෙසන **එම** භික්ෂුව "ඉමං පඨමං ආපත්තිං ආපන්නා ඉමං පටිඡා" යනුවෙන් නො දෙසා "අහං හන්තෙ පඨව හෙසජ්ජානි පටිගහෙස්සා සත්තාහං අතික්කමිත්වා පඨවා ආපත්තියො ආපන්නා, තා තුමහ මූලෙ පටිදෙසෙමි"යි **එක** වරක් පමණක් කියා දෙසන්නේය.එසේවිනා දෙතුන් වරක් කිමෙන් වැඩක් නැති. ස: පා: 1030**17** පරි:පා: 279**30** 280**12** ප්‍රා: පු: ස: 691**8** **-වාචික පවාරණ** (නා) = එක් වරක් කීමෙන් පවාරණය කිරීම. නව පවාරණයන්ගෙන් **එකක්**. "සංඝං ආවුසො පවාරෙමි දිට්ඨෙනවා සුතෙන වා" යනාදි විසින් **එක්** වරක් කියා පැවරීම. පවාරණය කිරීමට කාලය මද වී නම් **"ඒක වාචිකං පවාරෙය්‍ය"** යනුවෙන් ඇතැමිය පිහිටුවා පවාරණය කිරීම. "අනුජානාමි භික්ඛවෙ **එකවාචිකං** පවාරෙතුං" මහා: පා: 201**13** 202**9** 203**6** සි: ව: වි: 861**9-30** කු: සි: ස: 154**89** **-වාචිකා** (නා) = එක්වර කිම. **එකානුසාවණය** උපසම්පදා **කම්** වාක්‍යය **එක්වර** ඇස්වීම. උපසම්පදාපෙක්ෂකයන් දෙදෙනා හෝ තිදෙනා බැගින් **එකම කම්** වාක්‍යය ඇස්වීම. පරි: පා: 279**2** ස: පා: 1029**7** (එකානුසාවණ බලනු) **-විහාරී** (නා) (විහාර + ඊ) = එකලා විහරණ ඇති. තනිව වසන. ධ: අ: ගැ: 32**23** **-විසති** (නා) = එක් විස්ස. එකකින් වැඩි විස්ස. එනම් සඞ්ඛ්‍යාව. (එක වීසයි ද දක්නේය) **-විසති අනෙසන** (නා) (එකවීසති අනෙසන බලනු) **-විසති අනෙසන** (නා) = එක්විසි අනෙසුන් ප්‍රත්‍යය නො සෙවිය යුතු එක්විසි අනෙසනය 1 "එක් විසි අනෙසුන් නම් වෙළඳනං; පත්තදූනං; පුපඵ - ඵල - දන්තකඨ - මුඛොදක - සිනාන - චුණ්ණ - මත්තිකාදූනං; වාටුකම්‍යතා; මූගසුප්‍යතා; පාරිභට්ටකතා; ජංඝපෙසනිය **කම්මං**, වෙජ්ජ**කම්මං**; දූත**කම්මං**; පහෙණ ගමනං; පිණ්ඩපති පිණ්ඩදූනං; දූනානුප්පදූනං; වත්ථුවිජ්ජා; නක්ඛත්ත විජ්ජා; අඞ්ගවිජ්ජා යන මෙ එක් විසි අනෙසුනි" – 2 "එක් විසි අනෙසුන් නම් ඉඩෙකවෙවා වෙළඳනෙන වා පත්ත දූනෙන වා පුපඵ ඵල සිනාන දන්තකට්ඨ දූනෙන වා වාටුකම්‍යතාය වා මූගසුප්‍යතාය වා පාරිභට්වකතාය වා ජඞ්ඝපෙසනිකෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන බුද්ධපතිකුට්ඨෙන මිච්ඡාජීවෙන ජීවිකං **කප්පෙති**" යි මෙසේ කියන ලද දසය ද, "ආජීව හෙතු පඤ්ඤ තානානං ඡන්නං ඔකාසාපදූනං ඛීතික්කමස්ස වසෙන' යි කියන ලද සය ද, කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙනලාභං නිජිගිංසනතා යන පස ද මේ හැම එක් විසි අනෙසුන් නම්." සි: ව: වි: 6517 ජා: අ: ගැ: 2316 කු: සි: ස: 7317 වි: මා: ස: 764 **-විසති භික්ඛු** (නා) = එක් විස්සක් භික්ෂූන්. යටත් පිරිසෙසින් විසි එක් නමකට පරිමණ්ඩලා කාරව වැඩ හිඳිනු සේ බැන්ද යුතු සීමාව. කම්මීකී භික්ෂුව සහ අබ්භාන කාරක භික්ෂූන්. ස: පා: 7773**4** වි: වි: ටී: 3983**2** ක: වි: 4**28** වින: ම: 16**8** (අභිබුද්ධිකා සීමා බලනු) **-විසති වජ්ජනීය පුග්ගලා** (නා) = දුරු කටයුතු එක් විසි පුහුලෝ. පොහෝ පවුරුණු **කරණ** විට අන්‍යයන් දුරු කළයුතු පුද්ගලයන් විසි එක් දෙනා 1 ගහට්ඨ 2 නිකුබුනී 3 **සික්ඛමානා** 4 **සාමණෙර** 5 **සාමණෙරී** 6 **සික්ඛං** පච්චක්ඛාතක 7 අන්තිමවත්ථුඣාපන්නක 8 ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තක 9 ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තක 10 පාපි කාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තක 11 පණ්ඩක 12 ථෙය්‍යසංවාසක 13 තිත්ථිය පක්කන්තක 14 තිරච්ඡානගත 15 මාතු

ඝාතක 16 පිතුඝාතක 17 අරහන්තඝාතක 18 භික්ඛුනී දූසක 19 සඞ්ඝභෙදක 20 ලොහිතුප්පාදක 21 උභතොබ්‍යඤ්ජනක යන එක් විසි දෙනා ක: වි: 8[39] -ඝඛ්‍යාත (නා) [සං + √හන + ඇ; √හන=ඝාත) එක සටනක්. එක යුධයක්. "නාහං පටිබලෝ බ්‍රහ්ම දත්තෙන කාසිරඤ්ඤා **එක ඝඛ්‍යාතම්පි** සහිතුං" මහා: පා: 397[21] වි: වි: ටී: 444[10] -**සත පඤ්චසත්තනිකාය** (නා) = එක් සිය පන්සැත්තෑ නිකාය. හෙවත් නිකාය එක් සිය සැත්තෑ පස. මහාවග්ගපාළි උපොසථක්ඛන්ධකයේ සහ පවාරණක්ඛන්ධකයේ දක්නා නිකාය සඞ්ඛ්‍යාවක්. බහුතර, සමසම, ඕකතර යන මොනු නිදෙන ගිහි නම්. පඤ්ච අනාපත්ති නිකා, පඤ්චවග්ගාවග්ග සඤ්ඤීනිකා, පඤ්ච වෙමතිකා නිකා, පඤ්ච කුක්කුච්චපකත නිකා, පඤ්චභෙද පුරෙක්ඛාර නිකා යනුවෙන් නිකා පස්වේස්සකී. මේ පඤ්චවිස්ති නිකාය, "තෙ න ජානන්ති අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අත්තනා සීමං ඔක්කමන්ති" යනාදි ෂට්කයෙන් ගුණ කොට නැවත මුල් පස්වේස්ස **එකතු** කළ කල **එක** සත පඤ්චසත්තනිකාය ලැබේ. (25 × 6= 150 + 25=175) සාර: ම: 234[23] මහා: පා: 147[24] 196[10] -**සත්තනිවත්ත** (නා) = එක් සැත්තෑවක් වත්. චුල්ලවග්ගපාළි පාරිවාසිකක්ඛන්ධකයෙහි "තෙනහි භික්ඛවෙ පාරිවාසිකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි" යනුවෙන් පටන් ගෙන "න උපසම්පාදෙතබ්බං න නිස්සයෝ දාතබ්බෝ" යනාදීන් "න ඡමාය වඩ්ඪමනෙනා වඩ්ඪාමිතබ්බං" යනු අවසන් කොට දැක්වූ වත් ස සැටකි. එය වනාහි "න භික්ඛවෙ පාරිවාසිකෙන භික්ඛූනා පාරිවාසිකෙන බුඩ්ඪතරෙන භික්ඛූනා සද්ධිං -පෙ- මූලාය පටිකස්සනාරහෙන -පෙ- මානත්තාරහෙන -පෙ- මානත්තචාරිකෙන -පෙ- අබ්භානාරහෙන භික්ඛූනා සද්ධිං **එකච්ඡන්නෙ** ආවාසෙ වත්ථබ්බං" යනුවෙන් දැක් වූ වත් පුද්ගලයන්ගේ ගණනින් ගත් කල එක් සැත්තෑවක් වේ. "තෙසං වසෙන සම්පිණ්ඩෙත්වා එකෙකං කත්වා ගණිතානි පඤ්චාති **එක සත්තනි වත්තානි**" සාර: දී: 421[31] චූ: පා: 78[1] -**සමුට්ඨාන** (නා) [සං. සමුත්ථාන] = එක් අඞ්ගයකින් පැන නගින, එබඳු ඇවැත් සවැදෑරුම් ආපත්ති සමූහය නයන් අතුරෙන් සිව්වැනි, පස්වැනි, සවැනි **අඞ්ගයන්ගෙන්** පැනනගින ඇවැත්. ස සැත් තැවක් ශික්ෂා. "එකං සමුට්ඨානං කාරණං යස්සා සා ආපත්ති = **එක සමුට්ඨානා** යි ගන්න" ක: වි: පි: 20[4] ක: වි: 21[39] සු: ප: 52[2] විනි: ම: 60[33] -**සමොහාග** (නා) (සං + √භූජ් + ණ; ජ = ග) = එකම සමෝහොගය ඇති. ආමිස සමෝහොගය සහ ධර්ම සමෝහොගය ඇති. එබඳු නිස්ශ්‍රව. "යො වා **එක සමොහාග** පරිභොගො තස්ස සන්තිකෙ නිස්සයො ගහෙතබ්බා" ස: පා: 736[14] -**සංවච්ඡර** (නා) [සං. සංවත්සර] එක සංවත්සරය. එක අවුරුද්ද. -**සාටක පාරුත** (නා) [සං. ප්‍රාවෘත] = එක් ගිහි පෙරවීම් ක්‍රමයක්. පරිමණ්ඩල ලක්ෂණයෙන් තොර පෙරවීමක්. හඳනා ලද සළුවම එක් කෙළවරකින් පිට පෙරවා දෙ කොණ දෙ උරයෙහි දමා පෙර වීම ක: වි: 150[4-9] චූ: පා: B. xvi [5] සා: පා: 661[6] -**සාලක** (නා) (සාලා + ක) = එකම ශාලාවක් ඇති. එබඳු ආරාමය. සාර: දී: 166[4] සා: පා: 63[11] 545[7] -**සාලඝනනිවෙස** (නා) (සං + නි + √විස + ණ) = එක ශාලාවක් පිහිටුවා කළ, එබඳු මහා ප්‍රාසාදය. සෘජුව දිගු කොට ශාලාව පිහිටුවා කළ මහා ප්‍රාසාදය. සා: පා: 545[7] සාර: දී: 790[17] -**සිඛා** (නා) [සං. ශිඛා] = එක් ශිඛාව, කෙස් රොද. අඟල් දෙකකට වැඩි එක් ශිඛාවක් පමණ වූ හිසකේ ඇතියකු නමුදු භණ්ඩු කර්මය විවාරම් පැවිදි කළ යුතුය. "අථඛ්‍යාකුලා නිරිත්තකෙසෝ පන යො හොති අන්තමසෝ **එක සිඛා** මත්ත ධරොපි සෝ භණ්ඩුකම්මං ආපුච්ඡිත්වාව පබ්බාජෙතබ්බෝ" ස: ප: 749[18] වි: වි: ටී: 314[35] -**සීමා** (නා) = එක ම සීමාව. පොහෝ පවුරුණු ආදිය කරන එක ම සීමාව. ධ: අ: ගැ: 30[16] -**සෙය්‍යා** (නා) [සං.ශය්‍යා] = 1. **එක** සෙනසුන, 2. **එක** සයනය, "සත ගබ්භං වා චතුස්සාලං වා **එක සෙය්‍යා** ඉවෙවව සඞ්ඛ්‍යං ගච්ඡති" – "දුක්කරං ජීවිං **එක** හත්තං **එක සෙය්‍යා**" යනාදීන් සාජීවයෙහි දුර්ශීල බව පහළ නොකොට" ස: පා: 543[30] ධ: අ: ගැ: 273[6] ප්‍රා: පු: ස: 8[19] -**හඤ්ඤ** (නා) [සං. හස්ත] = එක් අතක් පමණක් ඇතියහු. පැවිදි නො කළ යුතු පරිස දූෂකයෙක්. ස: පා: 769[5].

එකක (නා) (එක + ක) = හුදෙකලාව, තනිව. (පුං: ලි: **එකකො** ස්ත්‍රී: ලි: **එකිකා** න: ලි: **එකකං**.) පාචි: පා: 253[28]

එකග්ග (නා) [සං. එකාග්‍ර] = එකඟ වූ, එක් අරමුණක පිහිටි සිත. "සමාහිතං චිත්තං **එකග්ගං**" පාරා: පා: 46

එකචර (නා) [සං. එක + චර්‍ය] = සමඟර, ඇතැම් අය. "පස්සන්නානඤ්ච **එකචරාණං** අඤ්ඤං එත්තායා" පාරා: පා: 19[20] සී: පා: 151[27] මහා: පා: 319[34] (සත්‍රී: ලි: **එකචරා** නප: ලි: **එකචරං**)

එකචාරික (නා) (එක + චර + ඉක?) = එකපට, තනිපට සිවුර. "**එකචාරිකෙ** ඉතරෙ" සී: පා, 836[27]

එකචාරිය (නා) = එක්පට, තනිපට සිවුර. උතුරු සඟළ. අන්තරවාසකය. "භගවතා තිචීවරං අනුඤ්ඤාතං විඝුණ්‍ණ සඞ්ඝාටි **එකචාරි යෝ** උත්තරාසඞ්ගෝ **එකචාරියා** අන්තර වාසකෝ" මහා: පා: 326[29] සී: පා: 836[24]

එකජ්ඣං (නා) [සං එකධ්‍යං] [බෞ: සං: එකධ්‍යං] = එක්ව, එකතුව. එක් තැනකට රැස්ව. "**එකජ්ඣං** සනිපතිත්වා උපොසථෝ කාතබ්බෝ" සාරා: ම: 225[20] මහා: පා: 118[8]

එකතෝ (නා) = එක් පසකින්, එක පැත්තකින්. **-අවස්සුත** (නා) = එක් පසකින් පමණක් රාගයෙන් තෙත් වූ නිඝණ්ඨීය පමණක් රාගයෙන් තෙත් වූ බව. සී: පා: 680[24] **-උපසම්පන්න** (නා) = එක් පසකින් පමණක් උපසපන්වූ නිඝණ්ඨ සඞ්ඝයා හෝ නිඝණ්ඨී සඞ්ඝයා යන එක් පසකින් පමණක් උපසපන්වූ මෙහෙණ. "එකතොප සම්පන්නාවට අෂ්ටගරු ධම්මයෙන් වෙවසි අනෙකකින් වෙවසි අ ව වා ද කරන්නා හට දුක්කටයි" ක: වි: පි: 75[24] **-උස්සාදිත** (නා) = එක් තැනක පිඬුකළ, රැස් කළ ස පා: 441[30] (උස්සාරිත යි ද දක්නේය.) **-උස්සාරිත** (නා) (උ + √සර + ණ; ඉ + ත) = එක් තැනක එකතු වූ කිසිවකු විසින් එක් තැනක රැස්කළ. "එවමෙව තුම්හෙ නානා නාම්ා - පෙ- නානාකුලා පබ්බජිතා **එකතෝ උස්සාරිතා**" පාරා: පා: 211[17] (එකතෝ උස්සාදිත බලනු) **-කාජ** (නා) = එක් පැත්තක බර එල්ලූ කද අනුදත් එක් කදක්. "අනුජානාමි භික්ඛවෙ **එකතෝ කාජං**" චූ: පා: 728[22] චූ: පා: 251[23] කු: සි: ස: 124[21] **-වණ්ටිකමාලා** (නා) = එක් දිශාවට නැවි තබා ගෙතූ මල්. එක් දිසාවට තුවටු ලා ගෙතූ මල් **එකතෝ වණ්ටික මාලා** නම් වේ" ධ: අ: ගැ: 123[3] පාරා: පා; 213[34] **-සුඬ්ඩි** (නා) - පංසුකූල චීවරයාගේ එක් ප්‍රභෙදයක්. දුයකයකු විසින් අත්හි හෝ පාමුල තබා දුන් වස්ත්‍රය. ඒ: මා: ස: 157[12]

එකන්තනය (නා) එක් න්‍යායයක්. සන්තාන යාගේ අනුප්පවෙජ්දයෙන් (නොසිදීමෙන්) **එකත්ත**යෙන්ම ගන්නා න්‍යායය. විශුද්ධිමාර්ගයෙහි පටිච්චසමුප්පාද නිද්දේශයෙහි දැක්වූ න්‍යාය සතරින් එකක්. "අඞ්කුර පත්‍ර ශාඛාදි භාවයෙන් පවත්නාවූ අවයවයන් එක්කොට ගෙණ සන්තානානුප්පවෙජ්දයෙන් බීජය වෘක්ෂභාවයට ප්‍රාප්තය. වෘක්ෂභාවයෙන් ප්‍රවෘත්තයයි **එකත්ත**යෙන් කියනු ලැබෙනුයි සන්තානානුප්පවෙජ්දය යම්සෙ එකත්තය නම් වීද" වි: මා: ස: 1455[23] 1567[31]

එකන්තන(නා) [සං. එකාන්තන] = එක කෙළවරක් ඇති සම්පූර්ණ නියමය. සාර: දී: 394[26] **-පරිපුණ්ණ** (නා) [සං. පරිපූර්ණ] = එක් දවසක්වුදු නොහැර හැසිරිය යුතු. එක් දිනයක්වුදු කඩ නො කොට වුනිවිත්තය දක්වා සම්පූර්ණ කටයුතු. පාර: පා: 11[7] සී: පා: 139[17] සාර: දී: 394[27] (-පරිසුද්ධ බලනු) **-පරිසුද්ධ** (නා) [සං. පරිශුද්ධ] = සම්පූර්ණයෙන් පිරිසුදු. කෙලෙස් කිලුටින් කිලිටි නොකොට වරිමක චිත්තය දක්වා අන්‍යූනයෙන්ම පිරිසුදු කොට රැකිය යුතු. "නාසිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං **එකන්ත පරිසුද්ධං** සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං" පාරා: පා: 11[7] සී: පා: 139[18] සාර: දී: 394[20] **-ලොම** (නා) (ලොම + ර්) = දෙපස්හි ලොම් ඇති ඇතිරි එක් මහ අසුනක්. හිඳීමෙන් හා හොවීමෙන් දුකුළා ඇවැත් අවදින එක් මහ අසුනක්. "**එකන්තලොමික** නම් දෙපස්හිම ලොම් ඇති ඇතිරියි" සි: ව: වි: 63[4] ස: පා: 807[33] කු: සි: ස: 63[30]

එකන්තරික (නා) = එක් අවුරුද්දක් තුළ. "එකන්තරිකෙ එකසම්ං සංවච්ඡරෙ" - "අනාපත්තිං **එකන්තරිකං** වුට්ඨාපෙති" ස: පා: 708[11] පාචි: පා: 376[31] 377[24]

එකන්තරිකකාජ (නා) = එක් කෙළවරක බර එල්වූ කද සහ දෙදෙනා උසුලන අතුරු කද. කු: සි: ස: 124[21] (එකතෝ කාජ සහ අන්තරාකාජ බලනු)

එකමන්න (නා) = එකත් පසක, එක් පැත්තක සවැදෑරුම් දොසින් යුතුව හිඳීම. ''තසමා අයම්පි ඡනිසජ්ජ දොසෙ වජෙත්වා නිසිද්. තෙන වුත්තං **එකමන්නං** නිසිදිති'' සං: පා: 80[17] ජා: අ: ගැ: 51[12]

එකාදස (නා) = 1 එකොළොස එකකින් වැඩි දශය. 2 එකොළොස් වන දවස. පාරා: පා: 237[3] **-අග්ගි** (නා) [සං. අග්නි] = එකොළොස් ගිනි 1 රාග 2 දෙස 3 මොහ 4 5 ජරා 6 මරණ 7 සොක 8 පරිදෙව 9 දුක්ඛ 10 දොමනස්ස 11 උපායාස යන එකොළොස. වි: වි: ටී: 121[13] ජා: අ: ගැ: 231[22] **-අනන්තරා** (නා) එකොළොස් අනතුරු උපසපන් කැමැති සාමණේරියකගෙන් විමසනු ලබන අන්තරාය කරධම් එකොළොස 1 නිසි අනිමිත්තා 2 නිසි නිමිත්තනමත්තා 3 නිසි ආලොහිතා 4 නිසි ධුවලොහිතා 4 නිසි ධුවවොලා 6 නිසිපගඝරන්තී 7 නිසි සිඛරිණී 8 නිසි ඉත්ථි පණ්ඩකා 9 නිසි වෙපුරිසිකා 10 නිසි සමණිත්තා 11 නිසි උභතෝ බ්‍යඤ්ජනා යන අන්තරායකර ධම් එකොළොස වූ: පා: 416[5] පරි: පා: 192[12] සං: පා: 994[34] **-අනන්තරායිකධම්ම** (නා) = එකොළොස් අන්තරායකර ධම් ''**එකාදස අනන්තරායිකා ධම්මා** පුච්ඡිතබ්බා'' පරි: පා: 192[12] (එකාදස අන්තරා බලනු) **-අනබ්භ** (නා) [සං. අභව්‍ය] = එකොළොස් අභව්‍යයෝ කු: සි: සං: 70[4] වි: වි: 2537. 2539 (එකාදස අභබ්බ පුග්ගල බලනු) **-අනබ්භ පුග්ගල** (නා)= එකොළොස් අභව්‍ය පුද්ගලයෝ. අසංවාසිකයෝ. දොසාරිතයෝ. මේ ජන්මයෙහි මහණවීමට හෝ උපසපන්වීමට නුසුදුසු පුද්ගලයන් එකොළොස් දෙනා 1 පණ්ඩක 2 ථෙය්‍ය සංවාසක 3 නිත්ථිය පක්කන්තක 4 තිරවජ්ජාභාගත 5 මාතුඝාතක 6 පිතුඝාතක 7 අරහන්ත ඝාතක 8 භික්ඛුනී දූසක 9 සඞ්ඝභෙදක 10 ලොහිතුප්පාදක 11 උභතෝ බ්‍යඤ්ජනක යන එකොළොස් දෙනා. කු: සි: සං: 9[22] **-අරුණුග්ගමන** (නා) [සං. අරුණොද්ගමන] = එකොළොස් වන අරුණ නැගීම. **කඨිනොද්ධාරය කළ** භික්ෂුවක විසින් දැරූ අතිරෙක චීවරය නිසඟි වන කාලය. එබදු භික්ෂුවක විසින් අතිරෙක චීවරයක් දස දවසක් දරනු හැකිය. දස දවස ඉක්මී එකොළොස්වන අරුණ නැගීමෙහි එය නිසඟි වේ. පාරා: පා: 229[24] පරි: පා: 192[13] සං: පා: 461[18] ක: වි: 55[39] 56[1] **-අවන්දිය** (නා) (සං. න+වන්ද්‍ය] = නො වැන්ද යුතු **එකොළොස්** දෙනා. පරි: පා: ගැ: 37[16] (එකාදස අවන්දිය පුග්ගලා බලනු) **-අවන්දිය පුග්ගල** (නා) = නො වැන්ද යුතු පුද්ගලයන් එකොළොස් දෙන. චුල්ලවග්ගපාළි සෙනාසනක්ඛන්ධකයෙහි දැක් වූ 1 පසුව උපසපන්වූවහු, 2. අනුපසපනහු 3 නානා සංවාසක අධම්මවාදී වැඩිමහල්ලහු, 4. මාගම්හු, 5. පණ්ඩකහු, 6. පිරිවෙස් පුරන්නහු, 7. මූලායපටිකස්සනයට සුදුස්සහු, 8. මානතට සුදුස්සහු, 9. මානත හැසිරෙන්නහු, 10. අබ්භාන කම්යට සුදුස්සහු යන මේ දශ දෙනාද, 11. නග්ගයාද යන එකොළොස් පුද්ගලයෝ නො වැන්ද යුත්තාහ. සං: පා: 995[6] පරි: පා: 191[21] (අවන්දිය පුග්ගල බලනු) **-ආචරියවාද** (නා)= ආචාරීවාද එකොළොස. සථවිර වාදයෙන් බිඳී ගිය ආචාරීවාද එකොළොසක්. ''ථෙරවාදතො නිජ්ඣිත්වා ඉමේ **එකාදස ආචරියවාද** උප්පන්නා'' සාර: දී: 97[25] (අඨාරස ආචරියවාද බලනු.) **-ආදීනව** (නා) = දෙස් එකොළොස. සබ්‍රහ්මචාරීන් වහන්සේට ආක්‍රොශ පරිභව බෙණෙන භික්ෂුව කෙරෙහි දක්නා ආදීනව එකොළොස. 1. අනභිගතං නාභිගච්ඡති, 2. අභිගතා පරිභායති, 3. සද්ධම්මස්ස න වොදායති, 4 සද්ධම්මෙසු වා අභිමානිකො හොති, 5. අනභිරතො බ්‍රහ්මචරියං චරති, 6. අඤ්ඤතරං වා සඞ්කිලිට්ඨං ආපත්තිං ආපජ්ජති, 7. සික්ඛං වා පච්චක්ඛාය හීනායා වත්තති, 8. ගාළ්හං වා රොගාතඞ්කං ඵුසති, 9. උම්මාදං වා පාපුණාති, 10. චිත්තක්ඛෙපං වා ආපජ්ජති, 11. සම්මූළ්හොකාලං කරොති කායස්සභෙදා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජති යන එකොළොස. සං: පා: 995[11] පරි: පා: 192[18] **-ආනිසංස** (නා) [සං. ආනෘශංස] = අනුසස් එකොළොස මෛත්‍රිය වැඩීමෙහි විද්‍යමාන ආනිසංස එකොළොස. 1. සුඛං සුපති, 2 සුඛං පටිබුජ්ඣති, 3. න පාපකං සුපිනං පස්සති, 4. මනුස්සානං පියොහොති, 5. අමනුස්සානං පියො හොති, 6. දෙවතා රක්ඛන්ති, 7 නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති, 8 තුවටං චිත්තං සමාධියති, 9. මුඛවණ්ණො විප්පසීදති, 10. අසම්මූළ්හො කාලං කරොති, 11. උත්තරිං අප්පටිවිජ්ඣං තෙනා බ්‍රහ්මලොකූපගො හොති යන අනුසස් එකොළොස. පරි: පා: 192[20] සං: පා: 995[28]

-**උපකසිලෙස** (නා) එකොළොස් උපක්ලෙශ. දිව ඇස අපිරිසුදු කරන කරුණු. 1. විචිකිච්ඡා 2. අමනසිකාර, 3. පිනම්ධ, 4. ත්‍යානතත්ත, 5. උබ්බිල්ලාවිත, 6. දුට්ඨුල්ල, 7. අච්චාරද්ධ විරිය, 8. අතිලීන විරිය, 9. අභිජප්ප, 10. නානත්තසඤ්ඤ, 11.අතිනිජ්ඣායිතත්තං යන, එකොළොස. සා: පා: 107[20] සාර: දී: 337 -**කපසිය පඤ්ච** (නා) = **එකොළොස් කැප** පොළොව (පඤ්ච සිකඛාපද බලනු) -**ගණසිඛා** (නා) = එකොළොස් වැදෑරුම් ගණඝී. කැපවූ ගණඝී එකොළොස. 1. අට්ඨිමය (=ඇටමුවා), 2. දන්තමය (=දළමුවා), 3 විසාණමය (=අංමුවා,) 4. නළමය (=බටදඬුමුවා), 5. වෙළුමය (=ලණදඬු මුවා), 6. කට්ඨමය (=ලී මුවා), 7. ජතුමය (=ලාකඩ මුවා), 8. ඵලමය (=ගෙඩිමුවා), 9. ලොහමය (=ලෝ මුවා), 10. සඞ්ඛනාභිමය (=සක්නැබමුවා), 11. සුත්තමය (=නූලමුවා) යන ගණඝී එකොළොස. වූ: පා: 250[28] වූ: පා: B. 7.6[19] සා: පා: 995[2] පරි: පා: 192[14] මි: ම: 670 (උ: මි:) කු: සි සා: 83[9] -**චිවරානි අකපසියානි** (නා) = කැප නැති සිවුරු එකොළොස. 1. සබබ නීලක, 2. සබබ පීතක, 3. සබබ ලොහිතක, 4. සබබ මඤ්ජට්ඨ, 5. සබබකණහ, 6. සබබ මහා රඞ්ග රත්ත, 7. සබබ මහා නාම රත්ත, 8. අච්ඡිඤ්ඤදසා, 9. දීඝදසා, 10. පුපඵදසා, 11. ඵලදසා (=එණදසා?) යන එකොළොස. මෙහි සබබ මහා රඞ්ග රත්ත නම්; රත්වයන් පිට පැහැසේ ඇති සිවුරු යි සබබ මහානාම රත්ත නම්; තුනු පියුම් පෙති පැහැසේ රත්වූ පිළිය යි නො සුන් දහ ඇත්තේ අච්ඡිඤ්ඤ දසා නම්. මැදින් කැපූ දික් දහ ඇති පිළිය දීඝ දසා නම්. පුපඵ දසා නම් කෙතකාදි පුෂ්ප යන් මෙන් කළ දහ ඇති වස්ත්‍රය යි. එකි නෙක ගොතා ඵල මෙන් කළ දහ ඇතියේ ඵල දසා නම්. (මෙය එණ දසා යි පොත් කිපයකම දක්නේය. එහෙත් එහි ශුද්ධ පාඨය ඵල දසා බව බුදුසිකඛා ටීකාවේ "ඵලා ච පුපඵා ච දසා යස්ස ඵලසදිසෙ දසෙ පුපඵසදිසෙ දසෙවාති අත්ථෝ" යන පාඨ යෙන් පෙනේ.) මහා: පා: 342[21] පරි: පා: 192[11] සා: පා: 994[32] සි: ව: මි: 595[35] කු: සි: සා: 22[4] 839 -**චිවරානි අධිට්ඨාතබබානි** (නා) = අධිෂ්ඨාන කළයුතු සිවුරු එකොළොස. ඉටා පරිභොග කළයුතු සිවුරු එකොළොස. 1. සඞ්ඝාටිය (=දෙපට සිවුර), 2. උත්තරා සඞ්ගය (=තනිපට සිවුර), 3. අන්තරවාසකය (=අදනය), 4. විසඞ්කච්ඡික සාටිකය (=වැසි සළුව) 5. නිසීදනය (අතුට හිඳිනා සිවුර), 6. පච්චත්ථරණය (=පසතුරුණ), 7. කණ්ඩු පටිච්ඡාදිය (=කණ්ඩුයාදි රොග ඇති සහුන් සඳහා අනුදන් සිවුර), 8. මුඛ පුඤ්ඡනය (=මුව පිස්නාව), 9. පරිඛාරවොළ (=පරිඛාරවොළය), 10. උදක සාටිකා (=දිය සළුව), 11. සඞ්ඛච්චිකා (=තත වැස්ම) යන එකොළොස් සිවුරු ඉටා පරිභොග කටයුතුය. පරි: පා: 192[12] සා: පා: 994[35] මි: මි: 671 (උ: වි:) -**චිවරානි න විකප්පෙතබබානි** (නා) = විකප්පනය නො කටයුතු සිවුරු එකොළොස. අධිෂ්ඨාන කළ සිවුරු එකොළොස අධිෂ්ඨාන කළ කාලයේ පටන් විකප්පනය නො කටයුතුය "එතානෙව අධිට්ඨිත කාලතො පට්ඨාය න විකප්පෙතබබානි" සා: පා: 995[2] පරි: පා: 192[13] (එකාදස චීවරානි අධිට්ඨාතබබානි බලනු.) -**නිසසය පවිප්පසසද්ධි** (නා) [බෙෂ: සං: ප්‍රතිප්‍රශ්‍රබ්ධි] = නිසසය පරිප්පස්සද්ධි එකොළොස. නිස බිඳීමට හෙතුවන කරුණු එකොළොස. එහි උපාධ්‍යායයන් කෙරෙන් පස් පරිද්දකින් සහ ආචාර්යයන් කෙරෙන් සපරිද්දකින් දූසි එකොළොස් ආකාරයකින් නිස බිඳේ. "චත් තෙරුන් කෙරෙ නිස ගෙන වසන්නා හට පස් සෙයෙකින් නිස පිළිපස්ස් වේ. හෙ කවරයන්. බැහැර යාමැ, ගිහි වීමැ, කලුරිය කිරීමැ, නිඵ බවට ගිය බවැ, ඇණ්වීමැ යන මේ පසයි. ඇදුරු තෙරුන් කෙරෙ නිස ගෙන වසන්නා හට සයෙකින් නිස පිළිපස්ස් වේ. හෙ කවරයන් බැහැර යි මැ, ගිහිවී මැ, කලුරිය කිරීමැ, නිඵබවට ගිය බවැ, ඇණ්වීමැ වත් තෙරුන් හා එක්වීමැ යන මේ සයයි. සි: ව: මි: 67[28] කු: සි: සා: 793[2] -**පඤ්චියො අකපසියා** (නා) =අකැප වූ එකොළොස් පොළොව. පඤ්ච ශික්ෂාපදයෙහි දූක්වූ පොළෝ එකොළොස. පරි: පා: 182[15] (පඤ්ච සිකඛාපද බලනු.) -**පඤ්චකපසියා** (නා) = කැප වූ එකොළොස් පොළොව. පරි: පා: 192[15] සා: පා: 995[4] (පඤ්ච සිකඛාපද බලනු) -**පත්තාඅකපසියා** (නා) [සං අකප්‍ය] = අකැප වූ පාත්‍ර එකොළොස. දශවිධ රත්නයෙන් කළ පාත්‍ර දශය සහ තඹ ලෝමුවා හෝ දූව මුවා (ලියෙන් කළ) පාත්‍රය සමග එකොළොස් පාත්‍ර "**එකාදසච්ඡදොපනෙතා** - වුත්තෙතා

දුකකාට වදනුතෝ'' ති: වි: 751 පරි: පා: 192[10] සා: පා: 994[30] කු: සි: සං: 26[35] සි: ව: වි: 775 **-පද** (නා) = එකොළොස් පදය. තනිය සඞ්ඝාදිසෙස ශික්ෂාපද පදභාජනියෙහි ආක්‍රෝශ නිදේශයෙහි ගැණෙන පද එකොළොස. 1 අනිමිත්තාසි 2 නිමිත්තනිමිත්තාසි 3 අලොහිතාසි 4 ධුවලොහිතාසි 5 ධුවවොළාසි. 6 පගඤ්ඤරහිසි 7 සිඛරිණිසි 8 ඉත්ථිපණ්ඩකාසි 9 වෙපුරිසිකාසි 10 සමිඤ්ඤාසි 11 උභතෝ ඛ්‍යඤ්ජනාසිති යන එකොළොස් පදය. මේ එකොළොස් පදයෙන් නො ගැටු කල අවණී භණනයක් නොවේ. මෙයින් සිඛරිණිසි, සමිඤ්ඤාසි, උභතෝ ඛ්‍යඤ්ජනාසි යන පද ත්‍රය සමග අවණීභණනය ඇටු කලම සඞ්ඝා දිසෙස වේ පාරා: පා: 145[5] සාර: දී: 664[2] සා: පා: 391[16] **-පයොග** (නා) = එකොළොස් ප්‍රයෝග. එකොළොස් රාග. සා: පා: 374[29] 376[32] (එකාදසරාග බලනු.) **-පරම** (නා) = පරම ශබ්දයෙන් පැණවූ ශික්ෂාපද එකොළොස. පරම ශික්ෂාපද තුදුස එකොළොසක් සේ ගැණීමෙන් ලැබෙන ශික්ෂාපද සඞ්ඛ්‍යාව. 1 දසාහපරමං අතිරෙක චීවරං 2 ඌනඤ්ඤ පාරිපූරියා මාසපරමං, 3 සන්තරුත්තර පරමං 4 ඡක්ඛත්තුපරමං 5 ඡබ්බස්සපරමං සන්ථතං 6 දසාහපරමං අතිරෙක පත්තෝ 7 එළකලොමානි තියොජන පරමං 8 තෙලානි සත්තාහ පරමං 9 සන්නිධිකාරකං ඡාරත්ත පරමං 10 නෙන චීවරෙන වතුක්කංස පරමං 11අඩ්ඪතෙය්‍යකංස පරමං 12 දඞ්ගුල පබ්බ පරමං 13 අඞ්ගුලපරමං 14 දන්තකට්ඨ පරමං යනු තුදුස පරම **ශික්ෂාපදයි** මෙහි මුල් සය **එක** ඡවිකයෙකි එසින් එකක් ඉවත් කොට දෙවන ඡවිකය සමග ගැණීමෙන් එකාදස පරම ශික්ෂා ලැබේ සා: පා: 990[37] 995[7] පරි: පා: 192[17] පරි: පා: ගැ: 191[3] සු: ප: 962[9] viii[12] (උ: ග්‍ර:) **-පරික්ඛාර** (නා) [බෙණ: සං: පරිෂ්කාර] = එකොළොස් පිරිකර. අටපිරි කරට ගැණෙන අට සහ පසතුරුණ(කෙණ්ඩිය හෝ) සම්කඩ සැරයටිය යන තුණත් ඇතුළු එකොළොස. සැරයටිය වෙනුවට තෙල් නළ ද ගණී ''එකාදසපරික්ඛාරිකස්ස කත්තරයට්ඨි වා තෙලනාළිකා වා වට්ටති'' සු: වි: 144[18] **පාදුකා** (නා) = අකැපවූ පාදුකා එකොළොස, දශවිධ රතනයෙන් කළ පාදුකා සහ ලීමුවා පාදුකාව. තිණපාදුකා, මූසඤ්ඤ පාදුකා, බබ්බජපාදුකාදිය ද කාෂ්ටපාදුකා යෙහි ම ඇතුළත් වේ. සා: පා: 994[29] පරි: පා: 192[10] සි: ව: වි: 6[10] කු: සි: සං: 62[31] වි: වි: 667 (උ: වි:) මහා: පා: 224[6] **-පුග්ගලා අනුසම්පන්නා** (නා) = උපසපන් නො පිහිටන, උපසපන් නො කළයුතු පුද්ගලයන් එකොළොස් දෙන. පණ්ඩකාදී අභව්‍ය පුද්ගලයෝ. සා: පා: 994[28] පරි: පා: 192[9] (එකාදස අභබ්බ පුග්ගල බලනු) **-පුග්ගලාඅවඤ්ඤියා** (නා) = නො වැන්දයුතු පුද්ගලයන් එකොළොස්දෙන. චුල්ලවග්ගපාළි සෙනාසනක්ඛන්ධකයෙහි දැක් වූ පුද්ගලයන් දශදෙනා සහ නග්ගපුද්ගලයාද යන එකොළොස් දෙනා. පරි: පා: 192[16] සා: පා: 995[6] චූ: පා: 281[10] පරි: පා: ගැ: 37 (අවඤ්ඤිය බලනු.) **-මාස** (නා) = එකොළොස් මස අකාලචීවරයට නියමින කාලය. පශ්චිම කාර්තික මාසය හැර සෙසු එකොළොස් මස. ''අකාලචීවරං නාම අනත්ථතෙ කඨිනෙ **එකාදසමාසෙ** උප්පජ්ජති'' පාරා: පා: 236[26] සා: පා: 474[28] **-යාවතනියක** (නා) = එනම් ශික්ෂාපද එකොළොස. උකඛිත්තානුවත්තිකා භික්ඛුනී සඞ්ඝාදිසෙස ශික්ෂාපද අට සහ අරිට්ඨ වණ්ඩ කාලී යන ශික්ෂාපද ඇතුළු **එකොළොස**. සා: පා: 994[32] පරි: පා: 192[11] **-රාග** (නා) = එකොළොස් රාග, සුක්කාවිසට්ඨි සඞ්ඝාදිසෙස පදභාජනියෙහි සඳහන් ආසවාද **එකොළොස**. 1 මොචනස්සාද 2 මුච්චනස්සාද 3 මුත්තස්සාද 4 මේථුනස්සාද 5 එස්සස්සාද 6 කණ්ඩුවනස්සාද 7 දස්සනස්සාද 8 නිසජ්ජ ස්සාද 9 වාචස්සාද 10 ගෙහසිතපෙම 11 වන භඞ්ගිය යන **එකොළොස**. සා: පා: 374[29] (එකාදස පයොග බලනු) **-වර** (නා) = එකොළොස් වරය. විශාඛාව ලද වරඅටකි. සුදෝවුන් රජු, ජීවකයන්, සහ මහාප්‍රජාපතී ගෞතමිය ලද වරතුණ ඇතුළුව එකොළොස් වරය වේ පරි: පා: 192[17] සා: පා: 994[28] 995[8] (අට්ඨවර 3 බලනු) **-විපත්තිසීමා** (නා)= කළාවූ කර්මය නො පිහිටන සීමා එකොළොස. 1 අතිබුද්ධිකා 2 අතිමහති 3 ඛණ්ඩනිමිත්තා 4 ඡායානිමිත්තා 5 අනිමිත්තා 6 බහිසීමෙ ඨිත සම්මතා 7 නදියා සම්මතා 8 සමුද්දෙ සම්මතා 9 ජාතස්සරෙ සම්මතා 10 සීමාය සීමං සම්භින්ද නෙනත සම්මතා 11 සීමාය සීමං අජ්ඣොත්ථරනෙනත සම්මතා යන **එකොළොස** විපත්ති සීමාවෝ වෙත්. ''ඉමෙහි **එකාදසහි ආකාරෙහි සීමනෝ** කම්මානි විපජ්ජන්තීති වචනතෝ එතා විපත්ති සීමායො නාම. ක;

සී: 4[21] චින: ම: 16[5] සං: පා: 1014[6] ම: පා: සං: 499[26A] **-චීඨ** (නා) = කැපවූ එකොළොස් විටු. 1 වෙළුමය (=හුණමුවා) 2 දන්තමය (=දළමය) 3 විසාණමය (=අංමුවා) 4 අටසිමය (=ඇට මුවා) 5 කට්ඨමය (=දඬුමුවා) 6 ලාඛාමය (=ලාමුවා= ලාකඩින් කළ) 7 ඵලමය (=ඵලමුවා = "ආම ලක කල්කාදින් කළෙ ඵලමුවා නම්") 8 සඞ්ඛ නාභිමය (=සක් නැබමුවා) 9 සුත්තාමය (=හූ මුවා) 10 නළමය (=රණ හුනමුවා) 11 ලෝහ මය (=ලොකොමුවා) යන එකොළොස. 'චීඨ නම් පටියේ පාසාණාභය ආරක්ෂා කරනු පිණිස එහි දමන මුදුවක හැඩහුරුව ඇති සිදුරක් සහිත උපකරණයක්. ගණ්ඨියට කැපවූ සියල්ල මෙයට ද කැපය." – "**එකඞ්ගා ලොස් කැපවීමක්** වදුළහ" සි: ව: වි: 71[22] 72[2] 731 කු: සි: සං: 82[30] චූ: පා: 250[15] පරි: පා: 192[15] සං: පා: 995[3] වි: වි: 670 (උ: වි:) **-සමනුභාසන** (නා) =එකොළොස් සමනු භාෂණ. සමනුභාෂණකර්මය කිරීමෙන් පසු ඇවැත් සිදුවන ශික්ෂාපද එකොළොස එකොළොස් සමනුභාෂණ නම් භික්ෂු ප්‍රාතිමොක්ෂ යෙහි යාවතනියක සඞ්ඝාදිසෙස සතර සහ අරිඨ ශික්ෂාපදය ද, යන පස ද, භික්ෂුණී ප්‍රාති මොක්ෂයෙහි එක් යාවතනියක පාරාජිකාව ද සඞ්ඝාදිසෙස සතර ද, චණ්ඩකාලී ශික්ෂාපද, ය ද, යන එකොළොසයි. වි: වි: ටී: 148[25] සං: පා: 225[16] (අට්ඨ දුකකට බලනු.) **-සීමා** (නා) =එකොළොස් විපත්ති සීමා. සීමා නොවන් නන්. "ඉමා එකාදසපි සීමා අසීමා. ගාම කෙඛත්ත සදිසා එව තාසු නිසිදිත්වා කතං කම්මං කුප්පති" සං: පා: 1014[31] **-සීමාදෙස** (නා) = එකොළොස් සීමාදෙෂ, විපත්ති සීමා දෙෂ එකොළොස. 1 අබ්භාන කර්මයට සුදුස් සකු ඇතුළුව විසි එක් නමකට සුවසේ වැඩ හිඳිනු නොහැකි බව අති බුද්ධක සීමාදෙෂය. 2 යොදුන් තුනකට කෙසඟක් පමණ කුදු විශාල විම අතිමහති සීමා දෙෂය. 3 නිමිත් තෙන් නිමිත්තා නොගැළ පිම ඛණ්ඩනිමිත්තන සීමා දෙෂය. 4 පළිත ඡායා ආදී යම්කිසි ඡායා වක් නිමිත්තට ගෙන සමමත කිරීම ඡායා නිමිත්තන සීමා දෙෂය. 5 හැමලෙසින් ම නිමිත්ත කිතීන රහිතව සමමත කිරීම අනි මිත්තා සීමා දෙෂය. 6 නිමිත්තා කිතීනය කොට නිමිත්තයන්ගේ බැහැර සිට සමමත කිරීම බහිසීමේ ඕන සමමත සීමා දෙෂය. 7 නදියෙහි සමමත කිරීම නදියා සමමන සීමා දෙෂය. 8. සාගරයෙහි සමමත කිරීම සමුද්දෙ සමමත සීමා දෙෂය. 9 ජාතසසරෙ සමමත සීමා දෙෂය නම්; ජාතසසරයෙහි සමමත කිරීමය. 10 තමන්ගේ සීමාවෙන් අනුන්ගේ සීමාව බිඳිමින් සමමත කිරීම සීමාය සීමං සමභින්දනෙනත්ත සමමත සීමා දෙෂය. 11 අපෙඛාත්ථරඤ්ඤත්ත සමමත සීමා දෙෂය නම් තමන්ගේ සීමාවෙන් අනුන්ගේ සීමාව වතු රුවා සමමත කිරීමය. සං: පා: 1014[31] ම: පා: සං: 499[26A] ක: සී: 4[21] 5[19] පරි: පා: 192[17] 289[2]

එකාදසහි ආකාරෙහි සීමතො කම්මානි විපජ්ජන්ති (ක්‍රි) (එකාදස සීමාදෙස බලනු.) පරි: පා: 289[2]

එකාසන (නා) = එක අස්නෙහි හිඳ වැළඳීම. වි: මා: සං: 1499 (එකාසන හොජන බලනු)

එකාසන හොජන (නා) = එක් වරුවක් අනු භව කිරීම. පෙරවරු ආහාර අනුභවය. හිරු උදා වූ තැන් පටන් පෙරවරු සියක් වර අනු භව කෙළේ ද එකාසන හොජන නම් වේ. ප: සූ: 80[13]

එකාසනික (නා) = එක ම ආසනයෙහි හිඳ වැළ දීම සවභාවය වූවහු. වි: මා: සං: 1499

එකාසනිකඞ්ග (නා) = එතම් ධුතාඞ්ගය. **එක** අස්නෙහි හිඳ වැළඳීම අඞ්ගය වූ ධුතාඞ්ගය. තෙළෙස් ධුතාඞ්ගයන්ගෙන් එකක්. "එක අස් නෙහි හිඳ වැළඳීම ප්‍රකෘති වීමට කාරණය නෙවත් එකාසනික වීමට කාරණය **එකාසනි කඞ්ග** නම්" වි: මා: සං: 1499

එකාසීති චතුකකා (නා) = චතුෂඨා එක් අසූව. ප්‍රථම පාරාජික ශික්ෂාපදයෙහි සත්‍රී වාරයෙහි ලැබෙන පාරාජිකා ක්ෂෙත්‍ර සඞ්ඛ්‍යාව. එහි මනුෂ්‍ය සත්‍රියගේ මාගීත්‍රය වශයෙන් සුදඩික චතුෂඨා තුණකි. එසේ ම ජාගරන්ති - සුත්තා - මත්ත - උමමත්තා - පමත්ත - මත අකඛයිත - යෙහුය්‍යෙන අකඛයිත - යෙහුය්‍යෙන ඛයිත යන සත්‍රින්ගේ මාගීත්‍රය බැගින් සුවිස්සකි. එවිට සත්‍රීවාරයෙහි චතුෂඨා සත්විස්සකි. අම නුෂ්‍යසත්‍රින් සහ තිරවඡානගත සත්‍රින් පිළිබඳ ව ද සත්විස්ස බැගින් ලැබෙනු යෙන් සියල්ල එක් අසූවක් වේ. මෙහි චතුෂඨ නම්, පවෙස, පවිට්ඨ, ඨිති, උඩ්ඩාණ යන චතුෂඨ යයි. "ඉත්ථි වාරෙ එකාසීති චතුඨඨානි" සං: පා: 188[21]

එකූනවිසති ධම්මා (නා) = එකුන්විසි දුර්වව ධර්. තමන් කෙරෙහි පැවැත් වූ අනුශාසනා තෙපුල් ආදර බුහුමන් ඇතිව නො ගන්නේ දුර්වව නම්. අනුමාන සූත්‍රයෙහි සඳහන් කරුණු එකුන් විස්ස. 1 පාපිච්ඡතා (=ලාමක බලාපොරොත්තු ඇතිබව) 2 අත්තුක්කංසක පරවම්භකතා (= තමන් උසස් කොට අනුන් පහත් කොට සලකන බව) 3 කොධනතා (= කිපෙන සුලු බව) 4 උපනාහිතා (= නැවත නැවත වෙරබඳින බව) 5 අභිසඞ්ගිතා (= බද්ධ වෛරය ඇතිබව) 6 කොධසාමන්තවාචා නිච්ඡාරණතා (= ක්‍රෝධයට ඉවහල් වවන කථාකරණ බව) 7 චොදකං පටිප්පඵරණතා (= චොදකයාට ප්‍රතිවිරුද්ධව සිටින බව) 8 චොදකං අපසාදනතා (= චොදකයා හා ගැටීම) 9 චොදකස්ස පච්චාරොපනතා (= චොදකයාට පෙරළා චොදනා කිරීම) 10 අඤ්ඤනඤ්ඤපටිචරණතා (= අන් කරුණකින් හෝ වවනයකින් චොදනාව වසා හැසිරෙන බව) 11 අපදානෙන - න සම්පායනතා (= තමන් පිළිබඳ යම් යම් දේ උපදවා චොදනාව ඔප්පු කරන්නට ඉඩ නො දීම) 12 මක්ඛී පලාසිතා (= පරගුණයන් මැකීම සහ අනුන්ගේ ගුණයන් ඩැහැගෙන තමන්ගේ ගුණ හා සමකොට සිතන බව) 13 ඉස්සුකී මච්ඡරිතා (= අනුන්ගේ සම්පත් නො ඉවසන බව සහ තමන්ගේ සම්පත් සඟවන බව) 14 සඨමායාවිතා (= කෛරාවික ගුණයෙන් සහ මායාවෙන් යුත් බව) 15 එදධාතිමානිතා (= තද බව සහ නො නැමෙන ගතියෙන් යුත් අතිමානී බව 16 සන්දිට්ඨිපරාමාසි (= ගන්දෙය දැඩි වශයෙන් ගන්නා බව සහ තමන්ගේ ලබ්ධිය නො හරන බව) යන මේ දුම්ම ධර්මයි. සමන්ත පාසාදිකා විනය අට්ඨවාසෙහි එකුන්විසි ධර්මය යි කියා තුදු අනුමාන සූත්‍රයෙහි මෙන් ම එහි අට්ඨවාසෙහිද, සාරත්ථදීපනී විනය ටීකාසෙහි ද, දක්නේ සොළසයි. "අනුමාන සුත්තාවා කථා යමපන මක්ඛපළාසාදයොපි යුගල යුගලව සෙන එකං කත්වා සොළස ධම්මානිවුත්තානං" සාර: දී: 708[17] ස: පා: 442[8] සාර: ම: 74[85]

එකූනවිසති පාරාජිකා (නා) = එකුන් විසි පාරාජිකා. භික්ෂූන්ට අනුරූප පාරාජිකා එකුන් විස්ස. 1 මෙථුනධම්ම 2 අදත්තාදාන 3 මනුස්ස විග්ගහ 4 උත්තරිමනුස්ස ධම්මා රොවන (මෙථුන ධම්ම පාරාජිකාවට අනුලොම් වූ) 5 මුදු පිටඨික 6 ලම්බී 7 පරස්ස අඞ්ගජාතං මුඛෙන ගණ්හනෙනා 8 පරස්ස අඞ්ගජාතෙ අනිහිසි දනෙනා 9 පණ්ඩක 10 ථෙය්‍යසංවාසක 11 තිත්ථිය පක්කන්තක 12 තිරච්ඡානගත 13 මාතු ඝාතක 14 පිතුඝාතක 15 අරහන්ත ඝාතක 16 භික්ඛුනී දූසක 17 සඞ්ඝභෙදක 18 ලොහිතුප්පාදක 19 උභතෝ බ්‍යඤ්ජනක යන අමූල සඞ්ඝාදිසෙසා පත්තියෙහි භික්ෂූන්ට අනුරූප වූ පාරාජිකා එකුන් විස්ස "භික්ඛුනෝ අනුරූපා නි - තෙසු **එකූන විසති**" වි: මි: 319-401 ක: වි: 33[18] 41[26] කු: සි: ස: 9[18] 12[21] ඕ: ව: වි: 30[82]

එකෝ (නා [සං. එකඃ] = එකෙක්. එක් පුද්ගලයෙක්. (පු: ලි: **එකෝ** සත්‍රී: ලි: **එකා** න: ලි: එකං)

එකෝදිභාවං (නා) = ශ්‍රෙෂ්ඨ බව, එකඟ බව ඇති, සමාහිතවූ එබදු සිත. "එකෝ උදෙතීති **එකෝදි**; චිතකී විචාරයන්ගෙන් වෙන්වූ හෙයින් ශ්‍රෙෂ්ඨව උදුවෙයි යනාථියි-නො හොත් සම්ප්‍රයුක්ත ධර්මයන් නැගිටුවයි යන අර්ථයි"-"**එකෝදි** නම් සමාධියයි" සාරා: ම: 7[16] පාරා: පා: 4[9] ස: පා: 94[18]

එටයි (නා) ($\sqrt{\text{එස}}$ + ති) = 1 සෙවීම, සිව්පසය සෙවීම. 2 කැමැති වීම. වි: මා: ස: 68[25] 80[8] කු: සි: ස: 161[24]

එටයිසුද්ධි (නා) = එසන සුඛිය, දැහැමින් සිව්පසය සෙවීම. පිරිසුදුව සෙවූ සිව්පසය සිව් වැදෑරුම් ශුද්ධින්ගෙන් **එකක්**. කු: සි: ස: 160[28] 161[25]

එණී (නා) (එණීමිග බලනු) කු: සි: ස: 61[14] -**මිග** (නා) [සං. එණිමෘග] = එනම් මුව විශෙෂය. සම් කැපවූ එක් මුව වර්ගයක්. වින: මි: 205[7] කු: සි: ස: 61[14] අ: ප: ස: 82[2]

එණෙය්‍ය (නා) එණිමුවා. එනම් මුව විශෙෂය. අ: ප: ස: 84[21]

එතං (නා) [සං. එතත්] = මෙය. මේ කරුණ. (පු: ලි: **එසෝ** සත්‍රී: ලි: **එසා** න: ලි: එතං) -"**අග්ගං** (නා) = මෙය අග්‍රය, ප්‍රධානය. "**එත දග්ගං** භගිනි පාරිවරියානං" පාරා: පා: 149[20] 150[1] ස: පා: 394[15] -"**අත්ථං** (නා) = මේ කරුණ මේ කාරණය. ස: පා: 479[32] (අත්ථ බලනු) -"**අත්ථා** (නා) = මේ පිණිසය, මේ නිසාය. මේ ප්‍රයොජන කොට ඇත්තේය. "**එතදත්ථා** කථා" පරි: පා: 219[17] වි: මා: ස:

41[19] -"අවොච (ක්‍රි) = මෙසේ කිවේය. මෙය දැන්වීය. ' භූතනාවිං ඔණිතපත්‍තපාණිං **එතද වොච**" පාරා: පා: 16[2] පාචි: පා: 119[1] -"අවොචුං (ක්‍රි) = මෙසේ කීවාහුය. මෙය දැන් වූහ. පාරා: පා: 12[8] මහා: පා: 230[4]

එතතක (නා) (ඉම + ත + ක) = මෙතෙක්. මේ පමණක්. "**එතතකෙහි** හෙසජෙජහි පවා රෙම්" පාචි: පා: 121[1] සං: පා: 633[24] ප්‍රා: පු: ස: 13[28] (පු: ලි: **එතතකො** ස්ත්‍රී· ලි: **එතතිකා** න: ලි: **එතතකං**)

එතතාවතා (නි) = මෙ පමණකින්, මෙතෙකින්. "**එතතාවතා** බොං උපාලි සංසො භිත්‍තෙනා හොති" සං: පා: 944[7]

එත්ථ (නි) = මෙහි, මේ කරුණෙහි.

එථ (ක්‍රි) (√ඉ + ථ) = එව්, එන්න. "එථ මයං ආවුසො සමණස්ස ගොතමස්ස සඞ්ඝභෙදං කරිස්සාම වක්කභෙදන්ති" පාරා: පා: 205[17] සං: පා: 434[9]

එරක (නා) = එරු, එරුහූ. කු: සි: ස: 22[21] ජා: අ: ගැ: 179[16] (එරකදුස්ස බලනු)

එරකදුස්ස (නා) [සං. දූෂී > පා: දුස්ස] = එරු හූ. එරුහුයෙන් කළ සිවුරු. එක් අකැප සිවුරක්. මනො: පූ: 488[14] කු: සි: ස: 22[21] (අකපපිය චීවර බලනු)

එරගු (නා) = එරුතණ, ඝන වූ එක් තෘණ විශෙෂයක්. "සෙය්‍යථාපි භන්තෙ **එරගු** මොරගු මජ්ජාරු ජනතු" මහා: පා: 231[26] සං: පා: 808[37]

එරණකඛම (නා) [සං. ක්ෂම] = එසවිය හැකි බව. බලමැදුම් පුරුෂයකු විසින් නඟාලිය හැකි බව. පිළිගැන්ම විය හැකි වස්තුවක එක් ලක්ෂණයක්. "**එරණකඛමතන්ති**, ථාමමජ්ඣිමෙන පුරිසෙන එරණස්ස උක්ඛිපනස්ස ඛමං යොගහං" බු: සි: ටී: 61[29] කු: සි: ස: 38[12] නි: ශි: 15[19] (ඊරණකඛම බලනු)

එරණඩ (නා) = 1 එරඬු, එරඬුගස. 2 එරඬු ගෙඩි, යාවජීවික බෙහෙත් විශෙෂයක් කු: සි: ස: 34[19] අ: ප: ස: 77[29] -**අට්ඨි** (නා) = එරඬු ඇට එරඬු ඇට පිළිගෙන පිසන ලද තෙල් සත්තාහ කාලිකය. ස: පා: 518[10] ක: වි: 76[26] කු: සි: ස: 33[11] -**තෙල** (නා) = එරඬු තෙල්. පස් වැදෑරුම් තෙල්වලින් එක් වගී යක්. පරි: පා: 177[25] ස: පා: 518[16] පාචි: පා: 388[29] (පඤ්චතෙල බලනු)

එරාවණ (නා) [සං. ඓරාවත] = එතම් ඇතා. සක්දෙවිඳුගේ ඇතා. අ: ප: ස: 6[11]

එලා (නා) = එන්සාල්. එල්සාල්, එනම් ගස, අ: ප: ස: 81[4]

එලාලුක (නා) = කැකිරි. නවමිහා ඵලයන් ගෙන් එකක්. ක: වි: 114[34] ක: වි: පි: 88[22] අ: ප: ස: 81[29] (එළාලුක බලනු)

එවං (නි) = 1 නිදර්ශන 2 ආකාර 3 උපමා 4 හර්ෂණ 5 උපදෙශ 6 වචන පිළිගැන්ම 7 අවධාරණ 8 නීතු 9 ඉදම්ථා (=මේය යන අර්ථය) 10 ප්‍රමාණ 11 ප්‍රශන විචාරීම යන අර්ථවල වැටෙන නිපාත පදයක්. අ: ප: ස: 158[34]

එවංස (නි) = එබඳු, එවැනි. "**එවංස** තෙ ආසවා විඝාත පරිළාහා න හොන්ති" චූ: පා: 331[13] චූ: පා: B. 222[5] 223[6]

එසනා (නා) (√එස + න + ආ) = සෙවීම, ආමිෂය සෙවීම. බි: මා: ස: 68[26] (එටඨි බලනු)

එසනාසුඛි (නා) = දැහැමින් සිවි පසය සෙවීම. කු: සි: ස: 161[25] (එටඨි සුඛි බලනු)

එසිකා (නා) [සං. ඊෂිකා?] = ඉන්ද්‍රකීලය. එසිකාසතාභය. සජනනගර පරිෂ්කාරයන් ගෙන් එකක්. "**එසිකා** නම් ඉන්ද්‍රකීල යයි. එය ඇතුළු නුවර හෝ පිටිනුවර නගරාරක්ෂාව පිණිස හෝ නගරාලඞ්කාර පිණිස ගඩොළු යෙන් හෝ ගලින් හෝ කිහිරි ආදී ඉරලියෙන් හෝ අටැස් කොට අටරියන් සොළොස්රියන් වීසි රියන් හෝ කොට අඩක් පොළොව යට කොට අඩක් මතුකොට පිහිටුවන අවලඤ්ඡනමහා විශෙෂයකි. ඉන්ද්‍රයාගේ (=ශක්‍රයාගේ) කීලය මෙන් උස් වූ අවල වූ ස්තම්භයානුයි හෝ ඉන්ද්‍ර වූ (=අධිපති) කීලයානුයි හෝ ඉන්ද්‍රකීල නම් වේ. මේ ඉන්ද්‍රකීල පෙලට නොව ගොමුත්‍ර වඞ්කාකාරයෙන් අතර තබා විසිතුරු කොට පිහිටුවති. එහි වක්ව ගිය තන්හි යුද කල සෙබළු **රැක** සිටිති" වි: මා: ස: 23 78[22] (උ: ග්‍ර:) අ: ප: ස: 29[22] සු: වි: 433[12]

එසො (නා) [සං. එෂඃ] = මෙතෙම. (පු: ලි: **එසො** ස්ත්‍රී: ලි: **එසා** න: ලි: **එතං**)

එහි (ක්‍රි) ($\sqrt{ඉ}$ + හි) = එව, මෙහි එව. පරි: පා: 125[21]

එහි අනාදරියං සික්ඛා (නා) = එනම් ශික්ෂාපදත්‍රය. "එහාවුසෝ ගාමං වා" යන ශික්ෂාපදය, අනාදරිය ශික්ෂාපදය සහ "භික්ඛු භිංසාපන" ශික්ෂාපදය යන තුණ. සං: පා: 963[6] පරි: පා: 125[21]

එහි ගාමං වා (නි) = එනම් පවිති ශික්ෂාපදය. "ඇවැත්න මා හා කැටිව එව. ගමකට හෝ නියම්ගමකට පිඬු පිණිස වදුම්හයි කියා භික්ෂුවක් කැඳවා ගෙණ ගොස් පසුව මාගමක් හා සිනා කෙළි ඇ අනාචාරයක හැසිරෙනු සඳහා ඇවැත: යව තා සමග කථා කිරීම හෝ හිඳීම මට සුව නොවේයයි කියා යම්කිසි ආමිසයක් දී හෝ කොදී ඒ භික්ෂුව පිටත් කරන මහණහුට පවිති ඇවැත් වන්නේයයි පැණ වූ ශික්ෂාපදය. සු: ප: 511

එහිපස්සික (නා) (පස්ස + ඉක) = එව, බලවයි කිමට සුදුසු, නව ලොවුතුරා දහමෙහි එක් ලක්ෂණයක්. "විද්‍යමාන බැවිනුදු පරිශුද්ධ බැවිනුදු "එහි පස්ස" විධියට අගීනුයි **එහි පස්සික** නම් වේ" වි: මා: ස: 517[22] 518[18] 531[29]

එහි භදන්තික (නා) (ත එහි භදන්තික බලනු) මනෝ: පූ: 463[28] අඞ්ගු: නි: 180

එහි භික්ඛු (නා) = මහණ මෙහි එන්න බුදුන් එහි භික්ෂූප සම්පත්තිය දෙන වාක්‍යයේ එක් කොටසක්." "භගවාහි **එහි භික්ඛු** භාවාය උපනිස්සය සම්පත්තං පුග්ගලං දිස්වා -පෙ- එහි භික්ඛු චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්ත කිරියායාති වදති" ස: පා: 170[14]

එහි භික්ඛු උපසම්පදා (නා) = එනම් උපසම්පදාව. අටවැදෑරුම් උපසම්පදාවන්ගෙන් **එකක්** "**එහි භික්ඛු උපසම්පදා** නම් අනන්තිම භවිකවූ පූර්වහේතුසම්පන්නා පුද්ගලයාට "එහි භික්ඛු චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්ත කිරියාය" යී දෙන උපසම්පත්තියි" ක: වි: පි: 1[410]ස: ප: 170[12] 171[11] (අට්ඨවිධ උපසම්පදා බලනු)

එහි භික්ඛුකා (නා) = එහි භික්ෂූපසම්පත්තියෙන් උපසපන් වූවෝ. ස: පා: 170[33]

එහි භික්ඛු චීවරං (නා) = එහි භික්ෂු චීවරය, ඍද්ධියෙන් උපන් සිවුර. තෙවිසි පාංශුකූල චීවරයෙන් එකක්. "ඉද්ධිමයන්ති එහි භික්ඛු චීවරං" මනෝ: පූ: 488[27]

එහි භික්ඛුනී (නා) = එහි භික්ෂූපසම්පත්තියෙන් උපසපන් වූ මෙහෙණ. වි: මි: ටී: 345

එහි සඞ්ගත වාදිනෝ (නා) = "එහි සඞ්ගතං තව" යන කථා ඇත්තෝ. මෙහි එන්න. ඔබගේ පැමිණීම යහපත්ය. ඔබට යහපතක් වේවයි කියන්නෝ. **එහි සඞ්ගත වාදිනෝ** අබ්භාකුටිකා උත්තානමුඛා පුබ්බභාසිනෝ" පාරා: පා: 214[24] සං: පා: 449[21] (එහි සාගත වාදිනෝ යනුත් පාඨයි.)

එළක 1 (නා) = එළිපත. ඉඳුකීලය. අ: ප: සු: 31[24]

එළක 2 (නා) [සං. එඩක] = එළුවා. තිරෙළුවා. පොර ගසන එළුවා. කු: සි: ස: 61[12] අ: ප: ස: 68[28] **-චතුෂක** (නා) [සං. එඩක චතුෂක] = එළක චතුෂ්ඨාය. ආනන්තරීය කර්මය විභාගයෙහි එක් ප්‍රභේදයක්. එළුවකු මරමිසි යන අදහසින් හෝ සිතින් එළුවා සිටිය තැන සිටි මිනිස් මවක හෝ පියකු මරන මිනිසා ආනන්තරීය කර්මය කෙරේ. එළුවකු මරමි යන අදහසින් හෝ මව්පියන් මරමි යන අදහසින් හෝ සිතින් එළුවකු මරන්නේ ආනන්තරීය නොවේ. මව්පියන් මරමි යන සිතින් හෝ අදහසින් මව්පියන් මරන්නේ ආනන්තරීය වේ. මේ එළක චතුෂ්කයයි. "මේ චතුර්විධ විකල්පයන්හි මෑ පූර්ව භාගයේ පැවැති මරණාභිප්‍රාය තෙමේ ප්‍රමාණ නොවේ. කවර හෙයිනයත්? ඉන් අර්ථසිද්ධිය නොවන හෙයිනි. මරන සිතත් ඒ මරන සිතට අරමුණු වූ ජීවිතෙන්ද්‍රියයත් ආනන්තරීය කර්මයාගේ වීමෙහිත් නො වීමෙහිත් ප්‍රමාණ වේයයි දත යුතුයි" අභි: ප්‍ර: 1806[4] මනෝ: පූ: 249[23] ප: සූ: 77[14](4) විභ: ම: 476 විභ: අ: 300[9] **-චම්ම** (නා) [සං. චර්ම] = තිරෙළු සම්. ඇඳ පුටු ආදියෙහි අතුට හිඳිනට සුදුසු ගරු බඩු වූ සම් විශෙෂයක්. අවන්ති දක්ෂිණාපථයෙහි අනුදත් ආස්තාරණයක්. "අවන්ති දක්ඛිණාපථෙ නික්කඛෙ චම්මානි අත්ථරණානි **එළකචම්මං** අජචම්මං මිගචම්මං" මහා: පා: 232[18] කු: සි: ස: 61[12] ක: වි: 140[9] **-පාදපිඨ** (නා) = එක් පුටු විශෙෂයක්. එළුවන්ගේ පා වැනි පා ඇති ගරු බඩු ගණයෙහි ගැණෙන පුටු වෙසෙසක්. මේ **"එළක පාදපිඨ"** යනු වැරැදි බවත් එය **"එළකපාදපිඨ"** යී ශුද්ධ විය යුතු බවත් සමහර පඬිවරුන්ගේ මත යැයි. එසේ කියනුයේ සමන්තපාසාදිකා විනයට්ඨකථායෙහි එන **"එළකපාද පිඨං**

නාම දුරුවට්ටිකාය උපරි පාදෙ ඨපෙත්වා හොජන ඵලකං වියඃ කතං පීඨං වුච්චති" යන පාඨය ප්‍රමාණ කරමිනි එකාර-එකාර දෙදෙනාගේ සාම්‍යය නිසා **"ඵලකපාදකං"** යනු **"ඵළකපාදකං"** යනුවට පෙරැළෙන්නට ඇතැයි වැඩි දුරටත් කියති. මෙහිදී චුල්ලවග්ගපාළියේ සහ අට්ඨකථාවේ එන ලකාරයද එක් සාධකයක් මෙන් ගණිති. එහෙත් **කඩ්ඛාවිතරණී** පිට පොතේ **"ඵළක පාදපීඨ"** යනුම දක්නේය. එමතුනොව චුල්ලවග්ගපාළි සෙනාසනක්ඛන්ධක උද්ධන ගාථාවන්හි "පීඨකෙළකපාදකං" යී සන්ධි රූපයකින්ද එයම දක්නේය. **"ඵළක පාදකං"** වී නම් මේ සන්ධිය විය නොහැක. **ක:** වි: පි: 111[24] චූ: පා: B. 14[13] 132[3] × ii[27] **සැ:** පා: 899[7] චූ: පා: 266[2] 302[20] **-ලොම** 1 (නා) [සං. රොම] = එළු ලොම්. "අනන්තරා මගෙහ **එළක ලොමානි** උපපජ්ජිංසු" පාරා: පා: 262[17] ප්‍රා: පු: සැ: 47[17] සාර: දී: 599[10] **-ලොම** 2 (නා) – එනම් ශික්ෂාපදය. අදත් මගට පිළිපන් භික්ෂුවක් සියනින් එළුලොම් පිළිගෙන තුන් යොදුනක් ඉක්මවා නම් නිසඟි පවිති වේයයි **පණ්ණත්ති** වදාළ ශික්ෂාපදය. **සූ:** ප: 74[5] ප්‍රා: පු: සැ: 47[18] සැ: පා: 497[10] **-ලොම** 3 (නා) = තෙළෙස් සමූට්ඨානයන්ගෙන් එකක්. **ක:** වි: 22[17] (**එළක** ලොම් සමූට්ඨාන බලනු) **-ධොවාපන** (නා) = එනම් ශික්ෂාපදය. යම් භික්ෂුවක් නොනැමෙහෙණක ලවා එළු ලොම් සෝදවා නම් හෝ රඳන් කරවා නම් හෝ අවුල් හරවා නම් හෝ නිසඟි පවිති වේයයි පැණවූ ශික්ෂාපදය. **සූ:** ප: 62[15] **-භණ්ඩික** (නා) = එළුලොම් පොදිය. **සැ:** පා: 497[19] **-සමුට්ඨාන** (නා) = එනම් ආපත්ති සමූහය. තෙළෙස් සමූට්ඨානයන්ගෙන් එකක්. **ක:** වි: 22[19] (අදින්න සමූට්ඨාන බලනු) **-සංවාස** (නා) = එළුවන්ගේ එක්වීම. කිසිවක් කථා නොකර **එක** තැන විසීම. **"ඵළක සංවාසඤ්ඤූ** කිර මේ භික්ඛවෙ මොඝපුරිසා වුත්ථාසමානා ථාසුකමහ වුත්ථාති පවිජානන්ති" මහා: පා: 178[35] ම: පා: සැ: 535[38]

එළගල 1 (නා) = තුවර, කලිල **"එළගලා. ගුම්බං, කලිලබැද්දකට. කමෙබොජගුම්බ නමුත් හේමැයි" ජා: අ: ගැ: 195[29] අ: ප: සැ: 81[16]**

එළගල 2 (නා) = කෙළතොල්ලා, කෙළ වැගිරෙන වදන් ඇත්තා

එළගල වාචා (නා) = කෙළතොලු වදන් ඇත්තා. "ඉධෙකච්චෙ දුබ්බචෙ හොති දුම්මනෙ **එළගල වාචෙ**" චූ: පා: 193[14]

එළමුඛ (නා) = කෙළතොලු. කෙළ වැගිරෙන්නා. පැවිදි නොකළ යුතු පරිසදූෂක යෙක්. **"එළමුඛොනි** නිච්චං පගෙරිත ලාල මුඛො" සැ: පා: 768[30] වි: ලං: 161[30]

එළමූග (නා) = කෙළතොල්ලා. හොළු බිහිරි වූවහු. කියන්නට හෝ අසන්නට නොහැක්කහු. **"එළමූගාසි,** ගොළුවොත්, නොහොත් **එළා,** මහතොල් ඇතියොත්: මූගා, ගොළුවොත්" ධ: අ: ගැ: 147[4] අ: ප: සැ: 97[28]

එළා (නා) = කෙළ අ: ප: සැ: 39[20]

එලාලුක (නා) = කැකිරි. නව මහඵලයන්ගෙන් එකක්. ධ: අ: ගැ: 91[33] අ: ප: සැ: 81[29] **එලාලුක** යී ද දක්නේය. (**එලාලුක** බලනු)

ඔ

ඔ 1 (නා) 1 පාළි වර්ණ මාලාවේ සවරයක්. ඔකාරය. 2 සංස්කෘත අව උපසර්ගීයා ගේ පාළි රූපය. පදාදියෙහි සිටි අව උපසර්ගීයාගේ සහ පදමධ්‍යයෙහි වූ අව ශබ්දාංශයාගේ පාළි රූපය. සං. අවවාද<පා: ඔවාද, සං. අවසාන<පා: ඔසාන සං. දන්නපවන< පා: දන්න පොන සං. ලවණ<පා: ලොණ ආදී තන්හි සෙයින්.

ඔ 2 (නා) = වි උපසර්ගීය සමඟ සිඳ පදයන් හා යෙදෙන දවසව ශබ්දයන්ගේ ආදි පදයේ ආදි අක්ෂරය. (අව උපසර්ගීයාගේ ආදේශ රූපය) "තානි **ඔලින** විලිනානි තිට්ඨන්ති" –"උත්තුරෙහිපි විහාරා **ඔකිණ්ණ විකිණ්ණා** හොන්ති" මහා: පා: 244[3–4] පාරා: පා: 280[7].

ඔක (නා) = 1 ගෙය, 2 දිය, ජලය. 3 ආධාරය "පළමුවන **ඔක** ශබ්ද දිය කියයි. දෙවන **ඔක** ශබ්ද ආලය කියයි." –"**ඔකා,** සසරින්" –"**ඔකා,** ගිහිගෙන්, පස්කම් ගුණ නිලයෙන් යූ සේයි" අ: ප: ස: 29[9] ධ: අ: ගැ: 96[10] 151[15-17] ස: පා: 820[7] –**පුණණ** (නා) [සං. පූර්ණ] = දිය පිරුණු ජලය බිගත්. "සිවුරු ගැබ්වල වතුර පෙරහන්වල සේ ජලය නැවතුණු" එබඳු සිවුරු. "අථඛො තෙ භික්ඛූ -පෙ- **ඔක පුණෙණාති** විවරෙති කිලන්තරූපා -පෙ- තෙනුපසඞ්කමිංසු" මහා: පා: 287[15] ස: පා: 820[7] ම: පා: ස: 753[37] (ඔඝ පුණණ යි ද පාඨාන්තරයි. ස: පා: 820[10])

ඔකප්පන (නා) [සං. අවකල්පන] = ඇදහිම, කල්පනා කිරීම. සිතීම. "**ඔකප්පනාසඞ්ඛ** සද්ධං, **කම්**ඵල හදහන ශ්‍රද්ධාවයි" ජා: අ: ගැ: 156[26].

ඔකප්පනිය (නා) = ඇදහිය යුතුවූ. හැදහිලි කටයුතු. ජා: අ: ගැ: 179[7].

ඔකමොපධා (පූ: ක්‍රි:) (අව + √කම්ප + ත්වා) = මදක් සොලවා, හිස වනා. "එවං වුත්තෙ උපකො ආජීවකො -පෙ- සීසං **ඔකමොපධා** -පෙ- පක්කාමි" මහා: පා: 7[33] සාරා: ම: 189[27].

ඔකාර (නා) = ලාමක බව, යටත් බව. පහත් බව. "කාමානං ආදීනවං **ඔකාරං** සංකිලෙසං" –"**ඔකාරං,** ළමු බවු, යටත් බවුයයි සේයි" මහා: පා: 214[8] ධ: අ: ගැ: 10[17] වි: වි: ටී: 36[24].

ඔකාස 1 (නා) (අව + √කාස + අ) [සං. අවකාශ] = 1 අවසර, ඉඩ. 2 හෙතුව, කාරණය 3 ස්ථානය. "ආයස්මා අජ්ජුකො තං **ඔකාසං** තස්ස දූරකස්ස ආචික්ඛි" –"තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ **ඔකාසං** කාරාපෙත්වා ආපත්තියා වොදෙනන්ති" –"ගච්ඡ අමුම්හි **ඔකාසෙ** තිට්ඨාහි" පාරා: පා: 66[10] පාචි: පා: 301[18] මහා: පා: 104[12] 123[15] 203[13] 397[29] ධ: අ: ගැ: 63[6] ස: පා: 430[15].

ඔකාස 2 (නා) = අවකාශ ස්ථානය. මනුෂ්‍ය විග්‍රහ පාරාජිකාවේ එක් ආණත්තික ප්‍රයොගයක්. ගම් හෝ ගෙදර හෝ වීථිය හෝ ආදීන් අසුවල් තැනැදී මැරිය යුතුයයි නියම් කරන ස්ථානය. "ඔවස් නම් අසුවල් තැනැදී මරායි ස්ථාන නියම කිරීම්" සි: ව: වි: 2[3][1] ස: පා: 319[16] ක: වි: 301 විනි: ම: 83[25] (ආණත්ති නියාමක බලනු) –**කම්ම** (නා) = අවසරය. අවසර ලබා ගැණීම. ඉඩ ලබා ගැණීම. සඞ්ඝයා කෙරෙහි අධිකරණය ඉදිරිපත් කරන භික්ෂුව විසින් දතයුතු එක් කරුණක්. "**ඔකාස කම්මං** කාරෙත්වා පවත්තා හොති" පරි: පා: ගැ: 346 ස: පා: 430[9] 101[2][34] පරි: පා: 243[9] 248[29] 249[3] –**කිච්ච** (නා) [සං කෘත්‍ය] = අවකාශ ගැණීමක්. පඨම දුටඨ දෙස සඞ්ඝාදිසෙස ශික්ෂා පදයෙහි සඳහන් පරිදි වොදනා කිරීමට අවකාශ ගැණීම. ස: පා: 430[2] –**නිමිත්ත** (නා) = ඔකාස නිමිත්තය. **පටිඝකූල** මනසිකාරයෙහි කෙශාදී කොටස් පිළිබඳව සජ්ඣායනා කරන ක්‍රමයක්. වි: මා: ස: 589[22] –**පරිකප්ප** (නා) [සං. පරිකල්ප] = අවකාශය කල්පනාකොට ගැන්ම. අදින්නාදාන පාරාජිකාවේ ථෙය්‍යාවහාර පඤ්චකයට අයත් දෙවැදෑරුම් පරිකප්පාවහාරයන්ගෙන් එකක්. "පුන එක් කෙනෙක් අනුන්ගෙ පිරිකර ගෙනැ අසෝ තෙනට ගිය සඳ ගන්මිසි පිරිකපා අනුන් දුට දී නොදුට තොදී පිරිකැපූ තැන් ඉක්මවන් නම් පරිජ් වෙ. මේ **ඔකාස පරිකප්ප** නම්" සි: ව: වි: 2[2][11] **ක**: වි: 27[35] ස: පා: 273[21] –**පුච්ඡා** (නා) = අවකාශය, ස්ථානය විචාරීම. අධිකරණ විනිශ්චය කරන භික්ෂුව විසින් වොදකයාගෙන් විචාළයුතු කරුණක්. "පෙරදිග පිහිටි අවකාශ **ස්ථානයකද?** යනාදීන් විචාරීම." පරි: පා: 228[30] –**සෙනාසන** (නා) [සං. ශයනාසන] = නිවාසස්ථානය. සිව් වැදෑරුම් සෙනාසනයන්ගෙන් එකක් "යථ වා පන භික්ඛු පටික්කමනන්ති එතං **ඔකාස සෙනාසනං** නාම්" මනො: පූ: 571[31]

ඔකාසතො 1 (නා) = අවකාශ ගෙයින්. කමට හත් දෙන ඇදුරකු විසින් උද්ග්‍රහ කෙරෙන ශල්‍යය = උද්ග්‍රහ විධිය කියා දිය යුතු සත් ආකාරයෙන් එක් ආකාරයක්. වි: මා: ස: 586[13].

ඔකාසතො 2 (නා) = අවකාශ ගෙයින්. අශුභ කම් ස්ථානයෙහි නිමිති ගන්නා සැටි දැරුම් ක්‍රමයෙන් එකක්. වි: මා: ස: 436[6].

ඔකිණ්ණණ (නා) [සං. අවකීර්ණ] = හැසුණු ගැවැසුණු. විසුරුණු. "උභතුරෙහිපි විහාරා ඔකිණ්ණණ විකිණ්ණණා හොන්ති" වි: මා: සං: 84216 ම: පා: සං: 6658 මහා: පා: 2443 -**විකිණ්ණණ** (නා) [සං. විකීර්ණ] = හැසුණු ගැවසුණු. හෙසජ්ජ සික්ඛාපද නිදාන කථා වෙහි සහ මහාවග්ග පාළි හෙසජ්ජ අනුසඤ්ඤුත භාණවාරයෙහි සඳහන් පරිදි ගිතෙල් සුවඳින් බිම කණින මියන් ගෙන් සහ බත්ති කණිමින් උඩ හැසිරෙන මියන් ගෙන්ද ගැවැසුණු පාරා: පා: 2807 සං: පා: 51524 මහා: පා: 2443-4 සාරා: ම: 10323 ම: පා: සං: 6658-31.

ඔකිරි (ක්‍රි) (අව + √කිර + ඊ) = පහතට හෙළීය, දැමීය (අනී: **ඔකිරි** වනී: **ඔකිරති** අතා: **ඔකිරිස්සති** සම්: **ඔකිරෙය්‍ය** පම්: **ඔකිරතු** පූ:ක්‍රි: **ඔකිරිත්වා** වකෘ: **ඔකිරනෙනා** සන්‍ර: ලි: **ඔකිරනති** = පහතට හෙළන්නී. විසුරුවන්නී) "සා ඉස්සා පකතා සපත්තිං අඞ්ගාර කටාහෙන **ඔකිරි**" – "භික්ඛු රජෙන **ඔකිරිංසු**" පාරා:පා: 11420 චූ: පා: 34935. සං: පා:30122

ඔකිරිණී (නා) = ගැවසුණී, අහුරින් ගැවසුණී. භාත්පස පිහිටි කැලමල් වැනි ගිනි අහුරින් මැදිවූ තැනැත්තී. "අද්දසං ඉත්ථිං උපකඤ්ඤා **ඔකිලිණිං ඔකිරිණිං** වෙහාසං ගච්ඡන්තං" පාරා: පා: 11418 සාරා: ම: 3525 සං: පා: 36315

ඔකිරියති (ක්‍රි) (අව + √කිර + ඊය + ති) = සිදින ලද කෙළවරින් ගැලෙයි, වැගිරෙයි. සිවුරු කොණින් හූ එල්ලෙයි "සුත්තා **ඔකිරියති**" – "**තිණවුණ්හණාදිපි** පංසුකෙනිපි **ඔකිරියති**" මහා: පා: 23733 33326 චූ: පා: 23423 සං: පා: 8379

ඔකිලිනී (නා) (අව + √කලිද + ඉනී) = පහතට වැගිරෙන්නී. සිරුරින් බින්දු බින්දු වශයෙන් ඔජාව වැගිරෙන්නී. තෙත්වූ තැනැත්තී. "අද්දසං ඉත්ථිං උපකඤ්ඤං **ඔකිලිනිං** ඔකිරිණ්ණං" පාරා: පා: 11418 සං: පා: 36334 සාරා: ම: 3924

ඔක්කන්ති (නා) (අව + √කමු + ති) [සං. අව ක්‍රාන්ති] = ඉපදීම, මව් කුසට පැමිණීම. පිළිසිඳ ගැණීම. "**ඔක්කන්ති** හොතීති, නිබ්බත්තී හොති" සාර: දී: 4045 වි: මා: සං: 149637

ඔක්කන්තික ධම්මදෙසනා (නා) = සූත්‍රාභිධර්ම විනය පාළියට නොනැගූ බුඩ දෙශනාව. ඒ ඒ කරුණෙහි නුවණින් පිවිස කරනු ලබන දෙශනාව ප්‍රතීත්‍යික දෙශනාව. "**ඔක්කන්තික ධම්ම දෙසනා** නාම සඤ්ඤෙත අනුපවිසිත්වා අන්තරා කථියමාන ධම්මදෙසනා" සාර: දී: 4189 සං: පා: 1558

ඔක්කන්තික පීති (නා) = එතම් ප්‍රීතිය. (පඤ්ච පීති බලනු) සාර: දී: 58712

ඔක්කන්තික විනිච්ඡය (නා) = ආචාර්‍යවාදයෙහි බැසගත් විනිශ්චය. ආචරිය වාදය. පන් සියයක් මහරහතන් වහන්සේ විසින් තබන ලද අර්ථ කථාව. සතර මහා ප්‍රදේශයන් ගෙන් එකක්. "ආචරිය වාදෙ නාම -පෙ- **ඔක්කන්තික විනිච්ඡය**පවත්තා අට්ඨකථා තන්ති" වි: ලං: 9736 සාර: දී: 4301 සං: පා: 16217 19715 (ආචරියවාද 1 බලනු)

ඔක්කඳික (නා) (අව + √කඳ + ඉක) = පැන පැන, පනිමින්. ජා: අ: ගැ: 16614 (ඔක්කන්දිත්වා බලනු.)

ඔක්කඳිත්වා (පූ: ක්‍රි:) (අව + √කඳ + ඉ + ත්වා) = පැන පැන නොහොත් ඕකදකොට. මත රැව් පවත්වමින්" ජා: අ: ගැ: 16615 සාර: දී: 58744

ඔක්කමනතා 1 (නා) = පැම්ණෙන්නෝ, පසුව පැම්ණෙන්නෝ. සමව නෝ එක් දිශාවකින් පැම්ණෙන භික්ෂූහු "අනුජානාමි භික්ඛවෙ පවජ්‍ය **ඔක්කමනතානං** අකාමාහාගාදුතුනති" මහා: පා: 32021 සං: පා: 1 722

ඔක්කමනතා 2 (නා) = පැම්ණෙන්නෝ, බැස ගන්නෝ. "මුච්චති හි ආනන්ද මුඨස්සතීනං අසම්පජානානං නිද්දං **ඔක්කමනතානං** සුපිනනෙනන අසුචි" මහා: පා: 3313-12

ඔක්කමනතී (නා) (ඔක්කමනත + ඊ) = ඉක්මවන්නී, ඉක්මවා යන තැනැත්තී. "අපරිකඛිත්තස්ස ආරම්මණස්ස උපවාරං **ඔක්කමනතියා** ආපත්තී පාචිත්තියස්ස" පාචි: පා: 34126

ඔක්කමයනත? (නා) = පැම්ණෙන, බැසගන්නා. "**පඤ්ඤා**මෙ උපාලි ආදීනවා මුඨස්සතිස්ස නිද්දං **ඔක්කමයනතො**" පරි: පා: 27221 (මේ පාඨය මහා: පා: ආදී පොත්වල දක්නේ "**ඔක්කමනතො**" යනුවෙනි.

ඔක්කමි (ක්‍රි) (අව + √කමු + ඒ) = පැමිණියේය. නින්දට පැමිණියේය. අනී: **ඔක්කමී** වතී: **ඔක්කමති** අනා: **ඔක්කමිස්සති** සමී: **ඔක්කමෙය්‍ය** පමී: **ඔක්කමතු** පු: ක්‍රි: **ඔක්කමිත්වා** වකෘ: **ඔක්කමමනෙනා** සත්‍රී: ලි: **ඔක්කමමනති** කර්මී: කෘ: **ඔක්කමිතබ්බා – තබ්බා – තබ්බං**) "අථ ඛො සො නාගො -පෙ- විස්සත්ථො නිද්දං **ඔක්කමි**" – "තස්ස ව මෙ ච්ඡිතං අරහං සම්මා සම්බුද්ධො **ඔක්කමෙය්‍ය**" – "මූහුත්තෙ නෙව නිද්දං **ඔක්කමි**" – "අසමපජඤා නිද්දං **ඔක්කමනති**" – අසම්පජඤානං නිද්දං **ඔක්කමනානං** සුපිනන්තෙන අසුචි මුච්චති" මහා: පා: 96^{25} 331^{2-3} චු: පා: 328^{35}

ඔක්කමිත්වා 1 (පූ: ක්‍රි:) = පැමිණ, වෙත පැමිණ. "ආයස්මා කඞ්ඛා රෙවතො අන්තරාමග්ගෙ ගුළකරණං **ඔක්කමම්ම**" ම: පා: සා: 666^{35} චු: පා: 307^{13}

ඔක්කමිත්වා 2 (පූ: ක්‍රි:) = ඉවත්ව, පසෙකට වී. "අනුජානාමි භික්ඛවෙ -පෙ- දූරතොව **ඔක්කමිත්වා** මඟඟං දූතුනති" – "පුන ගාම සීමං **ඔක්කමිත්වා** වසිත්වා පක්කමති" චු: පා: 411^{33} පාරා: පා: 292^{9} (ඔක්කමම බලනු).

ඔක්කමිංසු (ක්‍රි) = පැමිණියාහුය. ගියාහුය. "එකච්චෙ භික්ඛු පඨමං සුසානං **ඔක්කමිංසු**" මහා: පා: 320^{15} චු: පා: 328^{35}

ඔක්කමම (පූ: ක්‍රි:) = 1 පැමිණ. 2 පහවැ සිට, ඉවත්ව. "**ඔක්කමම**, පහවැ සිට" ක: වි: පි: 40^{37} ධ: අ: ගැ: 182^{18}

ඔක්කිත්ත (නා) (අව + √ඛිප + ත) [සං. අවක්ෂිප්ත] = යට හෙලූ, බිම බැලූ. (ඔක්කිත්ත චක්ඛු බලනු). -**චක්ඛු** (නා) = යට හෙලූ ඇස් ඇති, විය දඬු පමණ දුර බලන. "යුගමාත්‍ර දර්ශී බැවින් යට හෙලූ ඇස් ඇතියෙ" – "සො භික්ඛු -පෙ- පිණ්ඩාය පාවිසි -පෙ- **ඔක්කිත්ත චක්ඛු** ඉරියාපථ සම්පන්නො" – වි: මා: සා: 55^{21} 56^{29} පාරා: පා: 214^{29} සා: පා: 449^{4} 662^{9} ප්‍රා: පු: සා; 99^{28} ධ: අ: ගැ: 254^{23} මහා: පා: 36^{37} -**ලොචන** (නා) (√ලුව + යු = අන) = යට හෙලූ ඇස්ඇතිව. "**ඔක්කිත්ත ලොචනො**, පත්ත සංඥයෙන් යට හෙලූ ඇස් ඇතිව" වි: මා: සා: 173^{27} (ඔක්කිත්ත චක්ඛු බලනු).

ඔගණ (නා) [සං: අව + ගණ] = අඩු වූ සමූහය, සවලප පිරිසක්. "අථ ඛො භගවා **ඔගණෙන** භික්ඛු සඞ්ඝෙන දක්ඛිණාගිරිං චාරිකං පක්කාමි" මහා: පා: 88^{18} සා: පා: 749^{29}

ඔගත (නා) (අව + ගත) = බැස ගිය, ඉර බැස ගිය. "අත්ථඞ්ගතෙ සුරියෙති, **ඔගතෙ** සුරියෙ" පාචි: පා: 71^{2}

ඔගඩ (නා) (අව + ගඩ) = බැස ගත්, ඇතුළත්. අ: ප: සා: 98^{28}

ඔගමන (නා) (අව + ගමන) (ඔගාහන බලනු) සු: වි: 69^{1}

ඔගාහ 1 (නා) (අව + ගාහ) = බැස ගත්, අව නිණී. "ඉදානං ආවුසො -පෙ- නාගානං **ඔගාහං** -පෙ- සද්දං අස්සොසිං" පාරා: පා: 116^{7} සා: පා: 364^{37} 365^{1} ධ: අ: ගැ: 326 මහා: පා: 408^{2}

ඔගාහ 2 (නා) = ජලය, දිය. "**ඔගාහා**, දියෙන්, ඔගාහති එත්වාති **ඔගාහො**" – "**ඔගාහා ච** මෙ උත්තිණ්ණස්ස හත්ථිනියො කායං උපනිසංසන්තියො ගච්ඡන්ති" ධ: අ: ගැ: 325 මහා: පා: 408^{2}

ඔගාහෙත්වා (පූ: ක්‍රි:) (අව + √ගාහ + ණෙ + ත්වා) = 1 ගිල්ලවා, බස්වා. 2 ජලය ඇතුළත දැඩිසේ ගෙණ. 3 බැස. "වචඡතරිම්පි **ඔගාහෙත්වා** මාරෙන්ති" – "තෙ තං සරසිං **ඔගාහෙත්වා** -පෙ- අජ්ඣොහරන්ති" මහා: පා: 225^{11} චු: පා: 329^{32} සා: පා: 807^{16}

ඔගුණ්ඨිත (නා) [සං. අවගුණ්ඨිත] = හිස වැසූ. හිස වසා පෙරෙවී. ඇතුළු ගම් නො යායුතු යයි පැණ වූ එක් ක්‍රමයක්. "න **ඔගුණ්ඨිතෙන** අන්තරඝරෙ ගම්සාමීති සික්ඛා කරණීයා" ප්‍රා: පු: සා: 101^{26} කා: වි: පි: 125^{2} සා: පා: 663^{1} 666^{31} සා: පා: 896^{34} කා: වි: 151^{27} 155^{15} චු: පා: 338^{4} (**ඔගුණ්ඨිත** යි ද දක්නේය සා: පා: 896^{34})

ඔගුණ්ඨිත සික්ඛා (නා) = එනම් ශික්ෂා පදය (ඔගුණ්ඨිත බලනු).

ඔගුම්බියනති (ක්‍රි) (අව + √ගුම්බ + ඊය + නති) = වෙළා බඳිනු ලැබෙත්. බිත්ති දඬු ආදීන්හි වෙළා බඳිනු ලැබෙත්. "තෙන ඛො පන සමයෙන විහාරා වම්මවටෙහි **ඔගුම්බියනති**" මහා: පා: 228^{9} සා: පා: 808^{16} මී; පා; සා: 628^{20}

ඔගුම්බන්ධා (පු: ක්‍රි:) = ඝන දඬු යොදා, එසේ පියස්ස තනා. "අනුජානාමි භික්ඛවෙ **ඔගුම්බන්ධා** උල්ලිත්තාවලිත්තානං කාතුං" වූ: පා: 229[3] වූ: පා: B. 28[3] 670[20] 671[98] සා: පා: 892[28]

ඔඝගමන (නා) (අව+ගමන) = බැස යෑම, අසනඹගමනය සඳ හිරු සහ නැකැත්තරු බැස යෑම. එයින් ඇතිවන ඵලවිපාක කියමින් කරන මිථ්‍යා ජීවිකාව. දී: නි: 53[21] (ඔඝ මන යි ද පාඨයි) (ඔගමන බලනු.)

ඔඝ (නා) [සං. ඔඝ] = 1 කාමොඝාදිය 2 ජල ප්‍රවාහය, සැඩවතුරු 3 සමූහය. "යත්‍ර හි නාම ජණණුක මත්තෙසුපි **ඔඝෙසු** වත්තමානෙසු කට්මත්තෙසුපි **ඔඝෙසු** වත්තමානෙසු" අ: ප: සා: 135[10] මහා: පා: 328[22]

ඔවරක (නා) (අව+√වර+ණ්වු = අක) [සං. අවවරක] = ඇතුළට පිවිසෙන්නා. අනුන්ගේ ගෙවල නෝ විහාරාරාමයන්හි නෝ ආරක්ෂා වෙන් තොර වූ බඩු සොය සොයා අසුවල් අසුවල් දේ සොරා ගණුවසි. සංඥ ආදිය කරන තැනැත්තා. ඔත්තු කියන්නා. පාරා: පා: 46[29] 52[1] සා: පා: 264[14] 266 සාරා: ම: 27[30] වි: වි: ටී: 164 සාර: දී: 519[23]

ඔවරක කථා (නා) = අදින්නාදුන පාරාජිකාවේ ඔවරක විනිශ්චය. සා: පා: 264[27]

ඔවරිත්තා (පු: ක්‍රි:) = විමසා, සලකා, පිරික්සා බලා. "**ඔවරිත්තා**නි සල්ලක්ඛෙත්වා උපධාරෙත්වාති අත්ථො" සා: පා: 264[15] පාරා: පා: 52[1]

ඔවිණ (නා) (ඔවිනන බලනු) සාර: දී: 386[17]

ඔවින (නා) (අව+√වි+ත) = සිඳින ලද, බිඳින ලද, බුන්. "**ඔවින්නොවින්නං**, බුනු බුන්නා" ජා: අ: ගැ: 169[12]

ඔවිනන (නා) (අව+√වින+යු = අන) = නෙළීම, වල්නෙළීම. "මාලාවච්ඡ රොපනා දයො, කුලන් සගන්නට මල් රුක් රොපනාදි; රොපාපන සිඤ්චන සිඤ්චාපන **ඔවිනන ඔවිනාපන** ගන්‍ථන ගන්‍ථාපන යන මේ ගෘහිතයි" ක: වි: පි: 38[29] සා: පා: 445[35]

ඔවිනනති (ක්‍රි) (අව+√වින+නති) = මල් නෙළත්. කුලන් සගන්නා පිණිස මල් නෙළත්. (අකි: **ඔවිණි** වතී: **ඔවිනානි** = **ඔවිනනති** බහු: ව: **ඔවිනනති** අනා: **ඔවිනිඤ්ඤති** සම්: **ඔවිනෙය්‍ය** පරි: **ඔවිනාතු** පු: ක්‍රි: **ඔවිනිත්වා** වකා: **ඔවිනනෙනා** කර්මකා: **ඔවිනිනබ්බෝ, -නබ්බා -නබ්බං** නෙළිය යුතු, මල්නෙළිය යුතු) පාරා: පා: 213[28] ක: වි: පි: 38[29] වූ: පා: 259[26]

ඔවිනාපන (නා) (අව+√වි+න+ණාප+යු = අන) = නෙළවීම, මල් නෙළවීම. "**ඔවිනාපනෙ** සකිං ආණත්තෙනා බහුකම්පි **ඔවිනන්ති එක**මෙව සප්‍යාවන්තිය දුක්කටං" සා: පා: 446[1] ක: වි: පි: 38[39]

ඔවිනාපෙනති (ක්‍රි) (අව+√වි+නා+ණාපෙ+නති) = නෙළවත්. කුලන් සගන්නා පිණිස මල් නෙළවත්. "ඡබ්බග්ගියා භික්ඛූ -පෙ- **ඔවිනනන්ති ඔවිනාපෙනන්ති**" වූ: පා: 256[26] පාරා: පා: 213[28]

ඔවිජ්ඣිත්වා (පු: ක්‍රි:) (අව+√ඡන්ද+ඉ+ත්වා) = හවුරා, මඟ හවුරා. මඟ වළකා. ජා: අ: ගැ: 158[6]

ඔජ (නා) [සං. ඔජස්] = 1 දීප්තිය 2 ශක්තිය. බලය. අ: ප: සා: 134[23]

ඔජවනිකා (නා) (අව+ජවන+ඉක+ආ) = යටිගං බලායන, එබදු නැව. "අධොගාම් නිනන්ති **ඔජවනිකාය**" පාචි: පා: 81[17] සා: පා: 593[23]

ඔජා (නා) = ඔජස්. රසොජස් වණීණාදී අෂ්ට ධම්මකලාපයන්ගෙන් එකක්. "ආවිසනන්තිපි **ඔජම්පි** හරනති" වි: මා: සා: 879[8] අ: ප: සා: 134[22] මහා: පා: 166[10]

ඔඡක්ඛාපෙනති (ක්‍රි) = උඩුක්ඛාපෙනති යන්නෙහි පාඨාන්තරයක් සා: පා: 563[6] (උඩුක්ඛාපෙනති බලනු)

ඔඤ්ඤන (නා) (අව+√ඤ්ඤ+ත) [සං අවඥ] = ලාමක කොට දන්නා ලද, පහත් කොට සැලකූ. "**ඔඤ්ඤනන්නි** අවඤ්ඤතං" සා: පා: 122[4] 538[5] පාචි: පා: 93

ඔටඨ 1 (නා) = මුවවිට, ගැට්ට. "හිකඛූ ජම්මය පත්‍තං නික්කුජ්ජනති **ඔටට්ඨා** ඝංසියති" වූ: පා: B. 652[6] 653[7]

ඔට්ඨ 2 (නා) [සං. ඔෂ්ඨ] = තොල, දෙතොල. අ: ප: ස: 36^{17} **-චම්මන** (නා) = තොල් නැති යහු. පැවිදි නොකළයුතු පරිස දූෂකයෙක්. ස: පා: 768^{30} **-නිල්ලෙඛන** (නා) (නි + √ලිඛ + ණවු = අක) [සං. නි + ලෙඛක] = තොල ලෙවීම. "**ඔට්ඨනිල්ලෙඛකං** දිවින් පිටතොල ලෙව ලෙව" - න **ඔට්ඨනිල්ලෙඛකං** භුඤ්ජී සසාමීති සික්ඛා කරණීයා" ප්‍රා: පු: ස: 1057_{-20} **-මංස** (නා) = ඔටමස්, දෙතොල් පෙති දෙතොල. ක: වි: 153^{32}

ඔට්ඨා (නා) [සං. උෂ්ට්‍ර] = ඔටුවා. පාවි: **පා:** 14^{28} අ: ප: ස: 68^{30} (සත්‍රී: ලි: ඔටසී ජා: අ: ගැ: 225^{35})

ඔට්ඨා'සි (ක්‍රි) = ඔටුවෙක් වෙනි. දශවිධ ආක්‍රොශ වසතුන්ගෙන් **එකක්**. ඔම්සවාද ශික්ෂාපදයෙහි උපසපන් භික්ෂුවකට නිතු කිරීමෙන් පවිනි ඇවැත්වන හින ආක්‍රොශ වචනයක්. පාවි: පා: 14^{27-33} සි: ව: වි: 42^{32} ධ: අ: ගැ: 74^{9} 229^{8} 259^{8}

ඔඩ්ඩි 1 (ක්‍රි) (√උඩ්ඩ + ඒ)=ඉදිරිපත් කෙළේය. අභිමුඛ කෙළේය. නැමිය "අථඛොසා මක්කටී භුඤ්ජිත්වා තස්ස භික්ඛුනො කටිං **ඔඩ්ඩි**" පාරා: පා: 20^{16} ස: පා: 159^{2}

ඔඩ්ඩි 2 (ක්‍රි) = ඇට වී. (ඔඩ්ඩෙති යන ක්‍රියා පද යෙහි අතීත රූපය) (ඔඩ්ඩෙනති බලනු) ස: පා: 327^{1} වි: මා: ස: 1611^{13}

ඔඩ්ඩෙනති (ක්‍රි) = අටවත්. උගුලක් අටවත්. "**ඔඩ්ඩෙනති**, හටවත්" ජා: අ: ගැ: 61^{26}

ඔණ? (නා) = ගෙණ එන ලද. සාර: දී: 518^{23} වි: වි: ටී: 164^{7} (ඔණිරක්ඛ බලනු)

ඔණිරක්ඛ? (නා) = ගෙණවුත් තැබූ බඩු ආරක්ෂා කිරීම, එසේ කරන්නා. "**ඔණිරක්ඛා** නාම ආහටං භණ්ඩං ගොපෙනෙනා" ස: පා: 264^{28} සාර: ම: 27^{28} (ඔනිරක්ඛ යි ද දක්නේය. පාරා: පා: 52^{4}) (ඔනිරක්ඛ බලනු)

ඔණොජන (නා) (ඔනොජන බලනු) චූ: පා: 77^{30}

ඔණොජේථ? (ක්‍රි) = දෙව්. "**ඔණොජේථ**, වුසො සඞ්ඝස්ස චීවරනනි" පාරා: පා: 292^{29} (ඔනොජේථ බලනු)

ඔතපති (ක්‍රි) (අව + √තප + නි) = රත්වෙයි, අව්වෙන් රත්වෙයි, රත්කරයි. "පානීයං **ඔතපති**" චූ: පා: B. 28^{4} 29^{5}

ඔතමසික (නා) (අව + තමස + ඉක) = අඳුරෙහි සිටින්නා. අඳුරෙහි සිටින භික්ෂුව. නො වැන්ද යුතු භික්ෂූන් පස්නමගෙන් **එක** නමක්. "**ඔත මසිකො**, අඳුරෙහි හුන්නේ" පරි: පා: ගැ: 378 පරි: පා: 272^{31} ස: පා: 1024^{30} (අවඤ්ඤිය බලනු)

ඔතරති (ක්‍රි) (අව + √තර + නි) = බසියි අව තරණය කරයි. (අනී: **ඔතරි** වතී: **ඔතරති** අනා: **ඔතරිස්සති** සම්: **ඔතරෙය්‍ය** පම්: **ඔත රතු** පූ: ක්‍රි: **ඔතරිත්වා=අවතරිත්වා** වකෘ: **ඔතරනෙනා** සත්‍රී: **ඔතරන්ති**=බස්නී, එබදු තැනැත්තිය) පාරා: පා: 81^{25} ධ: අ: ගැ: 77^{34}

ඔතරාහි (ක්‍රි) = බසුව. "ඔතරති" යන ක්‍රියා පද යෙහි විධික්‍රියා රූපය. "ආවුසො ඉතො **ඔතරාහිති**" පාරා: පා: 81^{26}

ඔතල්ලක (නා) = බැගෑපත්, දීනයා, දුගියා. සා පිපාසාදි දුකින් පෙළුණු සිරුරු පිළිදැගුමක් හෝ නැති අසරණයා. ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන යෙහි ගිහි ශබ්දයට යෙදූ පර්‍යාය පදයක්. ස: පා: 180^{35} සාර: දී: 457^{30} වි: වි: ටී: 115^{11}

ඔතාපෙත්වා (පූ: ක්‍රි:) (අව + √තප + ණාපෙ + ත්වා) = තවා, රත්කොට. වියලා. අව්වෙහි තබා. (අනී: **ඔතාපෙයි** වතී: **ඔතාපෙති** අනා: **ඔතාපෙස්සති** සම්: **ඔතාපෙය්‍ය** පම්: **ඔතාපෙතු** පූ: ක්‍රි: **ඔතාපෙත්වා** වකෘ: **ඔතා පෙනෙනා** කම්කෘ: **ඔතාපෙතබ්බා-තබ්බා-තබ්බං**=තැවිය යුතු, අව්වෙහි රත් කළ යුතු.) "අනුජානාමි භික්ඛවෙ මුහුත්තං උණ්හෙ **ඔතාපෙත්වා** පත්තං පටිසාමෙතුං" චූ: පා: 224^{11-19} 340^{3} චූ: පා: B. 650^{11-13} මහා පා: 431^{4} ම: පා: ස: 158^{38} චූ: පා: 340^{3} පාවි: පා: 53^{26}

ඔතාර 1 (නා) (අව + √තර + ණ) = ඇතුළට පිවිසීම, බැසගැන්ම. කෙලෙසුන් සිත ඇතුළට බැස ගැන්ම. "දස්සනෙ සති සංසග්ගෙහා සංසග්ගෙ සති විස්සාසො විස්සාසෙ සති **ඔතාරො**" පරි: පා: 182^{15} ස: පා: 990^{8} පරි: පා: ගැ: 151^{1} අ: ප: ස: 150^{16} ධ: අ: ගැ: 187^{20}

ඔතාර 2 (නා) = සිදුරු, වරද, දෙස්, අනුන්ගේ වරද, ජා: අ: ගැ: 38^{13} අ: ප: ස: 150^{16} ධ: අ: ගැ: 187^{20} 174^{22}

ඔතාරාපෙඛ (නා) [සං.අපෙක්ෂා>පා: අපෙඛා >අපෙඛා] = සිදුරු සෙවීම, අනුන්ගේ වරද සෙවීම. **"ඔතාරාපෙඛා,** සිදුරු සොයන්නෙමි" ජා: අ: ගැ: 38^{13} 43^{32} ප: සූ: 100^{14} (4)

ඔතාරෙසි (ක්‍රි) (අව + √තර + ණෙ + ඊ) = බහාලී. ඇතුළෙහි බහාලිය. (අතී: **ඔතාරෙසි** වතී: **ඔතාරෙති** අනා: **ඔතාරෙසසති** සමී: **ඔතාරෙය්‍ය** පමී: **ඔතාරෙතු** පූ: ක්‍රි: **ඔතාරෙත්වා** වකෘ: **ඔතාරෙනෙතා** කමී: කෘ: **ඔතාරෙතබ්බා-තබ්බා-තබ්බං**=බහාලියයුතු) ජා: අ: ගැ: 176^{29} ක: වී: පි: 122^{32} ධ: අ: ගැ: 186^{10} 204^{4}

ඔතිණ්ණ 1 (නා) (අව + √තර + ත=ඉණ්ණ) [සං. අවතීර්ණ] = 1 බස්නා ලද, බටුවාවූ. 2 රාග රහිත වූ. 1 **"ඔතිණ්ණා,** කායසංසග්ගරාගයෝ විසින් බස්නා ලද්දේ නොහොත් කාය සංසග්ගරාගයට බටුයේ" 2 දුට්ඨුල්ලවාචස්සාදරාගයෝ විසින් බස්නා ලද්දේ නොහොත් දුට්ඨුල්ල වාචස්සාදරාගයට බටුයේ 3 අත්ත කාම පාරිචරියා රාගයෝ විසින් බස්නා ලද්දේ නොහොත් අත්තකාමපාරිචරියා රාගයට බටුයේ. ප්‍රා: පු: ස: 14^{20} සා: පා: 379^{15} ක: වී: 35^{1}

ඔතිණ්ණ 2 (නා) = ආරොවනය කිරීම, දැන්වීම. "ඔතිණ්ණෙන දෙසෙ සික්ඛාපද පඤ්ඤපනං'-"**ඔතිණ්ණෙනාති** ආරොචිතෙ" ස: පා: 135^{2} සාර: දී: 387^{15} **-චිත්ත** (නා) = කායසංසග්ගරාගයට බටුවා වූ සිත් ඇති, එබඳු මහණ. පරි: පා: 182^{15} **-සඞ්ඝාදිසෙස** (නා) = එනම් සඞ්ඝාදිසෙස තුණ. භික්ෂුණීන්ට අසාධාරණ වූ 1 කායසංසග්ග 2 දුට්ඨුල්ලවාචා 3 අත්ත කාම යන සඞ්ඝාදිසෙස **තුණ.** පරි: පා: ගැ: 193^{0} ප්‍රා: පු: ස: 14^{22} $159-21$

ඔතප්ප (නා) [සං. අපත්‍රප්‍ය] = භය, පවට ඇති බිය. අ: ප: ස: 22^{20}

ඔතාපී (නා) (ඔතාප + ඊ) [සං අපත්‍රප්‍ය] = පවට බිය ඇති. මහා: පා: 71^{18} 89^{10}

ඔත්ථර (නා) (අව + √ථර + ත) වැතුරුණු, පැතිරී පැවැති. ගලාගිය. "සො පදෙසො උදකෙන **ඔත්ථටො** හොති" මහා: පා: 29^{24}

ඔත්ථරණ (නා) = ළිඳ ඇතුළෙහි බැඳ තබන පෙරහන. ළිඳට බස්වා තිබෙන පෙරහන. ලී සතරක වස්ත්‍රයක් බැඳ ජලයෙහි **කණ්ඨ** සතරක් සිටුවා එහි වස්ත්‍රය සහිත ලී සතර බැඳ, කොන් සතර ජලයෙන් උඩට සිටින සේ ද, මැද කොටස ජලය ඇතුළෙහි වැටෙන සේ ද, යෙදූ පෙරහන. ජලය ඇතුළත පෙරහන ඇති බැවින් එහි වූ ජලය නිතර ම පෙරී ඇත්තේය. **කළය** එහි ඔබා ජලය ගනු ලැබේ. 'අනුජානාමි භික්ඛවෙ **ඔත්ථරණං"** වූ: පා: B. 668^{7} 669^{9} ස: පා: 893^{1} චූ: පා: 220^{28} චූ: පා: B. xii^{20} (ඵ: ඉ:)

ඔත්ථරිත්වා (පූ: ක්‍රි:) (අව + √ථර + ඉ=ත්වා) = වැතිර, වැතිර හිඳ. අතුරා (අතී: **අවත්ථරි**= **ඔත්ථරි** වතී: **අවත්ථරති**=**ඔත්ථරති** අනා: **අවත්ථරිස්සති**=**ඔත්ථරිස්සති** සමී: **අවත්ථරෙය්‍ය**=**ඔත්ථරෙය්‍ය** පමී: **අවත්ථරතු**=**ඔත්ථරතු** පූ: ක්‍රි: **අවත්ථරිත්වා**=**ඔත්ථරිත්වා** වකෘ: **අවත්ථරනෙතා**=**ඔත්ථරනෙතා** = වතුරුවමින්, වැතිර හිඳිමින්) "සති සමෙමාසා නිසීදනතං **ඔත්ථරිත්වා** පත්තං හිඳුනති"-"අඤ්ඤතරං විලිවකාරං **ඔත්ථරිත්වා** මාරෙසි"-"න සංඝාටිං **ඔත්ථරිත්වා අනතරඝරෙ** නිසීදිතබ්බං" චූ: පා: B. 652^{22} පාරා: පා: 81^{35} චූ: පා: 344^{6-36} පාචි: පා: 391^{2}

ඔත්ථරියති (ක්‍රි) (අව + √ථර + ඊය + ති) = වතුරුවනු ලැබෙයි. යටවෙයි. "උදකෙන **ඔත්ථරියති"** චූ: පා: 234^{8} චූ: පා B. 28^{5}

ඔදක (නා) (උදක + ණ) = දියෙන් හටගත්. ඕඩ. "**කඳමෝ** නාම **ඔදකො** වුච්චති" පාචි: පා: 138^{25}

ඔදකජාති (නා) (උදක + ණ; + ජාති) = දියෙහි උපදින, මසුන් කැස්බන් මැඩියන් ආදීහු. ස: පා: 185^{7}

ඔදකනන්තික (නා) (උදක + අනන්ත + ණික) = උදක කිස අවසන් කොට ඇති. සේදීමෙන් අවසන් වූ. මේථුන ධර්මය. "යං එවං අසද්ධම්මං -පෙ- **ඔදකනන්තිකං** -පෙ- සමාපජ්ජිස්සසි"-"උදකං අස්ස අන්තො **සුද්ධන්තං** ආදියතීති උදකන්තං. උදකන්තමෙව= **ඔදකනන්තිකං,** සො මේථුනධම්මො" පාරා: පා: 191^{6} ස: පා: 153^{31} 183^{22} සාර: ම: 15^{10} ජා: අ: ගැ: 131^{25}

ඔදන (නා) [සං. ඔදන] = 1 බත, ආහාරය. සත්වැදෑරුම් ධාන්‍ය සහලින් පිසූ බත. 2 **පස්** වැදෑරුම් භොජනයන්ගෙන් හෝ **එකක්,**

3 සොළොස් පිණ්ඩපාතයන්ගෙන් හෝ එකක්. ප්‍රා: පු: සං: 103^{19} පාරා: පා: 58^{19} සං: පා: 510^{13} 605^{7} මනෝ: පූ: 491^{34} පරි: පා: 249^{37}

-ගතික (නා) (ගති + **ක**) = ඔදන සුභාවය ඇති, බත්වැනි. **ක**: වි: 73^{25} **ක**: වි: පි: 54^{16}

-සුරා (නා) = එනම් සුරාව. හාජනයෙක්හි බත් බහා එහි දිය වත්කොට අළලා සදා ගත් සුරා වර්ගය. වින: ම: 236^{33} සාරා දී: 858^{17} (ඔදනීය සුරා බලනු)

ඔදනික (නා) (ඔදන + **ඉක**) = 1 බත් තබන තැන. බත් විකුණන තැන. 2 අරක්කැමියා. ජා: අ: ගැ: 94^{18} 173^{20} අ: ප: සු: 63^{26}

-ආපණ (නා) = බත් තබන අංගාණිය, බත් විකුණන සල්පිල ජා: අ: ගැ: 94^{18} –

-සරවිටි (නා) = බත් විකුණන ගෙවල් ඇති වීථිය. බත් විකුණන ගේ ඇති වෙළෙඳුන් ඉන්නා වීථිය. ජා: අ: ගැ: 173^{20} (ඔදනීයඝර බලනු)

ඔදනීයඝර (නා) = විකුණනු පිණිස බත් පිසන ගෙය. "අඤ්ඤතරෝ භික්ඛු දුබ්භික්ඛෙ ඔදනීය ඝරං පවිසිත්වා – පෙ – අවහරි" පාරා: පා: 58^{18} සං: පා: 275^{31}

ඔදනීයසුරා (නා) = එනම් සුරාව. පාචි: පා: 128^{1} වින: ම: 236^{33} (ඔදන සුරා බලනු)

ඔදපත්තකිනී (නා) (උදපත්ත + **ක** + ඉනී) = එනම් භාජනය. අටවැදුරුම් හෝ දසවැදුරුම් භාජනයන්ගෙන් එක් තැනැත්තියක්. ජලය (උදක පාත්‍රය) සාක්ෂ්‍ය කොට පාවා දුන් භාජනය. **ඔදපත්තකිනී** නාම උදපත්තං ආමසිත්වා වාසෙති" යි වදාළ "ඉදං උදපත්තං විය සංඝස්ස අහෙජ්ජා හොථ" යි කියා එක් දියපතක් පිරිමිහු එක්කොට භාජනාවතාර කරවා භරියා කැර වූ මාගම් **ඔදපත්තකිනී** නම්" ක: වි: පි: 291^{1} සාරා: මි: 58^{27} සං: පා: 397^{22} පාරා: පා: 156^{2-19} වින: ම: 101^{18} වි: වි: ටී: 225^{10}

ඔදහථ (ක්‍රි) (අව + $\sqrt{}$දහ + ථ) = යොමු කරව්. කත් තමව්. "**ඔදහථ** භික්ඛවෙ සොතං. අමත මධිගතං" මහා: පා 8^{28} 911

ඔදහිත්වා (පූ: ක්‍රි:) (අව + $\sqrt{}$දහ + ඉ + ත්වා) = බහා, ඇතුළත බහා. (අනී: **ඔදහි** වර්ත: **ඔදහති** අනා: **ඔදහිස්සති** සම්: **ඔදහෙය්‍ය** පරි: **ඔදහතු** පූ: ක්‍රි: **ඔදහිත්වා** වක්‍රා: **ඔදහනෙනා** කර්මක්‍රා: **ඔදහිතබ්බා – තබ්බා – තබ්බං** = බහා ලිය යුතු) "සොතං **ඔදහිස්සනතීති** පකකමිතබ්බං" මහා: පා: 168^{15} 911 169^{6} "පත්තමහි **ඔදහිත්වා** අභිනාගං බ්‍රාහමණස්ස දසෙසසි" මහා: පා: 23^{24}

ඔදාත (නා) [සං. අවදාත] = සුදු, ශ්වේත වර්ණය, එලළු. වි: මා: සා: 417^{3} මහා: පා: 265^{4} පරි: පා: ගැ: 29^{8} සාර: දී: 411^{8}

-අලඞ්කාර (නා) = ශ්වේතවර්ණ ආභරණ පැළඳි, සුදු පැහැති අබරණින් සැරසුණු. "අපෙපකවෙව ලිච්ඡවි **ඔදාතා** හොනති ඔදාත වණණා ඔදාතවත්ථා **ඔදාතාලඞ්කාරා**" මහා: පා: 265^{5} මි: පා: සා: 714^{32}

-කසිණ (නා) [සං. කෘත්ස්න] = අවදාත කසිණය. දශකසිණයන්ගෙන් එකක්. සුදු පැහැ ඇති දෑසමන් ආදී මල් හෝ සුදුපිළි ආදියක් හෝ එබදු අන් කිඹිවක් හෝ නිමිතිකොට වඩන **කසිණ** භාවනාව. වි: මා: සා: 516^{36} අඞ්ගු: පි: 268

-වණණ (නා) = අවදාත වර්ණය, සුදුපැහැය, එබදු පැහැ ඇති. මහා: පා: 265^{5} අඞ්ගු: නි: 268

-වත්ථ (නා) [සං. වස්ත්‍ර] = සුදුපිළි, වි: මා: සා: 4 636

-වත්ථවසනා (නා) = සුදුපිළි හඳිනා ලද්දේ, එබදු භික්ෂූහු. වින: ම: 478^{6}

-වත්ථා (නා) = සුදු පිළි හඳිනා ලද්දේ. "අපෙපකවෙව ලිච්ඡවි -පෙ= **ඔදාතවත්ථා** ඔදාතා ලඞ්කාරා" මහා: පා: 265^{4} මි: පා: සා: 714^{23}

-වසනා (නා) = සුදුපිළිහන්, එබදු ගිහියෝ. "නිහි කාමභොගිනො **ඔදාතවසනා** -පෙ- ආවරියෙසු සගාරවා සපපතිස්සා සභාගවුතතිකා විහරිස්සනතී" මහා: පා: 221^{18}

ඔදිස්ස (පූ: ක්‍රි:) [සං. උද්දිශ්‍ය] = උදෙසා, නියම කොට. පිණිස, හිමිතබා. ජා: අ: ගැ: 133^{28} **ක**: වි: පි: 34^{4} සං: පා: 521^{10} 596^{4} 676^{22} පාචි: පා: 249^{18} (සත්ත ඔදිස්ස බලනු සං: පා: 521^{10}) (ඔදිස්සක බලනු.)

-ආචික්ඛති (ක්‍රි) = නියම කොට, හිමි තබා කියයි. භික්ෂුණී විභඞ්ග සත්තරසකයෙහි ප්‍රථම සඞ්ඝාදිශෙෂ ශික්ෂා පදයෙහි නිස්සාරණීය ශික්ෂාපදයේ දක්නා පරිදි යම් මෙහෙණක් විනිශ්චය මහාමාත්‍යයන් වෙත ගොස් අසුවලා විසින් මෙහෙණ වරෙහි පලතුරු ආදිය පැහැරගනු ලැබේයයි නියම කොට කියයි නම් සඟ වෙසෙස් වේ. පාචි: පා: 249^{18} සං: පා: 676^{21}

-ආචික්ඛනා (නා) = නියම කොට කීම. අනාගතය හෝ අතීතය අරභයා නියම කොට කීම. භික්ෂුණී

විහඬග සත්තාරසක ප්‍රථම ශික්ෂාපදයෙහි භික්ෂුණියකට සඟවෙසෙස්වන එක් ආකාරයක්. සං: පා: 676[12] (ඔදිසස්ස ආචිකඛති බලනු)

ඔදිසඤ්ඤක (නා) (ඔදිසස්ස + ක) = නියම කිරීම, සීමා කිරීම. උදෙසා. "ඔදිසඤ්ඤක නම් භිම් තබනු" ජා: අ: ගැ: 467 12516 සං: පා: 5201[0] ජා: අ: ගැ: 1338[8]

ඔඛානසමොඛාන 1 (නා) [සං. අවඛාන? සමව ධාන] = තෙවැදෑරුම් සමොධාන පරිවාසයන් ගෙන් එකක්. "ඔධුනිත්වා අවධූය පහාය සමොධානෙ ඔඛාන සමොධානෙ" සමෝ ධාන පරිවාසය 1 ඔඛාන සමොධානය 2 අඟස සමෝධානය 3 මිස්සක සමොධානයයි තෙවැ දෑරුම් වේ. එහි ඔඛානසමොධානය නම් මූලාය පටිකස්සනය කළ මහණහට දෙන පිරි වෙසය." ම: පා: සං: 171[27] 172[4] 173[5] සං: පා: 875[28] 876[22] ක: වි: 501[0] ටීක: ම: 125[27] ක: වි: පි: 41[7]

ඔඛානසමොඛාන 2 (නා) = එනම් මානත සමොධාන මානත් තුණෙන් එකක්. "මේ සමොධාන මානත වනාහි 1 ඔඛානසමොධා නය 2 අඟසසමොධානය 3 මිස්සකසමොධාන යයි තෙවැදෑරුම් වේ. මූලාය පටිකස්සනය කළ මහණහට දෙන මානත ඔඛාන සමෝ ධාන මානත නම්" ම: පා: සං: 173[38] 174[1] සං: පා: 879[35] 880[2] ක: වි: පි: 41[7] (ඔඛාන සමොධාන බලනු)

ඔඛි (නා) [සං. අවධි] = සීමාව. නියමය. "ඔඛිං අකත්වා, භිරි නොදක්වා" ක: වි: පි: 127[21] ක: වි: 152[22] අ: ප: සං: 32[14] ජා: අ: ගැ: 204[18]

ඔඛිසොඵරණ (නා) = සීමා කොට පැතිරවීම. සත් ආකාරයකින් මෛත්‍රී භාවනාව වැඩීම. "ඉමෙහි සත්ත ආකාරෙහි ඔඛිසොඵරණා මෙත්තා වෙතොවිමුත්ති වෙදිතබ්බා" වි: මා: සං: 755[6] 759[1]

ඔධුනන (නා) [සං. අවධූනන] = යටිකුරුකොට සැලීම. "ඔධුනන නම් අධොමුඛ කොට වලනයයි" වි: මා: සං: 1202[24]

ඔධුනිත්වා (පූ: ක්‍රි:) (අව + √ධුන + ඉ + ත්වා) = පොළා, පොළා හැර, දුරුකොට,මකාහැර. සං: පා: 892[28] ටීක: ම: 125[27] ක; වි: පි: 41[17]

ඔනත (නා) [සං. අවනත] = නැමුණු, "නයි මසස කකුධස්ස සාඛා ඔනතා" මහා: පා: 26[24]

ඔනද්ධ (නා) [සං. අවනද්ධ] = 1 වැසුණු 2 එකා බද්ධ වූ, එකට බැඳී පවත්නා, "අඞ්කාරෙන ඔනද්ධා තණ්හාදසා සතෙත්තිකා' චූ: පා: 414[5] 439[28] සු: ප: 421[3]- පීඨ (නා) = මේට්ටය සහිත පුටුව. මේට්ටය හා එකාබද්ධ වූ පුටුව: "අනුජානාමි භික්ඛවෙ ඡිනද්ධ මඤ්චං ඔනද්ධ පීඨං" චූ: පා: 267[20] 414[5] චූ: පා: B. xiii[24] 460[8] 461[9] -මඤ්ච (නා) = මේට්ටය සහිත ඇඳ, මේට්ටය හා එකා බද්ධ වූ ඇඳ. "තෙන ඛො පන සමයෙන උතුනියො භික්ඛුනියො ඔනද්ධ මඤ්චං ඔතද්ධපීඨං අභිනිසීදනති" චූ: පා: 267[20] 414[4]

ඔනඤ්ඡිතුං (තුං) = අවවින් වැසීම. උරයක් යෙදීම. "අනුජානාමි භික්ඛවෙ භිසිං ඔනඤ්ඡිතුං" - "මහණෙනි බිස්සට උරයක් යෙදීම අනුදනිමි" චූ: පා: 267[17] චූ: පා: B. 181[8] 192[6]

ඔනමන (නා) (අව + √නම + යු = අන) = යටට නැමීම. පාරා: පා: 132[32] (ඔලඔසන බලනු)

ඔනාමෙසි (ක්‍රි) = නැමීය; පහතට නැමීය. "අථඛො කකුධෙ අධිවත්වා දෙවතා-පෙ- සාඛං ඔනාමෙසි" මහා: පා: 26[24] 27[11]

